විදේශ කටයුතු අමාත්‍යාංශය
வெளிநாட்டு அலுவல்கள் அமைச்சு
MINISTRY OF FOREIGN AFFAIRS



වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த முன்னேற்ற அறிக்கை
ANNUAL PERFORMANCE REPORT

2018

විදේශ කටයුතු අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

වාර්ෂික කාර්යසාධන වාර්තාව
2018

විදේශ කටයුතු අමාත්‍යාංශය

පටුන	පිටු අංක
1. විදේශ කටයුතු අමාත්‍යාංශයේ මෙහෙවර, විෂයයන් සහ කාර්යයන්	01
2. විධායක සාරාංශය	03 - 07
3. අමාත්‍යාංශයේ සංවිධාන සටහන	09 - 10
4. අංශවල ප්‍රගති වාර්තාව	
- අප්‍රිකා කටයුතු අංශය	11 - 37
- කොන්සියුලර් අංශය	39 - 48
- නැගෙනහිර ආසියා සහ පැසිෆික් අංශය	49 - 132
- ආර්ථික කටයුතු අංශය	133 - 147
- යුරෝපා සහ මධ්‍යම ආසියා අංශය	149 - 198
- යුරෝපා සංගමය, බහු පාර්ශ්වීය ගිවිසුම් හා පොදු රාජ්‍ය මණ්ඩලීය අංශය	199 - 211
- මුදල් අංශය	213 - 218
- සාමාන්‍ය පාලන අංශය	219 - 223
- ලතින් ඇමෙරිකා සහ කැරිබියානු අංශය	225 -232
- නීති අංශය	233 - 239
- මැද පෙරදිග අංශය	241 - 281
- සාගර කටයුතු ක්‍රමෝපායික ආරක්ෂාව හා දේශගුණික විපර්යාස පිළිබඳ අංශය	287 - 297
- විදේශ දූත මණ්ඩල පාලන අංශය	299 - 309
- මානව සම්පත් සංවර්ධන ඒකකය	310 - 313
- සන්ධාන අංශය	315 - 334
- පොදු සන්නිවේදන අංශය හා පාරසමුද්‍රිය ශ්‍රී ලාංකිකයන් සහ සංස්කෘතික රාජ්‍ය තාන්ත්‍රික භාවය පිළිබඳ අංශය	335 - 342
- දකුණු ආසියා සහ සාර්ක් අංශය	343 - 359
- එක්සත් ජාතීන් හා මානව හිමිකම් අංශය	361 - 371
- ඇමරිකා එක්සත් ජනපද හා කැනඩා අංශය	373 - 395
5. විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල	397
6. විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල මඟින් එකතු කරන ලද ආදායම් -2018	399 - 400
7. විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල විසින් සිදු කරන ලද කොන්සියුලර් කටයුතු - 2018	401 - 406
8. විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව	407 - 418

දැක්ම

“ලොව සියලුම රටවල් සමඟ මිත්‍රශීලි සබඳතා පවත්වා ගනිමින් ජාත්‍යන්තර ප්‍රජාව තුළ වගකීම දරන රටක් බවට පත්වීම”

මෙහෙවර ප්‍රකාශය

“ශ්‍රී ලංකා රජයේ විදේශ ප්‍රතිපත්තියට අනුකූලව ශ්‍රී ලාංකීය ජාතික අභිලාෂයන් ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීම, විදහා දැක්වීම, සුරක්ෂා කිරීම සහ ශ්‍රී ලාංකේය ජාතික අභිලාෂයන්ට අනුකූලව ජාත්‍යන්තර සබඳතා කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් රජයට උපදෙස් දීම”

විදේශ කටයුතු අමාත්‍යාංශයේ විෂයයන් සහ කාර්යයන්

“විදේශ කටයුතු පිළිබඳ දේශපාලනික සැලසුම් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,

විදේශ රටවලදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම,

ජාත්‍යන්තර ගිවිසුම් සහ සම්මුතිවලට එළඹීම,

විදේශ රටවල ආණ්ඩු සහ ජාත්‍යන්තර සංවිධාන ශ්‍රී ලංකාවේ දී නියෝජනය කිරීම,

විදේශ රටවලදී සිදුකරන ප්‍රචාරණ කටයුතු,

රාජ්‍යතාන්ත්‍රික විනිර්මුක්තීන් හා වරප්‍රසාද සහ

කොන්සියුලර් කටයුතු”

විධායක සාරාංශය

විදේශ කටයුතු අමාත්‍යාංශයේ මෙහෙවර වනුයේ, ශ්‍රී ලංකා රජයේ විදේශ ප්‍රතිපත්තිය අනුව ශ්‍රී ලංකාවේ ජාතික අභිලාෂයන් විදේශ රටවලදී ප්‍රවර්ධනය කිරීම, ප්‍රක්ෂේපණය කිරීම හා ආරක්ෂා කිරීමයි. 2018 වර්ෂයේ දී, ''කිසිවෙකුගේ සමඟ සතුරු නොවී සියල්ලන් සමඟ මිතුරුව කටයුතු කිරීම'' යන සංකල්පය සවිබල ගන්වමින්, දේශපාලන, ආර්ථික, සමාජයීය හා සංස්කෘතික පැතිකඩවල් ඔස්සේ ශ්‍රී ලංකාව නියැලී සිටින කටයුතු වැඩිදියුණු කිරීමට අඛණ්ඩව කටයුතු කර තිබේ. ප්‍රජාතන්ත්‍රවාදය, යහපාලනය, මානව හිමිකම්, නීතියේ ආධිපත්‍යය සහ තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම උදෙසා ශ්‍රී ලංකාව ඇපකැප වී කටයුතු කරන බව කහවුරු කරමින්, සිය ගෝලීය ස්ථාවරය අවධාරණය කිරීමට උදක්ම යත්න දරා තිබේ.

ඉහත මූලධර්ම මඟින් පාලනය වන ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය, අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා හා ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා විසින් විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා සම්පාදනය කර තිබේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය, යුරෝපා සංගමය, සාර්ක් සංවිධානය, බහු ආංශික හා තාක්ෂණික ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල සංවිධානය (BIMSTEC) හා ආසියානු කලාපීය සංසදය (ARF) ඇතුළු කලාපීය හා ජාත්‍යන්තර සංසද සමඟ අප සිදුකරනු ලබන කටයුතු මඟින් රජය විනිවිදභාවයකින් යුතුව හා ඵලදායී ලෙස කටයුතුවල නියැලී ඇති බව පෙන්නුම් කර තිබේ.

අපගේ සමීපතම අසල්වැසි රට වන ඉන්දියාව සමඟ අඛණ්ඩව ශක්තිමත් වෙමින් පවතින මිත්‍රත්වය විවිධාකාර වූ රාජ්‍යතාන්ත්‍රික කටයුතුවල නියැලීමෙන් පෝෂණය වී තිබේ. කලාපීය සහයෝගීතාව සඳහා දකුණු ආසියා රටවල සංගමයේ අන්‍යොන්‍ය විශ්වාසය සහ සහයෝගිතාව තහවුරු කරමින් හා ගැටලු විශාල පරාසයක් පිළිබඳව ඉහළ පෙළේ රැස්වීම් පවත්වමින්, පකිස්ථානය, බංග්ලාදේශය, නේපාලය, භූතානය, ඇෆ්ගනිස්ථානය, හා මාලදිවයින යන ශ්‍රී ලංකාවේ මිත්‍ර රටවල් සමඟ ශ්‍රී ලංකාව සිදු කරන කටයුතුවල ද මීට සමාන ආකාරයේ සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබේ.

දේශපාලන, ආර්ථික හා සංස්කෘතික ක්ෂේත්‍රයන්හි අන්‍යොන්‍ය සහයෝගිතාව වර්ධනය වීමත් සමඟම චීනය හා ශ්‍රී ලංකාව අතර පවතින ඓතිහාසික මිත්‍ර සබඳතා තවදුරටත් වර්ධනය වී තිබේ. ආර්ථික සහයෝගීතාව සම්බන්ධයෙන් ව්‍යාපෘති කීපයක් ආරම්භ කිරීමෙන් රුසියාව සමඟ ශ්‍රී ලංකාවේ සබඳතා තවදුරටත් පුළුල් වී තිබේ. ආසියාවේ අන්‍යොන්‍ය ක්‍රියාකාරකම් හා විශ්වාසය ගොඩනැංවීම පිළිබඳ සමුළුවේ (CICA) පූර්ණ සාමාජිකත්වය 2018 වසරේ අගෝස්තු මසදී ශ්‍රී ලංකාවට ලබා ගැනීමට හැකි විය.

ඉහළ මට්ටමේ සංචාර හා සංවාද ඔස්සේ සංහිඳියාව, සාමය සමාජ ආර්ථික සබඳතා ඇතුළුව ක්ෂේත්‍ර රාශියක් සම්බන්ධයෙන් ඉහළ සහයෝගීතාවක් හා අවබෝධයක් ඇති කරගැනීමත් සමඟ ශ්‍රී ලංකාව හා එක්සත් ජනපදය අතර සබඳතා තවදුරටත් වර්ධනය වී තිබේ.

මෙම වර්ෂයේ පළමු වැනි කාර්තුවේ දී, ෂින්සෝ අබේ අග්‍රාමාත්‍යතුමාගේ ආරාධනයකට අනුව අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජපානයේ සංචාරයක නිරත විය. ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, සිංගප්පූරුව, තායිලන්තය, ඉන්දුනීසියාව, මැලේසියාව, වියට්නාමය හා කොරියානු ජනරජය යන රටවල් සමඟ පවත්නා සබඳතා උනන්දුවක් දක්වන විවිධ ක්ෂේත්‍ර ඔස්සේ අබණ්ඩව පුළුල් වී තිබේ.

යුරෝපා සංගම් - ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිසම, යුරෝපා සංගමය සමඟ සිදුකරගෙන යන හවුල්කාරිත්ව ක්‍රියාවලිය පිළිබඳ වාර්ෂික සංවාදය ඔස්සේ යුරෝපා සංගම් පී. එස්. පී. ප්ලස් සහනය ලබා ගැනීම සම්බන්ධයෙන් වූ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ හා අනුකූල වීමේ කටයුතුවල මෙම අමාත්‍යාංශය නියැලී තිබේ. යහපාලනය, නීතියේ ආධිපත්‍යය, හා යුරෝපා සංගමය සමඟ ආරම්භ කොට ඇති මානව හිමිකම් සංවාදවලට අමතරව බහු ආංශික හවුල්කාරිත්වයට වෙළෙඳ පහසුකම් හා සංවර්ධන සහය ඇතුළත් වේ.

යුරෝපා සංගමය, එල්ටීටීඊ සංවිධානය ත්‍රස්ත සංවිධානයක් ලෙස අනුයාත වශයෙන් එළඹි දෙවැනි වසරේදීත් ලැයිස්තුගත කොට තබා ගැනීම සඳහා ශ්‍රී ලංකාව කටයුතු කර තිබේ.

2018 අප්‍රේල් හිදී ලන්ඩනයේ පැවැති පොදුරාජ්‍ය මණ්ඩලීය ආණ්ඩු ප්‍රධානීන්ගේ රැස්වීමට ක්‍රියාකාරීව සම්බන්ධ වීමෙන් එහි සාමාජික රාජ්‍ය සමගත් පොදුරාජ්‍ය මණ්ඩලීය මහලේකම් කාර්යාලය සමඟත් ශ්‍රී ලංකාව සමීප සබඳතා පවත්වා ගත්තාය. නැගෙනහිර යුරෝපයේ රටවල් සහ එක්සත් රාජධානිය, ජර්මනිය, ඕස්ට්‍රියාව, ස්වීඩනය, ඉතාලිය, ප්‍රංශය, ස්ලෝවේනියාව, නෝර්වේ, පින්ලන්තය හා තුර්කිය වැනි යුරෝපීය රටවල් සමඟ සබඳතා පුළුල් කිරීමට ශ්‍රී ලංකාව අබණ්ඩව කටයුතු කර තිබේ. සයිප්‍රසයේ ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයක් විවෘත කළ අතර එමගින් සයිප්‍රසය සමඟ අපගේ සබඳතා තවදුරටත් ශක්තිමත් වෙයි. ඉහළ මට්ටමේ සංචාර හා සංවාද ඔස්සේ දේශපාලනික, ආර්ථික, සමාජ, ආරක්ෂක හා සංස්කෘතික සහයෝගිතාවය විවිධාංගීකරණය කිරීමේ දී ත් ප්‍රවර්ධනය කිරීමේ දීත් ශ්‍රී ලංකාවේ යුරෝපා හා මධ්‍යම ආසියානු මිතුරු රටවල් වෙත ශ්‍රී ලංකාවේ ප්‍රවේශ වීම මගින් ප්‍රගතිගාමී ප්‍රවනතාවයක් දැකගත හැකි වී තිබේ. ශ්‍රී ලංකාව හා ජර්මනිය අතර වෙළඳ සහයෝගිතාව ශක්තිමත් කිරීමට හා ද්විපාර්ශ්වීය වෙළඳ හා ආයෝජනය තවදුරටත් වැඩි දියුණු කිරීමට බලාපොරොත්තු වෙයි. විදේශ කටයුතු අමාත්‍ය ගරු තිලක් මාරපන මැතිතුමා 2018 අප්‍රේල් මස 17 වැනි දින බර්ලින් බලශක්ති සංක්‍රාන්ති සංවාදයට (BETD) සහභාගීවීම සඳහා ජර්මනියේ සංචාරයක නියැලිණි.

දකුණු අප්‍රිකාව හා අප්‍රිකානු සංගමයේ සාමාජික රටවල් සමඟ අපගේ ද්විපාර්ශ්වික අන්තර් ක්‍රියාකාරිත්වයන්හි පැහැදිලි දියුණුවක් පෙන්වමින්, අප්‍රිකානු සංගමයේ (AU) අපගේ නිරීක්ෂක රාජ්‍යයන් හරහා අප්‍රිකානු මහාද්වීපයේ රටවල් සමඟ ශ්‍රී ලංකාවේ සබඳතාවය බොහෝ ක්ෂේත්‍රවල ව්‍යාප්ත වෙමින් පවතී. ආර්ථික හා සංස්කෘතික ක්ෂේත්‍රයෙහි ද්විපාර්ශ්වික සබඳතා ඔස්සේ ශ්‍රී ලංකාව ලතින් ඇමරිකාව හා කැරිබියානු කලාපය වෙත ළඟාවෙමින් සිටී.

මැදපෙරදිග බොහෝ රටවල ඉහළ පෙළේ සංචාර, ඒකාබද්ධ කොමිෂන් සභා හා වෙනත් සම්බන්ධවීම් ගණනාවක් මගින්, 2018 වසරේ දී මැදපෙරදිග සමඟ පැවති සබඳතා සැලකිය යුතු

ප්‍රගතියක් පෙන්වයි. සවුදි අරාබිය, කටාරය, කුවේට්, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, බහරේන්, ඕමානය, ජෝර්දානය, ඉරාකය, හා ඉරානය යන රටවල් සමඟ සෑම ක්ෂේත්‍රයකම අපගේ සබඳතා පුළුල් කෙරෙමින් පවතී. රාමල්ලා නුවර සිටින අපගේ නියෝජිතවරයා හරහා පලස්තීනයේ ජනතාව වෙත අපගේ සහය හා සහයෝගය ඔසවා තැබීම ශ්‍රී ලංකාව දිගටම සිදුකරයි. බොහෝ සහයෝගිතා ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ඊශ්‍රායලය සමඟ වැඩිදියුණු කළ අන්තර් ක්‍රියාකාරිත්වයන් පවත්වාගනු ලබන අතර, ඊශ්‍රායලය සමඟ සබඳතා වසරින් වසර දියුණු වෙමින් පවතී.

විනිවිදභාවය හා සියල්ලන් ඇතුළත් කර ගැනීමේ රජයේ ප්‍රතිපත්තියට අනුකූලව, සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR) යටතේ රජයේ පාර්ශ්වය පිළිබඳ වාර්තාව සහ මානව හිමිකම් කවුන්සිලයේ දී ශ්‍රී ලංකාවේ විශ්වීය වාර සමාලෝචනය පිළිබඳව ලද නිර්දේශ පිළිබඳව මහජන උපදේශන පවත්වන ලදී. අමාත්‍යාංශය, රේඛීය නියෝජිතායතන සමඟ උපදේශනයෙන් අනතුරුව, මානව හිමිකම් පිළිබඳ ක්‍රියාකාරී වැඩසටහන (NHRAP) ක්‍රියාවට නැංවීම සමීපව පසුවිපරම් කරයි.

අංක 30/1 හා 34/1 දරණ යෝජනා ක්‍රියාවට නැංවීමට අදාළව එක්සත් ජාතීන්ගේ ගිවිසුම් සංවිධාන සම්බන්ධයෙන් වූ ශ්‍රී ලංකාවේ කැපවීම්, රේඛීය අමාත්‍යාංශ හා නියෝජිතායතන සමඟ එක්ව, විදේශ කටයුතු අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ පවතියි. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයෙහි 73 වැනි සැසියෙහි අතිගරු ජනාධිපතිතුමාගේ සහභාගිත්වය, ජාත්‍යන්තර දේශපාලන පද්ධතිය තුළ වගකිව යුතු ක්‍රියාකාරියෙකු ලෙස ශ්‍රී ලංකාවේ සම්බන්ධවීම ඉස්මතුකර දක්වයි. එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා හමුදා නිලධාරීන් යොදවමින්, සාමසාධක කටයුතු සඳහා ශ්‍රී ලංකාවේ දායකත්වය දිගටම පවත්වා ගනී.

එක් තැනක සිරවී තිබීම බිඳ දමා, ජාත්‍යන්තර ආරක්ෂාව, බහුපාර්ශ්වික නිරායුධකරණයෙහි වේගය හා අවි සීමාකිරීම වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රයත්නයන් සහතික කරමින්, 2018 දී ශ්‍රී ලංකාවේ සභාපතිත්වයෙන් යුතුව පැවති නිරායුධකරණය පිළිබඳ සමුළුවේ දී ඊට අනුබද්ධ ආයතන පහක් පිහිටුවීම සඳහා සම්මුතියක් ඇතිකර ගන්නා ලදී.

ශ්‍රී ලංකාවේ ආර්ථික රාජ්‍යතාන්ත්‍රික වැඩසටහන තුළ අමාත්‍යාංශයෙහි කාර්යභාරය වනුයේ, ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික ආර්ථික සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම, වෙළඳ, ආයෝජන, තාක්ෂණික සහයෝගිතාව, සංචාරක ව්‍යාපාරය, තේ ප්‍රවර්ධනය හා සංවර්ධන සහාය සම්බන්ධීකරණය කිරීම මඟින් ශ්‍රී ලංකාවේ ගෝලීය ආර්ථික පසුබිම වර්ධනය කිරීමයි.

ආර්ථික විද්‍යා දර්ශක සහ දූතමණ්ඩල සඳහා කාර්යසාධක ඉලක්කයන් (EPITM), තෝරාගත් වෙළඳපොළවල ආර්ථික ප්‍රවර්ධනය හා ශ්‍රී ලංකා විදේශ සබඳතා සහ ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු පිළිබඳ සංවාදය යන කරුණුවලින් ආර්ථික රාජ්‍යතාන්ත්‍රික වැඩසටහන සමන්විත වේ.

ආසියා පැසිෆික් කලාපය සඳහා එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිසම (UNESCAP), කොළඹ ක්‍රමය, ඉන්දියන් සාගර වටද්දර රටවල සංගමය (IORA), ආසියා සහයෝගිතා සංවාදය

(ACD), අබුඩාබි සංවාදය සහ 2018 අගෝස්තු මස කත්මන්ඩුහි දී පවත්වන ලද 4 වැනි සමුළුවේ දී ශ්‍රී ලංකාවට සභාපතිත්වය හිමි වූ බිම්ස්ටෙක් සංවිධානය හරහා අමාත්‍යාංශය විසින් ද්විපාර්ශ්වික හා බහු පාර්ශ්වික ආර්ථික සබඳතා ඇතිකර ගන්නා ලදී.

ඉන්දියන් සාගරය තුළ ශ්‍රී ලංකාවෙහි ඇති උපායමාර්ගික වැදගත්කම සැලකිල්ලට ගනිමින්, සමුද්‍රීය ආරක්ෂාව, සුරක්ෂිතභාවය, හා සාගර ගැටලු පිළිබඳ ශ්‍රී ලංකා - ජපාන සංවාදය කොළඹ දී පැවැත්විණ.

ඉන්දියන් සාගරයේ සාමකාමී අන්තර් ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කිරීම පිළිබඳ ශ්‍රී ලංකාවේ දැක්ම සමඟ ශ්‍රී ලංකාව, 2018 සැප්තැම්බර් මස කොළඹ දී පැවති ඉන්දියන් සාගර වටද්දර රටවල සංගමයේ (IORA) සමුද්‍රීය ආරක්ෂාව හා සුරක්ෂිතතාව පිළිබඳ වැඩමුළුවෙහි හා 2018 ඔක්තෝබර් මස"ඉන්දියන් සාගරය: අපගේ අනාගතය නිර්වචනය කරයි" යන තේමාව යටතේ කොළඹ දී පැවති ට්‍රැක් 1.5 සංවාදයෙහි සත්කාරකත්වය දැරීය.

ඓතිහාසික පියවරක් ලෙස, අමාත්‍යාංශයේ කොන්සියුලර් කටයුතු අංශයේ ප්‍රාදේශීය කාර්යාල උතුරු පළාතේ දී පිහිටුවන ලද අතර, 2019 වසරේ පළමුවැනි කාර්තුවෙහි දී දකුණු පළාත ආවරණය වන පරිදි ප්‍රාදේශීය කාර්යාලයක් මාතර දී විවෘත කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විටත් අවසන් කොට ඇත. යාපනයේ පිහිටි ප්‍රාදේශීය කාර්යාලයත් සමඟ සහයෝගිතාවයෙන් යුක්තව, විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් කිලිනොච්චි හා මන්නාරම යන ප්‍රදේශවල ඒකාබද්ධ කොන්සියුලර් ජංගම සේවා පවත්වමින්, සිය කොන්සියුලර් සේවා කාර්යක්ෂම ලෙස ව්‍යාප්ත කර ඇත. 2018 අගෝස්තු 16 වැනි දින ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමට අනුව, ලේඛන සත්‍යාපනය කිරීමේ සේවාව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ලබා දෙමින් එම කාර්යාවලිය විමධ්‍යගත කරන ලදී. 2018 වර්ෂයේ දී පවුලේ සාමාජිකයන් හෝ විශ්වාසදායක වෙත වන්දි හෝ වෙනත් ගෙවීම් ලෙස බෙදා දීම පිණිස ශ්‍රී ලංකා රුපියල් මිලියන 420 ක් විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් වන්දි මුදල් ලෙස අයකර ගන්නා ලදී. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ (SLBFE) ලියාපදිංචි වී නොමැතිව හෝ වියදම දරාගැනීමට නොහැකි අවස්ථාවක හෝ සිටින ශ්‍රී ලාංකිකයන් විදේශ රටවල දී මියගිය අවස්ථාවල දී එම මෘත දේහයන් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම/අවමංගල කටයුතු සඳහා ශ්‍රී ලාංකිකයන් 12 දෙනෙකු සම්බන්ධයෙන් අමාත්‍යාංශය දළවශයෙන් ශ්‍රී ලංකා රුපියල් 577,975 ක මුදලක් වැය කොට ඇත.

විදේශ කටයුතු අමාත්‍යාංශය, බාහිර පාර්ශ්වයන් සමඟ සබඳතා පවත්වාගෙන යාම, කාලෝචිත තොරතුරු ව්‍යාප්ත කිරීම හා ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය විදේශයන්හි ප්‍රක්ෂේපණය කිරීම දිගටම සිදුකරයි. අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි නව ත්‍රෙභාෂා අතුරු මුහුණත 2018 දී දියත් කරන ලදී. අමාත්‍යාංශය විසින් මාධ්‍ය නිවේදන 452 ක් නිකුත් කරන ලද අතර, අතිශයින් වැදගත්/ඉතා වැදගත් පුද්ගලයන්ගේ සංචාර හා මාධ්‍ය කටයුතු සම්බන්ධීකරණය සහ සහ ශ්‍රී ලංකාවේ දී විදේශ මාධ්‍ය ආවරණවලට සහය ලබා දෙන ලදී. විදේශවල වෙසෙන ශ්‍රී ලාංකිකයන්ට ශ්‍රී ලංකාව සමඟ සංස්කෘතික සබඳතා පවත්වා ගැනීමට ශක්තිය දෙමින්, ජාතික රූපවාහිනියේ "එතෙර මෙතෙර"

වැඩසටහන ඉතාලියෙහි, එක්සත් ජනපදයෙහි හා කොරියානු සමූහාණ්ඩුවේ පැවැත්වීමට පහසුකම් සළසන ලදී.


අපගේ විදේශ ප්‍රතිපත්තියේ වර්තමාන අවශ්‍යතා අනුව කටයුතු කිරීම සඳහා, මෙම අමාත්‍යාංශයෙහි පරිපාලන ව්‍යුහය 2018 වසරේ දී සංශෝධනය කරන ලදී. විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහ විදේශ රටවල පිහිටි එහි දූතමණ්ඩලවල සමස්ත කාර්ය සාධනය පිළිබඳ ඇගයුමක් සිදු කරන ලදී. අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය, ශක්නුවත් මානව සම්පතින් පෝෂණය කිරීම සඳහා විනිවිද භාවයකින් යුතු හා සාධාරණ පදනමක් මත කාර්ය මණ්ඩලය බඳවා ගන්නා ලදී. නිලධාරීන් 20 දෙනෙකුගෙන් සමන්විත වන ශ්‍රී ලංකා විදේශ සේවයේ 2018 කණ්ඩායම විසින් 2018 මැයි 02 වැනි දින මෙම අමාත්‍යාංශයේ රාජකාරී භාර ගන්නා ලදී. බණ්ඩාරනායක රාජ්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය (BIDTI) විසින් සකසන ලද විස්තීරණ පුහුණු වැඩසටහනකට මෙම නිලධාරීහු සහභාගී වූහ.


තවද, නාවික කටයුතු, සිවිල් ගුවන් සේවා, ජාත්‍යන්තර වෙළඳාම, ආයෝජන සුරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම, සංක්‍රමණය සහ නුස්තවාදය මැඩලීම යන ජාත්‍යන්තර වශයෙන් වැදගත්කමක් ඇති ක්ෂේත්‍ර පිළිබඳව සියලුම විදේශ ප්‍රතිපත්ති තීරණවල නීතිමය පැතිකඩ සම්බන්ධයෙන් නීතිමය උපදෙස් මෙම අමාත්‍යාංශය විසින් ලබා දෙන ලදී.

ශ්‍රී ලංකාව රාජ්‍යතාන්ත්‍රික වශයෙන් නිරත වන කටයුතු වර්ධනය කිරීමට, ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු ප්‍රවර්ධනය කිරීමට සහ ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය, අභිලාෂයන්, අනන්‍යතාව හා එහි ජනතාවගේ අවශතා සැළකිල්ලට ගනිමින් විදේශ රටවල දී ශ්‍රී ලංකාවේ අභිලාෂයන් ප්‍රවර්ධනය ආරක්ෂා කරමින් සියලුම රටවල් සමඟ මිත්‍රත්වයෙන් යුතුව කටයුතු කිරීමේ විදේශ ප්‍රතිපත්තියන් අනුගමනය කිරීමට විදේශ කටයුතු අමාත්‍යාංශය ඇපකැප වී කටයුතු කරයි.

විදේශ කටයුතු අමාත්‍යාංශය
ජනරජ ගොඩනැගිල්ල
කොළඹ 01

විදේශ කටයුතු අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය - 2018




විදේශ කටයුතු අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය - 2019
ලේකම්
සහකාර ලේකම් (පරිපාලන)
ගිණුම් නිලධාරී
ප්‍රධාන සංධාන නිලධාරී
BIDTI
විදේශ දූත මණ්ඩල පාලන පිරිස්
විදේශ දූත මණ්ඩල පාලන වත්කම්
මහජන රාජ්‍ය තාන්ත්‍රික කටයුතු හා මාධ්‍ය ප්‍රකාශිකා
LKIIRSS
ප්‍රතිපත්ති සැලසුම් හා පර්යේෂණ අංශය
ඉහළ කළමනාකරණ නිලධාරීන්
දකුණු ආසියා
නැගෙනහිර ආසියාව අග්නි දිග ආසියා හා ශාන්තිකර කලාපය
මැදපෙරදිග
අප්‍රිකාව
ලතින් ඇමරිකාව සහ කැරිබියානු දූපත්
උතුරු ඇමරිකාව
යුරෝපය සහ මධ්‍යම ආසියාව
ඉහළ කළමනාකරණ නිලධාරීන්
යුරෝපා සංගමය, පොදු රාජ්‍ය මණ්ඩලය සහ බහුපාර්ශවික ගිවිසුම්
එක්සත් ජාතීන් සහ මානව හිමිකම්
සාගර කටයුතු , පරිසරය සහ දේශගුණික විපර්යාස
ඉහළ කළමනාකරණ නිලධාරීන්
නීති අංශය
ඉහළ කළමනාකරණ නිලධාරීන්
ආර්ථික කටයුතු
ඉහළ කළමනාකරණ නිලධාරීන්/ආර්ථික ලේකම්
ප්‍රදූත කටයුතු
සාමාන්‍ය පාලන අංශය
ඉහළ කළමනාකරණ නිලධාරීන්/ සහකාර ලේකම්
මූල්‍ය
අභ්‍යන්තර විගණන

අප්‍රිකා කටයුතු අංශය

අප්‍රිකා කටයුතු අංශය

මෙම අංශයේ කාර්ය කටයුතු

1. අප්‍රිකානු රටවල් සමඟ ශ්‍රී ලංකාවේ ද්විපාර්ශ්වික සබඳතා සම්බන්ධීකරණය කිරීම.

2. ඉහළ මට්ටමේ සංචාර හා අක්ත පත්‍ර ප්‍රදානය කිරීමේ උත්සව සඳහා සාකච්ඡා සටහන් හා රට පිළිබඳ විස්තර සකස් කිරීම ඇතුළුව අතිගරු ජනාධිපතිතුමා ගරු අග්‍රාමාත්‍යතුමා, විදේශ කටයුතු අමාත්‍යතුමා සහ අනෙකුත් අමාත්‍ය මණ්ඩල සාමාජිකයින්,පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ ද්විපාර්ශ්වික සංචාර සම්බන්ධීකරණය කිරීම.(අදාළ දූත මණ්ඩලය යටතේ විස්තර දක්වා ඇත).

3. අතිශයින් වැදගත් පුද්ගලයන් හා ඉතා වැදගත් පුද්ගලින් ශ්‍රී ලංකාවේ නියැලෙන හා විදේශීය රටවල නියැලෙන සංචාර සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම.

4. අත්සන් තැබීමට නියමිත අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් වලට ඉක්මනින් එළඹීමේ කටයුතු පසු විපරම් කිරීම.

5. අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයීය පත්‍රිකා පිළියෙළ කිරීම හා ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයීය අනුමැතිය ලබා ගැනීම.

6. අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ගරු විදේශ අමාත්‍යතුමාගේ ශෝකය ප්‍රකාශ කිරීමේ පණිවුඩ ජාතික දින පණිවුඩ, සව්දිය පිරීමේ පණිවුඩ හා සුභාශිංසන පණිවුඩ පිළියෙළ කිරීම.

7. කොළඹ සිටින අප්‍රිකානු කලාපයේ තානාපතිවරුන්/මහ කොමසාරිස්වරුන්ගේ අභ්‍යන්තර රැස්වීම් සහ සුහද පිළිසඳරවල් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.

8. අප්‍රිකානු කලාපය සඳහා කාර්ය සැලැස්ම සහ කාර්ය සාධන හා අයවැය වාර්තා ආදිය සැකසීම.

9. එදිනෙදා කටයුතු සම්බන්ධයෙන්, විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල, අප්‍රිකා කලාපයේ රටවල කොළඹ පිහිටි විදේශ දූත මණ්ඩල හා රේඛීය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා වෙනත් නියෝජිතායතන සමඟ අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීම.

ආවරණය කරනු ලබන රටවල්

අ) රටවල් 54 - දකුණු අප්‍රිකාව, ඇන්ගෝලාව, බොට්ස්වානා, එස්වටිනි, ලෙසොතො, මලාවි, මොසැම්බික්, සැම්බියාව, සිම්බාබ්වේ, නැමීබියා, ටියුනිසියාව, ඇල්ජීරියාව, මොරොක්කෝව, ඊජිප්තුව, ලිබියාව, එරිත්‍රියාව, ඉතියෝපියාව, ජිබුටි, දකුණු සුඩානය, සුඩාන ජනරජය, සෝමාලියාව, ඝානාව, සිනෙගල්, ගැබොන්, කේප්වර්ඩේ, සාඕ ටෝමිඇන්ඩ් ප්‍රින්සිපේ, ඉක්වටෝරියල් ගිනියා, බුරුන්දි, නයිගර්, නයිජීරියා,බෙනින්,බර්කිනා ෆාසෝ, කෝට් ඩී අයිවෝර්, මලී,ලිබීරියාව, මොරිටෙනියාව, චැඩ්, කැමරූන්, ටෝගෝ, කෙන්යාව, උගන්ඩාව, රුවන්ඩාව, ටැන්සානියාව, සිෂෙල්ස්, මැඩගස්කරය, මුරුසිය, කොමොරොස්, ගැම්බියාව, සියරාලියෝන්, ගිනියා, ගිනියා-බිසව්, කොන්ගෝ ජනරජය, කොන්ගෝ ප්‍රජාතාන්ත්‍රික ජනරජය, මධ්‍යම අප්‍රිකානු ජනරජය.

අප්‍රිකානු මහාද්වීපයේ ඇති ස්වාධීන රාජ්‍යය 54 අතුරෙන් ශ්‍රී ලංකාව මේ දක්වා රටවල් 44 ක් සමඟ විධිමත් රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කර තිබේ.

ඉතිරි රටවල් 10 සමඟ සබඳතා ස්ථාපනය කිරීම පිළිබඳව මෙම අංශය කටයුතු කරමින් සිටී.

ආ)අප්‍රිකා මහාද්වීපයේ නේවාසික රාජ්‍යතාන්තික දූත මණ්ඩල හයක් තිබේ.

- දකුණු අප්‍රිකාව/ප්‍රිටෝරියා හි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය.
- කෙන්යාව/නයිරෝබි හි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය.
- නයිජීරියාව/අබුජා හි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය.
- සීෂෙල්ස්/වික්ටෝරියා හි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය.
- ඉතියෝපියාව/අඩිස් අබාබා ශ්‍රී ලංකා තානාපති කාර්යාලය.
- ඊජිප්තු/කයිරෝ හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය.

ඇ) අප්‍රිකානු මහාද්වීපයේ රාජ්‍යතාන්ත්‍රික නියෝජන 4 ක් කොළඹ පිහිටුවා තිබේ.

- දකුණු අප්‍රිකානු ජනරජයේ මහ කොමසාරිස් කාර්යාලය.
- ඊජිප්තු අරාබි ජනරජයේ තානාපති කාර්යාලය.
- සීෂෙල්ස් ජනරජයේ මහ කොමසාරිස් කාර්යාලය.
- ලිබියානු රාජ්‍යයේ තානාපති කාර්යාලය.

ඈ) සමගාමී අක්තගැන්වීම්:

- **දකුණු අප්‍රිකාවේ** ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය (8)-
  ඇන්ගෝලාව, එස්වටිනි, ලෙසොතෝ, මලාවි, මොසැම්බික්, නැම්බියාව, සැම්බියාව, සිම්බාබ්වේ.

- **ඊජිප්තුවේ** ශ්‍රී ලංකා තානාපති කාර්යාලය (3)-
  ලිබියා, එරිත්‍රියාව, සුඩාන් ජනරජය.

- **ඉතියෝපියාවේ** ශ්‍රී ලංකා තානාපති කාර්යාලය (3)-
  දකුණු සුඩානය, සෝමාලියාව, ජිබුටි.

- **නයිජීරියාවේ** ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය(11)-
  කෝට් ඩී අයිවෝර්, ගැම්බියාව, සියේරාලියෝන්, ගිනියා, ගිනියා - බිසව්, ටෝගෝ, බෙනින්, බර්කිනා, ෆාසෝ, ලයිබීරියාව, මොරිටේනියාව, මාලි.

- **කෙන්යාවේ** ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය (5)-
  කොන්ගෝ ජනරජය, කොන්ගෝ ප්‍රජාතාන්ත්‍රික ජනරජය, උගන්ඩාව, රුවන්ඩාව, ටැන්සානියාව.

- **සීෂෙල්ස්** හි ශ්‍රී ලංකාවේ මහකොමසාරිස් කාර්යාලය (1)-
  මැඩගස්කරය

* ගැම්බියාව සමඟ රාජ්‍යතන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීම පිළිබඳව මේදක්වා වාර්තා සොයගෙන නොමැත. කෙසේවෙතත්, ගැම්බියාව නයිජීරියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට සිය එකඟතාව ප්‍රකාශ කර තිබේ.

ඉ) අක්තගන්වා නොමැති රටවල්

- නයිගර්
- මධ්‍යම අප්‍රිකානු ජනරජය
- ඉක්වටෝරියල් ගිනියා
- ගැබොන්
- සාඕ ටොම් ඇන්ඩ් ප්‍රින්සිපේ
- බුරුන්දි
- කැමරෝන්
- කේප් වර්ඩේඩ්
- චැඩ්
- කොමොරොස්

ඊ)අනේවාසික තානාපතිවරුන් පත් කිරීමට නියමිත රටවල්

- මුරුසිය (කලින් සීෂෙල්ස් වෙත අක්ත ගන්වා තිබුණි)
- ඝානාව (කලින් උගන්ඩාව වෙත අක්ත ගන්වා තිබුණි)
- සිනේගල් (කලින් උගන්ඩාවවෙත අක්ත ගන්වා තිබුණි)

- බොට්ස්වානාව (කලින් ද.අප්‍රිකාව වෙත අක්ත ගන්වා තිබුණි)
- ඇල්ජීරියාව (කලින් ඊජිප්තුව වෙත අක්ත ගන්වා තිබුණි)
- මොරොක්කෝව (කලින් ඊජිප්තුව වෙත අක්ත ගන්වා තිබුණි)
- ටියුනීසියාව (කලින් ඊජිප්තුව වෙත අක්ත ගන්වා තිබුණි)

අප්‍රිකානු රටවල් සමඟ ශ්‍රී ලංකාවේ සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමේ ඉදිරි බලාපොරොත්තු ඇතිව, ශ්‍රී ලංකාව 2014 අප්‍රියෙල් සිට බලපැවැත්වෙන පරිදි අප්‍රිකානු නොවන රාජ්‍යයක් ලෙස **අප්‍රිකානු සංගමයේ** පිළිගැනීමේ තත්ත්වය ලබා ගත්තාය.

ඌ) නිර්වේතනික කොන්සල් නියෝජනය

ශ්‍රී ලංකාව, මලාවි, මුර්සිය, මැඩගස්කරය, මොසැම්බික්, නැම්බියාව, සිනේගල්, දකුණු අප්‍රිකාව(ඩර්බන් හා කේප්ටවුන්, සුඩානය, ටැන්සානියාව, ටියුනීසියාව හා සැම්බියාව යන රටවල නිර්වේතනික කොන්සල් නියෝජන ස්ථාපනය කර තිබේ.

1. නයිජීරියාව

I. ද්විපාර්ශ්වික සබඳතා

මහ කොමසාරිස් කාර්යාලය

- 2018 මාර්තු මස මහාචාර්ය මෛත්‍රී වික්‍රමසිංහ මහත්මියගේ නයිජීරියා සංචාරයට.
- එක්සත් ජාතීන්ගේ මහ ලේකම්ගේ තරුණ කටයුතු පිළිබඳ විශේෂ නියෝජිත ජයත්මා වික්‍රමනායක මෙනෙවිය 2018 පෙබරවාරි මස නයිජීරියාවේ නියැලුණු සංචාරය සංවිධානය කිරීමට යුනිසෙෆ් සංවිධානයට.
- ත්‍රස්තවාදය මර්දනය කිරීම පිළිබඳව හිටපු නාවික හමුදාපති අඩුජාහිදී හා ලාඕසයේදී පොදු දේශන පැවැත්වීම සඳහා 2018 මාර්තු මසදී නියැලුණු සංචාරයට.
- 2018 මැයි මස ලාගෝස්හිදී පැවති නාවික සමුළුවට ජ්‍යෙෂ්ඨ නාවික නිලධාරියෙකුගේ සහභාගිත්වයට.
- මහා මාර්ග හා මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු හිස්බුල්ලා මැතිතුමා 2018 ජුනි මස අයිවරි කෝස්ට් හි නිරත වූ සංචාරයට අවශ්‍ය පහසුකම් සලසන ලද අතර
- ECOWAS සඳහා මහ කොමසාරිස්වරයෙකු අක්ත ගැන්වීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයට අවශ්‍ය සහාය ලබා දුනි. 2018 ඔක්තෝම්බර් මසදී මහ කොමසාරිස්වරයා අක්තපත්‍ර ප්‍රදානය කළේය.

II. බහුපාර්ශ්වික සබඳතා

- එක්සත් ජාතීන්ගේ සංවිධානය, ලෝක වෙළඳ සංවිධානය වැනි ජාත්‍යන්තර සංවිධාන කීපයක නයිජීරියාව හා ශ්‍රී ලංකාව සාමාජිකයෝ වෙති. සියලු රටවල යහපත තකා ගෝලීය සාමය හා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සහ නිදහස් හා සාධාරණ වෙළඳාම සඳහා දෙරටම සාමුහිකව කටයුතු කරයි. දෙරටම, ගැටුම්වලින් අනතුරුව සාමය සඳහා යන දුෂ්කර ගමන සාර්ථකව තරණය කිරීමට සහාය ලබාදීම සඳහා එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවට සුවිශේෂී දායකත්වයක් ලබදෙයි.

III. ආර්ථික සබඳතා හා විදේශීය අයෝජන

- 2013 වසරේදී එකිනෙක රටවල අගනගරවලදී නේවාසික දූතමණ්ඩල ස්ථාපනය කිරීමෙන් අනතුරුව දෙරට අතර ද්විපාර්ශ්වික ආරක්ෂක සබඳතා ස්ථීරසාර ලෙස ව්‍යාප්ත විය. (කෙසේවෙතත්, කොළඹ පිහිටි නයිජීරියාවේ මහ කොමසාරිස් කාර්යාලය, නයිජීරියාවේ මුල්‍ය දුෂ්කරතා හේතුවෙන් 2017.12.31 දින සිට වසා දමන ලදී.)
- ශ්‍රී ලංකාවේ වෙළඳ හා ආයෝජන කොන්ක්ලේවි වැඩි ප්‍රමාණයකට නයිජීරියාවේ ව්‍යාපාරිකයන්ගේ සහභාගිත්වය මහ කොමසාරිස් කාර්යාලය විසින් තහවුරු කරන ලදී.
- වෙළඳ ගිවිසුම් විශාල ප්‍රමාණයක් මහ කොමසාරිස් කාර්යාලය විසින් විසඳන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රී ලංකාවෙන් නයිජීරියාවට ආනයනය කරනු ලබන තේ, ඇගලුම්, හා රබර් නිෂ්පාදන වල වැඩි වීමක් දක්නට ලැබුණි.

IV. සංස්කෘතික සබඳතා

- එළඹීමට නියමිත සංස්කෘතික ගිවිසුම සඳහා නයිජීරියා මේ කටයුතු මෙම මණ්ඩලය පසුවිපරම් කරමින් සිටියි. ශ්‍රීලාංකික හා නයිජීරියා නළු නිළියන් යොදා ගනිමින් චිත්‍රපටයක් රඟදැක්වීමට නයිජීරියාවේ චිත්‍රපට නිෂ්පාදකවරයෙකුට මහකොමසාරිස් කාර්යාලය විසින් සහය ලබාදෙන ලදී.

V. කම්කරු සුබසාධන

- නයිජීරියාවේ වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් ඉදිරිකිරීමේ ක්ෂේත්‍රයේ කටයුතු කරන වෘත්තිකයන් විශේෂයෙන් ඉංජිනේරුවන් වෙයි.තවත් විශාල පිරිසක් ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ සේවය කරති. විවිධාකාරයේ සහය

පතමින් මොවුහු මහ කොමසාරිස් කාර්යාලයට පැමිණෙන අතර දූත මණ්ඩලය ඔවුන්ට අවශ්‍ය සහය නොපමාව ලබාදෙයි.

VI. අනෙකුත් ක්‍රියාකාරකම්

- සංක්‍රමණිකයින් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය සමඟ සමීපව කටයුතු කරමින් දූත මණ්ඩලය, මොරිටේනියාව, බෙනින්, නයිජීරියාව, නයිගර්, හා කැමරුන් යන රටවලට නීති විරෝධී ලෙස සංක්‍රමණය වී අතරමං වූ විශාල ලාංකිකයින් සංඛ්‍යාවක් ආපසු ලංකාව බලා පිටත් කොට යැවීමට අවශ්‍ය පහසුකම් සලසන ලදී.කීපදෙනෙකු ආපසු ශ්‍රී ලංකාවට එවීමට අවශ්‍ය කටයුතුද දූත මණ්ඩලය විසින් සලසා දී තිබේ.

2. දකුණු අප්‍රිකාව

I. ද්විපාර්ශ්වික සබඳතා

- මහ කොමසාරිස්වරයා, 2018 දෙසැම්බර් 11 වැනි දින දකුණු අප්‍රිකාවේ ජනාධිපතිතුමාට අක්තපත්‍ර ප්‍රදානය කළේය.
- ප්‍රිටෝරියා මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීහු අවස්ථා කීපයකදීම ජාත්‍යන්තර සබඳතා හා සහයෝගිතා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හමු වී ශ්‍රී ලංකා දකුණු අප්‍රිකා හවුල්කාරිත්ව සංසදයේ හත්වැනි සැසිවාරය කෙරෙහි අවධානය යොමුකරමින් ද්විපාර්ශික සබඳතා වැඩි දියුණු කිරීමේ විධික්‍රම පිළිබඳව සාකච්ඡා පවත්වා තිබේ.
- ශ්‍රී ලංකාව හා දකුණු අප්‍රිකාව අතර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ අවබෝධනා ගිවිසුමකට 2018 ජනවාරි මස විද්‍යා හා තාක්ෂණ අමාත්‍යංශයේ හිටපු ලේකම් උදය ආර් සෙනෙවිරත්න මහතාගේ ප්‍රිටෝරියා සංචාරයේදී අත්සන් තබන ලදී.
- දකුණු අප්‍රිකානු බලධාරීන් විසින් සංවිධානය කරන ලද උත්සව කීපයකට මහ කොමසාරිස්වරයා සහ දූත මණ්ඩලයේ රාජ්‍යතාන්ත්‍රික නිලධාරීහු සහභාගී වුහ. ජනාධිපති සිරිල් රමෆෝසා මැතිතුමා විසින් පවත්වන ලද දිවා භෝජන සංග්‍රහයද යහපාලනය හා සංහිඳියාව සම්බන්ධයෙන් පසුගිය වසර කීපය තුළදී ශ්‍රී ලංකා රජය අත්කරගෙන ඇති ප්‍රගතිය පිළිබඳව කරුණු පැහැදිලි කිරීම සඳහා වූ රැස්වීමක්ද මීට ඇතුළත් වෙයි.

ප්‍රිටෝරියා සඳහා සමගාමීව අක්ත ගන්වන ලද රටවල්

- 2018 මාර්තු මස 12 වැනි දින බොට්ස්වානාහි ජනාධිපතිවරයාගේ වාර්ෂික රාජ්‍යතාන්ත්‍රික කරුණු පැහැදිලි කිරීමේ රැස්වීම.

- රාජ්‍යතාන්ත්‍රික ප්‍රජාවේ සාමාජිකයින් විසින් අතිගරු **මොසැම්බික්** ජනාධිපතිතුමාට සුබපැතුම් ප්‍රදානය කිරීමේ සම්ප්‍රදායික උත්සවය.
- **නැමීබියානු** ජනාධිපතිතුමාගේ ජනාධිපති මන්දිරයේ පැවති වාර්ෂික අලුත් අවරුදු සුබපැතුම් පිරිනැමීමේ උත්සවයට මහ කොමසාරිස්වරයා සහභාගී විය.
- 2018 - 2022 කාලසීමාව සඳහා යුනෙස්කොහි ICH හි IV වැනි කණ්ඩායමේ ආසනයක් සඳහා වූ ශ්‍රී ලංකාවේ අපේක්ෂත්වයට සහාය ලබා ගැනීමේ අරමුණින් මහ කොමසාරිස්වරයා **මොසැම්බික්, නැමීබියාව, මලාවි, එස්වටිනි රාජධානිය, සැම්බියාවහා සිම්බාබ්වේ** යන රටවල දූත මණ්ඩල ප්‍රධානීන් සාකච්ඡා පැවැත්වීය. මෙහිදී ශ්‍රී ලංකාව සාර්ථක ජයග්‍රහණයක අත්කර ගත්තාය.

II.බහු පාර්ශ්වීය සබඳතා

- 2018 ජූලි 29 වැනි දින සිට 2018 අගෝස්තු 5 වැනි දින දක්වා ඩර්බන්හි පැවති ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය (IORA), ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කමිටුව(CSO) හා ඉන්දියානු සාගර සංවාදය (IOD) හා 2018 සැප්තැම්බර් 12 හා 13 දිනවලදී පොර්ට් එලිස්ලිබෙත් හි පැවති නිල් ආර්ථිකය පිළිබඳ ඉන්දියානු සාගර වටද්දර රටවල ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීමට මහ කොමසාරිස් කාර්යාලයීය නිලධාරීහු සහභාගී වූහ.

III. ආර්ථික සබඳතා හා විදේශීය ආයෝජන

- දකුණු අප්‍රිකාව හා ශ්‍රී ලංකාව අතර සිදු වූ සමස්ත වෙළඳ කටයුතුවල වටිනාකම ඇ.ඩො.මිලියන 316.46 කි.මේ අතරින් ශ්‍රීලංකාවෙන් අපනයනය කරන ලද භාණ්ඩවල වටිනාකම ඇ.ඩො.මිලියන 60.68 කි. 2018 වර්ෂය තුළදී දකුණු අප්‍රිකාවෙන් සංචාරකයන් 7416 ක් ශ්‍රී ලංකාවට පැමිණ ඇතිබව වාර්තා වී තිබේ.
- SAITEX,GTS,COMPLAST 2018 සහ"Eid Shopping Festival" යන ප්‍රධාන ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනවලට ශ්‍රී ලංකාවේ සහභාගිත්වයට අවශ්‍ය කටයුතු මෙම දූත මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී.
- මෙම දූත මණ්ඩලය සීමාසහිත "සිනර්පී ට්‍රැවල් පුද්ගලික සමාගම" හා "මැන්ටා ට්‍රැවල් සර්විසස්" සමඟ සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කළේය.
- දකුණු අප්‍රිකාවේ සංචාරක දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද " සංචාරක කටයුතු පිළිබඳ විශිෂ්ට පරිචයන් බෙදාහදා ගැනීම පිළිබඳ වැඩමුළුව" සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වයට අවශ්‍ය කටයුතු මෙම දූත මණ්ඩලය විසින් සලසන ලදී.

- ජොහැන්නස්බර්ග් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය සමඟ සහ වෙනත් වෙළඳ ආයතන හා ව්‍යාපාරික සංගම් සමඟ වෙළඳ කටයුතු ප්‍රවර්ධනය කිරීමෙහිලා රැස්වීම් හා සාකච්ජා කීපයක් මහ කොමසාරිස්වරයා විසින් පවත්වන ලදී.
- ශ්‍රී ලංකා - දකුණු අප්‍රිකා ව්‍යාපාරික සංසදය සංවිධානය කරන ලද අවධියේදී, ජෝහැන්නස්බර්ග් වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ ජාලකරන සැසියට මහකොමසාරිස් කාර්යාලයට සහභාගී විය.
- ආර්ථික රාජ්‍යතාන්ත්‍රික වැඩසටහන යටතේ 2018 නොවැම්බර් 20-22 දිනවලදී කේප් ටවුන්හිදී පැවති දකුණු අප්‍රිකාවේ ජාත්‍යන්තර ඇගලුම්, රෙදිපිළි හා පාවහන් ආනයනය වෙළඳ ප්‍රදර්ශනයට (ATF වෙළඳ ප්‍රදර්ශනය) දූත මණ්ඩලය සහභාගී විය. මෙහිදී ශ්‍රී ලාංකික අපනයනකරුවන් පස් දෙනෙකු විසින් සිය නිෂ්පාදන ප්‍රදර්ශන කරන ලදී.
- 2018 දෙසැම්බර් 08 වැනි දින DIRCO විසින් ශ්‍රී ලංකාවේ සංචාරක කටයුතු හා ලංකා තේ පිළිබඳ තොරතුරු පලකළ ප්‍රදර්ශනය කළ 2018 වාර්ෂික රාජ්‍යතාන්ත්‍රික විනෝද වෙළඳ ප්‍රදර්ශනයේ ශ්‍රී ලාංකික ප්‍රදර්ශන කුටිය මහ කොමසාරිස් කාර්යාලය විසින් සංවිධානය කරන ලදී.

IV. සංස්කෘතික සබඳතා

- ශ්‍රී ලාංකික ප්‍රජාවේ සහභාගීත්වයෙන් මෙම දූත මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ 70 වැනි නිදහස් දින සැමරුම් හා රාජ්‍යතාන්ත්‍රික පිළිගැනීමක් පවත්වන ලදී.
- මහ කොමසාරිස් කාර්යාලය දකුණු අප්‍රිකාවේ වෙසෙන ශ්‍රී ලාංකික බෞද්ධ ප්‍රජාවගේ සහභාගිත්වයෙන් 2018 අප්‍රියෙල් 29 වැනි දින වෙසක් දිනය සමරන ලදී. පිරිත් දේශනය, භාවනා වැඩසටහනක්, පොල්තෙල් පහන දැල්වීම හා වෙසක් කූඩු හා භක්ති ගීත ගායනයක් මෙම අංග අතරට ඇතුළත් විය. තායිලන්ත ප්‍රධාන පූජකතුමා හා තායිලන්ත බැතිමත්තුද මෙම උත්සව අවස්ථා සඳහා සහභාගී වූහ.
- දෙරට අතර සබඳතා ප්‍රවර්ධනය කිරීම සඳහා ජෝහැන්නස්බර්ග් භාවනා මධ්‍යස්ථානය (තායිලන්ත විහාරස්ථානය) විසින් සංවිධානය කරන ලද ආගමික හා සංස්කෘතික අංග සඳහා මහ කොමසාරිස් කාර්යාලය නිරන්තරයෙන්ම සහභාගී වෙයි.
- (ශ්‍රී ලාංකික සංස්කෘතික, ආහාර, ජායාරූප හා සම්ප්‍රදායික ඇදුම්) ජාත්‍යන්තර සබඳතා හා සහයෝගිතා දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද රාජ්‍යතාන්ත්‍රික වෙළෙඳපළේදී ප්‍රදර්ශනය කරන ලදී.
- ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය, 2018 නොවැම්බර් 11 වැනි දින මහ කොමසාරිස් නිල නිවසේදී දෙමළ ප්‍රජාව වෙනුවෙන් දීපාවලි උත්සවය පවත්වන ලදී.

- පුජ්‍ය ක්‍රිට්සාකොල් ෆාඉනෝයි හිමියන්ගේ ආරාධනයකට අනුව, ජොහැන්නස්බර්ග් භාවනා මධ්‍යස්ථානයේ "ඇබ්බෝට්" හිදී පැවති ථේරවාදී බෞද්ධයන්ගේ කඨින චීවර පූජාකිරීමේ උත්සවයට මහ කොමසාරිස්වරයා සහ දූත මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සහභාගී වූහ.

5. ඉතියෝපියාව

I. ද්විපාර්ශ්වික සබඳතා

නැගෙනහිර අප්‍රිකා කළාපයේ පිහිටුවා ඇති එකම නියෝජනය වශයෙන්, මෙම දූත මණ්ඩලය, ශ්‍රී ලංකාවේ වෙළඳ හා ආර්ථික සබඳතා කළාපය තුළ වැඩි දියුණු කිරීම සඳහා මාර්ග සෙවීමේ අරමුණින් යුතුව ශ්‍රී ලංකාවේ දේශපාලන හා ආර්ථික අභිලාෂයන් ඉතියෝපියාවේ මෙන්ම මෙම දූත මණ්ඩලය සඳහා සමගාමීව අක්තගනවන ලද වෙනත් රටවලද ප්‍රවර්ධනය කිරීමට කැපවී කටයුතු කරයි. මේ අනුව, මෙම දූත මණ්ඩලය, සමාලෝචනයට බඳුන්වන කාලය තුළදී පහත දැක්වෙන සම්භාවනීය පුද්ගලයන් හා නියෝජිතායතන සමඟ සාර්ථක රැස්වීම් පැවැත්විය.

- ඉතියෝපියා විදේශ කටයුතු අමාත්‍යාංශයේ විදේශ කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යවරයා සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ ක්‍රමවත් පදනමක් යටතේ සිදුකරනු ලබන කටයුතු.
- ශ්‍රී ලංකාවේ ඇතිවෙමින් පවතින සමාජයීය දේශපාලන ප්‍රවණතා පිළිබඳව මත සාදන්නන්, බුද්ධි මණ්ඩල, මාධ්‍යවේදීන් හා දේශපාලන නායකයන් සමඟ ක්‍රමවත් පදනමක් යටතේ සිදුකරනු ලබන කටයුතු.
- විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත සේනානායක මැතිතුමා, 2018 සැප්තැම්බර් 13-17 දිනවලදී ඉතියෝපියාවේ සංචාරයක නියැලුණු අතර මෙම දූත මණ්ඩලය, පහත සඳහන් සම්භාවනීය පුද්ගලයන් / සංවිධාන සමඟ රැස්වීම් සංවිධානය කළේය.

  අ.ඉතියෝපියාවේ අතිගරු ජනාධිපතිතුමා.

  ආ.ඉතියෝපියාවේ ගරු විදේශ කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යතුමා.

  ඇ.ඉතියෝපියාවේ විදේශ කටයුතු අමත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්.

  ඈ. ඉතියෝපියානු ආයෝජන කොමිෂන් සභාව.

  ඉ. අප්‍රිකානු සංගම් කොමිෂන් සභාවේ වැඩ බලන සභාපතිනි.

  ඊ. යුනිස්කෝහි විධායක අධ්‍යක්ෂ

  උ. ඉතියෝපියානු වාණිජ මණ්ඩල

- සමාලෝචනයට බඳුන් වන කාල සීමාව තුළදී ශ්‍රී ලංකාව, රටවල් 55 කින් සමන්විත වන අප්‍රිකානු කළාපයේ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල 6 ක් පමණක් පවත්වාගෙන යන හෙයින්, ශ්‍රී ලංකාව දැනට අප්‍රිකානු මහාද්වීපයේ ප්‍රමාණවත් තරමින් නියෝජනයක් නොකරන බව සැලකිල්ලට ගනිමින්, තානාපතිවරයා/අප්‍රිකානු සංගමයේ නිත්‍ය නියෝජිතවරයා අප්‍රිකානු රටවල් සමඟ ශ්‍රී ලංකාවේ ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් යුතුව අඩිස් අබාබා හි වෙසෙන අප්‍රිකානු තානාපතිවරුන් සමඟ රැස්වීම් රැසක් පැවැත්වීය. (එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පිළිගැනීමට ලක්වී ඇති රටවල් සංඛ්‍යාව 54 කි.)
- ඉතියෝපියානු විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ලද අයදුම්පත් පහක් අවශ්‍ය කටයුතු සඳහා අමාත්‍යාංශයට යොමුකර තිබේ.
- ශ්‍රී ලංකාවේ අභිලාෂයන් අප්‍රිකානු කලාපය තුළ ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම වසරතුළදී, ඉතියෝපියාවේ සඳහා ශ්‍රී ලංකා තානාපතිවරයා අප්‍රිකානු ජාතික පුවත්පත්, ගුවන් විදුලිය හා රූපවාහිනී මධ්‍යස්ථාන සමඟ සම්මුඛ සාකච්ඡා රාශියකට සහභාගී විය. අප්‍රිකානු රටවල් සමඟ ශ්‍රී ලංකාව පවත්වන සබඳතා ශ්‍රී ලංකාවේ සංචාරක කටයුතු, වෙළඳාම, ආයෝජන යන ක්ෂේත්‍රවල ශ්‍රී ලංකාවේ පවතින ඉහළ හැකියාව ශ්‍රී ලාංකික පුහුණු පුද්ගලයන් විදේශීය රැකියාවල නියුක්ත කරවීමට ඇති ඉඩකඩ ආදිය ඇතුළත් ක්ෂේත්‍ර රැසක් මෙමඟින් ආවරණය විය.

අඩිස් අබාබා සිට සමගාමීව අක්තගන්වා ඇති රටවල්.

- **ජිබුටි, සෝමාලියා සුඩාන් ජනරජය හා දකුණු සුඩානය** යන රටවල තානාපතිවරුන් සමඟ මෙම තානාපති කාර්යාලය නිරන්තරයෙන්ම සාකච්ඡා පැවැත්විය. (සුඩාන ජනරජය වර්තමානයේ ඊජිප්තුවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සඳහා අක්ත ගන්වා තිබේ.)
- ජිබුටි සඳහා සමගාමීව අක්ත ගන්වා ඇති ප්‍රථම තානාපතිවරයා වශයෙන් මෙම තානාපතිවරයා **ජිබුටිහි** ජනාධිපති අතිගරු ඉස්මයිල් ඕමාර් ගුලුල්ලේ මැතිතුමාට 2018 නොවැම්බර් 05 වැනි දින අක්තපත්‍ර ප්‍රදානය කළේය.
- ජිබුටිහි විදේශ කටයුතු අමාත්‍ය මොහොමඩ් අලි යුසොයුෆ් මැතිතුමා සමඟ සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ තානාපතිවරයා, 2018 නොවැම්බර් මස 05-06 දින වලදී ජිබුටිහි නිරත වූ සංචාරයේදී රැස්වීම් පැවැත්විය. (එක්සත් ජාතීන්ගේ අංශයේ අධ්‍යක්ෂ ජනරාල්, ආසියා අංශයේ අධ්‍යක්ෂ ජනරාල්, සන්ධාන ප්‍රධානි මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අතර විය)

- බුරුන්දි හි පළමු උප ජනාධිපතිතුමා 2018 ඔක්තෝබර් 25-28 දිනවලදී නිරත වූ ශ්‍රී ලංකා සංචාරය කටයුතු මෙම දූත මණ්ඩලය විසින් සම්බන්ධීකරණය කරන ලදී. දැනට ශ්‍රී ලංකාවේ බුරුන්දි සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා නොපවත්වයි.

II. බහු පාර්ශවීය සබඳතා

- අප්‍රිකානු සංගම් කොමිෂන් සභාවේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත කාර්යාලය ලෙස මෙම දූත මණ්ඩලය, අප්‍රිකානු සංගම් කොමිෂන් සභාව සමඟ සමීප හා සුහද සබඳතා පවත්වාගෙන යයි.
- අප්‍රිකානු සංගම් කොමිෂන් සභාව සිදුකරනු ලබන කටයුතු පුළුල් කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකාවේ සමාජ දේශපාලන ප්‍රවණතා පිළිබඳව කරුණු පැහැදිළි කිරීම සඳහා එම කොමිෂන් සභාවේ සභාපතිනි, නියෝජ්‍ය සභාපතිනි හා කොමසාරිස්වරුන් සමඟ මෙම දූත මණ්ඩලයට වාර රැස්වීම පැවැත්වීය.
- 2018 ජනවාරි මස අඩිස් අබාබා හිදී පැවති විධායක සභාවේ 32 වැනි සාමාන්‍ය සැසිවාරය විවෘත කිරීමේ හා අවසාන කිරීමේ උත්සව අවස්ථාවලදී හා අප්‍රිකානු සංගමයේ 30 වැනි සාමාන්‍ය සැසිවාරය විවෘත කිරීමේ හා අවසාන කිරීමේ උත්සව අවස්ථාවලදී තානාපතිවරයා ශ්‍රී ලංකාව නියෝජනය කළේය.
- අප්‍රිකානු සංගම් කොමිෂන් සභාව සඳහා අක්ත ගන්වා ඇති අප්‍රිකානු සංගමයට අයත් නොවන සාමාජික රටවල (අවධිමත් කණ්ඩායම) වටමේස සාකච්ඡා, සමාජ වැඩමුළු ආදිය සංවිධානය කිරීමට සහාය ලබාදෙමින් මෙම දූත මණ්ඩලය ශ්‍රී ලංකාව නියෝජනය කළේය.
- මෙම දූත මණ්ඩලය, **දකුණු සුඩාන** තානාපතිවරුන්ගේ කණ්ඩායම (දකුණු සුඩානය සඳහා අක්තගන්වන ලද තානාපතිවරුන්ගේ අවිධිමත් කණ්ඩායම) සමඟ රැස්වීම් / වැඩමුළු පැවැත්වීමට ක්‍රියාකාරීව කටයුතු කළේය.
- යුනෙස්කෝ සංවිධානයේ අනුග්‍රහය යටතේ, ශ්‍රී ලංකාව හා අප්‍රිකා සංගමය අතර සංචාරක හා සංස්කෘතික සහයෝගීතාව පිළිබඳ ගිවිසුමකට අත්සන් තැබීමට ඇති හැකියාව පිළිබඳව සොයා බැලීමට අප්‍රිකාව සඳහා යුනෙස්කෝ අධ්‍යක්ෂවරයා සමඟ හමුවක් තානාපතිවරයා විසින් පවත්වන ලදී.
- ශ්‍රී ලංකාවේ නියෝජිතවරයා වශයෙන් උතුරු ඉතියෝපියාවේ ඇඩ්වා හිදී පවත්වන ලද පෑන් - අප්‍රිකා ජාත්‍යන්තර සමුළුවට ශ්‍රී ලංකා තානාපතිවරයා, 2018 අප්‍රියෙල් 23-24 දිනවලදී සහභාගී විය.

- 2018-2022 කාලසීමාව සඳහා අස්පෘශ්‍ය සංස්කෘතික උරුමය (ICH) පිළිබඳ කමිටුවේ ශ්‍රී ලංකා අපේක්ෂකත්වය සඳහා සහාය ඉල්ලා සිටිමින් තානාපතිතුමා, **අප්‍රිකානු රටවල් දූත මණ්ඩල ප්‍රධානීන් 34 දෙනෙකු** හා ඉතියෝපියාවේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ජාත්‍යන්තර සංවිධානවල අධ්‍යක්ෂ ජනරාල්වරුන් සමඟ රැස්වීම් පැවැත්වීය. ඉතියෝපියාව ඇතුළු අප්‍රිකානු රටවල් වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට සහය ලබාදුන් අතර මෙහි ප්‍රතිඵලයක් ලෙස, ජන්ද 122 ක් ලබා ගත් ශ්‍රී ලංකාව මෙම කමිටුව සඳහා තොරා පත් කරගන්නා ලදී.
- 2018 සැප්තැම්බර් 03-04 දිනවලදී අඩිස් අබාබාහිදී ද අප්‍රිකානු සංගමී පැවති සර්ව තැපැල් සංගමයේ ඇති විශේෂ කොන්ග්‍රසයට සහභාගී වූ ශ්‍රී ලංකාවේ තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍ය ගරු එච්. එම්.අබ්දුල් හලීම් මහතාගේ නායකත්වයෙන් නියෝජිත කණ්ඩායම් පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු මෙම තානාපති කාර්යාලය විසින් සිදුකරන ලදී.
- 2018.05.11 දින අඩිස් අබාබා හි පැවති අප්‍රිකානු සංගමී ගිවිසුම් අපරානුමත කිරීම හා දේශීය නීතිකරණයට අනුව තත්ත්වය සැකසීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ මැන්ඩෙලා ප්‍රතිපත්ති සංසදයටද මෙම දූත මණ්ඩලය සහභාගී විය.
- අප්‍රිකානු සංගමී කොමිෂන් සභාවේ පැවති අප්‍රිකානු දින සැමරුම්ද දූත මණ්ඩලය විසින් නියෝජනය කරන ලදී.

III. ආර්ථික සබඳතා හා විදේශීය ආයෝජන

- ශ්‍රී ලංකාව ඉතියෝපියාව සමඟ පවත්වන වෙළෙඳ ආයෝජන සබඳතා තවදුරටත් වැඩි දියුණු කිරීමේ අරමුණෙන්, මෙම දූත මණ්ඩලය, පහත සඳහන් ඉතියෝපියානු නිලධාරීන් / නියෝජිතායතන සමඟ රැස්වීම් පැවැත්වීය.
  - අ)අප්‍රිකානු සංගමී කොමිෂන් සභාවේ වෙළඳ හා කර්මාන්ත කොමසාරිස්වරයා.
  - ආ) ඉතියෝපියාවේ ආයෝජන කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරිවරයා හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්.
  - ඇ) අඩිස් අබාබා වාණිජ මණ්ඩලය හා ආයෝජන ආංශික සංගමය.
  - ඈ) පෑන් අප්‍රිකා වාණිජ මණ්ඩලය.
  - ඉ) ඉතියෝපියානු වාණිජ මණ්ඩල සහ ආංශික සංගමය.

ඊ) ජිබුටි, සුඩාන ජනරජය, දකුණු සුඩාන හා සෝමාලියා තානාපති කාර්යාලවල තානාපතිවරුන් හා වෙළෙඳ නිලධාරීන්.

උ) 2018 නොවැම්බර් මාසයේදී තානාපතිතුමාගේ ජිබුටි සංචාරයේදී, එනම් ජිබුටි වාණිජ මණ්ඩලයේ සභාපතිවරයා සමඟ ශ්‍රී ලංකාවේ වෙළෙඳ කටයුතු පුළුල් කිරීමේ අරමුණින් රැස්වීමක් පැවැත්විය.

- ද්විපාර්ශ්වික වෙළඳාම හා ආර්ථික සබඳතා ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් තොරතුරු හුවමාරු කිරීම සඳහා, විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත සේනානායක මැතිතුමා 2018 සැප්තැම්බර් මස නියැලුණු සංචාරය අතරතුර දී මෙම දූත මණ්ඩලය විසින් ඉතියෝපියානු ආයෝජන කොමිෂන් සභාවේ හා වෙළඳ මණ්ඩලවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ රැස්වීම පැවත්වීමට අවශ්‍ය කටයුතු සංවිධානය කරන ලදී.
- ඉතියෝපියාවේදී ශ්‍රී ලාංකික ව්‍යාපාරික අයතනය විවෘත කිරීම 2018 ජූලි 02 වැනි දින සීමාසහිත ඔගාබෝ ග්ලෝබල් පර්ෆියුමෙරීස් පුද්ගලික සමාගම හා ශ්‍රී ලංකාවේ සීමාසහිත ටෙක්ස්ටයිල් උපදේශන කළමනාකරණ පුද්ගලික ආයතනය හා ඉතියෝපියාවේ අඩිස් අබාබා හි අලෙටා ලෑන්ඩ් ගෲප් අතර ඒකාබද්ධ ව්‍යාපාරයක් ස්ථාපනය කිරීම සඳහා වූ ගිවිසුමට රුව අලංකරණ ආලේපන හා සුවඳ විලවුන් නිෂ්පාදනාගාරයක් ඉතියෝපියාවේ පිහිටුවීම සඳහා තානාපතිවරයාගේ අනුග්‍රහය යටතේ අත්සන් තබන ලදී.
- 2018 වසරේදී ඉතියෝපියාවට පැමිණි පහත සඳහන් ව්‍යාපාරික නියෝජිත කණ්ඩායම් සමඟ දූත මණ්ඩලය සාර්ථක රැස්වීම් පවත්වා තිබේ.

  අ. සීමාසහිත ඔරේන්ජ් ඉලෙක්ට්‍රිකල්ස් පුද්ගලික සමාගම.
  ආ. සීමාසහිත සියෙරා කන්ස්ට්‍රක්සන් පුද්ගලික සමාගම.
  ඇ. සීමාසහිත ඔගාබු ග්ලෝබල් පර්ෆියුමෙරීස් පුද්ගලික සමාගම.
  ඈ. ඉන්ෆෝමැටික්ස් කම්පියුටර් සොලියුෂන්ස්.
  ඉ. සීමාසහිත විල්කින්ස් ශ්‍රී ලංකා සමාගම.
  ඊ. සීමාසහිත ස්මාර්ට් ෂර්ට් පුද්ගලික සමාගම.
  උ. සීමාසහිත එස් ඇන්ඩ් ඩී කෙමිකල්ස් පුද්ගලික සමාගම
  ඌ. සීමාසහිත ඉකොනො පැක්ස් පුද්ගලික සමාගම
  එ.කේ.එම්.බී. ටෙක්ස්ටයිල්ස් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස්
  ඒ. සීමාසහිත 20 කියුවේ ලොජිස්ටික්ස් පුද්ගලික සමාගම
  ඔ. සීමාසහිත මිහිරාජ් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම
- විදුලිබල පැනල නිෂ්පාදන සමාගමක් වන සීමාසහිත වෙනොරා ලංකා විදුලිබල පැනල සමාගම, ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහය ඇතිව,

2018 ඔක්තෝබර් 05 වැනි දින ඉතියෝපියාවේ එම සමාගමේ නිෂ්පාදන දියත් කළේය.

- සීමාසහිත සන්කන් ඕවර්සීස් පුද්ගලික සමාගම සිමාසහිත සෝ ඉංජිනියරින් පුද්ගලික සමාගම, සීමාසහිත වී විදුලිබල පුද්ගලික සමාගම සහ සීමාසහිත ELS ඉදිකිරීම් පුද්ගලික සමාගම නියෝජනය කරමින් ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් සමාගම විසින් මෙය 2018 නොවැම්බර් 01 වන දින තානාපති පරිශ්‍රයේදී ව්‍යාපාරික ප්‍රවර්ධන වැඩසටහනක් පවත්වන ලදී.

IV.සංස්කෘතික සබඳතා

- තානාපති කාර්යාලයේ මඟපෙන්වීම යටතේ, ඉතියෝපියාවේ වෙසෙන ශ්‍රී ලාංකිකයෝ, 2018 අප්‍රියෙල් මස ඉතියෝපියාවේ හවස්ස කර්මාන්ත උද්‍යානයේදී සිංහල - දෙමළ අලුත් අවුරුද්ද සැමරීම සඳහා උත්සවයක් සංවිධානය කළහ.

V.කම්කරු සුභසාධනය

- දැනට ශ්‍රී ලාංකිකයෝ 500 ක් පමණ ඉතියෝපියාවේ රැකියාවල නියුක්තව සිටිති. එහි වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගේ සුභසාධන පහසුකම් වැඩි දියුණු කිරීම පිළිබඳව හා ඔවුන්ට ආදාළව පවත්නා වෙනත් ගැටලු සම්බන්ධව ඉතියෝපියානු ආයෝජන කොමිෂන් සභාව හා අදාළ වෙනත් බලධාරීන් සමඟ මෙම දූත මණ්ඩලය සාකච්ජා රාශියක් පැවැත්වීය.
- සංක්‍රමණිකයන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය හා මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳව එක්සත් ජාතීන්ගේ ආයතනයේ (UNODC) සහාය ඇතිව මෙම දූත මණ්ඩලය 2018/05/31 වැනි දින සෝමාලියාවේ බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීමට යටත්ව සිටි ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන් 12 කු ශ්‍රී ලංකාවට එවීය.
- 2014 වසරේ සිට ඉතියෝපියාවේ රඳවාගෙන සිටි ශ්‍රී ලාංකිකයන් සිවු දෙනෙකු මෙම වසරේ මාර්තු මස නිදහස් කරන ලද අතර ඔවුන්ගෙන් දෙදෙනෙකු 2018/03/15 දින ශ්‍රී ලංකාවට එවන ලදී. අනෙකුත් ශ්‍රී ලාංකිකයන් දෙදෙනා ඇප මත නිදහස් කළ අතර ඉතියෝපියාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ඇති මෙම නඩුව ඉක්මනින් අවසාන කර ගැනීම සඳහා මෙම දූත මණ්ඩලය නීතිය බලාත්මක කිරීමේ බලධාරීන් සමඟ කටයුතු කරමින් සිටී.

4. කෙන්යාව

I. ද්විපාර්ශ්වික සබඳතා

- ශ්‍රී ලංකාව හා කෙන්යාව අතර ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කිරීමෙහිලා කෙන්යානු බලධාරීන් සමඟ ද්විපාර්ශ්වික රැස්වීම් රැසක් පවත්වන ලදී.
- මෙම මහ කොමසාරිස් කාර්යාලය විසින් ශ්‍රී ලංකාවෙන් කෙන්යාවේ නිරත වූ ඉහල මට්ටමේ සංචාර සඳහා අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණ කරන ලදී. එම සංචාර මෙසේය.
  - ගරු විදේශ කටයුතු අමාත්‍යතුමාගේ කෙන්යා සංචාරය (ජුනි 24 - 28)
  - ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා මෙම සංචාරය තුළදී විදේශ කටයුතු පිළිබඳ කැබිනට් ලේකම් ආචාර්ය මොනිකා ජුමා මහත්මිය හා පරිසර ව්‍යපෘතිවලදී සයයෝගිතාව පිළිබඳ "වර්ල්ඩ් ඇන්ග්‍රෝ ෆොරස්ට්‍රි" හි අධ්‍යක්ෂ ජනරාල් ටෝනි සයිමොන් මහතා හමුවිය.
  - සෝමාලියාවේ වෙරළෙන් ඔබ්බෙහි වූ මුහුදු කොල්ලකෑම් පිළිබඳ කණ්ඩායමේ (CGPCS) 21වැනි සැසිවාරයට සහභාගී වූ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමට අවශ්‍ය පහසුකම් සලසන ලදී.මෙය 11-13 දිනවලදී නයිරෝබිහිදී පවත්වන ලදී.
  - අගෝස්තු 3-10 දිනවලදී කෙන්යාවේ සංචාරයක නියැලුණු කණ්ඩායමේ නායකත්වය උසුලන ලද්දේ ජාත්‍යන්තර වෙළෙඳ රාජ්‍ය අමාත්‍ය ගරු සුජීව සේනසිංහ මැතිතුමා විසිනි.
  - විදේශ කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත සේනනායක මැතිතුමා ඔක්තෝම්බර් 21-25 දිනවලදී රුවන්ඩාවේ සංචාරයක නියැලිණි.
  - කෙන්යාවේදී සංවිධානයට කරන ලද නිල් ආර්ථික සමුළුවට ශ්‍රී ලාංකික නියෝජිත කණ්ඩායමක් නොවැම්බර් 26-28 දිනවලදී සහභාගී විය.
  - දෙසම්බෙර් 10-14 දිනවලදී කෙන්යාවේ පැවති ගුවන්සේවා පිළිබඳ සාකච්ජාවලට ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමක් සහභාගී විය.
    - ද්විපාර්ශ්වික සාකච්ජාවලදී හා පොදු සංසදවලදී ශ්‍රී ලංකාවේ ජනාධිපති ශිෂ්‍යත්ව සඳහා ලබා දුන් ප්‍රචාරාත්මක කටයුතුවල ප්‍රතිඵලයක් ලෙස, කෙන්යානු ශිෂ්‍ය ශිෂ්‍යාවෝ 6 දෙනෙක් ශ්‍රී ලංකාවේ පාඨමාලා සඳහා අයදුම් කළහ.
    - ශ්‍රී ලංකාවේ පැවති ඉන්දියානු සාගර වටද්දර රටවල සංගමයේ සමුද්‍රීය සුරක්ෂිතභාවය හා ආරක්ෂාව පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම් සමුළුව (සැප්තැම්බර් 4- 5) හා ශ්‍රී ලංකාව විසින් සත්කාරකත්වය ලබාදුන් ඉන්දියානු සාගරය අපගේ අනාගත සමුළුව අර්ථකථනය කිරීම සඳහා කෙන්යාවේ බලධාරීන්ගේ සහභාගිත්වය මෙම මණ්ඩලය විසින් තහවුරු කරන ලදී (ඔක්තෝබර් 11-12)

නයිරෝබිහි සිට සමගාමීව අක්තගන්වන ලද රටවල්

- ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ උගන්ඩා සංචාරය සඳහා මෙම මහකොමසාරිස් කාර්යාලය අවශ්‍ය පහසුකම් සලසන ලදී.(ජුනි 20-24) ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ මෙම සංචාරයේදී, උගන්ඩාවේ ජනාධිපති යොවිපි කගුටා මුනිවේනි මැතිතුමා, අග්‍රාමාත්‍ය ගරු ආචාර්ය රුහකානා රුගන්ඩා මැතිතුමා, විදේශ කටුයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු ඔකෙලෝ ඕර්යෙම් මැතිතුමා හා අභ්‍යන්තර දේශීය කටයුතු පිළිබඳ අමාත්‍ය ජනරාල් ඔඩොන්ගෝ මැතිතුමා බැහැදුටු අතර එහිදී ආරක්ෂා සහයෝගීතාව, වෙළඳාම හා ආයෝජන පිළිබඳ සාකච්ජා පැවැත්වීය.
- ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ගරු රුවන් විජේවර්ධන මහතා 14-18 දිනවලදී රුවන්ඩාවේ නිරත වූ සංචාරයේ කටයුතු සම්බන්ධීකරණය කරන ලද්දේ මෙම මහකොමසාරිස් කාර්යාලය විසිනි (ශ්‍රී ලංකාව හා රුවන්ඩාව අතර ආරක්ෂක සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුමට මෙම සංචාරයේදී අත්සන් තබන ලදී).
- රාජ්‍යතාන්ත්‍රික හා නිල විදේශ ගමන් බලපත්‍ර හිමියන් විසා බලපත් ලබා ගැනීමෙන් නිදහස් කිරීම පිළිබඳව ටැන්සානියාව, උගන්ඩාව හා රුවන්ඩාව සමඟ අවබෝධතා ගිවිසුම් වලට අත්සන් තැබීමේ කටයුතු මෙම දූත මණ්ඩල විසින් ආරම්භ කරන ලදී.
- ශ්‍රී ලංකාවේ හා රුවන්ඩාවේ දූත මණ්ඩල අතර අවබෝධතා ගිවිසුමකට එළඹීමේ කටයුතු ආරම්භ කරන ලදී.
    - ශ්‍රී ලංකාවේ ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සමාජිකයන් 15 දෙනෙකුගේ රුවන්ඩා විදේශීය අධ්‍යයනය සංචාරය සඳහා අවශ්‍ය පහසුකම් සලසන ලදී.
    - ශ්‍රීමත් ජෝන් කොතලාවල කැඩෙට් නිලධාරී වැඩසටහන රුවන්ඩා නිලධාරීන් දෙදෙනෙකුද අණ හා මාණ්ඩලික පාඨමාලාවලට එක් නිලධාරියෙකුද බඳවා ගන්නා ලදී.
    - කොළඹ පැවති ආරක්ෂක සමුළුවේ විශේෂ අමුත්තා වශයෙන් රුවන්ඩාවේ ආරක්ෂක අමාත්‍යවරයා සහභාගී වූ අතර එම සංචාරය සඳහා අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණ කරන ලද්දේ මෙම දූත මණ්ඩලය විසිනි.
    - ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ සාකච්ජා කිරීමෙන් මෙම මහකොමසාරිස් කාර්යාලය විසින් ටැන්සානියාව සඳහා නිර්වේතනික කොන්ල්වරයෙකු පත්කිරීමට අවශ්‍ය පහසුකම් සලසන ලදී.
    - ශ්‍රී ලාංකිකයන් සඳහා දැනට පවත්නා වීසා බලපත්‍ර ගැටලුව පිළිබඳ මෙම මහ කොමසාරිස් කාර්යාලය ටැන්ටන්සානියානු මහ කොමස්සරිස්වරයා සමඟ රැස්වීම කිපයක් පැවැත්විය.
    - වෙළඳ සබඳතා තවදුරටත් වැඩි දියුණු කර ගැනීම පිළිබඳව සාකච්ජා, පැවැත්වීම සඳහා උගන්ඩාවේ මහා කොමසාරිස්වරුන් සමඟ රැස්වීම් පවත්වන ලදී.

II. බහුපාර්ශ්වීය සබඳතා.

- 2018-2022 කාලසීමාව සඳහා අස්පෘශ්‍ය සංස්කෘතික උරුමය සඳහා ශ්‍රී ලංකාවේ අපේක්ෂකත්වයට කෙන්යාව හා කොංගෝ ප්‍රජාතාන්ත්‍රික ජනරජය සහාය ලබා දෙන බවට මහ කොමසාරිස් කාර්යාල තහවුරු කරන ලදී.
- සමුද්‍රිය කුණු කසල හා ක්ෂුද්‍ර ප්ලාස්ටික් පිළිබඳ තත් කාර්යය විවෘත අන්ත විශේෂඥ කණ්ඩායමට සහභාගී වූ නිලධාරීන් සඳහා අවශ්‍ය පහසුකම් සලසන ලදී.
- 35 UNEP 51 UN-Habitat4-5 රැස්වීම් වලට දූත මණ්ඩල නිලධාරීහු සහභාගී වූ අතර ශ්‍රී ලංකාවේ පිහිටි කේන්ද්‍රස්ථාන සමඟ අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.

III. ආර්ථික සබඳතා හා විදේශීය ආයෝජන

පහත සඳහන් ආර්ථික කටයුතුවලට අදාල ක්‍රියාකාරකම් මහා කොමසාරිස් කාර්යාලය විසින් සංවිධානය කරන ලදී.

- ලංකා සම්භාණ්ඩ සංස්ථාවේ නියෝජිත කණ්ඩායම පැමිණීම නිමිති කරගෙන කෙන්යාවේ රජය හා පෞද්ගලික අංශ නිලධාරීන් අතර වටමේස සාකච්ජාවක් හා හමු සංවිධානය කරන ලදී. (මාර්තු 21-24)
- චැරිටි බසාර්නමින් රාජ්‍යතාන්ත්‍රික ප්‍රජාව හා අමුත්තන් අතරේ ලංකා තේ ප්‍රවර්ධනය කිරීම (අප්‍රේල් 23).
- නයිරෝබි සිටින ශ්‍රී ලාංකික ව්‍යාපාර සමඟ ජාලකරණ සැසියක් පැවැත්වීම (ජූලි 7).
- FMGS හා සැහැල්ලු ඉංජිනේරු අංශ පිළිබඳව ගරු ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යවරයා විසින් ප්‍රධානත්වය ඉසිලූ අපනයන සංවර්ධන මණ්ඩල/පුද්ගලික අංශ නියෝජිත කණ්ඩාම සඳහාම ව්‍යාපාරික රැස්වීම් හා ද්විපාර්ශ්වික හමු රැසක් සංවිධානය කරන ලදී.(සැප්තැම්බර් 3 - 10)

IV. සංස්කෘතික සබඳතා

2018 වසරේදී පහත සඳහන් සංස්කෘතික ක්‍රියාකාරකම් වල මහ කොමසාරිස් කාර්යාලය නිරත විය.

- රුහුණා විශ්ව විද්‍යාලයේ, ප්‍රථම වාර්ෂික නවෝත්පාදන අන්තර් විශ්ව විද්‍යාලයීය තරඟයේ කණ්ඩායම් සමාජිකයින් ලෙස සහභාගී වන ලෙස ආරාධනා කරන ලදී.
- තානාපති කාර්යාලය, AHOM s Charity Bazaar සඳහා සහභාගී වූ අතර කෙන්යාවේ හඳුනාගත් ප්‍රජායාතනවලට මුදල් පරිත්‍යාග කළේය.(අප්‍රියෙල් 23)

- ශ්‍රී ලංකා අලුත් අවුරුදු උළෙල පවත්වන ලදී. (අප්‍රියෙල් 29)
- ශ්‍රී ලංකා විහාරස්ථානයේ ප්‍රජා වෙසක් උත්සවයේදී දන්සැලක් සංවිධානය කරන ලදී.
- නයිරෝබි හි පිහිටි එක්සත් ජාතින්ගේ කාර්යාලයේදී පැවති එක්සත් ජාතීන්ගේ වෙසක් දින සැමරුම් දූත මණ්ඩලය.(මැයි 21)
- කෙන්යාවේ සිනමාපට නිෂ්පාදකයින් අතර ශ්‍රී ලංකාව, රූගත කිරීම් සඳහා සුදුසු රටක් වශයෙන් ප්‍රවර්ධනය කිරීම.(මැයි)
- දූත මණ්ඩලය සිය වෙබ් පිටුව වන www.slhc.nairobi.org දියත් කරන ලදී.(සැප්තැම්බර් 04)
- ශ්‍රී ලංකාවේ තේ පිළිබඳ ප්‍රදර්ශනයක් හා තොරතුරු මධ්‍යස්ථානයක්, කෙන්යාවේ විදේශ අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද ආසියා පැසිෆික් BBAQ උළෙලේදී පවත්වන ලදී.(සැප්තැම්බර් 22)
- ආසියානු නියෝජනය නිත්‍ය නියෝජිතවරියන් සඳහා වූ ශ්‍රී ලංකා රාත්‍රිය / සංස්කෘතික සාදය පවත්වන ලදී. (සැප්තැම්බර් 22)
- කෙන්යාවේ වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාවේ සහභාගිත්වයෙන් කෙන්යාවේදී ප්‍රථම වතාවට දීපවාලි උත්සවය සමරන ලදී.(නොවැම්බර් 11 වැනි දින)
- ශ්‍රී ලාංකික ප්‍රජාවගේ නත්තල් උත්සවය පළමු වතාවට දීපවාලි උත්සවය පළමු වතාවට සමරන ලද අතර මොග්රා ළමා නිවාසයට අවශ්‍ය ආහාර වෛද්‍ය උපකරණ පරිත්‍යාග කරන ලදී.(දෙසැම්බර් 01)
- මහ කොමසාරිස් කලත්‍රයා විසින් රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවල කලත්‍රයින් සඳහා සංවිධානය කරන ලද ශ්‍රී ලංකා ඉවුම් පිහුම් ප්‍රදර්ශනයක් පැවැත්වීම.(දෙසැම්බර් 24)

I. ඊජිප්තුව

I. ද්විපාර්ශ්වික සබඳතා

ඊජිප්තුවේ නිරත වූ පහත සඳහන් සංචාර සඳහා ඊජිප්තුවෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය පහසුකම් සලසන ලදී.

- ගරු කථානායක කරු ජයසූරිය මහතාගේ නායකත්වය යටතේ මන්ත්‍රීවරුන් එකොළහකින් හා නිලධාරීන් තිදෙනෙකු ගෙන් සමන්විත පාර්ලිමේන්තු නියෝජිත කණ්ඩායම 2018 ජූලි මාසේ ඊජිප්තුවේ නිරත වූ සංචාරය.
- මෙම නියෝජිත කණ්ඩායම ඊජිප්තුවේ ගරු අග්‍රාමාත්‍යවරයා, විදේශ කටයුතු අමාත්‍යවරයා, කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යවරයා සමඟ රැස්වීම්

පැවැත්විය. ඔරියන්ටල් ඔර්තොඩොස් දේවස්ථානයේ පාප්වහන්සේ සහ අල් අස්හාර් විශ්ව විද්‍යාලයේ නියොජ්‍ය ග්‍රෑන්ඩ් ඉමාම් ද මවිලවි තුමාද මෙහිදී බැහැ දුටුවේය.

- ඊජිප්තුව හා ශ්‍රී ලංකාව අතර දක්ෂිණ සහයෝගිතා වැඩසටහන යටතේ, කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිලධාරීන් දස (10) දෙනෙක් කෘෂිකර්මය සඳහා ඊජිප්තු ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ (EICA) පැවැති තෙමස් (03) පුහුණු වැඩසටහනකට සහභාගී වූහ.
- ජාතික එකඟතා හා සහජීවන රාජ්‍ය අමාත්‍ය ගරු ඒ.එස්.එම්.ෆවුසි මැතිතුමා හා තැපැල් සේවා හා මුස්ලිම් කටයුතු අමාත්‍ය ගරු එම්..එස්.ඒ හලීම් මැතිතුමා ඔක්තොම්බර් මස පැවති සිද්ධාන්ත හා ප්‍රයෝගික කරුණු අතර ෆැත්මා අලුත් කිරීම පිළිබඳව ජාත්‍යන්තර සමුළුවට සහභාගී වූ අතර ඉන් අනතුරුව අල් අස්හාර් විශ්ව විද්‍යාලය සමඟ රැස්වීමක් පැවැත්වුහ.
- නානාපති කාර්යාලය, 2018 ඔක්තොම්බර් 03-06 දිනවලදී ඊජිප්තුවේ ෂාර්ම් එල් - ෂෙයික් හිදී පැවති ලෝක යෞවන සංසදයට සහභාගී විය. මේ සඳහා සත්කාරකත්වය ලබාදෙන ලද්දේ ඊජිප්තු අරාබි ජනරජයේ ජනාධිපති අතිගරු අබ්දෙල් ෆැට්ටාහ් එල් - සිසි මැතිතුමා විසිනි.
  ඊජිප්තුවේ ජාතිකයන් ශ්‍රී ලංකාවේ නියැලුණු පහත සඳහන් සංචාර හා සම්බන්ධ කටයුතුද මෙම නානාපති කාර්යාලය විසින් සම්බන්ධීකරණය කරන ලදී.

- ඊජිප්තුවේ තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ඊජිප්තු නිලධාරීන් හය (06) දෙනෙකුගෙන් සමන්විත වන තරුණ නියෝජිත කණ්ඩායමක්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් 2018 මාර්තු මස සංවිධානය කරන ලද කුරුණෑගල නිකවැරටියේ පැවති "යොවුන්පුර තරුණ උළෙලට" සහභාගී විය.
- ඔක්තෝම්බර් මස කොළඹදී පැවති ශ්‍රී ලංකා විදේශ ප්‍රතිපත්ති හා ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු වැඩසටහනකට ඊජිප්තු විදේශ අමාත්‍යාංශයේ නිලධාරියෙකු සහභාගී විය.

කයිරෝහි සිට සමගාමීව අක්තගන්වා ඇති රටවල්.

- කයිරෝහි ශ්‍රී ලංකා තානාපතිතුමා සුඩාන් ජනරජයේ ජනාධිපති අතිගරු ඕමර් හසන් අහමඩ්අල් බෂීර් මැතිතුමාට අක්තපත්‍ර ප්‍රදානය කළේය.

ශ්‍රී ලංකා තානාපතිතුමා සුඩානයේ නියැලුණු සංචාරයේදී එතුමා සුඩාන ජනරජයේ වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාව සමඟ හමුවක් පැවත්වූ අතර එහිදී ඔවුන් මුහුණ දෙන කොන්සියුලර් ගැටලු පිළිබඳව විමසා බැලිය. තවද, ශ්‍රී ලංකාවේ නිර්වේතනික කොන්සල් සවුද් මොවුන් මොහොමඩ් අහමඩ් එල් බෙරෙඉර් මැතිතුමාද හමුවිය. ඊට අමතරව, සුඩානජන රජයේ වාණිජ මණ්ඩලවල නිලධාරීන් හා සාමාජිකයන් ද හමුවිය.

II.බහුපාර්ශ්වීය සබඳතා

- 2018 නොවැම්බර් 14-29 දිනවලදී ඊජිප්තුවේ ෂාර්ම් එල්-ෂෙයික් හිදී පැවති එක්සත් ජාතීන්ගේ පෛව විවිධත්ව සමුළුවට මෙම තානාපති කාර්යාලය සහභාගී විය. මහවැලි හා පරිසර අමාත්‍යාංශයේ එක් නිලධාරියෙක්ද මෙම සමුළුවට සහභාගී විය.
- තනාපතිවරයා විසින්, 2018 ඔක්තෝම්බර් 21 වැනි දින ආසියා තානාපතිවරුන්ගේ කණ්ඩායමේ මාසික රැස්වීම පවත්වන ලදී.

III. ආර්ථික සබඳතා හා විදේශීය ආයෝජන

- 51 වැනි කයිරෝ වෙළඳ ප්‍රදර්ශනයට ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහභාගී වූ අතර ශ්‍රී ලංකාවේ සහභාගිත්වය අගයමින් එහි සංවිධායකවරුන් විසින් අප වෙත වෙළඳ කුටි නොමිලයේ ලබා දෙන ලදී.
- ඩී.එස්.අයි. සමූහ ව්‍යාපාරයේ නියෝජිත කණ්ඩායමක් කයිරෝ හි සංචාරයක නියැලුණු අතර එහිදී, ව්‍යාපාර ප්‍රවර්ධන කටයුතු සඳහා තානාපති කාර්යාලය විසින් ඔවුනට අවශ්‍ය පහසුකම් සලසන ලදී.
- ADSA බසාර්හිදී තුටු පඬුරු වශයෙන් තේ ලබාදෙමින් තානාපති කාර්යාලය විසින් ලංකා තේ ප්‍රවර්ධන වැඩසටහන සංවිධානය කරන ලදී. ඩිල්මාහ් සමාගම විසින් පරිත්‍යාග කරන ලද තේ මෙහිදි අලෙවිකරන ලදී.
- 2018 දෙසැම්බර් 08-10 දිනවලදී කයිරෝහි පැවති අහාර පිළිබඳ අප්‍රිකා ප්‍රදර්ශනයට සීමාසහිත ස්ටාසෙන් එක්ස්පෝට් පුද්ගලික සමාගමේ සහභාගිත්වයට අවශ්‍ය පහසුකම් තානාපති කාර්යාලය විසින් සලසන ලදී.
- 2017 වසරේදී ඊජිප්තුවේ සිට ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව 2981 ක් වූ අතර එම අගය 2018 වසරේදී 3854ක් දක්වා වැඩිය.(27.8%ක වර්ධනයකි.) ඊජිප්තුවේ ෆාරොනික් ගම්මානයේදී හා

බ්‍රිටිස් විශ්ව විද්‍යාලයේදී සංචාරක කටයුතු ප්‍රවර්ධන වැඩසටහන් තානාපති කාර්යාලය විසින් සංවිධානය කරන ලදී.

- ඊජිප්තුවේ "නයිල් කෲස්" හා පුරා විද්‍යාත්මක බිම් නැරඹීම සඳහා ඊජිප්තුවට පැමිණෙන ලෙස ශ්‍රී ලාංකිකයන් පෙළඹවීමේදී තානාපති කාර්යාලයේදී සහාය පැතූ ශ්‍රී ලාංකික සංචාරක නියෝජිතායතන කිපයකට සහය ලබා දී තිබේ.

I.සංස්කෘතික සබඳතා

ඊජිප්තුවේ වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගේ සහභාගිත්වය ඇතිව තානාපති කාර්යාලය විසින් පහත සඳහන් උළෙලවල් සමරන ලදී.

- පොංගල් බත් පිළියෙළ කිරීම හා අනුභවය සහ සම්ප්‍රදායික හින්දු සැරසිලි හා සිරිත් විරිත් සහිතව තෙපොංගල් උළෙල සමරන ලදී.
- තානාපතිවරයා විසින් පවත්වන ලද දිවා හෝජන සංග්‍රහයෙන් අනතුරුව, කයිරෝහි පිහිටි "නැෂනල් ඔපෙරා හවුස්" හිදී පැවති සංස්කෘතික සංදර්ශනය, ශ්‍රී ලාංකික ප්‍රජාවගේ සහභාගිත්වයෙන් ජාතික දිනය සමරන ලදී. රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන්, රජයේ නියෝජිතයින් හා ව්‍යාපාරික ප්‍රජාවේ සහභාගිත්වයෙන් රාජ්‍යතාන්ත්‍රික පිළිගැනීමේ උත්සවය මෙම ජාතික දින සැමරුම් වලට ඇතුළත් විය.
- ජාතික දින සැමරුම් සඳහා ශ්‍රී ලංකා යුද හමුදා සංස්කෘතික කණ්ඩායම ඊජිප්තුවට පැමිණි අතර තානාපති කාර්යාලය ඔවුන්ගේ සහභාගිත්වයෙන් සංස්කෘතික සංදර්ශනය සංවිධානය කළේය.
- ඊජිප්තුවේ වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගේ සහභාගිත්වයෙන් පාරම්පරික ක්‍රීඩා හා තරඟ ඇතුලත් අලුත් අවුරුදු සැමරුම් සංවිධානය කරන ලදී.
- තානාපති කර්යාලයේදී පවත්වන ලද වෙසක් උළෙලට ශ්‍රී ලාංකික ප්‍රජාව මෙන්ම බෞද්ධ රටවල රාජ්‍යතාන්ත්‍රික නිලධාරීහු ද සහභාගී වූහ.
- ශ්‍රී ලංකාවේ ෂියා හා සුන්නි මුස්ලිම් ප්‍රජාවන්ගේ සහභාගිත්වයෙන් තානාපති කාර්යාලයේදී ඉෆ්තාර් උත්සවය පවත්වන ලදී. ශ්‍රී ලංකාවෙන් හා ඊජිප්තුවෙන් එක් පූජකයෙක් බැගින් සහභාගී වී සාමූහික ආගමික මෙහෙයවල් පවත්වන ලදී.
- ජන නැටුම් හා කලා කටයුතු සඳහා ඔමන්හූර් උළෙලට සහභාගී වූ අතර මෙහිදී කයිරෝහි පැවති බෙර වාදන හා සම්ප්‍රදායානුකූල චිත්‍ර ඇතුළත් වූ ජාතික උළෙලටද අවශ්‍ය පහසුකම් තානාපති කාර්යාලය විසින් සපයන ලදී.

- රාජ්‍ය සංගීත හා නැටුම් කණ්ඩායම, සංස්කෘතික හා කලා කටයුතු සම්බන්ධයෙන් පැවති ඉස්මයිලියා ජාත්‍යන්තර උළෙලේ 19 වැනි වටයට සහභාගී වූ අතර ඒ සඳහා අවශ්‍ය පහසුකම් සලසන ලද්දේ තානාපති කාර්යාලය විසිනි.
- ශ්‍රී ලංකාවේ මැඩිහූර් රාසුල් කණ්ඩායම ඊජිප්තුවේ පැවතිආගමික හා සෆි සංගීත "සාමා" පිළිබඳ ජාත්‍යන්තර උළෙලේ 11 වැනි වටය සඳහා සහභාගී විය.
- මෙහිදී, ශ්‍රී ලාංකික ප්‍රජාවගේ සහභාගිත්වයෙන් නත්තල් මෙහෙයක් පැවැත්වීමෙන් තානාපති කාර්යාලය නත්තල උත්සවය සමරන ලදී.

V.කම්කරු සුබසාධනය

- මෙහි ශ්‍රමිකයන් සිටින්නේ සිය ගණානකි. ඊජිප්තු පවුමේ අගය අඩුවීම හේතුවෙන් ගෘහ සේවක සේවිකාවන් අපේක්ෂාකල ප්‍රතිලාභ අඩුවී තිබේ. නිපුනතා සහතිකයක් ඇති ඇගලුම් සේවක සේවිකාවෙන් සඳහා ඉල්ලුමක් පවතියි. නිපුණතා පිළිබඳ සහතිකවීමේ වැඩපිළිවෙලක් හදුන්වාදෙමින් හොඳ වැටුප් ලබාගැනීම සඳහා සේවකයන් වැඩි වශයෙන් ඊජිප්තුවට යැවීමට අවශ්‍ය පහසුකම් සැලසීමට ශ්‍රී ලංකා රෙදිපිළි හා ඇගලුම් ආයතනයට හැකි වෙයි.
- වීසා බලපත් නොමැති සේවිකාවන්ට කොන්සියුලර් ගාස්තු ගෙවීම හැර වෙනත් දඩුවම්වලට යටත් නොවී රටෙන් පිටවීමට තානාපති කාර්යාලයට සහාය දැක්වීය.

6. **සීෂෙල්ස්**

I. ද්විපාර්ශ්වික සබඳතා

- රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීමේ තිස්වැනි සංවත්සර සැමරුම් වලට සමගාමීව අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා 2018 ඔක්තෝබර් මස සීෂෙල්ස් හි නියැලුණු රාජ්‍ය සංචාරය අතරතුරේදී පහත සඳහන් අවබෝධතා ගිවිසුම්වලට අත්සන් තැබීය.
    - වෘත්තිය තාක්ෂණ විශ්ව විද්‍යාලය හා තාක්ෂණය පිළිබඳ සීෂෙල්ස් ආයතනය අතර අවබෝධතා ගිවිසුම.
    - සීෂෙල්ස් විශ්ව විද්‍යාලය හා මොරටුව විශ්ව විද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.
- සීෂෙල්ස් ජනධිපතිතුමා සමඟ පැවති රැස්වීමකදී අතිගරු ජනාධිපතුමා එකඟතාවයකට පත් පරිදි සීෂෙල්ස් රජයට මුර යාත්‍රා දෙකක් පරිත්‍යාග කිරීමේ කටයුතු මහකොමසාරිස් කාර්යාලය විසින් සම්බන්ධීකරණය කරන

ලදී.(මෙම යාත්‍රා 2019 පෙබරවාරි 01 වැනි දින උප ජනාධිපති ගරු වින්ස්ටන් මෙරිටෝන් මැතිතුමාට බාර දෙන ලදී.)

- මැඩගස්කර ජනරජයේ හා මුරුසි ජනරජයේ ශ්‍රී ලංකාව නියෝජනය කරන නව නිර්වේතනික කොන්සල්වරුන් පත්කිරීමේ කටයුතු සම්බන්ධීකරණ කරන ලදී.

II. බහු පාර්ශ්වීය සබඳතාව

- සෝමාලියාවේ වෙරළෙන් ඔබ්බෙහි මුහුදු කොල්ලකෑම පිළිබඳ කාර්ය කණ්ඩායමක (CGPCS) ලේකම් කාර්යාලය කොළඹ ස්ථාපනය කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.
- බටහිර ඉන්දියන් සාගරයේ අප්‍රිකානු රටවල් සමග සමීපව කටයුතු කිරීමට ශ්‍රී ලංකාව ඉඩ ප්‍රස්ථාව ළඟාකර ගැනීමේ ජාත්‍යන්තර සංසද වලදී එම රටවල සහාය ලබා දෙන බව තහවුරු කර ගැනීමේ අරමුණින් සියලු දෙනා සහභාගී වන සැසිවාරවලට සහභාගී විය.
- "ඉන්දියානු සාගර කොමිෂන් සභාවේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා අයදුම්පතක් ඉදිරිපත් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.
- සීෂෙල්ස්හි පවත්වන ලද නිල් සාගර ආර්ථික සමුළුවේදී ශ්‍රී ලංකාව නියෝජනය කරන ලදී.
- සංස්කෘතික සහයෝගීතාවට අදාළ පර්යේෂණ පැවැත්වීම සඳහා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නියෝජිත පිරිසක් ඔක්තෝබර් මස සීෂෙල් හි නිරත වූ සංචාරයට අවශ්‍ය පහසුකම් සලසන ලදී.

III. ආර්ථික සබඳතා හා විදේශීය ආයෝජන

- ශ්‍රී ලංකාවේ 7 වැනි ජාතික නිදහස් දින සැමරුම්වලට සමගාමිව, 2018 පෙබරවාරි 03 දින "කොරල් ස්ට්‍රෑන්ඩ්" හෝටලයේදී ශ්‍රී ලාංකික අහාර උළෙලක් පැවැත්විය. අතිගරු ජනාධිපතිතුමා නියැලුණු සීෂෙල්ස් රාජ්‍ය සංචාරයේදී තවත් ආහාර උළෙලක් පවත්වන ලදී.
- සීමාසහිත ලංකා හොස්පිට්ල්ස් හි ශාඛාවක්, 2018 ජුනි මස වික්ටෝරියාහි දී විවෘතකරන ලදී. 2018 ඔක්තෝබර් මසට යෙදී ඇති ශ්‍රී ලංකා අතිගරු ජනාධිපතිතුමාගේ රාජ්‍ය සංචාරයේදී මෙය නිල වශයෙන් විවෘත කිරීමට නියමිතය.

- ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම විශේෂඥයින් පිරිසක් විසින් සීෂෙල්ස් ස්වයංක්‍රීය හරිතාගාරයක් ස්ථාපනය කරන ලදී.
- සීෂෙල්ස් හි කුඩා ගොවි පිරිසක් ශ්‍රී ලංකාවේ අධ්‍යයනය චාරිකාවක නිරත විය.
- සීතල කාමර සවිකිරීම් හා පරිසර හිතකාමී කසල උර ලබාදීමේ කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.
- ආයුර්වේද පංචකර්ම රෝහලක් මාහේ වික්ටෝරියාහි විවෘත කිරීමට සැලසුම් කරමින් සිටියි. (මෙය 2019 අප්‍රේල් 24 වන දිනවන විට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ).
- සීෂෙල්ස්හි රෝහල්වලට හෙදියන් බඳවා ගැනීම සඳහා එහි අමාත්‍යාංශය සමඟ පැවැත්වෙන සාකච්ජා සම්බන්ධීකරණය කරන ලදී.
- සීෂෙල්ස්හි කටයුතු ආරම්භ කිරීමෙහිලා උනන්දුවක් දක්වන ව්‍යාපාරික සාකච්ජා පවත්වන ලදී.
- ස්වභාවික පොල්තෙල් අපනයනය කරන ශ්‍රී ලාංකික ව්‍යවසායකයින් සීෂෙල්ස්හි උප ජනාධිපතිතුමා සමඟ සාකච්ජා පැවැත්වීමට අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.

වික්ටෝරියා සිට සමගාමීව අක්තගන්වා ඇති රටවල්

- සීමාසහිත "සන්කන් ඕවර්සීස්" (සීෂෙල්ස්) සමාගමේ උප සමාගමක් මැඩගස්කරයේ විවෘත්ත කිරීම සඳහා මහකොමසාරිස් කාර්යාලය පහසුකම් සලසන ලදී.
- සීමාසහිත කැලණි කේබල් සමාගමේ උප සමාගම්, මැඩගස්කරය, මුරුසිය, කොමොරොන්හි විවෘත කිරීමට අවශ්‍ය පහසුකම්ද මහ කොමසාරිස් කාර්යාලය සලසන ලදී.

IV. සංස්කෘතික සබඳතා

- ශ්‍රී ලංකාවේ 70 වැනි ජාතික දිනයට සමගාමීව, මහකොමසාරිස් කාර්යාලය, සම්ප්‍රදායික ශ්‍රී ලංකා නැටුම් හා සංගීත අංග රඟ දක්වමින් සංස්කෘතික උළෙලක් සංවිධානය කළේය.
- සීෂෙල්ස්හි වෙසෙන ශ්‍රී ලාංකික බෞද්ධ භික්ෂුන්වහන්සේලාගේ ආශීර්වාදය ඇතිව සහ සීෂෙල්ස් බෞද්ධ සංගමය සමඟ කටයුතු සම්බන්ධීකරණයෙන් වෙසක්, පොසොන් හා වප් පුරපසළොස්වක

පෝය දිනයන්හිදී භාවනා වැඩසටහන් ඇතුලුව ආගමික කටයුතු සිදුකරන ලදී.

- ශ්‍රී ලංකා සංගමය සමඟ සහයෝගීතාවයෙන් යුතුව ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේදී පිරිත් දේශනයක් සංවිධානය කරන ලදී.
- මහකොමසාරිස්වරයාගේ නිල නිවසේදී නත්තල් වැඩසටහනක් පවත්වන ලදී.
- සීෂෙල්ස්හි බෞද්ධ විහාරස්ථානයක් ස්ථාපනය කිරීම පිළිබඳව සීෂෙල්ස් රජය සමඟ කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.

V. කම්කරු සුභසාධනය

- සීෂෙල්ස්හි වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාවගේ සුභසාධනය තහවුරු කිරීම සඳහා සීෂෙල්ස්හි හා ශ්‍රී ලංකාවේ බලධාරීන් සමඟ මහකොමසාරිස් කාර්යාලය සමීපව කටයුතු කරයි.
- ශ්‍රී ලාංකික සේවාදායකයන් සීෂෙල්ස් වෙත බඳවා ගැනීමේ අරමුණින් ප්‍රධාන පෙළේ මිනිස් බලය බඳවා ගැනීමේ සමාගමක් සමඟ ගිවිසුමකට අත්සන් තබන ලදී.
- සීෂෙල්ස්හි සිටින ශ්‍රී ලාංකික සේවාදායකයන් හා සම්බන්ධ කම්කරු කටයුතුවලට අදාළ නඩු රාශියක් සම්බන්ධයෙන් මහකොමසාරිස් කාර්යාලය කටයුතු කළ අතර වන්දි ලබා ගැනීමෙහිලා අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.
- සීෂෙල්ස්හි මුහුදේ නීති විරෝධී ධිවර කටයුතු සිදුකරනවා යන සැකය මත ශ්‍රී ලාංකික යාත්‍රා (මුතු කුමාරි හා සුබපැතුම්) රඳවාගත් අතර සීෂෙල්ස්හි අදාළ බලධාරීන් සමඟ මෙම ගැටලුව විසඳීමෙහි ලා අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණ කරන ලද්දේ මෙම මහ කොමසාරිස් කාර්යාලයයි.

කොන්සියුලර් අංශය

කොන්සියුලර් අංශය

හැඳින්වීම

1) 1981 අංක 04 දරන කාර්ය සහ ඉන්පසු 2006 අංක 18 දරන සංශෝධන පනත ප්‍රකාරව ශ්‍රී ලාංකිකයන් සහ ශ්‍රී ලාංකික සම්භවයක් ඇති පුද්ගලයන්ට විදේශ කටයුතු අමාත්‍යාංශය සහයෝගය දක්වන ද්වාරය වනුයේ කොන්සියුලර් කටයුතු අංශය වන අතර ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාල, ශ්‍රී ලංකා තානාපති කාර්යාල, මහකොමසාරිස් කාර්යාල, කොන්සල් කාර්යාල, නිර්වේතනික කොන්සල් කාර්යාල මෙන්ම විදේශීය දූත මණ්ඩල හා ශ්‍රී ලංකාවේ බලයලත් තනතුරු, ශ්‍රී ලාංකික හා වෙනත් දේශීය ආයතන / අධිකාරි මඟින් සිය වැඩකටයුතු සිදුකරයි.
2) කොළඹ 01 සෙලින්කෝ හවුස් හි පිහිටා ඇති කොන්සියුලර් අංශය ලේඛන සහතික කිරීමේ අංශය, නැවත ගෙන්වා ගැනීමේ අංශය, වන්දි අංශය, මරණ අංශය හා විවිධ කටයුතු අංශය යන අංශයන් ගෙන් මෙය සමන්විතය.
3) 2017 ජනවාරි 27 වන දින යාපනයේදී ආරම්භ කළ විදේශ කටයුතු අමාත්‍යාංශයේ පළමු ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාලය මඟින් උතුරු පළාතේ හා ඒ ආසන්න දිස්ත්‍රික්ක වල ජනයාට කොන්සියුලර් සහාය ලබා දේ. දකුණු පළාතේ ජනයාට තම එළිපත්ත ආසනයටම සේවා ලබාදීමට තවත් ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාලයක් මාතර පිහිටුවීමට සියලු කටයුතු ආරම්භ කර ඇත.

අ)2018 වසරේ ප්‍රධාන සංවර්ධන කටයුතු

4) ගැටුම් පවතින අතරතුර විදේශයන්හි සරණාගත තත්වය ඉල්ලා සිටි හා ගැටුම් අවසන් වීමෙන් පසුව ශ්‍රී ලංකාවට ස්වෙච්ජාවෙන් පැමිණි අයවලුන්ගේ කොන්සියුලර් අවශ්‍යතාවන් ආමන්ත්‍රණය කිරීම සඳහා විදේශ අමාත්‍ය තිලක් මාරපන මැතිතුමාගේ මඟ පෙන්වීම යටතේ කොන්සුලර් අංශයේ සම්බන්ධීකරණය ඒකාබද්ධ ජංගම කොන්සියුලර් සේවාවන් දෙකක් කිලිනොච්චිය හා මන්නාරමේදී පවත්වන ලදී.
5) මාරපන අමාත්‍යවරයාද මේ ඒකාබද්ධ කොන්සියුලර් සේවාවන් දෙකටම සහභාගී වූ අතර සහය පතා ආ ජනයා සමඟද කටයුතු කළේය. විදේශ කටයුතු අමාත්‍යාංශය ගැන ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාලයේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව හා ආගමන විගමන දෙපාර්තමේන්තුවේ නිලධාරින්ද මෙම ඒකාබද්ධ කොන්සියුලර් ජංගම සේවා දෙකටම සහභාගී විය.
6) මෙම ඒකාබද්ධ ජංගම කොන්සියුලර් සේවාවන් දෙකේදීම පුරවැසි අයදුම්පත් 422 ක් ලැබුණු අතර කොන්සියුලර් උප්පැන්න සහතික 120 ක්ද නිකුත් කරන ලදී. පුරවැසිභාවය හා සහතික පිළිබඳ උපදෙස් හා මඟ පෙන්වීම් පැතූ අයවලූන්ට ඒ සඳහා පැහැදිලි කිරීම ලබාදුනි.

7) ලේඛන සහතික කිරීම ක්‍රියාවලි විමධ්‍යගත කිරීම හා මෙම සේවය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ලබාදීම සඳහා 2018 අගෝස්තු මස 16 වන දින විදේශ කටයුතු අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

8) අපනයන ලිපි ලේඛන විද්‍යුත් සහතික කිරීම විමධ්‍යගත කිරීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය හා ලංකා වාණිජ මණ්ඩලය 2018 දෙසැම්බර් මස 12 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

9) ශ්‍රී ලංකාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍ය අතර හුවමාරු කිරීමේ ගිවිසුමකට අත්සන් තැබීමට අංශය පත් යෝජනා කර ඇති අතර එය දැනට සිදුවෙමින් පවතී.

ඈ. ලේඛන සහතික කිරීමේ අංශය

10) ලේඛන සහතික කිරීමේ අංශය විසින් නව ඩිජිටල් නාක්ෂණය භාවිතයෙන් ඉලෙක්ට්‍රොනික ලිපි ලේඛන සහතික කිරීමේ ක්‍රම වේදයක් (e-DAS) සපයා ඇත. සියලුම ලංකා දූත මණ්ඩල/විදේශ ස්ථාන සහ ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාලවලට කොළඹ කොන්සියුලර් කටයුතු අංශයට හා අංශයෙන් පිටතට ලේඛන බාගත කිරීමට හැකිවන පරිදි ශ්‍රී ලංකා රජයේ Cloud හි ධාරිතාව හා ක්‍රියාකාරිත්වය වැඩි කිරීම පිණිස ශ්‍රී ලංකා රජයේ Cloud LGC 1 සිට LGC 2 දක්වා වැඩි දියුණු කර ඇත.

11) මෙම අංශය හා ප්‍රාදේශීය කාර්යාලය ලේඛන 300,000 කට ආසන්න ප්‍රමාණයක් සම්බන්ධයෙන් කටයුතු කර ඇති අතර සමාලෝචනයට භාජනය කළ කාල පරිච්ඡේදයේදී ඒවා සහතික කිරීමෙන් රු : මිලියන 232.2 ක් ජනනය වී ඇත.

12) ලේඛන සහතික කිරීමට මුදලින් ගෙවීම සිදු කිරීමට අමතරව ණය කාඩ්පත හා හර කාඩ්පත් මගින් සිදු කරන ගෙවීම් අංශය මගින් බාර ගනී.

ඈ. සිය රට ගෙන්වා ගැනීමේ අංශය.

13) බහුවිධ හේතු මත විදේශයන්හි අතරමං වන ශ්‍රී ලාංකිකයන්ට අදාළ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කරනුයේ සිය රට ගෙන්වා ගැනීමේ අංශයයි.

14) ශ්‍රී ලංකා විදේශ සේවා කාර්යාංශයේ ලියාපදිංචි නොමැතිව රැකියා සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව ගිය ලාංකිකයන් නැවත මෙරටට ගෙන්වා ගැනීමට මෙම අංශය පහසුකම් සලසයි. 2018 වසරේදී විදේශ දූතයන් / හා අමතරව ලඟම ඥාතීන් නැවත මව්බිමට ගෙන්වා ගැනීම සඳහා මෙම අංශයට සිදුකරන ලද පැමිණිලි ප්‍රමාණය 480 කි.

15) අදාළ දූත මණ්ඩල / තනතුරු දරන්නන් හෝ ලඟම ඥාතීන් සිදු කරන මරණ අභියාචනාවලට පසුව විදේශ රටවල බන්ධනාගාරවල සිටින ශ්‍රී ලාංකිකයන් නැවත මෙරටට ගෙන්වා ගැනීම 2018 වර්ෂයේදී බන්ධනාගාරගත කළ 146 දෙනාගෙන් 54 දෙනෙකු මෙරටට ගෙන්වා ගන්නා ලදී.

16) මිට අමතරව කුවෙට් හා ලෙබනන් පිහිටි පිළිවෙලින් 6750 ක් හා 95 වූ සංක්‍රමණික සේවකයින් ඔවුන්ගේ නීති විරෝධී රැඳී සිටීම වෙනුවෙන් පොදු සමාව ලැබ පෙර කියන කාලයේදී මෙරටට ගෙන්වා ගන්නාලදී.

17) මත්ද්‍රව්‍ය ජාවාරම් සම්බන්ධයෙන් චෝදනා ලැබ 2017 මැයි 15 දින සිට ඉරානයේ රඳවා සිටි ශ්‍රී ලාංකිකයන් දෙදෙනෙකුද මෙරටට ගෙන්වා ගැනීමට මෙම අංශය පහසුකම් සලසන ලදී

18) සෝමාලියාවේ අතරමංව සිටි සංක්‍රමණික සේවකයන් 12 දෙනෙකු මෙම අංශයේ මැදිහත්වීමෙන් සංක්‍රමණ සඳහා වන ජාත්‍යන්තර සංවිධානයේදී සම්බන්ධීකරණය ඇතිව 2018 මැයි මාසයේදී ගෙන්වා ගන්නා ලදී.

19) අදාළ ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සම්බන්ධීකරණයෙන් ඔවුන්ගේ සහය ඇතිව මිනිස් ජාවාරමට ගොදුරු වූ 48 දෙනෙකු ආරක්ෂිතව නැවත මෙරටට ගෙන්වා ගෙන ඇත. එමෙන්ම මිනිස් ජාවාරමට ගොදුරු වූ ස්වෙච්ජාවෙන් ශ්‍රී ලංකාවට පැමිණෙන්නන්ටද මෙම අංශය පහසුකම් සලසයි.

20) අංශය නැවත ඇතුළුවීමේ සිද්ධි කළමනාකරණ පද්ධතිය යටතේ මධ්‍ය ලක්ෂයක් ලෙස ක්‍රියා කරමින් විශේෂ නැවත ඇතුළුවීමේ අයදුම්පත් උත්පාදනය කිරීම හා පෙරසැරිකරණය කිරීම සිදුකරන අතර නැවත ඇතුළුවීමේ සිද්ධි කළමණාකරණ පද්ධතිය (RCMS) හරහා අයදුම්පත් 24ක් පෙරසැරිකරණය සිදුකර ඇත.

ඉ. වන්දි ගෙවීම් අංශය

21) විදේශ රටවලදී මියගිය පුද්ගලයින් හා විවිධ හේතූන් මත ඔවුන්ගේ නීතිමය වරප්‍රසාද නොලැබ පැමිණි ශ්‍රී ලාංකිකයන්ට ලැබිය යුතු වන්දි, රක්ෂණය, සේවය අවසන් කිරීමේ / විශ්‍රාම ගැන්වීමේ ප්‍රතිලාභ සම්බන්ධයෙන් වන ගැටළු මෙම අංශය මගින් තහවුරු වනු ලැබේ.

22) 2018 වර්ෂය තුළ දී වන්දි මුදල් / විදේශයක දී මරණයට පත්වුවන්ගේ ළඟම ඥාතීන්ට ගෙවන මුදල් හා වෙනත් ගෙවිය යුතු මුදල් ලෙස පවුල් / විත්තිකයන් 190ක් හා සම්බන්ධ කටයුතු අවසන් කරමින් ශ්‍රී ලංකා රුපියල් මිලියන 420ක් පමණ අයකරගෙන තිබේ.

23) මියගිය අයගේ ළඟම ඥාතීන් විසින් හා අනෙකුත් පුද්ගලයන් විසින් වන්දි ඉල්ලා ඉදිරිපත් කළ අයදුම්පත් සම්බන්ධයෙන් අවශ්‍ය කොන්සියුලර් සහය ද නියමිත ආකෘතියෙන් යුතු පරිවර්තන ඇතුළු අවශ්‍ය ලිපි ලේඛන ඉදිරිපත් කිරීමට උපදෙස්ද මෙම අංශය විසින් සපයා ඇත.

24) විදේශයන්හි දූත මණ්ඩල සමඟ මන්ත්‍රණයෙන් චූදිතයන්ට ලැබිය යුතු වන්දි හා වෙනත් ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා විත්තිකයන් වෙනුවෙන් අදාළ රටවල නීති ආයතන මඟින් නීති කෘත්‍යයන් සිදු කිරීම මෙම අංශය විසින් සිදුකරයි. ලිපි ලේඛන නොමිලයේ සකස් කර ගැනීමට ළඟම ඥාතීන්ට සහය ලබා දේ.

25) මිනීමැරුමක් හෝ අනතුරකින් විදේශයකදී මියයන ශ්‍රී ලාංකිකයන්ට ලැබිය යුතු වරප්‍රසාද ඔවුන්ගේ ලඟම ඥාතීන් වෙත ලබාදීම තහවුරු කිරීම සඳහා මෙම අංශය ක්‍රියාකරනු ලැබේ.

26) වැටුප් හා අනෙකුත් හිමි දෑ නොගෙවීම සම්බන්ධයෙන් සංක්‍රමණික සේවකයන් විසින් සිදුකරන ලබන සියලුම පැමිණිලි සම්බන්ධයෙන් අදාළ ශ්‍රී ලංකා දූත මණ්ඩල හරහා පහසුකම් සැපයීම සිදු කරයි.

ඊ. මරණ අංශය

27) විදේශීයකදී සිදුවන මරණයකදී අදාළ විදේශ දූත මණ්ඩලයේ හා අදාළ පාර්ශව සමඟ සම්බන්ධීකරණ යෙන් ගෙන්වා ගැනීම, භූමදාන කිරීම හෝ ආදාහනය කිරීම සම්බන්ධයෙන් පහසුකම් සැලසීම හා නිවැරදි ලඟම ඥාතීන් සොයා ගැනීම සම්බන්ධයෙන් හා වගකීම මෙම අංශය සතු වේ.

28) විශේෂයෙන්ම පාර්ශව කීපයක් මළ සිරුර ඉල්ලා සිටින අවස්ථාවකදී නීත්‍යනුකූල පාර්ශවය නිවැරදිව සැලකිල්ලට ලක්කර භූමදානය කිරීම සහ දූත මණ්ඩලවලට මළසිරුරු මෙරටට ගෙන්වීම භූමදානය හෝ ආදාහනය කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම සිදුකරයි.

29) විදේශයකදී මියගිය ශ්‍රී ලාංකිකයන්ගේ ලඟම ඥාතීන් සොයා ගැනීම සඳහා ජනතාවගේ සහය ඉල්ලීමක් පුවත්පත් දැන්වීම් පළකිරීම මෙම අමාත්‍යාංශය විසින් සිදු කරයි.

30) සමාලෝචන කාලය අතරතුරදී කොන්සියුලර් සහය ඉල්ලූ මරණ සම්බන්ධ පැමිණිලි 444ක්ද සහය නොඉල්ලූ මරණ 110ක් ද අමාත්‍යාංශයට වාර්තා වී ඇත.

31) මරණ අංශය විසින් මරණ සහතික ලබා ගැනීමටද පහසුකම් සපයයි.

32) මරණයක දී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් වන්දි ලබා ගැනීමට මෙම අංශය සහය සපයයි.

33) ශ්‍රී ලාංකිකයෙකු විදේශ රටකදී මියගිය විට ඔවුන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී නැත්නම් හෝ මළසිරුර නැවත ගෙන්වා ගැනීමට භූමදානයට හෝ අනුග්‍රහනය කිරීමට හැකියාවක් නොමැති අයවළුන් වෙනුවෙන් මෙම අංශය සහය ලබා දේ. ශ්‍රී ලාංකිකයන් 12 දෙනෙකු වෙනුවෙන් අමාත්‍යාංශය රු.3,577,975 ක් වැයකොට ඇත.

34) 2018 වර්ෂයේදී සවුදි අරාබිය, ජෝර්දානය, අබුඩාබි ලෙබනනය සහ ඩුබායි යන රටවලදි මියගිය ශ්‍රී ලාංකිකයන් 06 දෙනෙකු වෙනුවෙන් ඔවුන්ගේ ඥාතීන් සොයා ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පළ කිරීමට ශ්‍රී ලංකා රු.435,878.50 ක මුදලක් වැය කොට ඇත.

ඇමුණුම අංක I -රජයේ වියදම්

ඇමුණුම අංක II – 2018 වර්ශයේදී වාර්තා වූ මරණ සංඛ්‍යාව

ළ. විවිධ අංශය

35) අනෙකුත් ඒකක හා සෘජුව සම්බන්ධතා විෂය පථයට අයත් නොවන විදේශ රටවල වාසය කරන ශ්‍රී ලාංකිකයන්ගේ තානාපති කටයුතු සඳහා අංශය සහ සැපයීම මෙම අංශයේ කාර්යය වේ.

36) විදේශ රටවල අධිකරණයන් මඟින් ශ්‍රී ලාංකිකයන්ට මරණ දඩුවම හෝ ජීවිතාන්තය දක්වා සිර දඩුවම් හිමිවන නඩු සම්බන්ධයෙන් මෙම අංශය කටයුතු කරන අතර සමාලෝචන කාලය තුළදී නඩු 21 ක් සම්බන්ධව කටයුතු කර ඇත. දඩුවම් ලැබුණු 3 දෙනෙකු ශ්‍රී ලංකාවට එවා ඇත.

37) අනෙකුත් රටවල මුහුදු සීමාවන් වෙත යන ධීවර යාත්‍රා සම්බන්ධයෙන් හා සාගර මධ්‍යයෙහි අතරමං වන ශ්‍රී ලාංකික ධීවරයන් හෝ විදේශ නාවික බලධාරීන් වෙරළ ආරක්ෂකයින් විසින් රඳවා ගන්නා ධීවරයන්ට ඔවුන්ගේ යාත්‍රා හා කාර්යය මණ්ඩල නිදහස් කර ගැනීමට සහය අපේක්ෂා කරන පිරිසට සහය ලබාදීම මෙම අංශයෙන් සිදු කරයි. ඒ අනුව සමාලෝචිත කාලය තුළදී විදේශයකදී හෝ ශ්‍රී ලාංකික මුහුදු සීමාවෙන් පිටතදී අත්අඩංගුවට පත් වූ ශ්‍රී ලංකා ධීවරයන් හා යාත්‍රා සම්බන්ධ ගැටලු 152 ක් සම්බන්ධයෙන් කටයුතු කළ අතර ධීවරයන් හා යාත්‍රා නිදහස් කර ගැනීම සඳහා සහය පළ කරන ලදී.

38) ජාතික මානව හිමිකම් කාර්ය සැලැස්ම ක්‍රියාත්මක කිරීම පැන වූ ආංශික කමිටුව සඳහා ලියාපදිංචි නොවූ සංක්‍රමණික සේවකයන් සම්බන්ධ මානව හිමිකම් වාර්තා දූත මණ්ඩල වලින් ලබාගෙන මාසික ප්‍රගති වාර්තා පෙරසැරිකරණය කිරීම මෙම අංශය මඟින් සිදුකරයි.

39) විදේශ රාජ්‍යයන්හි වාසය කරන හෝ රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන් සඳහා විදේශ රටවල් මඟින් නිකුත් කරන පොලිස් නිෂ්කාශන වාර්තා ලබාගැනීම සඳහා මෙම අංශය සහය ලබාදෙයි. 411 ක් අයදුම්කරුවන් වෙත එම පොලිස් නිෂ්කාශන සහතික භාරදීම සිදුකරන ලදී.

40) ''ජනාධිපතිට කියන්න'' දුක් ගැනවිලි කළමනාකරණ වැඩසටහන යටතේ මෙම අංශය වෙත පැමිණිලි 31 ක් ලැබී ඇති අතර එම දුක් ගැනවිලි පෙරසැරිකරණය වෙමින් පවතී.

41) තවද, අනෙකුත් අංශයන්හි විෂය පථයට අයත් නොවන තානාපති සහාය සඳහා සංක්‍රමණික සේවකයන්, ශිෂ්‍යයන් හා විදේශ වෘත්තිකයන් විසින් ඉල්ලීම් 206ක් ඉදිරිපත් කර ඇති අතර එම ඉල්ලීම් සම්බන්ධයෙන් මෙම අංශය කටයුතු කරයි.

42) විදේශ රාජ්‍යයන්හි උපත ලද ළමුන් සඳහා උප්පැන්න සහතික මරණ සහතික නිකුත් කිරීම සඳහා අංශය පහසුකම් මෙම අංශය විසින් සපයනු ලබන අතර ඒ සම්බන්ධ පැමිණිලි 69ක් ලැබී ඇත. විදේශ රාජ්‍යයන්හිදී ශ්‍රී ලාංකික පුරවැසියන්ට දාව උපත ලැබූ දරුවන් 1058 ක් සඳහා උප්පැන්න සහතික නිකුත් කරන ලදී.

43) විදේශකයින් 54 දෙනෙකු ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකාව තුළ විවාහ වන, ශ්‍රී ලංකාවට වීසා ලබා ගැනීම විවිධ තානාපති ලේඛන සහතික කිරීම වැනි විමසීම් හා ඉල්ලීම් වලට ප්‍රතිචාර වශයෙන් ඒ සඳහා මෙම අංශය සහය ලබා දී ඇත.

44) විදේශ රාජ්‍යයන්හිදී අතුරුදහන් වූ ඥාතීන් සම්බන්ධ පැමිණිලි 20 ක් සම්බන්ධ මෙම අංශයේ පෙරසැරිකරණය වෙමින් පවතී.

45) විදේශ දූත මණ්ඩල හරහා ලැබනු පුරවැසි සහතික 16 ක් බෙදා ඇති අතර පැමිණිලි 18 ක් සම්බන්ධ කටයුතු කර ඇත.

46) විදේශ රාජ්‍යයන්හිදී හදා වඩාගත් පුද්ගලයන් විසින් තම පීව විද්‍යාත්මක / ස්වභාවික මව්පියන් පිළිබඳ තොරතුරු දැන ගැනීමේ අපේක්ෂාවෙන් සිදුකරනු ලබන ඉල්ලීම් හා ඒ හා ඉල්ලීම විදේශ ශ්‍රී ලංකා දූත මණ්ඩලයට ඉදිරිපත් වූ විට ඒ සම්බන්ධව කටයුතු කරන ලදී.

2018 ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා ලබා දෙන ලද කොන්සියුලර් සහය පිළිබඳ විස්තර

ලිපිලේඛන සංඛ්‍යාව	297,410
මුළු මුදල් ලැබීම් (සත්‍යාපනය)	රු. 232,210,700.00
වාර්තා වූ මරණ	444
ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීමට සහය ඉල්ලා ලැබුණු පැමිණිලි (සාමාන්‍ය)	219
නිකුත් කරන ලද පොලිස් නිශ්කාෂණ වාර්තා සංඛ්‍යාව	196
ඉදිරියට සම්ප්‍රේෂණය සඳහා විදේශවල පිහිටි දූත මණ්ඩලවලින් ලැබුණු අධ්‍යාපන සහතික සංඛ්‍යාව	85
රඳවා තැබීම් පිළිබඳ පැමිණිලි (විදේශවල දී මරණ දණ්ඩනයට නියම වූ ශ්‍රී ලාංකිකයන්)	21
උපත් ලියාපදිංචි කිරීම සඳහා ලැබුණු පැමිණිලි	68
ප්‍රතිලාභ ලැබූ පවුල් සංඛ්‍යාව (වන්දි)	182
ලියාපදිංචි නොකළ පැමිණිලි	172
ගෙවන ලද මුළු වන්දි මුදල්	රු. 417,824,923.55
විවිධ විමසීම් (ලිඛිත)	68
ශ්‍රී ලංකාව වෙත ආපසු ගෙන්වාගන්නා ලද ශ්‍රී ලාංකික ධීවරයන්	80
සකසන ලද විදේශ රටවල පොලිස් නිශ්කාෂණ වාර්තා අයදුම්පත් විස්තර	215
ශ්‍රී ලංකා විදේශ රැකියා කාර්යාංශයෙහි ලියාපදිංචි වූ පැමිණිලි සංඛ්‍යාව	61
විදේශවල දී සිදු වූ උපත් ලියාපදිංචි කිරීම් විස්තර	1,058

මෘතදේහයන් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම, ආදාහන හා භූමදාන කටයුතු සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් සිදුකරන ලද ගෙවීම් - 2018.01.01 සිට 2018.12.31 දක්වා

අංකය	මියගිය අයගේ නම	විදේශ ගමන් බලපත්‍ර අංකය	මරණයට හේතුව	මියගිය දිනය	දූතමණ්ඩලය	වියදම		තත්ත්වය
						ශ්‍රී ලංකා රුපියල්	දේශීය මුදල්	
1	පූජ්‍ය මොරපේ කුසලඥාන හිමි	N7278366	රෝගාතුර වීම	2018.08.03	බැංකොක්	ශ්‍රී.ලං.රු. 560,100/-	ඇ.ඩො. 3,564/-	යවන ලදී
2	බී.කේ. ශ්‍යාමලී මහත්මිය	N 0947912	මිනීමැරුමක්	2018.01.28	ජෝර්දානය	ශ්‍රී.ලං.රු. 184,900/-	ඇ.ඩො. 840/-	යවන ලදී
3	එල්.එම්.පී.එන්. තරංග මහතා	N7477477	රෝගාතුර වීම	2018.03.04	බහරේන්	ශ්‍රී.ලං.රු. 102,800/-	බහරේන් ඩිනාර් 247/-	යවන ලදී
4	සුගත් සී. ප්‍රනාන්දු මහතා	N1319265	රෝගාතුර වීම	2018.04.04	සවුදි අරාබිය	ශ්‍රී.ලං.රු. 383,940/-	සවුදි රියාල් 9,000/-	යවන ලදී
5	රොනී ලකී ලීව් මහතා	N7842132	රෝගාතුර වීම	2018.01.10	ඕස්ට්‍රේලියාව	ශ්‍රී.ලං.රු. 953,235/-	ඕස්ට්‍රේලියානු ඩොලර් 7796/55	යවන ලදී
6	පූජ්‍ය බම්බාවේ ඉන්ද්‍රජෝති හිමි	N5205877	රෝගාතුර වීම	2018.12.20	තායිලන්තය	ශ්‍රී.ලං.රු. 400,000/-	තායිලන්ත භාට් 70,000/-	යවන ලදී
7	ලූපා ශාන්ති මහත්මිය	N3979238	රෝගාතුර වීම	2018.02.30	කුවේටය	ශ්‍රී.ලං.රු. 14,000/-	කුවේට් ඩිනාර් 25/-	භූමිදාන කරන ලදී
8	එම්.පේ.එෆ් හසිනා මෙනෙවිය	N5830090	සිය දිවි නසා ගැනීම	2018.04.06	ඩුබායි	ශ්‍රී.ලං.රු. 146,000/-	එ.අ.එ.රා. ඩිරාම් 3,353/-	භූමිදාන කරන ලදී
9	ශ්‍රියානි කන්නංගරගේ මහත්මිය	N5877508	සඳහන් කොට නොමැත	සඳහන් කොට නොමැත	ඩුබායි	ශ්‍රී.ලං.රු. 223,000/-	එ.අ.එ.රා. ඩිරාම් 4,780/-	භූමිදාන කරන ලදී
10	පැරල් කේ. ෆේබර් මහත්මිය	N7946146	රෝගාතුර වීම	2018.10.11	ඩුබායි	ශ්‍රී.ලං.රු. 240,000/-	එ.අ.එ.රා. ඩිරාම් 4,780/-	භූමිදාන කරන ලදී
11	ශාන්ති ප්‍රනාන්දු මෙනෙවිය	ලබා දී නොමැත	රෝගාතුර වීම	2018.10.15	ලෙබනනය	ශ්‍රී.ලං.රු. 145,000/-	ඇ.ඩො. 800/-	භූමිදාන කරන ලදී
12	කේ. ශාන්ති මහත්මිය	ලබා දී නොමැත	රෝගාතුර වීම	2018.05.21	සවුදි අරාබිය/ රියාද්	ශ්‍රී.ලං.රු. 225,000/-	ඇ.ඩො. 5,000/-	භූමිදාන කරන ලදී
	එකතුව					**ශ්‍රී.ලං.රු. 3,577,975/-**		

2 ඇමුණුම

2018.01.01 සිට 2018.12.31 දක්වා වාර්තා වූ මරණ සංඛ්‍යාව

අංකය	දූත මණ්ඩලය	මරණ සංඛ්‍යාව
1	අබුඩාබි	8
2	ඕස්ට්‍රේලියාව	9
3	ඕස්ට්‍රියා	1
4	බහරේන්	9
5	බන්ග්ලාදේශය	4
6	බෙල්පියම	1
7	චීනය	1
8	සයිප්‍රසය	2
9	කැනඩාව	2
10	ඩුබායි	32
11	ඊජිප්තුව	2
12	බතියෝපියාව	1
13	ෆීජි	1
14	ප්‍රංශය	6
15	ඉන්දියාව	14
16	ඉන්දුනීසියාව	1
17	ඉරානය	1
18	ඊශ්‍රායලය	2
19	ජපානය	6
20	ජෝර්දානය	11
21	සෞදි අරාබිය	103
22	ණැබහ්	1
23	කොරියාව	7
24	කුවේටය	73
25	බ්දි	2
26	ලෙබනනය	5
27	මැලේසියාව	17
28	මාලදිවයින	7
29	ඕමානය	14
30	පිලිපීනය	1
31	කටාරය	49
32	ඉතාලිය	31
33	තුර්කිය	1
34	තායිලන්තය	2
35	සීෂෙල්ස්	1
36	ස්විට්ස්ර්ලන්තය	1
37	ජර්මනිය	2
38	ස්විඩනය	1
39	එක්සත් රාජධානිය	5
40	එක්සත් ජනරජය	4
41	ඝානාව	1
42	හොං කොං	1
43	නේපාලය	1
එකතුව		444

නැගෙනහිර ආසියා සහ පැසිෆික් අංශය

නැගෙනහිර ආසියා හා පැසිෆික් අංශය

ආවරණය වන රටවල් : ඕස්ට්‍රේලියාව, බෘනායි, දරුස්සලාම්, චීනය, කාම්බෝජියාව, ප්‍රජාතාන්ත්‍රික මහජන කොරියානු ජනරජය, (DPRK) ෆීජී, ඉන්දුනීසියාව, ජපානය, කොරියා ජනරජය, ලාඕසය, මැලේසියාව, මොන්ගෝලියාව, මියන්මාරය, නවසීලන්තය, පිලිපීනය, පැපුවා නිව්ගිනියාව, සිංගප්පූරුව, තායිලන්තය, වියට්නාමය, වනුආටු, නාවුරු හා ටොංගෝ, සොලමන් දූපත්, ටිමෝර ලෙස්තේ, කිරිබටී, සැමෝආ, ටුවාලු

නේවාසික දූත මණ්ඩල සංඛ්‍යාව - 11 (ඕස්ට්‍රේලියාව, චීනය, ඉන්දුනීසියාව, ජපානය, කොරියාව, මැලේසියාව, මියන්මාරය, පිලිපීනය, සිංගප්පූරුව, තායිලන්තය, වියට්නාමය)

කොන්සල් කාර්යාල සංඛ්‍යාව - 04 (ඕස්ට්‍රේලියාව - සිඩ්නි සහ මෙල්බන්, චීනය - ෂැංහායි සහ ගුවාන්ෂු)

සමගාමීව අක්තගැන්වීම්

ඕස්ට්‍රේලියාව (කැන්බරා) - ෆීජී, නවසීලන්තය, පැපුවා නිව්ගිනියාව,
වනුආටු, සොලමන් දූපත්
චීනය - කොරියානු ප්‍රජාතන්ත්‍රවාදී මහජන ජනරජය,
මොන්ගෝලියාව
සිංගප්පූරුව - බෘනායි, දරුස්සලාම්
තායිලන්තය - කාම්බෝජියාව, ලාඕසය

බහුපාර්ශ්වීය/කලාපීය සංවිධාන සංඛ්‍යාව

ආසියාන් කලාපීය සංසදය (ARF), ෂැංහයි සහයෝගිතා සංවිධානය (SCO) ආසියාවේ අනෝන්‍ය ක්‍රියාකාරකම් හා විශ්වාසය ගොඩනැගීම පිළිබඳ සමුළුව

ආවරණය කරනු ලබන වෙනත් සංවිධාන සංඛ්‍යාව

බාලි ප්‍රජාතාන්ත්‍රික සංසදය, ෂැංග්‍රි - ලා සංවාදය

නැගෙනහිර ආසියා හා පැසිෆික් අංශයේ ප්‍රධාන කාර්ය කටයුතු පුළුල් ලෙස පහත පරිදි වර්ගීකරණය කළ හැකිය.

i. භූගෝලීයමය කලාපයේ රටවල්වලට අදාළව ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සැකසීම.

ii. රජයේ ප්‍රතිපත්තිමය තීරණ පිළිබඳව මෙම භූගෝලීයමය කලාපයේ පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට උපදෙස් දීම හා ඔවුනට පවරා තිබෙන රටවලදී ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ධනාත්මක වශයෙන් ප්‍රවර්ධනය කිරීම හා ප්‍රක්ෂේපණය කිරීම.

iii. ආර්ථික, රාජ්‍යතාන්ත්‍රික කටයුතු හා පොදු රාජ්‍යතාන්ත්‍රික කටයුතුවල ක්‍රියාකාරීව නියැලෙන ලෙස මෙම කලාපයේ ඇති ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට මඟ පෙන්වීම ලබාදීම සහ ශ්‍රී ලාංකිකයින්ට සහ ශ්‍රී ලාංකික සම්භවයක් ඇති පුද්ගලයන්ට සහාය ලබාදීම.

iv. ශ්‍රී ලංකාවේ සංචාරවල නියැලෙන/විදේශීය රටවල සංචාරවල නියැලෙන සම්භාවනීය පුද්ගලයන්ගේ සංචාර සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම/අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

v. මෙම භූගෝලීයමය කලාපයේ රටවල් හා සංවිධාන සමඟ ද්විපාර්ශ්වික ගිවිසුම්/අවබෝධතා ගිවිසුම්වලට අත්සන් තැබීමට අවශ්‍ය පහසුකම් සැලසීම.

vi. ආසියාන් කළාපීය සංසදය, ෂැංහයි සහයෝගිතා සංවිධානය, බාලි ක්‍රියාදාමයට අදාළ කටයුතු සම්බන්ධීකරණය.

vii. කොළඹ පිහිටි නැගෙනහිර ආසියා සහ පැසිෆික් කළාපයේ ශ්‍රී ලංකා විදේශීය දූත මණ්ඩල සමඟ සමීප හා සුහද සබඳතා පවත්වාගෙන යාම.

1.3 ද්විපාර්ශ්වික සහයෝගිතාවය

1. 2018 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මාසය දක්වා නැගෙනහිර ආසියානු හා පැසිෆික් අංශය මගින් අති විශේෂිත හා පුද්ගල හා අමාත්‍ය මණ්ඩල සංචාර කිහිපයක් හසුරුවා ඇති අතර, ද්විපාර්ශ්වීය විදේශ කාර්යාල උපදේශන කිහිපයක් කැඳවන ලදී.

11. මෙම අංශය විසින් ඉන්දුනීසියානු ජනාධිපති අතිගරු ජොකෝ විඩෝඩෝ මැතිතුමාගේ රාජ්‍ය සංචාරයත් (2018 ජනවාරි 24 -25 දක්වා), සිංගප්පූරු අග්‍රාමාත්‍ය ගරු ලී සෙයින් ලුංග් මැතිතුමාගේ සංචාරයත් (2018 ජනවාරි 24-25 දක්වා), තායිලන්ත අග්‍රාමාත්‍ය ගරු ප්‍රයුත් චැන් ඔ චා මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරයත් (2018 ජූලි 12-13 දක්වා), අතිගරු ජනාධිපතිතුමා සහ ගරු අග්‍රාමාත්‍යතුමා සමඟ ද්විපාර්ශ්වීය රැස්වීම් සංවිධානය කරන ලදී.

111. 2018 මාර්තු 12-15 දක්වා අතිගරු ජනාධිපතිතුමාගේ ජපාන සංචාරය සංවිධානය කරන ලදී.

IV. ගරු අග්‍රාමාත්‍යවරයාගේ සිංගප්පූරු (2018 ජූලි 08), වියට්නාම (2018 අගෝස්තු 27-28 දක්වාත් 2018 සැප්තැම්බර් 11-13 දක්වාත්) සංචාර සඳහා මෙම අංශයෙන් පහසුකම් සලසන ලදී.

V. ජපානයේ විදේශ කටයුතු අමාත්‍ය ගරු ටාරෝ කෝනෝ මැතිතුමාගේ (2018 ජනාවාරි 05) හා ජපාන ආරක්ෂක අමාත්‍ය ගරු ඉටිසුනෝරි ඔනෝඩෙරා මැතිතුමාගේ සංචාර සඳහා මෙම අංශය මගින් පහසුකම් සලසන ලදී.

VI. කතානායක ගරු කරු ජයසූරිය මැතිතුමාගේ ලාඕස් මහජන ප්‍රජාතාන්ත්‍රික ජනරජයෙත් (2018 අප්‍රේල් 17-21 දක්වා), දකුණු කොරියාව (2018 අගෝස්තු 27-30 දක්වා), ජපානය (2018 පෙබරවාරි 25 සිට මාර්තු 03 දක්වා), වියට්නාමය (2018 අප්‍රේල් 17-21 දක්වා) සංචාර සඳහා මෙම අංශය පහසුකම් සලසන ලදී.

VII. ගරු. විදේශ කටයුතු අමාත්‍යවරයාගේ සිංගප්පූරු (2018 අගෝස්තු 19-31) සහ ඉන්දුනීසියා (2018 අගෝස්තු 6-7) මැලේසියා (2018 අගෝස්තු 19 -31) සංචාර සඳහා මෙම අංශය පහසුකම් සලසන ලදී.

VIII. කොරියාවේ ජනරජය සමගත් (2018 ජුනි 7), තායිලන්තය (2018 පෙබරවාරි 27 -28), වියට්නාම (2018 අප්‍රේල් 11), පිලිපීනය (ඔක්තෝම්බර් 23, මැනිලා) සමගත් ද්වීපාර්ශ්වික විදේශීය කාර්යාලීය උපදේශන මෙම අමාත්‍යාංශය මගින් කොළඹ දී කැඳවන ලදී.

1.4 කලාපීය සහයෝගිතාවය

1.4.1 ආසියානු කලාපීය සංසදය (ARF)

ශ්‍රී ලංකාව **ආසියානු කලාපීය සංසදයෙහි** සහභාගීත්ව රටක් වන අතර ASEAN සංවිධානය සමග ආංශික සංවාද හවුල්කාරිත්වය ලබා ගැනීමේ ක්‍රියාවලියේ යෙදී සිටියි.

ශ්‍රී ලංකාව **ආසියානු කලාපීය සංසදයෙහි** පහත දැක්වෙන සිද්ධීන් සඳහා ක්‍රියාකාරීව සහභාගි විය

I. 12 වැනි ASEAN කලාපීය සංසදයේ විශේෂඥයන් සහ ගෞරවනීය පුද්ගලයින් (ARF / EEP) රැස්වීම 2018 මාර්තු 6-7 වියට්නාමයේ ARF රාමුව යටතේ ප්‍රායෝගික රාජ්‍යතාන්ත්‍රිකත්වය ශක්තිමත් කිරීමේ ප්‍රගති සමාලෝචනය කිරීම හා ප්‍රායෝගික පියවර ඔස්සේ ආර්එස්එෆ් කලාපීය ආරක්ෂාව වැඩිදියුණු කළ හැකි ආකාරය සාකච්ඡා කිරීම.

II. 2018 ජූනි මස 7 වන දින සිංගප්පූරුවේ පැවති 25 වැනි ආර්එස්එෆ් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීම සඳහා නැගෙනහිර ආසියාව අංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහභාගි විය.

III. ගරු. විදේශ කටයුතු අමාත්‍ය ධූරය සිංගප්පූරුවේ දී 2018 අගෝස්තු 03-04 දක්වා පැවැති 25 වැනි ARF අමාත්‍යවරුන්ගේ රැස්වීමට ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ මූලිකත්වයෙන් යුත් නියෝජිත පිරිසක් සහභාගී විය

1.4.2 බාලි ක්‍රියාවලිය .

ශ්‍රී ලංකාව බාලි ක්‍රියාදාමයේ සාමාජික රටකි

අධිකරණ හා ආරක්ෂක අමාත්‍යාංශය හරහා මෙම කාලසීමාව තුළදී බාලි ක්‍රියාවලි වැඩමුළු / සම්මන්ත්‍රණ / සිද්ධි පිළිබඳ ශ්‍රී ලංකාවේ සහභාගිත්වය පහත දැක්වේ.

අ) සැලසුම් සහ සූදානම පිළිබඳ බාලි සැකසුම් කාර්ය සාධක බලකායේ තෙවන රැස්වීම (TEPP), 2018 මාර්තු 21-22, බැංකොක්, තායිලන්තයේ දී පවත්වන ලදී.

ආ) පුද්ගල ජාවාරම, මිනිස් ජාවාරම හා ඒ සම්බන්ධ අන්තර්ජාතික අපරාධ සම්බන්ධ තොරතුරු හුවමාරු කර ගැනීමේ මාර්ගෝපදේශ පිළිබඳ උපදෙස් මාලාව පිළිබඳ බාලි ක්‍රියාවලි උපදේශන වැඩමුළුව තායිලන්තයේ දී 2018 මාර්තු 28 වන දින පවත්වන ලදී.

ඇ) ගුවන් තොටුපළ පුද්ගල ජාවාරම, මිනිස් ජාවාරම සහ ඒ ආශ්‍රිත අන්තර්ජාතික අපරාධවලට එරෙහිව සටන් කිරීම සඳහා වන බාලි ක්‍රියාවලියේ දේශසීමා කළමනාකරණය කිරීමේ වැඩමුළුව 2018 අප්‍රේල් 23-27 දක්වා ඉන්දුනීසියාවේදී පවත්වන ලදී.

ඈ) පෙරළා පැමිණි පුද්ගලයන් නැවත සමාජගත කිරීම පිළිබඳ බාලි ක්‍රියාවලියේ තාක්ෂණ විශේෂඥ කණ්ඩායම (RRG),2018 අප්‍රේල් 23-24, මැනිලා, පිලිපීනයේ දී රැස්විය

ඉ) පුද්ගල ජාවාරම්, මිනිස් ජාවාරම් හා සම්බන්ධිත අන්තර්ජාතික අපරාධ සම්බන්ධ තොරතුරු හුවමාරු කර ගැනීමේ මාර්ගෝපදේශ පිළිබඳ මාර්ගෝපදේශකත්වය පිළිබඳ බාලි සැකසුම් නියමු වැඩමුළුව, 2018 මැයි 3-4 දක්වා, ජකර්තා, ඉන්දුනීසියා හිදී පැවැත්විය.

ඊ) 13 වන බාලි ක්‍රියාවලිය Ad Hoc Group ජ්‍යෙෂ්ඨ නිලධාරී රැස්වීම, 2018 ජූනි 27, ඔස්ට්‍රේලියාවේ සිඩ්නි හිදී පැවැත් විය.

උ) 7 වන බාලි සැකසීම් හා පුද්ගල ජාවාරම්, මිනිස් ජාවාරම් හා සම්බන්ධිත සංක්‍රමණික අපරාධ පිළිබඳ අමාත්‍ය සමුළුව 2018 අගෝස්තු මස 8 වන දින ඉන්දුනීසියාවේදී පවත්වන ලදී. මේ සඳහා ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යවරයාත්, අධිකරණ නියෝජ්‍ය අමාත්‍යවරයාත් විදේශ කටයුතු අමාත්‍යාංශයේ හා නීතිපති දෙපාර්තමේන්තුවේ ජේෂ්ඨ නිලධාරීන් සහ තවත් අය නියෝජනය කරන ලදී.

ශ්‍රී ලංකාව මෙම අවස්ථාවට අඛණ්ඩව සහභාගී වී ඇති අතර මෙම වසරේදී විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් ඉහත සමුළුවේදී නියෝජිත කණ්ඩායමට නායකත්වය දුන් පළමු අවස්ථාව මෙයයි. එමගින් ශ්‍රී ලංකාවේ බාලි ක්‍රියාවලිය සඳහා ශ්‍රී ලංකාවේ වැඩෙන වැදගත්කම පෙන්නුම් කරයි. අතීතයේ දී, අධිකරණ අමාත්‍ය / නියෝජ්‍ය අමාත්‍යවරයා මෙම සම්මේලන සඳහා නියෝජිත කණ්ඩායමේ නායකත්වය ලබාදුන්හ.

බාලි ක්‍රියාවලියේ කෘත්‍යාධිකාරී කණ්ඩායම් වල ක්‍රියාකාරකම්, වෙනත් ක්‍රියාකාරිත්ව යාන්ත්‍රණ ආදියෙහි ක්‍රියාකාරකම් ඇතුලුව බාලි ක්‍රියාවලියෙහි ප්‍රවණතා මෙම සමුළුව මගින් සමාලෝචනය කළහ.

1.4.3 ආසියාවේ අන්තර් ක්‍රියාකාරීත්ව සහ විශ්වාසනීය ගොඩනැගීමේ පියවර පිළිබඳ සම්මන්ත්‍රණය (**CICA**)

2018 අගෝස්තු 15 වන දින ශ්‍රී ලංකාව මෙහි පූර්ණ සාමාජිකත්වය ලබා ගත්තේය.

අ) 2018 සැප්තැම්බර් 24 දින නිව්යෝර්ක්හි දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 73 වන සැසිවාරයට සමගාමීව විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා සහභාගි වූ අතර, ආසියාවේ අන්තර් ක්‍රියාකාරීත්ව සහ විශ්වාසනීයත්වය ගොඩනැගීමේ පියවර පිළිබඳ සම්මන්ත්‍රණයේ විශේෂ අමාත්‍ය සමුළුවට සහභාගි වී ප්‍රකාශයක් සිදු කරන ලදී.

ආ) කසකස්තානයේ අස්තානා හිදී, 2018 ඔක්තෝබර් 16-17 දින දක්වා පැවැති ආසියාව තුළ අන්තර් ක්‍රියාකාරීත්වය සහ විශ්වාසය ගොඩ නැංවීම පිළිබඳ සම්මන්ත්‍රණයේ යුධ දේශපාලනික පැතිකඩ පිළිබඳ සම්මන්ත්‍රණය සඳහා නිලධාරියෙකු නම් කිරීමට ආරක්ෂක අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණය කරන ලදී. ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් (INSSSL) සහභාගී විය.

1.4.4 ෂැංහයි සහයෝගිතා සංවිධානය (SCO)

ශ්‍රී ලංකාව 2009 සිට ෂැංහයි සහයෝගිතා සංවිධානයේ සංවාද පාර්ශවකරුවෙකු වන අතර මෙම සංවිධානයේ නිරීක්ෂණ තත්ත්වය සඳහා ඉල්ලුම් කර තිබේ.

අ) ටජිකිස්ථානයේ ඩුෂංබි හී සැප්තැම්බර් 20 වැනි දින පැවැති ෂැංහයි සහයෝගිතා සංවිධානයේ 16 වන අභිචෝදක ජනරාල් කවුන්සිලයට ගරු නීතිපතිවරයා සහභාගි විය.

1.4.5 ෂැන්ග්‍රිලා සංවාදය

ශ්‍රී ලංකා රජය වෙනුවෙන් IISS ෂැංග්‍රිලා සංවාදයේ දී ආරක්ෂක අමාත්‍යංශය අඛණ්ඩව සහභාගී වී සිටී.

අ) 2018 ජූනි මස 1-3 දක්වා සිංගප්පූරුවේ දී පවත්වන ලද 17 වැනි IISS ෂැංග්‍රිලා සංවාද සමුළුවට ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් සහභාගි වූ අතර එම සමුළුවේ දී එකී ඇමරිකාවේ ඉන්දියානු සාගර කලාපයේ තරගකාරීත්වය හා සහයෝගීතාවය පිළිබඳව තේමාව යටතේ සමගාමී විශේෂිත සැසිවාර 4 කදී කතාබහ කරනු ලැබීය.

2 කැන්බරා හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය, මෙල්බර්න් හි ශ්‍රී ලංකා කොන්සල් ජෙනරල් , සිඩ්නි හී ශ්‍රී ලංකා කොන්සල් ජෙනරාල් කාර්යාලය.

ද්විපාර්ශ්වික සබඳතා

1. කැන්බරා හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය

I. නිධන්ගත වකුගඩු රෝග හදුනාගැනීම සඳහා ඕස්ට්‍රේලියානු න්‍යෂ්ටික හා විද්‍යා හා තාක්ෂණ සංවිධානයේ (ANSTO) සහයෝගීතාව පිළිබඳ මහකොමසාරිස්වරයා විසින් නිධන්ගත වකුගඩු රෝගය වැළැක්වීම පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය වෙත ශ්‍රී ලංකාව සම්බන්ධව කටයුතු කරන ලදී.

II. විදේශ කටයුතු අමාත්‍ය ගරු වසන්ත සේනානායක මැතිතුමා මාර්තු මාසයේදී DFAT හි විශේෂ සංචාරක වැඩසටහන යටතේ ඔස්ට්‍රේලියාවේ සංචාරය කළේය.

III. ශ්‍රී ලංකා කාන්තා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ දූත පිරිසක් මාර්තු මාසයේ කැන්බරා ඇතුළු ඔස්ට්‍රේලියාවේ සංචාරය කර එරට පාර්ලිමේන්තුව හා රජයේ දෙපාර්තමේන්තු වල රැස්වීම් පැවැත්වූහ.

IV. උතුරු දේශසීමාවේ ශ්‍රී ලංකාව සඳහා නිර්වේතනික කොන්සල්වරයෙකු පත් කිරීමේ කටයුතු (ඩාර්වින්හි පිහිටි) නිමකරන ලදී.

V. ශ්‍රී ලංකා නාවුක නෞකාවක් වන SLNS සින්දුරළ, දෙරට අතර වර්ධනය වන ආරක්ෂක සම්බන්ධතා ප්‍රදර්ශනය කරමින් 2018 අගෝස්තු / සැප්තැම්බර් මාසයේදී ඩාර්වින්හි දී පැවැති, Fleet Exercise Kakadu 2018, සඳහා සහභාගි විය.

VI. සපුගස්කන්ද අණදෙන සහ මාණ්ඩලික විද්‍යාලයේ ආඥාපතිවරයා අගෝස්තු මාසයේදී ශිෂ්‍යය භට කණ්ඩායම් නියෝජිත පිරිසක් සමග අධ්‍යයන චාරිකාවක නියළුනි. කොළඹ සිටි ඕස්ට්‍රේලියානු ආරක්ෂක උපදේශකයෙක් හරහා මෙම වැඩ සටහනට පහසුකම් සලසනු ලැබීය.

VII. ශ්‍රී ලාංකිකයන්ට සාපරාධී අපරාධ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන / චෝදනා ලැබූ අවස්ථාවලදී මෙම දූත මණ්ඩලය, ස්වදේශ කටයුතු දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණ කටයුතු දිගටම පවත්වා ගෙන ගියේය.

VIII. මෙම දූත මණ්ඩලය විසින් ඔක්තෝබර් මාසයේදී 'ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කිරීමේ අවස්ථාවන් හා අභියෝග' පිළිබඳ ආචාර්ය ජයම්පති වික්‍රමරත්න මහතා වෙනුවෙන් කැන්බරාහි ශ්‍රී ලංකා පුරවැසියන් සමග අවිධිමත් දේශනයක් සහ සාකච්ඡාවක් පැවැත්විය.

සමගාමී අක්තගැන්වීම්

I. මැයි මාසයේදී මහකොමසාරිස්වරයා විසින් පැපුවා නිව් ගිනියාවේ දී අක්තපත්‍ර භාර දුන්නේය. පැපුවා නිව් ගිනියාවේ විදේශ කටයුතු අමාත්‍යවරයා සහ විදේශ කටයුතු ලේකම් හමුවිය. මෙම රැස්වීම්වල දී සාකච්ඡා පවත්වා ඇති අතර, පැපුවා නිව් ගිනියාව සමග ද්විපාර්ශ්වික උපදේශන සඳහා අවබෝධතා ගිවිසුමක් හුවමාරු කරගත්හ.

II. සිය තනතුරින් නික්ම යන ෆීජි මහ කොමසාරිස්වරිය සමග පැවැති සාකච්ඡාවලින් පසුව, රාජ්‍ය තාන්ත්‍රික හා නිල ගමන් බලපත්‍ර හිමියන්ට වීසා බලපත්‍ර නිදහස්කර ගැනීමට සමාන අවබෝධතා ගිවිසුමක් සලකා බැලීම සඳහා ෆීජි සමග හුවමාරු කර ඇත.

III. ද්විපාර්ශ්වික සාකච්ඡා ආරම්භ කිරීමට නවසීලන්තය සමග සාකච්ඡා පැවැත්වෙමින් තිබේ. තරුණ සංවර්ධනය පිළිබඳ සහයෝගීතාව පිළිබඳ නවසීලන්තය සමග ද අවබෝධතා ගිවිසුම හුවමාරු කරගෙන ඇත.

IV. පොර්ට් මොර්ස්බී හි මහ කොමසාරිස්වරියගේ අක්තපත්‍ර පිළිගැන්වීම හා කොළඹ සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, කැන්බරාහි මහ කොමසාරිස් කාර්යාලයට පැපුවා නිව්ගිනියාව සමග ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිල සාකච්ඡා පැවැත්වීමට දුත මණ්ඩලය යෝජනා කර තිබේ.

II මෙල්බන් හි ශ්‍රී ලංකා කොන්සියුලර් ජනරාල් කාර්යාලය

ශ්‍රී ලාංකික අමාත්‍යවරුන් / නිලධාරීන්ගේ සංචාර සහ රාජ්‍ය දේශපාලන ප්‍රභූන් / නිලධාරීන් සමග පැවති රැස්වීම් මගින් ද්විපාර්ශ්වික දේශපාලන සබඳතා ශක්තිමත් වී ඇත. සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළ පවත්වන ලද ඉහළ මට්ටමේ රැස්වීම් හා වැඩසටහන් පහත පරිදි වේ.

I. ශ්‍රී ලංකා කාන්තා පාර්ලිමේන්තු බල මණ්ඩලය - මෙල්බර්න් 2018 මාර්තු 21-29.

II. 2018 ජනවාරි මස 10 වන දින මෙල්බර්න්හි සිදු කරන ලද ශ්‍රී ලංකා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ සංචාරයේ දී වික්ටෝරියාහි පොදු ප්‍රවාහන ආයතනය සමග සාකච්ඡා සිදුකිරීම සඳහා පහසුකම් සැලසීය.

III. 2018 පෙබරවාරි 15-19 දින සිට පැවැති ජීවිතාරක්ෂක වික්ටෝරියා නැමැති ආයතනය සමග ශ්‍රී ලංකාවේ දියේ ගිලීම් වැළැක්වීමේ හා ජල ආරක්ෂක වැඩසටහනට සහභාගීවන සාමාජිකයින් හට පහසුකම් සැලසීය.

IV. ඉන්දියානු සාගරයේ නිදහසේ යාත්‍රා කිරීමේ දී ශ්‍රී ලංකාවේ සහභාගීත්වය මැයෙන් 2018 මැයි මස 30 වන දින සිට මැයි මස 1 වන දින දක්වා මෙල්බර්න්හි නීති විශාරද ඩයකිං සරසවියේ මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණය සඳහා පහසුකම් සැපයීම.

V. 2018 ජූලි 18 වන දින වික්ටෝරියා පාර්ලිමේන්තුව විසින් සංවිධානය කරන ලද වික්ටෝරියානු සොයුරු නගර සංසදයෙහි ශ්‍රී ලංකාව නියෝජනය කළේය.

VI. 2018 අගෝස්තු 02 සිට 14 දක්වා සපුගස්කන්ද ශ්‍රී ලංකා ආරක්ෂක සේවා අණ දෙන හා මාණ්ඩලික විද්‍යාලය සඳහා ඕස්ට්‍රේලියාවේ අධ්‍යයන චාරිකාවක් සඳහා පහසුකම් සැලසීම

VII. 2018 සැප්තැම්බර් 03 සිට සැප්තැම්බර් 07 දක්වා විද්‍යා හා තාක්ෂණ පිළිබඳ රාජ්‍ය ඇමතිතුමාගේ මෙල්බර්න් වෙත සිදුකරන ලද සංචාරය සම්බන්ධීකරණය කිරීම.

VIII. 2017 සැප්තැම්බර් 07-17 ගරු ශ්‍රී ලංකා අග්‍ර විනිශ්චයකාරවරයාගේ මෙල්බර්න් සංචාරය

IX. ගරු ශ්‍රී ලංකා සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යවරයාගේ සහ බනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු එස්. අනෝමා ගමගේ මැතිනියගේ සංචාරය සඳහා පහසුකම් සැලසීම (2018 සැප්තැම්බර් 20 -24)

III සිඩ්නි හි ශ්‍රී ලංකා කොන්සාල් ජනරාල් කාර්යාලය

I. ඕස්ට්‍රේලියානු රජයේ විශේෂ සංචාර වැඩසටහන යටතේ 2018/09/23-30 දක්වා ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා ඕස්ට්‍රේලියාවේ සංචාරය කළේය.

II. ඕස්ට්‍රේලියාවේ හොඳම උරුමයන් කළමණාකරණ පරිචයන් හඳුනාගැනීම පිළිබඳ උරුමයන් කළමනාකරණ ආයතන, **සිඩ්නි** විශ්ව විද්‍යාලය, ජාතික සමුද්‍ර කෞතුකාගාරය සමග එක්ව ආචාර්ය ශිරාන් දැරණියගල සඳහා රැස්වීම් සංවිධානය කරන ලදී.

III. ශ්‍රී ලංකා බලධාරීන් සමග සම්බන්ධීකරණය කරමින් නිව්කාසල් විශ්ව විද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරී හා CRC CARE හි කළමනාකාර අධ්‍යක්ෂ මහාචාර්ය රවි නායිඩු මහතා නිදන්ගත වකුගඩු රෝගය වැළැක්වීමටත් පාංශු දූෂණය වැළැක්වීම සහ පස සංරක්ෂණය කිරීම සහ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා යෝජනාව සම්බන්ධීකරණය කිරීම.

IV. පහත සඳහන් සංචාරයන් සඳහා කොන්සියුලර් කාර්යාලය පහසුකම් සපයන ලදී.

ඒ. 26-29/03/2018- ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්

බී. 25-29/06/2018- බාලි ක්‍රියාදාම රැස්වීම් සඳහා ශ්‍රී ලංකා නියෝජිත පිරිස

ජ. 11-14/08/2018- සේනාංකාධිපති මේජර් ජනරාල් ජේ.ආර්. කුලතුංග මහතාගේ නායකත්වයෙන් යුත් සපුගස්කන්ද අණ දෙන හා මාණ්ඩලික විද්‍යාලයේ අධ්‍යයන චාරිකාව.

ඩී. 24/06/2016- NSW පාර්ලිමේන්තු මන්ත්‍රී කෙවින් හම්ෆ්ෂෙයර් මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය.

දැඩි නියඟය හේතුවෙන් NSW ගොවීන් සඳහා වියළි ආහාර ලබා දීම සඳහා 2018 සැප්තැම්බර් මාසයේ දී සිඩ්නිහි ශ්‍රී ලංකා සංගමය සමග කොන්සාල් ජනරාල් කාර්යාලය සම්බන්ධ වී කටයුතු කළේය.

<u>ආර්ථික සබඳතා හා විදේශ ආයෝජන</u>

III කැන්බරාහි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය

i. ඕස්ට්‍රේලියා ශ්‍රී ලංකා ඒකාබද්ධ වෙළඳ හා ආයෝජන කමිටුවේ සමාරම්භක රැස්වීම අප්‍රේල් 19 වන දින කැන්බරාහිදී පැවැත්විණි.

ii. ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය බටහිර ඕස්ට්‍රේලියෙන් නව ඇපරල් සමාගමක් ශ්‍රී ලංකාවට හඳුන්වා දුන්නේය. මෙම සමාගම, ලගුනී ලෝයල්ල නම් නව සන්නාම නාමයක් යටතේ ඕස්ට්‍රේලියාව තුළ ප්‍රවර්ධන කටයුතු කිරීම සඳහා ඇගලුම් නිෂ්පාදන කටයුතු සහ ආනයනය කිරීම ආරම්භ කර ඇත.

iii. ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය විසින් නවසීලන්තයේ ලඊස්ප්‍රෙස් ස්ටෆ් සමාගමට 'හන්සා සිලෝන් කෝපි' හඳුන්වා දුන්නේය.

iv. ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් ශ්‍රී ලංකාවට e-Phyto පද්ධතිය හඳුන්වාදීමේ ප්‍රයත්නයේ දී පහසුකම් සපයන ලදී. ඕස්ට්‍රේලියානු කෘෂිකාර්මික හා ජල සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මෙම e-Phyto පද්ධතිය හඳුන්වාදීමේ ප්‍රයත්නයේ දී විශාල වශයෙන් දායක වී ඇත.

v.මහ කොමසාරිස් කාර්යාලය විසින් 'ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලංකා පොල් තෙල් නිෂ්පාදන' මැයෙන් සීමාවාසික යෙකු ලෙස වාර්තාවක් ලිවීම සඳහා ඕස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි ශිෂ්‍යයෙකු මෙම කාර්යයේ යොදවා අධීක්ෂණය කළේය. මෙම වාර්තාව ශ්‍රී ලංකා අපනයන කරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සමග හුවමාරු කරගත්හ.

vi. ඕස්ට්‍රේලියාව ද ඇතුලුව විදේශයන් හි වෙසෙන විදේශගත ශ්‍රී ලාංකික තරුණයින් සඳහා අනාගත රැකියා අවස්ථාවන් සඳහා ශ්‍රී ලංකාව තුළ වයස්ගත වූවන් රැකබලා ගැනීමේ සේවකයින් සඳහා ඕස්ට්‍රේලියානු සුදුසුකම් හඳුන්වා දීමේ හැකියාව මහ කොමසාරිස් කාර්යාලය විසින් සොයා බලයි. මේ සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියානු හිමිකාර නවෝත්පාදන සෞඛ්‍යය ආරක්ෂණ විසඳුම් සපයන්නෙකු වන වයස්ගත වූවන් රැකබලා ගැනීමේ සේවකයින් පුහුණු කිරීමේ ලියාපදිංචි පුහුණු ආයතනයක් වන ඇස්පෙන් මෙඩිකල් ආයතනය ශ්‍රී ලංකාව සමග වැඩ කිරීමට එකඟ වී ඇති අතර, ශ්‍රී ලංකා රජය සමග හුවමාරු කරගත් සිය යෝජනාව ඉදිරිපත් කරන ලදී.

vii. ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික කටයුතු ආරම්භ කිරීම ඕස්ට්‍රේලියානු මුහුදු ආහාර ආනයනකරුවන්ගේ සංගමය සමග මහ කොමසාරිස් කාර්යාලය සාකච්ඡා සිදුකරමින් සිටින අතර ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය සඳහා ආයෝජනය කිරීම සඳහා ද සාකච්ඡා කර ඇත. සාකච්ඡා සඳහා පැමිණෙන ලෙස නැගෙනහිර සංවර්ධන බැංකුව විසින් ඔවුන්ට දැනටමත් ආරාධනා කර ඇති අතර මේ සඳහා ඔවුන් මූලිකව එකඟ වී ඇත. මේ පිළිබඳ සංචාරයක් සිදුකිරීම සඳහා අන්‍යොන්‍ය වශයෙන් වඩාත් පහසු දිනයන් තීරණය කිරීමට කටයුතු කළ යුතුය.

viii. ලංකා නාවික හමුදාව හා පෞද්ගලික අංශය සමග එක්ව කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව, කර්මාන්තශාලා හිමියන් සහ ඕස්ට්‍රේලියානු නැව් නිපදවීමේ සමාගම අතර රැස්වීමක් සංවිධානය කරන ලදී.

සංචාරක ප්‍රවර්ධනය

i. 2019 නොවැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාව විසින් සත්කාරකත්වය ලබාදෙන ත්‍රාසජනක රේසිං ලෝක ශූරතාව හඳුන්වාදීමේ ව්‍යාපෘතියක් මහ කොමසාරිස් කාර්යාලය විසින් ආරම්භ කරන ලදී. පසුගිය වසරට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ සංචාරය කිරීම සඳහා ඕස්ට්‍රේලියානු සංචාරකයන් 38% කින් වැඩි වී තිබේ.

ii. මහ කොමසාරිස් කාර්යාලයේ දී වාර්ෂික ශ්‍රී ලංකා උත්සවයේ දී ප්‍රවර්ධන කටයුතු සිදුකළ අතර විශේෂඥයින් විසින් සංචාරක ප්‍රවර්ධන සාකච්ඡා සිදු කරන ලදී.

iii. 2018 සැප්තැම්බර් මස අවසානයේදී ඔස්ට්‍රේලියානු ජාතිකයින් 78756 ක් ශ්‍රී ලංකාවට පැමිණියේය. 2017 වසරේ එම කාලය තුළ ඕස්ට්‍රේලියාවෙන් පැමිණි සංචාරකයින් ප්‍රමාණය 38.6% කින් වැඩිවීමකි.

මෙල්බන් හී ශ්‍රී ලංකා කොන්සාල් ජනරාල් කාර්යාලය

i. 2018 ජනවාරි 18 සිට 25 දක්වා හම්බන්තොට දිස්ත්‍රික් වාණිජ මණ්ඩලයෙහි සාමාජිකයන්ගේ මෙල්බර්න් සංචාරයට සඳහා පහසුකම් සැලසීය

ii. 2018 පෙබරවාරි මස 23 වන දින ශ්‍රී ලංකාව හා වික්ටෝරියා අතර වෙළඳාම සහ ආයෝජනය සඳහා අන්‍යොන්‍ය අවස්ථාවන් හඳුනා ගැනීම සඳහා ජාලගත ප්‍රතිග්‍රහනය කිරීමක් සංවිධානය කරන ලදී.

iii. 2018 මාර්තු මස 14 වන දින ශ්‍රී ලංකාවේ නැනෝ තාක්ෂණය පිළිබඳ ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා ඩයස්පෝරා අවස්ථාවක් සංවිධානය කරන ලදී.

iv. 2018 අප්‍රේල් 16 වන දින වික්ටෝරියා හි ශ්‍රී ලංකා අපනයනකරුවන්ගේ වෙළඳ නියෝජිත ජයම්පති ආරම්බෙපොළ මහතාගේ වික්ටෝරියා සංචාරය සඳහා පහසුකම් සැලසීය.

v. ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ශ්‍රී ලංකා පොල් සංවර්ධන අධිකාරිය හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයට මෙම ආහාර ප්‍රදර්ශනය සඳහා සහභාගී වීමට 2018 සැප්තැම්බර් 10 වන දින සිට සැප්තැම්බර් 13 වන දින දක්වා පහසුකම් සලසන ලදී.

vi. 2018 සැප්තැම්බර් 11 දින මෙල්බර්න් හි දී ශ්‍රී ලංකාවේ පොල් අපනයනකරුවන් සහ අනාගත ගැනුම්කරුවන් සමග ව්‍යාපාරික උදෑසන රැස්වීම සංවිධානය කරන ලදී.

vii. 2018 නොවැම්බර් මස 18 - 25 දක්වා ශ්‍රී ලංකාවේ ජාතික අපනයනකරුවන්ගේ මණ්ඩලයේ සංචාරයට පහසුකම් සැලසීය.

viii. 2018 නොවැම්බර් මස 26-27 දින වල ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) හි සංචාරය සඳහා පහසුකම් සැලසීය.

ix. 2018 නොවැම්බර් මස 26 දින තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) ව්‍යාපාරික නියෝජිත පිරිසට පහසුකම් සැලසීම සඳහා RMIT විශ්ව විද්‍යාලය සමග එක්ව ප්‍රජා ජාලකරණ වැඩසටහනක් සංවිධානය කරන ලදී.

සිඩ්නි හි ශ්‍රී ලංකා කොන්සියුලර් ජනරාල් කාර්යාලය

වෙළඳ.

i. **සිඩ්නි** හි ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ නිලධාරීන්ගේ නිල සංචාරය - 2018 මාර්තු මස 18 සිට 21 දින දක්වා ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනයේ (SLINTEC) ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ මූලිකත්වයෙන් යුත් සිවු සාමාජික නිලධාරීන් පිරිසක් විසින් සිඩ්නි හි සංචාරයක නිරත විය.

ii. ඕස්ට්‍රේලියාව සමග TIFA පිළිබඳ පළමු නිල රැස්වීම 2018 අප්‍රේල් 19 වන දින කැන්බරාහි පවත්වන ලදී.

iii. ඕස්ට්‍රේලියාවට ශ්‍රී ලංකා ජාතික වෙළඳ පහසුකම් සැපයීමේ කමිටුවේ සංචාරය සඳහා පහසුකම් සැලසීය. 2018 අගෝස්තු 27 සිට 31 දක්වා ශ්‍රී ලංකා දේශසීමා නියාමන ආයතනය, පෞද්ගලික අංශයේ සංවිධාන, වාණිජ මණ්ඩලය සහ ශ්‍රී ලංකා ජාතික වෙළඳ පහසුකම් සැපයීමේ කමිටුවේ (NTFC) සාමාජිකයින් 15 දෙනකු ඔස්ට්‍රේලියාවේ සංචාරය කළහ.

iv. 2018 පෙබරවාරි මාසයේ දී සිඩ්නි නුවර සිදුකළ ශ්‍රී ලංකාවේ දේපළ සංවර්ධකයන්, හා සන්කෙන් සමූහ ව්‍යාපාරයේ නියෝජිතයින්ගේ සංචාරය සඳහා පහසුකම් සැලසීය.

v. උසස් නිලතල වල කටයුතු කරන ශ්‍රී ලාංකික කාන්තාවන් 23 ක් සැප්තැම්බර් / ඔක්තෝබර් මාසයේ දී බ්‍රිස්බේන් හි සංචාරය කිරීමට පහසුකම් සලසා ඇත.

vi. ශ්‍රී ලංකා ජාතික අපනයනකරුවන්ගෙන් ව්‍යාපාරික නියෝජිත පිරිස වෙනුවෙන් මෙල්බර්න්හි පැවැති සන්ධ්‍යා කාල ජාලගත හමුව- 2018 නොවැම්බර් 19-24 දක්වා මෙල්බර්න් ව්‍යාපාරික නියෝජිත පිරිස සාමාජිකයන් 12 දෙනෙකි.

vii. වික්ටෝරියානු වාණිජ හා කර්මාන්ත මණ්ඩලය (VCCI) සමග රැස්වීම - NCE නියෝජිත කණ්ඩායමේ සංචාරක සාමාජිකයන් විසින් සිය මෙල්බන් සංචාර අතරතුර දී වික්ටෝරියා වාණිජ මණ්ඩලයේ දී රැස්වීමක් හා අනෝන්‍ය ක්‍රියාකාරිත්ව සැසියක් පැවැත්විය.

viii. වික්ටෝරියා ප්‍රාන්තයේ හා ඕස්ට්‍රේලියා රජයේ වෙළඳ නියෝජිතයන් සමග රැස්වීම - NCE සංචාරක නියෝජිත පිරිසේ සාමාජිකයන් විසින් මෙල්බෝර්න් හි සංචාරයක නිරත වික්ටෝරියා වෙළඳ කලාපයේ දකුණු ආසියානු හා ජාත්‍යන්තර සම්බන්ධීකාරක විශේෂඥ ජේම්ස් එඩ්වර්ට්ස් මහතා හමුවිය.

ix. ඕස්ට්‍රේලියානු අපනයන කවුන්සිලය සමග රැස්වීම - NCE නියෝජිත කණ්ඩායමේ සාමාජිකයින් මෙල්බර්න් හි සංචාරය අතරතුර ඕස්ට්‍රේලියාවේ අපනයන කවුන්සිලයේ පර්යේෂණ හා වික්ටෝරියා රාජ්‍ය කළමනාකරු නීල්ස් ස්ට්‍රෝට්සන් හමු විය.

x. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) මූලිකත්වයෙන් සිදුකරන ලද ශ්‍රී ලාංකික තොරතුරු තාක්ෂණ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ නියෝජිත පිරිසගේ සිඩ්නි සංචාරය - සිඩ්නි හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් සමග සහයෝගයෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) විසින් මෙහෙයවනු ලබන IT-BPM සමාගම් හතෙන් 2018 නොවැම්බර් 28 සිට 30 දක්වා සිඩ්නි සංචාරය කළේය. ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ කර්මාන්තය සඳහා පහසුකම් සැලසීම සහ ඒවාට සහාය වීම සඳහා වෙළෙඳපොළ ප්‍රවේශ වැඩසටහන් නිවරදි කිරීම මෙහි අරමුණයි.

xi. සිඩ්නි නුවර පිහිටි Macquarie විශ්ව විද්‍යාලය වෙත ශ්‍රී ලංකා ICTA නියෝජිත පිරිසගේ සංචාරය- 2018 නොවැම්බර් මස 30 වන දින ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායම සඳහා Macquarie විශ්ව විද්‍යාලයේ පරිගණක දෙපාර්තමේන්තුව වෙත කොන්සියුලර් කාර්යාලය මගින් මෙම හඳුනාගැනීමේ සංචාරය සංවිධානය කරන ලදී.

xii. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ-BPM සමාගම් සඳහා සිඩ්නි හි B2B රැස්වීම් පැවැත්වීම - අලෙවිකරණ කවුළුව, උපදේශක නියෝජිතයන් සහ කොන්සල් කාර්යාලය මගින් 2018 නොවැම්බර් මස 29 වන දින ශ්‍රී ලාංකික සමාගම් සඳහා ගැලපෙන රැස්වීම් සහ B2B සැසි සංවිධානය කරන ලදී.

සංචාරක කර්මාන්තය

I. සිඩ්නි හි සංචාරක කර්මාන්ත ප්‍රදර්ශනයට ශ්‍රී ලංකා සහභාගීත්වය - ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (2018 අගෝස්තු 21 සිට 22 දින දක්වා ඩාර්ලින් හාර්බර්,ඩොක් සයිඩ් හිදී)

II. කොන්සල් ජනරාල් හා කොන්සල් වාණිජ කටයුතු මගින්, 2018 ඔක්තෝබර් 4 සිට 21 දක්වා සිඩ්නි නුවර දී Night Noodle Markets මැයෙන් පැවැත් වූ වාර්ෂික උත්සවයේ දී ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය ප්‍රවර්ධන කිරීම සඳහා ෆෙයාර්ෆැක්ස් මීඩියා ඕස්ට්‍රේලියා සමග රැස්වීමක් පැවැත්විය.

III. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශයේ ඉල්ලීම පරිදි, කොන්සියුලර් කාර්යාලය (I) FAM සංචාරක කටයුතු සඳහා තෝරාගත් බාහිර සංචාරක මෙහෙයුම්කරුවන් (II), FAM සංචාරය සඳහා තෝරාගත් සංචාරක මාධ්‍යවේදීන්, (III) ඔස්ට්‍රේලියානු බිල් බෝඩ් සමාගම් , (IV) ඕස්ට්‍රේලියාවේ මුද්‍රිත සංචාරක සඟරා , (V) සංචාරක වෙළඳාමේ නියුතු මහජන සම්බන්ධතා සමාගම් පිළිබඳ ලේඛනයක් සපයන ලදී.

ආයෝජන

I. 2018 අප්‍රේල් 2 වැනි දින ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ / ආයෝජන සමග, එරට ආයෝජන මණ්ඩලයේ කළමනාකාර අධ්‍යක්ෂක කිම් ඩැරින්ග් හෙලන් කිමින්සි මහතා හමුවීම සඳහා රැස්වීමක් සංවිධානය කරන ලදී.

II. ලැබ් ෆෙරෙන්ඩ් ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂ කාර්ල් වයිසෙන්බෙක් මහතා හමු වූ වාණිජ කොන්සාල් වරයා කොළඹදී සිය ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට දක්වනු ලබන තම කැමැත්ත පිළිබඳ සාකච්ඡා පවත්වනු ලැබීය. රැස්වීමෙන් පසුව, කාර්ල් මහතා අගෝස්තු මාසයේදී ශ්‍රී ලංකාවට පැමිණියේය. දැන් ඔහු තම තොරතුරු තාක්ෂණ ව්‍යාපාරය කොළඹ දී පිහිටුවීමට සැලසුම් කරයි.

<u>සංස්කෘතික සබඳතා</u>

<u>කැන්බරා හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය</u>

I. තේ හා සංචාරක ප්‍රවර්ධන ප්‍රදර්ශන කුටිය සමග පෙබරවාරි මාසයේ දී පැවැති වාර්ෂික කැන්බරා බහු සංස්කෘතික උත්සවය සඳහා මහ කොමසාරිස් කාර්යාලය සහභාගී විය.

II. ශ්‍රී ලංකාවෙන් පැමිණි සංචාරක කර්මාන්තයේ 13 දෙනෙකුගෙන් යුත් නියෝජිත සාමාජික කණ්ඩායමක් මහ කොමසාරිස් කාර්යාලය මගින් පහසුකම් සපයන ලද දියේ ගිලීමෙන් ජීවිතාරක්ෂාව ලබාගැනීම සහ ජලයේ සුරක්ෂිත වීම පිළිබඳ වැඩමුළුව සඳහා සහභාගී විය.

III. අප්‍රේල් මස ගෝල්ඩ් කෝස්ට් හි පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේ ක්‍රීඩා අමාත්‍ය සහ නිලධාරීන්ගේ සහභාගීත්වය මහ කොමසාරිස් කාර්යාලය සම්බන්ධීකරණය කළේය.

මෙල්බන් හි ශ්‍රී ලංකා කොන්සියුලර් ජනරාල් කාර්යාලය

I. 2018 මැයි 17 සිට ජූනි 11 දක්වා මෙල්බර්න්හි ශ්‍රී ලංකා විසුඩිමිමග්ග ජාත්‍යන්තර බෞද්ධ සංවිධානයේ අනුනායක අතිපූජ්‍ය නාගොඩ සද්ධාළා හිමියන්ගේ සංචාරයට පහසුකම් සැලසීම.

II. වික්ටෝරියා ප්‍රාන්ත රජය විසින් එක්සත් ජාතීන්ගේ දිනය වෙසක් උත්සවය 2018 මැයි 12 වන දින මෙල්බර්න් නගර ශාලාවේ දී පවත්වන ලදී.

III. 2018 ජූනි 27 දින වික්ටෝරියාහි බහු සංස්කෘතික කොමිෂන් සභාවේ දී බහු සංස්කෘතික හා විවිධත්ව දිනය සැමරීම සඳහා සහභාගී වීම.

IV. 2018 අගෝස්තු 25 දින මහමෙව්නාව භාවනා අසපුව විසින් සංවිධානය කරන ලද මෙල්බර්න් ධාතු මන්දිර පූජා සඳහා පහසුකම් සැලසීම.

බීජිං හී ශ්‍රී ලංකා තානාපති කාර්යාලය

ද්විපාර්ශ්වික සබඳතා

i. මොන්ගෝලියාවෙහි උලන්බාටර් හි ශ්‍රී ලංකා නිර්වේතනික කොන්සියුලර් කාර්යාලය පිහිටු වීම ආශ්‍රිත කටයුතු තානාපති කාර්යාලය මගින් සම්බන්ධීකරණය කරන ලදී.

ii. ගරු තානාපති ආචාර්ය කරුණාසේන කොඩිතුවක්කු මහතා චීනයේ අනෙකුත් පිළිගත් රටවල් සමග ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කිරීම සඳහා පහත සඳහන් රැස්වීම් /අවස්ථා සඳහා සහභාගී විය

-2018 ජනවාරි මස 17 වන දින තානාපති කාර්යාලයේ දී විදේශ රටවල් සමග මිත්‍රත්වය සඳහා චීන සංගමය රැස්වීම.

- චීනය හා ශ්‍රී ලංකාව අතර ආයෝජන, වෙළඳ හා සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් තානාපති කාර්යාලයේ 2018 පෙබරවාරි 27 වන දින ෂින්හුවා ප්‍රවෘත්ති ඒජන්සිය සමග පැවැති සම්මුඛ සාකච්ඡාව.

-ගුවංග් ෂි ෂුඅන්හි ස්වාධීන කලාපයේ දී 2018 අප්‍රේල් 24 සිට 28 දක්වා ගුවාන්සි සහ ලෝක ගමන.

- 2018 මැයි මස 6 -7 යන දිනවල ෂෙන්සෙන්හිදී 14 වන චීන (ෂෙන්ෂෙන්) ජාත්‍යන්තර සංස්කෘතික කර්මාන්ත වෙළඳ ප්‍රදර්ශනයට ශ්‍රී ලංකා ප්‍රදර්ශකයින් සහභාගී විය.

-2018 මැයි 26-28 දක්වා බෙන්ග්බු, අන්හුයි හිදී, ආන්හුයි බෙන්ග්බු පුරාණ නේවාසික එක්ස්පෝ පාක් සංචාරය සඳහා සහභාගී වීම

-2018 ජුනි මස 11-14 යන දිනවල දී කන්මින්ග් සහ ලින්කාන්හි නෙස්ලේ ආයෝජන යුනුන් සමූහ සමාගමේ සංචාරය කිරීම.

- 5 වන චීනය-දකුණු ආසියාවේ එක්ස්පෝ සහ චීනයේ කුන්මින්ග් ආනයන අපනයන ප්‍රදර්ශනය, 2018 ජුනි මස 14-17 වන දිනවල දී කුන්මියෙහි දී පැවැත්විය.

- තිරසර නාගරික සංවර්ධන වැඩසටහන පිළිබඳ 2 වන ඉහළ මට්ටමේ ජාත්‍යන්තර සංසදය.

- 2018 වෙස්ට් කෝස්ට් අන්තර්ජාතික ඉ-ක්‍රීඩා කර්මාන්ත සමුළුව අගෝස්තු 11 සිට 12 දක්වා කිංඩාවෝ, ෂැන්ග්ඩොං පළාතේ දී පැවැත් වීම

-2018 වසරේ සැප්තැම්බර් 7-11 දිනවල ටිබෙට්හිදී 2018 ජාත්‍යන්තර සංචාරක හා සංස්කෘතික ප්‍රදර්ශනය පැවැත්වීම.

- 17 වැනි බටහිර චීන ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය (එක් තීරයක් හා එක් මාවතක් අධ්‍යාපන ප්‍රදර්ශනය) 2018 සැප්තැම්බර් මස 19-21 දක්වා, චෙන්ග්ඩු, සිචුවාන් පළාතේ දී පැවැත් වුණි.

-NSBM හි අධ්‍යාපනික සහයෝගීතා සංසදය 2018 සැප්තැම්බර් 19 සිට 21 දින දක්වා පැවැත් වුණි.

2. බහුපාර්ශ්වික සබඳතා

ආසියාවේ අනෝන්‍ය ක්‍රියාකාරී විශ්වාසය ගොඩනැගීමේ පියවර පිළිබඳ සමුළුව (**CICA**)

2018 අගෝස්තු මස 15 වැනි දින ආසියානු කලාපයේ අනෝන්‍ය ක්‍රියාකාරී විශ්වාසය ගොඩනැගීමේ පියවර පිළිබඳ සමුළුවේ ශ්‍රී ලංකාව පූර්ණ සාමාජිකත්වය ලබා ගත්තේය. ශ්‍රී ලංකාව වෙනුවෙන් ආසියාවේ අනෝන්‍ය ක්‍රියාකාරී විශ්වාසය ගොඩනැගීමේ පියවර පිළිබඳ සමුළුව සාමාජික රාජ්‍යන් අතර ප්‍රමුඛ මාර්ගෝපදේශ සබඳතා ප්‍රකාශයට සහ අල්මටී පනතට බෙයිජිං හිදී පැවති උත්සවයකදී ගරු තානාපතිවරයා විසින් අත්සන් තබන ලදී.

උණ බට සහ බැම්බු සඳහා ජාත්‍යන්තර ජාලය (INBAR)

i. උණ බට සහ බැම්බු සඳහා ජාත්‍යන්තර ජාලයේ **(INBAR)** ලේකම් කාර්යාලය සමග නිරන්තර සබඳතා පවත්වාගෙන යන අතර, INBAR ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරන ලද රැස්වීම් / උත්සවවලට සහභාගී වේ.

ii. 2018 ජුනි 25-27 දක්වා බීජිං හි පවත්වන ලද INBAR හි යෝජනා සහ ගෝලීය උණ බැම්බු සහ උණ බට කොන්ග්‍රසය සම්බන්ධයෙන් 2018 දී INBAR" ITI" MST & R හා MOFA සමග තානාපති කාර්යාලය මගින් පහසුකම් සැපයීය.

3. ආර්ථික සබඳතා හා විදේශ ආයෝජන

ද්විපාර්ශ්වික වෙළඳාම ප්‍රවර්ධනය කිරීම

I. ශ්‍රී ලංකා සිවුවාන් වෙළඳ ආයෝජන ඉහළ නැංවීම සඳහා ජාත්‍යන්තර වෙළඳාම ප්‍රවර්ධනය කිරීම සඳහා චෙන්ග්වු සිවුවාන් ප්‍රාන්තයේ චීන කවුන්සිලය සමග පැවැති රැස්වීම - 9 වන දකුණු ආසියාවේ සිවුවාන් ව්‍යාපාර ප්‍රවර්ධන වට රවුම් මේස සමුළුව සඳහා සහභාගී වූ පිරිස ශ්‍රී ලංකා දූත මණ්ඩල සාමාජිකයින් 22 දෙනෙකුගෙන් සමන්විත වූ අතර, වාණිජ මණ්ඩලයේ සහ COYLE සහ SLS යන ආයතනවල සාමාජිකයින්ගෙන් මෙම පිරිස සමන්විත විය. ව්‍යාපාර වට රාමුව සහ චීන දකුණු ආසියානු ප්‍රමිතිකරණ සම්මන්ත්‍රණයේදී ඉදිරිපත් කිරීම් සිදුකරන ලදී.

II. චීනයේ ස්වභාවික සම්පත් අමාත්‍යාංශයේ ජාතික මැලේරියා තාක්ෂණ පරිපාලන මධ්‍යස්ථානය සමග පැවැති රැස්වීමේ දී 2018 දෙසැම්බර් මස බීජිං අන්තර්ජාතික මැණික් හා ස්වර්ණාභරණ වෙළෙඳ ප්‍රදර්ශනයේ ශ්‍රී ලංකා සහභාගිත්වය පිළිබඳව සාකච්ඡා කළහ.

III. එක් තීරයක් හා මාවතක් ජාත්‍යන්තර නිෂ්පාදන ධාරිතා සහයෝගිතා ප්‍රවර්ධන මධ්‍යස්ථානයට පහසුකම් සැලසීම හා සංවිධානය කිරීම. සාමාජිකයන් 22 ක් ශ්‍රී ලංකාවේ සංචාරය කරන ලදී. කොළඹ කිංග්ස්බරි හෝටලයේ දී සම්මන්ත්‍රණයක් පැවැත් වූ අතර ගරු මුදල් නියෝජ්‍ය අමාත්‍ය

එරාන් වික්‍රමරත්න මහතාද සහභාගි විය. සංවර්ධකයින් සමග සහයෝගයෙන් කොළඹ වරාය නගරයේ සංචාරය කිරීම සංවිධානය කරන ලදී.

IV. දකුණු ආසියා වෙළඳ භාණ්ඩ වෙළඳ පොළ පැවැත්වීම සඳහා 2018 ජුනි මස 6 වන දින සිට 10 දක්වා දක්වා කුණ්මිං හි පවත්වන ලද ප්‍රදර්ශකයින් 80 දෙනකු සමග සහභාගි විය.

V. කොමර්ෂල් අංශය විසින් ආරම්භ කරන ලද ශ්‍රී ලංකා මෘදුකාංග සංගමය SLASSCOM හා චෙන්දු මෘදුකාංග සංගමය අතර අවබෝධතා ගිවිසුමට සවුවාන් CCPIT උප කමිටුව එකග විය.

නව නිෂ්පාදන හඳුන්වා දීම

-චීනයේ ශ්‍රී ලංකා ධීවර නිෂ්පාදන හඳුන්වා දීමට කටයුතු කර ඇත.

-පවත්නා නිෂ්පාදනවල වෙළඳපල කොටස පුළුල් කිරීම, මැණික් හා ස්වර්ණාභරණ ප්‍රවර්ධනය කිරීම සහ චීනයේ ශ්‍රී ලංකා ප්‍රදර්ශනාගාර වැඩි කිරීම. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ වෙළඳ ප්‍රදර්ශන 15 කට අධික සංඛ්‍යාවක් හා ප්‍රදර්ශකයින් 12 කට අධික සංඛ්‍යාවක් සහභාගි වී ඇත.

වෙළඳ පොළවල් සංවිධානය කිරීම / සහභාගිත්වය

-හැන්ග්ඕයු සුපිරි එක්ස්පෝ ජනවාරි

-ෂෙන්සෙන් ටී එක්ස්පෝ මාර්තු

- ෂැංහයි ස්වර්ණාභරණ

- දලියාන් ජුවලරි ප්‍රදර්ශනය -අප්‍රේල්

- කුන්මින්-ජූනි දකුණු ආසියානු වෙළඳ භාණ්ඩ ප්‍රදර්ශනය (බීපිං-සැප්තැම්බර්)

- 10 වන චීන හයිනාන් ජාත්‍යන්තර සාගර කර්මාන්තය

- දකුණු ආසියාවේ එක්ස්පෝ ජූනි කුන්මින්

චීනයේ ශ්‍රී ලංකාවේ තත්ත්වය ශක්තිමත් කිරීම සඳහා පහත දැක්වෙන ප්‍රදර්ශනවලදී ශ්‍රී ලාංකික ප්‍රදර්ශකයකු සහභාගී විය.

-පළමු ෂැංහයි හි චීන ජාත්‍යන්තර ආනයන එක්ස්පෝ ප්‍රදර්ශනය CIIE

-චීනයේ දුම්රිය ප්‍රදර්ශනය

-බීජිං මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනය බීජිං දෙසැම්බර්

-හැන්ග්ෂුයි තේ එක්පෝ දෙසැම්බර්

-ලෝක සංචාරක සන්ධානය

-ගෝලීය ලොජිස්ටික් සන්ධානය

-ආන්හෙයි ලෝක උරුම උත්සවය තේ ප්‍රවර්ධනය කිරීම

-ශ්‍රී ලංකා ආයෝජන සමුළුව - ආන්හෙයි ශ්‍රී ලංකාව තුළ ආයෝජන අවස්ථාවන් පිළිබඳව ඉදිරිපත් කිරීමක් කළේය

-මධ්‍යම චීනය චැන්ෂා ආනයන එක්ස්පෝ ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය කරයි

-කෘෂිකාර්මික නිෂ්පාදන වෙළඳ නාම ප්‍රරවර්ධන සම්මන්ත්‍රණය

-හයිනාන් BOAO සමුළුව

අභ්‍යන්තර වෙළඳ / මිළ ගැනිමේ දූත මණ්ඩල

-චීනයේ කෘෂිකාර්මික තොග වෙළඳ සංවිතයේ සාමාජික සාමාජිකාවන් 8 දෙනකු ශ්‍රී ලංකාවට පැමිණෙන ලදී.

වෙළඳපොළ පිවිසුම් බාධක සඳහා විසඳුම් ලබාදීම

-ශ්‍රී ලංකාවේ විසිතුරු මත්ස්‍ය අපනයනකරුවන් මුහුණපා ඇති නිරෝධායන ගැටළු සම්බන්ධයෙන් චීනයේ කෘෂිකර්ම අමාත්‍යාංශය සමග සාකච්ඡා කර ඒ අනුව එම ගැටළුව විසඳා ගැනීමට අවශ්‍ය පියවර ගනු ඇත.

සම්මන්ත්‍රණ / වැඩමුළු / ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම

-ශ්‍රී ලංකා ප්‍රවර්ධන වැඩසටහන චෙන්දු සහ කුන්මින්

PPP වැඩසටහනේ ආරම්භක ව්‍යාපාර ජාලකරණය / ප්‍රගතිය

-ශ්‍රී ලංකා මාළු නිෂ්පාදන, කොහු කෙඳි, සහ අත්‍යවශ්‍ය තෙල් සඳහා තේ මිලදී ගැනීමට පහසුකම් සලසා ඇත.

තේ ප්‍රවර්ධනය

-චීනයේ කලූ තේ වෙළඳපලේ නිරන්තරයෙන් වර්ධනය වන නව අපනයනකරුවන්ට චීනය පුරා විහිදුණු සල්පිල ප්‍රදර්ශන කුටිවල ශ්‍රී ලංකාවේ සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම.

ආයෝජන ප්‍රවර්ධන

-ශ්‍රී ලංකාවේ සිවුවාන් ආයෝජන ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත්වීම. විශේෂයෙන් යටිතල පහසුකම්, නිවාස, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ, සාම්ප්‍රදායික චීන වෛද්‍ය, තොරතුරු තාක්ෂණ, රෙදිපිළි සහ ඉලෙක්ට්‍රෝනික උපකරණ, ආහාර සහ ආපන ශාලාවල.

-තානාපති කාර්යාලයේ SEIC ආයෝජන සම්මන්ත්‍රණයට පහසුකම් සැලසීම

-තානාපති කාර්යාලයේ ආයෝජන ආයෝජන සම්මන්ත්‍රණ පැවැත්වීම

-2018 ඔක්තෝබර් 23 සිට 25 දක්වා ශ්‍රී ලංකාව වෙත පීලින් පළාතේ නියෝජිත පිරිසට පහසුකම් සැලසිනි.

-ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය විසින් ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය වෙත පහසුකම් සැලසීය. CIFTIS 2018 මැයි 28 වනදා සිට ජූනි 1 වැනි දා දක්වා XIAN වට මේසයේදී සහභාගී විය.

සංචාරක ප්‍රවර්ධන

-චෙන්ග්ඩු සහ කුන්මින් හි වෙළඳ සල්පිල්වලදී සිචුවාන් සහ ශ්‍රී ලංකාව අතර ද්විපාර්ශ්වික සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය සඳහා චෙන්ඩු ටීවී සහ සිචුවාන් පළාත් සංචාරක අධිකාරිය සමග රැස්වීම් කිහිපයක් පැවැත්විය.

-CITS සමග ඒකාබද්ධව MICE සංචාරක සම්මේලනයක් සංවිධානය කරන ලදී. චීන සංචාරක කර්මාන්තයේ විශාලතම සංචාරක ආයතනයකි.

-ශ්‍රී ලංකා සංචාරක හා සම්මේලන කාර්යාංශයේ IBTM සහ BITM, වෛද්‍ය සංචාරක සහ චීනයේ බොහෝ සංචාරක ප්‍රසංග වලදී පහසුකම් සැලසීම. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සහයෝගය ඇතිව ශ්‍රී ලංකාවට FAM සංචාරයන් සංවිධානය කිරීම මගින් MICE අංශය ශක්තිමත් ලෙස ප්‍රවර්ධනය කරනු ඇත.

වෙනත් වෙළඳාම හා සම්බන්ධ ව්‍යාපෘති

- චීනයේ ආනයන ෂැන්හයි සමාගමට පහසුකම් සැලසිනි

4. සංස්කෘතික සබඳතා

i.මෙහිදී ඡායාරූප ප්‍රදර්ශනයක් පවත්වන ලද්දේ ශ්‍රී ලංකා හා චීන සබඳතා ප්‍රදර්ශනය කිරීමෙනි. ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වය සහ ශ්‍රී ලාංකීය මැණික් පිළිබඳ ප්‍රචාරක දැන්වීම් ප්‍රචාරණ කටයුතු සිදු කරන ලදී. එම සිදුවීම සති දෙකකට පෙර සිට චීන මාධ්‍යවල ප්‍රකාශයට පත් කර ඇත.

ii. ශ්‍රී ලංකාවේ චිත්‍රපටි රූගත කිරීමේ ස්ථාන සහ ජාත්‍යන්තර චිත්‍රපටි පිළිබඳ තොරතුරු ප්‍රදර්ශනය කරමින් මැයි මස 17-19 දක්වා බීජිං හි 15 වන ජාත්‍යන්තර චිත්‍රපට හා රූපවාහිනී වැඩසටහන් ප්‍රදර්ශනය සඳහා තානාපති කාර්යාලය සහභාගී විය.

iii. ශ්‍රී ලංකා සංස්කෘතිය හා කලාව ජූනි 22-23 දක්වා ෆුජියෑන් හි සාගරයේ සේද මාවත මැයෙන් ECI ජාත්‍යන්තර නවෝත්පාදන උළෙලෙහිදී ප්‍රදර්ශනය කෙරිණි.

5. කම්කරු සුබසාධනය

i. තානාපති කාර්යාලය මගින් ශ්‍රී ලංකා කම්කරු ප්‍රජාවගේ සුබසාධනය සඳහා හොං කොං හි කොන්සියුලර්වරයා සම්බන්ධීකරණය කළේය.

ii. චීන සංචාරකයන්ගේ වීසා අයදුම් කිරීමේ ක්‍රියාවලිය පහසු කරවීම සඳහා තානාපති කාර්යාලය අදාල බලධාරීන් සමග එක්ව කටයුතු කර ඇත.

6. වෙනත්

I. අධ්‍යාපනය

-ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා චීන ශිෂ්‍යත්ව අපේක්ෂකයින්ට චීන ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදී.

-චීනයේ ශ්‍රී ලාංකික සිසුන්ට අවශ්‍ය උපදෙස් ලබා දීම සඳහා තානාපති කාර්යාලය විසින් අදාළ චීන අධ්‍යාපන බලධාරීන් සම්බන්ධ කර ගනිමින් ඔවුන්ගේ විමසීම්, අභියාචනා සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

-අධ්‍යාපන, සමාජ හා සංස්කෘතික අංශය පිළිබඳ තොරතුරු සැපයීම සහ ශී ලංකාවේ සිසුන් සඳහා අධ්‍යාපන හා සම්බන්ධ ගැටළු පිළිබඳ තානාපති කාර්යාලයේ උපෙද්ශන සඳහා ක්ෂණික ප්‍රවේශය ලබා දීම සඳහා සමාජ මාධ්‍ය කණ්ඩායමක් (WeChat) ආරම්භ කරන ලදී.

-තානාපති කාර්යාලය, පිංග්සු (සැප්තැම්බර් 14 සිට 18 දක්වා) හි උසස් වෘත්තීය අධ්‍යාපන සංසදයේ සහ අධ්‍යාපනික ප්‍රදර්ශනය (සැප්තැම්බර් 20 සිට 24 දක්වා) හා සංසද සඳහා සහභාගි විය. ඒ සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය හා පහසුකම් සැපයීම, අධ්‍යාපන අමාත්‍යාංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, NSBM, CINEC සහ ප්‍රදර්ශන කුටි සඳහා ශ්‍රී ලාංකික සිසු සිසුවියන් විසින් සංවිධානය කරනු ලැබේ. අධ්‍යාපනික එක්ස්පෝවේ ප්‍රතිඵලයක් වශයෙන්, චීන ජාත්‍යන්තර අධ්‍යාපන ආයතනය (CIIE) 2018 සැප්තැම්බර් 24 වැනි දින CINEC සමග අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබූ අතර, සම්බන්ධතා වැඩි දියුණු කිරීම සඳහා සහ ඉදිරි වසරවල දී නව හවුල් සහයෝගීතා වර්ධනය කිරීමට හැකි විය. තවදුරටත් චෙංඩුහි උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ප්‍රධාන බලධාරීන් / පුද්ගලයන් සමග සබඳතා ඇති කර ගැනීමට NSBMB ආයතනයට අවස්ථාව ලැබිණි.

II. ආරක්ෂක

-තානාපති කාර්යාලය ශ්‍රී ලංකා හමුදාවන් සඳහා හමුදා පාඨමාලා සඳහා පහසුකම් සැපයූ අතර 2018/19 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන්ට නොමිලේ මිලිටරි පාඨමාලා 285 ක් ලැබිණි.

-ශ්‍රී ලංකා යුද හමුදාවේ, නාවික හා ගුවන් හමුදා පුහුණු ආයතන විසින් ආරක්ෂක අමාත්‍යාංශය විසින් පිළිගන්නා ලද යුද හමුදා පාඨමාලා ශ්‍රී ලංකා ජ්ලැට් නිළධාරීන් 8 දෙනෙකු (8) වෙත භාර දෙන ලදී.

-2018 ජූලි මස 22-31 දින දක්වා චීනයේ ඉහළ මට්ටමේ බොක්සිං පුහුණුව සඳහා ක්‍රීඩකයින් 12 දෙනෙකුගෙන් යුත් ශ්‍රී ලංකා යුද හමුදා බොක්සිං කණ්ඩායම් සහභාගී විය.

-ජාතික ආරක්ෂක අමාත්‍යාංශයේ අන්තර්ජාතික මිලිටරි සහයෝගිතා ආයතනය (OIMC) සමග සාකච්ඡාව හේතුවෙන් චීන රජය ශ්‍රී ලංකා යුධ හමුදා ඇකඩමිය (ශ්‍රී ලංකා යුධ හමුදාව) විසින් ශ්‍රී ලංකා යුද හමුදාවට භාර දී ඇත.

ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සහ ශ්‍රී ලංකා නාවික හමුදාවේ මාණ්ඩලික ප්‍රධානී ඇතුළු ශ්‍රී ලංකා දූත පිරිස ඇතුළු 2018 ඔක්තෝබර් මස 24 සිට 26 දක්වා බීජිංහි පැවති බීජිං Xiangshan සමුළුවට සහභාගී විය. ආරක්ෂක ලේකම් ජෙනරල් වෙයි ෆෙයිහ්, සංසදයේ ප්‍රධාන මාණ්ඩලික ප්‍රධානී ෂාඕ නිල සාකච්ඡා පැවැත්වීය.

-ඔක්තෝබර් 04 වැනිදා චීන නාවුක නෞකාව දින හතරක සංචාරයක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙනු ඇත.

නාවික හමුදාවේ රියර් අද්මිරාල් නාවික හමුදාපති වයිස් අද්මිරාල් නාවික හමුදාවේ පැල්මෙක් නාවික හමුදාවේ නියෝජිත පිරිසක් සහභාගි වූ අතර ගාලූ සංවාදය සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සංවිධානය කරන ලදී.

-ශ්‍රී ලංකා යුද හමුදාවේ බ්‍රිගේඩියර්වරුන් දෙදෙනෙකු 2018 දී ගුවන් ප්‍රදර්ශනය සඳහා සහභාගී විය.

කොන්සල් ජනරාල් කාර්යාලය, ගුආන්ෂෝ

1. ද්විපාර්ශ්වික සබඳතා

නියෝජිත කණ්ඩායමේ සංචාරය

I. ගුආන්ග්ඩොං කෘෂිකර්ම විද්‍යා ඇකඩමියේ සභාපති (ජීඒඑස්ඒ) සහ විවිධ කෘෂිකාර්මික පර්යේෂණ අංශ / ආයතනවලින් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පස් දෙනෙකුගෙන් සැදුම්ලත් නියෝජිත පිරිස 2018 ජුනි 25 සිට 28 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරය කළේය.

විදේශ කටයුතු අමාත්‍යාංශයේ අදාළ දේශපාලන කවුන්සිලය සමග සංචාරය කළ දූත පිරිස සඳහා රැස්වීමක් කොන්සල් ජනරාල්වරයා පිළියෙල කළේය.

ශ්‍රී ලංකා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමග ජීඒඑස්ඒ විසින් යෝජනා දෙකක් ඉදිරිපත් කර ඇත.

II. චීනයේ ආසියාන් කාර්යාංශයේ උප සභාපති හුවාන් පිංසි මහතා සහ සිව් දෙනෙකුගෙන් සමන්විත නියෝජිත පිරිසේ ශ්‍රී ලංකා සංචාරය 2018 ජූලි මස 1- 4 වන දින දක්වා සිදුකරන ලදී

III. චීන විද්‍යායතන විද්‍යා පීඨයේ උප සභාපති සහ චීනයේ ගුවැන්ෂු හි අධ්‍යාපන හා පර්යේෂණ ප්‍රධානියා සහ නියෝජිත පිරිස 2018 සැප්තැම්බර් 25 සිට 30 දක්වා රුහුණු විශ්වවිද්‍යාලයේ සංචාරය කළේය.

IV. චීනය-ආසියාන් මහලේකම් කාර්යාලය සමග සබඳතා තවදුරටත් ශක්තිමත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ ආයෝජන මණ්ඩල නියෝජිතයන් සඳහා කොන්සියුලර් ජනරාල්වරයා විසින් රැස්වීම් සංවිධානය කළේය.

2. ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන

සංචාරක සහ වෙළඳ / ආයෝජන සංසද

I. 2018 මාර්තු 1-3 දක්වා ගුවන්ග් ෂූ ජාත්‍යන්තර සංචාරක වෙළඳපොලට ශ්‍රී ලංකා සහභාගීත්වය කොන්සාල් ජනරාල්වරයා සංවිධානය කළ අතර, ඒ සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ද ඇතුලුව ශ්‍රී ලංකා සංචාරක නියෝජිතයින් හා සංචාර මෙහෙයවන්නන් 15 දෙනෙකු සහභාගී විය. ශ්‍රී ලංකාව විසින් තෙවැනි වරටත් වඩාත් ආකර්ෂණීය සංචාරක ගමනාන්තය නැමැති සම්මානය දිනා ගත්තේය. 2014 වසරේ සිට ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ දෙවන විශාලතම සංචාරක මූලාශ්‍රය වන්නේ චීනයයි.
II. ගුආන්ෂු හි ශ්‍රී ලංකා සංචාරක ප්‍රදර්ශනය 2018 මාර්තු 5 වනදා GITF3 සමග පවත්වන ලදී. සහභාගී වූ ශ්‍රී ලංකා සමාගම් වලට ව්‍යාපාරික හා ව්‍යාපාර ජාලකරණ සැසිය සඳහා ව්‍යාපාරික අවස්ථා බොහොමයක් ලබා දුනි.
III. ශ්‍රී ලංකාවේ වනජීවී කලාපයේ ගුආන්ග්ඩොන්ග් පළාතේ දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා වනජීවී විශේෂඥයෙකු වන ගිහාන් ද සිල්වා විජයරත්න මහතා සමග ශ්‍රී ලංකා වනජීවී සංරක්ෂණ වැඩමුළුව සංවිධානය කරන ලදි.

අ. මෙම වැඩමුළුව මගින් ශ්‍රී ලංකාව තුළ වනජීවීන් හා වනජීවී safaris ආවරණය කරන ලදී.

IV. 18 වන ජාත්‍යන්තර ආහාර ප්‍රදර්ශනය (GUF) ගුවැන්ෂෝ නුවරදී ශ්‍රී ලංකා සහාගීත්වයට කොන්සල් ජනරාල්වරයා පහසුකම් සැලසීය. තේ සහ පොල් අංශයේ ශ්‍රී ලාංකික සමාගම් දෙකක් මේ සඳහා සහභාගී විය.

V. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා Guangzhou විදේශ කාර්යාලය විසින් සංවිධානය කළ Guangzhou Trade Fair සඳහා කොන්සල් ජනරාල්වරයා සහභාගී විය, චීනය වෙත සාම්ප්‍රදායික හා අගය එකතු කළ අපනයනය ප්‍රදර්ශනය කරන ලදී.

VI. චීන සංචාරක ආයතන සහ මුද්‍රිත මාධ්‍ය සඳහා ශ්‍රී ලංකාව සුවිශේෂී ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා සංචාරක සම්මන්ත්‍රණයක් සැප්තැම්බර් 8 වැනි දින ශ්‍රී ලංකා කොන්සල් ජනරාල්වරයාගේ සත්කාරකත්වය පැවැත් වූහ.

VII. එරට පුරා සේවා විමර්ශන කටයුතු සඳහා ප්‍රදර්ශන කුටියක් පවත්වා ගෙන යමින් ශ්‍රී ලංකා කොන්සල් ජනරාල්වරයා විසින් චීනයේ දී (ගුගුඩොං) සංචාරක ප්‍රදර්ශනය (CITEE) 2018 සැප්තැම්බර් 7 සිට 9 දින දක්වා පවත්වනු ලැබූ ප්‍රදර්ශනයට සහභාගී විය.

VIII. 2018 සැප්තැම්බර් මස 7 - 9 දක්වා ශ්‍රී ලංකා ආහාර හා හෝටල් කර්මාන්ත ප්‍රදර්ශනයේ දී ශ්‍රී ලංකා කොන්සල් ජනරාල්වරයා ශ්‍රී ලංකාව වෙනුවෙන් සහභාගි විය.

IX. ශ්‍රී ලංකා කොන්සල් ජනරාල්වරයා විසින් 15 වනචීන - ආසියාන් එක්ස්පෝ ප්‍රදර්ශනයට (නැෂනින් හි, ගුආන්සි පළාතේ 2018 සැප්තැම්බර් 12 - 15 වන දින දක්වා පැවැති) ශ්‍රීල ංකා සහභාගත්වයට පහසුකම් සැලසීය.

X. 2018 ඔක්තෝබර් මස 10 සිට 13 දක්වා පැවැති 15 වැනි චීන ජාත්‍යන්තර කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර වෙළඳපොල ශ්‍රී ලංකා සහභාගීත්වය කොන්සියුලර් ජනරාල් විසින් සංවිධානය කළේය. මේ සඳහා ශ්‍රී ලාංකික කුඩා හා මධ්‍යම පරිමාණ 30 ක් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සහ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමග එක්ව සහභාගී විය.

XI. 2018 ඔක්තෝබර් 10 වන දින චීනයේ ගුවැංඩොන්ග් පළාතේ සිය නිෂ්පාදන සඳහා ව්‍යාපාරික අවස්ථාවන් සඳහා ශ්‍රී ලංකා සමාගම් 30 ක් සඳහා ව්‍යාපාර අනුගාමික රැස්වීමක් සඳහා කොන්සල් ජනරල් පහසුකම් සපයනු ලැබීය.

XII. 2019 ඔක්තෝබර් 12 වන දින පැවැත් වීමට නියමිත ගුවැන්ෂු වෙළඳපොළේ ශ්‍රී ලංකා වෙළඳ ප්‍රදර්ශනය ශ්‍රී ලංකාවේ වටිනාකම් එකතු කළ අපනයනයන් හා ප්‍රමුඛ පෙළේ ආනයනකරුවන් ඉලක්ක කරගත් ආයෝජන අවස්ථා පිළිබඳව දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා කොන්සල් ජනරාල්වරයා විසින් සත්කාරකත්වය දරයි.

XIII. ශ්‍රී ලංකා කොන්සල් ජනරාල්වරයා විසින් ඩුග්ගන්හිදී 2018 ඔක්තෝබර් 25 -28 යන දිනවල 21 වන සියවසේ සමුද්‍රීය සේද මාවත ජාත්‍යන්තර එක්ස්පෝ ගුවැංඩොං හිදී ශ්‍රී ලංකා සහභාගීත්වයට සහය දැක්වීය.

XIV. ගිම්හාන් ලී / සාමාන්‍යාධිකාරී හා geka Qiuming $ Guangzhou සමාගමේ නිර්මාණශිලී අධ්‍යක්ෂක වන Create View International Data Information Co' Ltd (චීනයේ බුද්ධිමත් අධ්‍යාපනික කර්මාන්තයේ ප්‍රධාන පෙළේ ව්‍යාපාරයක් වෙයි) 2018 ඔක්තෝබර් 29 වන දින කොන්සල් ජනරාල්වරයා හමුවිය. ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල සමග ස්මාට් ප්ලාස්ටික් ව්‍යාපෘතිය සඳහා ඇති ඉඩප්‍රස්ථා සොයා බැලීමට සිය නිෂ්පාදන ප්‍රදර්ශනාගාරය නැරඹීමට ගියහ.

මැණික් හා ස්වර්ණාභරණ සහ තේ අංශයේ නව සමාගම් 09 ක් සහභාගී වූහ. මෙය Nanning හි, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායන් සමග වෙළඳ සබඳතා පුළුල් කිරීම සඳහා විශිෂ්ට අවස්ථාවක් විය.

වෙළඳ විමසීම්

I. තානාපති කාර්යාලට නිතිපතා වෙළඳ විමසීම් සහ වෙළඳ ගැටුම් නිරාකරණය කිරීමේදී සහාය ලබාදේ. ඉ-වාණිජ්‍ය පසුතලයන් පිළිබඳ ශ්‍රී ලාංකේය වෙළඳ නාම සඳහා වෙළඳපොළ අවස්ථාවන් සඳහා වෙලඳ කුටි සහ ඉ- වාණිජ්‍ය වේදිකා ක්‍රියාකරුවන් සමග අඛණ්ඩව රැස්වීම් පැවැත්වේ.

3. සංස්කෘතික සබඳතා

ශ්‍රී ලාංකික ආහාර ප්‍රවර්ධනය සහ දැනුවත් කිරීම

I. 2018 මැයි 8 - 10 දිනවල පැවැත්වූ බොක්සූස් ආසියා ශාන්තිකර සූපශාස්ත්‍ර තරගයේ දී ශ්‍රී ලංකා කොන්සල් ජනරාල්වරයා ශ්‍රී ලංකාවේ සහභාගිත්වයට සහය ලබා දුන්නේය. වෝටර්ස් එජ් හෝටලයේ දෙදෙනෙකු විසින් මෙම තරගාවලිය ශ්‍රී ලංකාව නියෝජනය කළහ.

II. රාජකීය පණ්ඩිත් පාලකතුමාගේ නායකත්වයෙන් යුත් බෞද්ධ භික්ෂූන් 13 දෙනෙකුගේ දූත පිරිසක් සඳහා කොන්සියුලර් ජනරාල්වරයා සහාය ලබා දුන්නේය. ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ නාපාන පේමසිරි නාහිමියන් විසින් පවත්වන ලද 5 වන ලෝක බෞද්ධ මහා සම්මේලනය, 2018 නොවැම්බර් මස 28 සිට නොවැම්බර් 01 වනදා දක්වා පැවැත් විය.

<u>කොන්සල් ජනරාල කාර්යාලය, ෂැංහයි</u>

4. ද්විපාර්ශ්වික සබඳතා

I. 13 වන චීන මහජන දේශපාලන උපදේශන සමුළුවේ සමාරම්භක උළෙල

II. 15 වන ජාතික දේශපාලන සමුළුවේ සමාරම්භක උළෙල.

III. හංෂු විදේශ කටයුතු කාර්යාලය සමග රැස්වීම

IV. මිමාගේ සංචාරය. ෂැන්හයි මහ නගර සභාවේ කොන්සියාවේ ස්ථාවර කමිටු සභාපති යින් යුයිසි සහ නියෝජිත පිරිසගේ ශ්‍රී ලංකා සංචාරය

V. Quzhou විදේශ කටයුතු කාර්යාලය හා Quzhou ජාත්‍යන්තර වාණිජ හා වෙළඳ මධ්‍යස්ථානය සමග හමුව.

VI. සහෝදර නගර සහයෝගීතාව සඳහා විදේශ කටයුතු කාර්යාලයේ හා Quzhou නගරාධිපති හමුවීම

VII. චීන මහජන දේශපාලන උපදේශන සම්මේලනය සමග ෂැංහයි කමිටුව 2018 (ෂැංහයි CPPCC)

VIII. ෂැංහයි මහ නගර සභාවේ නගරාධිපතිවරයා හමුවීම

5. ආර්ථික සබඳතා

I. ෂැන්හයි පියොටොං විශ්ව විද්‍යාලය සමග සෞඛ්‍යය සම්පන්න චීනයක් සඳහා තීරයක් සහ මාවතක් පිළිබඳ අවධානය යොමුකිරීම යන තේමාව යටතේ චීනයේ රෝහල් සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර සංසඳය සඳහා සූදානම් කිරීමේ වැඩමුළුව

II. ලංකා-චීන ආර්ථික හා සංස්කෘතික කවුන්සිලය ස්ථාපිත කිරීම සඳහා බීජිං Langsheng Century Exhibition Co'

III. 2018 ශ්‍රී ලංකා හා චීන සංස්කෘතික හා ආර්ථික හුවමාරු රැස්වීම

IV. චීන සෞඛ්‍යය කර්මාන්ත ප්‍රවර්ධන සංසඳය

V. ව්‍යාපාර සඳහා ෂැංහයි ඒකාබද්ධ සේවා මධ්‍යස්ථානය ගේ ගෙයින්ග් ග්ලෝබල් හි සමාරම්භක උත්සවය

VI. ෂැංහයි පළමු ව්‍යාපාරික සංසඳය නින්ග්ෂියා වාණිජ මණ්ඩලය විසින් පවත්වනු ලැබේ

VII. 9 වන චීන මහා සම්මන්ත්‍රණ කර්මාන්ත උළෙල හයින්න් පළාතේ පවත් වන ලදී

VIII. එක් තීරයක් හා එක් මාවතක් වෙළඳ නාම ප්‍රදර්ශනය විවෘත කිරීම

IX. ග්‍රීන්ලෑන්ඩ් ග්ලෝබල් භාණ්ඩ වෙළඳ මධ්‍යස්ථානය විවෘත කිරීම

X ෂැංහයිහි ශ්‍රී ලංකා මැණික් ප්‍රදර්ශන මධ්‍යස්ථානය ප්‍රදර්ශනය කිරීම

XI. ශ්‍රී ලංකාවේ මුහුදු ආහාර කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා පෙරදිග ධීවර රාත්‍රිය

XII. Quzhou විදේශ කටයුතු කාර්යාලය හා Quzhou ජාත්‍යන්තර වාණිජ හා වෙළඳ මධ්‍යස්ථානය සමග හමුව

XIII. යුනන් ටියැන්ඩි ආනයනය කරන ලද ආහාර සැපයුම් දාම වේදිකා

XIV. 2018 චීනයේ ජාත්‍යන්තර කර්මාන්ත ප්‍රදර්ශනය විවෘත කිරීම

XV. චීනයේ ලොජිස්ටික් හා ප්‍රසම්පාදන වෙළඳ ප්‍රදර්ශන මූලස්ථානයේ විධායක අධ්‍යක්ෂවරයා හමුවීම

XVI. 2018 චීනයේ අන්තර්ජාතික ආනයන එක්ස්පෝ (CIIE) සඳහා සූදානම් කිරීමේ සමුළුව

XVII. 2018 CIIE රැස්වීම සහ ශ්‍රී ලංකා ප්‍රධාන ආරක්ෂක සහ සන්ධාන නියෝජිතයින් සමග නිරීක්ෂණ චාරිකා සහ ආරක්ෂක විස්තර සඳහා චීන බලධාරීන් සමග හමුව

XVIII වැනි 2018 දී සීඅයිඊ සංවිධානයේ සහයෝගය සහ සම්බන්ධීකරණය සඳහා චීන-ලංකා සංස්කෘතික හා ආර්ථික හුවමාරු සමාගමෙහි සභාපතිවරයා සමග රැස්වීම

XIX. 2018 දී CIIE හි රැස්වීම සඳහා ජාත්‍යන්තර වෙළඳාම ෂැංහයි උපසභාපති (ෂැංහයි CCPIT) ප්‍රවර්ධනය සඳහා චීන කවුන්සිලය සමග රැස්වීම

XX. එක් තීරයක් එක් මාවතක් ඉදිකිරීමේ සහයෝගිතා සම්මන්ත්‍රණය පිළිබඳ ඉදිරිපත් කිරීමක්

XXI. එක් තීරයක් එක් මාවතක් ජාත්‍යන්තර ආර්ථික හා වෙළඳ සහයෝගිතා ප්‍රවර්ධන සැසිය, කුසුහෝ

XXII. ලංකා ෆුජියාන් පෙනරල් වාණිජ මණ්ඩලයේ සභාපතිවරයා සමග රැස්වීමක්

XXIII. චීන ජාත්‍යන්තර රන්, ස්වර්ණාභරණ සහ මැණික් පොළ

XXIV. සබැඳි වෙළඳ සහයෝගීතාව සඳහා වුන් ටියන්ඩි ව්‍යාපෘතිය සමග හමුව

XXV. ආන්හෙයි පළාත හා ෂැංහයිහි විදේශ දූත මණ්ඩල අතර සංවාදය සහ ව්‍යාපාර ගැලපුම් අවස්ථා

XXVI. EXPO සම්බන්ධ අනාගත සහයෝගීතාව සඳහා රීඩ් ප්‍රදර්ශනය

6. සංස්කෘතික සබඳතා

I. ශ්‍රී ලංකාවේ 70 වන ජාතික නිදහස් දිනය සඳහා සූදානම් වීම සඳහා චීන-ලංකා ආර්ථික සංස්කෘතික (ෂැංහයි) සමාගම සමග රැස්වීම

II. ශ්‍රී ලංකා සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම සඳහා කොන්සියුලර් ජනරාල් කාර්යාලයේ කුඩා සිසුන්ගේ සංචාරය

III හංෂු ප්‍රාථමික විද්‍යාලයීය ශ්‍රවණාගාරයේ ශ්‍රී ලංකා සංස්කෘතිය හා ශාස්ත්‍රාලික සබඳතා ප්‍රවර්ධනය කිරීම සඳහා කොන්සියුලර් ජනරාල්වරයාගේ චාරිකාව

IV. ශ්‍රී ලංකාවේ සංස්කෘතිය හා ශාස්ත්‍රාලික සබඳතා ප්‍රවර්ධනය කිරීම සඳහා ජින්හුවා ජාත්‍යන්තර ප්‍රථමික විද්‍යාලයේ කොන්සල් ජනරාල්වරයාගේ නිරීක්ෂණ චාරිකාව

V.ජඩේ බුද්ධ විහාරයේ ප්‍රධාන භික්ෂුව සමග රැස්වීම

VI. ශ්‍රී ලාංකේය සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම සඳහා ෂැංහයි අක්ෂි විසින් වීඩියෝ සම්මුඛ සාකච්ඡාව

VII. චීනයේ ආසියානු ආර්ථික සංවර්ධන සංගමයේ සහ ටකුන්ගෝඕහි ශ්‍රී ලංකා බෞද්ධ සංස්කෘතිය හා ආගමික සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා චීනයේ සින්සිංහි මාලිගාවේ ආරම්භක උත්සවය

VIII. ජාත්‍යන්තර මාපියත්ව ඇතිකිරීමේ සුභ සාධන වෙළෙඳපොළ

IX. ශ්‍රී ලංකා සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම සඳහා ෂැන්හෙන් ෂෙන්ෆෙන් භූ විද්‍යා නව තාක්ෂණික පර්යේෂණ ආයතනය සමග හමුවීම.

X. අයිසීඑස් රූපවාහිනී නාලිකාවෙහි 10 වන සංවත්සරය

XI. චීන-ශ්‍රී ලංකා විශේෂ නියෝජිතගේ චිත්‍ර හා සංස්කෘතික හුවමාරු තරගාවලිය

XII. ශ්‍රී ලංකාවේ තේ, සංචාරක හා මැණික් ප්‍රවර්ධනය කිරීම සඳහා ග්ලෝබල් ටයිම්ස් සමග සම්මුඛ සාකච්ඡාව.

XIII. සංස්කෘතික හුවමාරු සඳහා Little Master Journal හී සිසුන්ගේ සංචාරය

XIV. සංස්කෘතික හුවමාරුව සඳහා ග්වෑන්ෂුංහි දී සිලෝන් කුමරිය සමග රැස්වීම

XV. සංස්කෘතික සහයෝගීතාව සඳහා හුමායි හි රෝහල් ආශ්‍රිත පුණ්‍යායතන ක්‍රියාකාරකම්

XVI. ශ්‍රී ලංකාව සමග සංස්කෘතික හා අධ්‍යාපන සහයෝගිතාව සඳහා යොන්කායි පුණ්‍යාධාර පදනමේ ලේකම් හමුවීම

7. විදේශ ආයෝජන

ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා පිළිබඳව වාචික කරුණු ඉදිරිපත් කිරීම සඳහා

I. දකුණු-දකුණු සහයෝගීතාව ප්‍රවර්ධනය සඳහා කවුන්සිලයේ සභාපති සමග සාකච්ඡා කිරීම.

II. ෂැංහයි සන්ෂයින් ඩිරැගන්ට් මැටීරියල් මැටීරියල්ස් හි කළමනාකාර අධ්‍යක්ෂවරයා සමග ආයෝජන රැස්වීම් පැවැත්වීම.

III. දකුණු-දකුණු සහයෝගීතාව ප්‍රවර්ධනය සඳහා කවුන්සිලය විසින් පවත්වන ලද Quzhou ක්ෂේත්‍ර චාරිකාව අනාගත ආයෝජනය සඳහා යන්ග්සි ගං ඩෙල්ටා ශාඛාව.

IV. අනාගත ආයෝජනයට ජාත්‍යන්තර වෙළඳ හන්ගෝඕ කමිටුව ප්‍රවර්ධනය සඳහා චීන කවුන්සිලය සමග රැස්වීම.

V. අනාගත ආයෝජන සඳහා ආනයන හා අපනයන සමාගම් සඳහා පියැංසු වාණිජ මණ්ඩලය සමග රැස්වීම.

VI. ෂැංහයි අකිලා IMP සමග රැස්වීම. සහ EXP ශ්‍රී ලංකාව තුළ අනාගත ආයෝජන සඳහා LLC සමාගම.

VII. ආයෝජන අවස්ථා සොයමින් හැන්ග්ෂු හි ගූඕමී සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා සමග රැස්වීම.

VIII. විදෙස් ආයෝජකයන් සඳහා වන අන්තර්ජාතික වෙළඳ සහයෝගීතා ප්‍රවර්ධනය සඳහා චීනයේ කවුන්සිලයේ සභාපතිතුමා හමුවීම.

IX. අනාගත ආයෝජනයක් සඳහා Wenzhou වාණිජ මණ්ඩලය සමග රැස්වීම.

X. ආයෝජන සහයෝගීතාව සඳහා චින්ග් දිස්ත්‍රික්කයේ ආයෝජන පරිසරය ප්‍රවර්ධනය කිරීම

XI. කර්මාන්තශාලා ඉදි කිරීම සඳහා ආයෝජකයින්ගේ සහයෝගීතාවය අපේක්ෂා කරමින් නගරාධිපති අපේක්ෂකයා හමුවීම සහ හැචෙන්ග් නගරයේ සංචාරය කිරීම

8. තේ සහ සංචාරක ප්‍රවර්ධනය

ශ්‍රී ලංකාව සංචාරක ස්ථානයක් ලෙස දක්වමින් සිදුකරන ඉදිරිපත් කිරීම

I. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ය්‍යුයු ජාත්‍යන්තර සංචාරක නියෝජිතායතනයේ කළමනාකරු හමුවීම.

II. ශ්‍රී ලංකන් සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා සංචාරක හා ලෙෂර් සගරාවේ වාර්ෂික සංචාරක සම්මාන ප්‍රදානෝත්සවය.

III. ශ්‍රී ලංකාවේ තේ ප්‍රවර්ධනය කිරීම සඳහා ෂැංහයි ටෙෆෝර්ත් සමාගම සමග රැස්වීම

IV. සංචාරක සහයෝගීතාව සඳහා ෂැංහයි Baiqian Industrial Co' Ltd සමග රැස්වීම

V. ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය කිරීම සඳහා 2018 ෂැංහයි ජාත්‍යන්තර තේ ප්‍රදර්ශනය විවෘත කිරීමේ උත්සවය

VI. 2018 ෂැංහයි ලෝක සංචාරක ප්‍රදර්ශනය විවෘත කිරීමේ උත්සවය

VII. සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ෂැන්හයිසිටි පොත් ප්‍රදර්ශනයේදී එක් තීරයක් හා එක් මාවතක් මැයෙන් සංස්කෘතිය හා සංචාරක සංසඳය

VIII. ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා දූපත්, සම්පත්, සංචාරක ව්‍යාපාරය සහ සමාජය මැයෙන් චූෂාන් හි පැවැති සංචාරක ප්‍රවර්ධන වැඩසටහන

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය-ජපානය

1. ද්විපාර්ශ්වීය සබඳතා

I. අතිගරු ජනාධිපතිතුමාගේ රාජ්‍ය සංචාරය

ශ්‍රී ලංකා ජනාධිපති, අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, ජපන් අග්‍රාමාත්‍ය සින්සෝ අබේ මහතාගේ ආරාධනයෙන් 2018 මාර්තු මස 12-17 දින වල දී ජපානයේ රාජ්‍ය සංචාරයක නියැලෙන ලදී. දෙරට නායකයෝ 2018 මාර්තු මස 14 වන දින, අග්‍රාමාත්‍ය කාර්යාලයේදී ද්විපාර්ශ්වීය සාකච්ඡාවක යෙදුණාහ. සාකච්ඡා අවසානයේදී, ශ්‍රී ලංකාවේ සෞඛ්‍යය සහ වෛද්‍ය සේවා වැඩිදියුණු කිරීම් සඳහා යෙන් බිලියන 10.639 ක ණයක් සැපයීම පිණිස ණය ලේඛනවලට අත්සන් තැබිණ.

II. ආයෝජන සංසදය

රාජ්‍ය සංචාරයේදී, ශ්‍රී ලංකා- ජපන් ආයෝජන සහයෝගිතාවය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ සහභාගිත්වයෙන්, ආයෝජන සංසදයක් ටෝකියෝහි දී පැවැත්විණි.

III අපද්‍රව්‍ය කළමණාකරණ තාක්ෂණය

ජපානයෙන් අපද්‍රව්‍ය කළමණාකරණ තාක්ෂණය ලබා ගැනීමේ අරමුණින්, අතිගරු ජනාධිපතිතුමා සහ නියෝජිත පිරිස, ටෝකියෝ හි නවීනතම අධි-තාක්ෂණික සහ අපද්‍රව්‍ය කළමණාකරණ යන්ත්‍රාගාරයක් වන, ෂිනගාවා කසළ දහන යන්ත්‍රාගාරය නැරඹීමටද ගියහ.

IV ශ්‍රී ලංකා වෙරළාරක්ෂක සේවයට මුර යාත්‍රාවක් ප්‍රදානය කිරීම

දෙරට අතර පූර්ණ සහයෝගිතාවය මත නිකුත් කරන ලද ඒකාබද්ධ ප්‍රකාශය මත පදනම්ව, ජයිකා ආයතනය සහ ශ්‍රී ලංකා රජය අතර ගිවිස ගත් ආධාර ගිවිසුමෙහි කොටසක් ලෙස, 2018 අගෝස්තු මස 29 වන දින, "එස්ඵල්සීජීඑස් සමුද්‍ර රක්ෂා" සහ "එස්ඵල්සීජීඑස් සමරක්ෂා" යන වෙරළාරක්ෂක යාත්‍රා දෙක ශ්‍රී ලංකාවට පරිත්‍යාග කෙරිණ. සමුද්‍රීය ආරක්ෂාව, සමුද්‍රීය නීති බලගැන්වීම, සෙවීම සහ බේරා ගැනීම, ආපදා අවදානම අවම කිරීම සහ පරිසර සුරක්ෂිතතාවය යනාදී ආශ්‍රිත ක්‍රියාකාරකම්වල දී මෙම මුර යාත්‍රා දෙක ශ්‍රී ලංකා වෙරළාරක්ෂක සේවාවේ ධාරිතාවය ඔප් නංවනු ඇත.

ශ්‍රී ලංකා වෙරළාරක්ෂක සේවාවේ නිලධාරීන් 08 දෙනෙකුට යාත්‍රාවලට හුරුවීමේ අභ්‍යාසයක් 2018 මැයි මස 07-19 දිනවලදී ටෝකියෝහි දී ලබා දෙන ලදී.

V ද්විපාර්ශ්වීය සංචාර

i. කථානායක, කරු ජයසුරිය මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් පාර්ලිමේන්තු නියෝජිත කණ්ඩායමක් 2018 පෙබරවාරි 25 සිට මාර්තු 03 දක්වා ජපානයේ සංචාරයක යෙදුණාහ.

ii. ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ගයන්ත කරුණාතිලක මහතා සහ පාර්ලිමේන්තු නිලධාරීන්ගෙන් සැදුම්ලත් නියෝජිත කණ්ඩායමක්, ජපන් පාර්ලිමේන්තු ක්‍රමවේදය හැදෑරීම පිණිස 2018 අප්‍රේල් මස 08-13 දක්වා ජපානයේ අධ්‍යයන චාරිකාවක නිරත වූහ.

iii. සපුගස්කන්දේ, රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ නිලධාරීන් කණ්ඩායමක් 2018 අගෝස්තු 2-4 දක්වා අධ්‍යයන චාරිකාවක නිරත වූහ.

iv. ජපානයේ විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය කසුයුකි නසානේ මහතා 2018 අගෝස්තු මස 28-30 දක්වා ශ්‍රී ලංකාවේ චාරිකාවක නිරතවූ අතර, ජපානයෙන් ප්‍රදානය කරන ලද වෙරළාරක්ෂක යාත්‍රා දෙක මුල්වරට සේවයේ යොදවන ලදී.

v. ජපානයේ, රාජ්‍යාරක්ෂක අමාත්‍ය ඉට්සුනෝරි ඔනොදේරා මහතා 2018 අගෝස්තු මස 20-22 දිනවල ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූ අතර, ඔහු ශ්‍රී ලංකාවට පැමිණි ප්‍රථම ජපන් ආරක්ෂක අමාත්‍යවරයා ද වන්නේය.

vi. ජපානයේ විදේශ කටයුතු අමාත්‍ය ටාරෝ කෝනෝ මහතා 2018 ජනවාරි මස 05 වන දින ශ්‍රී ලංකාවට පැමිණියේය.

vii. අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගරු තලතා අතුකෝරළ මහත්මිය 2018 ඔක්තෝබර් 08-10 දක්වා ටෝකියෝ හි, ආසියානු-අප්‍රිකානු නීති උපදේශන සංවිධානයේ 57 වන වාර්ෂික සැසියට සහභාගී වූ අතර, ජපන් අධිකරණ අමාත්‍ය ටකෂි යමෂිටා මහතා සමග ද්විපාර්ශ්වික සාකච්ඡාවක ද නිරත වූවාය.

viii. හිටපු විද්‍යා සහ තාක්ෂණ අමාත්‍ය, ආචාර්ය සරත් අමුණුගම මහතා, 2018 ඔක්තෝබර් 7-9 දිනවල දී ක්‍යෝටොහි පවත්වන ලද විද්‍යා සහ තාක්ෂණ විද්‍යා සංසදයේ 15 වන වාර්ෂික සංසදයට සහභාගී විය.

ix. කලාපීය සහ ජාත්‍යන්තර සංසදවලදී, ශ්‍රී ලංකාව සහ ජපානය ස්වකීය අපේක්ෂකත්වයන් සඳහා අන්‍යාන්‍ය වශයෙන් සහාය දැක්වූහ.

1. ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන

i 2018 වර්ෂයේ දී, කැපී පෙනෙන අන්දමේ චාරිකා හුවමාරුවක් සිදුවූ අතර, එයට ඇතුළත් අතිගරු ජනාධිපතිතුමාගේ ජපන් සංචාරය දෙරට අතර වඩාත් හොඳ මට්ටමක ආර්ථික සබඳතා සනිටුහන් කරයි. ජපන් අග්‍රාමාත්‍යතුමාගේ විශේෂ නියෝජිත ආචාර්ය හිරෝතෝ ඉෂුමි මහතා 2018 දී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වී දෙරට අතර වඩාත් පුළුල් ආර්ථික සබඳතාවල ප්‍රගතිය සාකච්ඡාවට භාජනය කරන ලදී.

ii ජපානයේ ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරික නියෝජිත පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණ අතර, අතිගරු ජනාධිපතිතුමන් සහ ව්‍යාපාරික ප්‍රජාව සමඟ අන්තර් ක්‍රියාවල නිරත වූහ.

iii මාර්තු මාසයේ දී, අතිගරු ජනාධිපතිතුමා ජපන් සංචාරයක නිරත වූ අතර, එහි ප්‍රධානතම ව්‍යාපාරික පිරිස් හමු වී, ජපන් සමාගම් 200ක් පමණ සහභාගී වූ ආයෝජන සංසදයකටද සහභාගී වූයේය.

iv මැයි මාසයේදී, ජපන් අග්‍රාමාත්‍ය ෂින්සෝ අබේ මහතාගේ විශේෂ නියෝජිත ආචාර්ය හිරෝටෝ ඉෂුමි මහතා දෙරට අතර වඩාත් පුළුල් ආර්ථික සබඳතාවල ප්‍රගතිය සාකච්ඡාවට භාජනය කිරීම පිණිෂ ශ්‍රී ලංකාවට පැමිණියේය.

v මුල් මාස නවයේ කාල පරාසය තුළ, දූත මණ්ඩල කාර්යාලය විසින් ව්‍යාපාර ආශ්‍රිත නියෝජිත කණ්ඩායම් 03ක් ශ්‍රී ලංකාවට පැමිණීම ද, නියෝජිත කණ්ඩායම් 05 ක් ජපානයට යාම ද සංවිධානය කර, පහසුකම් සලසන ලදී. ආයෝජන/ව්‍යාපාර ප්‍රවර්ධන සම්මන්ත්‍රණ 08ක් ටෝකියෝහි සහ විබාහි දී පැවැත්විණ. තානාපති කාර්යාලයේ ආධාරයෙන් ප්‍රධානතම සම්භාව්‍ය ජපන් සමාගම් 100 ක් පමණ පසුගිය මාස නවය තුළ ශ්‍රී ලංකාවට පැමිණ ඇත. දූතමණ්ඩල කාර්යාලය විසින් කේවල ඉසව් 04ක් ද, එනම්: ජපානයේ දී ශ්‍රී ලංකා උත්සවය, සිලෝන් තේ සම්මන්ත්‍රණ දෙකක් සහ ආයෝජන මණ්ඩලීය නිලධාරීන් සහ ජපන් පාර්ශ්වයන් සඳහා ව්‍යාපාර අන්තර්ක්‍රියා සහිත රාත්‍රී භෝජනය, සංවිධානය කර පහසුකම් සපසා ඇත. අවසන් මාස 9 තුළ, ජපානයේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන 04ක ශ්‍රී ලංකා සහභාගිත්වයටද දූත මණ්ඩල කාර්යාලයේ සහාය ලැබිණ. ජපානයේ කුළුබඩු වෙළඳපොළ සම්බන්ධයෙන් විමසා බැලීම පිණිස ශ්‍රී ලංකාවේ සමාගම් 04ක් සඳහා ජපානයට යාමට අවස්ථාව උදා කර දුන් අතර, ජපන් සමාගම් 60කට ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට (B2B) පදනමින් ව්‍යාපාරික කටයුතු සලසා දෙන ලදී. සංවර්ධන උපායමාර්ග අමාත්‍යවරයා විසින් සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් වෙළඳ සහ ආර්ථික සංරචකයන්ගෙන් සමන්විත අමත්‍යාංශයීය චාරිකා 2ක නිරත වන ලදී. ශ්‍රී ලංකාව සඳහා අපනයන ඇණවුම් මත ජපානයේ සමාගම් මට්ටමේ හඳුන්වාදීම් 10කට තානාපති කාර්යාල සහාය ලැබිණි. වෙළඳ සහ ආයෝජන විමසුම් 50 කට පමණ දූත මණ්ඩල කාර්යාලය ප්‍රතිචාරය දක්වා ඇති අතර, එක් වෙළඳ පැමිණිල්ලකට ද අවධානය යොමු කරන ලදී.

iv ජපානයෙන් මූල්‍යාධාර ලැබෙන පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මෙම අංශය පහසුකම් සලසා ඇත.

- ත්‍රිකුණාමල වරාය
- මධ්‍යම අධිවේගී මාර්ගය - 3 වන කොටස (පොතුහැර-ගලගෙදර)
- ද්‍රවමය ස්වාභාවික වායු විදුලි බලාගාරය සහ සැපයුම් දාමය
- මහනුවර මහ නගර සංවර්ධනය
- සැහැල්ලු දුම්රිය ප්‍රවාහනය

- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සංවර්ධනය

4.සංචරණය

i. පළමු මාස 08 තුළ ශ්‍රී ලංකාවේ ජපන් සංචාරක ආගමනය 34,824 ක් ලෙස වාර්තා විය. 2017 වසරේ එම කාලය හා සසඳන විට එය 9.46% ක වැඩිවීමකි.

ii. ජපානයේ, ශ්‍රී ලංකා දූත මණ්ඩලය 2018 සැප්තැම්බර් මස 20-23 දක්වා ටෝකියෝහි පැවති 2018 ජපන් චාරිකා නියෝජිතායතන සංගම් එකස්පෝ ප්‍රදර්ශනයට දායක විය. සංචාරක සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු රංජිත් අළුවිහාරේ, සංචාරක අධීක්ෂණ මන්ත්‍රී, ගරු සුජිත් පෙරේරා, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සභාපති ඩෙහාන් සෙනෙවිරත්න යන මහත්වරුද මෙයට සහභාගී වූහ.

iii. 2018 සැප්තැම්බර් 25 සහ 27 දින පිළිවෙළින් ටෝකියෝ හි සහ සපෝරෝ හි මාර්ග ප්‍රදර්ශන දෙකක් සාර්ථකව පවත්වන ලදී. මෙයට ශ්‍රී ලාංකීය සහ ජපන් චාරිකා නියෝජිතවරු සහභාගී වූහ.

iv. ශ්‍රී ලංකාවේ විවිධ සංස්කෘතික සහ ආගමික අංගයන් නිරූපනය කෙරෙන නිෂ්පාදන එළි දැක්වීම පිණිස පහත දැක්වෙන ජපන් මාධ්‍ය කණ්ඩායම් 05 ශ්‍රී ලංකාවට පැමිණීම දූත මණ්ඩලය විසින් සංවිධානය කෙරිණ. එනම්: ටෝකියෝ බ්‍රෝඩ්කාස්ටිං සිස්ටම්, නිපොන් ටෙලිවිෂන් නෙට්වර්ක් කෝපරේෂන්, බැක් අප් මීඩියා කම්පැණි ලිමිටඩ්, ක්‍රියේටිව් 30 කම්පැණි ලිමිටඩ් සහ අසාසි ටෙලිවිෂන් බ්‍රෝඩ්කාස්ටිං කෝපරේෂන්.

v. දූත මණ්ඩල කාර්යාලය, ශ්‍රී ලංකා සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම පිණිස පහත දැක්වෙන උත්සව වලට සහභාගී වන ලදී.

ටෝකියෝ කුළුණ ප්‍රදේශයේ, මිනාටෝ නගර සත්කාරයෙන්, 2018 මාර්තු 25 වන දින මිනාටෝ නගර ලෝක සැණකෙළිය, ශ්‍රී ලංකාව කිමිදුම් ගමනානන්තයක් ලෙස හඳුන්වාදීම පිණිස අප්‍රේල් 6-9 දක්වා දින තුනක් තුළ ශ්‍රී ලංකා වෙළඳ කුටි සහිත වූ 2018 සමුද්‍රිය කිමිදුම් ප්‍රදර්ශනය. 50,000 ක් දෙනා ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය වෙත පැමිණියහ. 2018 මැයි මස 4-5 දින සහ අගෝස්තු 26 වන දින, සාම යාත්‍රා ගෝලීය සැණකෙළිය, සාගර සිහිනය, යොකොහාමා ඔසන්බෂි ජාත්‍යන්තර මගී යාත්‍රා පර්යන්තය-2017 සහ 2018 මාර්තු මස 25 දින ශ්‍රී ලංකා සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා මිනාටෝ නගර ලෝක සැණකෙළියේ ශ්‍රී ලංකා කුටියක් සංවිධානය කිරීම සහ ශ්‍රී ලංකා සංචාරක කටයුතු සහ සංස්කෘති ප්‍රවර්ධනය උදෙසා ශ්‍රී ලංකා කුටි සංවිධානය.

vi. මිනාටෝ පුරවැසි උත්සවය 2018 ඔක්තෝබර් මස 6-7 දින ටෝකියෝ මිනාටෝහි, ෂිබා උද්‍යානයේ දී පැවැත්විණ. මෙම උත්සවය වාර්ෂිකව පවත්වන අතර, ලක්ෂ දෙකකට අධික

අමුත්තන් පිරිසක් පැමිණෙති. ටෝකියෝ නගරයේ තානාපති කාර්යාල සහ ජාත්‍යන්තර සංවිධාන, මිනාටෝ නගර කාර්යාලයේ සහාය ඇතිව මෙය සංවිධානය කළහ.

vii. ජපානයේ ශ්‍රී ලංකා ව්‍යාපාර සභාව විසින් සංවිධානය කරන ලද 14 වන ශ්‍රී ලංකා උත්සවය-2018 ටොයෝගි උද්‍යානයේදී, 2018 අගෝස්තු මස 4-5 දින වල පැවැත්විණ.

5. සංස්කෘතික සබඳතා.

I. "2018 ටෝකියෝ ජායාරූප මාසය" ටෝකියෝහි විවිධ කලාගාර 4ක දී 2018 මැයි මස 28 සිට ජූනි මස 26 දක්වා පැවැත්විණ. මෙහිදී ශ්‍රී ලංකාවේ දර්ශන, සම්ප්‍රදායන්, සංස්කෘතිය සහ ජනතා ජීවන ශෛලීන් ප්‍රදර්ශනය විය.

II. ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට අනුබද්ධ, ජපානයේ ශ්‍රී ලංකා සංගමය සංවිධානය කරන ලද 14 වැනි ශ්‍රී ලංකා උත්සවයට රාජකාරී මට්ටමින් සම්බන්ධීකරණ සහාය ලබා දෙන ලදී. ශ්‍රී ලංකා උත්සවය වූ කලී ප්‍රමුඛතම ප්‍රවර්ධන පරිශ්‍රමය වන අතර, ටෝකියෝ නගර දින දර්ශනයෙහි ඉමි ලකුණක් බවට පත්ව ඇත.

III. 2018 සැප්තැම්බර් මස 2 වැනි දින, සම්මු නගර කාර්යාලය විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකා දිනයට සහභාගී විය.

IV. ගුමාහි ටකසාකි යුනෙස්කෝ සංගමයේ නිලධාරීන් 7ක් සහ ශිෂ්‍යයින් 36 දෙනෙකු ජාත්‍යන්තර වැටහුම් අධ්‍යාපනය සඳහා තානාපති කාර්යාලය වෙත පැමිණීම තානාපති කාර්යාල වෙත කරන ලද 47 වන පැමිණීමයි. ඔවුහු තානාපතිවරයාගේ නිවසට පැමිණ ශ්‍රී ලාංකීය සංස්කෘතිය සම්බන්ධයෙන් වඩාත් හොඳ අවබෝධයක් ලබා ගත්හ.

V. "තානපතිගේ ඇසින් ජපානය" යන තේමාවෙන්, ජපානයේ ශ්‍රී ලංකා තානාපතිවරයා විසින් කවසාකි රොටරි සමාජ සාමාජිකයන් වෙත ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

VI. තානපති කාර්යාලීය නිලධාරීහු, ටෝකියෝ, එඩොගාවා, සිෂිබෝන් මූලික පාසලෙ හි සහ හිරෝෂිමා හි, කුමනෝ හගාසි කණිෂ්ඨ උසස් පාසලෙ හි ශිෂ්‍යයින් 80 දෙනෙකු සඳහා සංස්කෘතික දැනුම්වත් කිරීමේ වැඩසටහන් දෙකක් පවත්වන ලදී.

6. ශ්‍රමික සහ සුබසාධනය

i. ජපන් රජය සහ ශ්‍රී ලංකාවේ විදේශ රැකියා අමතයාංශය, තාක්ෂණික සීමාවාසික පුහුණු වැඩසටහන මත සහයෝගිතා ගිවිසුමක් 2018 පෙබරවාරි මස 01 වන දින අත්සන් තබන ලදී.

ii. ජපාන ජාත්‍යන්තර පුහුණු සහයෝගිතා සංවිධනය සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය අතර සාකච්ඡා පිළිබඳ සංශෝධිත වාර්තාව 2018 මැයි මස 31 වන දින අත්සන් තැබිණ.

iii. 2017 ජූලි මාසයේ දී, ජපානයේ ජාත්‍යන්තර මිනිස් බල සංවර්ධන සංවිධානය සහ ශ්‍රී ලංකාවේ විදේශ රැකියා අමාත්‍යාංශය අතර ගිවිස ගන්නා ලද අවබෝධතා ගිවිසුමට අනුකූලව, ශ්‍රී ලංකා තාක්ෂණික සීමාවාසිකයින් සම්බන්ධයෙන් ජපාන රැකියා නියෝජිතායතන සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම දූත මණ්ඩල කාර්යාලය විසින් සංවිධානය කරන ලදී. එම අවබෝධතා ගිවිසුම යටතේ විදේශ රැකියා අමාත්‍යාංශය විසින් එවන ලද සීමාවාසිකයින් 10 ක් 2018 අගෝස්තු මාසයේ දී ජපානයට ලඟා වී, දැනට ගොවිතැන් සහ යාන්ත්‍රික සැකසුම් අංශවල සේවයේ යොදවා ඇත. තවත් 08 දෙනෙකු 2018 සැප්තැම්බර් මාසයේ දී ජපානයට පැමිණි අතර, දැනට සයිටාමා හි ජපන් අභ්‍යාස මධ්‍යස්ථානයෙහි පුහුණුව ලබති. ඔවුන් හෙද සේවයේ යොදවනු ඇත.

iv. ජපානයේ, ගුම්මා, ඔසාකා, ෆකුඕකා සහ නගෝයාවල පදිංචි ශ්‍රී ලාංකිකයින්ට, ජංගම ප්‍රදූත වැඩසටහන් හරහා ප්‍රදූත සහාය සලසා දී ඇත. ශ්‍රී ලාංකිකයින් 140 ක් පමණ මෙම සේවය ලබා ගෙන ඇත.

කොරියන් සමූහාණ්ඩුව

1. ද්විපාර්ශ්වීය සබඳතා

සමාලෝචනයට භාජනය වන කාල වකවානුව තුළ, තානාපති කාර්යාලය විසින්, ශ්‍රී ලංකා රජය සහ කොරියන් ජනරජය අතර පවතින මිත්‍රශීලී ද්විපාර්ශ්වීය සබඳතා වර්ධනය කරලීමේ අපේක්ෂාවෙන්, අදාළ කොරියානු අමාත්‍යාංශ සහ අනුබද්ධිත ආයතන, කොරියානු ආයතන, ව්‍යාපාර ස්ථිති, මෙන්ම ජාතික සභාවේ සභිකයින් ඇතුළු කොරියන් ජනරජයේ දේශපාලන නායකත්වය සමඟ හොඳ සබඳතාවයක් පවත්වා ගෙන යනු ලැබේ.

සමාලෝචනයට භාජනය වන කාලපරාසය තුළ, කොරියානු ජනරජයෙහි ඇති වූ දේශපාලනමය සහ ආර්ථිකමය වර්ධනයන් තානාපති කාර්යාලය විසින් සමීපස්ථව සැලකිල්ලට භාජනය කරන ලද අතර, දේශපාලනමය වාර්තාවලට අමතරව, ක්‍රමික යාවත්කාලීන කිරීම් සහ සංක්ෂිප්ත වාර්තා කොළඹට එවීමට කටයුතු කර ඇත. කොරියානු අර්ධද්වීපයෙහි සිදු කෙරෙන හා සිදුවන කටයුතු තානාපති කාර්යාලය විසින් සමීපස්ථව විමසා බැලෙන අතර, කොරියානු ජනාධිපති මූන් ජා ඉන්ගේ නායකත්වය යටතේ අවසානයේ දී කොරියානු අර්ධද්වීපයට සදාකාලික සාමය සහ ස්ථාවරත්වය සහ න්‍යෂ්ටික අවිහරණය උදා කරදීමේ අරමුණින්, පැන්මුන්ජන් ප්‍රකාශනය සහ පියොංජියං ඒකාබද්ධ ප්‍රකාශනයට අනුගතවීම ඇතුළු අන්තර්-කොරියානු සමුළු 3ක් සම්බන්ධයෙන් ක්‍රමික යාවත්කාලීන කිරීම් විදේශ කටයුතු අමාත්‍යාංශයට සපයා ඇත. කොරියාවේ ගෘහස්ත දේශපාලන තත්ත්වයන් ගැන සහ විදේශ ප්‍රතිපත්තිය ගැන ද දූත මණ්ඩල කාර්යාලය විමසිල්ලෙන් පසුවෙයි.

I. <u>මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමන්ගේ කොරියානු රාජ්‍ය සංචාරයේ පසු විපරම</u>

දෙරට අතර රාජතාන්ත්‍රික සබඳතාවල 40 වැනි සංවත්සරය සැමරීම පිණිස, 2017 නොවැම්බර් මස 28-30 දින තුළ සිදු කරන ලද ජනාධිපති රාජ්‍ය සංචාරයට අදාළ පසු විපරම දූත මණ්ඩල කාර්යාලය විසින් සිදු කරන ලදී. මෙම ක්‍රියදාමයට, සංචාරයේ දී අත්සන් තබනලද

ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් 05ක් ක්‍රියාත්මක කිරීම/පසුවිපරම ද ඇතුළත්ය. සහයෝගිතාව සහ පසු විපරම අදාළ විය යුතු අංශ දෙරට අතර අත්සන් තබන ලද ඒකාබද්ධ ප්‍රවත්පත් නිවේදනයෙහි ඇතුළත් කර ඇත. ප්‍රවර්තක ශක්තිය පවත්වා ගෙන යාම පිණිස විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ අධ්‍යක්ෂ ජනරාල් මට්ටමේ උපදේශන කටයුතු සඳහා කොරියානු විදේශ කටයුතු අමාත්‍යාංශයේ, ආසියා සහ ශාන්තිකර කටයුතු කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් කිම් ඉයුන්-යන්ග් මහත්මිය 2018 මැයි මාසයේ දී ශ්‍රී ලංකාවට පැමිණියාය.

II. <u>ද්විපාර්ශ්වීය දේශපාලනමය උපදේශන</u>

ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය සහ කොරියාව අතර ද්විපාර්ශ්වීය දේශපාලනමය උපදේශනයෙහි 2 වන වටය, පස් වසරකට පසු, 2018.06.07 වන දින කොළඹ දී පැවැත්විණ. පළමුවන වටය පවත්වන ලද්දේ 2014 වසරේදීය. වෙළඳ, ආයෝජනය, සංචාරක කටයුතු, කෘෂිකර්මය, ධීවර කටයුතු, විද්‍යා සහ තාක්ෂණය, සංස්කෘතිය, පරිසරය සහ දේශගුණික විපර්යාස ආදිය මත සහයෝගිතාවය ඇතුළු ද්විපාර්ශ්වීය සබඳතා සමූහය එකී සාකච්ඡාවල දී සමාලෝචනයට භාජනය විය.

III. <u>ආර්ථික සහයෝගිතාවය මත ඒකාබද්ධ කොමිසම</u>

2017 රාජ්‍ය සංචාරයේ දී අත්සන් තබන ලද, ශ්‍රී ලංකාව සහ කොරියාව අතර ආර්ථික සහයෝගිතා කාර්ය රාමු ගිවිසුම යටතේ, ආර්ථික සහයෝගිතාව පිළිබඳ පළමුවන ඒකාබද්ධ කොමිසම 2018 ජූනි මස 28 වන දින කොළඹ දී පැවැත්විණ. සාකච්ඡා මෙහෙයවන ලද්දේ කොරියානු විදේශ කටයුතු අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසිනි. ඒකාබද්ධ කොමිසම විසින් ද්විපාර්ශ්වීය ආයෝජන, වෙළඳ සහ සංචාරක කටයුතු වැඩි කිරීමේ යාන්ත්‍රණයන් සාකච්ඡාවට භාජනය කරන ලදී.

IV. <u>නව දක්ෂිණ ප්‍රතිපත්තිය සහ දකුණු අසියාව සමඟ සමීපස්ථ සහයෝගිතාවය</u>

දකුණු ආසියානු කලාපය (ශ්‍රී ලංකාව ඇතුළු) සමඟ බැඳීම ඇතිකර ගැනීම ඇතුළු ජනාධිපතිතුමන්ගේ නව දක්ෂිණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසුවිපරම දූත මණ්ඩල කාර්යාලයෙන් සිදු විය. ශ්‍රී ලංකාව සහ කොරියාව අතර සමීපස්ථ සහයෝගිතාවය ඉදිරියට ගෙනයාමේ අරමුණින්, දූත මණ්ඩල කාර්යාලය විසින්, 2018 අගෝස්තු මාසයේ දී, කොරියානු ජාතික රාජතාන්ත්‍රික ඇකඩමියේ විදේශ කටයුතු සහ ජාතික ආරක්ෂා ආයතනයේ, නව සභාපති, තානාපති කිම් ඉන්-චුල් මහතා සමඟ මෙන්ම කොරියානු ජාතික රාජ්‍යතාන්ත්‍රික ඇකඩමිය යටතේ අළුතින් ස්ථාපිත කරන ලද ඒෂියන්-ඉන්ඩියා මධ්‍යස්ථානයේ ප්‍රධානී, ආචාර්ය චූ වොන්ගි මහතා සමඟ ද සම්බන්ධතා ගොඩනගා ගන්නා ලදී. කොරියානු ජාතික රාජ්‍යතාන්ත්‍රික ඇකඩමියේ සහයෝගය ඇතිව, කොරියානු විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලදුව 2018 සැප්තැම්බර් මස 20 වන දින පවත්වන ලද 9 වන කොරියා-සාක් සහයෝගිත්ව සමුළුවට ද දූත මණ්ඩල කාර්යාලය සහභාගී වන ලදී. මෙයට ශ්‍රී ලංකා විදේශ කටයුතු

අමාත්‍යාංශයේ අග්නිදිග ආසියා සහ සාක් අංශයේ අධ්‍යක්ෂ ඇතුළු සාක් නිලධාරීහු ද සහභාගී වූහ. (පසුව සඳහන් වන ලද අය තීරකයෙකු විය.)

V. <u>ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක, ගරු කරු ජයසූරිය මහතාගේ නිල කොරියන් සංචාරය - (2018 අගෝස්තු 27-30)</u>

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක, ගරු කරු ජයසූරිය මහතා, කොරියානු ජාතික සභාවේ කථානායකවරයාගේ ඇරයුමින්, 2018 අගෝස්තු 20-30 අතර, කොරියාවේ නිල සංචාරයක යෙදුණි. කථානායකවරයා සමඟ විවිධ පක්ෂවලට අයත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කණ්ඩායමක් ද මෙම සංචාරයට සහභාගී වූහ.

ගරු කථානායකවරයා විසින්, කොරියානු අග්‍රාමාත්‍ය ගරු ලී නක්-යොන්, කථානායක ගරු මූන් හී-සැං, ජාතික ආරක්ෂාව පිළිබඳ අධ්‍යක්ෂ (ප්‍රධානී)/ ජාතික ආරක්ෂා සභා ස්ථාවර කමිටු සභාපති, ගරු චුන්ග් ඉයුයි-හන්ග් සහ කොරියා-ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මිත්‍ර සංසදයේ සභාපති, ප්‍රුං සුන්ග්-හෝ සහ සාමාජිකයින් හා සමඟ රැස්වීම් පවත්වන ලදී.

කොරියාවේ ශ්‍රී ලාංකික ප්‍රජාවේ පොදු පිරිසකගේ සහභාගිත්වය ඇතුළු තානාපති කාර්යාලයේ දී පවත්වන ලද අනියම් අන්තර්ක්‍රියා රැස්වීමකට ද ගරු කථානායකවරයා සහ නියෝජිත පිරිස සහභාගී වූහ.

VI. <u>ජාතික සභාවේ සාමාජිකයෝ</u>

කොරියානු-ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංසදයේ සභාපති සහ සාමාජිකයින් ඇතුළුව, කොරියන් ජාතික සභාවේ තෝරාගත් සාමාජිකයන් ද හමු වූ තානපතිවරයා, සමාලෝචනයට භාජනය වන කාලපරාසය තුළ දී ඔවුන් සමඟ සුහදව කටයුතු කළේය.

VII. <u>ද්විපාර්ශ්වීය සහයෝගිතා ප්‍රදේශ</u>

යටිතල පහසුකම්, පාලනය, අධ්‍යාපනය, කර්මාන්ත, ධීවර කටයුතු, බලශක්ති, කෘෂිකර්මය, මානව සම්පත් සංවර්ධනය සහ රාජ්‍ය පරිපාලනය ඇතුළු පුළුල් වර්ණාවලියක් මත පදනම් වූ සංවර්ධන සහයෝගිතාවයට අදාළව, කොරියා ජාතික සහයෝගිතා නියෝජිතායතනයේ සහ කොරියා එක්සිම් බැංකුවේ-ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදලේ ජ්‍යෙෂ්ඨ සංවාදකයින් සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම තානාපති කාර්යාලය විසින් සිදු කරන ලදී.

පවත්වා ගෙන යනු ලබන සහයෝගිතාවය යටතේ පුහුණු/හුවමාරු වැඩසටහන් සඳහා ශ්‍රී ලංකාවේ සහ කොරියා ජනරජයේ ආරක්ෂාව ආශ්‍රිත ආයතන සමඟ සම්බන්ධීකරණය පවත්වා ගෙන යන ලදී. ඒ අනුව, කොරියාවේ ජාතික ආරක්ෂාව පිළිබඳ අමාත්‍යාංශය සහ ආශ්‍රිත ආයතන හා සමඟ සම්බන්ධීකරණයෙන්, සපුගස්කන්ද, ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ ඉල්ලීම මත, එහි 16 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත කණ්ඩායමකට සති 2ක පූර්ණ කාලීන විදේශ අධ්‍යයන චාරිකා වැඩසටහනක් 2018 අගෝස්තු මාසයේ දී සංවිධානය කර, පහසුකම් සලසා දෙන ලදී.

විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය සහ විද්‍යා, තාක්ෂණවිද්‍යා සහ නව නිපැයුම් සම්බන්ධීකරණ මහලේකම් කාර්යාලය ඇතුළු ශ්‍රී ලංකාවේ අදාළ ආයතන සමඟ විද්‍යා, තාක්ෂණ විද්‍යාව සහ නව නිපැයුම් සහයෝගිතාවය පවත්වා ගෙනයාම සම්බන්ධයෙන්, දූත මණ්ඩල කාර්යාලය විසින් විද්‍යා සහ තාක්ෂණ විද්‍යා ප්‍රතිපත්ති ආයතනය සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. මෙම සහයෝගිතාවය යටතේ, ධාරිතා වර්ධනය සඳහා ඒකාබද්ධ වැඩමුළුවක් මැයි මස 28 සිට ජූනි 06 දක්වා, විද්‍යා සහ තාක්ෂණ විද්‍යා ප්‍රතිපත්ති ආයතනයේ සහාය ඇතිව කොළඹ දී පවත්වන ලදී.

අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි දී, තානාපති කාර්යාලය විසින්, ඉන්චියන් ජාතික විශ්ව විද්‍යාලය සහ ශ්‍රී ලංකාවේ පේරාදෙණිය සහ මොරටුව විශ්ව විද්‍යාල අතර යෝජිත සහයෝගිතාවයට සහාය පළකරමින් සම්බන්ධීකරණයෙහි නියැලෙන ලදී. මෙයට ඉලෙක්ට්‍රෝනික්ස්, විදුලිබල සහ ජීව තාක්ෂණවිද්‍යා ඉංජිනේරු ආදී ක්ෂේත්‍රවල, ශ්‍රී ලංකා උපාධිධාරීන්ට (එම්එස්සී, පීඑච්ඩී) ශිෂ්‍යත්ව අවස්ථා ප්‍රදානය ද ඇතුළත් විය. මේ සම්බන්ධයෙන්, ඉන්චියන් ජාතික විශ්ව විද්‍යාල සභාපති, මහාචාර්ය චෝ ඩොං-සුං සහ ජ්‍යෙෂ්ඨ මහාචාර්වරුන්ගෙන් සමන්විත නියෝජිත කණ්ඩායමක් 2018 අගෝස්තු මාසයේ දී පේරාදෙණිය සහ මොරටුව විශ්ව විද්‍යාල වෙත පැමිණියහ.

2018 දෙවන වර්ෂා'ර්ධයේ දී වූප්‍රුං ශිෂ්‍යත්ව සඳහා ශ්‍රී ලාංකික ශිෂ්‍යයින් 5 දෙනෙකු තෝරා ගැනීමට තානාපති කාර්යාලය විසින් වූප්‍රුං අධ්‍යාපනය සහ සංස්කෘතිය පදනමට සහාය දක්වන ලදී.

අධ්‍යාපන අමාත්‍යවරයාගේ කොරියානු සංචාරය දූත මණ්ඩල කාර්යලය විසින් සම්බන්ධීකරණය කරන ලද අතර, එම සංචාරයේ දී, ශ්‍රී ලංකාවේ විද්‍යුත් සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ පුහුණුව වැඩිදියුණු කිරීම පිණිෂ අධ්‍යාපනය පිළිබඳ ග්වන්ජු මෙට්‍රොපොලිටන් කාර්යාලය (අධ්‍යාපනය පිළිබඳ ග්වන්ජු මෙට්‍රොපොලිටන් කාර්යාලයේ අධිකාරිවරයා) සමඟ ඇතිකර ගෙන තිබූ අවබෝධතා ගිවිසුම 2018 අගෝස්තු මස 7 වන දින අළුත් කරන ලදී.

කොරියාවේ ශ්‍රී ලාංකීය ශිෂ්‍ය සංගමයේ උපදේශක ලෙස තානාපතිවරයා කටයුතු කරන අතර, උපදෙස් ලබාදීම සහ සම්බන්ධවී කටයුතු කිරීම තානාපති කාර්යාලය විසින් අඛණ්ඩව සිදු කරන ලදී. 2018 මාර්තු මාසයේ දී ශිෂ්‍යයින් සහ ශ්‍රී ලාංකික වෘත්තික ප්‍රජාව අතර දිවා භෝජනය සහිත රැස්වීමක් මෙන්ම 8 වන වාර්ෂික මහා සභා රැස්වීම ද 2018 සැප්තැම්බර් මස 29 වන දින තානාපති කාර්යාලයේදී පවත්වන ලදී.

පර්යේෂණ සහයෝගිතාවය යටතේ, 2017 මාර්තු මාසයේ දී, ආයතන දෙක අතර අවබෝධතා ගිවිසුම අත්සන් තැබීමෙන් පසු, කොරියා ජාතික රාජතාන්ත්‍රික ඇකඩමිය සහ ශ්‍රී ලංකාවේ බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික අභ්‍යාස ආයතනය අතර සහයෝගිතාවය තානාපති කාර්යලය විසින් අඛණ්ඩව පවත්වා ගෙන ලදී. දූත මණ්ඩල කාර්යාලය විසින්, කොරියාවේ විදේශ කටයුතු සහ ජාතික ආරක්ෂා ආයතනය සහ ශ්‍රී ලංකාවේ බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික අභ්‍යාස ආයතනය සහ ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය අතර සහයෝගිතාවය පෝෂණය කෙරිණ. කොරියා ජාතික ඇකඩමියේ, විදේශ කටයුතු සහ ජතික ආරක්ෂා ආයතනයේ,

චීන අධ්‍යාපන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ, තානාපති චුං සැං-කි මහතා "එකම තීරයක්-එකම මාවතක් ප්‍රත්‍යුත් ක්‍රමය" යටතේ, විදේශ කටයුතු සහ ජාතික ආරක්ෂා ආයතනයේ/කොරියා ජාතික රාජ්‍යතාන්ත්‍රික ඇකඩමියේ පර්යේෂණ කටයුතු සඳහා මෙරටට පැමිණියේය. (මැයි මස 19-22)

2018 ඔක්තෝබර් මස 11-12 කොළඹ දී පැවැත්වීමට නියමිත "ඉන්දියන් සාගරය: අපේ අනාගතයේ විග්‍රහය"ට අදාළ ට්‍රැක් 1.5 සම්මන්ත්‍රණයේ කොරියා සහභාගිත්වය සමබන්ධයෙන් තානාපති කාර්යාලය විමසිලිමත්ව සිටින ලද අතර, සහභාගිත්වය තහවුරු කර ඇත.

අන්‍යොන්‍ය නෛතිකමය සහාය සම්බන්ධයෙන්, 1990 ගණන්වල කොරියාවේ දී සිදු වූ අපරාධයක් සම්බන්ධයෙන්, 2018 ජූලි මස 28 සිට අගෝස්තු මස 13 දක්වා, ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ දී, ශ්‍රී ලංකාවේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිත කණ්ඩායමක් විසින් කොරියානු අධිකරණ බලධාරීන් හා සමඟ පවත්වන ලද විමර්ෂණයට දූත මණ්ඩල කාර්යාලය විසින් සහාය දක්වමින් පහසුකම් සපයන ලදී.

ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සංවර්ධනය උදෙසා කොරියන් ක්‍රීඩා අමාත්‍යාංශය සමඟ සහයෝගිතාවය කාල වකවානුව තුළ ශක්තිමත් කරන ලද අතර, 2018 අගෝස්තු මාසයේ දී ආසියානු ටෙක්වොන්ඩෝ ක්‍රීඩා-2018 තරඟවලට සහභාගී වූ කොරියාවේ, ශ්‍රී ලාංකික ටෙක්වොන්ඩෝ ක්‍රීඩකයින් 10 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහනක් ද සංවිධානය කරන ලදී.

කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශය විසින් මෙහෙයවන ලද, ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ රෙජීමයට අදාළ අට සාමාජික ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කණ්ඩායමක් වෙනුවෙන්, කොරියාවේ බුද්ධිමය දේපළ කාර්යාලය විසින් සංවිධානය කරන ලද අතර අධ්‍යාපන චාරිකාවක් සඳහා කොරියාවට යෑමට ද තානාපති කාර්යාලය විසින් පහසුකම් සලසන ලදී.

ශ්‍රී ලංකාවේ ගරු කොන්සල්වරුන් සහ ඔවුන්ගේ කාර්යාල සමඟ සම්බන්ධකම් පවත්වා ගෙන යාමට දූත මණ්ඩල කාර්යාලය විසින් කටයුතු කරන ලදී. බුසාන් ගරු කොන්සල්වරයා සහ ජාතික ධීවර සමූපකාර සම්මේලනයේ සභාපති, කිම් ඉම්-ක්වොන් මහතා දිවයිනේ සංචාරයක නිරත විය. දකුණු ගියොංසාන්ග් පළාත් නව කොන්සල්වරයා ලෙස දූත මණ්ඩල කාර්යාලය විසින් නම්කරන ලද, හ්වාසින් ෂිපිං ඇන්ඩ් එයා කාගෝ ප්‍රයිවට් ලිමිටඩ් සමාගමේ සභාපති, සියෝ මින්ජා මහතා 2018 අප්‍රියෙල් මස 10 වන දින පත්කරන ලදී.

(1) ඉහළ මට්ටමේ චාරිකා

සමාලෝචනයට භාජනය වන කාලය තුළ සිදු කරන ලද , සැළකිය යුතු ඉහළ මට්ටමේ චාරිකා කිහිපයක විස්තර පහත දැක්වේ.

කොරියා ජනරජයට

- වරාය සහ නාවික අමාත්‍ය, ගරු මහින්ද සමරසිංහ මහතා (2018 මැයි 8-30) කොරියාවේ සංචාරයක නියැලෙන ලද්දේ, යාන්ත්‍රණ සහ ආලෝකාගර බලධාරීන්ට සමුද්‍රීය ආධාර සැපයීම පිළිබඳ සංගමයේ 19 වන සම්මන්ත්‍රණයට සහභාගී වීම පිණිසය.

- රාජ්‍ය පරිපාලන සහ නීතිය හා සාමය අමාත්‍ය, ගරු රංජිත් මද්දුම බණ්ඩාර මහතා (2018 ජූනි 25-27) කොරියා සංචාරයෙහි නියැලුණේ, කොරියානු ඵලදායිතා මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද වැඩ සටහනකට සහභාගී වීමටය.

- ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ,කථානායක ගරු කරු ජයසූරිය මහතා (2018 අගෝ.27-30) කොරියාවේ නිල සංචාරයක නියැලුණේ, කොරියානු ජාතික සභාවේ කථානායක විසින් කරන ලද ඇරයුමක් පරිදිය.

- අධ්‍යාපන අමාත්‍ය, ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (2018 අගෝ.24-29) කොරියාවේ සංචාරයක නියැලුණේ, ග්වන්ජු අධ්‍යාපන නගර කාර්යාලයේ ඇරයුම මත වන අතර, ශ්‍රී ලංකාවේ විද්‍යුත් හැඳෑරුම් සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණවේද පුහුණුව සංවර්ධනය කිරීම පිණිස, ග්වන්ජු අධ්‍යාපන නගර කාර්යාල ජැන්ග් වි-ගුක් සමග අවබෝධතා ගිවිසුමකට එළඹෙන ලදී.

- තරුණ කටයුතු, ව්‍යාපෘති කළමණාකරණ සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය,ගරු සාගල රත්නායක මහතා (2018 සැප්.02-08) කොරියා සංචාරයක නියැලුණේ, "දේශපාලන කටයුතු වැඩ සටහනේ කීර්තිමත් ප්‍රභූවරයෝ " වැඩසටහනට සහභාගී වීමටය.

- ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍ය, අශෝක් අබේසිංහ මහතා (2018 සැප්.18-20) කොරියා සංචාරයෙහි නියැලුන අතර කොරියානු ඉඩම්, යටිතල සහ ප්‍රවාහන අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද ගෝලීය යටිතල සහයෝගිතා සම්මන්ත්‍රණයට සහභාගී විය. සංචාරය තුළ දී, නියෝජ්‍ය අමාත්‍යවරයා කොරියානු ජනරජයේ ඉඩම්, යටිතල සහ ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍ය, කිම් පියොං රියොල් මහතා හමු වී, තම තමන්ගේ අමාත්‍යාංශ අතර පවතින සහයෝගිතාවය සාකච්ඡාවට භාජනය කළහ.

- ශ්‍රී ලංකා නාවික හමුදාපති, වයිස් අද්මිරාල් එස්.එස්.රණසිංහ මහතා (2018 ඔක්.11-18) බටහිර ශාන්තිකර නාවික සම්මන්ත්‍රණයට සහභාගීවීම පිණිස කොරියා සංචාරයේ නියැලුණි

- කොළඹ නගරාධිපතිනි, රෝසි සේනානයක මහත්මිය, (2018 දෙසැ.10-13) සියොල් මෙට්‍රොපොලිටන් රජය විසින් සංවිධානය කරන ලද "2018- යහපත් කාර්යයන් සඳහා නගර පරිවර්තනය කිරීමේ ජාත්‍යන්තර සංසදයට" සහභාගී වීමට වන අතර, සියොල් මෙට්‍රොපොලිටන් නගරාධිපති හමු වී, කොළඹ නගරය සහ සියොල් නගරය අතර සහයෝගිතා ශක්තිමත් කිරීමේ හැකියාව සාකච්ඡාවට භාජනය කරන ලදී. 2018 දෙසැම්බර් මස 12 වන දින සියොල් නගරාධිපති කාර්යාලයේ දී පවත්වන ලද විශේෂ උත්සවයක දී, සියොල් නගරාධිපති විසින්, "සියොල් ගරු පුරවැසිභාවය" රෝසි සේනානායක නගරාධිපතිවරියට ප්‍රදානය කරන ලදී.

ශ්‍රී ලංකාවට:

- කොරියානු ජන රජයේ, විදේශ කටයුතු පිළිබඳ 1 වන උප අමාත්‍ය, ගරු ලිම් සුන්ග් නාම් මහතා ශ්‍රී ලකාව සහ කොරියානු ජනරජය අතර දේශපාලන උපදේශනයෙහි දෙවන වටය පැවැත්වීම පිණිස දිවයිනට පැමිණියේය.

- කොරියානු විදේශ කටයුතු අමාත්‍යාංශයේ, ආසියා සහ ශාන්තිකර කටයුතු කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්, කිම් ඉයුන්-යන්ග් මහත්මිය (2018 මැයි මස 13-14)

- කොරියානු විදේශ කටයුතු අමාත්‍යාංශයේ ද්විපාශ්වික ආර්ථික කටයුතු කාර්යාංශයේ අධ්‍යක්ෂ ජෙනරාල්, කිම් හී-සැන්ග් මහතා(2018 ජූනි මස 27-28) කොරියානු-ශ්‍රී ලංකා ආර්ථික සහයෝගිතා පළමුවන ඒකාබද්ධ කොමිෂම පැවැත්වීම සඳහා පැමිණෙන නියෝජිත කණ්ඩායමේ ප්‍රධානිය විය.

(2) ද්විපාර්ශ්වීය ගිවිසුම්

සමාලෝචනයට භාජනය වන කාල පරාසය තුළ දී දූත මණ්ඩල කාර්යාලයේ ආධාරයෙන්, පහත දැක්වෙන ගිවිසුම් වලට අත්සන් තැබිණ:

- යාතුණායට සැලසෙන ආධාර සංවර්ධනයෙහි ලා සහයෝගිතාවය මත ශ්‍රී ලංකාවේ වරාය හා නාවික අමාත්‍යාංශය සහ කොරියාවේ සමුද්‍ර සහ ධීවර අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමක්, 2018 මැයි මස 28 වන දින, ශ්‍රී ලංකාවේ වරාය හා නාවික අමාත්‍යවරයා සහ කොරියා ජනරජයේ සමුද්‍ර සහ ධීවර අමාත්‍යවරයා විසින් අත්සන් කරන ලදී.

- ශ්‍රී ලංකාවේ විද්‍යුත් හැඳෑරුම සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ සංවර්ධනය උදෙසා අවබෝධතා ගිවිසුමක් ගරු අධ්‍යාපන අමාත්‍යතුමන් සහ ග්වන්ජු මෙට්‍රොපොලිටන් අධ්‍යාපන කාර්යාලයේ අධිකාරිය විසින් අත්සන් තබන ලදී.

2. බහුපාර්ශ්වීය සබඳතා

(1) බහුපාර්ශ්වීය ආයතන සමඟ ගිවිසුම්

හරිත දේශගුණ අරමුදල සමඟ සහයෝගිතාවය (GCF)

කාලගුණික විපර්යාස සහයෝගිතාවය සම්බන්ධයෙන් හරිත දේශගුණ අරමුදල සමඟ අඛණ්ඩව කටයුතු කර ගෙනයාම තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද අතර, හරිත දේශගුණ අරමුදලේ වරප්‍රසාද සහ විනිර්මුක්තීන් පිළිබඳ ගිවිසුම් කෙටුම්පත සකස් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලකාවේ අදාළ ස්ථති සමඟ පසුවිපරමෙහි යෙදීම ද අඛණ්ඩව කර ගෙන යන ලදී.

ශ්‍රී ලංකාව සහ හරිත දේශගුණ අරමුදල අතර, දේශගුණයට අනුගතවීම සහ අවම කර ගැනීම මත තවදුරටත් සහයෝගිතාවය පවත්වා ගැනීම පිළිබඳ සාකච්ඡා කිරීම පිණිස අරමුදලේ

විධායක අධ්‍යක්ෂ ආචාර්ය හොවාර්ඩ් බැම්සේ මහතා 2018 ආප්‍රල් 5-19 දක්වා ශ්‍රී ලංකාවේ රැඳී සිටි අතර, තම සංචාරය අතරතුර අතිගරු ජනාධිපතිතුමන් බැහැදැකීමට ද පියවර ගත්තේය.

ගෝලීය හරිත වර්ධන ආයතනයේ ශ්‍රී ලංකා සමාජිකත්වය (GGGI)

හරිත දේශගුණ අරමුදලේ සේවා සැපයුම් කොටස්කරුවෙකු වන ගෝලීය හරිත වර්ධන ආයතනයේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියා පරිපාටිය ශ්‍රී ලංකා පාර්ශ්වය විසින් සම්පූර්ණ කරන ලදුව, දූත මණ්ඩල කාර්යාලය විසින් සාමාජිකත්වය ලබා ගැනීමේ සාධන පත්‍රය 2018.12.14 වන දින ගෝලීය හරිත වර්ධන ආයතනයේ මූලස්ථානය වෙත භාර දෙන ලදී. ශ්‍රී ලංකාව ගෝලීය හරිත වර්ධන ආයතනයේ 30 වන සාමාජික රට වන අතර, 2019.01.13 වන දින ශ්‍රී ලංකා සාමාජිකත්වය විධිමත්ව ආරම්භ කෙරිණ.

ගෝලීය හරිත වර්ධන ආයතනයේ ශ්‍රී ලංකා සාමාජිකත්වය, දේශගුණික විපර්යාස වලට අනුගතවීම සහ අවමකර ගැනීමෙහි ලා එහි දැඩි සම්බන්ධතාවය සහ එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ කාර්ය රාමු සම්මුතිය යටතේ එහි ක්‍රියාකාරිත්වය, 2018.07.17 වන දින මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයේ ලේකම් අනුර දිසානායක මහතා සහ ගෝලීය හරිත වර්ධන ආයතනයේ කවුන්සිලයේ සභාපති සහ සමුළුවේ සභාපති ආචාර්ය බෑන් කී-මූන් මහතා අතර පැවති සාකච්ඡාවේ දී විශේෂිතව හුවා දක්වන ලදී.

ප්‍රවර්ධන ක්‍රියාකාරකම්

1. කොරියාවේ ආර්ථික සහයෝගිතා ආයතන සමඟ සබඳතාව

තානාපති කාර්යාලය විසින්, කොරියානු විදේශ කටයුතු අමාත්‍යාංශය, අදාළ රේඛීය අමාත්‍යාංශ සහ නියෝජිතායතන සහ අනුබද්ධිත ආයතන, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ වෙළඳ ආයතන සමඟ හොඳ සබඳතා පවත්වා ගෙනයාමට කටයුතු කෙරිණ.

2. වාහන කොටස් සහ උපකරණ පිළිබඳ පස් සාමාජික කොරියන් නියෝජිත පිරිසක් (අප්‍රේල් 1-4); කොරියානු ජාතික ධීවර සහ සමුපකාර සම්මේලනයේ සභාපතිගේ ප්‍රධානත්වයෙන් යුත් දස සාමාජික නියෝජිත පිරිසක් (ජනවරි 15-19); ඩීගු හානි විශ්ව විද්‍යාලයේ උප සභාපතිගේ ප්‍රධානත්වයෙන් යුත් සය සාමාජික නියෝජිත පිරිසක් (මාර්තු 15-19); ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද , 2018: 3 වන ශ්‍රී ලංකා ආයෝජන සහ ව්‍යාපාර පර්ෂදයට සහභාගිවීම පිණිස පැමිණි කොරියන් සමාගම් දෙකක් (ජූනි මස 19-21) සහ පහසුකාරක කේවල සමාගමක් ශ්‍රී ලංකාවේ චාරිකවල නියැලුණි.

3. දූත මණ්ඩල කාර්යාලය පහත දැක්වෙන සිද්ධීන්වලට ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සහ පහසුකරණය සිදු කරන ලදී. ජාත්‍යන්තර උද්‍යාන විද්‍යා ගොයාන් කොරියා-2018; " ලොවනන් දෙසින් තේ- තේ ලෝකය", භාණ්ඩ ආනයන ප්‍රදර්ශණය; සියොල් ආහාර-2018; මියුන් වොන් ලෝක තේ ප්‍රදර්ශණය-2018; හැඩොං වයිල්ඩ් ට කල්ච උත්සවය, 33 වන කොරියා ජාත්‍යන්තර චාරිකා ප්‍රදර්ශණය; 06 වන සියොල් ජාත්‍යන්තර බෞද්ධාගම ප්‍රදර්ශණය; බසාන් ජාත්‍යන්තර

චාරිකා පොළ; කොරියන් ජාත්‍යන්තර චාරිකා ප්‍රදර්ශණය; සියොල් මිත්‍රත්ව ප්‍රදර්ශණය-2018; බයෝහි පවත්වන ලද 16 වන සීඩොං ලෝටස් උත්සවය

4. විවිධ වැඩ සටහන් දෙකක් චිත්‍රපට ගත කිරීම පිණිස, "විසාර්ඩ් ඔෆ් නෝ වෙයා" සාමාජිකයින් 40 කින් යුක්ත වූ චිත්‍රපට කණ්ඩායමක් (ජනවාරි 30-පෙබරවාරි 04) සහ සාමාජිකයින් 45 දෙනෙකුගෙන් යුත් "කැළෑ නීතිය" චිත්‍රපට කණ්ඩායම (අගෝස්තු 4-13) ශ්‍රී ලංකාවට පැමිණීම දූත මණ්ඩල කාර්යාලය විසින් සංවිධානය කරන ලදී. කොරියාවේ දී ශ්‍රී ලංකාවට සැලකිය යුතු ප්‍රසිද්ධියක් අත්පත් කර ගැනීමට මෙම රූපවාහිනී වැඩසටහන් දෙක ඉවහල් වනු ඇත.

5. තානාපති කාර්යාලය විසින්, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය හා එක්ව, කොරියන් සංස්කෘතික සම්මේලනයේ සහ පාවෙන උද්‍යාන (SEOULLO) කළමණාකරණ කාර්යාලයේ සහාය ඇතිව, SEOULLO 7017-මැග්නොලියා චත්‍රරශ්‍රයේ දී, 2018 ජූනි මස 16 වන සෙනසුරාදා, සියොල් නුවර මධ්‍යයේ, ප්‍රථම ශ්‍රී ලංකා දිනය සංවිධානය කරන ලදී.

6. බෞද්ධාගමික සංචාරකයින් ශ්‍රී ලංකාවට ආකර්ෂණය කර ගැනීම පිණිස, ලෝක ප්‍රසිද්ධ ශ්‍රී ලංකා බෞද්ධ සිද්ධස්ථාන දෙකක් වන පොළොන්නරුවේ ගල්විහාරය සහ මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ අභ්‍යන්තරය දැක්වෙන රාමුකරන ලද ඡායාරූප දෙකක් කොරියානු විහාර 100 කට පරිත්‍යාගකරන ලදී.

7. තානාපති කාර්යාලයේ සහ කොරියන් පදනමේ සත්කාරයෙන්, නම්හේ ජනපදය විසින් සංවිධානය කරන ලද "ශ්‍රී ලංකා: නිදන් දූපත" යන තේමාව යටතේ දෙවන ඡායාරූප ප්‍රදර්ශනය,2018 අගෝස්තු 07 සිට සැප්තැම්බර් 09 දක්වා, ගියෝන්සැන්ගුඅන්-ඩූ හි, නම්හේ විප්‍රවාශ සාහිත්‍ය ප්‍රදර්ශන මධ්‍යස්ථානයේදී පවත්වන ලදී.

ශ්‍රමික සුබසාධනය (සේවා නියුක්තිය සහ සුබසාධනය)

2018 සැප්තැම්බර් මස 30 වන දින වන විට, ඇස්තමේන්තු ගත ශ්‍රී ලාංකිකයින් 27,000ක සංඛ්‍යාවක් කොරියාවෙහි සේවයේ යොදවා තිබුණි. මින් බහුතරයක් ප්‍රියමනාප සේවා තත්ත්වයන් භුක්ති විඳිති. ශ්‍රී ලාංකිකයන් 30,000 පමණ සංඛ්‍යාවක් කොරියාවේ ජීවත් වෙමින්, වැඩකරන බව ඇස්තමේන්තු කර ඇත. සේවා නියුක්ති බලපත්‍ර ක්‍රමවේදය යටතේ, කොරියාවේ සේවය කරන ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ගේ සුබසාධනය සම්බන්ධයෙන්, අදාළ කොරියන් නියෝජිතායතන වන කොරියාවේ සේවා නියුක්ති සහ කම්කරු අමාත්‍යාශය සහ කොරියාවේ මානව සම්පත් සංවර්ධන සේවය වැනි ආයතන සමඟ සමීපතම සම්බන්ධීකරණයක් දූත මණ්ඩල කාර්යාලය විසින් පවත්වා ගෙන යනු ලැබේ. 2018 ජනවාරි මස 01 වන දින සිට සැප්තැම්බර් 30 දක්වා කාල පරාසය තුළ කොරියාවට පැමිණි සේවකයින් සංඛ්‍යාව 2683 ක් විය.

(1) සුබසාධනය

2018 ජනවාරි මස 01 දින සිට 2018 දෙසැම්බර් මස 31 වන දින දක්වා, තානාපති කාර්යාලයේ, සේවා නියුක්ති සහ සුබසාධන අංශය විසින් ඉටුකරන ලද සුබසාධන කාර්යභාරයේ සාරාංශයක් පහත දැක්වෙයි.

(i) වැඩ ආශ්‍රිතව ලත් පැමිණිලි සංඛ්‍යාව - 272

සමථයට පත් කරන ලද පැමිණිලි සංඛ්‍යාව - 256

(පැමිණිලිවල ස්වාභාවය : හිංරිහැර, පඩිනඩි නොගෙවීම, ඌණ සංනිවේදනය, අසනීප, සේවා නියුක්ති ගිවිසුම් කඩකිරීම් ආදිය)

(ii) ආරෝග්‍යශාලා ගත කිරීම් - 39

(iii) සිරගතවූ අය - 12

(iv) දූත මණ්ඩලකාර්යාලය විසින් පවත්වන ලද සේවා නියුක්ති සහ සුබසාධන ජංගම සේවා(කොන්සියුලර් ජංගම සේවාවන්ට සමගාමීව) - 10

(9) සංස්කෘතික සිද්ධි

සමාලෝචනයට භාජනය වන කාලය තුළ, ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් පහත දැක්වෙන පරිදි, ඉසව් (5) පහක් සංවිධානය කර, සහභාගී වන ලදී.

i. 'බුද්ධොත්පත්ති එනම්, වෙසක් මංගල්‍යය සැමරීම පිණිස, මැයි මස 12 වන සෙනසුරාදා සන්ධ්‍යා භාගයේ, 2018-වාර්ෂික ලෝටස් පහන් කූඩු උත්සවයේ ශ්‍රී ලංකා පෙරහැරකට සහාය පළකර, සහභාගී වන ලදී.

ii. 2018 ජූනි 24 වන ඉරිදා ශ්‍රී ලංකා තානාපතිකාර්යාලයේ සහභාගිත්වයෙන්, ඓතිහාසික බොන්ගුඅන් විහාරස්ථානයේ දී, විශේෂ විහාරස්ථ වැඩ සටහනක් සංවිධානය කෙරිණ.

iii. 2018 සැප්තැම්බර් මස 02 වන දින, කොරියාවේ මානව සම්පත් සංවර්ධන සේවය විසින් සංවිධානය කරන ලද, 2018- විදේශීය ශ්‍රමිකයින්ගේ උත්සවයේ දී, ශ්‍රී ලංකාවේ අති මහත් සංස්කෘතික සහ සංචාරක ආකර්ෂණයන් ප්‍රවර්ධනය කෙරෙන ප්‍රදර්ශන කුටියක් තානාපති කාර්යාලය විසින් සංවිධානය කෙරිණ.

iv. 2018 සැප්තැම්බර් මස 09 වන දින ගිම්පෝ නගර ශාලාව විසින් සංවිධානය කරන ලද 11 වන ගිම්පෝ එකමුතු දින උත්සවයේ දී, ශ්‍රී ලංකාවේ අති මහත් සංස්කෘතික සහ සංචාරක ආකර්ෂණයන් ප්‍රවර්ධනය කෙරෙන ප්‍රදර්ශන කුටියක් තානාපති කාර්යාලය විසින් සංවිධානය කෙරිණ.

v. 2018 ඔක්තෝබර් මස 02 වන දින, ශ්‍රී ලාංකික සංස්කෘතිය, ඉතිහාසය සහ සම්ප්‍රදායයන් හඳුන්වා දීම පිණිස, සියොල් නගරයේ සැම්සුන් දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ දී ගුරුවරුන් දෙදෙනෙකු ඇතුළු සිසු දරුවන් 14 දෙනෙකු සඳහා කෙටි වැඩ සටහනක් තානාපති කාර්යාලය විසින් සංවිධානය කරන ලදී.

vi. 2018 ඔක්තෝබර් මස 13 වන දින, ඉටාවොන් ගෝලීය උත්සවයේ දී දකුණු කොරියාවේ ශ්‍රී ලාංකික ශිෂ්‍ය පර්ෂදය හා එක්ව පෙරහැරක් සංවිධානය කරන ලදී.

vii. 2018 දෙසැම්බර් මස 07 වන දින, කොරියා ජනරජයේ, ගවන්ජු හි, ආසියානු සංස්කෘතික මධ්‍යස්ථානයේ දී, ආසියානු නෘත්‍ය කමිටු රැස්වීමට තානාපතිකාර්යාලය විසින් පහසුකම් සලසන ලදී.

viii. ග්‍රීෂ්ම ඍතුවේ වර්ෂාර්ධයේදී යොන්සෙයි විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් 03 දෙනෙකුට, දූත මණ්ඩල කාර්යාලය සමඟ වැඩ කිරීමට අවස්ථාව සලසමින් ස්වකීය වාර්ෂික සීමාවාසික වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට දූත මණ්ඩල කාර්යාලය කටයුතු කරන ලදී.

(10) EPS-TOPIK විභාගය සමත් වී, රැකියා අපේක්ෂිත ශ්‍රී ලාංකිකයින්ට කොරියන් භාෂාව ඉගැන්වීමේ වැඩ සටහනක්

EPS-TOPIK විභාගය සමත් වී, රැකියා අපේක්ෂිත ශ්‍රී ලාංකිකයින් සඳහා, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා එක්ව, කොරියන් භාෂාව ඉගැන්වීමේ වැඩ සටහනක් පැවැත්වීම, ආසියා සංවර්ධන පදනම විසින් යෝජනා කර ඇත.

(11) ආරක්ෂිත පියවර ගැන තොරතුරු

නිෂ්පාදන සහ ධීවර අංශය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමන්, කාර්මික සහ වෙනත් අනතුරු මග හරවා ගැනීම පිණිස ශ්‍රී ලාකික සේවකයින් විසින් අනුගමනය කළ යුතු ආරක්ෂිත පියවර පිළිපබඳ තොරතුරු බෙදා හැරීම දූත මණ්ඩල කාර්යාලය විසින් අඛණ්ඩව සිදු කෙරෙයි.

(12) වන්දි

සමාලෝචනයට භාජනය කෙරෙන කාලවකවානුව තුළ, අභාප්‍රාප්ත වූ ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් 09 දෙනෙකුට වන්දි ගෙවීම දූත මණ්ඩල කාර්යලය විසින් පහසු කෙරිණ. ගෙවන ලද මුළු වන්දි මුදල කොරියානු වොන් 387,703,094 කි. (ශ්‍රී ලංකා රුපියල් 58,155,464)

සංචාරණ ප්‍රවර්ධනය

2018 වසරේ මුල් මාස 09 තුළ, කොරියානු සංචාරකයන් 11,936 දෙනෙකු ශ්‍රී ලංකාවට පැමිණ ඇත. පසුගිය වසරේ එම කාලය තුළ සංචාරකයින් සංඛ්‍යාව හා සංසන්දනාත්මකව සළකා බැලීමේ දී මෙය 14.96%ක වැඩිවීමකි.

ශ්‍රී ලංකාවේ නුවරඑළිය, සීගිරිය, ගාල්ල ආදී ස්ථාන ආවරණය කෙරෙමින් රියැලිටි රූපවාහිනී වැඩ සටහනක් නිෂ්පාදනය කිරීමට (ජනවාරි මස 31 සිට පෙබරවාරි මස 05 දක්වා) සහ "1985-ජංසංපෝ" නැමැති වාර්තාමය වැඩ සටහනේ එක් කතාංගයක් නිෂ්පාදනය කිරීම පිණිස (2018 මාර්තු මස 27 සිට අප්‍රේල් 03 දක්වා) මුන්වා ගුවන් විදුලි සංස්ථාවේ රූපවාහිනී වැඩ සටහන් සම්පාදක කණ්ඩායම් දෙකක පැමිණීම සම්බන්ධයෙන් දූත මණ්ඩල කාර්යාලය කටයුතු කළේය.

2018 ජූලි මස 29 සිට අගෝස්තු 16 දක්වා, "කැළෑ නීතිය" වැඩ සටහන යටතේ, රූපවාහිනී වැඩසටහනක් නිෂ්පාදනය කිරීම පිණිස, සියොල් ගුවන්විදුලි සේවයේ රූපවාහිනී වැඩ සටහන් සම්පාදක කණ්ඩායමක පැමිණීම සම්බන්ධයෙන් දූත මණ්ඩල කාර්යාලය කටයුතු කළේය.

<u>ශ්‍රී ලංකා මාධ්‍ය</u>

ජාතික රූපවාහිනී නාලිකාව ඔස්සේ විකාශනය කෙරෙන, 'එතෙර මෙතෙර වැඩ සටහනේ නිෂ්පාදක කණ්ඩායම කොරියා ජනරජයේ සංචාරයක නියැලුණ අතර, 2018 සැප්තැම්බර් මස 18-25 දක්වා කාලය තුළ, තානාපතිතුමන් හා තානාපති කාර්යාලීය කාර්ය මණ්ඩලය සමඟ පැවති සම්මුඛ සාකච්ඡා, ජංගම සේවා සහ කොරියාවේ ශ්‍රී ලාංකික ප්‍රජාව විසින් සංවිධානය කරන ලද යම් යම් ඉසව් ඇතුළු වැඩසටහන් මාලාවක් චිත්‍රපටගත කෙරිණ.

ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය, මැලේසියාව

1. ද්විපාර්ශ්වීය සබඳතා

I. 2018 අප්‍රේල් මාසයේ දී ගරු රාජ්‍යාරක්ෂක අමාත්‍යතුමන් සමඟ රැස්වීම

II. මැලේසියාවේ නව රාජ්‍යාරක්ෂක අමාත්‍ය, වයිබී තුවන් හාපී මොහමඩ් බින් සාබු මහතා සමඟ රැස්වීම ද්විපාර්ශ්වීය ලැදියාවන් විශේෂයෙන්ම ශ්‍රී ලංකා සහ මැලේසියානු රජයන් අතර ආරක්ෂක සහයෝගිතාවය ගැන සාකච්ඡා කෙරිණ.

III. 2018 ජූලි මාසයේ දී, මැලේසියාවේ විදේශ කටයුතු අමාත්‍යවරයා සමඟ පැවති රැස්වීමේ දී දෙරට අතර ද්විපාර්ශ්වීය සබඳතා වැඩි දියුණු කර ගැනීම කෙරෙහි අවධානය යොමු විය.

IV. 2018 ජූලි මාසයේ දී, කර්මාන්ත සහ වාණිජ අමාත්‍ය, ගරු රිෂාර්ඩ් බදියුදීන් මහතාගේ චාරිකාව

කර්මාන්ත සහ වාණිජ අමාත්‍ය, ගරු රිෂාර්ඩ් බදියුදීන් මහතා ,මැලේසියාවේ ජාත්‍යන්තර වෙළඳ සහ කර්මාන්ත අමාත්‍ය, වයිබී ඩැරල් ලීකිං මහතා බැහැ දැක, ශ්‍රී ලංකාව සහ මැලේසියාව අතර ද්විපාර්ශ්වීය සබඳතා ප්‍රවර්ධනය ගැන සාකච්ඡා කරන ලදී.

V. 2018 සැප්තැම්බර් මාසයේ දී. විදේශ කටයුතු අමාත්‍ය, පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු තිලක් මාරපන මහතාගේ ක්‍රියාකාරිත්ව චාරිකාව.

ඇ. විදේශ කටයුතු අමාත්‍ය, පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු තිලක් මාරපන මහතා මැලේසියාවේ චාරිකාවක නියැලෙමින්, මැලේසියානු විදේශ කටයුතු අමාත්‍ය, වයිබී ඩාටෝ සයිෆුදීන් බින් අබ්දුල්ලා මහතා සමඟ ද්විපාර්ශ්වීය සාකච්ඡා පැවැත්වීය.

ආ. අමාත්‍යවරයා, සංචාරක, කලා සහ සංස්කෘතික නියෝජ්‍ය අමත්‍යවරයා ද හමු වූ අතර, වොන්ඩර් ඔෆ් ඒෂියා එක්ස්ට්‍රාවැගන්සා සහ මැලේසියානු චාරිකා සහ සංචාර නියෝජිතායතන සංගම් මේලාව ද නැරඹීය. සංචාරය තුළ දී, විදේශ කටයුතු කාර්යාල උපදේශනය ගැන රාජ්‍යතාන්ත්‍රික සටහනක් ද අමාත්‍යවරුන් අතර හුවමාරු කෙරිණ.

ඈ. සංචාරය තුළ දී, විදේශ කටයුතු කාර්යාල උපදේශනය ගැන රාජ්‍යතාන්ත්‍රික සටහනක් ද අමාත්‍යවරුන් අතර හුවමාරු කෙරිණ.

VI. 2018 සැප්තැම්බර් මාසයේ දී, සංචාරක සහ ක්‍රිස්තියානු ආගමික කටයුතු අමාත්‍ය, ගරු ජෝන් අමරතුංග මහතාගේ චාරිකාව

දකුණු ආසියානු යටත් ලේකම් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ක්‍රමිකව හමුවීම සහ රේඛීය අමාත්‍යාංශ සමඟ අන්තර් ක්‍රියාදාම.

VII. 2018 ඔක්තෝබර් මාසයේදී, මැලේසියානු ශ්‍රී ලාංකික සංවිධාන සම්මේලන චාරිකාව

මහ කොමසාරිස්තුමා, මැලේසියානු ශ්‍රී ලාංකික සංවිධාන සම්මේලන සභාපති, ඩාටෝ එස්. කුලසේගරන් හමුවුණ අතර, වෙළඳ සහ අයෝජන ආශ්‍රිත කරුණු මෙන් ම, ඉදිරියේ දී සිදුවීමට නියමිත ශ්‍රී ලංකා මැලේසියා ව්‍යාපාර කවුන්සිලයේ නිලධාරීන්ගේ පැමිණීම ද සාකච්ඡාවට භාජනය කෙරිණ.

VIII. පීනෑන්ග් ප්‍රධන අමාත්‍ය සමඟ රැස්වීම

මහ කෙමසාරිස්තුමා, පිනෑන්ග් ප්‍රධාන අමාත්‍ය, චව් කොන් යව් බැහැ දැක, වෙළඳ, අයෝජන සහ සංචාරක අවස්ථා තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා පිනෑන්ග්හි ද්විපාර්ශ්වීය ලැදියාවන්ට අදාළ කරුණු සාකච්ඡාවට භාජනය කරන ලදී.

2. වෙළඳ සහ ආර්ථික සබඳතා / විදේශීය ආයෝජන

I. මැලේසියාවේ වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගී වීම

2018- මැලේසියානු ජාත්‍යන්තර ආහාරපාන වෙළඳ සැණකෙළිය (2018 ජූනි)

- මෙහි දී, තේ මණ්ඩල මණ්ඩපය යටතේ තේ අපනයනකරුවන් 4 දෙනෙකු සහ ශ්‍රී ලංකාවේ යන්ත්‍රෝපකරණ අපනයකරුවෙකු තම නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීමට සමත් වූහ.

II. අග්නි දිග ආසියානු ජාතීන්ගේ සංගමය (යාන්ත්‍රික හා විදුලි) ප්‍රදර්ශනය - 2018 ජූලි

12 දෙනෙකුගෙන් සමන්විත විදුලි සහ ඉලෙක්ට්‍රෝනික නියෝජිත පිරිසක් සහභාගී වූහ. ප්‍රදර්ශන භූමියේ දී, සපැමිණි නියෝජිත පිරිස වෙනුවන් 'ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට' සැසියක් පවත්වන ලදී.

III. මැලේසියානු ජාත්‍යන්තර වෙළඳ සන්නාම ප්‍රදර්ශනය - 2018 දෙසැම්බර්

ශ්‍රී ලංකාවේ එක් තේ අපනයනකරුවෙකු සහ එක් සුවඳවිලවුන් අපනයනකරුවෙකු තම නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීමට සමත් වූහ.

IV. වෙළඳ නියෝජිත පිරිස්

මැලේසියානු නිෂ්පාදක සම්මේලනයේ වෙළඳ නියෝජිත පිරිස-ජනවාරි 2018 මැලේසියානු නිෂ්පාදක සම්මේලනයේ, 11 දෙනෙකුගෙන් සමන්විත වෙළඳ සහ ආයෝජන නියෝජිත පිරිසක් ශ්‍රී ලංකාවට එවන ලදී. ආයෝජන මණ්ඩලය, අපනයන සංවර්ධන මණ්ඩලය, මැලේසියානු-ශ්‍රී ලංකා ව්‍යාපාර මණ්ඩලය, ලංකා වාණිජ මණ්ඩලය සහ ශ්‍රී ලංකාවේ වාණිජ සහ කර්මාන්ත මණ්ඩල සම්මේලනය සමඟ එක්ව ව්‍යාපාර මුණගැස්වීමේ වැඩ සටහන් සහ රැස්වීම් සංවිධානය කෙරිණ.

V. මැලේසියානු- ශ්‍රී ලංකා ව්‍යාපාර මණ්ඩලයේ වෙළඳ නියෝජිත පිරිස - ජූනි 2018

ලංකා වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද ආයෝජන සහ ව්‍යාපාර පර්ෂදයට සහභාගීවීම පිණිස 13 දෙනෙකුගෙන් සමන්විත මැලේසියානු-ශ්‍රී ලංකා ව්‍යාපාර මණ්ඩලයේ ආයෝජන නියෝජිත පිරිසක් ශ්‍රී ලංකාවට එවන ලදී. ආයෝජන මණ්ඩලය, අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා සිල්ලර වෙළඳුන්ගේ සංගමය සහ මැලේසියානු-ශ්‍රී ලංකා ව්‍යාපාර මණ්ඩලය සමඟ එක්ව ව්‍යාපාර මුණගැස්වීමේ වැඩ සටහන් සහ රැස්වීම් සංවිධානය කෙරිණ

VI. ශ්‍රී ලංකාවෙන්, ඉලෙක්ට්‍රෝනික සහ විදුලි අංශ නියෝජිත පිරිසක්- ජූලි 2018

12 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත පිරිසක් මැලේසියාවේ චාරිකාවක නියැලුණාහ. මැලේසියානු බාහිර වෙළඳ සංවර්ධන සංස්ථාව, මැලේසියානු නිෂ්පාදකයින්ගේ සම්මේලනය, මැලේසියාවේ විදුලි සහ ඉලෙක්ට්‍රොනික් නිෂ්පාදකයින්ගේ සම්මේලනය සමඟ එක්ව ව්‍යාපාර මුණගැස්වීමේ වැඩ සටහන් සහ රැස්වීම් සංවිධානය කරන ලද අතර, කර්මාන්ත ශාලා නැරඹුම් චාරිකා දෙකක්ද සංවිධානය කෙරිණ.

VII. මැලේසියාවේ ටෑන් චොං සමාගම් සමූහයෙන් නියෝජිත පිරිසක් - අගෝස්තු 2018

ලංකා ඔටෝ - 2018 ට සහභාගී වීම පිණිස, මැලේසියාවේ ටෑන් චොං සමාගම් සමූහයෙන් 9 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත පිරිසක් එවන ලදී. සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය, ගරු මලික් සමරවික්‍රම, ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා

තිරසාර බලශක්ති අධිකාරිය, ලංකා වාණිජ මණ්ඩලය, ලංකා මෝටර්ස් සහ අමතර කොටස් වෙළඳුන්ගේ සංගමය සමඟ වෙන වෙනම රැස්වීම් සංවිධානය කර දෙන ලදී.

VIII. මැලේසියානු-ශ්‍රී ලංකා ව්‍යාපාර මණ්ඩලයේ වෙළඳ නියෝජිත පිරිස - නොවැ. 2018

2018 නොවැම්බර් 12 - 14 දක්වා සංවිධානය කරන ලද තෙදිනක වැඩ සටහනක් සඳහා මැලේසියානු-ශ්‍රී ලංකා ව්‍යාපාර මණ්ඩලයේ සභාපති, ඉක්රාම් කුට්ටිලන් මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් 09 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත පිරිසක් මැලේසියාවට ගියහ. මෙම නියෝජිත පිරිස, මැලේසියනු ආයෝජන සංවර්ධන අධිකාරිය, මැලේසියානු බාහිර වෙළඳ සංවර්ධන සංස්ථාව සහ මැලේසියානු-ශ්‍රී ලංකා ව්‍යාපාර මණ්ඩලය සමඟ සාකච්ඡා පවත්වන ලද අතර, මැලේසියාවේ එක්සත් චීන වාණිජ සහ කර්මාන්ත මණ්ඩලය, මැලේසියානු නිෂ්පාදකයින්ගේ සම්මේලනය, මැලේසියානු එක්සත් ඉන්දියානු වාණිජ සහ කර්මාන්ත මණ්ඩලය සහ ක්වාලාලම්පූර් සහ සෙලන්ගෝ ඉන්දියානු වාණිජ හා කර්මාන්ත මණ්ඩලය ඇතුළු වාණිජ මණ්ඩල හමුවන ලද අතර, කර්මාන්ත රැස්වීම් සහ පද්ධති ඉසව්වලට ද සහභාගී වූහ.

IX. ඇකඩමි හීවා- මැලේසියානු රබර් මණ්ඩලය

i. ශ්‍රී ලංකාවේ රබර් කිරි නිෂ්පාදන අංශය සඳහා තාක්ෂණික පුහුණු සහ නිරාවරණ වැඩ සටහන්

- අපනයන සංවර්ධන මණ්ඩල යෝජනාව යටතේ ශ්‍රී ලංකාවේ රබර් කිරි නිෂ්පාදන අංශය සඳහා තාක්ෂණික පුහුණු සහ නිරාවරණ වැඩ සටහන් සංවිධානය කරන ලදී.

- ශ්‍රී ලංකාවේ රබර් කිරි නිෂ්පාදනකරුවන් 12 ක් සහභාගී වූහ.

X. නිපැයුම් ප්‍රවර්ධනය

2018 මැයි මාසයේදී, මහ කොමසාරිස් කාර්යාලයේදී, ලංකා නැවුම් පොල්තෙල් නිෂ්පාදන එළි දැක්විණ.

XI. ශ්‍රී ලංකා අපනයන, මැලේසියාවේ ප්‍රවර්ධනය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සහභාගිත්වය ඇතිව, මැලේසියානු ජාත්‍යන්තර අභාරපාන-2018 පද්ධති ප්‍රකාරව, ශ්‍රී ලංකා තානාපති කාර්යාලීය පරිශ්‍රයෙහි ප්‍රවර්ධන අංගයක් සංවිධානය කෙරිණ - ජූනි 2018

XII. සමීපස්ථ ආගමික සහයෝගිතාව වර්ධනය

දූත මණ්ඩල කාර්යාලය, 2018 නොවැම්බර් මාසයේ දී, 2018-ජාත්‍යන්තර සංස්කෘතික උළෙලට සහභාගී විය.

XIII. බ්‍රිජ් ඇකඩමි ඔෆ් ෆයින් ආර්ට්ස් ආයතනයේ 100 කට අධික ශිෂ්‍යය පිරිසක් සමඟ, ශ්‍රී ලංකා ශිෂ්‍යයින් 23 දෙනෙකු මෙම උත්සවයේ දී රැඟුම් ඉදිරිපත් කරන ලදී.

2. ශ්‍රමික සුබසාධනය

I. සේවක/සේව්‍ය පැමිණිලි සම්බන්ධයෙන් පියවර

සේවක/සේව්‍ය පාර්ශ්වයන් සහ බඳවා ගැනීම් නියෝජිතයන් විසින් ඉදිරිපත් කෙරෙන පැමිණිලි සම්බන්ධයෙන් මහ කොමසාරිස් කාර්යාලය විසින් ක්‍රමිකව කටයුතු කරන ලදී.

II. සේවා නියුක්ති ගිවිසුම් උල්ලංඝණය, වැටුප් නොගෙවීම, හිරිහැර කිරීම, සන්නිවේදන පහසුකම් නොමැතිකම සහ පැන යාම් පැමිණිලි 60කට විසඳුම් ලබා දෙන ලදී.

III. නීති විරෝධී සංක්‍රමණිකයින්ගේ සංඛ්‍යාව අවම කිරීම සහ ශ්‍රමිකයින් සියරට එවීම

බන්ධනාගාර සහ කඳවුරු වෙත යාම - රඳවා ගෙන ඇති ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ගේ තොරතුරු ලබා ගැනීම පිණිස ක්‍රමිකව බන්ධනාගාර සහ රැඳවුම් කඳවුරු වෙත යාම.

IV. රැඳවියන් පිටුවහල් කිරීමේ ක්‍රියාදාමය විධිමත් සහ කඩිනම් කිරීම සහ අතරමංව සිටින ශ්‍රී ලාංකිකයින්ගේ තොරතුරු ලබා ගැනීමට සහාය.

3. සංචාරන ප්‍රවර්ධනය

I. මහ කොමසාරිස් කාර්යාලය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය හා එක්ව, මැලේසියානු සංචාරක ආයතනයේ සහාය ද ඇතිව, ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීමට කැමති මැලේසියාවේ චාරිකා නියෝජිතයින් 11 දෙනෙකු සහ මැලේසියානු සංචාරක ආයතනයේ නිලධාරීන් 2නෙකු සඳහා හුරුවීමේ සහ දැනුවත්වීමේ චාරිකාවක් සංවිධානය කරන ලදී.

II. මැලේසියානු සංචාර සහ චාරිකා නියෝජිතයින්ගේ සංගමයේ සහ ටුවරිසම් මැලේසියා ආයතනයේ නිලධාරීන් සමඟ සමීපස්ථ අන්තර් ක්‍රියා.

- රැස්වීම්, දිරි ගැන්වීම්, සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශන සහිත සංචාරක කටයුතු ප්‍රවර්ධනය උදෙසා ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය වෙනුවෙන් රැස්වීම් සංවිධානය- මාර්තු 2018
- ශ්‍රී ලංකා කරදිය ආහාර උත්සවය සංවර්ධනය කිරීම පිණිස බෙර්පෙයා ටයිම් ස්කවයා හෝටලයට සහාය වීම.

III. ශ්‍රී ලංකාවේ චාරිකා නියෝජිතයින් 16 ක් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශ මණ්ඩපය යටතේ සහභාගී වූහ.

මැලේසියානු සංචාර හා චාරිකා නියෝජිතයින්ගේ සම්මේලන උත්සවය-2018 අනුව, ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය හා එක්ව, 'ශ්‍රී ලංකා- වොන්ඩර් ඔෆ් ඒසියා විචිත්‍රවත් සැණකෙළිය' සංවිධානය කරන ලදී.

IV. මැලේසියානු සංචාරක නියෝජිතයින් හමුවීම සඳහා වෙනම ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට පදනමින් සැසියක්, සංචාරක සංසදය, සහ පුවත්පත් සාකච්ඡාවක් 'ශ්‍රී ලංකා-වොන්ඩර් ඔෆ් ඒසියා විචිත්‍රවත් සැණකෙළිය' පරිශ්‍රයේ දී සංවිධානය කරන ලදී.

4. රාජ්‍යාරක්ෂාව

අ. පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය සහ සහාය

ශ්‍රී ලංකාවේ සහ මැලේසියාවේ පැවැත්වෙන පුහුණු වැඩසටහන් සඳහා මහ කොමසාරිස් කාර්යාලය සහාය වෙයි.

ආරක්ෂක කාර්ය මණ්ඩල ප්‍රධානීගේ ප්‍රධානත්වයෙන් සාමාජිකයින් 8 දෙනෙකුගෙන් යුත් නියෝජිත පිරිසක් 2018 අප්‍රේල් මස ක්වාලාලම්පූර්වල, මැලේසියානු ජාත්‍යන්තර වෙළඳ සහ ප්‍රදර්ශන මධ්‍යස්ථානයේ පැවති 'ආරක්ෂක සේවා-ආසියා-2018' ට සහභාගී වූහ.

<u>ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය -සිංගප්පූරුව</u>

4.2. ඉහළ මට්ටමේ දේශපාලන චාරිකා ඇතුළුව, දේශපාලන, ආර්ථික, වෙළඳ සහ සංස්කෘතික හුවමාරු

1. 2018 ජනවාරි මාසයේ දී, සිංගප්පූරු අග්‍රාමාත්‍යවරයාගේ ශ්‍රී ලංකා නිල චාරිකාවට දූත මණ්ඩල කාර්යාලයේ පහසුකම් සැපයීම සිදුවිය. සිංගප්පූරුව සහ ශ්‍රී ලංකාව අතර සබඳතා සවිමත් කිරීම මෙන්ම ආර්ථික සහයෝගිතාවය සහ ධාරිතා වර්ධනයෙහි සහයෝගය වර්ධනය කරලීමේ මාර්ග සාකච්ඡා කිරීමට ද දෙපාර්ශ්වයටම මෙමගින් අවකාශ ලැබිණි. භාණ්ඩ සහ සේවා වෙළඳාම, ආයෝජන සහ රාජ්‍ය ප්‍රසම්පාදනයන් අන්තර්ගත විස්තරාත්මක ද්විපාර්ශ්වීය ගිවිසුමක් වන, ශ්‍රී ලංකා-සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම ද අත්සන් තබන ලද්දේ ද මෙම චාරිකාවේදී ය. ශ්‍රී ලංකාවට සපැමිණි අග්‍රාමාත්‍යවරයා අතිගරු ශ්‍රී ලංකා ජනාධිපතිතුමන් සහ ගරු අග්‍රාමාත්‍යතුමන් සමඟ ද ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වීය.

I. සිංගප්පූරු අග්‍රාමාත්‍යවරයාගේ ආරාධනය මත, ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා සිංගප්පූරු ජාත්‍යන්තර ජල සතිය-ජලය සුරැකීමේ උපාය මාර්ග-2018 ට සහභාගී වූ අතර, සංසදයේ ප්‍රධාන දේශනය ද පවත්වන ලදී. සංචාරය තුළ දී, ගරු අග්‍රාමාත්‍යතුමා, සිංගප්පූරුවේ අග්‍රාමාත්‍යවරයා, නියෝජ්‍ය අග්‍රාමාත්‍යවරයා සහ වෙළඳ සබඳතා අමාත්‍යවරයා හමුවුන අතර, ද්විපාර්ශ්වීය වෙළඳ කටයුතු, ආයෝජනය සහ අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනවත් වෙනත් ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වන ලදී.

II. 2018 ජූලි මස පවත්වන ලද සිංගප්පූරු ජාත්‍යන්තර ජල සතිය-ජලය සුරැකීමේ උපාය මාර්ග-2018 ට සමගාමීව පැවැත්වෙන ලෝක නගරාධිපති සමුළුවේ දී, කොළඹ සහ මහනුවර නගරාධිපතිවරුන්ගේ සහ ගාල්ලේ නියෝජ්‍ය නගරාධිපතිගේ සහභාගිත්වය සම්බන්ධයෙන්, සිංගප්පූරු ජාත්‍යන්තර ජල සතිය- ජලය සුරැකීමේ උපාය මාර්ග-2018 සංවිධායකයින් හා සමඟ සම්බන්ධීකරණය කෙරිණ.

III. 2018 අගෝස්තු මස 23-24 දින තුළ දී, විදේශ කටයුතු අමාත්‍ය, ගරු තිලක් මාරපන මහතා සිංගප්පූරුවේ නියැලුණ ආරම්භක චාරිකාව දූත මණ්ඩල කාර්යාලය විසින් සම්බන්ධීකරණය විය. සංචාරයේ දී, ගරු අමාත්‍යතුමා ස්වකීය සිංගප්පූරු ප්‍රතිපූරකයා වන ආචාර්ය විවියන් බාලක්‍රිෂ්ණන් හමුවී, ද්විපාර්ශ්වීය සාකච්ඡා පැවැත්වීය. ගරු අමාත්‍යතුමා වාර්තා කළමණාකරණය විධිමත් කිරීම, වාර්තා ඩිජිටල්කරණය කිරීම සහ ශ්‍රී ලංකා ජාතික ලේඛණාගාරයෙහි කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සඳහා තාක්ෂණික සහාය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් සිංගප්පූරුවේ, තාක්ෂණික අධ්‍යාපන ආයතනයට, ජාතික පුස්තකාල මණ්ඩලයට සහ ජාතික ලේඛණාගාරයටද ගිය අතර, සිංගප්පූරුවේ, තාක්ෂණික අධ්‍යාපන සේවාවේ සහාය ඇතිව ශ්‍රී ලංකාවේ තාක්ෂණික සහ වෘත්තීමය අධ්‍යාපනයේ සහ පුහුණු කිරීමේ ධාරිතා වර්ධනය සඳහා සම්භාව්‍ය සහයෝගය සම්බන්ධයෙන් එහි ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සමඟ සවිස්තරාත්මක ලෙස සාකච්ඡා පවත්වන ලදී.

IV. 2018 අගොස්තු මාසයේ දී පැවති අමාත්‍යසීය රැස්වීමට සහභාගී වූ ශ්‍රී ලාංකීය නියෝජිතයින්ට නායකත්වය දුන් ගරු විදේශ කටයුතු අමාත්‍යතුමාගේ සංචාරය සම්බන්ධීකරණය කරන ලද්දේ දූත මණ්ඩල කාර්යාලය විසිනි.

V. 2018 අගෝස්තු මස 25-28 දින සිංගප්පූරුවට පැමිණි අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය,ගරු තලතා අතුකෝරළ මහත්මියගේ සංචාරයේ සඳහා පහසුකම් සැලසන ලද්දේ දූත මණ්ඩල කර්යාලයයි. එතුමිය තම සංචාරයේ දී, නීතිය පිළිබඳ අමාත්‍යාංශයේ, ජ්‍යෙෂ්ඨ රාජ්‍ය අමාත්‍ය, ගරු එඩ්වින් ටොන්ගි මහතා ද, ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ පාර්ලිමේන්තු ලේකම් ගරු අමිරින් අමීර් මහතා ද, සිංගප්පූරු ජාත්‍යන්තර විනිශ්චය මධ්‍යස්ථානයේ ප්‍රධාන විධායක නිලධාරිතැන ද සමඟ සාකච්ඡා පැවැත් වූවාය.

VI. බන්ධනාගාර කළමණාකරණයෙහි/ප්‍රතිසංස්කරණයෙහි යහ පුරුදු සම්බන්ධයෙන් දැනුම්වත් වීම පිණිස ගරු අධිකරණ අමාත්‍යවරියගේ ප්‍රධානත්වයෙන් යුත් නියෝජිත පිරිසක් චන්ගි බන්ධනාගාර සංකීර්ණයට ද ගියාහ.

4.3. ජනනය වූ වාර්තා සහ තක්සේරුකිරීම් සංඛ්‍යාව හා ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය ප්‍රතිඵල සම්බන්ධයෙන් පසු විපරම

II. 2018 වර්ෂයේ දී, ශ්‍රී ලාංකික නිලධාරීන් සඳහා කෙටි හා මධ්‍ය කාලීන පුහුණුවීම් අවස්ථා 80කට වැඩි සංඛ්‍යාවක්, විදේශ කටයුතු අමාත්‍යාංශයේ, තාක්ෂණික සහයෝගිතා

අධ්‍යක්ෂක මණ්ඩල හා සම්බන්ධීකරණයෙන්, ලබාගැනීමට දූත මණ්ඩල කාර්යාලයට හැකිවිය.

III. සිංගප්පූරු ජාතික විශ්ව විද්‍යාලයෙහි, රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ලික්වාන් යූ අධ්‍යාපන අංශ සම්මාන සාමාජිකත්ව පාඨමාලා හැදෑරීම පිණිස දීර්ඝකාලීන පශ්චාත් උපාධි අධ්‍යාපන අවස්ථා කිහිපයක් ද ශ්‍රී ලාංකික රාජ්‍ය නිලධාරීන්ට පිරි නමන ලදී.

4.4. විදේශීය රටවල සහ ජාත්‍යන්තර සංවිධානවලදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සඳහා සහභාගී වූ ඉසව් / සංසද සංඛ්‍යාව

I. 2018 ජනවාරි මස 22-24 දින, සිගප්පූරුවේ, 6 වන උපාය මාර්ගික අධ්‍යයන සඳහා වූ ජාත්‍යන්තර ආයතන - ෆුලර්ටන් සංසද-ෂන්ග්‍රි ලා සංවාද ෂර්පා රැස්වීමේ ශ්‍රී ලංකා සහභාගිත්වය සපුරා ගැනීම පිණිස දූත මණ්ඩල කාර්යාලය, අදාළ සංවිධාකයින් හා සමඟ සම්බන්ධීකරණයෙහි යෙදුණේය.

II. 2018 ජූනි මස සිංගප්පූරුවේ පැවැති උපාය මාර්ගික අධ්‍යයන සඳහා වූ ජාත්‍යන්තර ආයතන- ආසියා සුරක්ෂිතතා සමුළුව: ෂන්ග්‍රි ලා සංවාද -2018 හි ශ්‍රී ලංකා සහභාගිත්වය සපුරා ගැනීම පිණිස ෂැන්ග්‍රි ලා සංවාද සංවිධාකයින් වන උපායමාර්ගික අධ්‍යයන පිළිබඳ ජාත්‍යන්තර ආයතනය හා සමඟ සම්බන්ධීකරණය කිරීමට දූත මණ්ඩල කාර්යාලය ක්‍රියා කළේය.

III. 2018 අගෝස්තු මාසයේ දී පවත්වන ලද, අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමයේ කලාපීය සංසදයේ ජ්‍යෙෂ්ඨ නිලධාරී රැස්වීමේ ශ්‍රී ලාංකා නියෝජන පිරිසේ සහභාගිත්වය පහසුකරණය කරන ලද්දේ දූත මණ්ඩල කාර්යාලය විසිනි.

IV. 2018 අගෝස්තු මාසයේ දී අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමයේ කලාපීය සංසදයේ අමාත්‍යයීය රැස්වීමේ දී ගරු විදේශ කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් ශ්‍රී ලංකා නියෝජිත පිරිසේ සහභාගිත්වය සම්බන්ධයෙන්, සිංගප්පූරුවේ, විදේශ කටයුත අමාත්‍යාංශයේ, අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගම් අධ්‍යක්ෂක මණ්ඩයල සමඟ සම්බන්ධීකරණය කරන ලද්දේ දූත මණ්ඩල කාර්යාලය විසිනි.

5.4. වෙළඳ, විදේශීය ආයෝජන සහ සංචාරණ කාර්ය සාධනය- 2018

ප්‍රවර්ධනය කරන ලද විදේශීය ආයෝජන සංඛ්‍යාව : 18

සාධනය කර ගන්නා ලද සංචාරණ, වෙළඳ සහ වාණිජ ක්‍රියාකාරකම් සංඛ්‍යාව : 13

- 2018 ජනවාරි මස 20-23 දිනවල, සිංගප්පූරු අග්‍රාමාත්‍යතුමාගේ ශ්‍රී ලංකා නිල සංචාරයේ දී දූත මණ්ඩල කාර්යාලය විසින්, 'එන්ටප්‍රයිස් සිංගප්පූර් හා එක්ව, ඉහළ මට්ටමේ ව්‍යාපාරික නියෝජිත පිරිසක් ශ්‍රී ලංකාවට එවීමට කටයුතු කරන ලදී.

පහත දැක්වෙන අවබෝධතා ගිවිසුම් 04 ට අත්සන් තැබිණ.

I. කොළඹ නගර මධ්‍යස්ථානය විසින් සුබෝපභෝගී සාප්පු සංකීර්ණයහි බොජුන් හලක් ස්ථාපිත කිරීම හා පවත්වා ගෙනයාම

II. ගාලු මුවදොර (ෂැන්ග්‍රි ලා සාප්පු සංකීර්ණය) බොජුන් හලක් ස්ථාපිත කිරීම හා පවත්වා ගෙනයාම

III. වාණිජ තිරසාරත්වය සඳහා අපනයන/බෙදාහැරීම් ඒකකයක් ද සහිතව, ශ්‍රී ලංකාවේ කුකුළන් බෝ කිරීමේ/දැඩි කිරීමේ වාණිජමය හවුල් ව්‍යාපාරයක් ස්ථාපිත කිරීම පිණිස, බිපීඅයි සහ ආර්ක් හෝල්ඩින්ග්ස් සමාගම් අවබෝධතා ගිවිසුමකට එළඹෙන ලදී.

IV. යටත් විජිතවාදී සමයට අයිති දේපළ ප්‍රතිසංස්කරණය කර, මෙහෙයුම් කටයුතු කර ගෙනයාම සඳහා එච්පිඑල් හොටේල්ස් සහ රිසෝර්ට්ස් සමාගම ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හොටේල් සමාගම සමඟ මනාපය දැක්වීමේ ලිපියකට අත්සන් තබනු ඇත.

- දූත මණ්ඩල කාර්යාලය විසින්, සිංගප්පූරු චීන වාණිජ සහ කර්මාන්ත මණ්ඩලය හා එක්ව, එම මණ්ඩලය මඟින් සාමාජිකයින් 25 දෙනෙකුගෙන් සමන්විත වෙළඳ සහ ආයෝජන නියෝජිත පිරිසකට 2018 මැයි 06-11 දක්වා ශ්‍රී ලංකා සංචාරයක් සංවිධානය කරන ලදී.

- ලංකා වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකා-සිංගප්පූරු ව්‍යාපාර කවුන්සිලය, ආයෝජන මණ්ඩලය එක්ව, ශ්‍රී ලංකා සමාගම් සමඟ ව්‍යාපාරික අන්තර්ක්‍රියා සැසි සඳහා පහසුකම් සලසන ලදී. තවද, මෙම නියෝජිත පිරිස, ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සහ ආයෝජන අවස්ථා ගැන දැනුවත් වීම සඳහා ගරු සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා, ගරු කර්මාන්ත සහ වාණිජ අමාත්‍යතුමා, කොළඹ ප්‍රධානතම සමාගම් සමූහ සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හමු වූහ.

- ශ්‍රී ලංකාවේ වාණිජමය මැදිහත්වීම් ගැන විමසා බැලීම පිණිස සිංගප්පූරු නීති සංසදයේ වාණිජ නීතිඥයින් පිරිසක් 2018 සැප්තැම්බර් මස 10-14 තුළ ශ්‍රී ලංකාවට පැමිණීම.

- ශ්‍රී ලාංකික වාණිජ නීතිඥයින් සහ සමාගම් සමඟ අන්තර් ක්‍රියාදාම ස්ථාපිත කර ගැනීම පිණිස සිංගප්පූරු නීති සංගමයේ, සාමාජිකයින් 22 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත පිරිසක් සැප්තැම්බර් මස 10-14 දින තුළ ශ්‍රී ලංකාවට පැමිණියහ. මෙම නියෝජිත පිරිස, ශ්‍රී ලංකා නීතිඥ සංගමය, ආයෝජන මණ්ඩලය, රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර සඳහා වූ ජාතික නියෝජිතායතනය සහ ප්‍රධානතම සමාගම් කිහිපයක් සමඟ සාකච්ඡා පැවැත් වූහ. පද්ධතිකරණ සැසියක් සඳහා සත්කාරය ලංකා වාණිජ මණ්ඩලයෙනි.

- **දූත මණ්ඩල කාර්යාලය, සිංගප්පූරු ශ්‍රී ලංකා ව්‍යාපාර සංගමය හා කොළඹ කොටස් වෙළඳපොළ සමඟ එක්ව, 2018 මාර්තු මස 1 වන දින, ෆෝ සීසන්ස් හෝටලයේදී, 'ඉන්වෙස්ට් ඉන් ශ්‍රී ලංකා' සංසදය සංවිධානය කරන ලදී.**

සිංගප්පූරුවේ, 350 කට අධික සමාගම්, ආයෝජකයෝ සහ අරමුදල් කළමණාකරුවෝ සහභාගී වූ මෙම රැස්වීමේ ප්‍රධාන අමුත්තා වූයේ අග්‍රමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතාය. සිංගප්පූරුවේ, වෙළඳ සහ කර්මාන්ත අමාත්‍ය, එස්.ඊස්වරන් ආරාධිත අමුත්තා විය.

- **2018 ජූලි මස 19-20, ශ්‍රී ලංකාවේ විදුලි සහ ඉලෙක්ට්‍රොනික අංශ නියෝජිත පිරිස විසින් සිදුකළ ව්‍යාපාර ගළපා ගැනීමේ සහ අනාවරණය වීමේ චාරිකාව.**

සමාගම් 06 ක සාමාජිකයෝ 10 ක් සහභාගී වූහ. සංවිධානය කරන ලද වැඩසටහන් මෙසේය: කේන්ද්‍රගත විශේෂිත සිංගප්පූරු සමාගම් 15ක් සහිතව එන්ටප්‍රයිස් සිංගප්පූර් අන්තර් ක්‍රියාදාමය; ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට පදනමින් සැසිය සඳහා 35කට අධික සමාගම් සහිතව සිංගප්පූරු නිෂ්පාදන සම්මේලනය; 14 කට අධික ඉදිකිරීම් හා ආශ්‍රිත වෙළඳ සමාගම් සහිතව සිංගප්පූරු ව්‍යාපාර සම්මේලනය.

නියෝජපිතයින්ට, සිංගප්පූරු රෝල්ස්රොයිස් සහ විල්සන් කේබල්ස් කර්මාන්ත ශාලා නැරඹීමට අවස්ථාව සලසා දෙන ලදී.

2018 ජූනි මස 14-17 දක්වා, සිංගප්පූරුවේ, චිලැක්ස් ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගී වීම

ශ්‍රී ලංකා නිෂ්පාදනවල අද්විතීයත්වය ප්‍රවර්ධනය කිරීම පිණිස, ශ්‍රී ලංකා තේ, කුරුඳු, සහ රසකැවිලි, ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටියෙහි ප්‍රදර්ශනය කෙරිණ.

2018 අප්‍රේල් මස 24-27 දක්වා, ෆුඩ් ඇන්ඩ් හොටෙල් ඒෂියා ප්‍රදර්ශනයේදී, ශ්‍රී ලංකා තේ සහ කුරුඳු ප්‍රවර්ධන වැඩ සටහන සිංගප්පරුවේ,ස්ථාන දෙකක පවත්වන ලද ෆුඩ් ඇන්ඩ් හොටෙල් ඒෂියා ප්‍රදර්ශනයේදී ශ්‍රී ලංකා මණ්ඩප දෙකක් සංවිධානය කෙරිණ. තේ මණ්ඩල මණ්ඩපයේ කුටි 3 ක් සහ තේ ප්‍රදර්ශන ඒකකයක් පිහිටුවා තිබුණි.

2018 සිංගප්පූරු ජාත්‍යන්තර ස්වර්ණාභරණ එක්ස්පෝ ප්‍රදර්ශණයේ ශ්‍රී ලංකා සහභාගිත්වය

2018 සිංගප්පූරු ජාත්‍යන්තර ස්වර්ණාභරණ එක්ස්පෝ ප්‍රදර්ශනයේ ශ්‍රී ලංකා සහභාගිත්වය සංවිධානය කරන ලද්දේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසිනි.

සංචාර හා චාරිකා අංශ වෙළඳ ප්‍රදර්ශනවල සහභාගිත්වය

ජාතික සිංගප්පූරු චාරිකා නියෝජිත සංගම චාරිකා ප්‍රදර්ශනය; සිංගප්පූරුවේ, එක්ස්පෝ සම්මුති ශාලාවෙහි මාර්තු 23-25 දක්වා පවත්වන ලද ජාතික සිංගප්පූරු චාරිකා නියෝජිත සංගම් චාරිකා ප්‍රදර්ශනය සංවිධානය කරන ලද්දේ, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය හා එක්ව, මෙම දූත මණ්ඩල කාර්යාලය විසිනි.

2018 ඔක්තෝබර්මස 16 වනදින, ෂැන්ග්‍රි ලා හෝටලයේ දී පවත්වන ලද රැස්වීම්, දිරිගැන්වීම්, සම්මුති සහ ප්‍රදර්ශන- 2018 - " මීට් ඉන් ශ්‍රී ලංකා" වැඩසටහන

ශ්‍රී ලංකාව රැස්වීම්, දිරිගැන්වීම්, සම්මුති සහ ප්‍රදර්ශන ගමනාන්තයක් ලෙස දැනුවත්කිරීම පිණිස සංචාර, චාරිකා සහ ආයතනික අංශ සඳහා සංසදයක් සංවිධානය කිරීම ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය විසින් මෙම දූත මණ්ඩල කාර්යාලයට පවරන ලදී.

දූත මණ්ඩල කාර්යාලය විසින් ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය හා එක්ව, වීඩියෝ දර්ශන, විශ්වාසනීය ආහාරපාන, ශ්‍රී ලංකා තේ, කකුළුවන්, අමුත්තන්ගේ දේශන ආදිය සහිතව ඉසව්ව සංවිධානය කරන ලදී. ස්වකීය නිෂ්පාදන අලෙවි කිරීමට හැකිවන පරිදි, ශ්‍රී ලංකාවෙන් සහභාගී වන සමාගම් 13 වෙනුවෙන්, ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට පදනමින් සැසියක් සංවිධානය කරන ලදී.

2018 නොවැම්බර් 8-30 දක්වා, මැණික් හා ස්වර්ණාභරණ සඳහා ජේඩීඑම්අයිඑස් විසින් ශ්‍රී ලංකාවේ ගවේෂණාත්මක චාරිකාවක්.

විවිධ ප්‍රභේදයන්හි වෙළඳපොළ අවශ්‍යතා සපුරලීම පිණිස මැණික් සැකසීම සඳහා ශිෂ්‍යයින් හුවමාරු කර ගැනීමේ හැකියාව විමසා බැලීම පිණිස නියෝජිත පිරිස සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහනක් පැවැත්වීමට මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමග සම්බන්ධීකරණයෙහි නියැලිණ.

තොරතුරු විමසීමේ හා ඒකරාශී කිරීමේ චාරිකා: 08

අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගම් සම්මන්ත්‍රණය සහ පද්ධති සැකසුම් ඉසව්: එක තීරුවක්-එක මාර්ගයක් ප්‍රත්‍යුත්ක්‍රමය; ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය; 2018 මාර්තු මස 20 වන ඉන්දුනීසියාවේ බටාස් දූපත්, නොන්ග්සා ඩිජිටල් උද්‍යානය නිලවශයෙන් විවෘත කිරීම; 2018 මාර්තු මස 22 වන දින, මරිනා බේසෑන්ඩ්ස්හි, කැෆේඒෂියා - 2018; මාර්තු 14-16 දක්වා, ආසියා ශාන්තිකර සමුද්‍රීය ප්‍රදර්ශණය; සිංගප්පූරු ඉන්දියන් වාණිජ සහ කර්මාන්ත මණ්ඩලය; සිංගප්පූරුවේ සංවර්ධන බැකුව; 2018 මාර්තු 31 දින, සිංගප්පූරු-ඉන්දියන් ව්‍යවසායක තිලිණ ප්‍රදාන - 2018.

නොවැම්බර් මස 16 වන දින සිංගප්පූරුවේදී ,ආසියා ශාන්තිකර ආහාර ප්‍රදර්ශනය

ද්‍රව ස්වාභාවික වායු සමාගම් සමුවීම පිණිස 2018 නොවැ. 27 දින මරිනා බේ සෑන්ඩ්ස් හි, තෙල් සහ වායු කර්මාන්ත ඉසව්වට සහභගී විය.

2018 නොවැම්බර් මස 08 වන දින, රාසා සැන්ටෝසා නිවාඩු නිකේතනයේ දී 2018 CNF සඳහා සහභාගිත්වය

සම්බන්ධීකරණය කරන ලද කේවල සමාගම් චාරිකා සංඛ්‍යාව :26

කේවල ව්‍යාපාර චාරිකා 23ක් සමබන්ධීකරණය කෙරිණ. සිංගප්පූරු ආර්ථික සංවර්ධන මණ්ඩලය, වෙළඳ සහ කර්මාන්ත අමාත්‍යාංශය සම්බන්ධ කර ගැනීමට සහ අදාල සමාගම් සමග රැස්වීම් සඳහා සහාය වන ලදී.

සම්පාදනය කරන ලද වාර්තා : 02

- ක්විනෝආ නව අපනයන භෝගයක් ලෙස
- වෙළඳ/ආයෝජන සහ සංචාරණය මත ප්‍රවණතා විග්‍රහය
- ශ්‍රී ලංකාව සහ සිංගප්පූරුව අතර ද්විපාර්ශ්වීය වෙළඳ සහ ආර්ථික සබඳතා
- 2018 ඉන්-ඩිප්ලොමැසි සඟරාව සඳහා ප්‍රධානතම ශ්‍රී ලාංකික නිෂ්පාදන ගැන වාර්තාව

වෙළඳ විමසුම් සහ වෙළඳ පැමිණිලි : 46

5. විදේශ සේවා නියුක්ත අවස්ථා පහසුකරණයට සහ ප්‍රවර්ධනය සඳහා සංවිධානය කරන ලද ක්‍රියාකාරකම් සංඛ්‍යාව

-2018 වර්ෂයේදී, සුබසාධන පියවර සඳහා විදේශ සේවා නියුක්ත කාර්යාංශය යටතේ ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයින් 1585 ක් ලියාපදිංචි කිරීමට දූත මණ්ඩල කාර්යාලයට හැකිවිය.

-2018 වර්ෂයේදී, ශ්‍රී ලාංකිකයින් 2500 කට පමණ රැකියා අවස්ථා උදා කර දීමට දූත මණ්ඩලය විසින් සිංගප්පූරුවේ රැකියා නියෝජිතායතන හා සම්බන්ධීකරණයෙහි යෙදෙන ලද අතර, නිෂ්පාදන (ඉදිකිරීම් ශ්‍රමික/පිරිමි) ක්ෂේත්‍රයේ සහ ගෘහ සේවක/උදව්කරු ශ්‍රේණිවල ඇති පුරප්පාඩු සඳහා කැඳවීමට හැකි වන පරිදි, එම අවස්ථා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා ශ්‍රී ලංකාවේ රැකියා නියෝජිතායතන සමඟ බෙදාහදා ගන්නා ලදී.

-2018 වසරේදී, සිංගප්පූරුවේ සිටින ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයින්ගේ ආරවුල්/ පැමිණිලි 130 ක් සම්බන්ධයෙන් දූත මණ්ඩලය විසින් අවශ්‍ය කටයුතු කරන ලදී.

-2018 වසරේදී, සිංගප්පූරුවේ සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් වෙත ශ්‍රමික සුබසාධන සහ කොන්සියුලර් සේවා ලඟාකර දීම පිණිස දූත මණ්ඩලය විසන් ජංගම සේවා 05 ක් සංවිධානය කරන ලදී.

-දූත මණ්ඩල විසින් වසර පුරා සියළුම ලියාපදිංචි රැකියා නියෝජිතායතන සමඟ ත්‍රෛමාසික රැස්වීම් පවත්වනු ලැබේ. එසේම, ලියාපදිංචි රැකියා නියෝජිතායතනවල සේවා සැපයුම වැඩිදියුණු කිරීම පිණිස ශ්‍රමික අංශයෙහි කාර්යමණ්ඩලය විසින් එකී නියෝජිතායතන වෙත යාමේ සහ නව යාන්ත්‍රණයක්ද, සංක්‍රමණික ශ්‍රමිකයන් සඳහා සේවා කොන්දේසි සම්බන්ධයෙන් විශේෂ දැනුම්වත් කිරීම් වැඩ සටහන් එකී රැකියා නියෝජිතායතන හරහා පැවැත්වීමේ නව යාන්ත්‍රණයක්ද, සකස් කර ඇත. මේ වර්ෂයේ,මෙතෙක් දූත මණ්ඩලය විසින් එවැනි නියෝජිතායතන/සමාගම් වෙත කරන ලද විමසුම් චාරිකා සංඛ්‍යාව 120 කට අධිකය.

තායිලන්තයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය

1. ද්විපාර්ශ්වික සබඳතා:

තායිලන්තයේ සිට සංචාර:

I. 2018 ජූලි මස තායිලන්ත අගමැතිතුමාගේ ශ්‍රී ලංකා නිල සංචාරය. පහත සඳහන් ගිවිසුම සහ අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී: වරදකරුවන් යැවීම සහ අපරාධ දඬුවම් පැනවීමේදී සහයෝගය සම්බන්ධ ගිවිසුම, උපාය මාර්ගික ආර්ථික හවුල්කාරිත්වය සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුම, ප්‍රාථමික නිෂ්පාදිතවල වටිනාකම එකතු කිරීම සම්බන්ධව තාක්ෂණික සහයෝගිතාවය පිළිබඳ අවබෝධතා ගිවිසුම, සාධනීය ආර්ථික දර්ශනය යොදාගැනීම මත පදනම්වූ තිරසාර ප්‍රජා සංවර්ධන ආකෘතියක් මත සහයෝගිතාව සඳහා ඒකාබද්ධ ක්‍රියාකාරී වැඩසටහන. තායි-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමේ සාකච්ඡා ආරම්භ විය.

II. 2018 පෙබරවාරි මස පැවැත්වූ ශ්‍රී ලංකා-තායිලන්ත දේශපාලන උපදේශනයේ 4 වන වටය සඳහා තායිලන්තයේ විදේශ කටයුතු පිළිබඳ ස්ථිර ලේකම් විසින් නියෝජිත කණ්ඩායමක් මෙහෙයවන ලදී.

III. තායිලන්තයේ සංස්කෘතික අමාත්‍යවරයා 2018 දෙසැම්බර් මස 31 දින සියම් නිකායේ භික්ෂූන් වහන්සේලාගේ ධූරාවලියට පිරිත් දේශනාව සඳහා තායිලන්තයට ආරාධනා කිරීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණියේය.

IV. (4) රාජකීය කඨින උත්සවය පැවැත්වීමට තායි විදේශ ඇමති ඩෝන් ප්‍රමුදිවිනෙයි මහතා ශ්‍රී ලංකාවට පැමිණියේය. (2018 නොවැම්බර්)

තායිලන්තයට සංචාර:

I. ගරු අග්‍රාමාත්‍යවරයා බැංකොක් හරහා කොළඹට ගමන් කළේය. අග්‍රාමාත්‍ය කාර්යාලයට අනුයුක්ත තායි ඇමති කොඩිසැක් ප්‍රොටොකෝල් අතර රැස්වීමක් සංවිධානය කර තිබුණි. ගරු සංවර්ධන ක්‍රමෝපායන් සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමන් ද සම්බන්ධ විය.

II. නෛතික පද්ධතියේ ක්‍රියාකාරිත්වය සහ වැරදිකරුවන්ට සැලකීම සහතික කිරීම සඳහා අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරිය විසින් අධ්‍යාපන චාරිකාව. ඇය තායිලන්තයේ නියෝජ්‍ය අග්‍රාමාත්‍ය හා විනිසුරුවරයා හමුවූවාය.

III. ගරු ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා එම අමාත්‍යාංශයෙන් සංවිධානය කර තිබූ සහ තානාපති කාර්යාලයෙන් පහසුකම් සපයා තිබූ තායි ෆොක්ස්සස් වෙත ගොස් එම ප්‍රදර්ශන කුටිය නැරඹීය.

IV. අගමැති කාර්යාලයේ කාර්ය මණ්ඩල ප්‍රධානී සහ ව්‍යාපෘති කළමනාකරණය, යෞවන කටයුතු හා දක්ෂිණ සංවර්ධන අමාත්‍ය ගරු සාගල රත්නායක මහතා, ශ්‍රී ලංකාවේ චයිනා හාබර් ලිමිටඩ් නියෝජිතයින් සමඟ එක්ව රේඹන්ග්හි AMATA කාර්මික උද්‍යානය නැරඹීය. ඔහු පොස්ට්රාකෝල් ඇමතිවරයාගේ මගී මෙහෙයුම් කටයුතු පිළිබඳව ද හමුවිය.

V. ගරු ආරක්ෂක අමාත්‍යවරයා තායිලන්තයට ගොස් තායිලන්තයේ ආරක්ෂක අමාත්‍යවරයා මුණගැසිය.

(5) අනෙකුත් ද්විපාර්ශවික හමුවීම් :

I. ශ්‍රී ලංකාවේ සිට බෝධි අංකුරය පිරිනැමීම සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය කාර්යාලයට සම්බන්ධ තායි ඇමතිවරයා සමඟ රැස්වීමක් පැවැත්විණි.

II. නව වාණිජ ඇමතිවරයා හා අගමැතිවරයාගේ කාර්යාලයේ ආර්ථික ගැටලු සම්බන්ධයෙන් කටයුතු කරන අමාත්‍යවරයා සමඟ රැස්වීම් පැවැත්වීය.

III. විශේෂයෙන් කෘෂිකර්මය සහ සමාජ සවිබලගැන්වීම යන ක්ෂේත්‍රවල තාක්ෂණ සහාය ලබාගැනීමට අධ්‍යක්ෂ ජනරාල් - TICA හමුවිය.

IV. සිරින්ධෝන් රජ කුමරිය සමඟ රාජකීය ව්‍යාපෘතිවල සංචාරයක නිරත වූ අතර, කෘෂිකර්ම, විද්‍යාව, තාක්ෂණය සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඇය මුලසුන හෙබවූ උත්සවවලට සහභාගි විය.

V. රාජකීය වැසි නිපදවීමේ කාර්යාංශයේ තායි අධ්‍යක්ෂ ජනරාල්ගේ ශ්‍රී ලංකා සංචාරය සහ පසුව ශ්‍රී ලංකාවෙන් තාක්ෂණික කණ්ඩායමක් විසින් තායිලන්තයේ සංචාරය සඳහා පහසුකම් සපයන ලදී.

VI. අදාළ බලධාරීන් සමඟ කටයුතු කරන තමසත් විශ්ව විද්‍යාලයේ උපාධි ශිෂ්‍යත්ව. තවද තායි අංශය විසින් පිරිනමන තාක්ෂණ සහාය ශිෂ්‍යත්වවල ප්‍රගතියක් ලබා ඇත.

VII. සාධනීය ආර්ථික දර්ශනය අත්දැකීමට 2 වන ආසියානු තරුණ නියෝජිත කණ්ඩායම සඳහා කොළඹ සිට සහභාගි වූ තරුණ නියෝජිත කණ්ඩායමට සහාය දැක්වීය.

VIII. කොළඹ පැවති ආරක්ෂක සම්මන්ත්‍රණයට සහභාගි වූ තායි සහභාගිත්වය සඳහා පහසුකම් සපයන ලදී. සන්නද්ධ හමුදාවල බෝම්බ හෙළීම් මධ්‍යස්ථානයේ වැඩසටහන්වලට සහභාගිවිය.

I. සාගර සඳහා ආසියානු පැසිපික් දිනය සමාරම්භක උත්සවය, කාන්තාවන් සහ ගැහැණු ළමුන් පිළිබඳ හිංසාව තුරන් කිරීමේ ජාත්‍යන්තර දිනය ආසියානු පැසිපික් සැමරීම, ජාත්‍යන්තර දූෂණ විරෝධී දිනය, 'විස්ඩම් ඔෆ් මොනාක්' - තිරසාර සංවර්ධනය, නීතිය පිළිබඳ ලෝකයා ග්‍රන්ථය එළි දැක්වීම, අතිගරු භූමිබෝල් අඩුල්යාඩෙජ් රජතුමාගේ රාජකීය ව්‍යාපෘති, මෝව් සම්බන්ධයෙන් තායි ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් කේපීඅයි සමුළුව ඩඩඩ සහ මහා චාක්‍රි සිරින්ධෝර්න් රජ කුමරිය විසින් මුලසුන හොබවන ලද විවෘත කිරීමේ උත්සවයට සහභාගි විය.

2. බහුපාර්ශවික සබඳතා:

I. ESCAP හි 74 වැනි ආරම්භක සැසියට ශ්‍රී ලංකාවේ සහභාගිත්වයට සහ තිරසර සංවර්ධනය සඳහා 2030 න්‍යාය පත්‍රයේ සමානතා සම්බන්ධයෙන් ESCAP උසස් තත්වයේ සංවාදයට ශ්‍රී ලංකාවේ සහභාගිත්වයට පහසුකම් ලබාදෙන ලදී.

II. UNESCAP හි ස්ථිර නියෝජිතයන්ගේ උපදේශක කාරක සභාවේ රැස්වීම්, APTA ස්ථාවර කාරක සභාවේ පනස් දෙවැනි සැසිය,

මහජන සෞඛ්‍යය පිළිබඳ 4 වන ජාත්‍යන්තර සමුළුව, විද්‍යාව සහ තොරතුරු ජන්නිවේදන සමුළුව, සංවර්ධන සහකරුවන් සඳහා

FAO සහ UNESCP දේශගුණික වෙනස්වීම් පිළිබඳ සංසදයට සහභාගිවිය.

3. ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන:

I. ශ්‍රී ලංකාවේ කර්මාන්තපුරවලට ද්‍රව්‍ය ලබාදීම සඳහා රොජානා කර්මාන්තපුරයේ උප සභාපති සමග උපදේශකත්වය ලබාගැනීමට බැංකොක් හි ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ රාජ්‍ය අමාත්‍යවරයාගේ සංචාරයට පහසුකම් සපයන ලදී.

II. රොජානා කර්මාන්තපුරය සමග සාකච්ඡා සඳහා ලංකා ආයෝජන මණ්ඩලයෙන් කණ්ඩායමකට සංචාරයක් සඳහා පහසුකම් සපයන ලදී.

III. FTA ස්කෝපිං සැසියට සහ කොළඹ උපාය මාර්ගික ආර්ථික හවුල්කාරිත්ව අවබෝධතා ගිවිසුමේ ප්‍රගතිය සඳහා රැස්වීමට සහභාගි විය.

IV. බැංකොක් මැණික් සහ ස්වර්ණාභරණ වෙළඳපොළ සහ තායිෆෙක්ස් ශ්‍රී ලංකා වෙළඳුන් සමග අපනයන සංවර්ධන මණ්ඩලයේ සහභාගිත්වයට පහසුකම් සපයන ලදී.

V. කර්මාන්තපුර අංශයේ විකල්ප ආයෝජන අපේක්ෂාවෙන් සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි සමග රැස්වීම.

VI. මුඅංතායි ජීවිත සුරක්ෂණය වෙතින් නියෝජිත කණ්ඩායමක් කොළඹට පැමිණීමේ සංචාරයට පහසුකම් සපයන ලදී.

VII. තේ සහ කුරුඳු ප්‍රවර්ධනය සහ අලෙවිය සඳහා අවස්ථාවක් වශයෙන් වාර්ෂික රතු කුරුස වෙළඳපොළට සහභාගි විය.

VIII. ශ්‍රී ලංකාවේ SUTECH සීනි ව්‍යාපෘතියට පහසුකම් සැපයීමට ඒ සඳහා උපකාර කරමින් සිටීම

IX. 2019 ජනවාරි මාසයේ දී ශ්‍රී ලංකාවේ ආරම්භ කරන තායි ලයන් එයාර් සේවයට සහයෝගය දක්වන ලදී.

X. ශ්‍රී ලංකාවේ පුද්ගලික පේටියානා සංචාරවලට ආයෝජනය සම්බන්ධයෙන් MJets වෙතින් පැමිණි නියෝජිත කණ්ඩායමට පහසුකම් සපයන ලදී.

XI. කසල රබර් ආනයනය කරන තායි රබර් සෝසිං කම්පැනි, ITM AI - මවුස්ක්වැටර්ස් ගෘප් කාබනික ආහාර නිෂ්පාදන, ලේසි බෝයි කම්පැනි - සුවපහසු ගෘහ භාණ්ඩ, තායි ලීඩර් ග්ලෝබල් ට්‍රේඩ් කම්පැනි - තේ - ඩිටෝ කම්පැනි ලිමිටඩ් - තේ සැපයීම, ATM බැංකොක් - පටයා සංචාරක කණ්ඩායම - සංචාරක මෙහෙයවීම් - තායි සමාගම්වලට පහසුකම් සපයන ලදී.

XII. ශ්‍රී ලංකා රේල්වේ, වරාය අධිකාරිය, ලංකා බනිජවැලි සංස්ථාව, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, ශ්‍රී ලංකා එයාර්ලයින්ස්, ලංකා බනිජතෙල් සංස්ථාව, ප්‍රවාහන සහ ගුවන් සේවා අමාත්‍යාංශය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ ටෙන්ඩර් සහ ලංසු දැන්වීම් පළකරන ලදී.

XIII. වෙළඳ විමසීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සමාගම්වලට පහසුකම් සපයන ලදී. - IFCO සමාගම, ඩිලැක්ස්පෝ, TIIKM සමාගම, වික්ටෝරියා එක්පෝර්ට් ඉම්පෝර්ට් (පුද්) සමාගම, CDDEF ගෘප් ඔෆ් කොම්පැනීස්, Bluelotus 360 සමාගම ආනයනය, අපනයනය සහ වෙළඳ සබඳතා .

XIV. (16) මුවැං තායි ජීවිත රක්ෂණ සමාගම, ඒෂියන් ටයිගර්ස් මොබිලිටි, සීමාසහිත ට්‍රාන්ස්පෝ ඉන්ටර්නැෂනල්, බ්ලූ ස්කයි එනර්ජි කොම්පැනි ලිමිටඩ්, ඉන්දු රාමා ගෘප් මගින් ශ්‍රී ලංකාවේ අපේක්ෂිත ආයෝජන සඳහා පහසුකම් සපයන ලදී.

XV. තායිලන්තයේ කර්මාන්ත ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව මගින් පුහුණු සහාය ලබාගැනීමේදී ශ්‍රී ලංකාවේ IDB සඳහා සහාය දක්වන ලදී.

XVI. ශ්‍රී ලංකාවේ ප්‍රවර්ධනය කරන ලද සහ පහසුකම් සපයන ලද අවස්ථා: ආයෝජන සහ ව්‍යාපාර සම්මේලනය 2018, ශ්‍රී ලංකා සුළු වෙළඳ සංසදය

I. තාක්ෂණය පිළිබඳ සිරින්ධෝර්න් ජාත්‍යන්තර ආයතනය (SIIT), තමසත් විශ්වවිද්‍යාලය, තායිලන්තයේ චූලබෝන් උපාධි ආයතනය, ජෙනරාල් සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය, කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය, ජාතික තරුණ සේවා සභාව, මේ ෆැහ්ලොං විශ්ව විද්‍යාලය, තායි නික් තාක්ෂණික ආයතනය යනාදි ආයතනවල අධ්‍යාපනික කටයුතු සඳහා පහසුකම් සපයන ලදී.

II. ඩෙංගු රෝගීන් සඳහා Dextran 40 ආනයනය කිරීමට රාජ්‍ය ඖෂධ සංස්ථාවට සහාය දක්වන ලදී.

III. ඩිජිටල් ආර්ථික ප්‍රවර්ධන නියෝජිතායතනය (DEPA), තායිලන්තය, තායි සුළු වෙළඳ සංගමය, තායි මැණික් හා ස්වර්ණාභරණ වෙළඳ සංගමය සහ තායි වාණිජ මණ්ඩලය සමග සාකච්ඡා පවත්වන ලදී.

IV. භාණ්ඩ යැවීම මගහැරීම සම්බන්ධයෙන් ස්කෑන් ටෙක් ඔෆිස් ඔටොමේෂන්, රයිගම් මාකටිං සර්විසස්, මැක්සස් මාකටිං (පුද්) සමාගම සහ එස්එන් එස් ග්ලෝබල් පුද්. සමාගමේ අලෙවි පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කරන ලදී.

V. තායිෆැක්ස් 2018 ප්‍රදර්ශනයට සමගාමීව වෙළඳපොළ නිරාවරණය සහ පැකේජ් කිරීම සම්බන්ධයෙන් පුහුණුව සඳහා ආහාර නිෂ්පාදන සම්බන්ධයෙන් SME අංශය මත SLEDB වෙතින් අලෙවි නියෝජිත කණ්ඩායමක් සංවිධානය කරන ලදී.

VI. YWCA ඩිප්ලොමැටික් චැරිටි බසාර් වෙළඳපලට සහභාගිවී එහිදි ශ්‍රී ලංකා නිෂ්පාදන ප්‍රවර්ධනය කරන ලදී.

VII. තායිලන්තයෙන් A4 පොටෝ කොපි කඩදාසි ආනයනය කිරීමට MIT ලංකා ලිමිටඩ් ආයතනයට අලෙවි තොරතුරු සපයන ලදී, පොල් නිෂ්පාදන අලෙවි අවස්ථා සොයා බැලීමට සිලොන් මැට්‍රිනට් හෝල්ඩිංස් පුද්ගලික සමාගමට, බැංකොක් හරහා කුකුළු පැටව් ආනයනය කිරීමට ත්‍රී ඒකර් ෆාම් ආයතනයට, ෆර්නික්‍රාප්ට් සමාගමට ලා ඉසෙඩ් බෝයි සමග රැස්වීම් පිළියෙල කිරීම මගින් ඔවුන්ගේ දැව නිෂ්පාදන සඳහා අලෙවි අවස්ථා සොයාබැලීම, ශ්‍රී ලංකා තේ මිලදී ගැනීමට බැංකොක් හි ජර්මන් ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් ඔෆිස් බොක්ස් කොමපැනිස්, හවුස් ඔෆ් ඩිටෝ කොම්පැනි ලිමිටඩ් සහ ශ්‍රී ලංකාවෙන් මුහුදු ආහාර ආනයනය කිරීමට තායිලන්තයේ එස්එන්එස් ග්ලෝබල් පුද්. සමාගම.

VIII. FACET 2018 ප්‍රදර්ශනය නැරඹීම සඳහා තායි මැණික් සහ ස්වර්ණාභරණ අලෙවිකරුවන්ගේ සංගමයේ සභාපතිට ආරාධනා කරන ලද අතර තායි මැණික් අපනයනකරුවන් සමග ප්‍රදර්ශනයට නම් කරන ලද නිලධාරියකු සහභාගිවිය.

IX. ලංකා වානිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද 2018 ඔක්තෝබර් මස පවත්වන ලද ශ්‍රී ලංකා සුළු වෙළඳ සංසදයට සහභාගි වන මෙන් තායි සුලු වෙළඳ සංගමයේ සියාම් පැරගන් සමාගමේ සමූහ සමාන්‍යාධිකාරිවරයාට ආරාධනා කරන ලද අතර සංසදයට ඔහු සහභාගි විය.

X. PET ප්ලාස්ටික් නිෂ්පාදනයේ ශ්‍රී ලංකාවේ ආයෝජනය කරන මෙන් ඉන්දු රාමා කණ්ඩායමෙන් ඉල්ලීම් කරන ලදී.

XI. තායිලන්තයේ ඒකාබද්ධ විදේශ වාණිජ මණ්ඩලයේ (JFCCT) සාමාජිකයන්ට ශ්‍රී ලංකාවේ ආර්ථිකය, සංචාරක කර්මාන්තය සහ ආයෝජන සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීමක් කරන ලදී.

XII. බැංකොක් හි UNESCAP හිදී පවත්වන ලද දකුණු - දකුණු සහයෝගිතාව පිළිබඳ සම්මන්ත්‍රණයට සහ ජාතික දින උත්සවයට, UNESCAP විසින් සම්බන්ධීකරණය කරන ලද 5 වැනි

හරිත කර්මාන්ත සමුළුව, විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් සංවිධානය කරන ලද 51 වැනි ASEAN විදේශ ඇමතිවරුන්ගේ රැස්වීමේ ප්‍රතිඵල සම්බන්ධයෙන් වූ සම්මන්ත්‍රණයට, තාක්ෂණය පිළිබඳ ආසියානු ආයතයේ භාරකාර මණ්ඩලයේ රැස්වීම සහ ආයතනය භාරදීමේ උත්සවයට සහ UNESCAP හි විද්‍යා සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ සම්මන්ත්‍රණයට, තිරසාර සංවර්ධණ අරමුණු සඳහා බෞද්ධ මාර්ගය සම්බන්ධ සම්මන්ත්‍රණයට, සහභාගි වූ අතර, තරුණ බෞද්ධ සංගමය විසින් පවත්වන ලද ලෝක බෞද්ධ විශ්ව විද්‍යාල සමුළුවට සහ තාක්ෂණය පිළිබඳ ආසියානු ආයතනයේ 130 වැනි උපාධි උත්සවයට සහභාගි විය.

XIII. ශ්‍රී ලංකාවේ රබර් කර්මාන්තකරුවන් සඳහා රබර් තාක්ෂණික පුහුණුව සැපයුම්කරුවකු තෝරාගැනීමට කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශයට පහසුකම් සපයන ලද අතර තායිලන්තයේ මෙසර්ස් ටෙක්නොබිස් කොමියුනිකේෂන් සමාගම නිර්දේශ කරන ලදී.

XIV. ශ්‍රී ලංකාවට බාහිර නියෝජිත කණ්ඩායමක් සංවිධානය කිරීමට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ තායි කර්මාන්තකරුවන්ගේ සංසදයේ ඉලෙක්ට්‍රොනික් සහ ඉලෙක්ට්‍රිකල් ඵලයිඩ් ක්ලබ් සමග සම්බන්ධීකරණය කරන ලදී.

XV. රාජ්‍ය ඖෂධ සංස්ථාවේ, මිනරල් සෑන්ඩ් ලිමිටඩ්හි ගෝලීය ප්‍රසම්පාදන දැන්වීමට, බනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය මගින් පළ කරන ලද ශ්‍රී ලංකා වෙළඳපොළේ ලිහිසි තෙල් සැපයුම්කරු, විදුලි බල සහ පුනර්ජනනීය බලශක්ති ටෙන්ඩර් දැන්වීම, කොළඹ චාමර්ස් ග්‍රේනරීස් සඳහා මිශ්‍ර සංවර්ධ ව්‍යාපෘතිය සඳහා යෝජනා ඉල්ලීම සහ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ප්‍රසම්පාදන දැන්වීම ප්‍රසිද්ධිය ලබාදෙන ලදී.

XVI. ව්‍යාජ අරමුදල් මාරුකිරීම සම්බන්ධයෙන් වෙළඳ පැමිණිලි විසඳීමට, ගෙවීම් පැහැර හැර තිබූ මුදල් ලබාගැනීමට පොටෝ ෆයින් කලර් ලැබොරටරීස් (පුද්) සමාගමට, භාණ්ඩ නොඑවීම සම්බන්ධයෙන් කොළඹ එම්එම් ට්‍රේඩර් ආයතනයට, ගෙවීම අනුව ඒ4 කඩදාසි තොගය නොඑවීම සම්බන්ධයෙන් ගාල්ලේ ලිට්ල් ලංකා ලිමිටඩ් ආයතනයට, ශ්‍රී ලංකාවේ සෙහාසා (පුද්) සමාගම මගින් ප්ලාස්ටික් අමුද්‍රව්‍ය බහලුම් සඳහා ගෙවීම් නොඑවීම සම්බන්ධයෙන් යුනියන් ජේ. ප්ලස් (තායිලන්ත) සමාගමට පහසුකම් සපයන ලදී.

4. සංස්කෘතික සබඳතා:

1. 70 වැනි නිදහස් සමරුව වෙනුවෙන් "Sri Lanka-Thailand: A timeless Partnership" යටතේ සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී. විශේෂ කාර්ය අමාත්‍ය ගරු ආචාර්ය සරත් අමුණුගම සහ තායිලන්තයේ හිටපු ශ්‍රී ලංකා තානාපති මහාචාර්ය ජේ.බී. දිසානායක මහතා විසින් දේශන පවත්වන ලදී.

2. තාක්ෂණය පිළිබඳ ආසියානු ආයතනයේ සිසුන් සහ තායිලන්තයේ ශ්‍රී ලංකා සංගමය විසින් සංවිධානය කරන ලද අවුරුදු උත්සවයට සහභාගි විය.

3. චුලලෝන්ග්කෝර්න් විශ්ව විද්‍යාලයේ ශ්‍රී ලාංකික ස්වාමීන්වහන්සේ නමක් විසින් පවත්වන ලද ධර්ම දේශනය තානාපති කාර්යාලය විසින් සංවිධානය කරන ලද අතර එයට නියෝජ්‍ය අගමැති විසානු-ක්‍රී-න්ගම් මහතා සහ නියෝජ්‍ය විදේශ ඇමති විරසාක්ඩි ෆුට්‍රාකුල් මහතා සහභාගි වූහ.

5. සංචාරක කටයුතු:

1. නියෝජ්‍ය අගමැති විසානු-ක්‍රී-න්ගම් විසින් මූලාසනය හොබවන ලද තායි සිල්ක් දැක්මේ සංවිධාන කමිටුවට සේවය සලසන ලෙස ආරාධනා කරන ලදී. මෝස්තර ලෝකයේ සහ සංචාරක අංශයේ ශ්‍රී ලංකාව ප්‍රදර්ශනය කිරීමට මෙය කදිම අවස්ථාවකි.

2. තායි ජාත්‍යන්තර සංචාරක ප්‍රදර්ශනයට සහභාගිත්වය සඳහා කටයුතු සලසන ලද අතර විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි විය.

3. නව සංචාරක අමාත්‍යවරයා හමු වූ අතර පසුව අවශ්‍ය තොරතුරු සලසන කතා පොතක් සම්පාදනය කිරීම තුළින් උපාය මාර්ගික බෞද්ධ චාරිකාව සඳහා සහභාගි විය.

4. තායිලන්තයේ ජාතික සංචාරක සංවිධානයේ (NTO) සංගමයට සහභාගි වූ අතර තායි ටුවර් ඔපරේටර්ස් වෙනුවෙන් FAM සංචාරය සංවිධානය කිරීමේදී සහාය දක්වන ලදී.

තායිලන්තයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය

LAO මහජන ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය

1. ද්විපාර්ශ්වික සබඳතා:

I. 2018 සැප්තැම්බර් මස වියට්නාමයේ පවත්වන ලද WEF ASEAN රැස්වීම අතරතුර ශ්‍රී ලංකාවේ ගරු අග්‍රාමාත්‍යවරයා සහ ලියෝ ජනරජයේ තම සමකාලීනයා අතර රැස්වීමක් පිළියෙල කිරීමට තානාපති කාර්යාලය සාර්ථකව සම්බන්ධීකරණය කරන ලදී.

II. ලාවෝ PDR වෙත ශ්‍රී ලංකාවේ ගරු කථානායකතුමා විසින් මෙහෙයවන ලද ශ්‍රී ලංකා ලාවෝ පාර්ලිමේන්තු මිත්‍රත්ව කණ්ඩායමේ සංචාරයට පහසුකම් සපයන ලදී. එම සංචාරය ශ්‍රී ලාංකිකයන් වෙත ලැබුණු විට වීසා පහසුකම තුළ අවසාන වූ අතර එවකට ගරු කොන්සල්වරයාගේ සහායද ලැබුණි.

III. ලියෝහි ශ්‍රී ලංකා ගරු කොන්සල්වරයාගේ පත්වීම සම්පූර්ණ කරන ලදී.

IV. UNGA හි නිවියෝක් හිදී 73 වැනි සැසිවාරයේ ආන්තික සම්බන්ධයෙන් දෙරට අතර ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

V. වියට්නාමයේ බෞද්ධ ස්වාමීන්වහන්සේගේ අපවත්වීමට පසුව දේහය ශ්‍රී ලංකාවේ ගරු කොන්සෙල්වරයාගේ සහාය ඇතිව රැගෙන එන ලදී.

VI. ව්‍යාපාර සහ කොන්සියුලර් විමසීම් සඳහා පහසුකම් සපයන ලදී.

2. බහුපාර්ශ්වික සබඳතා:

I. සිංගප්පූරුවේ ARF හි ආන්තික සම්බන්ධයෙන් ගරු විදේශ කටයුතු පිළිබඳ ඇමති සහ ලියෝහි ඔහුගේ සමකාලීනයා අතර රැස්වීමක් සූදානම් කිරීම තානාපති කාර්යාලය විසින් සාර්ථකව සම්බන්ධීකරණය කරන ලදී.

II. "The Indian Ocean: Defining Our Future" සමුළුව සම්බන්ධීකරණය කරන ලද අතර සහභාගිත්වය තහවුරු කරන ලදී.

II. ශ්‍රී ලංකා විදේශ සබඳතා සහ ආර්ථික රාජ්‍ය තාන්ත්‍රිකත්ව වැඩසටහනට සහභාගිවීමට ආරාධනා කරන ලදී. (SLFREDP) - 2018.

3. ආර්ථික සබඳතා

(1) Lao PDR හි ආයෝජනය අපේක්ෂාවෙන් ශ්‍රී ලංකාවේ හේලීස් ඇඩ්වෙන්ටිස් සමාගමට සහාය දක්වන ලදී.

තායිලන්තයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය

කාම්බෝජ රාජ්‍යය

1. ද්විපාර්ශ්වික සබඳතා:

I. 2018 සැප්තැම්බර් මස වියට්නාමයේ WEF ASEAN රැස්වීම අතරතුර ශ්‍රී ලංකාවේ ගරු අග්‍රාමාත්‍ය තුමා සහ කාම්බෝජයේ ඔහුගේ සමකාලීනයා අතර රැස්වීමක් පිළියෙල කිරීමට සාර්ථකව සම්බන්ධීකරණය කරන ලදී.

II. ව්‍යාපාර සහ කොන්සියුලර් විමසීම් සඳහා පහසුකම් සපයන ලදී.

2. බහුපාර්ශ්වික සබඳතා:

(1) ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා සහ එතුමාගේ කාම්බෝජ සමකාලීනයා අතර සිංගප්පූරුවේ පවත්වන ලද ආන්තික සම්බන්ධයෙන් ARF අමාත්‍යාංශයීය රැස්වීම සංවිධානය කිරීම තානාපති කාර්යාලය විසින් සාර්ථකව සම්බන්ධීකරණය කරන ලදී.

ජකර්තා හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය

1. ද්විපාර්ශ්වික සබඳතා:

I. 2018 ජනවාරි 24-25 පවත්වන ලද අතිගරු ජනාධිපතිතුමා සහ ගරු අගමැතිතුමා සමග ද්විපාර්ශ්වික සබඳතා පැවැත්වීමෙන් අනතුරුව අතිගරු ජනාධිපති ජොකෝ විඩොඩෝ ගේ සංචාරය. පසුගිය වසර 38 තුලම ඉන්දුනීසියානු ජනාධිපතිවරයකුගේ පළමු සංචාරය මෙය වේ.

II. අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම්: උසස් අධ්‍යාපන, පර්යේෂණ සහ තාක්ෂණ ක්ෂේත්‍රවල සහයෝගිතාව සම්බන්ධ අවබෝධතා ගිවිසුම; සොයාබැලීම සහ බේරාගැනීම සම්බන්ධ සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම ; නාකොටික් මත්ද්‍රව්‍ය, මනෝ විකිත්සක ද්‍රව්‍ය සහ ඒවායේ රසායනික නීති විරෝධී ආකාරයට ගෙනයාමට විරුද්ධව සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම.

III. මැතිවරණ කොමිසම - ප්‍රාදේශිය මැතිවරණ වැඩසටහනේ (ජකර්තා) මැතිවරණ කොමිසමේ සහභාගිත්වය අතර සහයෝගිතාව සහ 2018 ජූනි 25-28 (සුරබයා) දූත මණ්ඩලවල ප්‍රධානීන්ගේ වැඩසටහනේ තානාපති නිලධාරීන් මැතිවරණ කටයුතුවලට පැමිණීම.

IV. රාජ්‍ය සංචාර සඳහා අත්‍යාවශ්‍ය කරුණු මග පෙන්වීමේ සාකච්ඡාව : සෙවීම සහ බේරාගැනීම, අධ්‍යාපනය සහ පර්යේෂණ, නාකොටික් මත්ද්‍රව්‍ය, ආපදා කළමනාකරණය, දේශගුණ විද්‍යාව, ආහාර සුරක්ෂණය, සංස්කෘත සහයෝගිතාවය සම්බන්ධ සහයෝගිතාවය .

V. තරුණ නුවමාරුව: 2018 මාර්තු 29-30 දක්වා පැවති යොවුන් පුරය ජාතික වැඩසටහන 2018 සඳහා සාමාජිකයන් 6 කින් යුත් ඉන්දුනීසියානු නියෝජිත කණ්ඩායමක් සංවිධානය කරන ලදී.

VI. හොඳම පුරුදු නුවමාරු කිරීම: 2018 මාර්තු 27 සිට අප්‍රියෙල් 01 දක්වා ශ්‍රී ලංකාව වෙත ප්‍රාථමික හා මාතෘ සෞඛ්‍යය පිළිබඳ ඉන්දුනීසියානු වෛද්‍ය කණ්ඩායම අධ්‍යයන චාරිකාවක් සඳහා පහසුකම් සැලසීය.

VII. වැළැක්විය හැකි මාතෘ මරණ සඳහා නව්‍යකරණයන් පිළිබඳ එයා ලන්ගා විශ්ව විද්‍යාලයේ සම්මන්ත්‍රණයෙහි තාක්ෂණික පත්‍රිකාව ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා සම්පත් දායකයා සංවිධානය කිරීම 2018 මැයි 12-13.

VIII. තානාපති සබඳතාවල 65 වැනි සංවත්සරය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය යුනෙස්කෝ ලෝක උරුම භූමියේ ප්‍රිමියර් උද්භිද උද්‍යානයේදී බෝගොර් උද්භිද උද්‍යානය වෙත ප්‍රදානය කිරීම.

IX. ආසියාතික ක්‍රීඩා උළෙල 2018 දී ජකර්තා සහ පාලම්බැන්ග් හි ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමක් සඳහා පහසුකම් සැලසීම.

X. ශ්‍රී ලංකාවේ ක්‍රීඩා අමාත්‍ය ගරු ෆයිසර් මුස්තාෆා සහ ඉන්දුනීසියාවේ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍ය අතිගරු නක්වි සමග ක්‍රීඩා ක්ෂේත්‍රයේ පුහුණුව, තාක්ෂණ ඥානය ආදිය සම්බන්ධයෙන් 2018 සැප්තැම්බර් 01 දින ද්විපාර්ශ්වික සාකච්ඡා

XI. 2018 ආසියානු ක්‍රීඩා උළෙල අතරතුර පළමු වරට විදේශීය උසස් පෙළ විභාගය පැවැත්වීම.

XII. ඉන්දුනීසියාවට කුඩා හා මධ්‍යම මට්ටමේ කර්මාන්ත අධ්‍යයන චාරිකාවක් පිළියෙල කිරීම හා අවසන් කිරීම - ඔක්තෝබර්-නොවැම්බර් 2018

XIII. විදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය ජ.නී. ගරු තිලක් මාරපන මහතාගේ යොගයකාර්තා වෙත රාජ්‍ය සංචාරය සහ විශේෂයෙන් යොගයකාර්තා රාජ්‍යය සමග ඉන්දුනීසියාව සහ ශ්‍රී ලංකාව අතර සංස්කෘතික සහ අධ්‍යාපනික සහයෝගිතාවය සඳහා සාකච්ඡා සඳහා 2018 ඔක්තෝබර් 25 දින ශ්‍රී සුල්තාන් හෙමෙන්ග්කු බුවනෝ රැජිණ සමග හමුව.

2. බහුපාර්ශ්වික සබඳතා

I. විදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය ජ.නී. ගරු තිලක් මාරපන මහතා විසින් මිනිස් ජාවාරම සහ ඒ සම්බන්ධ අපරාධ සම්බන්ධයෙන් බාලි අමාත්‍යාංශ සමුළුවට ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායම මෙහෙයවූ අතර එය 2018 අගෝස්තු මස 07දින ද ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීම 2018 අගෝස්තු මස 06 දින දපවත්වන ලදී.

II. 2018 මාර්තු 21 සහ 22 ජකාර්තා හිදී 2 වන Prep Com towards the 2020 Review Conference to the Treaty of the Non-Proliferation Nuclear Weapons (NPT) සඳහා ආසියා පැසිපික් කණ්ඩායමේ කලාපීය සාකච්ඡාව සහ උපදේශනය.

III. 2018 දෙසැම්බර් 07-08 දක්වා බාලි හි පවත්වන ලද ඉන්දියන් සාගර කලාපයේ වර්ධනය සඳහා නාවුක සහයෝගිතාවය ඉහළ නැංවීම සම්බන්ධයෙන් IORA උසස් මට්ටමේ කණ්ඩායම, ආර්ථික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්ගේ සහභාගිත්වය

IV. 2018 දෙසැම්බර් 6-7 දක්වා බාලි හිදී එකොලොස් වැනි බාලි ප්‍රජාතාන්ත්‍රික සංසදය සඳහා නියෝජනය කරන ලද තානාපතිවරු සහ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායම

V. ඉන්දුනීසියාවේ මනාඩෝ හිදී 2018 නොවැම්බර් 1-2 දක්වා පැවැත්වූ ආකිපෙලපීක් සහ දිවයින් රාජ්‍යවල අමාත්‍ය රැස්වීමට තානාපති සහ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායම නියෝජනය කිරීම.

VI. ඉන්දුනීසියාවේ ප්‍රධාන පෙළේ විශේෂඥයන්, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති විශ්ලේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය විසින් "Indian Ocean: Defining Our Future" වෙනුවෙන් 2018 ඔක්තෝබර් 11-12 දක්වා කරන ලද ශ්‍රී ලංකා සංචාරයට පහසුකම් සැපයීම

VII. ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමට පහසුකම් සැපයීම සහ GoSL 14 (SDG 14) තිරසර සංවර්ධනය පිළිබඳ කලාපීය සමුළුව -Life below water සම්බන්ධයෙන් 2018 මැයි 11 දින ඉන්දුනීසියාවේ ධීවර සහ නාවික කටයුතු අමාත්‍යාංශය සමග පවත්වන ලද උසස් රැස්වීමේදී ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායම සමග සකච්ඡාව නියෝජනය කරන ලදී.

VIII. ඉන්දුනීසියාවේ බාලි හි 2018 ඔක්තෝබර් 29 සහ 30 පවත්වන ලද "අවර් ඕෂන්" සමුළුවට තානාපතිවරුන් සහ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායම විසින් ශ්‍රී ලංකාව නියෝජනය කරන ලදී.

3. ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන

I. ශ්‍රී ලාංකික හවුල්කරුවන් හමුවීමට ඉන්දුනීසියාවෙ සිට සාමාජිකයන් 11 ක ප්‍රධාන විධායක නිලධාරීන්ගේ නියෝජිත කණ්ඩායමකගේ සංචාරයක් සහ ගරු අග්‍රාමාත්‍යතුමා සමග අන්තර් හමුවක් (2018 ජනවාරි 24).

II. වෙළඳාම සහ ආයෝජන සම්බන්ධයෙන් ක්‍රියාකාරී කණ්ඩායමට නිර්ණය විෂයන් අවසන් කිරීම-2018 ජනවාරි

III. නායක මට්ටමෙන් ප්‍රතිපත්ති ආකාරයට ද්විපාර්ශ්වික FTA අවසන් කිරීමේ සාකච්ඡා (තවමත් පැවැත්වෙන) (2018 ජනවාරි සිට).

IV. ප්‍ර.වි.නි. නියෝජිත කණ්ඩායම සමග ආයෝජන සම්බන්ධයෙන් සංවර්ධනය සඳහා නියෝජිතායතනවල උපදේශකත්වයෙන් පසු විපරම් සාකච්ඡා: ඖෂධ; බලශක්තිය; රෙදිපිළි; සත්කාරක; සිමෙන්ති; ඉන්දුනීසියා උප කලාප; යටිතල පහසුකම් - දුම්රිය මාර්ග, පාලම්, මාර්ග, වරාය (PT INKA, WICA et al).

4. ව්‍යාපාර සහ වෙළඳ පහසුකම් සැපයීම

I. 2018 ජනවාරි 24 ඉන්දුනීසියානු ප්‍ර.වි.නි. නියෝජිත කණ්ඩායම සමග ලංකා වාණිජ මණ්ඩලයේ ව්‍යාපාර හමුවේ සැසිවාර සංවිධානය කිරීම .

II. ජකර්තා ජාත්‍යන්තර ස්වර්ණාභරණ ප්‍රදර්ශනයේදී ශ්‍රී ලංකා සහභාගිත්වය සඳහා පහසුකම් සැලසීම.

III. 2018 මාර්තු 2-4 දක්වා "Astindo" 2018 සංචාරක ප්‍රදර්ශනයට ශ්‍රී ලංකා සමාගම් සහභාගිත්වය සඳහා පහසුකම් සැලසීම.

IV. 2018 ඔක්තෝබර් 22 ඉන්දුනීසියාව සහ ශ්‍රී ලංකාව අතර FTA ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසුවිපරම.

V. 2018 නොවැම්බර් 14 සහ 15 Women International Club's Charity Bazaar ප්‍රදර්ශනයේ දී ශ්‍රී ලංකාව ප්‍රදර්ශනය කිරීම.

5. සංස්කෘතික සබඳතා

I. 70 වැනි නිදහස් සමරුව සහ ශ්‍රී ලංකාව සහ ඉන්දුනීසියාව අතර රාජ්‍ය තාන්ත්‍රික සබඳතා වල 65 වැනි සංවත්සරය පිළිගැනීම සහ ශ්‍රී ලංකා ආහාර ඉදිරිපත් කිරීම .

II. 2018 අගෝස්තු 9 සිට 2018 සැප්තැම්බර් 2 දක්වා ජකර්තා නුවර රෙදිපිළි කෞතුකාගාරයේ පවත්වන ලද ඒසියන් ගේම්ස් 2018 වෙනුවෙන් පවත්වන ලද ජාත්‍යන්තර රෙදිපිළි ප්‍රදර්ශනයේදී ශ්‍රී ලාංකික අන්තර් වාර රෙදිපිළි ප්‍රදර්ශනය කරමින් ශ්‍රී ලංකාව නියෝජනය කරන ලදී. 2018 අගෝස්තු 09 සිට 13 දක්වා ශ්‍රී ලංකාවේ මධ්‍යම පලාතේ කුඩා හා මධ්‍යම හස්ත කර්මාන්ත සංවර්ධනය සම්බන්ධයෙන් කර්මාන්ත, යෞවන, කාන්තා කටයුතු පිළිබඳ අමාත්‍යාංශ නියෝජිත කණ්ඩායම විසින් කරන ලද අධ්‍යයන චාරිකාව සඳහා පහසුකම් සැලසීම

III. 2018 සැප්තැම්බර් 22 ඉන්දුනීසියාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් සංවාධානය කරන ලද ජාත්‍යන්තර සාමය සඳහා පාපන්දු යන ජාත්‍යන්තර උත්සවයට පහසුකම් සැපයීම සහ ශ්‍රී ලංකා ප්‍රජා සහභාගිත්වය

IV. 2018 දෙසැම්බර් 14 ජකර්තා හි පැවැත්වූ එතෙර මෙතෙර රූපවාහිනී වැඩසටහන සඳහා පහසුකම් සැලසීම

6. කම්කරු සුබසාධනය

I. 2018 පෙබරවාරි 9 සිට ආරම්භ කරන ලද KM Mega Top III ඇතුළුව අතුරුදහන් වූ නැව් 04 බේරාගැනීමේ මෙහෙයුමට ඉන්දුනීසියානු බලධාරීන්ගෙන් සහාය අපේක්ෂා කරන ලදී

II. 2018 ජනවාරි සිට ශ්‍රී ලාංකිකයන් ස්වේච්ඡාවෙන් ආපසු පැමිණීම සම්බන්ධයෙන් IOM ඉන්දුනීසියානු බලධාරීන් සමග ඒකාබද්ධ හවුල්කාරිත්වය

7. ආරක්ෂක සහයෝගිතාවය

I. තානාපති කාර්යාලය විසින් බටහිර පැසිපික් නාවික හමුදා සමුළුවේ නිරීක්ෂක තත්ත්වය සඳහා ඉන්දුනීසියාවේ සහයෝගය ලබා ගත්තේය. 2018 මාර්තු 09 වන දින ඉන්දුනීසියාවේ සහයෝගය ලබා දුන්නේය.

II. ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධාරීන් දෙදෙනෙකු නියෝජනය කරමින් (KOMODO) -2018 බහුපාර්ශ්වික නාවික අභ්‍යාසයේ අවසන් සැලසුම් සමුළුව (2017 මාර්තු 05-07 සිට) ලොම්බොක්හි පවත්වන ලදී.

III. SLNS Sagara ශ්‍රී ලංකා නාවික නෞකා සාගර ශ්‍රී ලංකා නාවික හමුදාවේ OPV සහ නාවුක නියෝජිත කණ්ඩායමක් තෙවන බහුපාර්ශවික නාවික අභ්‍යාස - 'කොමෝඩෝ' (MNEK - 2018) සහභාගී විය. එය මටරාම්, ලොම්බොක්හිදී 2018 මැයි මස 4 සිට 9 දක්වා පවත්වන ලදී.

IV. 2018 අගෝස්තු 2 සිට 14 දක්වා ඉන්දුනීසියාව වෙත ශ්‍රී ලංකාවේ DSCSC සිට සාමාජිකයන් 17 කින් සමන්විත නියෝජිත කණ්ඩායමේ අධ්‍යයන චාරිකාවට පහසුකම් සැලසීය.

V. ඉන්දුනීසියාවේ National Resilience Institute of Indonesia හි නිලධාරීන් දෙදෙනෙකුට පහසුකම් සැලසීය - අධ්‍යයන වර්ෂය 2018 57 සහ 58 කණ්ඩායම්

VI. ඉන්දුනීසියාවේ LEMHANAS හිදී 2018/2019 අධ්‍යයන වැඩසටහනේ 59 වැනි ඇතුළත්කර ගැනීම නිලධාරීන් දෙදෙනෙකු ට ආරක්ෂාව සලසන ලදී.

I. 2018 අප්‍රේල් 01 සිට 06 දක්වා මධ්‍යම ජකර්තාවේ JCLEC, Semarang ඉන්දුනීසියානු වෙරළ ආරක්ෂකයන් විසින් සංවිධානය කරන ලද "මුහුදු නීතිය සහ සාගර බලාත්මක පුහුණුව" සම්බන්ධ වැඩසටහනේ HACGAM ධාරිතා වර්ධන වැඩසටහනට එක් වෙරළ ආරක්ෂක නිලධාරියකුගේ නියෝජනය

II. 2018 අප්‍රියෙල් 19 සිට 22 දක්වා පවත්වන ලද පළමුවැනි ආසියානු පැසිපික් කාන්තා හමුදා නිලධාරිනියන්ගේ සම්මන්ත්‍රණයට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සහ නාවික හමුදාව නියෝජනය කරමින් කාන්තා හමුදා නිලධාරිනියන් දෙදෙනෙකු සහභාගි විය.

III. 2018 අප්‍රියෙල් 23 සිට 27 දක්වා ඉන්දුනීසියාව සහ ඇමරිකා එක්සත් ජනපදය විසින් එක්ව සංවිධානය කරන ලද 2018 දී ජකර්තා නුවර පැවැත්වූ බහුපාර්ශ්වික සන්නිවේදන අන්තර් මෙහෙයුම් වැඩසටහන (PSW 2)- 2018 සඳහා යුද්ධ හමුදාවේ, නාවික හමුදාවේ සහ ගුවන් හමුදාවේ සහ නාවික හමුදාවේ එක් නිලධාරියකු බැගින් නියෝජනය.

IV. 2018 මැයි 3-4 දිනවල ජකර්තා හි දී මිනිසුන් නීති විරෝධී ලෙස ගෙනයාම, මිනිස් ජාවාරම සහ ඒ සම්බන්ධ අන්තර්ජාතික අපරාධ සම්බන්ධයෙන් තොරතුරු හුවමාරු කිරීමට උපදෙස් සම්බන්ධයෙන් බාලි ක්‍රියාදාමය නියමු පුහුණු වැඩමුලුවට ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් එක් නිලධාරියකු නියෝජනය

V. බාලි හි ජූලි 16 සිට 20 දක්වා නාවුක දත්ත විශ්ලේෂණයේ හොඳම පුරුදු සම්බන්ධයෙන් ASEAN කලාපීය සංසදයට නාවික හමුදා නිලධාරියකු සහභාගි විය.

VI. 2018 සැප්තැම්බර් 13 සිට 14 දක්වා සර් ජෝන් කොතලාවල ආරක්ෂක සරසවියේ (KDU) 11 වැනි ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව - 2018 සඳහා ඉන්දුනීසියානු ආරක්ෂක සරසවියේ නිලධාරීන් දෙදෙනෙකු නම්කිරීම .

VII. 2019 සඳහා DSCSC සඳහා ඉන්දුනීසියානු සන්නද්ධ හමුදාවලින් එත් නිලධාරියකු නම් කිරීම.

VIII. 2018 සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් පවත්වන ලද පාඨමාලාවල පුරප්පාඩු 13 ක් ලබාදෙන ලදී.

IX. 2019 සඳහා ඉන්දුනීසියානු සන්නද්ධ හමුදා වෙනුවෙන් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පවත්වන ලද අසමමිතික සුහසාධන පාඨමාලාවේ පුරප්පාඩු 03 ක් (නිලධාරීන් 01 සහ ශ්‍රේණි 02 01 Officer) 02 Ratings) ලබාදෙන ලදී.

X. 2019 සඳහා කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ උපාධි වැඩසටහන සඳහා ඔහෂ කැඩෙට් නිලධාරීන් සඳහා ශිෂ්‍යත්ව 02 ක් ලබාදෙන ලදී.

XI. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් පවත්වන ලද Exercise Cormorant Strike IX - 2018 සඳහා නිරීක්ෂකයන් දෙදෙනෙකු සහ 8 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් ලබාදෙන ලදී.

පිලිපීනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය

හැඳින්වීම

සමාලෝචන කාල පරිච්ඡේදය අතරතුරදී, ශ්‍රී ලංකා - පිලිපීන සබඳතා මාර්ග සිතියම් සැකසීමේ හා ඉදිරි වර්ෂය සඳහා තාත්ත්වික ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ වැදගත් අදියරක් හරහා අවධානයට යොමු කෙරුණි. උපායමාර්ගික සැලසුම් කිරීම රටවල් දෙක අතර ඉහළම දේශපාලනික හවුල්වීමේ මට්ටමක් ඇති කිරීමට සකස් කර තිබුණි. මෙම සන්දර්භයේදී, ධාරිතා ගොඩනැගීමේ කුසලතා, අධ්‍යාපනය හා සංස්කෘතික ක්ෂේත්‍ර ඇතුළත් දේශපාලනික, වෙළඳ හා ආයෝජන, සංචාරක, ආරක්ෂක, කෘෂිකාර්මික, කම්කරු වැනි තෝරාගත් අංශ වෙත මෙහෙයුම් කටයුතු අවධානය යොමු කර තිබුණි.

1. ද්විපාර්ශ්වික සබඳතා

I. 2019 ජනවාරි මස තුන්වැනි සතියේ ශ්‍රී ලංකාවේ සිට පිලිපීනය දක්වා ඉහළ පෙළේ සංචාර සඳහා කටයුතු සූදානම් කරමින් පවතී.

II. 2018 ඔක්තෝබර් 23 දින මැනිලා හිදී ශ්‍රී ලංකාව සහ පිලිපීනය අතර දේශපාලන උපදේශනයේ 2 වන වටය පවත්වන ලදී.

III. කොළඹ පිලිපීන තානාපති කාර්යාලය නැවත විවෘත කිරීම සම්බන්ධයෙන් විදේශ කටයුතු දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා තවදුරටත් පැවැත්වීම.

IV. කෘෂිකර්මය, උසස් අධ්‍යාපනය, ගුවන් සේවා හා ආරක්ෂක සහයෝගීතාව ඇතුලත් ද්විපාර්ශ්වික උපකරණ කිහිපයක් අත්සන් සඳහා අවසාන අදියරේ ඇති අතර යෝජිත VVIP නැරඹුමේදී අවසාන කිරීමට අපේක්ෂිතය.

V. එමෙන්ම, පහන ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් පිළිබඳ සාකච්ඡා කෙරෙමින් පවතී; දඬුවම් ලැබූ වරදකරුවන් මාරුකිරීම, අපරාධ කාරණාවලදී අන්‍යොන්‍ය නෛතික සහාය ගිවිසුම, 1978 STCW සම්මුතියේ නියම යටතේ පිළිගැනීම සැලකිල්ලට ගන්නා අවබෝධතා ගිවිසුම, පවතින වෙළඳ ගිවිසුමේ ප්‍රතිරාවය, සංස්කෘතික සහයෝගිතාව පිළිබඳ විධායක වැඩසටහනේ ක්‍රියාකිරීමේ

සැලැස්ම, කම්කරු සහයෝගීතාව, හෙද හා රැකවරණය දීමේ පැතිකඩ, කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්තිය සඳහා වන ශ්‍රී ලංකා කවුන්සිලය (SLCARP) හා පිලිපීන ලොස් බානොස් විශ්වවිද්‍යාලය (UPLB) හා සංචාරක සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම.

VI. සමාලෝචිත කාලපරිච්ඡේදය අතරතුරදී, පිලිපීනයේ ජාතික ආරක්ෂක විද්‍යාලයේ 2018-2019 අධ්‍යයන වර්ෂයේ ජාතික සුරක්ෂණ පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධියේ නිත්‍ය පාඨමාලා අංක. 54 සඳහා, තානාපති කාර්යාලයට ශ්‍රී ලංකාවෙන් හමුදා නිලධාරියෙක්ගේ සහභාගිත්වයට පහසුකම් සැලසීමට හැකි විය.

VII. ශ්‍රී ලංකාවේ විද්‍යාඥයින්ට පැළ වගාකිරීම, කෘෂිකාර්මික ආර්ථිකය හා වෙනත් ඒ සම්බන්ධ දෑ වල PhD සහ MSc මට්ටම අධ්‍යයනය කිරීමට ශිෂ්‍යත්ව ලබාගැනීමට, තානාපති කාර්යාලයට පිලිපීන ලොස් බානොස් විශ්වවිද්‍යාලය සමග සාර්ථකව සාකච්ඡා කිරීමට හැකි වුණි. ශ්‍රී ලංකාවේ පළමු විද්‍යාඥ කණ්ඩායම (19) PhD සහ Msc උපාධි හැදෑරීමට ඇතුලත් කරන ලදී. 2019 ජනවාරි රාජ්‍ය සංචාරය අතරතුර කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්තිය සඳහා වන ශ්‍රී ලංකා කවුන්සිලය සහ පිලිපීන ලොස් බානොස් විශ්වවිද්‍යාලය අතර ගිවිසුමක් අත්සන් කිරීම හරහා ඇතුලත් කිරීම විධිමත් කිරීමට ද ක්‍රියාමාර්ග ගෙන ඇත.

2. බහුපාර්ශ්වික සබඳතා

I. බහුපාර්ශ්වික සබඳතාවල, 2018 පෙබරවාරිහිදී ජාත්‍යන්තර සහල් පර්යේෂණ ආයතනය (IRRI) මගින් ශ්‍රී ලංකාවේ රටේ කාර්යාලයක් පිහිටුවීම, කොළඹ සැලසුම් කාර්ය මණ්ඩල විද්‍යාලයේ (CPSC) සක්‍රීය සහභාගිත්වය හා සූර්ය ශක්තිය, යටිතල පහසුකම්, සෞඛ්‍ය හා වාරිමාර්ග ඇතුලත් ව්‍යාපෘති නමයක් සඳහා ඇමරිකානු ඩොලර් බිලියන 1 ක් හා "ව්‍යවසාය ශ්‍රී ලංකා" යටතේ කුඩා හා මධ්‍යම ව්‍යවසාය ණයවල දී ඇමරිකානු ඩොලර් මිලියන 75 ක් සැපයීමෙන් ශ්‍රී ලංකාවේ විශාලතම සංවර්ධන හවුල්කරුවා බවට පත්වීම, පිලිපීනය පදනම් කරගත් බහුපාර්ශ්වික සංවිධාන සමග ශ්‍රී ලංකාවේ ධනාත්මක මැදිහත් වීම ඉහළ නැංවීමේ දී සමාලෝචිත කාල පරිච්ඡේදය තුලදී (2018) ක්‍රියාත්මක විය.

II. ඉහත දෑවලට අමතරව, බහුපාර්ශ්වික සබඳතා සම්බන්ධයෙන් සිදුවූ පහත ප්‍රගති කැපී පෙනේ:

2018 ජූනි මස IRRI අධ්‍යක්ෂ ජනරාල්වරයා ශ්‍රී ලංකාවට පැමිණියේය. අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍ය තුමා සහ කෘෂිකර්ම අමාත්‍ය තුමා වසර පහේ (2019-2023) ක්‍රියාකාරී සැලැස්ම සාකච්ඡා කිරීමට රැස්වීමක් පැවැත්විය. එයට ඉහළ අස්වැන්න ලබාදීම, දේශගුණික තත්ත්ව වලට ඔරොත්තු දෙන සහල් වර්ග, සහල් වටිනාකම් දාමය යාවත්කාලීන කිරීම, තිරසර භූමිය, පාංශු ජලය සහ පෝෂණය කලමනාකරණය, දුරස්ථ සංවේදනය සහ තීරණ ගැනීමට උපකාර වන භූගෝලීය තොරතුරු පද්ධති, ධාරිතා වර්ධනය, උසස් ජානමිතික පදනම, ජනන ශිල්ප ක්‍රම සහ වඩා හොඳ ක්‍රමෝපාය ඇතිකිරීම සහ පසු අස්වනු තාක්ෂණය ඊට ඇතුලත් විය.

III. ආංශික සාකච්ඡා හවුල්කරුවකු (SDP) වශයෙන් ASEAN සඳහා ශ්‍රී ලංකාවේ අඳාලත්වය සඳහා උපකාර කිරීමට මැනිලා මූලික කරගත් ASEAN සාමාජික රටවල් සමග සාකච්ඡා පැවැත්වේ.

IV. යටිතල පහසුකම්, බලශක්තිය, සෞඛ්‍යය, ධීවර සහ අධ්‍යාපන යන ව්‍යාපෘති ගණනාවක් සඳහා 'Strategy 2030' දීර්ඝ කාලීන සහයෝගය සමග මීළඟ වසර 3 තුළ අමෙරිකානු ඩොලර් බිලියන 3 ක් ලබාදෙමින් අඳාල වර්ධනය ලබාගැනීමට ආසියානු සංවර්ධන බැංකුව එහි වගකීම නැවතත් ලබාදෙන ලදී.

V. පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය කිරීම සහ TVET ප්‍රවණතා ඇතිවීම සමග ශ්‍රී ලංකාව පාලන ආයතනයක් වශයෙන් CPSC ක්‍රමෝපාය සැලැස්ම 2018-2023 සකස් කිරීමට ක්‍රියාකාරීව සහභාගි විය. ඊට අමතරව, සියලු කලාපීය වැඩසටහන්, ජාත්‍යන්තර සමුළු, කෙටි කාලීන වැඩසටහන්, CPSC මගින් සංවිධානය කරන ලද 2018 ජුනි පැවැත්වූ රට තුල පැවැත්වූ වැඩ සටහන්වලට ශ්‍රී ලංකාවට සහභාගිවීමට හැකිවිය. දැනට CPSC ලේකම් කාර්යාලයේ ශ්‍රී ලංකා වෘත්තිකයන් දෙදෙනෙක් සිටිති.

VI. සමාලෝචිත කාලය තුල ශ්‍රී ලංකාවේ වෘත්තිකයන් තුන්දෙනෙක් ජාත්‍යන්තර සංවිධානවලට බඳවාගෙන තිබේ (ADB, WHO හා CPSC).

3. ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන

I. රජය හා පෞද්ගලික අංශය සමග අඛණ්ඩව හවුල්වීමේ හා එහි අපනයන නිෂ්පාදන සමාලෝචිත කාලපරිච්ඡේදය අතරතුර පිලිපීනයට විවිධාංගීකරණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකාව හා පිලිපීනය අතර මුළු වෙළඳ පිරිවැටුම 2018 අගෝස්තු මසට ඇමරිකානු ඩොලර් මිලියන 47.5 ක් වාර්තා විය. (අපනයන - ඇමරිකානු ඩොලර් මිලියන 10.9, ආනයන - ඇමරිකානු ඩොලර් මිලියන 36.6)

II. පිලිපීන රජය සමග සාර්ථක සාකච්ඡා පසුවිපරම, ද්විත්ව බදු අයකිරීම සහ ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ 2000 දෙසැම්බර් 11 වන දින අත්සන් කරන ලද ආදායම් මත බදු මුදල් අයකර ගැනීම වැළැක්වීම පිලිපීනය විසින් 2018 දී අනුමත කරන ලදී.

III. 1980 දී අත්සන් කරන ලද ශ්‍රී ලංකා - පිලිපීන වෙළඳ ගිවිසුම නැවත උත්තේජනය කිරීමට ප්‍රගතියක් සිදු කර ඇති අතර පසු විපරම් කිරීම 2018 ඔක්තෝම්බර් වල මැනිලා හි දේශපාලන උපදේශන වල දෙවන වටයේදී සාකච්ඡා කරනු ලැබේ.

IV. විවිධ රස සමග විශාල තේ හා තේ අසුරණ, වායුමය හා පසුබැස්ම කළ රබර් ටයර් හා වෙනත් රබර් නිෂ්පාදන, නිමි ඇඳුම්, සැකසූ ආහාර, සහල් හා ධාන්‍ය සමාලෝචිත කාලපරිච්ඡේදය අතරතුර ශ්‍රී ලංකාවෙන් පිලිපීනයට අපනයනය වූ විශාල අපනයන නිෂ්පාදන ලෙස හඳුනාගෙන ඇත.

V. 2017 වර්ෂය හා සැසඳීමේදී, කාපට්, සංචාරක භාණ්ඩ, බෑග්, හා බේස් ලෝහ නිෂ්පාදන හා ලයන් බෘවරි වැනි නව නිෂ්පාදන කිහිපයක් පිලිපීන වෙළඳපළට හඳුන්වා දී ඇත.

VI. පහත ශ්‍රී ලංකාවේ නිෂ්පාදන පිලිපීනයට අපනයට කිරීමට අනාගත පිලිපීන ආනයනකරුවන් සමග සාකච්ඡා කෙරෙමින් පවතී; සීමාසහිත ලයන් බෘවරි සමාගම මගින් ලයන් බියර්, ඇසෝසියේටඩ් මෝටර්වේස් මගින් රබර් ටයර්, ඕ.එම් අලියාර් සන්ස් මගින් බණිජ තෙල්, සීනෝර් පදනම විසින් බෝට්ටු, සහ සීමාසහිත මර්කරි ලංකා කුළුබඩු පුද්ගලික සමාගම විසින් කුළුබඩු හා කුරුඳු.

VII. ශ්‍රී ලංකාවේ වෙළඳපොළ දාම සහයෝගීතාව සඳහා ශාන්ත අන්තෝනි සමාගම හා SM සමාගම් සමූහය සමග සහෝදර BPO සමූහයක් ශ්‍රී ලංකාවේ පිහිටුවීමට ට්‍රාන්ස්කොම් වර්ල්ඩ් වයිඩ් හි කලාපීය ප්‍රධාන කලමණාකරු සමග සාකච්ඡා සිදුවෙමින් පවතී.

VIII. ජෝර්ජ් ස්ටුවර්ට් පිලිපීන හා බසිලර් තේ සමග හවුල්කාරිත්වයෙන් 2018 නොවැම්බර් වල 52 වන ජාත්‍යන්තර බසාර් හිදී තානාපති කාර්යාලය "Ceylon Teas" ප්‍රදර්ශනය කරන ලදී.

4. සංචාරක ප්‍රවර්ධනය

I. තානාපති කාර්යාලය මගින් සිදුකළ ප්‍රබල ප්‍රවර්ධන ක්‍රියාකාරකම් වල ප්‍රතිඵලයක් ලෙස, ASEAN රටවල් අතර දෙවන ඉහළම සංචාරක පැමිණීම හා නැගෙනහිර ආසියනු රටවල් අතුරින් 5වන ඉහළම ශ්‍රේණිය හොබවමින්, සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවට පැමිණි පිලිපීන සංචාරකයින් ප්‍රමාණය 2018 අගෝස්තු මසට 13,550 දක්වා (2017 සමග සැසඳීමේදී 23.6% ක ඉහළ යාමක්) ලඟා වී ඇත. ශ්‍රී ලංකාවට සෘජු ගුවන් යානා නොමැතිව පවා පිලිපීනය නැගෙනහිර ආසියානු රටවල් ශ්‍රී ලංකාව සඳහා සංචාරක ගමනාන්තයක් ලෙස ඉහළ පස් වැනි ස්ථානය ගනී.

II. තානාපති කාර්යාලය 2018 පෙබරවාරි 9 සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමග 25 වන පිලිපීන සංචාරක නියෝජන සංගම් සංචාරය හා සංචාරක ප්‍රදර්ශනයට සහභාගි වූ අතර 2018 ඔක්තෝබර් හි අඛණ්ඩව දෙවන වසරටත් "2018 ලෝක වෙළඳ ප්‍රදර්ශනයට" සහභාගි වීමට සූදානම් වෙමින් සිටියි.

III. 2018 දෙසැම්බර් හි සංචාරක ජීවිතය සඟරාවෙන් සංචාරක මාධ්‍යවේදීන් දෙදෙනෙක් ශ්‍රී ලංකාවට එවීමට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමග සාකච්ඡා කෙරෙමින් පවතී.

IV. 2018 සැප්තැම්බර් 27 දින සීමාසහිත NKAR සංචාරක හා චාරිකා පුද්ගලික සමාගම සමග සහයෝගීතාවෙන් පිලිපීනයේදී බාහිර සංචාරක මෙහෙයුම්කරුවන් සමග අන්තර්ක්‍රියාකාරී සැසියක් සංවිධානය කරන ලදී.

5. සංස්කෘතික සබඳතා

I. "සංස්කෘතික රාජතාන්ත්‍රිකභාවය හරහා සබඳතා ශක්තිමත් කිරීම" - ශ්‍රී ලංකාවේ ජාතික දිනයට සමානව රාජතාන්ත්‍රික පිළිගැනීමක් 2018 පෙබරවාරි මස පැවැත්වුණි.

II. ශ්‍රී ලංකා ප්‍රජාව හා ශ්‍රී ලංකා ශිෂ්‍ය සංගමය සමග සහයෝගයෙන් ශ්‍රී ලංකා තානාපති කාර්යාලය "එරබදු මල් වසන්තය" - සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සව හා "බුද්ධ රශ්මි" ජාත්‍යන්තර වෙසක් දින උත්සව සංවිධානය කරන ලදී.

III. 2018 අප්‍රේල් මස ගෝලීය පුවත් ජාලය සමග "ශ්‍රී ලංකා ගමනාන්තය, ආසියාවේ ආශ්චර්ය" රූපවාහිනී සාකච්ඡා වැඩසටහන පවත්වන ලදී.

IV. "ආහාර රාජතාන්ත්‍රිකභාවය" - 2018 මැයි මස ABS-CBN පුවත් නාලිකා (ANC) රූපවාහිනී ජාලය හරහා ශ්‍රී ලංකාවේ ආහාර ප්‍රවර්ධනය කරන ලදී.

V. 2018 අප්‍රේල් මස ටාගුයිග් හා කොළඹ නගරය අතර "සොයුරු නගරය" සංකල්පයේ සංස්කෘතික හුවමාරුව සඳහා සාකච්ඡා ආරම්භ කරන ලදී.

VI. 2018 සැප්තැම්බර් මස "නැවුම් ශ්‍රී ලංකාව: ආසියාවේ ආශ්චර්ය" හිදී තානාපති කාර්යාලය ශ්‍රී ලංකාවේ පොහොසත් සහ අද්විතීය සංස්කෘතිය විදහා දක්වන ලදී.

VII. තෝරාගත් පිරිවෙන් වල ශ්‍රී ලංකාවේ සාමනේරවරුන් සඳහා ඉංග්‍රීසි භාෂා පාඨමාලාවලට සහාය වීමට පිලිපීනයේ බෞද්ධ බැතිමතුන් සමග සාකච්ඡා කෙරෙමින් පවතී.

ශ්‍රමික සුභසාධනය

i. ශ්‍රමික සහයෝගිතා අවබෝධතා ගිවිසුම්/ ගිවිසුම් ප්‍රමන්ත්‍රණය, එනම් හෙද සේවය සහ සත්කාරක ක්ෂේත්‍රයේ අවබෝධතා ගිවිසුමක් සහ 1978 STCW සම්මුතියේ විධිවිධාන යටතේ සහතික පළිගැනීමට අදාළ තවත් අවබෝධතා ගිවිසුමක් සම්පාදනය නිම වෙමින් පවතී.

ii. ශ්‍රී ලාංකික හෙද හෙදියන්, ගුරුවරුන්, නාවිකයන් සහ සත්කාරක අංශ සේවකයින් පුහුණු කිරීම පිණිස පිලිපීනයේ සම්භාව්‍ය පුහුණු ආයතන හා සමඟ සාකච්ඡා කෙරෙමින් පවතී.

iii. විදේශීය ශ්‍රමිකයින්ගේ සුභසාධනය, ඔවුන්ගේ ආරක්ෂාව සඳහා පිලිපීනය රජය විසින් සපයනු ලබන වඩාත් යහපත් සේවාවන් හඳුනාගැනීම පිණිස (සටහන: පිලිපීනය වූ කලී ලෝකයේ ප්‍රමුඛතම පුහුණු ශ්‍රමිකයින් සපයන රටකි) තාක්ෂණික අධ්‍යාපන සහ කුසලතා වර්ධන අධිකාරිය, පිලිපීන විදේශ සේවා නියුක්ති පරිපාලනය සහ විදේශීය ශ්‍රමික සුබසාධන පරිපාලනය යන ආයතන සමඟ ප්‍රමන්ත්‍රණයන් සිදු කෙරෙමින් පවතී.

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය - මියන්මාරය

1.ද්විපාර්ශ්වීය සබඳතා

I. ශ්‍රී ලංකා නිදහස් දින 70 වන සංවත්සරය සැමරුම, 2018 පෙබරවාරි මස 5-11 දිනවලදී, යැන්ගොන් හි, සුලේ ෂැන්ග්‍රි ලා හෝටලයේදී, ශ්‍රී ලාංකික ආහාරපාන උත්සවයක් පවත්වන ලදී.

II. ශ්‍රී ලංකාවේ ලගැල්මෙන් පීඩාවට පත් ජනතාවට මුනිෂිකය අධාරයක් ලෙස, සහල් මෙට්‍රික් ටොන් 300 ක් පිලිපීන රජය විසින් පරිත්‍යාග කෙරිණ. මෙම ප්‍රේෂණය, 2018 මාර්තු මස 29 වන දින ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් භාර ගන්නා ලදී.

III. පිලිපීන ඒකාබද්ධ ජනරජයේ ක්‍රම සම්පාදන සහ මුදල් රාජ්‍ය අමාත්‍යවරයා සහ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය අතර, ද්විපාර්ශ්වීය රැස්වීමක් 2018 අප්‍රේල් මස 19 වන දින නේපයිටෝ හි, ක්‍රම සම්පාදන සහ මුදල් අමාත්‍යාංශයේදී පවැත්විණ. මෙහිදී, දෙරට අතර අපනයන හා ආනයන අංශ සංවර්ධනය, කෘෂිකර්ම අංශයෙහි තාක්ෂණික දැනුම පහසුකරණ හුවමාරුව, මැණික් කර්මාන්තය සහ මියන්මාරයේ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ශාකමය ඖෂධ ආදිය සහ දෙරට අතර සෘජු ගුවන් ගමන් ආරම්භ කිරීම ආදී කරුණු සාකච්ඡාවට භාජනය විය.

IV. 2018 සැප්තැම්බර් මස 04 වන දින, නේපයි ටෝහි ජනාධිපති මාලිගයේදී, තම අක්තපත්‍ර පිරිනැමීමේ අවස්ථාවේදී, අප තානාපතිතුමා විසින් සංස්කෘතික සහ ආගමික සබඳතා ශක්තිමත් කිරීම, විදුලි සංදේශ වැනි ක්ෂේත්‍රයන්හි තාක්ෂණික විශේෂඥ දැනුම හුවමාරුව, ක්ෂුද්‍ර මුල්‍යකරණය, බැංකු අංශ, හෝටල් කර්මාන්තය, ගොඩනැගිලි සහ ඉදිකිරීම් ක්ෂේත්‍රය සහ දෙරට අතර සෘජු ගුවන් ගමන් ආරම්භ කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

V. 2018.11.02 වන දින, නේපයි ටෝහි විදේශ කටයුතු අමාත්‍යාංශයේදී, මියන්මාර ජනරජයේ විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමන් සහ රාජ්‍ය සහිකවරයා බැහැ දැකීමටද තානාපතිතුමා කටයුතු කළේය.

2.ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන

I. මියන්මාර ප්ලාස්ටික් කර්මාන්ත සංගමය විසින් සංවිධානය කරන ලද "කොම්ප්ලාස්ට් මියන්මාර්" ජාත්‍යන්තර ප්ලාස්ටික් ප්‍රදර්ශනය, 2018-6.15 වන දින යැන්ගොන්හිදී පැවැත්විණ. ස්වකීය ව්‍යාපාරික කටයුතු මියන්මාරයේ ප්‍රවර්ධනය කරලීම පිණිස ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සමාගම් 10 ක් සහ කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයේ නිලධාරීන් මෙම ප්‍රදර්ශනයට සහභාගී වූහ.

II. ශ්‍රී ලංකාවේ කොමර්ෂල් බැංකුවෙහි උපයෝගී සමාගමක් වන නව මියන්මාර් ක්ෂුද්‍ර මූල්‍ය කාර්යාලයක් 2018.07.16 වන දින නේ පයි ටෝ හි දී ආරම්භ කෙරිණ. දැනට, මෙම සමාගම මියන්මාරයේ නේ පයි ටෝ ප්‍රදේශයේ ක්ෂුද්‍ර මූල්‍යකරණ කටයුතුවල යෙදී සිටී.

III. ශ්‍රී ලංකාවේ සන්කෙන් ඕවර්සීස් (ප්‍රයිවට්) සමාගමෙහි උපයෝගී සමාගමක් වන, සන්කෙන් ඕවර්සීස් (මියන්මාර) සමාගම 2014 වසරේ සිට මියන්මාරයෙහි ස්වකීය මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කරමින් සිටින අතර, මියන්මාරයෙහි ස්වකීය ව්‍යාපාර කටයුතු ව්‍යාප්ත කරලීම පිණිස, යැන්ගොන්හි, සුලේ ෂැන්ග්‍රි ලා හෝටලයෙහිදී, 2018.08.14 වන දින "දැනුම් මිත්‍රත්වයේ සැන්දෑවක්" යන තේමාව යටතේ ඉසව්වක් සංවිධානය කෙරිණ.

3. සංස්කෘතික සබඳතා

I. මියන්මාර රජය විසින් මෑතකදී ශ්‍රී දළදා මාලිගාව වෙත ප්‍රදානය කරන ලද දළ හස්තියා පරීක්ෂා කිරීම පිණිස, ශ්‍රී ලංකාවේ මහනුවර, ශ්‍රී දළදා මාළිගාව විසින් කරන ලද ආරාධනයක් පරිදි, මියන්මාර ජනරජයේ, ස්වාභාවික සම්පත් සහ පරිසර සංරක්ෂණ අමාත්‍යාංශයේ නිලධාරීහු, 2018 අගෝස්තු මස 22-28 දක්වා, ශ්‍රී දළදා මාළිගාවේ සංචාරයක නිරත වූහ.

II. ශ්‍රී ලංකාවේ මහනුවර, ශ්‍රී දළදා මාළිගාව විසින් කරන ලද ආරාධනයක් පරිදි, දෙරටේ, ශ්‍රී දළදා මාළිගා දෙක අතර, සංස්කෘතික සහ ආගමික සබඳතා තර කිරීම පිණිස, යැන්ගොන්, ශුද්ධ ෂ්වෙඩැගොන් පැගෝඩාවේ භාරකාර මණ්ඩලයේ, සාමාජිකයින් දෙදෙනෙකු 2018 අගෝස්තු මස 22-28 දක්වා, ශ්‍රී දළදා මාලිගාවේ සංචාරයක නිරත වූහ.

III. මියන්මාර සැදැහැවතුන් විසින්, මියන්මාරයේ ප්‍රමුඛ කඩඉම් ලකුණක් සේ සැලකෙන, ශුද්ධ ෂ්වෙඩැගොන් පැගෝඩාවේ ප්‍රතිකෘතියක් මාතලේ ස්ථාපිත කරනු ඇත. මෙම ප්‍රතිකෘතිය, 2017.11.28 වන දින මාතලේදී, අතිපූජ්‍ය මුගුණුවෙල අනුරුද්ධ හිමියන් වෙත ප්‍රදානය කෙරිණ.

IV. 2018 මැයි මස 22-25 දක්වා, මියන්මාර ජාතික ආගමික නායකයින් විසින්, සාමය, සාධාරණත්වය සහ සංහිඳියාව ශක්තිමත් කිරීම පිණිස, ඉහළ මට්ටමේ ජාත්‍යන්තර බහු-ආගමික නියෝජනයන් උදෙසා සංවිධානය කරන ලද, 'සාමය උදෙසා ආගම් සම්මන්ත්‍රණයට සහභාගී වීම පිණිෂ අමරපුර සහා නිකායේ උත්තරීතර සංඝනායක, අග්ග මහා පණ්ඩිත අතිපූජ්‍ය කොටුගොඩ ධම්මාවංශ මහා නායක හිමියෝ, පූජ්‍ය මහාචාර්ය මැදවච්චියේ ධම්මජෝති හිමියන් කැටුව මියන්මාරයට වැඩම කළහ.

V. ශ්‍රී ලංකාවේ, ගල්දූව, යෝගාශ්‍රම, වර්තමාන අධිපති, අතිපූජ්‍ය පහලවිටියල, ජනානන්ද නායක හිමියෝ ප්‍රධානත්වයෙන්, ස්වාමීන් වහන්සේ 09 නමක් සහ ගිහියන් 05 දෙනකුගෙන් යුත් බෞද්ධ නියෝජිත පිරිසක් සහ මියන්මාරයේ ආශ්‍රමවල වැඩ වාසය කරන/

අධ්‍යපානය ලබන ශ්‍රී ලාංකික ස්වාමින් වහන්සේලා කිහිප නමක් 2018 අගෝස්තු මස 11 වන දින ශුද්ධ ස්වැන්ඩාගොන් පැගෝඩාවෙහි පැවැති බෝධි පූජාවකට සහභාගී වූහ.

VI. යැන්ගොන්, ශුද්ධ ෂ්වෙඩැගොන් පැගෝඩාවේ භාරකාර මණ්ඩලයේ, ආරාධනය පරිදි, මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ නියෝජිත පිරිසක්, 2018 නොවැම්බර් මස 20-26 දින මියන්මාරයේ චාරිකාවක නිරත වූහ.

VII. මහෝපාධ්‍ය, ශ්‍රී ලංකාවේ, ගල්දූව, යෝගාශ්‍රම සංස්ථා, වර්තමාන අධිපති, ගාල්ලේ, ශ්‍රී ලංකා ඥානෝභාස භාවනා මධ්‍යස්ථානයේ විහාරාධිපති, පූජ්‍ය කහගොල්ලේ සෝමවංශ මහා නායක හිමි සහ දිදුල රූපවාහිනි නාලිකාවේ අධිපති, පූජ්‍ය මාලිගාවිල අස්සජී හිමි ප්‍රධාන නියෝජිත පිරිසක් (පූජ්‍ය පක්ෂය 30ක් සහ ගිහි පිරිස 300)- 2018.12.10 දින ශුද්ධ ෂ්වෙඩැගොන් පැගෝඩාවේදී, විශේෂ බෞද්ධාගමික වතාවත්වල නිරත වූහ.

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය - හැනෝයි

1. ද්විපාර්ශ්වීය සබඳතා

I. විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය, ගරු ඩැන් ඩින්කයුයි මහතාගේ ප්‍රධානත්වයෙන් යුත්, නියෝජිත පිරිසක්, 2018 අප්‍රේල් මාසයේදී කොළඹ දී පැවති 3 වන ශ්‍රී ලංකා - වියට්නාම් දේශපාලන උපදේශන රැස්වීමට සහභගී වූහ.

II. කථානායක, ගරු කරු ජයසූරිය මහතා 2018 අප්‍රේල් මස 23-27 දින වියට්නාමයේ නිල චාරිකාවක නිරත විය. මෙම සංචාරයේදී, එතුමා විසින් ශ්‍රී සර්වඥ ධාතූන්වහන්සේලා වියට්නාමයට පූජා කරන ලදී.

III. 2018 ජූනි මාසයේදී, වියට්නාමයේ කොමියුනිස්ට් පක්ෂයේ, මධ්‍ය කාරක සභාවේ බාහිර සබඳතා පිළිබඳ කොමිෂන් සභාවේ, පළමුවන උපසභාපති, ට්‍රාන් ඩේලොයි මහතා ශ්‍රී ලංකාවෙහි නිල චාරිකාවක නිරත විය.

IV. වියට්නාමයේ, ජාත්‍යන්තර DSDI ජාත්‍යන්තර නියෝජ්‍ය ප්‍රධානි, ජ්‍යෙෂ්ඨ කර්නල් නිගුයෙන් ටකාන්ග් ක්ෂුඅන් මහතා 2018 අගෝස්තු මස 30-13 දින කොළඹ පැවැති ආරක්ෂක සම්මන්ත්‍රණයකට සහභාගී විය.

V. බුද්ධ ශාසන අමාත්‍ය, ගරු ගාමිණී ජයවික්‍රම මහතා 2018 සැප්තැම්බර් මස 2-27 වන දින, වියට්නාමයේ සංචාරයක නිරත විය.

VI. විදේශ කටයුතු අමාත්‍යාංශයේ, බහුපාර්ශ්වීය කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සහ මුදල් අමාත්‍යාංශයේ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කොළඹ ක්‍රමයේ විධායක කමිටු රැස්වීමට සහභාගීවීම (ඔක්තෝබර් මස 29-31) පහසුකරණය කෙරිණ.

VII. ශ්‍රී ලංකාවේ, දේශපාලන වර්ධනයන් සම්බන්ධයෙන් දැනුවත් කිරීමට සහ අන්‍යොන්‍ය වැදගත්කමකින් යුත් කරුණු සාකච්ඡා කිරීම පිණිස, තානාපතිතුමා, වියට්නාමයේ, විදේශ කටයුතු අමාත්‍යාංශයේ, දකුණු ආසියා සහ දකුණු ශාන්තිකර දෙපාර්තමේන්තුවේ, දකුණු ආසියා කලාප අධ්‍යක්ෂ ජෙනරාල්, න්ගුඅයෙන් ටැට් තාන් මහතා සමු විය.(නොවැ.21)

VIII. ඩානාන්වල පැවැති, 37 වන විධායක කමිටු රැස්වීමට සහ සිටි නෙට් ජාත්‍යන්තර සම්මන්ත්‍රණය, කොළඹ ගරු නගරාධිපතිවරයාගේ සහභාගිත්වය පහසුකරණය කෙරිණ. (නොවැ. 21-22)

IX. වියට්නාමයේ සංචාරයේ යෙදෙන හෝ පදිංචිව සිටින ශ්‍රී ලාංකිකයින් විසින් මුහුණ පානු ලබන කොන්සියුලර් සහ වීසා ගැටළු සම්බන්ධයෙන් තානාපතිතුමා, න්ගුඅයෙන් ති හුඅංලං මහත්මය සමු විය.

2. බහු පාර්ශ්වීය සබඳතා

I. 2018 මාර්තු මස 5-9 දින, හැනෝයි හි පැවැති, අග්නිදිග ආසියා ජාතීන්ගේ සංගමයේ, කලාපීය සංසද විශේෂඥ සහ විශාරද පුද්ගල රැස්වීමට, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අමල් ජයවර්ධන මහතාගේ සහභාගිත්වය පහසුකරණය කෙරිණ.

II. 2018 මාර්තු මස 07 දින, MOLISA සහභාගිත්වයෙන්, ඇක්ෂන් ඒඩ් ආයතනය විසින් සංවිධානය කරන ලද, සත්කාරයෙන් තොර කාර්ය පර්යේෂණ ප්‍රතිඵල බෙදහදා ගැනීමේ වැඩමුළුවට තානාපතිතුමා සහභාගී විය.

III. 2018 මාර්තු මස 15-16 දක්වා, හැනෝයි හි පැවැති, "ප්‍රත්‍යස්ථ ආහාර සහ කෘෂිකර්ම ක්‍රමවේද පිළිබඳ කලාපීය සම්මන්ත්‍රණයේ ශ්‍රී ලංකා සහභාගිත්වය පහසුකරණය කෙරිණ.

IV. ගෝලීය පාරිසරික දිනය සනිටුහන් කිරීම පිණිස, තානාපතිතුමන් විසින් ප්ලාස්ටික් දූෂණය මැඩ පැවැත්වීමේ ක්‍රියාකලාප සංග්‍රහයට අත්සන් තැබිණ. එය, වියට්නාමයේ තිරසාර සංවර්ධනයට සහය වන තානාපති කාර්යාල සහ ජාත්‍යන්තර පාර්ශ්වකරුවන්ගේ ප්ලාස්ටික් දූෂණ උපදේශන ව්‍යාපාරයෙහි කොටසක් වූ අතර, පසුවිපරම් ක්‍රියාදාම 4 කට සහභාගී වූහ.(ජූනි 04).

V. ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යතුමන්ගේ හා නියෝජිත පිරිස ඉන්දියන් සාගර සම්මන්ත්‍රණයට සහභාගී වීම පහසුකරණය කෙරිණ.

VI. APCSS විද්‍යාසේවීන් සමඟ එක්සත් ජනපදයේ නව ඉන්දු-ශාන්තිකර ක්‍රමවේදය පිළිබඳ අනියම් සාකච්ඡාවක් සඳහා, HCP-NAP සහ APCSS විසින් ඒකාබද්ධව සංවිධානය කරන ලද "ඉන්දු-ශාන්තිකර කලාපීය ආරක්ෂාව සහ සහයෝගිතාව පිළිබඳ වත්මන් වෙනස්කම්"

සම්මන්ත්‍රණයට (සැප්තැම්බර් 04) සහභාගී වන ලෙස තානාපතිතුමන්ට ආරාධනය කෙරිණ.

VII. 2018 සැප්තැම්බර් මස 10-13 පවත්වන ලද අග්නිදිග ආසියා ජාතීන්ගේ සංගමය පිළිබඳ ලෝක ආර්ථික සංසදයට ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යතුමන්ගේ සහභාගිත්වය පහසුකරණය කරන ලද අතර, ගරු අග්‍රාමාත්‍යතුමන් සඳහා අප්‍රධාන ද්විපාර්ශ්වික රැස්වීම් 10 ක් සංවිධානය කෙරිණ.

VIII. ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමිෂන් සභාවෙහි ස්ථානයක් සඳහා වියට්නාමයේ අයැදුම සහ දෙරටේ අනෙකුත් අයැදුම් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම පිණිස තානාපතිතුමා, වියට්නාම විදේශ කටයුතු අමාත්‍යාංශයේ, ජාත්‍යන්තර නීති සහ ගිවිසුම් දෙපාර්තමේන්තුවේ, අධ්‍යක්ෂ ජෙනරාල්, ලී ති ටියෙට් මායි මහතා හමුවිය.

IX. තානාපතිතුමා, ඩා නාන්ග් නුවර, ෂෙරටන් හෝටලයේදී (නොවැම්බර් 8-9) DAV FESS and VLA විසින් සංවිධානය කරන ලද, කලාපීය ආරක්ෂාව සහ සංවර්ධනය සඳහා වූ දකුණු චීන සමුද්‍ර ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ 10 වන සැසියට සහභාගී විය.

X. හැනෝයි නුවර පැවැති (නොවැම්බර් 19-21) සෞඛ්‍යය සඳහා මානව සම්පත් මත 10 වන ආසියා ශාන්තිකර ක්‍රියාකාරී සන්ධාන සැසියට සහභාගී විය

XI. තානාපතිතුමා, UNIS-HANOi විසින් සංවිධානය කරන ලද, එක්සත් ජාතීන්ගේ දින සැමරුම් උත්සවයට සහභාගී විය.

XII. වියට්නාමයේ, සංක්‍රමණික කාන්තාවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ පර්යේෂණ වාර්තාව මත උපදේශන වැඩමුළුවේ අත්දැකීම් බෙදා හදා ගැනීම පිණිස විශේෂ ආරාධිතයෙකු ලෙස තානාපතිතුමා සහභාගී විය.

3.ආර්ථික සබඳතා

I. ශ්‍රී ලංකාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස ශ්‍රී ලංකා හා වියට්නාම කාර්ය මණ්ඩල සමඟ කටයුතු කිරීමේදී, වියට්නාමයේ කටයුතු කරද්දී දැනෙන ආකාරය කෙසේද යන්න සහ බහු-සංස්කෘතිකමය පරිසරයක ගැටලු නිරාකරණය කර ගන්නේ කෙසේද සම්බන්ධයෙන් පැවැති සාකච්ඡාවකට (ජූනි 07) තානාපතිතුමා සහභාගී විය.

II. ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යතුමා වියට්නාමයේ සංචාරය කළ අවස්ථා දෙකින් එකකදී, JCCI ප්‍රමුඛ සමාජිකයින් සමඟ අන්තර්ක්‍රියාකාරී සැසියක් සංවිධානය කර ගැනීම සාකච්ඡා කිරීම පිණිස තානාපතිතුමා, වියට්නාමයේ, JCCI අධ්‍යක්ෂ ජනරාල් සමඟ රැස්වීමකට (අගෝස්තු 09) සහභාගී විය.

III. සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා සඳහා, JCCI සාමාජිකයින් සමඟ රැස්වීමක් (සැප්තැම්බර් 11) සංවිධානය කරන ලදී.

IV. නොවැම්බර් මස 15-26 දක්වා, සුනිමල් අත්කම් පිළි සමාගම් හිමිකාරිණී, රුචිනී ලියනගේ මහත්මිය සඳහා ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට පදනමින් රැස්වීමක් සංවිධානය කරදෙන ලදී.

V. ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ ප්‍රවර්ධන ඉසව්වක් සංවිධානය කරන ලදී. (නොවැම්බර් 25)

VI. ශ්‍රී ලංකා සහ වියට්නාම යන දෙපාර්ශ්වයෙන්ම ලද වෙළඳ විමසුම් 13 ක් සම්බන්ධයෙන් පහසුකරණයෙහි යෙදුණි.

4. විදේශීය ආයෝජන

I. FPT විශ්වවිද්‍යාලයක් ස්ථාපිත කිරීමේ හැකියාව අධ්‍යක්ෂණය කිරීමට සහ ශිෂ්‍ය හුවමාරුව සම්බන්ධයන් සාකච්ඡා කිරීමට FPT විශ්වවිද්‍යාලයේ නියෝජිත පිරිසක් සඳහා රැස්වීම් සම්බන්ධීකරණය.

II. වියට්නාමයේ ප්‍රාතිපදික, ඒසියා- නෝර්ඩික් කොන්සල්ට් විසින් මෙහෙයවනු ලබන මූල්‍ය ආයතන සමූහයක් විසින් "කසළින් බලශක්තිය" ව්‍යාපෘතිය ආයෝජනය කිරීම සම්බන්ධීකරණය කෙරිණ.

III. වියට්නාමයේ ප්‍රාතිපදික, ජපන් ආයෝජකයෙකු විසින් හෝටල ව්‍යාපෘතියක (වෙරළාසන්න නිවාඩු නිකේතනයක් සහ ගොල්ෆ් පිට්ටනියක් සහ කාමර 100-200 ක කඳුරට හෝටලයක්)

IV. "වියට්නාමයේ විදේශීය ආයෝජන දියත් කිරීමේ 30 වසරක් : නව දැක්ම, නව යුගයක නව අවස්ථා" සම්මන්ත්‍රණයට (ඔක්තෝබර් 04) සහභාගී විය.

5. සංචාරණය ප්‍රවර්ධනය

I. වියට්නාමයේ චාරිකා නියෝජිතයින් සහ මාධ්‍ය පිරිස්වලට ශ්‍රී ලංකාවේ FAM චාරිකා 03 ක් සංවිධානය කිරීමට අවශ්‍ය මූලික පියවර නිමකර ඇත.

II. වියට්නාම ජායරූප දින 65 වන සංවත්සරය සනිටුහන් කරමින්, 2018 මාර්තු මස 17-25 දක්වා, VAP විසින් සංවිධානය කරන ලද ප්‍රදර්ශනයට සහභාගී විය. මෙයට ශ්‍රී ලංකාව ඇතුළු රටවල 25 ක ජායාරූප ඇතුළත් විය.

III. 1999 දී යුනෙස්කෝව විසින් ලෝක උරුමයක් ලෙස නම්කරන ලද පුරාණ නගරයක් වන, හොයි ඇන් හි, ඇන් හොයි මූර්තිකලා උද්‍යානයෙහි, පවත්වන ලද හොයි ඇන් ජාත්‍යන්තර උත්සවයේ 3 වන සංස්කරණයට සහාය දී සහභාගී වන ලදී.

IV. ශ්‍රී ලංකා 70 වන නිදහස් සංවත්සරය මෙන්ම, ශ්‍රී ලංකාව සහ වියට්නාමය අතර 48 වසරක රාජ්‍යතාන්ත්‍රික සබඳතා සැමරීම පිණිස හැනෝයි හා, වියට්නාම කාන්තා කෞතුකාගාර භූමියෙහි පවත්වන ලද තෙදිනක සංස්කෘතික මේලාව (අප්‍රේල් 27-29) සංවිධානය කරන ලදී. වියට්නාමයේ මාධ්‍ය ආවරණ අවස්ථා 32ක් ඇතුළත් විය.

V. ශ්‍රී ලංකාවේ, රණාරංග නාට්‍ය කලායතනයේ නැටුම් කණ්ඩායමක් අප්‍රේල් 27- මැයි 2 දක්වා පැවැති 10 වන හ්‍යූ උත්සවයට සහභාගී විය.

VI. ශ්‍රී ලංකාවේ වර්ණවත් අත්යන්ත්‍ර කපු රෙදි පිළි සහ කපු මිශ්‍රිත රෙදි පිළි වර්ධනය සඳහා විලාසිත මේලාවක්, "විලාසිතා හරහා වියට්නාම සහ ශ්‍රී ලංකා මිත්‍රත්වය සැමරුම" මැයි 24 වන දින සංවිධානය කෙරිණ.

VII. හැනෝයි හි එතෙර චාරිකා මෙහෙයවන්නන් සමග අන්තර්ක්‍රියාකාරී සැසියක් , 2018 ජූලි මස 26 වන දින, සංවිධනය කෙරිණ.

VIII. හැනෝයි වර්ණ පාෂාණ ප්‍රාකාරයෙහි ශ්‍රී ලංකා කලා කෘති නිර්මාණය කිරීම සම්බන්ධීකරණය කෙරිණ.

IX. ශ්‍රී ලංකාවේ බතික් ප්‍රවර්ධනය සඳහා ශ්‍රී ලංකාවේ සමකාලීන බතික් කලා ශිල්පී සහ නිර්මාණකාරිණී, සොනාලි ධර්මවර්ධන මහත්මියගේ විලාසිතා දැක්මක් (ඔක්.09) සංවිධානය කෙරිණ.

X. තානාපතිතුමා, ශ්‍රී ලංකාවේ කැළණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධිත, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ වියට්නාමයේ පුරාවිද්‍යා ආයතනය අතර ඉස්මතු කර ගත හැකි සහයෝගිත්වය සාකච්ඡා කිරීම පිණිස හැනෝයිහි, සමාජ විද්‍යා ඇකඩමියට අනුබද්ධිත, වියට්නාම පුරාවිද්‍යා ආයතනයේ විද්වතුන් සහ පර්යේෂකයින් (ඔක් 31) හමුවිය.

XI. ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික බෙර වාදනයක් සමග 2018 චැරිටි බසාර්හිදී ශ්‍රී ලංකා මණ්ඩපයක් සංවිධානය (නොවැ.18)කෙරිණ.

XII. වියට්නාම් දේශීය විශේෂත්ව මේලාවේදී (නොවැම්බර් 21-23) ශ්‍රී ලංකා මණ්ඩපයක් සංවිධානය කෙරිණ.

XIII. ශ්‍රී ලංකා සංචාරණය ප්‍රවර්ධනය කිරීමක් සමඟ (දෙසැ.01) තානාපති නිල නිවසේදී, ශිෂ්‍ය සමුගැනීම් සාදයකට පහසුකම් සැපයිණ.

XIV. තානාපති නිල නිවසේදී, වසන්ත පෙරේරා චිත්‍ර ශිල්පියාගේ "මගේ සුන්දර ශ්‍රී ලංකා " චිත්‍ර ප්‍රදර්ශනය සංවිධානය කෙරිණ.

6. සංස්කෘතික සබඳතා

I. ශාක්‍ය රාජධානි අධ්‍යාත්මික මධ්‍යස්ථානයෙහි, වියට්නාම බෞද්ධ මණ්ඩපයක් ඉදිකිරීම පිණිස, ජනවාරි මස 5-8 දක්වා, ආසියා ලෝක පදනමෙහි සභාපති, නවීන් ගුණරත්න මහතාගේ වියට්නාම සංචාරය පහසුකරණය විය.

II. කුරුණෑගල, නිකවැරටිය, තරුණ සේවා සභාව විසින් සංවිධානය කරන ලද, "යොවුන්පුර තරුණ උත්සවයට" (මාර්තු 28-අප්‍රේල් 01) වියට්නාම ශිෂ්‍යයින් 05 දෙනෙකු සහභාගීවීම පහසුකරණය කෙරිණ.

III. හැනෝයි ළමා මාළිගය සමග සහයෝගිත්වයෙන්, HAUFO විසින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර ළමා දිනය (ජූනි 06) සැමරුමේදී, "හැනෝයි: සාමකාමී පුරවරයට මා ආදරෙයි" තේමාවෙන්, ජාත්‍යන්තර චිත්‍ර තරඟයට සහාය වන ලදි. මෙම තරඟයට ශ්‍රී ලාංකීය දරුවන් ඇතුළු දරුවන් 100 ක් පමණ ආකර්ෂණය විය.

IV. වියට්නාමයේ වෙසක් උත්සවය, ශ්‍රී ලංකා 70 වන නිදහස් සැමරුම සහ ශ්‍රී ලංකාව සහ වියට්නාමය අතර 48 වසරක රාජ්‍යන්තර සබඳතා සමරමින්, හැනෝයි නුවර ක්වන් සු පැගෝඩා භූමියේදී (VBS මූලස්ථානය) 'සිද්ධාර්ථ: බුදුහිමි' චිත්‍රපට ප්‍රදර්ශනය සංවිධානය කෙරිණ.

V. හැනෝයිහි, නෙළුම් සමය සහ ශ්‍රී ලංකා සංස්කෘතියෙහි නෙළුම් ගැන ස්වකීය අදහස් බෙදාහදා ගැනීම පිණිස, තානාපතිතුමිය විසින් නෙට් වියට්නාම් රූපවාහිනියෙහි,"ෂෙයාරිං වියට්නාම්" නමින්, සංවාදයක යෙදෙන ලදී. (ජූලි 3 වන දින පටිගතකරන ලද අතර, ජූලි 24 විකාශනය විය)

VI. ශ්‍රී ලාංකික සහභාගීවන්නන් ද සහිතව, VNAM හිදී, "ශ්‍රී ලංකා-වියට්නාම් මිත්‍රත්වය ප්‍රසංගය" සංවිධානය කරන ලදී. (ජූනි 23)

VII. 2019 එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර වෙසක් දින උත්සවය පැවැත්වීමට නියමිත, ටෑම් චුක් පාගෝඩාවෙහිදී, විශේෂ නියෝජිත පිරිසක් විසින් වැඩම වන ලද ශ්‍රී මහා බෝධි අංකුරයක් රෝපණය කිරීම පහසුකරණය කෙරිණ.(ජූලි 22)

VIII. බැන්ග් පැගෝඩාවෙහිදී, කෘතඥතාවයේ ස්ථූපයෙහි සර්වඥ ධාතු නිදන් කිරීමේ කටයුත්තට සහාය වන ලදී.(අගෝස්තු 19)

IX. වියට්නාමයේ ජාතික දිනය සැමරීම පිණිස (සැප්තැම්බර් 02) පැවැත්වෙන උත්සවයක් වන, හැනෝයි නෘත්‍ය ශාලාවේ, "නොනැසෙන දේ" ප්‍රසංගයෙදී, වියට්නාම පුවත්පත් විසින් තානාපතිතුමිය හා සම්මුඛ සාකච්ඡාවක් පැවැත්විණ.

X. ක්‍රමාගත තෙවන වසරේ සේවයේ නියුතු තානාපතිතුමිය, ස්වකීය නිල නිවසේදී, වියට්නාම කාන්තා දිනය සැමරීම පිණිස (ඔක්තෝබර් 02) පද්ධති සුහඳ හමුවක් පවත්වන ලදී.

XI. හැනෝයි ජාත්‍යන්තර චිත්‍රපට උළෙල්දී (ඔක්තෝබර් 30-31) සුමිත්‍රා පීරිස් මහත්මිය විසින් අධ්‍යක්ෂණය කරන ලද "රුක් දේවතාවා" සහ සුදත් අබේසිරිවර්ධන මහතා විසින් අධ්‍යක්ෂණය කරන ලද "මගේ ගමන්මග කොහිද?" යන චිත්‍රපටය ඇතුළත්, 2018 හැනෝයි චිත්‍රපට උළෙලේ ශ්‍රී ලංකා නියෝජනය පහසුකරණය විය.

XII. අන්ධ සහ අඩ වශයෙන් අන්ධ තරුණ පිරිස්වලින් සමන්විත "අපේක්ෂාවේ ගායක කණ්ඩායමට" අරමුදල් රැස් කිරීම පිණිස නත්තල් ගීතිකා සහිත මිත්‍රත්ව ප්‍රසංගය සංවිධානය කෙරිණ. (දෙසැම්බර් 02)

XIII. වියට්නාම විදේශ කටයුතු අමාත්‍යාංශයේ 5 වන ආහාරපාන මේලාවේ, ශ්‍රී ලංකා මණ්ඩපය සංවිධානය කෙරිණ.

ආර්ථික කටයුතු අංශය

ආර්ථික කටයුතු අංශය

ආර්ථික කටයුතු බහුපාර්ශ්වීය අන්තර්ජාතික හා තාක්ෂණික සහයෝගිතා සම්බන්ධ ක්‍රියාකාරකම් ආර්ථික කටයුතු අංශය වෙත පැවරී ඇත. විදේශීය රාජ්‍යයන් හා සංවිධාන සමඟ ද්විපාර්ශ්වීය හා බහුපාර්ශ්වීය සම්බන්ධතා ගොඩනඟා ගැනීම හරහා ශ්‍රී ලංකාවට ප්‍රතිලාභ අත්කරදීමේ අපේක්ෂාවෙන් වෙළඳාම, ආයෝජන, තාක්ෂණික සහයෝගිතාව, සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය සහ තේ ප්‍රවර්ධනය සහ අංවර්ධන සහය යනාදී ක්ෂේත්‍ර සම්බන්ධ රාජ්‍ය නියෝජිත ආයතන හා සමීපව සම්බන්ධීකරණ කටයුතු කිරීමට මෙම අංශය ක්‍රියා කරයි.

එලෙසම මෙම අංශය සෙසු අමාත්‍යාංශයක් සඳහා අවශ්‍ය කෙරෙන උසස් රාජ්‍ය තාන්ත්‍රික ආර්ථික කටයුතු සඳහා සහය ලබාදීමේ සහ සෘජු විදේශ ආයෝජන ආකර්ශනය කර ගැනීම සඳහා ව්‍යාපාර/ආයෝජන ආශ්‍රිත රැස්වීම් සංවිධානය කිරීමේ දී ප්‍රධාන භූමිකාවක් නිරූපනය කරයි.

අනෙකුත් රාජ්‍යයන් සමඟ ආර්ථිකයේ නව පිබිදීමක් ඇතිකිරීමට උරදෙන පහසුකම් සළසන්නෙකු වශයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශය 2018 වර්ෂය තුළ දී සිය කර්තව්‍යය නිසි ලෙස ඉටුකරන ලදී. විදේශ කටයුතු අමාත්‍යාංශයේ ආර්ථික කටයුතු අංශය ආයෝජන ආකර්ෂණය කරගැනීම සහ සංචාරක ව්‍යාපාරය හා විදේශ රැකියා අවස්ථා ප්‍රවර්ධනය ඇතුළුව ශ්‍රී ලාංකික නිෂ්පාදන සහ සේවා සඳහා සුදුසු ශක්තිමත් වෙළඳපොළවල් විමසා බැලීම සම්බන්ධව මූලික වශයෙන් වග කියනු ලැබේ.

එසේම, මෙම අංශය වෙළඳාම ප්‍රවර්ධනය, ආයෝජනය, සංචාරක ව්‍යාපාරය සහ අනෙකුත් ආර්ථික ක්‍රියාකාරකම් සඳහා වගකිවයුතු රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය සිදුකරයි.

01 <u>රාජ්‍යතාන්ත්‍රික ආර්ථික කටයුතු</u>

ශ්‍රී ලංකා රජයේ රාජ්‍යතාන්ත්‍රික ආර්ථික කටයුතු සඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වසර තුනකින් ක්‍රියාවට නැංවෙන වැඩසටහනක් ආර්ථික කටයුතු අංශය මඟින් හඳුන්වාදෙන ලදී. මෙම වැඩසටහන ප්‍රධාන සංරචක ත්‍රිත්වයකින් සමන්විත වේ.

1 දූතමණ්ඩල සඳහා අවශ්‍ය කෙරෙන ආර්ථික දර්ශක හා කාර්යසාධක ඉලක්කයන් (EIPTM)
2 ශ්‍රී ලංකාවේ තෝරාගන්නා ලද වෙළඳපොලවල් සඳහා ආර්ථික ප්‍රවර්ධනයන් සහ
3 ශ්‍රී ලංකා විදේශ සම්බන්ධතා හා රාජ්‍යතාන්ත්‍රික ආර්ථික සංවාදයන්

රාජ්‍යතාන්ත්‍රික ආර්ථික කටයුතු හරහා ශ්‍රී ලංකාව සෙසු දේශයන් හා ගොඩනඟාගත් සම්බන්ධතා ශක්තිමත් කරගැනීමට අවශ්‍ය කෙරෙන දායකත්වය මෙම එක් එක් අනුවැඩසටහන් මඟින් සපයනු ලැබේ.

1. දූතමණ්ඩල සඳහා ආර්ථික ඉලක්ක

තානාපති කාර්යාල සඳහා කාර්ය සාධන ඉලක්කයන් හඳුන්වාදීම මඟින් විදේශ සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය අපේක්ෂා කරනුයේ වැඩි සම්පත් ප්‍රමාණයක් පිබිදෙන හෝ

විභව වෙළඳ සැල් වෙත වෙන්කරන අතරතුර ශක්තිමත් වෙළඳපොළවල් වෙත සම්බන්ධ වීම වර්ධනය කිරීම හා ස්ථාන හඳුනා ගැනීමයි. මෙවැනි උපාය මාර්ගික සම්පත් වෙන් කිරීම මඟින් විදේශ කටයුතු අමාත්‍යාංශයට විවිධ දේශයන් සමඟ සංසක්ත ආකාරයට කටයුතු කිරීමට හා එය උපරිම කිරීමට හැකියාව ලැබේ.

11 ඍජු මැදිහත්වීමක් සහිත ආධාර ප්‍රවර්ධන ක්‍රියාකාරකම් ද්විතීය සංරචකයන් ලෙස රටට හඳුන්වාදුන් නිසි මාර්ග හඳුනාගැනීම සඳහා අනු වැඩසටහනක් වන "ශ්‍රී ලංකා ආර්ථික ප්‍රවර්ධන" වැඩසටහන මඟින් ශ්‍රී ලංකාවට තවදුරටත් තම කටයුතුවල නිරතවීමේ හැකියාව ලැබී තිබේ. එක් එක් වෙළඳපළවල්වල විවිධ ශක්තීන් පවතින බැවින් එකී ශක්තීන්ට ගැළපෙන ප්‍රවර්ධන උපාය මාර්ගයන් යෝජනා කෙරෙන අතර, ප්‍රධාන වෙළඳපළවල් හඳුණාගැනීම සඳහා මෙම අනුවැඩසටහන නිර්මාණය කරන ලදී. මෙම වැඩසටහන හරහා අමාත්‍යාංශය විසින් 2018 වර්ෂයේ දී ඍජුව රාජ්‍ය තාන්ත්‍රික වැඩසටහන් සංවිධානය කිරීමට හා අවශ්‍ය අරමුදල් ඍජුව සැපයීමට කටයුතු කරන ලද අතර, 2019 වර්ෂයේ දී ද අමාත්‍යාංශ හා පෞද්ගලික අංශයේ සහයෝගය ඇතිව එකී වැඩසටහන් සංවිධානය කිරීමට අපේක්ෂිතය.

ශ්‍රී ලංකාවේ ගෝලීය පියසටහන් වර්ධනය කිරීමට සහ ස්පෘෂ්‍ය ආර්ථික ප්‍රතිලාභයක් මෙරටට අත්කරදීම සඳහා පිබිදෙන වෙළඳපොළවල්වල පිහිටා තිබෙන ශ්‍රී ලංකා දූතමණ්ඩල 11 ක් ඉලක්කගත වැඩ පිළිවෙල දියත් කිරීමෙන් පහසුකම් සලසා ඇත. මෙකී ප්‍රවර්ධන අවස්ථාවන් පුළුල් පරාසයකට අයත් වන අතර, ඒ යටතේ ස්විඩනයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ, නිෂ්පාදන හා සේවා මෙන්ම, කාබනික ආහාර නිෂ්පාදන දකුණු අප්‍රිකාවේ ඇඳුම් පැළඳුම් විලාසිතා හා පාවහන් බහරේන්හි නැවුම් හා කෘත්‍රිමව නිෂ්පාදනය කළ ආහාර බ්‍රසීලයේ විදුලි උපකරණ, සංචාරක හා ඇඳුම් පැළඳුම්, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සංචාරක ව්‍යාපාරය, ජපානය හා කොරියානු ජනරජයේ අභ්‍යන්තර ආයෝජන වැඩසටහන් ආදිය අන්තර්ගත වේ. ඒ අනුව, අමාත්‍යාංශය සියලු පාර්ශ්වකරුවන් හා සහයෝගයෙන් යුතුව අපනයන සංවර්ධන මණ්ඩලය විසින් දියත් කරන ලද ජාතික අපනයන උපාය මාර්ග (NES) අවධානය යොමු කරනු ලබන ප්‍රධාන ක්ෂේත්‍රවලට සමගාමීව මෙම වැඩසටහන් තෝරා ගෙන ඇත.

111 ශ්‍රී ලංකා විදේශ සම්බන්ධතා හා රාජ්‍යතාන්ත්‍රික ආර්ථික සංවාද

තුන්වෙනුව සෙසු රටවල් හා සම්බන්ධතා වර්ධනය කරනු වස් විදේශ කටයුතු අමාත්‍යාංශය ශ්‍රී ලංකා විදේශ සම්බන්ධතා හා රාජ්‍යතාන්ත්‍රික ආර්ථික සංවාද වැඩසටහන පිහිටුවන ලදී. ශ්‍රී ලංකාවේ පැවැත්වෙන රාජ්‍යතාන්ත්‍රික පුහුණු පාඨමාලාව සඳහා තෝරාගන්නා ලද රටවල මධ්‍ය වෘත්තික රාජ්‍යතාන්ත්‍රිකයන්ට ආරාධනා කළ අතර, ශ්‍රී ලංකා විදේශ සම්බන්ධතා හා රාජ්‍යතාන්ත්‍රික ආර්ථික සංවාදය ලෝකයේ සියලුම කළාප නියෝජනය කරන රටවල් 23 ක මධ්‍ය වෘත්තික රාජ්‍යතාන්ත්‍රිකයින්ගේ සහභාගිත්වයෙන් 2018 ඔක්තෝබර් මස සාර්ථකව විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් පවත්වන ලදී.

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සඳහා වැදගත්වන විශේෂයෙන් වෙළඳ ආයෝජන, සංචාරක ව්‍යාපාරය හා විදේශ ආයෝජන යන ක්ෂේත්‍ර සඳහා එම රටවල්වල අනාගත තීරණ ගන්නා පුද්ගලයන් සමඟ සබඳතා ඇතිකරගැනීම මෙම වැඩසටහනේ අරමුණ විය.

ගෝලීය ගැටළු, ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය සහ අනෙකුත් තේමාත්මක ක්ෂේත්‍රයන් පිළිබඳ අවධාරණය කරමින් ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික වර්ධනය හා අනාගත අපේක්ෂාවන් පිළිබඳව පෘථුල හෙලිදරව් කිරීමක් සැපයීම මෙම වැඩසටහනේ අරමුණ විය. මේ වන විට විදේශ කටයුතු අමාත්‍යාංශය මෙම වැඩසටහන අතරතුර හුවමාරු වූ දේශන හා අත්දැකීම් ඇතුළත්කොට ග්‍රන්ථයක් සම්පාදනය කරන අතර, එය අනාගත පුහුණු පාඨමාලාවන් සඳහා අත්පොතක් ලෙස භාවිතා කළ හැකිය. මෙම වැඩසටහනේ සත්කාරකත්වය මත පදනම් වෙමින් රාජ්‍යතාන්ත්‍රික ආර්ථික වැඩසටහන යටතේ අයවැය ප්‍රතිපාදන භාවිතා කරමින් ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික ආර්ථික කටයුතු සඳහා අඛණ්ඩව සත්කාරකත්වය ලබාදීමට අමාත්‍යාංශය අදහස් කරයි.

ශ්‍රී ලංකාවේ වෙළඳ සහ ආර්ථික ප්‍රතිපත්තිය වැඩිදියුණු කිරීම සඳහා සෙසු පාර්ශ්වකාර අමාත්‍යාංශ හා නියෝජිතායතන විසින් ගනු ලබන ප්‍රයත්නයන් සඳහා සහය ලෝකය පුරා විහිදුණු රාජ්‍යතාන්ත්‍රික දූතමණ්ඩල 67 ක් මඟින් විදේශ කටයුතු අමාත්‍යාංශය ලබාදෙයි. ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ ප්‍රතිපත්තිය වැඩිදියුණු කිරීම සඳහා අමාත්‍යාංශය වෙළඳ ගිවිසුම් සාකච්ඡාවල නිරතවීම හා සම්බන්ධීකරණය කරන අතරතුර අනෙකුත් රේඛීය නියෝජිතායතන සමඟ සහයෝගයෙන් ඒකාබද්ධ ආර්ථික කොමිෂන් සම සංවිධානය කිරීම කරයි.

2. ද්විපාර්ශ්වික ආර්ථික සම්බන්ධතා

1. අංශය විසින් ඕස්ට්‍රේලියාව, පෝර්ජියා, චෙක් ජනරජය, බල්ගේරියාව, නවසීලන්තය, එක්සත් රාජධානිය හා පින්ලන්තය යන රටවල්වලින් මෙරටට කෙරුණු ඉහළ මට්ටමේ සංචාර 10 ක් සඳහා පහසුකම් සළසනලදී.

11 ඉන්දුනිසියාව, පෝලන්තය, සිංගප්පූරුව, මියන්මාරය, ජපානය, ඉරානය, කෙන්යාව, නේපාලය සහ පිලිපීනය යන රටවල් වෙත කෙරුණු ඉහළ මට්ටමේ සංචාර 10 ක් සඳහා පහසුකම් සලසන ලදී.

111.ආර්ථික කටයුතු පිළිබඳ අංශය මඟින් පාකිස්ථානය, ඉන්දුනීසියාව, රුසියාව, ජපානය, සීෂෙල්ස් රාජ්‍යය, චීනය, සිම්බාබ්වේ, බෙල්ජියම, නෝර්වේ සහ ඕස්ට්‍රේලියාව යන රටවල් මෙරටට පැමිණි ව්‍යාපාරික සංචාර 12 ක් හා කටාර් ඕස්ට්‍රේලියාව, ජපානය, වියට්නාමය හා ඉතියෝපියාව යන රටවල කෙරුණු සංචාර 05 ක් සම්බන්ධීකරණය කරන ලදී.

IV අමාත්‍යාංශයේ ආර්ථික කටයුතු හා වෙළඳාම පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ අමාත්‍යාංශයේ සහකාර නීති උපදේශකවරයා සේවා ආර්ථික සහ තාක්ෂණික සහයෝගය හා ආයෝජන පරිච්ඡේදය යටතේ නිදහස් වෙළඳ ගිවිසුම හා එටිකා සාකච්ඡා සඳහා සහභාගී විය.

V මෙම අංශය අන්තර්ජාතික සංවිධාන හා සමීපව කටයුතු කරනු ලබන අතර, විශේෂයෙන්ම නිදහස් වෙළඳාම සංවර්ධනය හා වානිජ්‍ය ගිවිසුම් ආශ්‍රිතව නිර්මාණය වන කරුණු පිළිබඳව අවශ්‍ය කටයුතු සම්පාදනය කරයි.

2.1 2018 වර්ෂයේ දී පවත්වන ලද ඒකාබද්ධ ආර්ථික සැසිවල ප්‍රගතිය සහ අනාගත රැස්වීම.

සැලකිල්ලට ගනු ලබන කාල පරිච්ඡේදය තුළ දී පහත සඳහන් ඒකාබද්ධ ආර්ථික සැසි සහ වෙළඳ/ආර්ථික සමුළු පවත්වන ලදී.

I වාණිජ්‍යය හා තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ වූ කුවේට්-ශ්‍රී ලංකා ඒකාබද්ධ අමාත්‍යාංශ කමිටුවෙහි දෙවැනි සැසිවාරය.

වාණිජ්‍ය හා තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ වූ කුවේට්-ශ්‍රී ලංකා ඒකාබද්ධ අමාත්‍යාංශ කමිටුවෙහි දෙවැනි සැසිවාරය 2018 වසරේ ඔක්තෝබර් මස 09 වැනි දින සිට 11 වැනි දින දක්වා කුවේට්හි පවත්වන ලදී. කුවේට්-ශ්‍රී ලංකා ඒකාබද්ධ අමාත්‍යාංශ කමිටුවෙහි තුන්වැනි සැසිය 2019 වර්ෂයේ දී අන්‍යෝන්‍ය වශයෙන් එකඟවන දිනයන්හි දී කොළඹ දී පැවැත්වේ.

රටවල් දෙකම ද්විපාර්ශ්වීය ආර්ථික සහ වාණිජ්‍ය සම්බන්ධතාවල පවත්නා වූ තත්ත්වය පිළිබඳව සමාලෝචනය කිරීමට එකඟ වූ අතර, සංචාරයන් හුවමාරුව, ප්‍රදර්ශන, වෙළඳ හා ආයෝජන වෙළඳපොළවල් වෙත සම්බන්ධවීමේ අවස්ථා වැඩි කිරීම මඟින් වෙළඳ පරිමාව වර්ධනය කර ගැනීමේ සහ වෙළඳ සබඳතා සංවර්ධනය කිරීමේ වැදගත්කම මෙහිදී පෙන්වා දෙන ලදී.

වෙළඳ හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ කෙටුම්පතක් සහ ද්විත්ව බදු අයකිරීම වැළැක්වීම සඳහා සකස් කරන ලද ගිවිසුමෙහි මුල් ලේඛනයන් සංශෝධනය කිරීම සඳහා කෙටුම්පතක් සකස් කිරීමට රටවල් ද්විත්වයෙහිම අවධානය යොමු විය. මෙහි දී සාකච්ඡාවට බඳුන් කරන ලද අනෙකුත් මූලික ක්ෂේත්‍රයන් යටතට වෙළඳාම ආර්ථික සහ ආයෝජන සහයෝගීතාව, ශ්‍රමිකයන් හා මිනිස් බල සහයෝගීතාව, කාර්මික සහයෝගීතාව, කෘෂිකාර්මික සහයෝගීතාව, සංචාරක ව්‍යාපාරයේ සහයෝගීතාව සහ සංවර්ධන සහයෝගීතාව යන විෂය ක්ෂේත්‍රයන් අයත් විය.

ii ශ්‍රී ලංකා-දකුණු අප්‍රිකා සහයෝගීතා සමුළුවෙහි හත්වන සැසිවාරය.

2018 ඔක්තෝබර් මස 16 වැනි දින ශ්‍රී ලංකා-දකුණු අප්‍රිකා සහයෝගීතා සමුළුවෙහි හත්වන සැසිවාරය ශ්‍රී ලංකාවේ දී පැවැත්විණි. වෙළඳාම හා ආර්ථික සහයෝගීතාවට අදාළව සංචාරක, වන විද්‍යාව, ධීවර, වාරි මාර්ග, බල ශක්ති කෘෂිකර්මාන්තය සහ ශ්‍රමික සහයෝගීතාව යනාදී ක්ෂේත්‍රයන්හි සම්බන්ධය ශක්තිමත් කිරීමට මෙහි දී සමුළුව එකඟ විය. එලෙසට, සංවාදයක්

ඉහළ මට්ටමේ සංචාරයන් ඇතුළු රාජ්‍ය නිල සංචාරයන් ඉදිරියට පවත්වාගෙන යාමේ අවශ්‍යතාව සේම සෑම මට්ටමේම සහයෝගීතාව පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සැලසීම පිළිබඳවද රටවල් ද්විත්වය කටයුතු කරන ලදී.

iii ශ්‍රී ලංකා-ඕස්ට්‍රේලියා වෙළඳ හා ආයෝජන සැලැස්ම සඳහා වූ එකඟතාව (TIFA)

රටවල් ද්විත්වය අතර වෙළඳ හා ආයෝජනය දිරිමත් කිරීමට හා පහසුකම් සැලසීමේ අපේක්ෂාවෙන් 2017 නොවැම්බර් මස 02 වැනි දින ශ්‍රී ලංකා-ඕස්ට්‍රේලියා වෙළඳ හා ආයෝජන සැලැස්ම සඳහා වූ එකඟතාවට අත්සන් කරන ලදී. මෙහි දී පළමු ඒකාබද්ධ සැසිය 2018/අප්‍රේල් මස 19 වැනි දින ඕස්ට්‍රේලියාවේ කැන්බරාහි දී පවත්වන ලදී. මෙම සමුළුවේ දී වෙළඳාම හා ආයෝජනයන් ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම, රටවල් ද්විත්වයෙහිම ව්‍යාපාර ප්‍රජාවන් ආකර්ෂනය වීම, නෛතික හා නියාමක සැලැස්ම ශක්තිමත් කිරීම යනාදී ක්ෂේත්‍රයන් ඇතුළුව විවිධ ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳව සාකච්ඡා කෙරිණි. ශ්‍රී ලංකා-ඕස්ට්‍රේලියා වෙළඳ හා ආයෝජන සැලැස්ම සඳහා වූ එකඟතාවය පිළිබඳ සැසියෙහි ශ්‍රී ලංකාව හා ඕස්ට්‍රේලියාව අතර ඉදිරි සාකච්ඡා 2019 ජනවාරි මස 16 වැනිදා කොළඹ සංවර්ධන උපාය මාර්ග හා අන්තර් ජාතික වෙළඳාම පිළිබඳ අමාත්‍යාංශයේ දී පැවැත්විණි. මීලඟ සැසිවාරය ඕස්ට්‍රේලියානු මැතිවරණයෙන් පසුව 2019 ජුනි මාසයේ දී පැවැත්වීමට නියමිතය.

iv ශ්‍රී ලංකාව සහ ඉරානය අතර ආර්ථික සහයෝගීතාව සඳහා වූ ඒකාබද්ධ සැසියෙහි එකොළොස්වන අදියරයෙහි ඉදිරි සාකච්ඡාවන් ශ්‍රී ලංකාව හා ඉරානය අතර ආර්ථික සහයෝගීතාව සඳහා වූ ඒකාබද්ධ සැසියෙහි එකොළොස්වන සැසිවාරයෙහි ඉදිරි සාකච්ඡා 2018 පෙබරවාරි මස 07 සහ 08 ය දෙදින කොළඹ දී පවත්වන ලදී. මෙහි දී ඉදිරි කමිටුවේ සාකච්ඡා ප්‍රධාන අනු-කමිටු දෙකක් යටතේ පවත්වන ලද අතර, එහිදී පහත සඳහන් ක්ෂේත්‍රයන්හි සහයෝගීතාව පිළිබඳව සාකච්ඡා කරන ලදී;

බැංකු කටයුතු, මූල්‍ය කටයුතු, වෙළඳාම, තෙල්, තේ සහ කෘෂිකර්මය, රක්ෂණය, ආර්ථික හා රේගු සහයෝගීතාව:

ප්‍රමිතීන්, ප්‍රවාහනය, විද්‍යාව හා තාක්ෂණය, සෞඛ්‍ය, සංස්කෘතිය හා පුහුණු වැඩසටහන්,

මෙම සාකච්ඡාවේ දී, රටවල් ද්විත්වය අතර සෘජු ගුවන් ගමන් හා බැංකු ගණුදෙනු ආරම්භ කිරීමේ යෝජනා පිළිබඳව නියෝජිත මණ්ඩලය විසින් සාකච්ඡා කරන ලදී. තේ කර්මාන්තය පිළිබඳව මෙන්ම තීරු බදු ආකෘතිය සහ වෙළඳ සංඛ්‍යාලේඛන පිළිබඳව තොරතුරු හුවමාරුව පිළිබඳව රටවල් ද්විත්වය විසින් අත්සන් කරන ලද වරණීය වෙළඳ ගිවිසුමට යටත්ව ඇතිකර ගන්නා ලද අවබෝධතා ගිවිසුම මත පදනම්ව ඉදිරි සාකච්ඡාව පැවැත්විණි. සයිබර් ආරක්ෂාව හා ඒ හා සම්බන්ධ ගැටලු පිළිබඳව ඉරානයට සලකා බැලීම සඳහා අවබෝධතා ගිවිසුමක කෙටුම්පතක් එවීමට ද ශ්‍රී ලංකා පාර්ශවයන්ගෙන් එකඟතාව ප්‍රකාශ කරන ලදී.

3. බහු පාර්ශ්වීය ආර්ථික සබඳතා

3.1 ආසියා සහ පැසිෆික් කලාපය සඳහා වූ එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිසම

ආසියා සහ පැසිෆික් කලාපය සඳහා වූ එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිසම (UNESCAP) හා සම්බන්ධ සියලු ගැටලු හැසිරවීමේ දී අමාත්‍යාංශයේ කේන්ද්‍රීය ස්ථානය බවට පත්ව ඇත්තේ ආර්ථික කටයුතු පිළිබඳ අංශයයි. වර්තමානය වන විට ශ්‍රී ලංකාව, ආසියා සහ පැසිෆික් කලාපය සඳහා වූ ආර්ථික හා සමාජ කොමිසමේ පාලන කවුන්සිල 5 ක් සඳහා සහභාගී වී ඇත: ආසියා හා පැසිෆික් කලාපය සඳහා වූ සංඛ්‍යා ලේඛන ආයතනය (SIAP), තිරසාර කෘෂිකර්මාන්ත යාන්ත්‍රණයක් සඳහා වූ මධ්‍යස්ථානය (CSAM), තිරසර කෘෂිකර්මාන්තයක් මඟින් දිළිඳුකම දුරලීමේ මධ්‍යස්ථානය (CASPA), තාක්ෂණික හුවමාරුව සඳහා වූ ආසියා හා පැසිෆික් කලාපීය මධ්‍යස්ථානය (APCTT) සහ ආපදා තොරතුරු කළමනාකරණ සංවර්ධනය සඳහා වූ ආසියා පැසිෆික් කලාපීය කේන්ද්‍රය (APDIM) ඒවා වේ.

I ආසියා සහ පැසිෆික් කලාපය සඳහා වූ එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිසමේ 74 වන සැසිවාරය 2018 මැයි මස 11 වන දින සිට 16 වන දින දක්වා බැංකොක්හි දී පැවැත්විණි. ශ්‍රී ලංකාවේ බැංකොක්හි තානාපතිවරයා දේශීය රාජ්‍යතාන්ත්‍රිකයන්ගේ ප්‍රධානියා ලෙස ඊට සහභාගී විය. 74 වන සැසිවාරය සඳහා ජාතික ප්‍රතිපත්ති සැකසීමේ දී සහ රාජ්‍යතාන්ත්‍රිකයන්ගේ කටයුතු සම්බන්ධීකරණය කිරීමේ දී අංශය ඉමහත් ලෙස උපකාරී විය. ඊට අමතරව, ආසියා හා පැසිෆික් කලාපය සඳහා වූ එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමසම ආශ්‍රිත රැස්වීම්, සමුළු, වැඩමුළු යනාදිය සඳහා ශ්‍රී ලාංකික නියෝජිතවරුන් සහභාගීත්වය පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සඳහා ද මෙම අංශය සහය විය.

ii ආසියා හා පැසිෆික් කලාපය සඳහා වූ එක්සත් ජාතීන්ගේ කොමිසම විසින් සංවිධානය කරන ලද පහත සඳහන් අවශ්‍ය ඉසව් සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය අදාළ පහසුකම් ආර්ථික කටයුතු අංශය සිදු කරන ලදී.

- 2018 නොවැම්බර් මස 28 දින සිට 30 වන දින දක්වා තායිලන්තයේ පැවති සමාජ සංවර්ධනය සඳහා වූ කමිටුවෙහි පස්වන සැසිවාරය සඳහා ශ්‍රී ලංකාවේ රාජ්‍ය තාන්ත්‍රිකයන් සහභාගී විය.
- 2015 ඔබ්බට HIV හා AIDS සම්බන්ධ ආසියා පැසිෆික් අන්තර් රාජ්‍ය රැස්වීමේ එකඟතා ක්‍රියාත්මක කිරීම පිළිබඳව 2018 නොවැම්බර් මස 26 සිට 30 දක්වා බැංකොක් හි පැවති ආසියා පැසිෆික් කලාපීය විශේෂ කණ්ඩායමේ රැස්වීමට සහභාගී වූ ශ්‍රී ලාංකික රාජ්‍යතාන්ත්‍රිකයන්
- 2018 නොවැම්බර් මස 19 වැනි දින සිට 21 වැනි දින දක්වා බැංකොක්හි පැවති ප්‍රවාහන සඳහා වූ කමිටුවෙහි පස්වන සැසිවාරය නියෝජනය කරමින් ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රිකයන් සහභාගී වීමේ දී.

- 2018 දෙසැම්බර් මස 12 වැනි දින සිට 14 වැනි දින දක්වා චීනයේ බීජිං නගරයෙහි පැවති බලශක්ති සබැඳුම සඳහා වූ විශේෂ මණ්ඩලයේ දෙවැනි සැසිවාරය නියෝජනය කරමින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය තාන්ත්‍රිකයන්ගේ සහභාගීවීමේ දී.
- විදේශ රැකියා අමාත්‍යාංශය හා එක්ව ආර්ථික කටයුතු අංශය කොළඹ ක්‍රියාවලියේ කේන්ද්‍රීය ස්ථානය විසින් කොළඹ ක්‍රියාවලියෙහි ක්‍රියාකාරකම් සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමේදී.

3.2 බිම්ස්ටෙක් සමුළුව (BMISTEC)

2018 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා පැවැති පහත සඳහන් බිම්ස්ටෙක් (BMISTEC) සමුළු සඳහා ශ්‍රී ලංකාව සහභාගීවීමේ දී ඒ හා සම්බන්ධිත රේඛීය අමාත්‍යාංශයන් හා එකතුව ආර්ථික කටයුතු පිළිබඳ අංශය සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

2018 අගෝස්තු මස 30 වන දින සිට 31 වන දින දක්වා නේපාලයේ කත්මන්ඩු නගරයේ පැවති 04 වැනි බිම්ස්ටෙක් සමුළුවේ දී ශ්‍රී ලංකාව සභාපති ධුරය හෙබවීය.

I ඌරු මස් වෙළඳාමේ දී කලාපීය වටිනාකම් දාමය ශක්තිමත් කිරීම පිළිබඳ වැඩමුළුව 2018 ජූනි මස 13-14 දිනවල නේපාලයේ දී පැවැත්විණි. (ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය)

ii 2018 මාර්තු මස 08 සහ 09 දෙදින තායිලන්තයේ බිම්ස්ටෙක් මානව සම්පත් සංවර්ධනය හා AML/CFT ධාරිතා වර්ධනය පිළිබඳ වූ වැඩමුළුව (මූල්‍ය බුද්ධි අංශය, ශ්‍රී ලංකා මහ බැංකුව)

iii 2018 මාර්තු මස 13 වන දින සිට 15 දින දක්වා බංගලාදේශයෙහි ඩකා අගනුවර පැවති හා බිම්ස්ටෙක් සාමාජික රටවල සයිබර් අපරාධ හා සයිබර් ආරක්ෂාව සඳහා වූ වැඩමුළුව (මූල්‍ය බුද්ධි අංශය, ශ්‍රී ලංකා මහ බැංකුව)

iv 2018 මාර්තු මස 21-22 යන දෙදින තුළනායිලන්තයේ බැංකොක්හි පැවති සම්ප්‍රදායික දැනුම හා ප්‍රවේණි සම්පත් ආරක්ෂාව සඳහා වූ බිම්ස්ටෙක් සමුළුව (සෞඛ්‍ය, පෝෂණය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය)

v 2018 මාර්තු මස 28 වන දින බංගලාදේශයේ ඩකා අගනුවර පැවති බිම්ස්ටෙක් ජාතික ආරක්ෂක ප්‍රධානීන්ගේ දෙවැනි සමුළුව.

vi 2018 මැයි මස 23 වැනි දින නේපාලයේ පැවති නීති විරෝධී මත් ද්‍රව්‍ය ජාවාරම්, මනෝව්‍යාධී ද්‍රව්‍ය සහ පුරෝගාමී රසායනික ද්‍රව්‍ය තහනම් කිරීම පිළිබඳ වූ බිම්ස්ටෙක් අනු මණ්ඩලයෙහි පස්වන සමුළුව.

vii 2018 මාර්තු මස 22 හා 23 දෙදින තුළ ඉන්දියාවේ නවදිල්ලියෙහි පැවති රේගු කටයුතු සඳහා අන්‍යෝන්‍ය එකඟතාව හා සහයෝගිතා පිළිබඳ කෙටුම්පතෙහි අවසන් කිරීම සඳහා වූ බිම්ස්ටෙක් ක්‍රියාකාරී මණ්ඩල සමුළුව (ශ්‍රී ලංකා රේගුව/විදේශ කටයුතු අමාත්‍යාංශය)

viii 2018 අගෝස්තු මස 13 හා 14 දෙදින තුළ බංග්ලාදේශයේ ඩකා අගනුවර පැවති තුස්ත විරෝධී කටයුතු හා පරිවර්තික අපරාධ (JWG-CTTC) පිළිබඳව වූ බිම්ස්ටෙක් ඒකාබද්ධ ක්‍රියාකාරී මණ්ඩලයේ අටවැනි සමුළුව (ආරක්ෂක අමාත්‍යාංශය)

ix ඔක්තෝබර් මස 29 හා 30 දෙදින තුළ නේපාලයේ කත්මන්ඩු නගරයේ පැවති නීතිය හා නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ වූ බිම්ස්ටෙක් අනු මණ්ඩලයෙහි අටවැනි සමුළුව

x 2018 අගෝස්තු මස 11 වැනි දින නේපාලයේ කත්මන්ඩු නගරයේ පැවති විශේෂ ජ්‍යේෂ්ඨ නිල සමුළුව සඳහා ආර්ථික කටයුතු හා වෙළඳ (බහු පාර්ශ්වීය) අධ්‍යක්ෂ ජනරාල්වරයා සහභාගී විය.

xi 2018 අගෝස්තු මස 28 වැනි දින සිට 31 වැනි දින දක්වා නේපාලයේ කත්මන්ඩු නගරයෙහි බිම්ස්ටෙක් 4 වැනි සමුළුව හා එහි පසු රැස්වීම පැවැත්විණි.

xii 2018 නොවැම්බර් මස 12 වැනි දින සිට 16 වැනි දින දක්වා ඉන්දියාවේ හයිද්‍රාබාද් නගරයේ පැවති පරිගණක වෝහාරික විද්‍යාව පිළිබඳව වූ පුහුණු වැඩසටහන. (මහ බැංකුව)

xiii 2018 නොවැම්බර් මස 18 හා 19 යන දෙදින බංග්ලාදේශයේ ඩකා අගනුවර පැවති 21 වැනි TNC සමුළුව (වාණිජ දෙපාර්තමේන්තුව, ආයෝජන මණ්ඩලය, වෙළඳ දෙපාර්තමේන්තුව, රේගුව හා විදේශ කටයුතු අමාත්‍යාංශය)

2018 වර්ෂයේ බිම්ස්ටෙක් සමුළුව සඳහා ශ්‍රී ලංකාවේ දායකත්වය

බිම්ස්ටෙක් ස්ථිර ලේකම් කාර්යාලය පිහිටුවීම සම්බන්ධයෙන් වූ බිම්ස්ටෙක් ක්‍රියාකාරී මණ්ඩලයෙහි 8 වැනි සමුළුව 2018 ජූලි මස 10 වැනි දින කොළඹ දී පැවැත්විණි.

3.4 ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO)

ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO) හා සම්බන්ධ කටයුතු පිළිබඳව කර්මාන්ත, වාණිජ්‍ය කටයුතු අමාත්‍යාංශය සහ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය (NIPO) ආර්ථික කටයුතු අංශය විසින් සම්බන්ධීකරණය කරනු ලබයි. 2018 සැප්තැම්බර් මස 24 වැනි දින සිට 2018 ඔක්තෝබර් මස දෙවැනි දා දක්වා පිනීවාහි පැවති පේටන්ට් සහයෝගිතා ගිවිසුම (PCT) ඒකාබද්ධ රැස්වීම ඇතුළුව ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ (VIPO) සාමාජික රටවල සහභාගිත්වයෙන් පවත්වන සමුළු මාලාවේ 58 වැනි සමුළුව සඳහා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහභාගී විය.

ලෝක බුද්ධිමය දේපළ සංවිධානය හා සම්බන්ධ වීම සඳහා පියවර 10 කින් යුතු ක්‍රියාකාරී සැලැස්මක් සකස් කෙරිණි. මෙම අමාත්‍යාංශය විසින්, ශ්‍රී ලංකාව ඵලදායී බුද්ධිමය දේපළ පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා ජාතික බුද්ධිමය දේපල උපාය මාර්ග පද්ධතියක් කෙටුම්පත් කිරීමට කොරියා ජනරජය වෙත සංචාරයක් සිදුකරන ලදී. වර්ෂය මුළුල්ලේම ලිස්බන් පද්ධතිය, මැඩ්රිඩ් එකඟතාව වැනි කරුණු සම්බන්ධව ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (VIPO) විසින්

වර්ෂය පුරාම සංවිධානය කරන විවිධ (පේටන්ට්, වෙළඳ ලකුණු, කර්තෘ හිමිකම, කාර්මික සැළසුම ක්‍රියාත්මක කිරීම) ශ්‍රී ලාංකික නිලධාරීන් සම්බන්ධ වන්නා වූ විට ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැළසීමක්, ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය හා ලෝක බුද්ධිමය දේපළ සංවිධානය අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමේ දී මෙම අංශය සිය දායකත්වය සපයනු ලැබේ.

3.5 IORA (ඉන්දියන් සාගර වටදේදර රටවල සංගමය)

ඉන්දියන් සාගර වටදේදර රටවල සංගමය විසින් 2018 වර්ෂයේ ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා ත්‍රි කාල පරිච්ඡේදය තුළ පවත්වන ලද විවිධ රැස්වීම් සඳහා ශ්‍රී ලංකාව සහභාගී වීමේ දී ඒ සම්බන්ධව අදාළ රේඛීය අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණ කාර්යය සඳහා ආර්ථික කටයුතු පිළිබඳ අංශය සිය දායකත්වය සැපයීය.

I. නිල් කාබන් (Blue Carbon) පිළිබඳ වූ ඉන්දියන් සාගර වටදේදර රටවල සංගමයේ සම්මේලනය 2018 මාර්තු මස 19 වැනි දින සිට 23 වැනි දින දක්වා ඕස්ට්‍රේලියාවේ පර්ත් නුවර දී පැවැත්විණි. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද නාම යෝජනා සම්බන්ධීකරණ කටයුතු සඳහා මෙම අංශය සහය ලබා දුන් අතර, මෙම අවස්ථාව සඳහා සාගර කටයුතු හා දේශගුණ විපර්යාස සහකාර අධ්‍යක්ෂවරයා සහභාගී විය.

II. අමාත්‍යාංශ සමුළුව හා ක්‍රියාකාරී මණ්ඩලය සඳහා සූදානම් වීමේ අරමුණින් පවත්වන ලද ඉන්දියන් සාගරික කාන්තා ආර්ථික බලගැන්වීම ශක්තිමත් කිරීම සඳහා වූ වැඩමුළුව 2018 මැයි මස 3 වැනි හා 4 යන දෙදින තුළ මුරුසියෙහි දී පවත්වන ලදී. මේ වැඩමුළුව සඳහා ආර්ථික කටයුතු සහ වෙළඳ අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂවරයා සහභාගී විය.

III. ඉන්දියන් සාගර වටදේදර රටවල අධ්‍යයන කණ්ඩායම පිළිබඳ (IORG) ශ්‍රී ලංකාවේ ස්ථාවරය හා සම්බන්ධ කටයුතු පිළිබඳව සාකච්ඡා කිරීමේ අරමුණින් මෙම අංශය විසින් පවත්වන ලද සමුළුව 2018 මැයි මස 25 වැනි දා විදේශ කටයුතු අමාත්‍යාංශයේ සම්මේලන ශාලාවේ දී පැවැත්විණ.

IV. ජ්‍යේෂ්ඨ නිලධාරීන්ගේ කමිටු රැස්වීමේ 8 වැනි අර්ධ වාර්ෂික සමුළුව (ESO), පස්වැනි ඉන්දියන් සාගරික සංවාදය (IOD) සහ 24 වැනි ඉන්දියන් සාගර වටදේදර රටවල අධ්‍යයන මණ්ඩලය (IORAG) 2018 ජූලි මස 30 වැනි දින සිට 2018 අගෝස්තු මස 3 වැනි දින දක්වා දකුණු අප්‍රිකාවේ ඩර්බන් හි දී පැවැත්විණි. අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා නාවික හමුදාවේ ජ්‍යේෂ්ඨ නිලධාරීන් මෙම අවස්ථාවට සහභාගී විය.

V. තිරසර සංවර්ධනයක් සඳහා පූර්වාවශ්‍යතාව වෙනුවෙන් කාන්තා ආර්ථිකය බලගැන්වීම යන මැයෙන් පැවති ඉන්දියන් සාගර වටදේදර රටවල සංගමයේ අමාත්‍යවරුන්ගේ සමුළුව 2018 අගෝස්තු මස 28 හා 29 යන දෙදින තුළ මුරිසියේ හි දී පවත්වන ලද අතර, මේ

සඳහා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යවරිය හා ජාතික කාන්තා කමිටුවේ සභාපතිනිය සහභාගී විය.

VI. නිල් ආර්ථිකයක් සඳහා වූ ඉන්දියන් සාගර වටද්දර රටවල සංගමයේ ක්‍රියාකාරී මණ්ඩලය පිහිටුවීම සඳහා පැවති ප්‍රාරම්භක සමුළුව 2018 සැප්තැම්බර් මස 12-13 දෙදින තුළ දකුණු අප්‍රිකාවේ නැගෙනහිර කේප් පළාතේ දී පැවැත්විණ. මෙම අවස්ථාව සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රිටෝරියාවේ මහකොමසාරිස්වරයා සහභාගී විය.

VII. අමාත්‍ය කවුන්සිලයේ (COM) 18 වැනි ජ්‍යේෂ්ඨ නිලධාරී කමිටුවෙහි (CSO) 20 වැනි සමුළුව 2018 ඔක්තෝබර් මස 31 වැනිදා සිට නොවැම්බර් මස 2 වැනි දා දක්වා දකුණු අප්‍රිකාවේ දී පැවැත්විණි. මෙම අවස්ථාව සඳහා ආර්ථික හා වෙළඳ අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් සරෝජා සිරිසේන මහත්මිය, ප්‍රිටෝරියාහි කොන්සල් ප්‍රියංගනී හේවාරත්න මහත්මිය සහභාගී විය.

VIII. ඉන්දියන් සාගරයේ වර්ධනය ඇතුළු සමුද්‍රීය සහයෝගිතා වර්ධනය කිරීම සඳහා වූ ඉන්දියන් සාගර වටද්දර රටවල සංගමයේ ඉහළ මට්ටමේ මණ්ඩලය 2018 දෙසැම්බර් මස 7 හා 8 යන දෙදින තුළ ඉන්දුනීසියාවේ පවත්වන ලදී. මේ සඳහා ආර්ථික හා වෙළඳ අමාත්‍යාංශයේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් කපිල ෆොන්සේකා මහතා සහභාගී විය.

3.6 කොළඹ ක්‍රමය

කොළඹ ක්‍රමය උපදේශක කමිටු රැස්වීමේ 46 වැන්න 2018 ඔක්තෝබර් මස 29 වැනි දින සිට 31 වැනි දින දක්වා වියට්නාමිහි හැනෝහි දී පැවැත්විණි. මේ සඳහා නිරීක්ෂකයෙකු ලෙස සහභාගී වූ චිලී රාජ්‍යය ඇතුළුව සාමාජික රටවල් 27 න් 22 ක් සම්බන්ධ වන ලදී.

එම සාකච්ඡාවේ දී පහත සඳහන් කරුණු සාකච්ඡාවට ගැනිණි.

මොන්ගෝලියාව නැවත සාමාජික රටක් බවට පත් කිරීම - හිඟ සාමාජික ගාස්තු නොගෙවීම හේතුවෙන් මොන්ගොලියාව සාමාජිකත්වයෙන් ඉවත් කරන ලදී. මොන්ගෝලියානු රජය විසින් ගෙවිය යුතු හිඟ සාමාජික මුදල් නැවත අය නොකිරීමට ගත් තීරණයට කිසිදු විරුද්ධත්වයක් නොමැති බවත්, නැවත මොන්ගෝලියාවට සාමාජිකත්වය ලබා දීමට ශ්‍රී ලංකා රජය එකඟ බවත් ප්‍රකාශ කරමින් කොළඹ මහලේකම් කාර්යාලය වෙත අමාත්‍යාංශය විසින් පණිවිඩයක් යොමු කොට ඇත.

මෙම රැස්වීමේ දී 47 වැනි උපදේශක කමිටු රැස්වීම (CCM) තවත් අවුරුදු 2 කට පසු එනම් 2020 දී පැවැත්වීමට සත්කාරකත්වය දැක්වීමට ශ්‍රී ලංකාව ප්‍රතිඥා දෙන ලදී.

නව පහසුකම් සහිතව ඉදි කිරීමට නියමිත කොළඹ ක්‍රමයේ මහලේකම් කාර්යාලය කොළඹ පිහිටුවීම සඳහා සුදුසු කාර්යාල ඉඩ ප්‍රමාණයක් ලබා දෙන බවට ශ්‍රී ලංකාවේ කැපවීම පිළිබඳ නැවතත් අවධාරණය කරන ලදී.

අදාළ ගොඩනැගිල්ල පිහිටුවීම සඳහා ශ්‍රී ලංකා රජය ඉඩමක් කළින් වෙන් කර දී තිබුණත්, එහි ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් නිසි ලෙස නොලැබීමේ හේතුවෙන් එහි ඉදිකිරීම් සිදු නොවිය.

2018 - 2019 වර්ෂය සඳහා කොළඹ ක්‍රමයේ මාණ්ඩලික කමිටු රැස්වීම 2018 දෙසැම්බර් මස 19 වැනි දින පෙරවරු 10 ට කොළඹ ක්‍රමයේ මහලේකම් කාර්යාලයේ දී පවත්වනු ලැබූ අතර, ඒ සඳහා අමාත්‍යාංශය සම්බන්ධ විය.

3.7 ආසියානු සහයෝගිතා සංවාදය (ACD)

අන්තර්ගත හා තිරසර සංවර්ධනය සඳහා වූ ආසියානු සහයෝගීතාව සංවාදයේ 2 වැනි වැඩ කණ්ඩායමේ 2018 මාර්තු මස 13 වැනිදා කුවේට් හිදී පවත්වන ලද අතර මේ සඳහා කුවේට්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ පළමු ලේකම්වරයා සම්බන්ධ විය. ආසියානු සංචාරක අරමුණෙහි (ATC) ඉහළ මට්ටමේ ඉසව්වක් 2018 අගෝස්තු මස 27 දින සිට 29 වැනි දින දක්වා ඉරානයේ හැමේඩන් හිදී පවත්වන ලද අතර ඒ සඳහා ඉරානයේ ශ්‍රී ලංකා තානාපතිවරයා සම්බන්ධ විය.

3.8 අබුඩාබි සහයෝගිතා සංවාදය

අබුඩාබි සහයෝගිතා සංවාදයේ පස්වැනි ජ්‍යේෂ්ඨ නිලධාරී සමුළුව 2018 මැයි මස 8 හා 9 යන දෙදින තුළ ශ්‍රී ලංකා රජයේ සත්කාරකත්වය මත කොළඹ දී පවත්වන ලදී.

සහයෝගිතා සංවාදයේ 4 වැනි ජ්‍යේෂ්ඨ නිලධාරී තේමාත්මක රැස්වීම හා එහි සමාරම්භක උත්සවය වෙනුවෙන් ආර්ථික කටයුතු සහ වෙළඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් රවිනාථ ආර්යසිංහ මහතා සහභාගී විය. එමෙන්ම මෙම අවස්ථාව සඳහා ආර්ථික කටයුතු හා වෙළඳ අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂිකා සුභාෂිනි සිල්වා මහත්මිය ද සහභාගී වූවාය.

අනාගත සංක්‍රමණ පිළිබඳ වූ මැනිලා සම්මේලනය 2018 අගෝස්තු මස 14 හා 15 දෙදින තුළ පිලිපිනයේ දී පවත්වන ලද අතර, මේ සඳහා ජිනිවාහි DPR ජේ.ඒ.එස්.කේ. ජයසූරිය මහත්මිය සහභාගී විය.

3.9 GFMD- සංක්‍රමණ හා සංවර්ධනය සඳහා වූ ගෝලීය සංග්‍රහය/පොදු වේදිකාව

GFMD සහ GCM සම්බන්ධ සමුළු 2018 දෙසැම්බර් 05 වැනි දා සිට 11 වනදා තෙක් මොරොක්කෝවේ මාර්කේෂ් (Marrkesh) හිදී පැවැත්විණි.

i GFMD සමුළුවේ එකොළොස්වන සැසිය 2018 දෙසැම්බර් 05 සිට 07 වන දා තෙක් මොරොක්කෝවේ මාර්කේෂ් හිදී පැවැත්විණි.

ii සංක්‍රමණ හා සංවර්ධනය සඳහා වූ ගෝලීය සංග්‍රහයෙහි/පොදු වේදිකාවෙහි 11 වැනි සැසිය 2018 දෙසැම්බර් 05 වැනි දා සිට 09 වැනිදා තෙක් මොරොක්කෝවේ මාර්කේෂ් හි දී පැවැත්විණි.

iii ආරක්ෂාව අනුක්‍රමික හා ක්‍රමික සංක්‍රමණය සඳහා වූ ගෝලීය ගිවිසුම සම්මත කිරීම සඳහා පැවති අන්තර් රාජ්‍ය සමුළුව 2018 දෙසැම්බර් මස 10 සහ 11 යන දෙදින තුළ පවත්වන ලද අතර, යථෝක්ත සමුළුව සඳහා ශ්‍රී ලංකාව සම්බන්ධ වන විට ඊට අවශකරනු ලබන පහසුකම් මෙම අංශය විසින් සපයන ලදී.

3.10 එක්ස්පෝ 2025

අන්තර්ජාතික වෙස් ප්‍රදර්ශනයෙහි මහ සමුළුවෙහි 164 වැනි සැසිය 2018 නොවැම්බර් මස 23 වැනි දා පැරිසියේ දී පවත්වන ලද අවස්ථාවේ දී ලෝක එක්ස්පෝ 2025 ජපානයේ ප්‍රධානත්වයෙන් ඔසාකාහි දී පැවැත්වීම සඳහා ජපාන අපේක්ෂකත්වය සඳහා ශ්‍රී ලංකා රජය සිය සහය ලබාදෙන ලදී.

4. විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ සංඛ්‍යාලේඛනය
2018 ජනවාරි මාසයේ සිට 2018 දෙසැම්බර් දක්වා

ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව, අන්තර්ජාතික මූල්‍ය අරමුදල, ජපාන අන්තර්ජාතික සහයෝගිතා නියෝජිතායතනය යනාදී ආයතනයන්හි නිලධාරීන් විසින් සිදුකරන කෙටිකාලීන සංචාර සඳහා විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය සඳහා ආර්ථික කටයුතු අංශය දායකත්වය සපයන ලදී. එමෙන්ම විවිධ රාජ්‍ය නියෝජිත කණ්ඩායම් විසින් සංවිධානය කරන වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා පැමිණෙන්නන් හට විදේශ ගමන් බලපත්‍ර ලබාගැනීම සඳහා අවශ්‍ය පහසුකම් ද මෙම අංශය විසින් සපයන ලදී.

වීසා ප්‍රභේදය							
කෙටිකාලීන ගෙවීම් රහිත වීසා බලපත්‍ර		**කෙටිකාලීන ව්‍යාපාර වීසා බලපත්‍ර**		**විවිධ ප්‍රවේශ දිගුකාලීන වීසා බලපත්‍ර**		**පදිංචි වීමේ/ප්‍රවේශ දිගුකාලීන වීසා බලපත්‍ර නිර්දේශ**	
කාහට ද	**වීසා බලපත්‍ර සංඛ්‍යාව**	**කාහට ද**	**වීසා බලපත්‍ර සංඛ්‍යාව**	**කාහට ද**	**වීසා බලපත්‍ර සංඛ්‍යාව**	**කාහට ද**	**වීසා බලපත්‍ර සංඛ්‍යාව**
ADB	06	ශ්‍රී ලංකා තේ මණ්ඩලය	04			ADB	02
World Bank	211	WIPO	02			World Bank	40
JICA	69	FCCISL	18			JICA	37

වෙනත්	85					Colombo Plan	16
						IMF	04
						IFC	11
						Others	02

කොළඹ ක්‍රමය, සිංගප්පූරු තාක්ෂණික සහයෝගිතා වැඩසටහන, මැලේසියා තාක්ෂණික සහයෝගිතා වැඩසටහන, ආසියා හා පැසිෆික් කළාපය සඳහා වූ එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිසම, කොරියා අන්තර්ජාතික නියෝජිතායතනය, (KOICA) ඉන්දීය රජය යනාදිය මඟින් ශ්‍රී ලංකාවේ සිසුන් හට, වෘත්තිකයන් හට හා රජයේ නිලධාරීන්හට කෙටිකාලීන හා දිගුකාලීන ශිෂ්‍යත්ව කිහිපයක් සඳහා අවශ්‍ය පහසුකම් ලබා දී ඇත.

කොළඹ ක්‍රමය හා සම්බන්ධ ස්වාධීන ගැටලු මෙම අංශය විසින් පාලනය කරනු ලබයි. කොළඹ ක්‍රමය මාණ්ඩලික සමුළුවෙහි 294 හා 295 සැසිවාරයන් සඳහා ආර්ථික කටයුතු හා වෙළඳ අංශය සහභාගී විය.

යුරෝපා සහ මධ්‍යම ආසියා අංශය

යුරෝපා සහ මධ්‍යම ආසියා අංශය

දේශපාලන කටයුතු (යුරෝපා සහ මධ්‍යම ආසියා) අංශය භූගෝලීය කලාප දෙකකින් සමන්විත වන අතර, යුරෝපය සහ ස්වාධීන රාජ්‍යයන්ගේ පොදු රාජ්‍ය මණ්ඩලය (Commonwealth of Independent States - CIS) යන රටවල් සමඟ ශ්‍රී ලංකාව පවත්වා ගෙන යනු ලබන ද්විපාර්ශ්වික සබඳතාවයන්ට අදාළ කටයුතු ආවරණය කරයි. ශ්‍රී ලංකා රජයේ විදේශ ප්‍රතිපත්තියෙහි අරමුණු මගින් මග පෙන්වන මෙම අංශයේ විෂය පථය පහත පුළුල් ලෙස දක්වා ඇත. :

- දේශපාලන, ආර්ථික, සමාජීය, ආරක්ෂක සහ සංස්කෘතික සහයෝගීතාව ආවරණය වන ද්විපාර්ශවීය සබඳතා ප්‍රවර්ධනය, වැඩි දියුණු කිරීම සහ විවිධාංගීකරණය කිරීම.

- සංචාරක කර්මාන්තය ඇතුලු ද්වි මාර්ග වෙළඳ ප්‍රවාහය සහ විදේශීය සෘජු ආයෝජන (FDI) වැඩිදියුණු කිරීම සඳහා ආර්ථික ජාත්‍යන්තර සබඳතා මෙහෙයුම ප්‍රවර්ධනය කිරීම.

- ප්‍රතිසන්ධානය සහ සාමය ගොඩනැගීමේ ක්‍රියාවලිය සඳහා ආරක්ෂිත සංවර්ධන සහාය වීම.

- යුරෝපයේ වෙසෙන ශ්‍රී ලාංකීය සම්භවයක් ඇති ඩයස්පෝරා ප්‍රජාවන් සමග මනා සම්බන්ධතාවයන් ප්‍රවර්ධනය කිරීම.

- යුරෝපය සහ මධ්‍යම ආසියාව තුළ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය සහ ලැදියාව ප්‍රවර්ධනය කිරීම.

- යුරෝපා සංගමය මෙන්ම වෙනත් බහුපාර්ශ්වීය සහ කලාපීය සංසදයන්වල (යුරෝපා සංගමය, එක්සත් ජාතීන්ගේ සංවිධානය ආදිය) ශ්‍රී ලංකාවේ ලැදියාව ප්‍රවර්ධනය කිරීම සඳහා ද්විපාර්ශවික සහයෝගය ලබා දීම. නොබැඳි ජාතීන්ගේ සංවිධානය (NAM), පොදු රාජ්‍ය මණ්ඩලය යන කලාප දෙකෙහි රටවල් සහ දකුණු සහයෝගීතාව ඇතුළුව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ G77+ කණ්ඩායමේ රටවල් හා චීනය තුළ ද හවුල් ලැදියාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා සහ දරිද්‍රතාවය, දේශගුණික විපර්යාස, වෙලඳ අසමතුලිතතාව සහ ආහාර සුරක්ෂිතතාව වැනි පොදු අභියෝගයන්ට විසඳුම් ලබා දීම සඳහා සහයෝගීව කටයුතු කිරීම

අ. යුරෝපය:

දේශභූමි ආවරණය : 43

ඇල්බේනියාව, ඇන්ඩෝරාව, ඔස්ට්‍රියාව, බෙල්ජියම, බොස්නියාව සහ හර්සෙගොවිනා,

බල්ගේරියාව, ක්‍රොයේෂියාව, සයිප්‍රසය, චෙක් ජනරජය, ඩෙන්මාර්කය, එස්තෝනියාව, ෆින්ලන්තය, ප්‍රංශය, ජෝර්ජියාව, ජර්මනිය, ග්‍රීසිය, හන්ගේරියාව, අයිස්ලන්තය, අයර්ලන්තය, ඉතාලිය, ලැට්වියාව, ලීච්ටෙන්ස්ටයින්, ලිතුවේනියාව, ලක්සම්බර්ග්, මැසිඩෝනියාව, මෝල්ටාව, මොනාකෝ, මෝන්ටිනේග්‍රෝ, නෝර්වේ, පෝලන්තය, පෘතුගාලය, රුමේනියාව, සැන් මැරිනෝ, සර්බියාව, ස්ලොවේකියාව, ස්ලෝවේනියාව, ස්පාඤ්ඤය, ස්වීඩනය, ස්විට්සර්ලන්තය, වතිකානුව, නෙදර්ලන්තය, එක්සත් රාජධානිය සහ තුර්කිය

නේවාසික දූත මණ්ඩල සංඛ්‍යාව : 14

ඔස්ට්‍රියාව, බෙල්ජියම, ප්‍රංශය, ජර්මනිය (බර්ලින් සහ ෆ්‍රැන්ක්ෆර්ට්), ඉතාලිය (රෝමය සහ මිලාන්), සයිප්‍රසය, නෝර්වේ, පෝලන්තය, ස්වීඩනය, නෙදර්ලන්තය, එක්සත් රාජධානිය සහ තුර්කිය

සමගාමීව සිදුකරන ලද අක්ත ගැන්වීම් : 23

බොස්නියාව, හර්සෙගොවිනා, සර්බියාව, ස්ලොවේකියාව, වියානා සිට ස්ලෝවේනියාව, බ්‍රසල්ස් සිට ලක්සම්බර්ග්, පැරීසියේ සිට ස්පාඤ්ඤය, ස්විට්සර්ලන්තය, ක්‍රොයේෂියාව, මැසිඩෝනියාව, බර්ලින් සිට මෝන්ටිනේග්‍රෝ, රෝමයේ සිට සැන් මැරිනෝ, වර්සව් සිට රුමේනියාව, ඩෙන්මාර්කය, එස්තෝනියාව, ලැට්වියාව, ස්ටොක්හෝල්ම් සිට ලිතුවේනියාව, ඔස්ලෝ සිට පින්ලන්තය සහ අයිස්ලන්තය, ඇන්කරා සිට ජෝර්ජියාව

1.1 ඔස්ට්‍රියාව

ඔස්ට්‍රියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. 2018 මාර්තු 12 සිට 16 වන දින දක්වා පැවති මත්ද්‍රව්‍ය නාශක ඖෂධ පිළිබඳ කොමිසමෙහි 61 වැනි සැසිවාරයට සහභාගී වූ අතර 'තිරසාර සංවර්ධන යුගය තුළ ලෝක මත්ද්‍රව්‍ය ගැටලුව විසඳීම' නමින් අතුරු උත්සවයක් සංවිධානය කරන ලදී.

ආ. ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය (IAEA) සහ ශ්‍රී ලංකාව අතර සහයෝගිතාව සමාලෝචනය කිරීම සඳහා 2018 මාර්තු මස 14 වන දිනැතිව ශ්‍රී ලංකාවට පැමිණි ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයෙහි (IAEA) හි අධ්‍යක්ෂ ජනරාල් යුකියා අමානෝ මහතාගේ නිල සංචාරයේ සම්බන්ධීකරණ කටයුතු සිදු කර, ඒ සඳහා පහසුකම් සපයනු ලැබීය. මෙම සංචාරය අතරතුර, අමාන් මහතා ශ්‍රී ලංකාවේ

විදේශ කටයුතු අමාත්‍ය ගරු. වසන්ත සේනානායක සහ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය ගරු. අජිත් පී. පෙරේරා යන මහත්වරුන් මුණ ගැසුණි.

ඇ. 2018 මැයි මස 14 සිට 18 දක්වා පවත්වන ලද අපරාධ වැලැක්වීමේ හා අපරාධ යුක්තිය පිළිබඳ කොමිසමෙහි 27 වන සැසි වාරයට සහභාගි වූ නීතිපති ප්‍රධාන ශ්‍රී ලංකා දූත මණ්ඩලයට පහසුකම් සැලසීය. එසේම, '21 වන ශතවර්ෂයේ පිළිවෙත : සයිබර් මත යැපෙන අපරාධ වැළැක්වීම සඳහා එක්සත් රාජධානි ප්‍රවේශය' ශීර්ෂය යටතේ එක්සත් රාජධානිය විසින් 2018 මැයි 16 වන දිනැතිව සංවිධානය කරන ලද අතුරු උත්සවය සඳහාද සහභාගි වනු ලැබීය.

ඈ. අග්‍රාමාත්‍ය කාර්ය මණ්ඩල ප්‍රධානී සහ ව්‍යාපෘති කළමනාකරණ, යෞවන කටයුතු හා දක්ෂිණ සංවර්ධන අමාත්‍ය ගරු. සාගල රත්නායක මහතා, 2018 මැයි මස 15 වන දින වියානා හි පැවති ගෝලීය සමුද්‍රික අපරාධ වැඩසටහනට (GMCP) සහභාගි වීම සඳහා වියානා වෙත සංචාරය කරනු ලැබීය.

ඉ. 2018 ජූනි 05 සහ 06 යන දිනවල පැවැත්වූ 'ක්‍රීඩාව වංචාවෙන් ආරක්ෂා කිරීම, පිළිබඳ සම්මන්ත්‍රණය' 2018 ජුනි මස 7 වන දින පවත්වන ලද වත්කම් අත්පත්කර ගැනීම සඳහා විවෘත අන්තර් රාජ්‍ය ක්‍රියාකාරී කණ්ඩායම් දොළොස්වන රැස්වීම සහ 2018 ජුනි 08 වන දින පවත්වන ලද දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ අන්තර්ජාතික සහයෝගීතාව පිළිබඳ හත්වැනි විවෘත අන්තර් රාජ්‍ය ක්‍රියාකාරී කණ්ඩායම සඳහා සහභාගි වූ ජනාධිපති ලේකම්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කොමසාරිස් සහ නියෝජිත පිරිස සඳහා පහසුකම් සපයන ලදී.

ඊ. ඒඑම්ඊ ඉන්ටර්නැෂනල් ජීඒම්බීඑච්, මෙඩ්*ඊඅයි ජීඑම්බීඑච්, සහ ඔඩෙල්ගා මෙඩ් ගෙස්. එම්බීඑච්, සහ හිට්සින්ගර් ජීඑම්බීඑච් ඇතුළුව, ඔස්ට්‍රියන් සමාගම්වල නියෝජිතයන් අනුබද්ධිත ව්‍යාපෘති මූල්‍යකරණයට කැපවූ ඔස්ට්‍රියානු ව්‍යාපාරික දූත පිරිස ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා සොයා බැලීම සඳහා 2018 මැයි මස 23 සිට 25 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නියුතු විය. මෙම සංචාරය අතරතුර, නියෝජිත පිරිස ශ්‍රී ලංකා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය ගරු. මංගල සමරවීර මහතා හමු විය.

උ. 2018 ජුනි 19 සිට 21 දක්වා ශ්‍රී ලංකාවේ පැවැත් වූ ආයෝජන සහ ව්‍යාපාර සාකච්ඡාවට සර්බියාවේ ආයෝජකයින් / ව්‍යාපාරිකයින් සහභාගි වීමට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා සර්බියාවේ ගරු. කොන්සල් සමඟ සම්බන්ධීකරණය කරන ලදී.

ඌ. තාක්ෂණික අධ්‍යාපනය පිළිබඳ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ අරමුණින් අන්තර්ජාතික සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල (OFID) වෙතින් ඩොලර් මිලියන 50 ක් වටිනා මූල්‍යාධාර ලබා ගැනීම සඳහා වූ ණය ගිවිසුමක් 2018 ජූලි 03 දින ඔස්ට්‍රියාවේ

වියානාහි OFID හි මූලස්ථානයේ දී අත්සන් කරන ලදී. එම ගිවිසුමට ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය ආර්. එච්. එස්. සමරතුංග මහතා සහ අන්තර්ජාතික සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල වෙනුවෙන් OFID හි අධ්‍යක්ෂ ජනරාල් සුලෙයිමින් පේ. අල් හර්බිස් මහතා අත්සන් තබනු ලැබීය.

සෘ. 2018 සැප්තැම්බර් 17 සිට 21 දක්වා පැවති 62 වන මහා සම්මේලනයට ශ්‍රී ලංකාව වෙනුවෙන් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ දූත පිරිසක් සහභාගි විය.

සෘෘ. මත්ද්‍රව්‍ය නාශක ඖෂධ පිළිබඳ කොමිසමේ තුන්වන අන්තර්ජාතික රැස්වීම සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සහභාගිත්වයට පහසුකම් සැපයීම සහ 'හරස් කැපුම් ගැටලු : මත්ද්‍රව්‍ය, මානව හිමිකම්, තරුණයින්, ළමයින්, කාන්තාවන් සහ ප්‍රජාවන්' මැයෙන් 2018 සැප්තැම්බර් 27 වන දින පැවති සැසියට කණ්ඩායම් සාමාජික ලෙස සහකාර අධ්‍යක්ෂ, විද්‍යාත්මක පර්යේෂණ පබසරා වීරසිංහ මහත්මියගේ සහභාගිත්වයට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

එ. ඔස්ට්‍රියාවේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය එක්ව ඔස්ට්‍රියාවේ විශාලතම නිවාඩු හා සංචාර ප්‍රදර්ශනය වන "Ferien – Messe Wien 2018" ට සහභාගී විය.

ඒ. තේ ප්‍රවර්ධන වැඩසටහනක් සංවිධානය කිරීම සහ සංචාරක සිනමා උත්සවයේදී 'ශ්‍රී ලංකාව - ඉන්දියන් සාගරයේ මුතු ඇටය' යන තේමාව යටතේ දේශනයක් සංවිධානය කර ඉදිරිපත් කරන ලදී.

වැඩසටහන් වල ප්‍රගතිය:

ඓ. එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය (UNIDO) විසින් ශ්‍රී ලංකාවේ අපද්‍රව්‍ය කළමණාකරණ ව්‍යාපෘතිය සඳහා යෝජනා කරන ලද ක්‍රමවේදය පිළිබඳව ශ්‍රී ලංකා මධ්‍යම පරිසර අධිකාරිය විසින් උනන්දුව දක්වා ඇත. ඕස්ට්‍රියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් මෙම ව්‍යාපෘතිය සම්බන්ධව අදාළ UNIDO බලධාරීන් සමඟ කටයුතු කරනු ලැබීය.

ඔ. ශ්‍රී ලංකාව තුළ මිනිස් ජාවාරමට එරෙහි වීම සඳහා එක්සත් රාජධානියේ වින්ඩ්සර් අරමුදලින් පවුම් මිලියන 2 ක අරමුදල් සම්පාදනය කර ගැනීමේ හැකියාව පිළිබඳව ඕස්ට්‍රියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ එක්සත්

ජාතීන්ගේ කාර්යාංශය (UNODC) සමඟ සාකච්ඡා කළහ. නවදිල්ලියේ පිහිටුවා ඇති දකුණු ආසියානු කලාප කාර්යාලය විසින් මෙම වැඩසටහන සම්බන්ධීකරණය කරනු ලබන අතර, 2018 - 2021 සඳහා වන ඔහධඃඝ දකුණු ආසියානු කලාප වැඩසටහනෙහි උප වැඩසටහන 1 හි අන්තර්ගත වනු ඇත.

1.2 බෙල්ජියම

බෙල්ජියමේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. බෙල්ජියමේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) සමඟ එක්ව, 2018 පෙබරවාරි 1 සිට 4 දක්වා බ්‍රසල්ස් එක්ස්පො හි පැවති බ්‍රසල්ස් උත්සව පොළ 2018 - 60 වන දිගහැරුම සඳහා ශ්‍රී ලංකා මණ්ඩපය සංවිධානය කරන ලදී.

ආ. ශ්‍රී ලංකාවේ සංචාරක ආකර්ෂණයන් දැක්වෙන 'Land Like No Other / නොවේ මෙවන් වෙනත් දේශයක්' නම් ඡායාරූප ප්‍රදර්ශනය 2018 පෙබරවාරි මස 01 සිට 08 වන දින දක්වා බ්‍රසල්ස් ප්‍රෙස් ක්ලබ් ප්‍රදර්ශන ශාලාවේදී පැවැත්විණි.

ඇ. 2018 පෙබරවාරි 17 වන දින ෆ්ලැන්ඩර්ස් එක්ස්පො හිදී පැවති බෙල්ජියමේ බෝට්ටු ක්ෂේත්‍රයේ විශාලතම වෙළඳ ප්‍රදර්ශනයේදී ශ්‍රී ලංකා බෝට්ටු කර්මාන්තයේ ප්‍රවර්ධන වැඩසටහන පවත්වන ලදී. ශ්‍රී ලංකා වාණිජ දෙපාර්තමේන්තුවේ සාමාජිකයින් 4 දෙනෙකුගෙන් සමන්විත දුත කණ්ඩායමක්, බෙල්ජියානු බෝට්ටු සංගමයෙහි නියෝජිතයන, බෙල්ජියමේ බෝට්ටු සමාගම් සහ මාධ්‍ය නිලධාරීන් මෙම ප්‍රවර්ධන වැඩසටහනට සහභාගී විය.

ඈ. ගෙන්ට් විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකාවේ සාගර විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම් කෙටුම්පත සඳහා වූ ක්‍රියාමාර්ගයන්ට මුල පුරනු ලැබීය. සාගර විශ්වවිද්‍යාලය තුළ සාගර විද්‍යාගාරයක් පිහිටුවීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබාගැනීමට පවතින හැකියාව සාකච්ඡා කිරීම සඳහා සාගර විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් දෙදෙනෙකු 2018 පෙබරවාරි මාසයේදී බෙල්ජියම වෙත සංචාරය කළහ.

ඉ. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) සමඟ සහයෝගිත්වයෙන් 2018 මාර්තු මස 15 වන දින බ්‍රසල්ස්හි මෙට්‍රොපෝල් හෝටලයේදී සංචාරක මාර්ග ප්‍රදර්ශනයක් සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකාවේ චාරිකා මෙහෙයවන්නන් හට මෙහිදී බෙල්ජියම් චාරිකා මෙහෙයවන්නන් හමුවීමේ අවස්ථාව හිමි විය.

ඊ. බෙල්ජියමේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ බෙල්ජියම බ්‍රික්ස් පෙඩරේෂන් එක්ව 2018 අප්‍රේල් මාසයේදී අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලද සාමාජිකයින් 11 දෙනෙකුගෙන් සමන්විත උළු සහ ගඩොල් නිෂ්පාදකයින්ගේ දූත කණ්ඩායමක් සඳහා තාක්ෂණික නිරාවරණ වැඩසටහනක් සම්පාදනය කරන ලදී. ශ්‍රී ලංකා දූත පිරිස බෙල්ජියමේ ප්‍රමුඛ ගඩොල් සහ උළු නිෂ්පාදකයන් වන වැන්ඩර්සන්ඩන් එන්වී, වර්නර්බර්ගර් එන්වී සහ බ්‍රික්වටර්ස් ඩි ප්ලොග්ස්ටීර්ට් එස්ඒ හමුවූහ. ගඩොල් සහ උළු නිෂ්පාදන කර්මාන්තයේ නව තාක්ෂණය පිළිබඳව ඔවුන්ට මනා නිරාවරණයක් ලබා ගත හැකි වූ බව ශ්‍රී ලාංකීය සහභාගිවන්නන් ප්‍රකාශ කරන ලදී.

උ. බෙල්ජියමේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ අපනයන සංවර්ධන මණ්ඩලය එක්ව, බ්‍රසල්ස්හි යුරෝපීය මුහුදු ආහාර ගෝලීය ප්‍රදර්ශනයේදී මුහුදු ආහාර ප්‍රදර්ශනය කිරීම සඳහා වන ශ්‍රී ලංකා මණ්ඩපයක් 2018 අප්‍රේල් මස සංවිධානය කරන ලදී. මෙම ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලාංකික මුහුදු ආහාර අපනයනකරුවන් 09 දෙනෙක් සහභාගි වූහ.

ඌ. බෙල්ජියමේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ අපනයන සංවර්ධන මණ්ඩලය එක්ව ෆ්ලැන්ඩර්ස් ආයෝජන හා වෙළඳ නියෝජිතායතනය (ෆෂඔ) සහ බ්‍රසල්ස් වාණිජ්‍යය හා කර්මාන්ත ව්‍යාපාරය, බ්‍රසල්ස් ආයෝජන හා අපනයන සහ වැලොනියා අපනයන ආයෝජන නියෝජිතායනය හා සහයෝගිත්වයෙන් සහ බොල්ජියමේ සමාගම්වල සහභාගිත්වයෙන් ව්‍යාපාර සමුළුවක් 2018 මැයි 17 වන දින සංවිධානය කරන ලදී. ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු සුජීව සේනසිංහ මහතා ප්‍රමුඛ ශ්‍රී ලාංකික වෙළඳ නියෝජිතයින් 33 දෙනෙකු මෙම අවස්ථාවට සහභාගි විය.

ඍ. එමිරේට්ස් ගුවන් සේවය සමඟ සහයෝගීව සංවිධානය කරනු ලැබූ සංචාරක ප්‍රවර්ධන වැඩසටහනක් බෙල්ජියමේ චාරිකා මෙහෙයවන්නන්ගේ සහභාත්වයෙන් යුතුව 2017 මැයි මස 31 වන දින ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේදී පැවැත්විණි.

ඎ. 131 වන රේගු සහයෝගිතා කවුන්සිලයේ ලෝක රේගු සංවිධාන (WCO) සැසි වාරය බ්‍රසල්ස්හි පිහිටි උසස මූලස්ථානයේදී 2018 ජූලි මස පවත්වන ලදී. රේගු අධ්‍යක්ෂ ජනරාල් එස්. එම්. චාර්ලස් මහත්මියගේ ප්‍රධානත්වයෙන් සහාගි වූ ශ්‍රී ලංකා දූත කණ්ඩායමට බෙල්ජියමේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් පහසුකම් සපයන ලදී.

එ. බෙල්ජියානු ෆෙඩරල් පාර්ලිමේන්තුවෙහි බෙල්ජියානු - ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මිත්‍ර සංසදයේ සාමාජිකයින් 06 දෙනෙකුගෙන් සමන්විත දූත කණ්ඩායමෙහි 2018 ජූලි 14 සිට 20 දක්වා වූ ශ්‍රී ලංකා සංචාරය සඳහා පහසුකම් සපයන ලදී. මෙම සංචාරය අතරතුර දී නියෝජිත පිරිස ශ්‍රී ලංකා ගරු. අග්‍රාමාත්‍යතුමා, ගරු කථානායකතුමා සහ ජ්‍යෙෂ්ඨ කැබිනට් අමාත්‍යවරු හමුවූහ.

ඒ. බෙල්ජියානු රජය විසින් සිය අපනයන ණය යෝජනා ක්‍රමය යටතේ සම මූල්‍යනය කරන කොළොන්න සහ බලන්ගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය, දුම්රිය පාලම් හතක් ප්‍රතිසංස්කරණය කිරීම සහ බුත්තල - මොණරාගල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ෆින්එක්ස්පෝ (FINEXPO) සමඟ සම්බන්ධීකරණය සිදු කරන ලදී.

ඓ. ශාකසාර තේ ප්‍රවර්ධනය කිරීම උදෙසා ෆැඩිනා (ජෑහ්) තේ නියෝජිතයින් වෙනුවෙන් 2018 සැප්තැම්බර් මාසයේ දී ව්‍යාපාර ගැලපුම් රැස්වීම් සංවිධානය කරන ලදී.

1.3 සයිප්‍රසය

සයිප්‍රසයේ ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකත්වය වැඩි දියුණු කිරීම සහ සයිප්‍රසයේ ප්‍රවාසික ප්‍රජාව සඳහා කොන්සියුලර් සේවාව වර්ධනය කිරීම සඳහා සයිප්‍රසයේ කොන්සල් ජනරාල් කාර්යාලය 2017 නොවැම්බර් මාසයේදී විවෘත කරන ලදී.

ආ. සත්කාරක සේවා, සෞඛ්‍යය සහ ඉදිකිරීම් අංශ සඳහා පුහුණු ශ්‍රමිකයින් බඳවා ගැනීම වෙනුවෙන් සයිප්‍රසයේ කම්කරු අධිකාරීන් සමඟ සාකච්ඡා ආරම්භ කිරීමට කොන්සල් ජනරාල්වරයා කටයුතු කර ඇත.

ඇ. මෙම ක්ෂේත්‍රයේ ද්වි - මාර්ග සංචාරක ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සහ ද්විපාර්ශ්වික සහයෝගිතාවයන් අඛණ්ඩව පවත්වා ගෙන යාමට සයිප්‍රසයේ සංචාරක අධිකාරීන් සහ සංචාරක නියෝජිතයින් සමඟ කටයුතු කරමින් සිටී

1.4 චෙක් ජනරජය

චෙක් ජනරජය වෙත සමගාමීව සිදු කරන ලද අක්ත ගැන්වීම් හරහා ඔස්ට්‍රියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. ශ්‍රී ලංකාවෙහි සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය සහ චෙක් ජනරජයේ කර්මාන්ත හා වෙළඳ අමාත්‍යාංශය අතර අන්‍යෝන්‍ය සහයෝගිතාව පිළිබඳ ගිවිසුම 2018 පෙබරවාරි මස 07 වන දින අත්සන් කරන ලදී.

ආ. විදේශ අමාත්‍ය ගරු. තිලක් මාරපාන මහතා 2018 මැයි 15 - 17 දිනයන්හි චෙක් ජනරජයේ සංචාරයක නිරත විය. සංචාරය අතරතුර, ගරු. අමාත්‍යතුමන් චෙක් ජනරජයේ නියෝජ්‍ය අග්‍රාමාත්‍ය සහ විදේශ කටයුතු අමාත්‍ය ගරු. මාර්ටින් ස්ට්‍රොප්නිකි මහතා සමඟ

ද්විපාර්ශ්වික සාකච්ඡාවක් පැවැත්විය. එසේම එහිදී ගරු අමාත්‍යතුමා සෙනට් සභාවේ සභාපති, ප්‍රාග් නගරාධිපති මිලාන් ස්ටෙච් මහතා සහ චෙක් වාණිජ මණ්ඩලයේ සාමාජිකයින් හමුවූහ.

ඇ. චෙක් ජනරජයේ පාර්ලිමේන්තු සෙනට් සභාවේ සභාපති අතිගරු මිලාන් ස්ටෙච් මහතාගේ ප්‍රධානත්වයෙන් යුතු චෙක් ව්‍යාපාරික දූත පිරිසක් 2018 සැප්තැම්බර් 20 සිට 25 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නියුතු විය.

1.5 ඩෙන්මාර්කය:

ඩෙන්මාර්ක් රාජ්‍යය වෙත සමගාමීව සිදු කරන ලද අක්ත ගැන්වීම් හරහා ස්වීඩනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. ස්වීඩනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ එක්ව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහ ශ්‍රී ලංකා සංචාරක නියෝජිතයින් 2018 පෙබරවාරි මස 23 සිට 25 දක්වා පැවති ඩෙන්සි සංචාරක සංදර්ශනය "FERIE FOR ALLE" ට සහභාගී වූහ.

1.6 එස්තෝනියාව

එස්තෝනියාව වෙත සමගාමීව සිදු කරන ලද අක්ත ගැන්වීම් හරහා ස්වීඩනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. එස්තෝනියා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ආරාධනාවක් මත, අතිගරු ස්වීඩනයේ ශ්‍රී ලංකා තානාපතිවරයා එස්තෝනියානු සමූහාණ්ඩුවේ ජාතික දින සැමරුම සඳහා සහභාගි වීමට 2018 පෙබරවාරි 23 දින එස්තෝනියානු සමූහාණ්ඩුව වෙත සංචාරය කරන ලදී. එම සංචාරය අතරතුර, අතිගරු තානාපතිවරයා සහ තානාපති කාර්යාලයේ ඉහළ පෙළේ නිළධාරීන් අතර සාකච්ඡා පැවැත්වුණු අතර, එහිදී තොරතුරු තාක්ෂණ, සයිබර් ආරක්ෂණ සහ ආගන්තුක සත්කාරක ක්ෂේත්‍රයන්හි පුහුණුව (සංචාරක) සම්බන්ධයෙන් ඉදිරි ද්විපාර්ශ්වික සහයෝගිතාව වර්ධනය කිරීම සම්බන්ධයෙන් සාකච්ඡාවට ගැනුණි.

ආ. ස්වීඩනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් 2018 පෙබරවාරි 09 සිට 11 දක්වා කාලය තුළ එස්ටෝනියා හි පැවති "Tourest 2018" සංචාරක ප්‍රදර්ශනයේ දී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට පහසුකම් සැපයීමට කටයුතු කරන ලදී.

1.7 ෆින්ලන්තය

ෆින්ලන්තය වෙත සමගාමීව සිදු කරන ලද අක්ත ගැන්වීම් හරහා නෝර්වේ හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. ෆින්ලන්තයේ උප රාජ්‍ය ලේකම්, ආර්ථික කටයුතු හා රැකීරක්ෂා අමාත්‍ය ගරු. පෙට්‍රි පෙල්ටනන් මහතා ප්‍රධාන ෆින්ලන්ත ව්‍යාපාරික දූත කණ්ඩායමක් 2018 ජුනි 10 සිට 13 දක්වා ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නියුතු වූහ. මෙම සංචාරය අතරතුර, පහත සඳහන් අවබෝධතා ගිවිසුම් අත්සන් කරන ලදී.

i. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සහ ෆින්ලන්තයේ සමාජ කටයුතු හා සෞඛ්‍යය අමාත්‍යාංශය අතර සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම

ii. ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යාංශය සහ ෆින්ලන්තයේ ප්‍රවාහන හා සන්නිවේදන අමාත්‍යාංශය අතර ඩිජිටල්කරණය ක්ෂේත්‍රයේ සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම

iii. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශය සහ ෆින්ලන්තයේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය අතර ද්විතියික අධ්‍යාපන පුහුණුව සහ වෘත්තීය අධ්‍යාපනය ක්ෂේත්‍රයේ සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම

ආ. ශ්‍රී ලංකාව හා ෆින්ලන්තය අතර ද්විපාර්ශ්වික දේශපාලන උපදේශනය පිළිබඳ පළමු සැසිය 2018 ඔක්තෝබර් 01 වන දින, කොළඹ විදේශ කටයුතු අමාත්‍යාංශයේදී පැවැත්විනි. ශ්‍රී ලංකා දූත පිරියේ නායකත්වය අතිරේක ලේකම් (ද්විපාර්ශවික කටයුතු) සුමිත් නාකන්දල මහතා විසින් දැරූ අතර, ෆින්ලන්ත විදේශ කටයුතු අමාත්‍යාංශයේ ඇමරිකානු සහ ආසියානු කලාප අධ්‍යක්ෂ ජනරාල් තානාපති කිම්මො ලොදිවිර්ටා විසින් ෆින්ලන්ත දූත කණ්ඩායම මෙහෙයවනු ලැබීය.

ද්විපාර්ශ්වික වෙළඳාම සහ ආයෝජනය අරමුණුකොට පුළුල් ලෙස සාකච්ඡා පැවැත්විනි. අධ්‍යාපනය (වෘත්තීය පුහුණුව), සෞඛ්‍යය, පුනර්ජනනීය බලශක්තිය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ ඩිජිටල්කරණය යන ක්ෂේත්‍රයන්හි ප්‍රගතිය පිළිබඳ පසු විපරම් කිරීමත ඉ-රාජ්‍යය, විවේචනාත්මක සන්නිවේදනය, සයිබර් ආරක්ෂණය, දේශගුණික විපර්යාස සහ ලිහිල්කිරීම, වන වගාව, ආරක්ෂක, සංචාරක ව්‍යාපාරය සහ ආකර්ෂණීය නගර සංවර්ධනය කිරීම සඳහා විශේෂඥ දැනුම හුවමාරු කර ගැනීම සහ ඒකාබද්ධ සහයෝගිතා වැඩසටහන් තුළින් අන්‍යොන්‍ය වශයෙන් ප්‍රතිලාභදායක සහයෝගීතාවය වැඩි දියුණු කිරීම ආදිය පිළිබඳව එහිදී සාකච්ඡාවට ගැණුනි.

1.8 ප්‍රංශය

ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. ආර්ථික සහයෝගිතා හා සංවර්ධන සංවිධානයේ (OECD) දී 2018 අප්‍රේල් මස පවත්වන ලද තුස්තවාද මූල්‍යකරණයට එරෙහි සම්මන්ත්‍රණයට සහභාගිවීමට බෙල්ජියම වෙත සංචාරය කළ මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු එරාන් වික්‍රමරත්න මහතා සහ දූත පිරිස වෙත එම සංචාරය සඳහා පහසුකම් සැලසීය. තුස්තවාදයේ අරමුදල් මූලාශ්‍ර සහ අරමුදල් නාලිකා වලට එරෙහිව සටන් කිරීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රවීණත්වය සහ යහපත් චර්යාවන් හුවමාරු කර ගැනීම අරඹයා දෙදින සම්මන්ත්‍රණයක් ලෙස සමුළුව පැවැත්විණි.

ආ. 2018 මාර්තු 15 - 18 දක්වා පැරිසියේදී පැවති "Salon Mondial du Tourism" හි 43 වැනි සංස්කරණයේදී ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සම්බන්ධීකරණය හා සංවිධානය කිරීම සිදු කරන ලදී.

ඇ. 2018 මාර්තු 19 වන දින සිට අප්‍රේල් 5 වන දින දක්වා පැවති ' උරුමයන් සංරක්ෂණය පිළිබඳ ගිවිසුමේ ක්ෂේත්‍ර තුළ සහයෝගිතාවය' යටතේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහ මධ්‍යම සංස්කෘතික අරමුදල නියෝජනය කරන සංරක්ෂකයන් තිදෙනෙකු සඳහා පුහුණු වැඩසටහනක් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහනට ප්‍රංශයේ සංස්කෘතික අමාත්‍යාංශය සිය අනුග්‍රහය දැක්වීය.

ඈ. ශ්‍රී ලංකා ලේඛකයෙකු වන අශෝක් ෆෙරී විසින් රචිත ග්‍රන්ථයක් එළි දැක්වීම සහ සංස්කෘතික අංගයන් ඉදිරිපත් කිරීමේ උත්සවයක් 2018 අප්‍රේල් 03 වන දින රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්, ව්‍යාපාරික ප්‍රජාව හා මාධ්‍යවේදීන්ගේ සහභාගිත්වයෙන් එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන විද්‍යා හා සංස්කෘතික සංවිධාන (UNESCO) මූලස්ථානයේදී පවත්වන ලදී.

ඉ. පලාත් සභා හා පලාත් පාලන අමාත්‍ය ගරු. ෆයිසර් මුස්තාපා මහතා සහ ප්‍රංශයේ වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාව නියෝජනය කරන පිරිසක් සමඟ සාකච්ඡාවක් 2018 අප්‍රේල් මස 17 වන දින පවත්වන ලදී. සංවිධානාත්මක කණ්ඩායම් විසින් සිදු කරන ලද වාර්ගික ආතතීන් ලිහිල් කිරීමට උත්සාහ දැරීම සහ ප්‍රතිසංධාන ක්‍රියාවලියේ ප්‍රගතිය පිළිබඳව ගරු අමාත්‍යතුමා විසින් මෙහිදී ප්‍රජාව දැනුවත් කරන ලදී.

ඊ. එක්සත් ජාතීන්ගේ අන්තර් ජාතික වෙසක් දිනය සැමරීම සඳහා එක්දින සම්මන්ත්‍රණයක් 2018 මැයි මස 24 වැනි දින, පැරිසියේ යුනෙස්කෝ මූලස්ථානයේ සංවිධානය කරන ලදී. මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු

පිළිබඳ අමාත්‍ය ගරු. විජයදාස රාජපක්ෂ මහතා සහභාගි විය. මෙම වැඩසටහන සමාරම්භක උත්සවය, විද්වත් සාකච්ඡාව සහ සාම්ප්‍රදායික ශ්‍රී ලාංකීය නර්තන අංගයන්ගෙන් යුතු සංස්කෘතික සංදර්ශනයක් සහ අනෙකුත් ආසියානු ඉදිරිපත් කිරීම් වලින් සමන්විත විය. මෙම උත්සවය සඳහා 1200 කට අධික පිරිසක් සහභාගි වූහ.

උ. ප්‍රංශ සෙනට් සභාවේ විදේශ කටයුතු, ආරක්ෂක හා සන්නද්ධ හමුදා කමිටුවේ උප සභාපති හෙලන් කොන්වි-මෞරෙට් මහත්මිය 2018 ජූනි 05 සිට 08 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නියුතු විය.

ඌ. පැරිසියේ ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය සමඟ සහයෝගීත්වයෙන් 2018 ජූනි 22 - 23 දක්වා 'ශ්‍රී ලංකා දිනය' සම්බන්ධීකරණය කර සංවිධානය කරන ලදී.

ඍ. මහානගර සහ බස්නාහිර පලාත් සංවර්ධන ගරු. අමාත්‍ය පාඨලී චම්පික මහතාගේ 2018 ජූනි 30 වනදා සිට ජූලි 06 වන දින දක්වා පැවති ප්‍රංශ නිල සංචාරයට පහසුකම් සපයනු ලැබීය. ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමට උනන්දු වූ ප්‍රංශ සමාගම් 15 කට අධික සංඛ්‍යාවක් සමඟ MEDEF ඉන්ටර්නැෂනල් හිදී (ජාත්‍යන්තර ප්‍රංශ ව්‍යාපාරික සම්මේලනය) ආයෝජන සමුළුවක් සංවිධානය කරන ලදී. මෙම රැස්වීම් පැවැත්වීමෙන් පසුව, SNPF (ප්‍රංශ දුම්රිය සමාගම), මහා නගර ව්‍යාපෘතිය සඳහා වැඩසටහනක් සකස් කිරීම අරමුණු කරගත් අධ්‍යයන චාරිකාවක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණියහ.

ඎ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, අපනයන සංවර්ධන මණ්ඩලය සහ ප්‍රංශයේ ව්‍යාපාරික සංසදය අතර ත්‍රෛයිපාර්ශ්වික අවබෝධතා ගිවිසුමක් සඳහා 2018 ජූලි මස කොළඹදී අත්සන් තැබිණි.

එ. අපනයන සංවර්ධන මණ්ඩලය සමඟ එක්ව පැරිසියේ ටෙක්සර්වර්ඩ් ඇඟලුම් මූලාශ්‍ර - 2018 වෙළඳ ප්‍රදර්ශනයට සහභාගි විය. 2018 සැප්තැම්බර් 17 සිට 20 දක්වා පැවති මෙම උත්සවය සඳහා ඇඟලුම් අපනයනකරුවන් සයදෙනෙකු සහ මෝස්තර නිර්මාණකරුවන් දෙදෙනෙකු සහභාගී වූහ.

ඒ. 2018 සැප්තැම්බර් 21 - 23 දක්වා පැරිසියේදී පැවැත්වූ ආහාරපාන ගම්මානය සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සම්බන්ධීකරණය හා සංවිධානය සිදු කරන ලදී.

ඔ. 2018 සැප්තැම්බර් 25 - 28 දක්වා පැරිසියේ පැවති ෂෂඔ ඔධෂ සඎ් 2018 සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සම්බන්ධීකරණය හා සංවිධානය සිදු කරන ලදී.

ඕ. අධ්‍යාපන අමාත්‍ය ගරු. අකිල විරාජ් කාරියවසම් මහතා ප්‍රධාන රාජ්‍ය දූත පිරිසක් 2018 ඔක්තෝබර් 3 - 17 දක්වා පැවති යුනෙස්කෝ විධායක මණ්ඩලයේ 205 වන සැසිවාරයට සහභාගි වූහ.

ඖ. 2018 ඔක්තෝබර් 21 - 25 දක්වා පවත්වන ලද SIAL ජාත්‍යන්තර ආහාර හා පාන වර්ග ප්‍රදර්ශනය, සඳහා වැවිලි කර්මාන්ත අමාතය ගරු. නවින් දිසානායක මහතා සහ රාජ්‍ය කෘෂිකර්ම අමාත්‍ය ගරු. වසන්ත අලුවිහාරේ මහතා සහභාගි විය.

ක. 2018 නොවැම්බර් 26 සිට දෙසැම්බර් 1 දක්වා පැවැත්වීමට නියමිත අස්පෘශ්‍ය සංස්කෘතික උරුමයන් සුරක්ෂිත කිරීම සඳහා වන අන්තර් රාජ්‍ය කමිටුවේ 13 වන සැසිවාරයේදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සඳහා ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමට සහය දක්වන ලදී.

ඛ. ශ්‍රී ලංකාවේ පහත දැක්වෙන මාධ්‍ය චාරිකා සහ සිනමා නිර්මාණ නැරඹීමට පහසුකම් සැලසිනි.

- " Off Roads" සංචාරක වාර්තා චිත්‍රපටය
- " One Planet " වනජීවිත වාර්තා චිත්‍රපටය
- “Invitation au voyage” ප්‍රංශ සිත්තම
- “Faut Pas Rêver” TV3 සංස්කෘතික සංදර්ශනය
- ශ්‍රී ලංකාවේ සිය වාර්ෂික සම්මේලනය පැවැත්වීමට පෙර එහි මූලික සංචාරය ලෙස ස්පාඤ්ඤ සංචාරක නියෝජිතායතන සංගමය (CEAV) ශ්‍රී ලංකාවේ සංචාරය කිරීම

ග. පහත සඳහන් සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් සඳහා පහසුකම් සැලසිනි.

- 2018 මාර්තු මස 10 - 15 දක්වා පැරිසියේදී පැවති “ Salon Mondial du Tourism” හි 43 වැනි සංස්කරණය
- 2018 සැප්තැම්බර් මස 21 - 23 දක්වා පැරිසියේදී පැවති ආහාරපාන ගම්මානය
- 2018 සැප්තැම්බර් මස 25 - 28 දක්වා පැරිසියේදී පැවති IFTM TOP RESA 2018
- 2018 නොවැම්බර් මස 27 - 29 දක්වා ස්පාඤ්ඤයේ බාර්සිලෝනාහිදී පැවති IBTM World 2018
- 2018 දෙසැම්බර් මස 3 - 7 දක්වා කාන්ස් හි පැවති ILTM සුඛෝපභෝගී සංචාරක ප්‍රදර්ශනය

- 2018 නොවැම්බර් 29 - 30 දක්වා ශ්‍රී ලංකාවේදී පැවති ස්පාඤ්ඤ සංචාරක නියෝජිතායතන සංගමයේ (CEAV) වාර්ෂික සමුළුව සහ B2B සැසිය

1.9 ජෝර්ජියාව

ජෝර්ජියාව වෙත සමගාමීව සිදු කරන ලද අක්ත ගැන්වීම් හරහා තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. 2018 ජූලි මස 6 සිට 20 දක්වා පැවති 5 වන විවෘත රාජ්‍ය හවුල්කරුවන්ගේ සහයෝගීතා සංසදය සඳහා සහභාගි වූ ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමා ප්‍රධාන ශ්‍රී ලංකා සහභාගිත්වයට පහසුකම් සලසනු ලැබීය.

ආ. 2018 ජූලි 16 සිට 20 වන දින දක්වා තෙබිලිහි පැවති 5 වන විවෘත රජයේ හවුල්කරුවන්ගේ සංසදයට සහභාගී වන අතරතුර ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමා සහ ඔහුගේ ජෝර්ජියානු ප්‍රතිරූපය සමඟ පැවති ද්විපාර්ශ්වික සාකච්ඡාවන් සඳහා පහසුකම් සලසනු ලැබීය.

ඇ. 2018 අගෝස්තු මාසයේ දී ජෝර්ජියාවේ සහ ශ්‍රී ලංකාවේ සංචාර මෙහෙයවන්නන් අතර B2B හමුවීම් සඳහා පහසුකම් සපයන ලදී.

ඈ. ආරක්ෂක අමාත්‍යාංශය සහ රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ සාකච්ඡා සඳහා, ජෝර්ජියානු රාජ්‍ය හමුදා විද්‍යාත්මක තාක්ෂණ මධ්‍යස්ථානයේ (DELTA) දූත කණ්ඩායම් දෙකක් 2018 සැප්තැම්බර් 03 සිට 06 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. දෙරට අතර යුධමය සහයෝගිතාවය වැඩි දියුණු කිරීමේ මෙහි පරමාර්ථය විය.

ඉ. ජෝර්ජියාවේ සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා කිර්තිමත් සංචාරක මෙහෙයුම්කරුවන් සමඟ සාකච්ඡා පැවැත්විය.

ඊ. 2018 - 2022 කාලය සඳහා අස්පෘශ්‍ය සංස්කෘතික උරුමයන් සුරක්ෂිත කිරීම සඳහා වන ශ්‍රී ලංකා අපේක්ෂකත්වය සඳහා තුර්කියේ සහාය සාර්ථක ලෙස හිමි විය.

උ. ජෝර්ජියානු කොන්සල් ජනරාල් කාර්යාලය ශ්‍රී ලංකාවේ ස්ථාපිත කරන ලදී.

1.10 ජර්මනිය

ජර්මනියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. CKDU පිළිබඳ අධ්‍යයනයක් සිදු කිරීම සඳහා සහ මේ සම්බන්ධයෙන් ජර්මන් රජය විසින් ශ්‍රී ලංකාව වෙත ව්‍යාප්ත කළ හැකි ආධාර පිළිබඳ සොයා බැලීම සඳහා මහාචාර්ය එකාර්ඩ්ට් මහතා 2018 පෙබරවාරි මස 14 වන දින ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

ආ. ශ්‍රී ලංකා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් සහ නියෝජිත පිරිස නැවත පැමිණීම සහ පිටමං කිරීම සම්බන්ධ සාකච්ඡාවන්ට සහභාගි වීම සඳහා 2018 පෙබරවාරි 18 - 19 දිනයන්හි ජර්මනියේ සංචාරයක නියුතු වූහ.

ඇ. රාජ්‍ය කෘෂිකර්ම අමාත්‍ය ගරු. වසන්ත අලුවිහාරේ මහතා අන්තර්ජාතික හරිත සතියට සහභාගී වීම සඳහා 2018 ජනවාරි මස 18 - 20 දිනයන්හි ජර්මනියේ සංචාරයක නිරත විය.

ඈ. ශ්‍රී ලංකාව තුළ ද්විපාර්ශවික වෙළඳාම සහ ආයෝජනය වැඩි දියුණු කිරීම පිළිබඳ කටයුතු කිරීම සඳහා ජර්මනියේ කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ දූත කණ්ඩායමක් 2018 පෙබරවාරි 28 දින ශ්‍රී ලංකාවට පැමිණියහ.

ඉ. සංචාරක හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය ගරු. ජෝන් අමරතුංග මහතා 2018 මාර්තු 06 සිට 10 දක්වා බර්ලිනයේ සංචාරයක නිරත විය.

ඊ. බර්ලින් නුවර පැවති අන්තර්ජාතික සංචාරක වෙළෙඳ ප්‍රදර්ශනය (International Travel Trade Show) හි ශ්‍රී ලංකා සහභාගිත්වය සම්බන්ධීකරණය කරන ලැබීය. 2017 මාර්තු මස 7 - 11 දිනවල පැවති තරඟාවලියේදී ශ්‍රී ලංකා මණ්ඩපය 7 වැනි ස්ථානය දිනා ගනු ලැබීය.

උ. ජර්මානු අධ්‍යයන හුවමාරු සේවාව (DAAD) සහ ශ්‍රී ලංකාවේ ජාතික විද්‍යා පදනම අතර අවබෝධතා ගිවිසුමක් 2018 අප්‍රේල් මස 06 වන දින අත්සන් කෙරිණි.

ඌ. 2018 අප්‍රේල් 17 වන දින සිට පැවති බර්ලිනයේ බලශක්ති සංක්‍රමණික සංවාදයට (BETD) සහභාගී වීම සඳහා ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු. තිලක් මාරපාන මහතා ජර්මනියේ සංචාරයක නිරත විය. මෙම නිල සංචාරය අතරතුර, ගරු අමාත්‍යවරයා ජර්මානු ෆෙඩරල් සමූහාණ්ඩුවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු නීල්ස් අනෙන් මහතා සමඟ කාකච්ඡාවක නිරත විය.

සෘ. ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය කාර්ය මණ්ඩල ප්‍රධානී සහ යෞවන කටයුතු අමාත්‍ය ගරු. සාගල රත්නායක මහතා 2018 මැයි මස 16 - 18 දිනයන්හි මියුනිච් නුවර සංචාරයක නිරත විය.

සෘෘ. OAV විසින් සංවිධානය කරන ලද, ශ්‍රී ලංකාව තුළ සූර්ය ශක්තිය සහිත ස්වයංධාරක ගොඩනැගිලි, යන තේමාව යටතේ මියුනිච්හි පැවති සූර්ය සමුළුව සඳහා පහසුකම් සැලසීය. ජර්මනියේ ශ්‍රී ලංකා තානාපතිතුමන් විසින් 2018 ජූලි 03 දින සම්මන්ත්‍රණයේ ප්‍රධාන දේශනය පැවැත්වීය.

ඵ. 2018 අගෝස්තු 03 - 06 දක්වා හැම්බර්ග්, ඩුසල්ඩෝෆ්, ෆ්‍රැන්ක්ෆර්ට් සහ මියුනිච් යන නගරවල පැවති සංචාරක මාර්ග ප්‍රදර්ශනය සම්බන්ධීකරණය කරනු ලැබීය.

ඒ. ජර්මනියේදී සංවිධානය කරනු ලැබූ ව්‍යාපාරික සංසදයට සහභාගි වීම සඳහා සංවර්ධන ක්‍රමෝපායන් හා ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අමාත්‍ය ගරු. මලික් සමරවික්‍රම මහතා 2018 සැප්තැම්බර් 24 - 26 දිනයන්හි ජර්මනියේ සංචාරයක නිරත විය.

ඓ. සංවර්ධන ක්‍රමෝපායන් හා ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අමාත්‍ය ගරු. මලික් සමරවික්‍රම මහතා විසින් 2018 සැප්තැම්බර් 24 - 26 දිනයන්හි සිදු කළ ජර්මානු සංචාරය අතරතුර, ජර්මනියේ වාණිජ මණ්ඩල හා කර්මාන්ත සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නියෝජිත පිරිස සමඟ සහයෝගීත්වයෙන්, ආයෝජන / ආර්ථික සංසදය සඳහා පහසුකම් සැපයීය.

ඔ. ශ්‍රී ලාංකීය සිනමාව පිළිබඳ සංවාදයක් සංවිධානය කරන ලද අතර, තානාපති කාර්යාලයේදී 'ඉර හඳ යට' සිංහල සිනමා සිත්තම තිරගත කරනු ලැබීය. මෙම සිනමා පටයේ නිෂ්පාදක හා අධ්‍යක්ෂක බෙනට් රත්නායක මහතා මෙම උත්සවයට සහභාගී වූ අතර, සිනමා පටයේ පසුබිම සහ සංකල්පය ඔහු විසින් පැහැදිලි කරනු ලැබීය.

ඕ. ආසියා පැසිෆික් කලාපයේ තානාපතිවරුන් හා රාජ්‍ය තාන්ත්‍රිකයන්හට ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික නර්තන අංගයන් ප්‍රදර්ශනය කිරීම අරමුණු කර ගනිමින්, නේවාසික කාර්යාල පරිශ්‍රයේදී සංස්කෘතික සන්ධ්‍යාවක් සංවිධානය කරන ලදී.

ඖ. ශ්‍රී ලංකාව සහ ජර්මනිය අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතාවන්හි 65 වන සංවත්සරය සැමරීම සඳහා බර්ලින් නගර ශාලාවේ සිට තානාපති කාර්යාල පරිශ්‍රය දක්වා රාජ්‍යතන්ත්‍රික ප්‍රජාව, ශ්‍රී ලාංකිකයන් සහ ජර්මානු ජාතිකයින්ගේ සහභාගිත්වයෙන් බයිසිකල් රැලියක් සංවිධානය කරන ලදී.

ක. ජර්මනියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් බර්ලිනයේ බෞද්ධ විහාරස්ථානයට චාරිත්‍රානුකූලව අටවිසි බුදු පිළිම පූජා කරනු ලැබීය.

ඛ. 2018 සැප්තැම්බර් 30 දින බර්ලින් නුවර වෙත වැඩම කරවූ ශ්‍රී මහා බෝධි අංකුරය රෝපණය කිරීම සඳහා බර්ලින්හි ෆ්‍රොනෝව් බෞද්ධ පන්සල වෙත චාරිත්‍රානුකූලව පූජා කරන ලදී.

ග. 2016 දී අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම අනුව ශ්‍රී ලංකාවේ වෘද්ධ චිකිත්සක හෙදියන් බඳවා ගැනීම සම්බන්ධයෙන් ආර්ථික සහයෝගිතා හා බලශක්ති අමාත්‍යාංශය සහ ජර්මානු ෆෙඩරල් විදේශ කාර්යාලය සමඟ අඛණ්ඩව සාකච්ඡා පවත්වනු ලැබීය.

ඝ. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB), තේ මණ්ඩලය, පොල් සංවර්ධන අධිකාරිය, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සහ වාණිජ දෙපාර්තමේන්තුව යන ආයතන විසින් ජර්මානු වෙළඳ සල්පිලෙහි ශ්‍රී ලාංකීය සහභාගීත්වය සඳහා ෆ්‍රැන්ක්ෆර්ට් හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල්තුමා විසින් පහසුකම් සපයනු ලැබීය. ශ්‍රී ලාංකික ප්‍රදර්ශකයින් ජර්මානු වෙළඳ සල්පිල් 16 ක් සඳහා සහභාගී වූහ. ශ්‍රී ලාංකේය අපනයනකරුවන් අතර ජර්මානු වෙළඳ සල්පිල් 19 ක් ප්‍රවර්ධනය කරන ලද අතර, ප්‍රදර්ශකයින් / නරඹන්නන් 400 කට පමණ මෙහිදී පහසුකම් සැලසීය. ජර්මනියෙන් ශ්‍රී ලංකාව වෙත ව්‍යාපාර නියෝජනයන් 04 ක් සහ ශ්‍රී ලංකාවෙන් ජර්මනිය වෙත ව්‍යාපාරික නියෝජනයන් 17 ක් සිදු කිරීම සඳහා සහාය විය.

ච. සංවර්ධන ක්‍රමෝපායන් සහ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අමාත්‍යවරයාගේ සංචාරය සහ ජර්මනියේ වෙළඳ හා කර්මාන්ත වාණිජ මණ්ඩලය සහ ජර්මානු ආසියා ශාන්තිකර ව්‍යාපාර සංගමයේ (OAV) සහාය ඇතිව ෆ්‍රැන්ක්ෆර්ට්, හැම්බර්ග් සහ බර්ලින්හි පැවැත්වූ ආයෝජන ප්‍රවර්ධන මාර්ග සැනකෙළි සඳහා ෆ්‍රැන්ක්ෆර්ට්හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් විසින් පහසුකම් සපයනු ලැබීය.

ඡ. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් සංවිධානය කරන ලද මියුනිච්, ඩයස්ඩර්ෆ්, හැම්බර්ග් සහ ෆ්‍රැන්ක්ෆර්ට් නගර 4 හි පැවැත්වූ මාර්ග සැනකෙළි සඳහා ෆ්‍රැන්ක්ෆර්ට්හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් විසින් පහසුකම් සපයනු ලැබීය.

ජ. ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සභාවේ (NYSC) අනුග්‍රහය සහිතව හඳුන්වාදෙන ලද තරුණ නුවමාරු වැඩසටහනක් යටතේ කසෙල් විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන් 05 දෙනෙකුගේ ශ්‍රී ලංකානු සංචාරය සඳහා ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් විසින් පහසුකම් සපයනු ලැබීය. පසු විපරම් වැඩසටහන 2017 නොවැම්බර් මස 14 වන දින කසෙල් විශ්වවිද්‍යාලයේදී විද්වතුන් සහ ශිෂ්‍යයින්ගේ සහභාගිත්වයෙන් පැවැත්විනි. ඇමතිවරයා මෙම වැඩ සටහනට සහභාගි වූ අතර, අතිරේක ලේකම් (තරුණ කටයුතු) ස්කයිප් හරහා සහභාගිවූවන් අමතනු ලැබීය. ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ශ්‍රී ලංකා යොවුන්

නියෝජිත පිරිසගේ අන්‍යොන්‍ය සංචාරය සඳහා පහසු දිනයන් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් කසෙල් විශ්වවිද්‍යාලය සමග සහයෝගීව කටයුතු කරනු ලැබේ.

1.11 ඉතාලිය

ඉතාලියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. මිලාන්හි මෙට්‍රොපොලිටන් රජය සහ ශ්‍රී ලංකාව අතර සහයෝගීතාව වැඩි වර්ධනය කිරීම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා 2018 ජනවාරි මස 16 වන දින මිලාන්හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල්වරයා, මිලාන්හි ප්‍රාන්ත නායක ලුසියානා ලැමරෝග්ස් මහතා හමුවිය.

ආ. 2018 පෙබරවාරි මස 9 වන දින, ඉතාලියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය නර්තන කණ්ඩායමේ සහභාගිත්වයෙන් රෝමයේ වෙස්ටින් එක්සෙල්සියෝ හෝටලයේදී 'ශ්‍රී ලංකාවේ රුචිකත්වයන්' නමින් විශේෂ සංස්කෘතික වැඩසටහනක් සංවිධානය කරන ලදී. එසේම මහනුවර අමායා හිල්ස් හෝටලයේ සේවයේ නියුතු ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨතම සූපවේදීන් දෙදෙනෙකුගේ සහාය ඇතිව 2018 පෙබරවාරි මස 10 - 15 වන දින දක්වා වෙස්ටින් එක්සෙල්සියෝ ඩෝනි ආපනශාලාවේදී විශේෂ ශ්‍රී ලාංකේය ආහාර සතියක් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන මගින් ඉතාලි සංචාරකයින් අතර ශ්‍රී ලාංකික ආහාර සහ සංස්කෘතිය ප්‍රවර්ධනය කරන ලදී.

ඇ. වෙළඳ සහ සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් මාලාවක් පවත්වන ලදී. ශ්‍රී ලංකා ආහාර සතිය හා රාත්‍රී ආහාර පිළිගැනීමේ වැඩසටහන 2018 පෙබරවාරි මස 9 - 15 දින දක්වා රෝමයේදී, ශ්‍රී ලංකා සංස්කෘතික සන්ධ්‍යාව පෙබරවාරි 10 වන දින ෆ්ලෝරන්ස් හිදී, සහ BIT සංචාරක ප්‍රදර්ශනයේ ශ්‍රී ලංකා සහභාගිත්වය 2018 පෙබරවාරි මස 11 - 13 වන දිනයන්හි, මිලාන්හිදී සහ ශ්‍රී ලංකාවේ සංචාරක සමාගම් 20 ක් සමඟ B2B හමුවීම් පැවැත්වීම සිදුවිය.

ඈ. 2018 පෙබරවාරි මාසයේ පැවති 5 වන IFAD - 11 වන අනුග්‍රාහක උපදේශන කටයුතු සඳහා ශ්‍රී ලංකා සහභාගි වූ අතර, 2018 පෙබරවාරි මාසයේ පැවති 41 වන IFAD පාලන කවුන්සිලයට සහභාගී විය. පිළිවෙලින් 2018 පෙබරවාරි සහ ජූනි මාසයන්හි පවත්වන ලද WFP's විධායක මණ්ඩල රැස්වීම සහ එහි විධායක මණ්ඩලයේ වාර්ෂික සැසිවාරයට ශ්‍රී ලංකාව සහභාගි වූ අතර, 2018 - 2022 කාල පරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකාව සඳහා අනුමත කල WFP's උපායමාර්ගික සැලැස්මට සමගාමීව ශ්‍රී ලංකාවේ පාසල්වල ආහාර සහ පෝෂණ වැඩසටහන් සඳහා අරමුදල් සම්පාදනය කිරීම දිරිගැන්වීමට සහ පෞද්ගලික අංශය දිරිගැන්වීමට දූත පිරිස ධෛර්යමත් කරනු ලැබීය.

ඉ. ඉතාලි විදේශ අමාත්‍යාංශය සහ රෝමයේ ශ්‍රී ලංකා තානාපතිවරයා සමඟ මෙන්ම, සයිප්‍රසය, ග්‍රීසිය, ඇල්බේනියාව සහ මෝල්ටාව යන රටවල්වල නේවාසික තානාපතිවරුන් සහ සමගාමී අක්ත ගැන්වූ නේවාසික තානාපතිවරුන් අතර 2018 පෙබරවාරි 28 දින සිට

මාර්තු 7 දක්වා සාකච්ඡාවන් පවත්වන ලද අතර, එහිදී 2018 - 2022 කාල පරිච්ඡේදය සඳහා ෂඩ වන කාණ්ඩයේ ඇති අස්පෘශ්‍ය සංස්කෘතික උරුමයන් සුරක්ෂිත කිරීම සඳහා වන අන්තර් රාජ්‍ය කමිටුවේ ආසන සඳහා ශ්‍රී ලංකා අපේක්ෂකත්වය ලබා ගැනීමට අන්‍යොන්‍ය සහාය පල කිරීම යන ක්ෂේත්‍රයන් පිළිබඳ සාකච්ඡා විය. මේ සම්බන්ධයෙන් ධනාත්මක ප්‍රතිචාර ලැබිණි. ඉතාලි පාර්ශවය එකිනෙකාගේ අපේක්ෂකත්වයන්ට සහාය දැක්වීම සඳහා එකඟතාවය පල කරන ලදී.

ඊ. 2018 මාර්තු මස 16 වන දින නපෙල්හි ශ්‍රී ලංකා කොන්සල්වරයා ලෙස කාමයින් කැපාසෝ මහතා පත් කරන ලදී.

උ. මිලාන් වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කළ, 2018 මාර්තු මස 20 වන දින පැවති, ආර්ථික රාජ්‍යතන්ත්‍රයේ භූමිකාව, පිළිබඳ සම්මන්ත්‍රණයට මිලාන්හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල්වරයා සහභාගී වූ අතර, එහිදි පැවති කණ්ඩායම් සාකච්ඡාවන්ටද සහභාගි විය. මෙහිදී ශ්‍රී ලංකාව තුළ ආයෝජන / ව්‍යාපාරික අපේක්ෂාවන් පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

ඌ. මැයි 22 වන දින ටියුරින් වාණිජ මණ්ඩලයේදී ශ්‍රී ලංකා රාජ්‍ය දේශනය ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංකාවේ රබර් නිෂ්පාදන, ආහාර, කුළුබඩු, කොහුබත් හා සංචාරක භාණ්ඩ සඳහා ඉතාලි ආයෝජකයින් හා ගැණුම්කරුවන් හමුවීමට (වෙළඳ) අමාත්‍යවරයා ටියුරින්හි තනිවම සංචාරය කරන ලදී.

ඍ. ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ගරු. විජේවර්ධන මහතා විසින් 2018 මැයි 30 - ජුනි 04 දක්වා මිලාන්හි සිදුකළ සංචාරය සඳහා මිලාන්හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල්වරයා විසින් පහසුකම් සලසනු ලැබීය.

ඎ. ඉතාලියේ හොප්ලි පබ්ලිෂර්ස්, ඉතාලියේ ශ්‍රී ලංකා කොන්සල් ජනරාල්වරයා සමඟ හවුල්කාරීත්වයෙන් යුතුව ඉතාලි ජාතික ජනමාධ්‍යවේදී ලූකා නොවේලි විසින් රචිත "IL PONTE DI ADAMO" (ආදම්ගේ පාලම) නම් කෘතිය 2018 ජුනි 21 වන දින මන්සෝනි නිවසේදී එළි දක්වනු ලැබීය.

එ. ඉතාලියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් EDB සහ ITC සමග ඒකාබද්ධව ශ්‍රී ලංකාවේ සිට මිලාන් වෙතට ආහාර සැකසුම් හා ඇසුරුම්කරණය පිළිබඳ සාමාජිකයින් 13 දෙනෙකුගෙන් සමන්විත අධ්‍යයන චාරිකාවක් සඳහා පහසුකම් සපයන ලදී.

ඒ. ආහාර හා කෘෂිකාර්මික සංවිධානයේ (FAO) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ආරාධනය මත ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා වන සංරක්ෂණ කමිටුවේ (COFO) 24 වැනි සැසිවාරය ඇමතීම සඳහා සහ 2018 ජූලි 14 - 16 දක්වා රෝමයේ FAO මූලස්ථානයේ පැවති ලෝක වන සතියට සහභාගි වීම සඳහා 2018 ජූලි 14 - 16 දින දක්වා ඉතාලියේ නිල සංචාරයක නියුතු විය.

ඒ. සයිප්‍රසයේ කොන්සල් ජනරාල් කාර්යාලයක් පිහිටුවීමට අදාළ තානාපති කාර්යාලයේ යෝජනාව අනුගමනය කිරීමෙන් පසුව, ළඟදීම දිනක සයිප්‍රසයේ නිකෝසියාවේ නව ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය විවෘත කිරීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සූදානම් කෙරෙමින් පවතී. නව පත්වීම් ලද සයිප්‍රසයේ නිකෝසියාවේ ශ්‍රී ලංකා කොන්සල් ජනරාල්වරයා 2018 සැප්තැම්බර් 19 වන දින සිය රාජකාරී කටයුතු අරඹනු ලැබීය.

ඔ. ජාත්‍යන්තර තේ දිනය, FAO මූල්‍ය ආධාර සහිත ක්ෂේත්‍ර චාරිකා, රෝමය - පාදක වූ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සහ එහි අවබෝධතා ගිවිසුම්, එක්සත් ජාතීන්ගේ ප්‍රතිසංස්කරණ, දකුණු සහයෝගීතාව, ආසියානු කලාපීය සමූහයේ මාසික රැස්වීම් (ශ්‍රී ලංකාව එහි සභාපති ලෙස) සහ G77 සහ චීන කාර්යාංශය සහ පූර්ණ රැස්වීම් ආදිය ඇතුලත්වත ජාන සම්පත්, ජෛව විවිධත්වය, වනාන්තර, දේශගුණික විපර්යාස, ස්ත්‍රී පුරුෂ සමතුලිතතාවය, ආහාර සුරක්ෂිතතාව, පෝෂණය, ජෛව විවිධත්වය, ජෛවමිතික මිනුම්, පොහොර යෙදීම් කේත, තිරසර පාංශු, ගෝලීයව වැදගත් කෘෂිකාර්මික උරුම ක්‍රමවේද (GIAHS), ධීවර, ජලජීවී වගාව, වෙළඳ භාණ්ඩ පිළිබඳ ගැටලු යනාදී විෂයගත ක්ෂේත්‍රයන් ආවරණය කරන කමිටු රැස්වීම්, විධිමත් සම අවිධිමත් සම්මන්ත්‍රණ, ත්‍රිධ සම්මේලනය යනාදී රැස්වීම් සඳහා අඛණ්ඩ සහභාගිත්වය සිදු විය.

ඕ. ශ්‍රී ලංකාවේ බෝට්ටු ගොඩනැඟීම් ක්ෂේත්‍රයේ ඒකාබද්ධ ව්‍යාපාර පුළුල් කිරීම සඳහා සාමාජිකයින් 06 දෙනෙකුගෙන් යුත් ශ්‍රී ලාංකික ව්‍යාපාරික දූත පිරිසකගේ සංචාරයක් සංවිධානය කරන ලදී. පෞද්ගලික අංශ නියෝජිත කණ්ඩායමක් 2019 සැප්තැම්බර් 22 - 26 වන දින දක්වා ජීනෝවා සහ මිලාන් වෙත සංචාරය කළ අතර, ජිනෝවා බෝට්ටු සංදර්ශනය, ඉතාලි නාවුක කර්මාන්ත සංගමයට (UCINA) සහභාගී විය. එහිදී තෝරාගත් ඉතාලි බෝට්ටු නිෂ්පාදකයින් වන සැන්ලොරෙන්සෝ එස්.පී.ඒ., අමර් යැචෙට්, ඇසොමැරිනාස්, එෆ්බී ඩිසයින් සමාගම, එෆ්. ලිලි ඇන්ජලිස් සමාගම, රූන්ක්‍රාෆ්ට් යැචෙට්, නුමෆවා ජොලි නාවුක සමාගම, ජාත්‍යන්තර නාවුක සමාගම සහ ඩෙල්ටා බිල්ඩ සමාගම යන ඉතාලි බෝට්ටු නිෂ්පාදකයින් හමුවීමට කටයුතු කරන ලදී.

ඖ. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) සමඟ එක්ව සංවිධානය කරන ලද ශ්‍රී ලංකා පාවහන් නිෂ්පාදකයින් සඳහා වූ 5 - සාමාජික වෙළඳපොළ නිරාවරණ වැඩසටහන 2018 සැප්තැම්බර් මස 25 - 27 දිනයන්හි මිලාන්හිදී පැවැත්වීමට සංවිධානය කරන ලදී.

ක. ඉතාලියේ එළිමහන් සංචාරක ප්‍රවර්ධන ප්‍රචාරණ වැඩසටහනක් පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) විසින් සහාය ලබා දුන් අතර, රෝමයේ සංචාරක මාර්ග සැනකෙළියක් පැවැත්වීමටත් ඔක්තෝබර් මාසයේ දී රිමිනි පිහිටි ඔඔඨ ඉන්කොන්ට්‍රි සංචාරක ප්‍රදර්ශනයට සහභාගි වීමටත් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට තානාපති කාර්යාලය සිය සහාය පල කරනු ලැබීය. එසේම ඉතාලියේ ප්‍රධාන සංචාරක සඟරා දෙකක සංචාරක වෙළඳ දැන්වීම් පල කිරීමටද SLTPB සහාය ලබා දෙනු ලැබීය.

ඔ. ඉතාලියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ඉතාලි විදේශ කටයුතු අමාත්‍යාංශය සහ ඉතාලියේ ගෝලීය ක්‍රියාකාරී සංගමය සමඟ එක්ව 2018 පෙබරවාරි 23 සිට මැයි 30 දක්වා පැවති, රාජ්‍යතාන්ත්‍රික අධ්‍යාපනය, වැඩසටහනට සහභාගි විය. මෙය රෝමයේ අනෙකුත් විදේශ දූත මණ්ඩල සමග එක්ව සිදු කරන ලදී. ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ඉතාලි විදුහල (ලයිසෝ මැපොරනානා) සමඟ ද්විපාර්ශ්වික සබඳතා පැවැත්වූ අතර, අතිගරු තානාපතිතුමා සහ රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් විසින් ශ්‍රී ලංකාවේ වෙළඳාම සහ ආයෝජන ඇතුලත්ව ද්විපාර්ශ්වික / දේශපාලන, සංස්කෘතික සහ කොන්සියුලර් සහයෝගීතාව යන ක්ෂේත්‍රයන් සඳහා සිසුන් 25 දෙනෙකුගෙන් (වයස 16 - 17) සමන්විත කණ්ඩායමක් සමඟ අන්තර් ක්‍රියාකාරී සැසි කිහිපයක් පැවැත්වීය. 2018 මැයි මාසයේ රෝමයේ උපජ මූලස්ථානයේ පවත්වන ලද මෙම වැඩසටහනෙහි නිගමනයන් සඳහා පැවති එක්සත් ජාතීන්ගේ ආදර්ශ වැඩසටහනේදී ඉතාලි සිසුන් විසින් ශ්‍රී ලංකාව නියෝජනය කරන ලදී.

ග. FAO-චීනය-ශ්‍රී ලංකාව දකුණු සහයෝගීතාවයේ ත්‍රෛයිපාර්ශ්වික ගිවිසුම අත්සන් කිරීමේ උත්සවය 2018 දෙසැම්බර් 06 දින රෝමයේ FAO හි දී පැවැත්විණි. ශ්‍රී ලංකා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා හා FAO හි නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා (වැඩසටහන්) සහ චීන තානාපතිවරයා ගිවිසුම අත්සන් කිරීම සඳහා සහභාගි වූහ. මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය (ඇ.ඩො. මිලියන 1.1 කට වඩා වැඩි වටිනාකමින් යුත්) වන්නේ, කෙසෙල්, අඹ සහ අන්නාසි යන පලතුරු බෝග වර්ග තුනෙහි නිෂ්පාදනය සහ වාණිජකරණය කිරීම වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවට සහාය දැක්වීමයි.

1.12 ලැට්වියාව

ලැට්වියාව වෙත සමගාමීව සිදු කරන ලද අක්ත ගැන්වීම් හරහා ස්ථිඩනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. ලැට්වියා ජනරජයේ ජනාධිපති අතිගරු රේමන්ඩ්ස් වෙජෝනිස් මහතා සහ ජනාධිපති ආර්යා ඉවෙන්ටා වෙජෝනිස් මහත්මිය 2018 ජනවාරි 06 - 16 දක්වා ශ්‍රී ලංකාවේ පෞද්ගලික සංචාරයක නිරත විය.

ආ. වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු නවීන් දිසානායක මහතා හට 2018 සැප්තැම්බර් 15 - 18 දක්වා ලැට්වියාවේ නිල සංචාරය සඳහා පහසුකම් සපයන ලදී. මෙම සංචාරයේ ප්‍රධාන අරමුණ වූයේ බෝල්ටික් රටවල්වල ලංකා තේ වෙළෙඳපොළ කොටස් ප්‍රවර්ධනය කිරීම සහ පුළුල් කිරීමයි.

1.13 ලිතුවේනියාව

ලිතුවේනියාව වෙත සමගාමීව සිදු කරන ලද අක්ත ගැන්වීම් හරහා ස්ථිඩනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු නවීන් දිසානායක මහතා ප්‍රධාන දූත පිරිසක් 2018 සැප්තැම්බර් 13 - 15 දක්වා ලිතුවේනියාවෙහි නිල සංචාරයක නිරත විය. මෙම සංචාරයේ ප්‍රධාන අරමුණ වූයේ බෝල්ටික් රටවල්වල ලංකා තේ වෙළෙඳපොළ කොටස් ප්‍රවර්ධනය කිරීම සහ පුළුල් කිරීමයි.

ආ. ශ්‍රී ලංකා සේවකයින්ට නිසි පහසුකම් සැපයීම සඳහා ලිතුවේනියාවෙහි පිහිටි 'විසාටෙක්ස්' ඇඟලුම් කම්හල් කළමනාකරණය සමග අඛණ්ඩ සංවාදයකට සම්බන්ධ විය.

1.14 ලක්සම්බර්ග්

ලක්සම්බර්ග් වෙත සමගාමීව සිදු කරන ලද අක්ත ගැන්වීම් හරහා බෙල්ජියමේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) සමඟ එක්ව, 2018 ජනවාරි 12 - 14 දක්වා ලක්සම්බර්ග්හි දී පැවති වැකන්ස් වෙළඳ පොලෙහි (Vakanz salon Dou Tourisme) 26 වන සංස්කරණයේදී ශ්‍රී ලංකා මණ්ඩපය සංවිධානය කරන ලදී.

ආ. ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු. සුජීව සේනසිංහ මහතා 2018 මැයි මස 16 වන දින ලක්සම්බර්ග්හිදී EIB හි අධ්‍යක්ෂ ජනරාල් හමුවූ අතර, එහිදී ඈපඊ විසින් අරමුදල් සපයන ලද මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව සාකච්ඡා කරනු ලැබූහ.

ඇ. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) සමඟ එක්ව, 2018 මැයි 29 වන දින ලක්සම්බර්ග්හි ලක්සම්බර්ග් සංචාරක මෙහෙයවන්නන් සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන වැඩසටහනක් සංවිධානය කරන ලදී. උත්සවයේ ප්‍රධාන අරමුණ වූයේ දැනුවත් කිරීම, දැනුම හුවමාරු කර ගැනීම හා ලක්සම්බර්ග් හි සංචාරක මෙහෙයවන්නන් සඳහා යෝග්‍ය ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමයි.

ඈ. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය හා ලක්සම්බර්ග් වාණිජ මණ්ඩලය සමඟ එක්ව ලක්සම්බර්ග්හිදි ශ්‍රී ලංකාව පිළිබඳ දැනුවත් වීම සඳහා වටමේස සාකච්ඡාවක් පවත්වන ලද අතර, ඉන් පසුව ලක්සම්බර්ග් සමාගම් සමඟ ජාලගත දිවා භෝජන සංග්‍රහයක් පැවැත්විය. ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු. සුජීව සේනසිංහ මහතා ප්‍රධාන 25 දෙනෙකුගෙන් සමන්විත ශ්‍රී ලංකා වෙළඳ නියෝජිත කණ්ඩායමක් මෙම උත්සවයට සහභාගි විය.

ඉ. 2018 ජූලි මාසයේ දී ලක්සම්බර්ග් සිවිල් ගුවන් සේවා අධිකාරිය සමඟ සාකච්ඡා පැවැත්වීම සඳහා ශ්‍රී ලංකාවෙහි ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් පී. එස්. විතානගේ මහතා සහ නියෝජිත පිරිසගේ ලක්සම්බර්ග් සංචාරයට පහසුකම් සැලසීය.

ඊ. කාගොලක්ස් සහ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය අතර අවබෝධතා ගිවිසුමක් 2018 ජූලි මස අත්සන් කරන ලදී.

උ. UNGA 75 වන සැසිවාරයට අනුගාමීව ද්වි-මාර්ග සංචාරය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාව සහ ලක්සම්බර්ග් අතර ගුවන් සේවා ගිවිසුමද 2018 සැප්තැම්බර් මස 25 වන දින නිව්යෝක්හි දී අත්සන් කරන ලදී.

1.15 මැසිඩෝනියාව

මැසිඩෝනියාව වෙත සමගාමීව සිදු කරන ලද අක්ත ගැන්වීම් හරහා ඔස්ට්‍රියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. 2018 මැයි මස 28 - 30 දක්වා ගරු. සුමන්තිරන්, ගරු. ජනක බාලසූරිය, ගරු. අජිත් මාන්නප්පෙරුම මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් සහ පාර්ලිමේන්තු මහලේකම් ධම්මික දිසානායක මහතා ඇතුළු පාර්ලිමේන්තු නියෝජිත පිරිසකගේ මැසිඩෝනියාවේ සංචාරය සඳහා පහසුකම් සැලසීය.

1.16 නෙදර්ලන්තය

නෙදර්ලන්තයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) සමඟ එක්ව, 2018 ජනවාරි 09 - 14 වන දින දක්වා "Vakantiebeurs)2018" සංචාරක වෙළඳ ප්‍රදර්ශනය සංවිධානය කරන ලදී.

ආ. 2018 මැයි මස 10 වන දින අන්තර්ජාතික වෙසක් දින වැඩසටහන සංවිධානය කරන ලද අතර, එයට භක්ති ගී වැඩසටහනක්, වෙසක් තොරණ, දන්සැල සහ පූජ්‍ය ඕලන්දේ ආනන්ද හිමියන් විසින් රචිත "භික්ෂූන් සහ වඳුරන්" නමැති ග්‍රන්ථය එළිදැක්වීම ඇතුලත් විය.

ඇ. ජාත්‍යන්තර වෙලඳාම පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු. සුජීව සේනසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් යුතු සමාගම් 21 ක් නියෝජනය කරන සාමාජිකයින් 31 දෙනෙකුගෙන් සමන්විත ව්‍යාපාරික නියෝජිත පිරිසක් විසින් 2018 මැයි 14 - 15 දක්වා නෙදර්ලන්තයේ සිදු කළ සංචාරය සඳහා පහසුකම් සපයන ලදී. වැඩසටහන සංරචක දෙකකින් සමන්විත වියත් ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කටයුතු සිදු කිරීම් මැයෙන් සම්මන්ත්‍රණයක් සහ ඊ2ඊ රැස්වීම් යන්නයි.

ඈ. නෙදර්ලන්ත විදේශ කටයුතු අමාත්‍යාංශයේ, ආසියා හා ඕසියානා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ පීටර් පොට්මාන් මහතා 2018 මැයි 15 - 17 දිනයන්හි ශ්‍රී ලංකාවේ සංචාරයක නියුතු විය. පොට්මාන් මහතා, 2018 මැයි 17 වන දින ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමා හමුවිය.

ඉ. මහමෙව්නාව භාවනා අසපුව විසින් සංවිධානය කරන ලද වෙසක් දින වැඩසටහනට පහසුකම් සලසන ලද අතර, 2018 මාර්තු 26 වන දින තානාපතිවරුන් හා රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් කිහිප දෙනෙකුගේ සහභාගිත්වයෙන් එම උත්සවය බලමුලු ගැන්විනි.

ඊ. නෙදර්ලන්තයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, VAT ගෙවීම් තානාපති කාර්යාලයට ආපසු නොගෙවීම සම්බන්ධයෙන් වන දිගුකාලීන ගැටලුව විසඳීම සඳහා ඕලන්ද බලධාරීන් සමඟ දිගින් දිගටම සංවාද කරමින් සිටින අතර, දේශීයව බඳවාගත් කාර්ය මණ්ඩලයට අදාළ හිඟ මුදල් නොගෙවීම පිළිබඳව බලධාරීන් සමාප ආරක්ෂණ දූත පිරිස මගින් සම්බන්ධ කර තිබේ. දූත පිරිසේ උපරිම ප්‍රයත්නය තිබියදී වුවද, ලන්දේසි බලධාරීන්ගේ සහයෝගීතාව නොමැති වීම හේතුවෙන් ශ්‍රී ලංකා රජය වෙත සරණාගත රැකවරණ පතන්නන් නොලැබීම, දූත මෙහෙවර කළමණාකරණය පිළිබඳ පද්ධතිය (RCMS) භාවිතා කිරීම සාර්ථක වී නැත.

කෙසේ වෙතත්, දූත මණ්ඩලයට හමු වූ ශ්‍රී ලාංකිකයන් හත් දෙනෙක් (07) ස්වේච්ඡා පදනමින් ෂධඒ සහාය ලබා දීම පදනම් කර ගනිමින්, එම සෘඣී මගින් නිකුත් කළ සංචාරක ලේඛන මත නිවෙස් වෙත යැවීමට දූත මණ්ඩලයට හැකි වී තිබේ.

උ. අප්‍රේල් මාසයේ දී පැවැත්වෙන EB රැස්වීමේදී ඉන්දියාව, පාකිස්තානය සහ ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සඳහා පොදු භාණ්ඩවල පොදු අරමුදල් (CFC) විධායක මණ්ඩලයට (EB) ශ්‍රී ලංකාව තේරී පත්විය. පෞද්ගලික අන්තර්ජාතික නීතිය පිළිබඳ හේග් සම්මේලනය (HCCH) විසින් සංවිධානය කරන ලද විදේශීය විනිශ්චයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයකට සහභාගි වීම සඳහා සොලිස්ටර් ජනරාල් ගරු. දප්පලා ද ලිවේරා මහතා ජූනි මාසයේ දී හේග් වෙත සංචාරය කිරීමද මෙම දූත මණ්ඩලය විසින් සම්බන්ධීකරණය කරනු ලැබ ඇති අතර, එසේම HCCH හි 150 වන සංවත්සර සැමරුම සඳහා සැප්තැම්බර් මස ඔහු විසින් සිදු කළ හේග් සංචාරයද සම්බන්ධීකරණය කරනු ලැබීය.

ඌ. මෙම දූත මණ්ඩල ස්ථාවර බේරුම් කිරීමේ අධිකරණය (PCA) සමඟ ක්‍රියාකාරීව සම්බන්ධ වී සිටී. මෙම දූත මණ්ඩලය රසායනික අවි තහනම් කිරීම සඳහා වූ සංවිධානයේ (OPCW) වර්ධනයන් සමීපව අනුගමනය කර ඇත. මෙම දූත මණ්ඩලය පහත දැක්වෙන රැස්වීම්වලට සහභාගී වී අමාත්‍යාංශයට වාර්තා යවා ඇත. එනම්, විධායක සභාවේ (EC) 89 වැනි සැසිවාරය, 2018 ඔක්තෝබර් 9 - 11, 18 සහ 22 යන දිනවල; විධායක සභාවේ 61 වැනි රැස්වීම, 2018 නොවැම්බර් 5; රාජ්‍ය පාර්ශවයන්ගේ 23 වන සැසිවාර සම්මේලනය (CSP), 2018 නොවැම්බර් 19, 20 සහ 29 සහ 4 වන සමාලෝචන සම්මේලනය (RC), 2018 නොවැම්බර් 21 - 30.

1.17 නෝර්වේ

නෝර්වේ හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. ඔස්ලෝ සංචාරක වෙළඳ සල්පිල - 2018 ජනවාරි 13 - 15 - ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ (SLTPB) සහයෝගය ඇතිව ඔස්ලෝහි පැවති "Reiselivsmessen 2018" ප්‍රමුඛ සංචාරක වෙළඳ සල්පිලෙහි ශ්‍රී ලංකා සහභාගීත්වය සංවිධානය කරන ලදී. ලොව සංචාරකයන් 50,000 ක් පමණ "Reiselivsmessen 2018" වෙත පැමිණියහ.

ආ. හමාර් ළමා උළෙල 2018 ජුනි 4 - 5 - 2018 ජුනි මාසයේ දී හමාර් හි පැවති වාර්ෂික ළමා උළෙලේ ශ්‍රී ලංකා කුටියක් සැලසුම් කරන ලදී. ශ්‍රී ලංකාව සංචාරක කේන්ද්‍රස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සමඟින් ළමුන් සඳහා ක්‍රියාකාරකම් මෙහිදී සිදු කරන ලදී.

ඇ. නෝර්වීජියානු රාජධානියේ සංවර්ධන සහයෝගීතාව පිළිබඳ රාජ්‍ය ලේකම් පෙන්ස් ෆ්‍රොලිච් හොල්ටේ මහතා 2018 ජූනි 20 - 23 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නියුතු විය. මෙම සංචාරය, නෝර්වේජියානු නාවික පර්යේෂණ යාත්‍රාව ආචාර්ය ෆ්රිඩ්ට්ජෝෆ් නන්සන් (හිමිකාරිත්වය නොරාඩ් (NORAD) සතු වන අතර විධායක ආර්ථික කලාපයෙහි (EEZ) ශ්‍රී ලංකාවේ මත්ස්‍ය සම්පත සමීක්ෂණය කිරීම සඳහා නෝර්වීජියානු සාගර පර්යේෂණ ආයතනය (IMR) සහ බර්ගන් විශ්වවිද්‍යාලය (UIB) ඒකාබද්ධව මෙහෙයවනු ලැබීය.) ගේ පැමිණීම සමඟ සමගාමී විය.

ඉහත සංචාරය අතරතුර රාජ්‍ය ලේකම් හොල්ටේ මහතා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන හා ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍ය ගරු. විජිත් විජයමුණි සොයිසා මහතා, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය ගරු මංගල සමරවීර මහතා, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය ගරු. රවුෆ් හකීම් මහතා, විපක්ෂ නායක ගරු. ආර්. සම්බන්ධන් මහතා, විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු. වසන්ත සේනානායක මහතා සහ විදේශ කටයුතු ලේකම් ප්‍රසාද් කාරියවසම් මහතා සමඟ සාකච්ඡා පවත්වනු ලැබීය.

ඈ. කොළඹ පිහිටි නෝර්වීජියානු තානාපති කාර්යාලය සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව ධීවර අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද 2018 ජූනි මස 21 වන දින පැවති "SDG 14 - ජලයට පහළ ජීවිතය" සම්මන්ත්‍රණය පෙන්ස් ෆ්‍රොලිච් හොල්ටේ මහතා විසින් අමතනු ලැබීය. ඔහු යාපනයේ සංචාරය කරන ලද අතර, එහිදී වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහනකට සහභාගි වීම සහ එළවළු හා පලතුරු ඇසුරුම් මධ්‍යස්ථානයක් විවෘත කිරීමට කටයුතු කරන ලදී. 2018 ජුනි මස 23 වන දින රාජ්‍ය ලේකම් විසින් රාජ්‍යයන් දෙකෙහි නාවික කටයුතු, සමුද්‍රීය හා ජලජීවී ක්ෂේත්‍රයේ සහභාගීවන්නන්ට සාගර කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා සහ නිල් ආර්ථික ක්ෂේත්‍රයේ සහයෝගීතාවයන් ගොඩ නැංවීම සඳහා නිල් ආර්ථිකය පිළිබඳ ව්‍යාපාරික සමුළුවක් විවෘත කරන ලදී.

ඉ. නෝර්වේහි ඔස්ලෝ මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද වැඩසටහනක් සඳහා සහභාගි වීමට 15 දෙනෙකුගෙන් සමන්විත පාර්ලිමේන්තු නියෝජිත පිරිසක් සැප්තැම්බර් 30 සිට ඔක්තෝබර් 06 දක්වා නෝර්වේ සංචාරයක් සඳහා සහභාගි වූහ.

ඊ. අන්තර් ජාතික තොරතුරු තාක්ෂණ සම්මේලනය, ‘‘ඔස්ලෝ නවොත්පාදක සතිය’’ ට සහභාගි වූ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආරම්භක සමාගම් පිළිගැනීමේ උත්සවයක් 2018 සැප්තැම්බර් 28 වන දින අතිගරු. තානාපතිතුමන් විසින් පවත්වනු ලැබීය. ICT-නෝර්වේ, නෝර්වේජියානු තොරතුරු තාක්ෂණ කර්මාන්තය සහ SLASSCOM ශ්‍රී ලංකා මෙම පිළිගැනීමේ උත්සවය සඳහා සහභාගි විය.

උ. 2018 අගෝස්තු මාසයේ පවත්වන ලද ,ප්‍රතිභා, ශ්‍රී ලංකා සංස්කෘතික උත්සවය සඳහා තානාපති කාර්යාලය සහභාගි විය.

ඌ. " ANTOR Norway’’ නෝර්වේ වසන්තය 2018 ජාල සංසදය - 2018 අගෝස්තු මාසයේ දී බර්ගන් හා ඔස්ලෝහි පවත්වන ලද ANTOR පුවත් වැඩමුළුවට නෝර්වේ හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහභාගි විය. ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

ඍ. සැප්තැම්බර් 21 සිට 23 දක්වා නෝර්වේ ලිල්ස්ට්‍රෝම් හි පැවති "OPPLEV MER" ANTOR මණ්ඩපය සඳහා සහභාගි විය. මෙම වැඩසටහන ප්‍රධාන වශයෙන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ඉලක්ක කර පැවැත්විණි. විවේකය, සෞඛ්‍යය, සංචාරය හා ආර්ථිකය යන ප්‍රධාන වෙනස් අංශ හතරක් ප්‍රවර්ධනය කිරීම මෙම වැඩසටහන මගින් අරමුණු කර තිබුණි.

ඎ. ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු. නිරෝෂන් පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් යුතු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 15 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත පිරිසක් අධ්‍යයන චාරිකාවක් සඳහා 2018 සැප්තැම්බර් 30 - ඔක්තෝබර් 06 දක්වා නොර්වේහි සංචාරයක නියුතු විය. මෙම වැඩසටහනෙහි අරමුණු වූයේ සහාග ගොඩ නැගීම සහ එකගත්වයට යාන්ත්‍රණයන් පිළිබඳවයි.

එ. ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය ගරු. රනිල් වික්‍රමසිංහ මහතා ඔක්තෝබර් 3 - 6 වන දිනයන්හි නෝර්වේ රාජ්‍යයේ සංචාරය කරනු ලැබීය. ධීවර අමාත්‍යවරයා, රාජ්‍ය නියෝජිතයින්, ව්‍යාපාරික නියෝජිතයින් සහ මාධ්‍ය නියෝජිතයින් මෙම සංචාරය සඳහා ඔහු සමඟ එක්ව සිටියහ.

ඉහත සංචාරය අතරතුර, ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයා සහ නෝර්වේ අග්‍රාමාත්‍යවරයා අතර ඒකාබද්ධ ප්‍රකාශනයකට අත්සන් තැබුණි. එමගින් තිරසර සංවර්ධන අභිමතාර්ථ, සාගර සම්පත් තිරසාර කළමනාකරණය සහ පෞද්ගලික අංශයේ සහයෝගිතාවය ආවරණය විය.

ඒ. මොස්කව් සිට කොළඹ දක්වා ගුවන් තොටුපළ හරහා ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමේ උත්සවයක් පැවැත්විය.

ඓ. ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා බර්ගන් සහ ඕස්ලෝ හි පැවති 'ANTWOR 2018' සංචාරක උත්සවය සඳහා සහභාගි විය.

ඔ. නෝර්වීජියානු නවෝත්පාදන වැඩසටහනට සහභාගි වීම සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතන ගණනාවක් නෝර්වේ රාජ්‍යයට පැමිණියහ.

ඕ. ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා ලිලිස්ට්‍රෝම් හි "Opplev Mer" වැඩසටහනට සහභාගි විය.

ඖ. ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධන අභිමතාර්ථ සම්මේලනය පැවැත්වීමේ හැකියාව පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා නෝර්වේහි ශ්‍රී ලංකා තානාපතිවරයා, ඔස්ලෝ විශ්වවිද්‍යාලයේ සංවර්ධන හා පරිසර පිළිබඳ මධ්‍යස්ථානයේ මහාචාර්ය ඩෑන් බැනික් මහතා හමු විය.

ක. නෝර්වේහි ශ්‍රී ලංකා තානාපතිවරයා ජලය ශක්තිය බවට පරිවර්තනය කිරීමේ සමාගමක් වන 'ඩීප් රිවර් ඒඑස්. / Deep River AS' හි රෙයිඩර් වෙස්ට් මහතා හමු විය.

ඛ. තානාපති කාර්ය මණ්ඩලය, ශ්‍රී ලංකා ප්‍රජා කණ්ඩායම ,තිසරණ, විසින් පවත්වන ලද සංස්කෘතික උත්සවයකට සහභාගී විය.

ග. ඉන්දියානු අධ්‍යාත්මික නායකයකු වන ශ්‍රී රවි ක්‍රිෂ්ණා මහතා විසින් ශ්‍රී ලංකාව තුළ සිදුකරන කාර්යයන් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා තානාපතිවරයා එතුමාව හමු විය.

1.18 පෝලන්තය

පෝලන්තයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය වසන්ත සේනානායක මහතා ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික කටයුතු වල නිරත වූවන් සමඟ 2018 පෙබරවාරි 14 - 17 දිනයන්හි පෝලන්තයේ නිල සංචාරයක නිරත විය. මෙම සංචාරය අතරතුර, විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා පෝලන්තයේ විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ගරු. මැරෙක් මැජිරොවස්කි මහතා, ක්‍රීඩා හා සංචාරක නියෝජ්‍ය අමාත්‍ය ගරු. ජන් විඩේරා මහතා, ව්‍යවසායකත්ව සහ තාක්ෂණ නියෝජ්‍ය අමාත්‍ය ගරු. තදෙව්ස් කොස්කින්ස්කි මහතා සමඟ ද්වි පාර්ශ්වික සාකච්ඡා පවත්වනු ලැබීය.

ඉහත සංචාරය අතරතුර ශ්‍රී ලංකා ක්‍රීඩා අමාත්‍යාංශය සහ පෝලන්ත ජනරජයේ ක්‍රීඩා හා සංචාරක අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමක් සහ ශ්‍රී ලංකා රජය අතර පෝලන්ත රජය අතර ගුවන් ප්‍රවාහනය පිළිබඳ ගිවිසුමකට අත්සන් තබන ලදී.

ආ. පෝලන්තයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ පෝලන්ත වාණිජ මණ්ඩලය එක්ව 2018 පෙබරවාරි 16 දින ව්‍යාපාර සමුළුව සහ B2B රැස්වීම් සංවිධානය කරන ලදී. පෝලන්ත සමාගම් 40 ක් මෙයට සහභාගී වූහ.

ඇ. 2018 මාර්තු මස 21 - 23 දිනයන්හි යුරෝපා ආහාර ප්‍රදර්ශනයට සහභාගි වීමට ශ්‍රී ලංකා සමාගම්වලට පහසුකම් සපයනු ලැබීය.

ඈ. 2018 අප්‍රේල් 06 වන දින වෝර්සෝහි ආසියානු ශාන්තිකර කෞතුකාගාරයේදී පැවති ආසියානු සාම්ප්‍රදායික ක්‍රීඩා උළෙලට සහභාගි විය.

ඉ. 2018 අප්‍රේල් 10 - 13 දිනයන්හි වෝර්සෝහි පැවති ලෝක ආහාර ප්‍රදර්ශනය සඳහා, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමඟ එක්ව පෝලන්තයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහභාගි විය.

ඊ. 2018 අප්‍රේල් 17 - 18 දිනයන්හි ඔස්ට්‍රෝඩාහි පවත්වන ලද මසුරි වෙළඳ ප්‍රදර්ශනය - Expo Mazuri (මසුරි හොරේකා වෙළඳ ප්‍රදර්ශනයේ තුන්වන සංස්කරණය) සඳහා සහභාගි විය.

උ. 2018 අප්‍රේල් 27 දින වෝර්සෝහි පැවති ලෝක ආහාර ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමඟ එක්ව පෝලන්තයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහභාගි විය.

ඌ. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමඟ එක්ව පෝලන්තයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය 2018 මැයි මස 14 වන දින වෝර්සෝහි දී මාර්ග ප්‍රදර්ශනය සඳහා සහභාගී වූ අතර, 2018 මැයි මස 15 වන දින පෝලන්තයේ ක්‍රකොව් හිදී එයට සහභාගී විය.

ඍ. 2018 මැයි මස 17 වන දින පෝලන්තයේ පළමු සංස්ථාපිත සිනමා උළෙල වන වෝර්සෝ සංස්ථාපිත සිනමා උළෙලට සහභාගි විය.

ඎ. වෝර්සෝ පාසැල් සිසුන් සඳහා ආර්ථික විද්‍යාව පිළිබඳ සාකච්ඡාවක් / සම්මන්ත්‍රණයක් පැවැත්වීය.

ඒ. රුමේනියාවේ ලිවාස් සහ බැම්බූස් ඇඟලුම් (පුද්) සමාගමට ශ්‍රී ලාංකිකයන් 300 ක් බඳවා ගැනීම සඳහා මුල පුරන ලද අතර, ඒ සඳහා සම්බන්ධීකරණය කරනු ලැබීය.

1.19 පෘතුගාලය

පෘතුගාලය වෙත සමගාමීව සිදු කරන ලද අක්ත ගැන්වීම් හරහා ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු. වසන්ත සේනානායක මහතා, 2018 සැප්තැම්බර් මස 18 - 20 වන දින දක්වා පෘතුගාලයේ නිල සංචාරයක නිරත විය.

මෙම චාරිකාව අතරතුර, විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා, පෘතුගාලයේ විදේශ කටයුතු හා සම්බන්ධීකරණ රාජ්‍ය ලේකම් අතිගරු. තෙරේසා රිබෙයිරෝ මහත්මිය, පෘතුගාලයේ සංස්කෘතික අමාත්‍ය සහ ඔරියන්ට් කෞතුකාගාරයේ සභාපති යූයිස් පිලිප් ඩි කාස්ට්‍රෝ මෙන්ඩේස් මහතා, සහ කාමොයිස් ආයතන ප්‍රධානී ජොආඕ නෙවෙස් මහතා සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වීය. ද්විත්ව * මාර්ග සංචාරක සේවය ප්‍රවර්ධනය කිරීම, මන්නාරම කොටුව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පෘතුගාල රජයෙන් ආධාර ලබා ගැනීමේ හැකියාව විමසා බැලීම, දෙරටෙහි කෞතුකාගාර අතර සහයෝගිතාව වර්ධනය කිරීම හා ශ්‍රී ලංකාවේ පෘතුගීසි භාෂා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා පවතින හැකියාව සොයා බැලීම සඳහා සහයෝගිතාව තහවුරු කර ගැනීම මෙම සාකච්ඡාවන්හි අරමුණ විය.

1.20 රුමේනියාව

රුමේනියාව වෙත සමගාමීව සිදු කරන ලද අක්ත ගැන්වීම් හරහා පෝලන්තයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. 2018 ජනවාරි මස 24 වන දින ශ්‍රී ලංකා-රුමේනියානු පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය පිහිටුවීම සඳහා පහසුකම් සැලසීය.

ආ. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සුභසාධන අමාත්‍ය ගරු. දයා ගමගේ මහතා 2018 අගෝස්තු 4 - 7 දිනයන්හි රුමේනියාවේ සංචාරයක නිරත වූ අතර, රුමේනියාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු. තියොඩර් මෙලෙස්කානු මහතා මුණ ගැසුණි. බලශක්ති, දුම්රිය හා වරාය යටිතල පහසුකම්, නැව්, කෘෂිකර්මාන්තය, ආහාර කර්මාන්තය හා රෙදිපිළි යන ක්ෂේත්‍රයන්හි දෙරටේ ආර්ථික සහයෝගිතාව ශක්තිමත් කිරීම මෙම සාකච්ඡාවන්හි අරමුණ විය.

ඇ. පීම්නාස්ටික් ක්ෂේත්‍රයේ සහයෝගිතාවය පිලිබඳ ශ්‍රී ලංකාව සහ රුමේනියාව අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුමක් යටතේ, 2018 අගෝස්තු මස 06 - 31 දින දක්වා රුමේනියාවේ පවත්වන ලද පීම්නාස්ටික් පුහුණු කඳවුරට ශ්‍රී ලංකා පීම්නාස්ටික් ක්‍රීඩකයින් දෙදෙනෙක් සහභාගි වූහ.

ඈ. ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍ය ගරු. තිලක් මාරපන මහතා 2018 සැප්තැම්බර් 28 වන දින නිව්යෝර්ක් හි පැවති එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 73 වැනි සැසිවාරයට අනුගාමීව රුමේනියාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු. තියොඩර් මෙලෙස්කානු මහතා හමු විය.

1.21 ස්වීඩනය

ස්වීඩනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. මොඩරේට් පක්ෂයේ ස්වීඩන් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු. ආසා කොයින්රාස් 2018 පෙබරවාරි මස 19 වන දින තානාපති කාර්යාලය වෙත පැමිණ, ඇය ශ්‍රී ලංකා රජය සමඟ අඛණ්ඩව සම්බන්ධ වන බව සහ සහයෝගයෙන් කටයුතු කරන බවට සහතික විය.

ආ. ශ්‍රී ලංකා රජයේ නිලධාරීන් සඳහා වාර්ෂික පුහුණු වැඩසටහන් සම්පාදනය කිරීමට සහ මැල්මෝහි පිහිටි ලෝක නාවුක විශ්වවිද්‍යාලයේ නාවුක නිලධාරීන් දෙදෙනෙකුට පුහුණු අවස්ථා ලබා ගැනීම සඳහා ස්වීඩන් ආයතන සමඟ සම්බන්ධීකරණය කරන ලැබීය. ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන්ට පුහුණු අවස්ථා ලබා ගැනීම සඳහා ස්වීඩන් සන්නද්ධ හමුදා සමඟ කිට්ටුවෙන් කටයුතු කළහ. ශ්‍රී ලංකාව වෙත 2018 සැප්තැම්බර් මස දක්වා පුහුණු වැඩසටහන් 8 ක් ලැබී ඇත.

ඇ. 2018 අප්‍රේල් 18 - 20 දක්වා ස්වීඩනයේ ප්‍රධාන අධ්‍යයන ආයතනයන් වෙත සංචාරය කරනු ලැබූ උප කුලපතිවරුන් තිදෙනෙකු සහ ජාතික විද්‍යා පදනමෙහි සභාපති ඇතුලත් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ ඉහළ පෙළ නියෝජිතයන්ගෙන් සැදුම්ලත් දූත පිරිසක් වෙත සිය සංචාරය සඳහා පහසුකම් සපයනු ලැබීය. මෙම සංචාරය පර්යේෂණ සහ උසස් අධ්‍යාපනය පිළිබඳ අන්තර්ජාතික සහයෝගිතාව සඳහා වන ස්වීඩන පදනම සමඟ එක්ව පිළියෙල කරනු ලැබීය.

ඈ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී පුනර්ජනනීය බලශක්ති (ලංවිම) සේනාරත්න බණ්ඩාර මහතාහට 2013 මැයි මස 13 - 17 වන දින දක්වා දකුණු ස්වීඩනයේ ලයිසේකිල් හි තරංග විදුලි බලාගාරය වෙත සංචාරය කිරීමට පහසුකම් සලසන ලදී.

ඉ. ස්වීඩනය සහ ඩෙන්මාර්කය වෙත සංචාරය කළ ශ්‍රී ලංකාවේ අමාත්‍යාංශ ලේකම්වරුන් පස්දෙනෙකුගෙන් සමන්විත ලේකම්වරුන්ගේ නියෝජිත කණ්ඩායමට SWITCH ආසියානු නිරාවරණ සංචාරය සඳහා පහසුකම් සපයනු ලැබීය.

ඊ. ශ්‍රී ලංකා වෙළඳ ප්‍රදර්ශන 10 ක් සහ වෙළඳ හා ආයෝජන විමසීම් 35 ක් ප්‍රවර්ධනය කරන ලද අතර, වෙළඳාම් සම්බන්ධ පැමිණිලි 4 ක් සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබීය.

උ. සත්කාරක රටවල් අතර 'යොවුන් පුරය' යෞවන සැහැකෙළිය සඳහා අවශ්‍ය ප්‍රචාරය ලබා දෙනු ලැබීය.

1.22 ස්විස්ටර්ලන්තය

ස්විස්ටර්ලන්තය වෙත සමගාමීව සිදු කරන ලද අක්ත ගැන්වීම් හරහා ජර්මනියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. සංක්‍රමණික ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකාව හා ස්විට්සර්ලන්තය අතර පුළුල් සහයෝගිතාවයක් පවතී. 2018 අගෝස්තු මස 06 වන දින සංක්‍රමණ හවුල්කාරිත්වයක් පිහිටුවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය හා ස්විස්ටර්ලන්ත සමුහාණ්ඩුව අතර අත්සන් කරනු ලැබූ අවබෝධතා ගිවිසුම හරහා මෙම ක්ෂේත්‍රයේ ද්විපාර්ශ්වික සහයෝගිතාවය විධිමත් කරනු ලැබ ඇත.

ආ. අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන අමාත්‍ය එස්.බී. නාවින්න මහතා සහ ෆෙඩරල් සභා මන්ත්‍රී සිමෝනේටා සොමරුගා විසින් අගෝස්තු 3 - 8 දක්වා පැවති සිය ශ්‍රී ලංකානු සංචාරය තුළ අත්සන් කරනු ලැබූ අවබෝධාත්මක ගිවිසුම අනුව, විශේෂයෙන් සංක්‍රමණික ගලායාම කළමනාකරණය කිරීමේදී දෙරටට ප්‍රයෝජනවත් වන සංක්‍රමණික කරුණු පිළිබඳ පොදු පරස්පර ක්‍රියාවලියක් ඇති කිරීම සඳහා සහ විධිමත් සහ ස්ථාවර කතිකාවතක් ස්ථාපනය කිරීම සඳහා ඉඩකඩ සලසා දෙයි.ත අක්‍රමවත් සංක්‍රමණය වැළැක්වීමත අත්තනෝමතික පුද්ගලයන් සහ තෙවන රටවැසියන් පිළිබඳ නැවත කියවීමත ආධාර හරවා යැවීම සහ නැවත සමාජගත කිරීමත සංක්‍රමණ පාලන කටයුතු වල ධාරිතාව ගොඩනැංවීමත සංක්‍රමණික ජාවාරම වැළැක්වීම සහ මිනිස් ජාවාරමට එරෙහිව සටන් කිරීම.

1.23 සර්බියාව

සර්බියාව වෙත සමගාමීව සිදු කරන ලද අක්ත ගැන්වීම් හරහා ඔස්ට්‍රියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. සර්බියානු විදේශ කටයුතු අමාත්‍ය සහ ප්‍රථම නියෝජ්‍ය අග්‍රාමාත්‍ය අතිගරු. ඉවිසිකා ඩැචික් මහතා 2018 මැයි 7 - 8 දිනයන්හි ශ්‍රී ලංකාවේ සංචාරයක නියුතු විය. ඔහු ශ්‍රී ලංකාවේ ලරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා, පාර්ලිමේන්තුවේ කථානායක ගරු. කරු ජයසූරිය මහතා, විදේශ කටයුතු අමාත්‍ය ගරු. තිලක් මාරපන මහතා සහ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය ගරු. නිමල් සිරිපාල ද සිල්වා මහතා සමඟ සාකච්ඡා පවත්වනු ලැබීය.

ආ. සංචාරය අතරතුර, 2018 මැයි මස 08 දින ශ්‍රී ලංකා රජය සහ සර්බියානු ජනරජය අතර ද්විපාර්ශවික ගුවන් සේවා ගිවිසුමක් අත්සන් කෙරිණි.

1.24 ස්ලොවේකියාව

ස්ලොවේකියාව වෙත සමගාමීව සිදු කරන ලද අක්ත ගැන්වීම් හරහා ඔස්ට්‍රියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. ස්ලොවේකියානු ජනරජයේ නියෝජ්‍ය අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය අතිගරු. පීටර් කසිමීර් මහතාගේ ප්‍රධානත්වයෙන් යුතු 22 දෙනෙකුගෙන් සැදුම්ලත් ව්‍යාපාරික නියෝජිත කණ්ඩායමක් 2018 මාර්තු 27 - 29 දිනයන්හි ශ්‍රී ලංකාවේ සංචාරයක නියුතු විය.

මෙම චාරිකාව අතරතුර, ඔහු ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු. තිලක් මාරපන මහතා, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය ගරු. මංගල සමරවීර මහතා, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් මහතා, මුදල් හා ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍ය ගරු. ඉරාන් වික්‍රමරත්න මහතා, සමඟ සාකච්ඡා පවත්වන ලදී. එසේම ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය සහ ස්ලෝවේකියානු ආයෝජන හා වෙළඳ සංවර්ධන නියෝජිතායතනය අතර අවබෝධතා ගිවිසුමක් ද අත්සන් කරන ලදී.

1.25 ස්ලෝවේනියාව

ස්ලෝවේනියාව වෙත සමගාමීව සිදු කරන ලද අක්ත ගැන්වීම් හරහා ඔස්ට්‍රියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. ස්ලෝවේනියාවේ නියෝජ්‍ය අග්‍රාමාත්‍ය සහ විදේශ කටයුතු අමාත්‍ය ගරු. කාල් අර්ජවෙක් මහතාගේ ආරාධනයකට අනුව, 2018 සැප්තැම්බර් 10 සිට 11 දක්වා පැවති බ්ලෙඩ් උපායමාර්ගික සංසදයට සහභාගි වීම සඳහා ශ්‍රී ලංකා විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු. වසන්ත සේනානායක මහතා ස්ලොවේනියාවේ සංචාරයක නියුතු විය. සංසදය පැවැත්වෙන අතරතුර ‘‘තනිව අපි අසාර්ථක වෙමු : තිරසර අනාගතයක් සඳහා එක්ව කටයුතු කරමු’’ යන කණ්ඩායම් සාකච්ඡාවේ සාමාජිකයකු ලෙස විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා සහභාගි විය. කණ්ඩායම විවිධ රජයන්, විද්වතුන්, සිවිල් සමාජය සහ සංස්ථා අංශය නියෝජනය කරන විවිධ රටවල්වල ඉහළ මට්ටමේ කථිකයින්ගෙන් සමන්විත විය.

ආ. දෙරටේ ද්විපාර්ශවික සාකච්ඡාව අතරතුර, රාජ්‍ය අමාත්‍ය සේනානායක මහතා ස්ලෝවේනියානු විදේශ කටයුතු අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම් ඇන්ඩ්‍රෙජ් ලොජර් මහතා හමුවූ අතර, ශ්‍රී ලංකාව හා ස්ලොවේනියාව අතර සබඳතා තවදුරටත් තහවුරු කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ කැපවීම යළිත් තහවුරු කර ඇති අතර, සංස්කෘතිය, විද්‍යාව, අධ්‍යාපනය, වෙළඳ හා ආයෝජන අංශයන්හි වැඩිදුර සම්බන්ධීකරණය කල හැකි ආකාර පිළිබඳ සාකච්ඡා කරනු ලැබීය.

1.26. ස්පාඤ්ඤය

ස්පාඤ්ඤය වෙත සමගාමීව සිදු කරන ලද අක්ත ගැන්වීම් හරහා ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. 2018 ජනවාරි 15 - 18 වන දින දක්වා ස්පාඤ්ඤයේ මැඩ්රිඩ්හි පැවැත්වූ "FITUR Travel Fair 2018" සංචාරක වෙළඳ සැනකෙළියෙහි ශ්‍රී ලංකා සහභාගිත්වය සම්බන්ධීකරණය හා සංවිධානය කිරීම සිදු කරනු ලැබීය.

1.26 තුර්කිය

තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. ශ්‍රී ලංකා ජාතික තරුණ නර්තන කණ්ඩායම විසින් පවත්වනු ලබන සංස්කෘතික සංදර්ශනය 2018 පෙබරවාරි 03 වන දින ඕරන්, පැනෝරා සහ අන්කරා හිදී පවත්වන ලදී.

ආ. ශ්‍රී ලංකා ජාතික තරුණ නර්තන කණ්ඩායම විසින් පවත්වනු ලබන සංස්කෘතික සංදර්ශනය 2018 පෙබරවාරි මස 04 වන දින නටවේගා, අන්කරා, තුර්කියේ දී පවත්වන ලදී.

ඇ. සංචාරක ප්‍රවර්ධන වැඩසටහන 2018 පෙබරවාරි 02 - 04 දක්වා නටවේගා, අන්කරා හි පවත්වනු ලැබීය.

ඈ. සිලෝන් තේ ප්‍රවර්ධන වැඩසටහන 2018 පෙබරවාරි මස 06 වන දින පැවැත්විණි.

ඉ. සංචාරක ප්‍රවර්ධන වැඩසටහන 2018 පෙබරවාරි 6 වන දින හිල්ටන් අන්කරා හිදී පැවැත්විණි.

ඊ. ශ්‍රී ලංකා ජාතික තරුණ නර්තන කණ්ඩායම විසින් පවත්වනු ලබන සංස්කෘතික සංදර්ශනය 2018 පෙබරවාරි 6 වන දින හිල්ටන් අන්කරා, තුර්කියේදී පවත්වන ලදී.

උ. ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ප්‍රවර්ධනය කිරීම සඳහා තුර්කියේ ප්‍රධාන නගර තුනක් වන අන්කරා, ට්‍රබ්සෝන් හා අර්සූරම් යන නගරවල ජාතික දින උත්සව පිළිවෙලින් 2018 පෙබරවාරි මස 06, 08 සහ 09 වන දිනයන්හි පවත්වන ලදී.

ඌ. ශ්‍රී ලංකා ජාතික තරුණ නර්තන කණ්ඩායම විසින් පවත්වනු ලබන සංස්කෘතික සංදර්ශනය 2018 පෙබරවාරි මස 07 වන දින අන්කරාහි ශ්‍රී ලංකා තානාපති කාර්යාල නිල වාසස්ථානයේදී පැවැත්විණි.

ඍ. තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය 2018 පෙබරවාරි මස 07 වන දින ශ්‍රී ලංකා සංචාරකරුවන් සහ තුර්කියේ පාර්ශවකරුවන් අතර B2B රැස්වීම් සංවිධානය කරන ලදී.

ඎ. ශ්‍රී ලංකා ජාතික තරුණ නර්තන කණ්ඩායම විසින් පවත්වනු ලබන සංස්කෘතික සංදර්ශනය 2018 පෙබරවාරි 08 දින තුර්කියේ, ට්‍රබ්සෝන්හිදී පැවැත්විණි.

එ. ශ්‍රී ලංකා ජාතික තරුණ නර්තන කණ්ඩායම විසින් පවත්වනු ලබන සංස්කෘතික සංදර්ශනය 2018 පෙබරවාරි 09 වන දින තුර්කියේ අර්සූරම් හිදී පවත්වන ලදී.

ඒ. ශ්‍රී ලංකා ජාතික තරුණ නර්තන කණ්ඩායම විසින් පවත්වනු ලබන සංස්කෘතික සංදර්ශනය 2018 පෙබරවාරි මස 10 වන දින තුර්කියේ බර්සාහිදී පවත්වන ලදී.

ඓ. සංචාරක ප්‍රවර්ධන වැඩසටහන 2018 පෙබරවාරි 10 වන දින බර්සාහිදී පැවැත්විණි.

ඔ. ශ්‍රී ලංකා ජාතික තරුණ නර්තන කණ්ඩායම විසින් පවත්වනු ලබන සංස්කෘතික සංදර්ශනය 2018 පෙබරවාරි මස 11 වන දින තුර්කියේ ඉස්තාන්බුල්, ඉස්තාන්බල් මෝල් හිදී පවත්වන ලදී.

ඕ. 2018 සිට අප්‍රේල් 5 - 6 දක්වා නාම්, බාකු, අසර්බයිජාන් අන්තර් මධ්‍යම අමාත්‍ය රැස්වීම් වලදී ශ්‍රී ලංකාව නියෝජනය කරන ලදී.

ඖ. ශ්‍රී ලංකාව තුළ කොකෝ නිෂ්පාදකයින් සහ තුර්කියේ උනන්දුව දක්වන ව්‍යාපාරික පාර්ශ්වකරුවන් අතර 2018 අප්‍රේල් 02 - 07 දක්වා B2B සාකච්ඡාවන් පවත්වන ලදී.

ක. 'කොළඹ ඉස්තාන්බුල් හමුවෙයි' වැඩමුළුව 2018 අප්‍රේ මස 13 වන දින තුර්කි ගුවන් සමාගම සමග ඒකාබද්ධව සංවිධානය කරන ලදී.

ඛ. 2018 අප්‍රේල් 24 වන දින ගල්ලිපොලිහිදී කැනකැලේ ඉඩම් - යුද්ධයේ 103 වන සංවත්සරයට සහභාගී විය.

ග. 2018 අප්‍රේල් 24 සිට 25 වන දින දක්වා කැනකැලේ, කේප් හෙල්ස් හි පොදු රාජ්‍ය මණ්ඩලය සහ අයර්ලන්ත අනුස්මරණ සේවයට සහභාගි විය.

ඝ. තේ ප්‍රවර්ධන වැඩසටහන 2018 මැයි මස 10 වන දින ඇන්කරා, හැකටෙප් විශ්වවිද්‍යාලයේ, ජාත්‍යන්තර මිත්‍රත්ව දිනයේදී පැවැත්විණි.

ච. ශ්‍රී ලංකා ප්‍රවර්ධන වැඩසටහන 2018 මැයි මස 14 වන දින අදාන, හෝටල් ඩිවාන් හි දී පැවැත්විණි.

ඡ. 2018 අගෝස්තු 03 සිට 14 දක්වා ශ්‍රී ලංකා ආරක්ෂක සේවා අණදෙන මාණ්ඩලික විද්‍යාලයේ සාමාජිකයින් 18 කින් සැදුම්ලත් නියෝජිත කණ්ඩායමේ අධ්‍යයන චාරිකාවට පහසුකම් සැලසීය.

ජ. තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය 2018 සැප්තැම්බර් 06 - 09 දක්වා ඉස්තාන්බුල්හි පැවති ලෝක ආහාර ප්‍රදර්ශනයෙහිදී ශ්‍රී ලංකා සහභාගිත්වයට පහසුකම් සපයන ලදී.

ට. 2018 සැප්තැම්බර් 6 - 8 දක්වා පැවති 87 වන ඉස්මීර් ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය සඳහා සහභාගි විය.

ඨ. 2018 සැප්තැම්බර් 07 - 09 වැනිදා දක්වා ඇන්ටල්යා හි පැවති ජාත්‍යන්තර විදි ආහාර උළෙලට සහභාගි විය.

ඩ. 2018 සැප්තැම්බර් 06 වන දින ශ්‍රී ලංකා දේශයේ ඉදිරිපත් කිරීම - ශ්‍රී ලංකාව සමග ආයෝජනය කිරීම / තුළ ආයෝජනය කිරීම් ඉද්මීර් වාණිජ මණ්ඩලයේදි පැවැත්විණි.

ඪ. 2018 - 2022 කාලය සඳහා අස්පෘශ්‍ය සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා අපේක්ෂකත්වය සඳහා තුර්කියේ සහාය ලබා ගැනීම සිදු කෙරිණි.

ණ. 2018 නොවැම්බර් මස 1 වන දින තුර්කිය, මුග්ලා සිටිකි කොක්මන් විශ්වවිද්‍යාලයේ පැවති ණීයුරෝපා ආසියාවේ සිට දකුණු ආසියාවට පාලමක් : තුර්කි - ශ්‍රී ලංකා සබඳතා යන තේමාව යටතේ පැවති සම්මන්ත්‍රණයට සහභාගි විය.

ත. 2018 නොවැම්බර් 5 වන දින බර්සා, උලුඩග් විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද තානාපතිවරුන්ගේ සමුළුවට සහභාගි වූ අතර, තානාපතිවරයා විසින් ශ්‍රී ලංකා*තුර්කි සබඳතා පිළිබඳ දේශනයක් පැවැත්විය.

ථ. 2018 නොවැම්බර් මස 13 වන දින බර්සාහිදී වෙළඳාම්, තේ සහ සංචාරක කර්මාන්තය ආදී බහුවිධ ශ්‍රී ලංකා ප්‍රවර්ධන වැඩසටහනක් පැවැත්වූ අතර, 2018 නොවැම්බර් 14 දින කම්සෙලිහිදී සහ 2018 නොවැම්බර් 15 වන දින එඩිර්න්හිදී එම ප්‍රවර්ධන වැඩසටහන පැවැත්වුණි.

ද. තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ඈඋඈ (තුර්කි විදේශ අමාත්‍යාංශ කලත්‍රයින්ගේ සංගමය) විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන පුණ්‍යාධාර වැඩසටහනට 2018 නොවැම්බර් 25 වන දින සහභාගි විය.

ධ. 2018 දෙසැම්බර් 6 වන දින සමාරම්භ කළ සංචාරක තුර්කි ඉස්මීර්හි පැවති - 12 වන ජාත්‍යන්තර සංචාරක වෙළඳ ප්‍රදර්ශනය සහ කොන්ග්‍රසයෙහි ශ්‍රී ලංකා නියෝජනය සඳහා පහසුකම් සපයන ලදී.

න. පහත දැක්වෙන උත්සව සංවිධානය කිරීම හා සහභාගී වීම:

- 2018 පෙබරවාරි 03 - 05 දක්වා හිල්ටන් ඇන්කරාහි ශ්‍රී ලංකා ආහාර උත්සවය.
- 2018 පෙබරවාරි 06 වන දින හිල්ටන් ඇන්කරා හි නිදහස් දින උත්සව සැමරුමට සමගාමීව ශ්‍රී ලංකාවේ සූපශාස්ත්‍ර ප්‍රදර්ශනය.
- 2018 පෙබරවාරි 07 වන දින නිල නේවාසික පරිශ්‍රයේදී ශ්‍රී ලංකාවේ සූපශාස්ත්‍ර ප්‍රදර්ශනය.
- 2018 මාර්තු 16 වන දින නිල නේවාසික පරිශ්‍රයේදී තුර්කි මාධ්‍යය වෙත ශ්‍රී ලංකාවේ සූපශාස්ත්‍ර ආදර්ශනය.
- තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය 2018 අප්‍රේල් 22 දින ඇන්කරාහි බිල්කන්ට් විශ්වවිද්‍යාලයේ අන්තර්ජාතික සංස්කෘතික උත්සවයට සහභාගි වීම සඳහා පහසුකම් සැපයීය.
- තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය තුර්කි සැමරුම්වල සංස්ථාතික කේන්ද්‍රස්ථානය කස්ටමනහිදී නෙව්රස් සැමරුම් 2018 සඳහා සහභාගි විය.
- තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය 2018 මැයි මස 13 වන දින අන්කරා කර්මාන්ත සහ ව්‍යාපාරික සංගමය සහ මහජන මාධ්‍යය විසින් සංවිධානය කරන ලද අන්කරා අන්තර්ජාතික සංස්කෘතික උලෙළට සහභාගි විය.

1.27 එක්සත් රාජධානිය

මහා බ්‍රිතාන්‍යයේ එක්සත් රාජධානිය සහ උතුරු අයර්ලන්තයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. 2018 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා ශ්‍රී ලංකා සංචාරකයින් විවේක දින සංචාරක චාරිකා - ඩෙල්බන්, අයර්ලන්තය, ගමනාන්ත සංචාරක චාරිකා - මැන්චෙස්ටර්, විවේක දින සංචාරක චාරිකා - ලන්ඩන්, ජාතික විවාහ උත්සවය - ලන්ඩන්, ටෙලිග්‍රැෆික් සංචාරක චාරිකාව - ලන්ඩන් යනාදියට සහභාගි වූහ.

ආ. වෙසෙක්ස්හි ආදිපාද, රාජකීය මහෝත්තම එඩ්වඩ් කුමරු, සහ වෙසෙක්ස්හි ආදිපාදවරිය, 2018 පෙබරවාරි මස 04 වන දින ශ්‍රී ලංකාවේ නිදහස පිළිබඳ 70 වන සංවත්සරය සැමරීමේ උත්සවයට සහභාගි වීම සඳහා 2018 ජනවාරි මස 31 සිට පෙබරවාරි මස 05 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නියුතු විය.

ඇ. ශ්‍රී ලංකාව නියෝජනය කරන සර්ව පාක්ෂික පාර්ලිමේන්තු කණ්ඩායමෙහි සභාපති (ඊෂඨ) සහ එක්සත් රාජධානියේ පාර්ලිමේන්තු මන්ත්‍රී, රනිල් ජයවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් යුතු, ශ්‍රී ලංකාව නියෝජනය කරන සර්ව පාක්ෂික පාර්ලිමේන්තු කණ්ඩායමෙහි (APPG) සාමාජිකයන් 05 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත පිරිසක් 2018 ජනවාරි 03 - 08 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූහ. මෙම නියෝජිත පිරිස ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමා, ගරු. අග්‍රාමාත්‍යතුමා, ගරු. කථානායකතුමා, ගරු. විදේශ කටයුතු අමාත්‍යතුමා සහ ගරු. විපක්ෂ නායකතුමා සමඟ සාකච්ඡා පවත්වනු ලැබීය.

ඈ. ගරු. එක්සත් රාජධානියේ පාර්ලිමේන්තු මන්ත්‍රී රනිල් ජයවර්ධන මහතා, බ්‍රිතාන්‍ය අග්‍රාමාත්‍යවරයාගේගේ වෙළඳ නියෝජිතයා ලෙස 2018 පෙබරවාරි 15 සිට 17 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරය කරන ලදී.

ඉ. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සාමාජිකයින් පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය විසින් සංවිධානය කරන ලද පුහුණු වැඩසටහනකට 2018 පෙබරවාරි මස සහභාගි වීම සඳහා අවශ්‍ය කටයුතු එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් සංවිධානය කරන ලදී.

ඊ. 2018 අප්‍රේල් 14 - 20 දක්වා පැවැත්වූ පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව 2018 සඳහා සහභාගි වීමට අතිගරු ජනාධිපතිතුමාගේ සංචාරය සංවිධානය කරන ලදී.

උ. 2018 අප්‍රේල් 14 - 20 දක්වා පැවැත්වූ පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව 2018 සඳහා සහභාගි වීමට ගරු. විදේශ කටයුතු අමාත්‍යවරයාගේ සංචාරය සංවිධානය කරන ලදී. සංචාරය අතරතුර, ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යවරයා විදේශ කටයුතු හා පොදු

රාජ්‍ය මණ්ඩලීය කාර්යාලයේ ආසියානු හා ශාන්තිකර කලාපයේ රාජ්‍ය අමාත්‍ය, පා.ම. ගරු. මාක් ෆීල්ඩ් මහතා හමු විය.

ඌ. ශ්‍රී ලංකා තේ මණ්ඩලය, සමාගම් හතරක් (04) සමඟ එක්ව 2018 අප්‍රේල් මස ලන්ඩනයේ දී පැවැත්වූ යුරෝපයේ ස්වාභාවික සහ කාබනික නිෂ්පාදන. ප්‍රදර්ශනයට සහභාගී විය.

ඍ. එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමඟ එක්ව, ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද ණීමේඩ් ඉන් වෙල්සියා□ ප්‍රකට රූපවාහිනී මාලාවේ කථාංගයක් 2018 මැයි මස තිරගත කරන ලදී. මෙම උත්සවය සඳහා සංචාරක රචකයින්ගේ බ්‍රිතාන්‍ය ශිල්ප ශේණියේ සභාපති, ෂැන්ග්‍රි-ලා හෝලටයේ නියෝජිතයින්, මැසේ හවුල්කාරිත්වය සහ රූපවාහිනී කතා මාලාවේ ප්‍රධාන චරිත නිරූපණය කල නළු නිලියන් ඇතුළු සංචාරක මාධ්‍යවේදීන් සහභාගි වූහ.

ඎ. 2018 මැයි මස 17 වන දින එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේදී ආකර්ශනීය අයෝජන සංසදයක් පැවැත්වුණි. ශ්‍රී ලංකාවේ සභාධිපත්‍ය සංවර්ධන සමිතියේ නියෝජිතයෙකු සහ අනෙකුත් පාර්ශවකාර ආයතනවල නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් ශ්‍රී ලංකාවේ නිපැයුම් වෙළෙඳපොළ ප්‍රවර්ධනය කිරීම මෙහි අරමුණ විය.

එ. 2018 මැයි මස 08 වන දින හවුස් ඔෆ් කොමන්සිහි, ටෙරස් පැවිලියන්හිදී "Their future today" නම් ත්‍යාගශීලී උත්සවයට සහභාගි විය. ශ්‍රී ලංකාව තුළ අනාථ වූ දරුවන්ට උපකාර කිරීම පිළිබඳව මෙම උළෙලේ අවධානය යොමු විය.

ඒ. 2018 ජුනි 15 - 18 දක්වා ගරු. අග්‍රාමාත්‍යතුමාගේ එක්සත් රාජධානියේ සංචාරය සංවිධානය කරන ලදී. සංචාරය අතරතුර, පොදු රාජ්‍ය මණ්ඩලයේ මහලේකම්වරයා සහ එක්සත් රාජධානියේ හිටපු අග්‍රාමාත්‍ය ඩේවිඩ් කැමරන් ඇතුළු අනෙකුත් පිරිස සමඟ සාකච්ඡා සංවිධානය කර තිබිණි.

ඓ. ලන්ඩන් වෙත පැමිණි රූපවාහිනී කණ්ඩායම සමඟ ලන්ඩනයේදි 'එතෙර මෙතෙර' වැඩසටහන පැවැත්වීම සම්බන්ධීකරණය කරන ලදී.

ඔ. ලන්ඩන්හිදී පැවැත් වූ 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවට සමගාමීව පවත්වන ලද පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදය (CBF) 2018 සඳහා ශ්‍රී ලංකා කුඩා හා මධ්‍ය පරිමාණ (SMEs) ව්‍යාපාරික නියෝජිතයින්ගේ වාර්තාගත සංඛ්‍යාවක් සහභාගී විය. මෙම සන්සදය සඳහා තොරතුරු තාක්ෂණය / ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණය / ඉලෙක්ට්‍රොනික ඇඟලුම් අත්කම්, පොල්, සංචාරක, මැණික් හා ස්වර්ණාභරණ, සමුද්‍රීය හා බෝට්ටු ගොඩනැංවීමේ අංශ නියෝජනය කරමින් 40 කට අධික SMEs සහභාගී වූහ. ගරු. CBF සඳහා පැමිණි ශ්‍රී ලංකා නියෝජිත පිරිසට නායකත්වය සැපයූ රිෂාඩ් බදියුදීන් මහතා කණ්ඩායම් සාමාජිකයකු ලෙස මෙම SME වෙළඳ සංසදය

නියෝජනය කරන ලදී. අතිගරු ජනාධිපතිතුමා තිරසාර සංවර්ධනයේ අරමුණු පිළිබඳව කථා හි ප්‍රධාන දේශනය පවත්වන ලදී. ඊට අමතරව, තොරතුරු තාක්ෂණ / ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණය, සමුද්‍රීය අංශය, සහ බෝට්ටු ගොඩනැගීම, මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය පිළිබඳ පවතින අවස්ථා ප්‍රදර්ශනය කිරීම සඳහා පොදු රාජ්‍ය මණ්ඩලයීය ව්‍යවසායකයින්, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ වෘත්තිකයින් 170 කට පමණ උදෑසන භෝජන සංග්‍රහය බැඳුණු සාකච්ඡාවට සහභාගී වීමට ආරාධනා කරන ලදී.

උදෑසන භෝජන සංග්‍රහය බැඳුණු සාකච්ඡාවෙහි ප්‍රධාන අංගය වූයේ ලන්ඩනයේදී ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ ජාතික සන්නාමය එළිදැක්වීමයි.

ඕ. ජෝන් කීල්ස් සමූහයේ පරිපාලිත ආයතනයක් වන ඉන්ෆොමේට් (පෞද්) සමාගම විසින් "යහපත් හෙටක් සඳහා ශ්‍රී ලංකාවට උපකාර කිරීම" යන තේමාව යටතේ සංවිධානය කරන ලද ව්‍යාපාරික ප්‍රවර්ධන වැඩසටහන 2018 ජුනි මස දී එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේදී සංවිධානය කෙරුණි.

ඖ. 2018 සැප්තැම්බර් මාසයේ දී ලන්ඩනයේ දී පවත්වන ලද ජාත්‍යන්තර ස්වර්ණාභරණ ලන්ඩන් (IJL) 2018 සඳහා ශ්‍රී ලංකාවෙන් සමාගම් හයක් සහභාගී විය. එක්සත් රාජධානියේ මැණික් හා ස්වර්ණාභරණ අංශය සඳහා පැවැත්වෙන විශාලතම වෙළඳ ප්‍රදර්ශනය මෙයයි.

ක. 2018 සැප්තැම්බර් 20 වන දින චෙවනින් ශිෂ්‍යත්වලාභීන් සඳහා පිළිගැනීමක් සංවිධානය කරන ලදී.

ඛ. ගරු. එක්සත් රාජධානියේ පාර්ලිමේන්තු මන්ත්‍රී රනිල් ජයවර්ධන මහතා, බ්‍රිතාන්‍ය අග්‍රාමාත්‍යවරයාගේගේ වෙළඳ නියෝජිතයා ලෙස 2018 සැප්තැම්බර් 18 - 21 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරය කරන ලදී.

ග. එක්සත් රාජධානියේ විදේශ හා පොදු රාජ්‍ය මණ්ඩල කාර්යාලයේ දකුණු ආසියානු දෙපාර්තමේන්තුවේ ප්‍රධානී ෆර්ගුස් ඕල්ඩ් මහතා 2018 මාර්තු මස 07 - 10 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නියුතු විය. ඔහු සිය සංචාරය අතරතුර, ශ්‍රී ලංකා විදේශ අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ සාකච්ඡා පැවැත්වීය.

ඝ. පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදය 2018 එක්සත් රාජධානියේදි 2018 අප්‍රේල් මස පවත්වන ලද අතර, ලන්ඩනයේ පවත්වන පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවට සමගාමීව සමඟ පවත්වන ලද මෙම සංසදයට ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික නියෝජිතයින් වාර්තාගත සංඛ්‍යාවක් සහභාගි විය.

ච. පොදු රාජ්‍ය මණ්ඩලීය වෙළඳාම සහ ආයෝජනය නැංවීම සඳහා වූ විකල්පයන් පිළිබඳ වෙළඳ හා ආයෝජන පිළිබඳ කාරක කණ්ඩායමේ නිර්දේශ විමර්ශනය කිරීම අරමුණු කරගනිමින් 2018 ජුනි 28 - 29 යන දිනයන්හි පොදු රාජ්‍ය මණ්ඩලීය ජ්‍යෙෂ්ඨ වෙළඳ

නිලධාරීන්ගේ රැස්වීම, 2018 වෙළඳාම ආශ්‍රිත ප්‍රතිඵල පිළිබඳ ප්‍රතිරූපණය කිරීම සඳහා පැවැත්වුණි. පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව 2018, ඉදිරි දෙවසර තුළදී පොදු රාජ්‍ය මණ්ඩලීය වෙළඳාම සහ ආයෝජන සඳහා සහයෝගය දැක්වීමට අපේක්ෂා කරන ආකාරය පිළිබඳ එකඟතාවයකට එළඹුණිත ඉදිරි දෙවසර තුළ සාමාජිකයින් සඳහා වැඩ සැලසුම පිළිබඳව එකඟ විය.

ඡ. පොදු රාජ්‍ය මණ්ඩලීය මහ ලේකම් ගරු. පැට්‍රීෂියා ස්කොට්ලන්ඩ්‌ ෂ ගේ 2018 අගෝස්තු මාසයේ දී පැවති ශ්‍රී ලංකා නිල සංචාරය සංවිධානය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සිදු කරනු ලැබීය. ඇය ගරු අගාමාත්‍යතුමා, ගරු කථානායකතුමා, විදේශ කටයුතු අමාත්‍යතුමා, මුදල් අමාත්‍යතුමා, පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යවරයා යන අමාත්‍යවරුන් සමඟ සාකච්ඡා කරනු ලැබුවාය.

ජ. උතුරු පළාතේ ආණ්ඩුකාර ගරු. රෙජිනෝල්ඩ් කුරේ මහතා ප්‍රමුඛ නියෝජිත පිරිස 2018 ඔක්තෝබර් 04 - 07 දක්වා එක්සත් රාජධානියේ වෙසෙන ශ්‍රී ලංකා ඩයස්පෝරාව හමුවීමට එක්සත් රාජධානියේ සංචාරයක නිරත වූ අතර, එහිදී උතුරු පළාතේ සංවර්ධනය සඳහා ආයෝජනය කිරීමට ඔවුන්ට ආරාධනා කර තිබේ.

ට. එක්සත් රාජධානියේ විදේශ හා පොදු රාජ්‍ය මණ්ඩල කාර්යාලයේ ආසියාවේ සහ ශාන්තිකර කලාපය සඳහා රාජ්‍ය අමාත්‍ය ගරු. මාර්ක් ෆීල්ඩ් මහතා 2018 ඔක්තෝබර් 04 - 06 දක්වා ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නිරත විය.

ඨ. උතුරු අයර්ලන්තයේ සහ මහා බ්‍රිතාන්‍යයේ එක්සත් රාජධානියේ විදේශ හා පොදු රාජ්‍ය මණ්ඩල කාර්යාලයේ ආසියාවේ සහ ශාන්තිකර කලාපය සඳහා රාජ්‍ය අමාත්‍ය ගරු. මාර්ක් ෆීල්ඩ් මහතාගේ ශ්‍රී ලංකා සංචාරය අතරතුර, 2018 ඔක්තෝබර් 06 වන දින විදේශ කටයුතු අමාත්‍යාංශයේදී ගරු. විදේශ කටයුතු අමාත්‍යවරයා හමුවිය.

ඩ. 2018 ඔක්තෝබර් 06 - 09 දක්වා පැවති ගරු. අග්‍රාමාත්‍යතුමාගේ එක්සත් රාජධානි සංචාරය සංවිධානය කරන ලදී. සංචාරය අතරතුර, අග්‍රාමාත්‍යවරයා 2018 ඔක්තෝබර් 08 දින ලන්ඩන් කොටස් විනිමය කණ්ඩායම (LSEG) නැරඹීමට ගියේය. අග්‍රාමාත්‍යතුමා ලන්ඩන් කොටස් විනිමය වෙළෙඳපොළ විවෘත කිරීමේ උත්සවයේ විශේෂ ආරාධිත අමුත්තා විය. 2018 ඔක්තෝබර් 08 වන දින ඔක්ස්ෆර්ඩ් සංගමයේ ඉන්දියානු සාගර කලාපයේ භූ මූලෝපායික වැදගත්කම පිළිබඳ දේශනයක්ද ගරු. අග්‍රාමාත්‍යවරයා විසින් පවත්වන ලදී.

ඪ. 2018 ඔක්තෝබර් මාසයේදී එක්සත් රාජධානියේ ආයෝජක ප්‍රවර්ධන වැඩසටහන් මාලාවක් සංවිධානය කිරීම සඳහා කොළඹ කොටස් හුවමාරුව (CSE) හා සුරැකුම්පත් හා විනිමය කොමිසම (SEC) වෙත පහසුකම් සපයනු ලැබීය. මෙම උත්සවය, අග්‍රාමාත්‍යවරයා සහභාගි වූ ලන්ඩන් කොටස් හුවමාරුවෙහි සමාරම්භක උත්සවය, ලන්ඩන් කොටස් වෙළඳ පොළේ ආයෝජන සමුළුවක් හා SLHC පරිශ්‍රයේ පැවති ආයෝජන සමුළුවක් ද ඇතුලත්

විය. මීට අමතරව, 2018 ඔක්තෝබර් 8 වන දින මහ කොමසාරිස් කාර්යාලයේදී කොළඹ කොටස් ආයෝජකයින්ගේ සංසදයක්ද සංවිධානය කරන ලදී.

ණ. මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු. පාඨලී චම්පික රණවක මහතා සහ එක්සත් රාජධානියේ විදේශ හා පොදු රාජ්‍ය මණ්ඩල කාර්යාලයේ ආසියාවේ සහ ශාන්තිකර කලාපය සඳහා රාජ්‍ය අමාත්‍ය ගරු. මාර්ක් ෆීල්ඩ් මහතා අතර හමුවක් 2018 ඔක්තෝබර් 17 වන දින එක්සත් රාජධානියේ ගරු. මාර්ක් ෆීල්ඩ් මහතාගේ නිල කාර්යාලයේදි පැවැත්විණි.

ත. එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය, කොළඹ පිහිටි මහා බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය සහ ශ්‍රී ලංකාවේ මහානගර සහ බටහිර සංවර්ධන අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණයෙන්, මහානගර සහ බටහිර සංවර්ධන අමාත්‍යවරයාගේ අනුග්‍රහයෙන් යුතුව 2018 ඔක්තෝබර් 18 වන දින කොළඹ පිහිටි මහා බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය පරිශ්‍රයේදී පැවති ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන සඳහා පහසුකම් සපයනු ලැබීය.

ථ. වාර්ෂිකව ප්‍රධාන ගෝලීය සංචාරක මාධ්‍යය වන සහ සංචාරකයින් 35,000, ප්‍රදර්ශකයින් 5,000, ඉක්මවූ ප්‍රමාණයක් සහ සංචාරක නියෝජිතයින් සහ සංචාරක මෙහෙයවන්නන් 2,000 ඉක්මවූ ප්‍රමාණයක් ආකර්ෂණය කර ගනු ලබන සංචාරක කර්මාන්තයේ ප්‍රමුඛතම ගෝලීය වැඩසටහනක් වන ලෝක සංචාරක වෙළඳපොළ (WTM) 2018 ට සමගාමීව, 2018 නොවැම්බර් මස 05 වන දින ‘So Sri Lanka’ ලෙස හඳුන්වා දෙනු ලැබූ ශ්‍රී ලංකා සංචාරක ක්ෂේත්‍රයේ නවතම සංචාරක ගමනාන්ත සන්නාමය එළිදැක්වීම සඳහා පහසුකම් සපයනු ලැබීය. ශ්‍රී ලංකාවේ සංචාරක හා වනජීවී අමාත්‍යතුමිය ඇතුළු තවත් බොහෝ සම්භාවනීය අමුත්තන්ගේ සහභාගිත්වයෙන් සන්නාමය එළිදැක්වීම සිදු කරන ලදී. 2018 නොවැම්බර් මස 5 - 7 දක්වා ලන්ඩන් හි එක්සෙල් ප්‍රදර්ශන මධ්‍යස්ථානයේදී පවත්වන ලද උඹළු සඳහා ශ්‍රී ලංකාවේ කර්මාන්තකරුවන් 60 කට අධික පිරිසක් සහභාගි වූහ.

ද. 2018 නොවැම්බර් 10 වන දින පොදු රාජ්‍ය මණ්ඩලයීය රටවල් විසින් සංවිධානය කරන ලද වාර්ෂික පොදු රාජ්‍ය මණ්ඩලීය සැණකෙළියට සහභාගී විය. ශ්‍රී ලාංකික කුටිය සාම්ප්‍රදායික රසකැවිලි, බත් හා ව්‍යාංජන සහ ලංකා තේ වලින් සමන්විත විය.

ධ. ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයා සහ නියෝජ්‍ය මහ කොමසාරිස් වරයා විසින්, ශ්‍රී ලංකාව නියෝජනය කරන සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායම් (APPG-SL) සාමාජිකයන් ඇතුලුව, මන්ත්‍රී මණ්ඩලය සහ ස්වාමි මණ්ඩලය යන දෙකෙහිම එක්සත් රාජධානි පාර්ලිමේන්තුවේ තෝරාගත් මන්ත්‍රීවරුන් කැඳවූ අතර, ඔවුන් සමාලෝචන කාලය තුළ සමාජ ගතව සිටියහ. ශ්‍රී ලංකා රජය විසින් මානව හිමිකම්, ප්‍රතිසන්ධානය, වගවීම, යහපාලනය වර්ධනය කිරීම සඳහා සහ ශ්‍රී ලංකාවේ සිදුව ඇති අනෙකුත් වැදගත්

අංශයන් පිළිබඳව ශ්‍රී ලංකා රජය ගෙන ඇති පියවර සම්බන්ධයෙන් එක්සත් රාජධානියේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ නිලධාරීන් නිතිපතා දැනුවත් කිරීම සිදු කරන ලදී.

න. 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවේදී ඒකමතිකව එකඟ වූ පොදු රාජ්‍ය මණ්ඩලීය නිල් ප්‍රඥප්තිය ක්‍රියාවට නැංවීම සඳහා, පොදු රාජ්‍ය මණ්ඩලය පුරා ඇති කඩොලාන ප්‍රතිසංස්කරණයේ ජයග්‍රාහකයා වීම සඳහා ශ්‍රී ලංකාව තුළ අදාළ කාර්යයන්ට මුල පිරීම සම්බන්ධීකරණය කරන ලදී. පොදු රාජ්‍ය මණ්ඩලීය නිල් ප්‍රඥාප්තිය ක්‍රියාකාරී කණ්ඩායම කඩොලාන ප්‍රතිසංස්කරණය ස්ථාපනය කිරීම උදෙසා, විදේශ කටයුතු අමාත්‍යාංශයගේ උපදේශනය සහිතව මහ කොමසාරිස් කාර්යාලය කටයුතු කරනු ලැබීය.

ආ. ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩල රාජ්‍යයන් (CIS):

දේශභූමි ආවරණය: 11

ආර්මේනියාව, අසර්බයිජාන්, බෙලාරුස්, කසකස්තානය, කිර්ගිස්තානය, මෝල්ඩෝව, රුසියාව, ටජිකිස්ථානය, ටර්ක්මෙනිස්තානය, යුක්රේනය, උස්බෙකිස්තානය

නේවාසික දූත මණ්ඩල සංඛ්‍යාව: 01

රුසියාව

සමගාමීව සිදුකරන ලද අක්ත ගැන්වීම් : 09

ආර්මේනියාව, බෙලාරුස්, මෝල්ඩෝව, මොස්කව් සිට උස්බෙකිස්ථානය, අසර්බයිජාන්, ටෙහෙරානයේ සිට ටර්ක්මෙනිස්ථානයත කිර්ගිස්තානය, ඉස්ලාමාබාද් සිට ටජිකිස්ථානය දක්වාත සහ ඇන්කාරා සිට යුක්රේනය

1.1 රුසියානු සමූහාණ්ඩුව

රුසියානු සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. රුසියානු රාජ්‍ය සංස්ථාවේ (ROSATOM) හි නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නිකොලායි ස්පාස්කි මහතා සමඟ ඔලෙග් සවන්කොව් මහතා දෙරට අතර ආරක්ෂක අංශයන්හි සහයෝගිතාව වර්ධනය කිරීම සඳහා 2018 ජනවාරි මස 16 - 17 වන දින ශ්‍රී ලංකාවේ සංචාරයකට පැමිණියහ.

ආ. 2018 පෙබරවාරි 04 - 10 දක්වා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සම්බන්ධීකරණ කටයුතු හරහා පශු වෛද්‍ය සහ ෆයිටොසැනිටරි ආවේක්ෂණය (Roselkhoznadzor) සහ රුසියානු ශාක නිරෝධායන පර්යේෂණ මධ්‍යස්ථානය වෙත ෆෙඩරල් සේවයේ නිලධාරීන් සිව්දෙනෙකුගේ සංචාරය සඳහා පහසුකම් සැලසීය.

ඇ. රුසියානු සමූහාණ්ඩුවේ තේ ප්‍රවර්ධන අංශය විසින් සංවිධානය කරන ලද ලංකා තේ උත්සවය (ලංකා තේ සාදය සහ ජාලකරණ සැසිවාරය සහ ශ්‍රී ලංකාවේ 70 වන නිදහස් දිනය සැමරීම සඳහා ශ්‍රී ලංකා තේ අනුග්‍රාහකත්වය) 2018 පෙබරවාරි 26 - 27 දිනයන්හි මොස්කව් හි ලොටේ හෝටලයේ පවත්වන ලදී.

ඈ. ආරක්ෂක ලේකම් කපිල වෛද්‍යරත්න මහතා විසින් ප්‍රධානත්වය දැරූ නියෝජිත පිරිසක් 2018 අප්‍රේල් 03 - 06 දිනයන්හි 2018 අන්තර්ජාතික ආරක්ෂක කටයුතු පිළිබඳ මොස්කව් සමුළුවට සහභාගිවීම සඳහා රුසියාවේ සංචාරය කරනු ලැබීය.

ඉ. 2018 අප්‍රේල් මස 17 - 22 දක්වා පැවති මොස්කව් අන්තර්ජාතික අධ්‍යාපනික ප්‍රදර්ශනය සඳහා සහභාගි වීමට උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් ඩී. සී. දිසානායක මහතා රුසියාවේ සංචාරයක නියුතු විය. සංචාරය අතරතුර, දිසානායක මහතා රුසියානු සමූහාණ්ඩුවේ විද්‍යා සහ අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍ය පවෙල් සෙන්කොවිච් මහතා හමු විය.

ඊ. රුසියාවේ ශාන්ත පීටර්ස්බර්ග් හි පැවති VIII වන ශාන්ත පීටර්ස්බර්ග් ජාත්‍යන්තර නෛතික සංසදයට සහභාගි වීම සඳහා 2018 මැයි 15 - 19 දිනයන්හි ශ්‍රී ලංකාවේ අධිකරණ අමාත්‍ය ගරු. තලතා අතුකෝරල මහත්මියගේ රුසියානු සංචාරය සඳහා පහසුකම් සපයන ලදී.

උ. 2018 මැයි මස 24 - 26 දක්වා රුසියාවේ ශාන්ත පීටර්ස්බර්ග් ආර්ථික සංසදයට සහභාගි වීම සඳහා ශ්‍රී ලංකාවේ බනිජ තෙල් සම්පත් හා සංවර්ධන අමාත්‍ය ගරු. අර්ජුන රණතුංග මහතා සහ නියෝජිතයින් දෙදෙනෙකුගේ රුසියානු සංචාරයට පහසුකම් සපයනු ලැබීය.

ඌ. විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන, වෘත්තීය පුහුණු හා උඩරට උරුමයන් පිළිබඳ නියෝජ්‍ය අමාත්‍ය පා.ම. කරුණාරත්න පරණවිතාන මහතා සහ පා.ම. ගරු. සුසිල් ප්‍රේමජයන්ත් මහතා 2018 ජුනි 04 - 07 දක්වා පැවති පාර්ලිමේන්තු සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර සංසදයට සහභාගි වීම සඳහා මොස්කව් බලා සංචාරය කළහ.

ඍ. සාමකාමී අරමුණු සඳහා න්‍යෂ්ටික බලශක්ති භාවිතය පිළිබඳ සහයෝගීතාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සහ රුසියාව අතර ඒකාබද්ධ කාර්ය සැසිවාරය 2018 ජූනි මස 29 වන දින කොළඹ දී පැවැත්විණි.

ඎ. රුසියාවේ FIFA ලෝක කුසලාන 2018 තරගයට සමගාමීව 2018 ජුනි මස 12 වන දින සිට ජුලි 17 වන දින දක්වා ලංකා තේ බිල්බෝර්ඩ් ප්‍රචාරක වැඩසටහන මොස්කව්හිදී සංවිධානය කරන ලදී. මෙම ප්‍රචාරක වැඩසටහනට ඩිජිටල් සහ පුරවර ආකෘති යන ආකාර දෙකෙහිම පුවරු 58 කින් සමන්විත විය.

ඒ. රුසියානු යුධ හමුදා තාක්ෂණික සහයෝගීතා සංගමයේ අධ්‍යක්ෂක දමිත්‍රි ෂගවු මහතා 2018 අගෝස්තු 09 - 10 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නියුතු විය. සංචාරය අතරතුර ඔහු ශ්‍රී ලංකා අතිගරු ජනාධිපතිතුමා හමු විය.

ඒ. ගුවන් හමුදා උප ප්‍රධානි කේ. එෆ්. ආර්. ප්‍රනාන්දු මහතා 2018 අගෝස්තු 21 - 26 දක්වා රුසියාවේ අන්තර්ජාතික හමුදා තාක්ෂණික සංසදය ‘‘හමුදා 2018’’ සඳහා සහභාගි වීමට රුසියාවේ සංචාරයක නියුතු විය.

ඓ. ශ්‍රී ලංකා යුධ හමුදාව, නාවික හා ගුවන් හමුදාවේ 50 දෙනෙකුගෙන් යුත් ශ්‍රී ලංකා හමුදා තූර්ය වාදක කණ්ඩායම් 2018 අගෝස්තු 20 - සැප්තැම්බර් 02 දක්වා රුසියාවේ පැවති ‘ස්පාස්කියානු කුළුණ’ සංගීත උළෙල සඳහා සහභාගි විය.

ඔ. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් කපිල වෛද්‍යරත්න මහතාගේ නායකත්වයෙන් යුතු ශ්‍රී ලංකා දූත පිරිසක් 2014 අගෝස්තු 31 සිට සැප්තැම්බර් 05 දක්වා රුසියානු සමූහාණ්ඩුවේ සංචාරය කරන ලදී. මෙම සංචාරයේදී පහත සඳහන් ගිවිසුම් අත්සන් කරන ලදී.

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ රුසියානු සමූහාණ්ඩුව අතර යුධ සහයෝගීතාවය පිළිබඳ ගිවිසුමක් 2018 සැප්තැම්බර් 03 දින මොස්කව්හිදී අත්සන් කරන ලදී.
- හමුදා-තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ ඒකාබද්ධ රුසියානු - ශ්‍රී ලංකා ක්‍රියාකාරී කණ්ඩායමේ පරිශීලන නියමයන් (TOR) 2018 සැප්තැම්බර් මස 03 වැනි දින මොස්කව්හිදී අත්සන් කරන ලදී.

ඕ. රුසියානු සමූහාණ්ඩුවේ ආරක්ෂක අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා හමුදාවට රුසියානු හමුදා ආයතනවල පුහුණුව (පුරප්පාඩු 25 ක්) ලබා දී ඇත.

ඖ. ශ්‍රී ලංකාවේ සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය යටතේ කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය සමග එක්ව මොස්කව් ලෝක ආහාර සැපයුම් 2018 සඳහා ශ්‍රී ලංකාව සහභාගි විය. ශ්‍රී ලංකා කුළු බඩු, පොල්, තේ, විප්ලනිය පලතුරු හා ආයුර්වේදීය නිෂ්පාදන යන අංශයන් නියෝජනය කරමින් ශ්‍රී ලාංකික අපනයනකරුවන් සයදෙනෙකු සහ නිලධාරීන් පස් දෙනෙකුගෙන් සමන්විත නියෝජිත පිරිසක් මෙම අවස්ථාවට සහභාගි වූහ. තවද, ශ්‍රී ලංකා මණ්ඩපය තුළ ආහාර පිසීමේ ආදර්ශන නිරූපණය කරමින් ශ්‍රී ලාංකේය ආහාරවල සුවිශේෂත්වය මෙහිදී පෙන්නුම් කරනු ලැබීය.

ක. 25 වැනි MITT - මොස්කව් නුවර ජාත්‍යන්තර චාරිකා හා සංචාරක ප්‍රදර්ශනයෙහි සහභාගිත්වය සඳහා පහසුකම් සපයන ලද අතර, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහ ශ්‍රී ලංකාවේ සංචාරක සමාගම් 11 ක් මේ සඳහා සහභාගි විය.

ඛ. AZUR AIR සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) අතර ගොඩ බෑමේ පිරිවැය 50% කින් කපා හැරීම සඳහා වන අවබෝධතා ගිවිසුමෙහි සකස් කර අවසන් කිරීමට කටයුතු කර ඇත.

ග. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සහය සහිතව 2018 සැප්තැම්බර් 11 - 13 දක්වා ධම්ඍශණ්‍ය විනෝදාස්වාද ප්‍රදර්ශනයෙහිදී ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සඳහා පහසුකම් සැලසීය. මෙම අවස්ථාවට සංචාරකයින් සහ සංචාරක වෙළෙඳුන් 14 දෙනෙකු සහභාගී වූහ. ශ්‍රී ලංකා යුධ හමුදා නර්තන කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද ශ්‍රී ලාංකේය සාම්ප්‍රදායික නර්තන අංගයන් මගින් ජාතික මණ්ඩපය ආලෝකමත් කරන ලදී.

ඝ. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහ ඇනෙක්ස් ටුවර් සමඟ සහයෝගීත්වයෙන් සංචාරක නියෝජිතයින් සඳහා දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක් 2018 සැප්තැම්බර් මස 14 වැනි දින මොස්කව් ෂෙරටන් පැලස් හෝටලයේදී පැවැත්විණි.

ච. රුසියානු සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ තේ ප්‍රවර්ධන අංශය 2018 පෙබරවාරි මස 05 - 09 වන දින මොස්කව්හි පවත්වන ලද "PRODEXPO 2018" ආහාර සහ පාන වර්ග ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාවෙන් ප්‍රදර්ශකයින් 06 දෙනෙකු සඳහා ලංකා තේ මණ්ඩපය සංවිධාන කරන ලදී; 2018 මැයි මස 16 - 18 දක්වා පැවති ලෝක ආහාර අසර්බයිජාන් 2018 ප්‍රදර්ශනයේදී ප්‍රදර්ශකයින් 07 දෙනෙකු සඳහා අවස්ථාව හිමි විය; 2018 අප්‍රේල් මස 04 - 06 දක්වා උස්බෙකිස්ථානයේ, ටෂ්කෙන්ට් හි පැවති ලෝක ආහාර උස්බෙකිස්ථාන 2018 ප්‍රදර්ශනයේදී ප්‍රදර්ශකයින් 03 දෙනෙකුට අවස්ථාව හිමි විය; 2018 අගෝස්තු 25 - 26 දක්වා මොස්කව්හි කෝපි සහ තේ උත්සවය 2018 සඳහා ලංකා තේ ප්‍රවර්ධන වැඩමුළුව පවත්වා ගැනීම සහ 2018 සැප්තැම්බර් 17 - 20 දක්වා මොස්කව් හි පැවති ලෝක ආහාර මොස්කව් 2018 හිදී ප්‍රදර්ශකයින් 06 දෙනෙකු සඳහා ලංකා තේ මණ්ඩපය සංවිධානය කරන ලදී.

ඡ. රුසියානු බලශක්ති සතිය (REW) ජාත්‍යන්තර සංසදය 2018 ඔක්තෝබර් 03 - 06 දක්වා මොස්කව්හි මධ්‍යම ප්‍රදර්ශන ශාලාව 'Manège' හි පවත්වන ලදී. සංසදයේ විශේෂ සැසිවාරයට රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින් මහතා සහභාගී වූ අතර, "වෙනස් වූ ලෝකයක් සඳහා තිරසාර ශක්තියක්" යන තේමාව යටතේ ජනාධිපතිවරයා ප්‍රේක්ෂකයින් ඇමතීය. සෑදැ හි මූලික අරමුණ වන්නේ, බලශක්ති ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර සහයෝගිතාව සඳහා නවීකරණය කරන ලද වේදිකාවක් සැපයීම අතරතුර රුසියාව තුළ ඉන්ධන සහ තෙල් පිළිබඳ අනාගතය ආදර්ශනය කිරීමයි. මෙම සංසදයේ මාතෘකාවන් මගින්, ගෑස් කර්මාන්තය, ගල් අඟුරු කර්මාන්තය, තෙල් කර්මාන්තය, පරමාණුක කර්මාන්තය, බහිජ රසායන විද්‍යාව, විදුලිබලය, බලශක්ති සංරක්ෂණය සහ බලශක්ති තිරසාරත්වය වැඩි දියුණු කිරීම යන අංශ ආවරණය කෙරේ. රුසියානු සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකා තානාපති අතිගරු. ආචාර්ය දයාන් ජයතිලක මහතා, සාකච්ඡා සැසියට සහභාගි වූ අතර, සෑම මහාද්වීපයකම ව්‍යාපාරික, දේශපාලනික සහ පරිපාලන ප්‍රභූන් රැසක්ද ඔහු සමඟින්

සහභාගී විය. එය බලශක්ති ක්ෂේත්‍රය තුළ ජාත්‍යන්තර සහයෝගිතාව වැඩිදියුණු කිරීම හා ආර්ථික, පාරිසරික සහ ඵලදායි කලමනාකරණය න්‍යාය පත්‍රය තුළ නව අභියෝග ජයගත ගැනීමට උත්සාහ දැරීමක් විය.. විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ අතිරේක ලේකම් මෙරිල් ගුණතිලක මහතා, ලංකා විදුලිබල මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරී එස්. ඩී. ඩබ්ලිව්. ගුණවර්ධන මහතා, බනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ජෙනරාල් වජිර දසනායක මහතා ඇතුළු ශ්‍රී ලංකා නියෝජිත පිරිසක් සෘෂද සඳහා සහභාගී වූහ.

ජ. රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍ය ගරු. නලින් බණ්ඩාර මහතා විසින් ප්‍රධානත්වය දැරූ තිදෙනෙකුගෙන් සමන්විත නියෝජිත පිරිසක් 2018 ඔක්තෝබර් 23 - 26 දක්වා මොස්කව්හිදි පැවති 22 වන අන්තර්ජාතික වාසභූමි ආරක්ෂක ප්‍රදර්ශනය “Interpolitex 2018” සඳහා සහභාගි විය. 2018 ඔක්තෝබර් 23 වන දින ගරු. නලින් බණ්ඩාර මහතා සහ ශ්‍රී ලංකා දූත පිරිස රුසියානු සමූහාණ්ඩුවේ අභ්‍යන්තර කටයුතු අමාත්‍ය ගරු. වී. කොලොකොට්සෙව් මහතාගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලද මෙම ප්‍රදර්ශනයේ සමාරම්භක උත්සවයට සහභාගී විය. රුසියානු සමූහාණ්ඩුවේ අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය, රුසියානු සමූහාණ්ඩු ආරක්ෂක සේවය, රුසියානු සමූහාණ්ඩුවේ ජාතික ආරක්ෂක බලකායේ ෆෙඩරල් සේවය, සහ ප්‍රදර්ශන සමාගම් සමූහය "BIZON" විසින් මෙම ප්‍රදර්ශනය සංවිධානය කරන ලදී. ප්‍රදර්ශනය අතරතුර, ගරු. නලින් බන්ඩාර මහතා රුසියාවේ ජාත්‍යන්තර පොලිස් සහයෝගිතා දෙපාර්තමේන්තුවේ ප්‍රධානී හමුවූ අතර, රාජ්‍ය හා රාජ්‍ය ආරක්ෂක අංශවල ජාත්‍යන්තර සහයෝගිතාව පිළිබඳ කරුණු සාකච්ඡා කළේය. ප්‍රදර්ශනයේ දී, නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් විසින් භාවිතා කරන අති නවීන සහ උසස් තාක්ෂණ හා උපකරණ ප්‍රදර්ශකයින් විසින් නලින් බණ්ඩාර මහතාහට ආදර්ශනය කරනු ලැබීය.

ට. සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත සංවර්ධන අමාත්‍ය ගරු. දයා ගමගේ මහතා 2018 ඔක්තෝබර් මස 24 සිට 27 දක්වා රුසියාවේ, මොස්කව් හිදී පවත්වන ලද ICAPP හි 10 වන මහා සම්මේලනයට සහභාගී විය. එම රැස්වීමට සමගාමීව, අමාත්‍යවරයා ඔක්තෝබර් 27 වන දින Inter-CHARM ප්‍රදර්ශනය නැරඹීමට පැමිණි අතර, එහිදී ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ට සහභාගී විය හැකි අනාගත සිදුවීම් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා Inter-CHARM හි ජාත්‍යන්තර විකුණුම් කළමණාකරු ඇලෙක්සැන්ඩර් කල්යාගින් මහතා හමුවිය.

ඨ. 2018 දෙසැම්බර් මස 2 සිට 5 වැනි දින දක්වා මොස්කව් හි දී පැවැත්වූ ජාත්‍යන්තර ස්වේච්ඡා සංසදයට සහභාගිවීම සඳහා ශ්‍රී ලංකාවෙන් නවදෙනෙකුගෙන් යුත් නියෝජිත කණ්ඩායමක් රුසියාවේ සංචාරයක නිරත විය. ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමට, අනෙකුත් තරුණ සංවිධාන නායකත්වයන් හමුවීමට සහ ඔවුන්ගේ අත්දැකීම් හුවමාරු කර ගැනීමට සංසදය මනා ස්ථානයක් වියත ලොව පුරා ස්වේච්ඡා තරුණයන් සහ තරුණ නායකයින් සමඟ නව සබඳතා ඇති කර ගැනීම සඳහා ද එමගින් දායකත්වය ලැබුණි. දෙසැම්බර් 6

වන දින ශ්‍රී ලංකා නියෝජිත පිරිස රුසියාවේ ජාතික යොවුන් සම්මේලනයේ ප්‍රධානි, ග්‍රෙගරි පෙටව්ස්කොව් හමු වූ අතර, එහිදී දෙරටෙහි යොවුන් සංවිධාන අතර හවුල්කාරිත්වය සහ සම්බන්ධීකරණය සමීපව පවත්වා ගැනීමේ අවස්ථාවන් පිළිබඳ සාකච්ඡා කෙරුණි. දෙරටෙහි යෞවන සභා දෙක අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම සඳහා නියෝජිත පිරිස සාකච්ඡා කළහ.

ඩ. තානාපති කාර්යාලය විසින් තානාපති කාර්යාල කාර්ය මණ්ඩලය සහ ශ්‍රී ලංකා ප්‍රජාවගේ සහභාගීත්වයෙන් 2018 පෙබරවාරි 04 දින තානාපති කාර්යාල පරිශ්‍රයේ දී ධජය උත්සවාකාරයෙන් ඔසවීමේ උත්සවයක් සංවිධානය කරන ලදී. ඊට අමතරව, මෙම උත්සවය සැමරීම සඳහා තානාපති කාර්යාලය විශේෂ සංස්කෘතික සංදර්ශනයක් සහ රාත්‍රී භෝජන සංග්‍රහයක් සංවිධානය කරන ලද අතර, ඒ සඳහා රාජ්‍ය පාලනයේ සාමාජිකයන්, රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සාමාජිකයන්, විදේශ කටයුතු අමාත්‍යාංශය, අධ්‍යාපන සහ විද්‍යා අමාත්‍යාංශය, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, සංචාරක සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය නියෝජනය කරමින් රුසියානු රජයේ නිලධාරීන්, ෙඩරල් රේගු සේවය, පශු වෛද්‍ය පෙඩරල් සේවය, යුරෝපීය, සාර්ක්, ඒසියාන් සහ සීඅයිඑස් දේශයන්හි තානාපතිවරුන් හා රාජ්‍ය තාන්ත්‍රිකයන්, විද්වතුන්, රුසියානු ව්‍යාපාරික ප්‍රජාව සහ සංචාරක වෙළඳ සාමාජිකයන් යනාදී ආරාධිතයින් 175 ඉක්මවූ පිරිසකගේ සහභාගිත්වයක් විය.

ඪ. ආචාර්ය දයාන් ජයතිලක මහතා රුසියානු විදේශ කටයුතු අමාත්‍යාංශයේ ආසියා ශාන්තිකර කලාපය අධීක්ෂණය කරන, රුසියානු විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ගරු. ඉගෝර් මෝගුලොව් මහතා හමුවූ අතර, 2018 සැප්තැම්බර් 7 වන දින ඔහුගේ නියෝග ලිපියේ පිටපතක් ලබා දෙන ලදී. නියෝජ්‍ය ඇමතිවරයා විසින් ආචාර්ය දයාන් ජයතිලක මහතා, නව තානාපති වශයෙන් උණුසුම් ලෙස පිළි ගනු ලැබූ අතර, ශ්‍රී ලංකාව සහ රුසියානු සමූහාණ්ඩුව අතර ශක්තිමත් හා මිත්‍රශීලී ද්විපාර්ශ්වික සබඳතා මෙන්ම බහුපාර්ශ්වීය ආයතනවල සබඳතාද සිහිපත් කළේය.

ණ. ආචාර්ය දයාන් ජයතිලක මහතා රුසියාවෙහි සාමාන්‍ය ක්‍රියා පටිපාටීන් පිළිබඳව සහ රුසියානු විදේශ කටයුතු අමාත්‍යාංශයේ රාජ්‍ය ක්‍රියා පටිපාටීන් සහ තානාපතිවරුන් සඳහා ඉදිරියේදී පැවැත්වෙන නිල උත්සව පිළිබඳ තොරතුරු සාකච්ඡා කිරීමට විදේශ කටයුතු අමාත්‍යාංශයේ රාජ්‍ය ක්‍රියා පටිපාටි පිළිබඳ අධ්‍යක්ෂ අයිගෝර් බොග්ඩෂෙව් මහතා හමුවිය. (සැප්තැම්බර් 05). ඔහු රුසියාවේ විදේශ අමාත්‍යාංශයේ දෙවන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සමීර් කබුලොව් මහතා (ඔක්තෝබර් 30) සහ රුසියානු විදේශ කටයුතු අමාත්‍යාංශයේ ජාත්‍යන්තර සංවිධානවල අධ්‍යක්ෂ පටෙර් ඉලගිචෙව් මහතාද හමුවිය.

ත. රුසියානු සමූහාණ්ඩුවේ නව තානාපති ආචාර්ය දයාන් ජයතිලක මහතා 2018 ඔක්තෝබර් 11 වන දින මොස්කව්හි ක්‍රෙම්ලින් හිදී රුසියානු සමූහාණ්ඩුවේ ජනාධිපති අතිගරු ව්ලැඩිමීර් පුටින් මහතා හට සිය අක්තපත්‍ර පිළිගැන්වීය. රටවල් 23 ක

තානාපතිවරුන්ගෙන් අක්තපත්‍ර ලබා ගැනීමෙන් පසුව ජනාධිපති පුටින් විසින් කථාවක් පවත්වන ලද අතර, ඔහුගේ කථාව තුලදී රුසියාව ශ්‍රී ලංකාව සමඟ සාම්ප්‍රදායිකව මිත්‍රශීලී සබඳතා පවත්වන බව සඳහන් කරමින්, ධීවර, කෘෂිකාර්මික සහ සංචාරක යන ක්ෂේත්‍රයන් ද ඇතුලුව වඩාත් සමීප වෙළඳාම සහ ආර්ථික සහයෝගිතාවන් කෙරෙහි උනන්දු වන බව සඳහන් කළේය. 2018 නොවැම්බර් මස 07 වන දින අතිගරු දයාන් ජයතිලක මහතා සිය අක්තපත්‍ර භාර දීමෙන් පසු, ඔහුගේ ප්‍රථම නිල සත්කාරක උත්සවය ශ්‍රී ලංකා රුසියානු හවුල්කාරිත්වයේ විශාල සංඛ්‍යාවක් නියෝජනය කරමින් රුසියානු අමුත්තන් සඳහා පවත්වන ලදී.

ථ. තානාපති අතිගරු. ආචාර්ය දයාන් ජයතිලක මහතා 2018 නොවැම්බර් 11 වන දින රුසියානු සමූහාණ්ඩුවේ රාජ්‍ය මන්ත්‍රණ සභාව වෙත ගොස් පා.ම. යෙව්ගිනි ප්‍රිමාකොව් මහතා සමඟ සාකච්ඡාවක් පැවැත්වීය. වර්තමාන ද්විපාර්ශ්වික හා කලාපීය සම්බන්ධතා පුළුල් පරාසයක් තුළට ගෙන ඒම සඳහා වඩාත් පරිපූර්ණ සහ බහුපැතිකඩ ජාත්‍යන්තර දැක්ම යලි ක්‍රියාත්මක කිරීම සඳහා අගයන් සහ අපේක්ෂාවන් බොහොමයක් තානාපතිතුමන් සහ ප්‍රිමාකොව් මහතා විසින් හඳුනාගනු ලැබුහ. අනෙකුත් සමාන තත්වයන් අවම වුවද, විවිධ පාර්ශවයන් හා පක්ෂ එක්සේසත් කළ හැකි ගෝලීය සාම ව්‍යාපාරය පුනර්ජීවනය කිරීමේ වැදගත්කම අවධාරණය කළහ. 2018 නොවැම්බර් 15 වන දින තානාපතිතුමා විසින් රුසියානු පාර්ලිමේන්තු සමූහාණ්ඩු සම්මේලනයේ විදේශ කටයුතු කමිටුවේ සභාපති සෙනට් සභික අතිගරු කොන්ස්ටන්ටින් කොස්චේව් මහතා හමුවිය.

ද. ශ්‍රී ලංකාවේ සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය යටතේ කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය සමග එක්ව මොස්කව් ලෝක ආහාර සැපයුම් 2018 සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය තානාපති කාර්යාලය විසින් සම්බන්ධීකරණය කරනු ලැබීය. ශ්‍රී ලංකා කුළු බඩු, පොල්, තේ, විප්ලනීය පලතුරු හා ආයුර්වේදීය නිෂ්පාදන යන අංශයන් නියෝජනය කරමින් ශ්‍රී ලාංකික අපනයනකරුවන් සයදෙනෙකු සහ නිලධාරීන් පස් දෙනෙකුගෙන් සමන්විත නියෝජිත පිරිසක් මෙම අවස්ථාවට සහභාගි වූහ. තවද, ශ්‍රී ලංකා මණ්ඩපය තුළ ආහාර පිසීමේ ආදර්ශන නිරූපණය කරමින් ශ්‍රී ලාංකේය ආහාරවල සුවිශේෂත්වය මෙහිදී පෙන්නුම් කරනු ලැබීය.

ධ. 25 වැනි MITT - මොස්කව් නුවර ජාත්‍යන්තර චාරිකා හා සංචාරක ප්‍රදර්ශනයෙහි සහභාගිත්වය සඳහා පහසුකම් සපයන ලද අතර, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහ ශ්‍රී ලංකාවේ සංචාරක සමාගම් 11 ක් මේ සඳහා සහභාගි විය.

න. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ මහජන සම්බන්ධතා අංශය සමඟ සම්බන්ධීකරණය මගින් ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සංස්කෘතික සාමාජිකයින්ගේ ශ්‍රී ලංකා සංචාරය සම්බන්ධීකරණය කරන ලදී. ශ්‍රී ලාංකේය ඉතිහාසය, සංස්කෘතිය සහ වෙනත් දේ පිළිබඳව චාර්තාගත වීඩියෝ දර්ශන රූපගත කිරීමට ඔවුහු සැලසුම් කරති.

ප. ශ්‍රී ලංකා පෞද්ගලික අංශයේ නියෝජිතයන් සහ රුසියානු රූපවාහිනී නාලිකාව ‘Pyàtnitsa’ අතර සබඳතාවයක් නිර්මාණය කිරීම සඳහා තානාපති කාර්යාලය විසින් සමනල කන්දෙහි වීඩියෝවක් රූපගත කිරීමට පහසුකම් සලසා ඇත.

එ. මොස්කව් සිට කොළඹ දක්වා සෘජු ගුවන් ගමන් සඳහා රුසියානු ගුවන් සේවා "PJSC Aeroflot" මෙන්ම "Rossiya Airlines" සහ රුසියානු ගුවන් සේවය වෙත අනුමැතිය ලබා දීමට තානාපති කාර්යාලය විසින් පහසුකම් සපයන ලදී.

බ. මෙම අවස්ථාවට සහභාගි වූ අමුත්තන්හට පිරිසිදු සිලෝන් තේ රසවිඳීමට අවස්ථාව ලැබුණු අතර, ශ්‍රී ලංකා සංස්කෘතියේ අක්‍යාවශ්‍ය අංගයන් වන සාම්ප්‍රදායික සංස්කෘතික හා සංගීතමය අංගයන්ගෙන් පරිපූර්ණව පැවති සංදර්ශනය රස විඳිනු ලැබීය. ශ්‍රී ලාංකීය සංගීත කණ්ඩායම “Soul Sounds” සිත් ඇදගන්නා සුළු සජීවී ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී. රුසියානු නර්තන කණ්ඩායම “Vozrozhdenie” බැලේ නාට්‍යය වැනි සම්භාව්‍ය රුසියානු නර්තනයන් රඟ දැක් විය.

භ. මෙම වැඩසටහනේ රාමුව තුල, ඇනා ස්විස්වෙවා, රුසියාවේ ‘ටී මාස්ටර්ස්’ කුසලාන ශූර (Tea Masters Cup Champion) සහ ‘ටී මික්ස්ලොජි’ ජයග්‍රාහක (Tea Mixology Winner), ලංකා තේ මත පදනම් ව ඇයි විසින් සිසිල් තේ බීම සූදානම් කරන කලාව ආදර්ශනය කරන ලද අතර, සම්භාවනීය අමුත්තන්හට "මෑන්හැටන්" තේ පානය රස විඳීමට පිරිනමනු ලැබීය.

ම. ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමග සහයෝගීතාවයෙන් තානාපති කාර්යාලය විසින් ලංකා තේ නියැදි සකස් කිරීම පළමු සැසි වාරය මොස්කව්හි ප්‍රධාන පෙළේ සුපිරි වෙළඳසැල් හතරේ දී (මාර්ෆිනෝ, ට්‍රොයිකා, අල්ටුෆයිවෝ, සහ පොලෙටර්ස්කයා) පිළිවෙලින් පළමු සැසිවාරය අගෝස්තු මස 17 සිට 19 දින දක්වා; අගෝස්තු 24 සිට 26 දක්වා; අගෝස්තු 31 සිට සැප්තැම්බර් 02 දක්වා සහ සැප්තැම්බර් 07 සිට 09 දින දක්වා පවත්වනු ලැබීය.

ය. 2018 ඔක්තෝබර් 23 සිට 25 දක්වා යුක්‍රේනයේ, කේව්හි ජාත්‍යන්තර ප්‍රදර්ශන මධ්‍යස්ථානයේදී යුක්‍රේන ලෝක ආහාර, යුක්‍රේන ජාත්‍යන්තර ආහාර සහ පාන ප්‍රදර්ශනය 21 වන සංස්කරණට සඳහා තානාපති කාර්යාලය සහභාගි වූ අතර, යුක්‍රේන තේ වෙලඳපොළෙහි ලංකා තේ සුලබතාවය තවදුරටත් ශක්තිමත් කිරීම මෙහි අරමුණ විය.

1.2 බෙලරුස්

බෙලරුස් වෙත සමගාමීව සිදු කරන ලද අක්ත ගැන්වීම් හරහා රුසියානු සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. වර්ගීකෘත තොරතුරු අන්‍යොන්‍ය වශයෙන් ආරක්ෂා කිරීමේ ගිවිසුමෙහි කෙටුම්පත සම්බන්ධයෙන් විශේෂඥ මට්ටමේ උපදේශන පැවැත්වීම සඳහා බෙලරුසියානු දූත

පිරිසක් (නියෝජිතයින් 4 දෙනෙකු) 2018 ඔක්තෝබර් 28 - 31 දිනයන්හිදී කොළඹට පැමිණියහ.

1.3 යුක්රේනය

යුක්රේනය වෙත සමගාමීව සිදු කරන ලද අක්ත ගැන්වීම් හරහා තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

අ. 20108 මාර්තු මාසයේදී යුක්රේනයේ හාර්කිව්හි ශ්‍රී ලංකා කොන්සල්ගේ ගරු කටයුතු අපේක්ෂකයකු සහ ප්‍රමුඛ ව්‍යාපාරිකයෙකු සමඟ ශ්‍රී ලංකාවේ ආයෝජනය සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත්වීම.

ආ. 2018 මාර්තු මාසයේ පැවති යුක්රේනියානු වාර්ෂික සංචාරක වෙළඳ ප්‍රදර්ශනයට ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සඳහා පහසුකම් සැලසීය.

ඇ. ගරු. ඔක්සානා බිලෝසිර්ගේ ප්‍රධානත්වයෙන් යුතු යුක්රේන පාර්ලිමේන්තු දූත කණ්ඩායම 2018 ජූලි 19 - 20 ශ්‍රී ලංකාවේ සංචාරය කළහ.

යුරෝපා සංගමය, බහු පාර්ශ්වීය ගිවිසුම් හා පොදු රාජ්‍ය මණ්ඩලීය අංශය

යුරෝපා සංගමය, පොදු රාජ්‍ය මණ්ඩලය සහ බහු පාර්ශ්වික ගිවිසුම් අංශය

1. යුරෝපා සංගමය සමග ශ්‍රී ලංකාවේ සබඳතා 2018 වර්ෂයේදී යුරෝපා සංගමය සමග ශ්‍රී ලංකාවේ සබඳතා අබණ්ඩව ධනාත්මක ලෙස වර්ධනය විය.

අංශයේ 2018 දෙසැම්බර් 31 දක්වා වූ කාර්යය සාධනයන්/ක්‍රියාකාරකම් පහත දක්වා ඇත.

1. <u>යුරෝපා සංගමයේ පොදු වරණීය වෙළඳ ක්‍රමය (GSP) වෙළඳ පහසුකම් සම්බන්ධ විශ්ලේෂනය</u>

- ශ්‍රී ලංකාවට GSP Plus පහසුකම ලබා දීමෙන් අනතුරුව GSP + ක්‍රියාකාරකම් ලකුණු ක්‍රියාත්මක කිරීම යුරෝපා සංගමය විසින් අබණ්ඩව නිරීක්ෂණය කිරීම තුලින් බැඳියාවක් ඇති කර ගන්නා ලදී. යුරෝපා සංගමයේ GSP + රෙගුලාසි අනුව රටක් GSP + ප්‍රතිලාභියෙකු බවට පත් වූ විට නිරීක්ෂණය ක්‍රියාවලිය වසර 2 ක චක්‍රයක් ලෙස ආරම්භ වන අතර එය ත්‍රීවූ සහ අබණ්ඩ වේ. මෙම ක්‍රියාවලියට එකිනෙක බැඳුනු අන්තර් මෙවලම් 2 කින් සමන්විත වන අතර ඒවා නම් (i) ප්‍රතිලාභී රටක් සඳහා වන ලකුණු පුවරුව (ii) ප්‍රතිලාභී රටක් සමඟ සමීප සංවාදය (ගමන් බිමන්, රැස්වීම්, වෙනත් ක්‍රම මඟින්). මේ සම්බන්ධව යුරෝපා සංගමය විසින් GSP + ලකුණු පුවරුවක් සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ ගරු අමාත්‍යාවරයාට 2018 මාර්තු 29 දිනැති ලිපියෙන් යොමු කර ඇත.

- ලකුණු පුවරුව මගින් ශ්‍රී ලංකාව ඉදිරි වාර දෙක තුළ GSP + අබණ්ඩව ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව ඇගයීමට ලක් කෙරෙන නිර්ණායක සැකසෙනු ඇත. එහි සඳහන් ගැටළු ලැයිස්තුව GSP + සහනයට අදාළ ජාත්‍යන්තර සම්මුතීන් 27 ක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ඉතා වැදගත් අඩුපාඩු ආමන්ත්‍රණය කරනු ඇති අතර ඒවා මානව හිමිකම්, කම්කරු, පාලනය සහ පරිසරය යන ප්‍රධාන පර්ශද 4 යටතේ වර්ගීකරණය කර ඇත.

- විදේශ කටයුතු අමාත්‍යාංශය GSP + මධ්‍ය ලක්ෂය සමග සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණයෙන් හා ඉහත සඳහන් කර ඇති පර්ශද හතරෙහි ප්‍රධානීන් හා සාමාජිකයන් සමග මන්ත්‍රණයෙන් අනතුරුව ලකුණු පුවරුව සම්බන්ද ශ්‍රී ලංකාවේ ප්‍රතිචාරය දක්වන ලදී. GSP + සමීන්ධ අන්තර් අමාත්‍ය කමිටුවේ අනුමැතියට පසුව ශ්‍රී ලංකා රාජ්‍යයේ ප්‍රතිචාර යුරෝපා සංගමයේ පාර්ශවයට 2018 අගෝස්තු මස 09 වන දින ඉදිරිපත් කරන ලදී.

- ප්‍රධාන GSP+ වගකීම් ආමන්ත්‍රණය සඳහා විදේශ කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් GSP+ සඳහා වූ අන්තර් අමාත්‍ය කමිටු රැස්වීම 2018 ඔක්තෝම්බර් මස 09 වන දින පැවැති අතර එම රැස්වීමේදී එම ප්‍රධාන කරුනු සම්බන්ධව අන්තර් අමාත්‍ය කමිටුවේ කැමැත්ත ලබා දෙන ලදී.

- මෙයට අමතරව අමාත්‍යාංශය යුරෝපා සංගමය රාජ්‍ය තාන්ත්‍රිකයන් සමග කොළඹ දී හා බ්‍රසල් හි නිලධාරීන් සමඟ විටින් විට යුරෝපා සංගමය විසින් ප්‍රධාන ලෙස නගන ලද ගැටළු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ ස්ථාවරය පැහැදිලි කර ගැනීම සඳහා සාකච්ඡා පවත්වන ලදී.

- එමෙන්ම ශ්‍රී ලංකාව තුළ ඉන්දුනීසියාවේ ආවේණික අමුද්‍රව්‍ය පොදු නිෂ්පාදනය කරනු ලබන ඇගළුම් නිෂ්පාදනවල සම්භවය පිළිබඳව කලාපීය සමුච්චිතයක් සම්බන්ධව ශ්‍රී ලංකාව විසින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.

- සම්භවය පිළිබඳ GSP+ සහතිකය නිකුත් කිරීම සඳහා වූ REX ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී බ්‍රසල්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය යුරෝපා කොමිසමේ අදාළ නිලධාරීන්ගේ උපදේශන මත 2018 ජනවාරි මස 01 සිට බලපැවැත්වෙවන පරිදි REX ක්‍රමය යටතේ අපනයනකරුවන් ලියාපදිංචි කිරීම ආරම්භ කිරීම වාණිජ දෙපාර්තමේන්තුව වෙත පහසුකම් සපයන ලදී.

II. <u>වාර්ෂික ව්‍යුහගත යාන්ත්‍රණය යටතේ නීතිපතා සංවාදය</u>

- වාර්ෂික ව්‍යුහගත යාන්ත්‍රණය යටතේ ශ්‍රී ලංකා යුරෝපා සංගමය ඒකාබද්ධ කොමිසම, වෙළඳ හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ වැඩ කණ්ඩායම් පාලනය සම්බන්ධ වැඩ කණ්ඩායම්, නීතියේ සහ මානව හිමිකම් සහ සංවර්ධන සහයෝගීතාව පිළිබඳ වැඩ කණ්ඩායම් අඛණ්ඩව ක්‍රියාත්මක වේ. මෙම රාමු තුළ සංවාදය මගින් පාර්ශවයන් දෙකටම වැඩදායක පහසු පරිසරයක් ඇති කර ගැනීමට පහසුකම් සැලසී ඇත.
- යුරෝපා සංගමය හා ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිසමේ 21 වැනි සැසිවාරය 2018 ජනවාරි මස 18 වැනි දින කොළඹදී පවත්වන ලදී. විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ප්‍රසාද් කාරියවසම් මහතා ශ්‍රී ලංකා පාර්ශ්වයෙන්ද යුරෝපා සංගමයේ බාහිර ක්‍රියා සේවා පිළිබඳ ආසියානු පැසිෆික් කලාපයේ නියෝජ්‍ය කළමණාකරණ අධ්‍යක්ෂ පාඕලා පැම්පලෝනි මෙනවිය යුරෝපා සංගමය පාර්ශවයෙන්ද මෙම රැස්වීමේ සම ප්‍රධානත්වය දරණා ලදී.

- 2016 දී පිහිටුවන ලද පාලනය, නීතියේ ආයතනය සහ මානව හිමිකම් පිළිබඳ යුරෝපා සංගම් හා ශ්‍රී ලංකා කාර්යය කණ්ඩායම් පිට පිට තෙවන වරටත් 2018 ජූනි මස 05 දින බ්‍රසල්හි මුණ ගැසුණ යුරෝපා සංගමයේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් සහ යුරෝපා සංගමයේ බාහිර ක්‍රියා සේවා පිළිබඳ දකුණු ආසියානු ශාඛාවේ හා කලාපීය කටයුතු පිළිබඳ ප්‍රධානී කැරොලින් විනොට් මෙනෙවිය විසින් සම ලෙස රැස්වීම මෙහෙයවන ලදී.

- වෙළඳ හා ආර්ථික සහයෝගිතාව පිළිබඳ වැඩ කණ්ඩායම 2018 ජූලි මස 05 වැනි දින කොළඹ දී හමු වූ අතර ශ්‍රී ලංකා පාර්ශ්වයෙන් සංවර්ධනය උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අමාත්‍යාංශ ලේකම්වරයාද, යුරෝපා සංගමයේ පාර්ශ්වයෙන් වෙළඳාම පිළිබඳ අමාත්‍ය මණ්ඩලය දකුණු හා ගිණිකොණ ආසියා ඒකකයේ අංශ ප්‍රධානී ද මෙම රැස්වීමේ සම ප්‍රධානත්වය දරන ලදී.

- 2017 දී ආරම්භ කළ ශ්‍රී ලංකා, යුරෝපා සංගම් ආයෝජන සංවාදය 2018 අප්‍රේල් මාසවල කොළඹ දී පවත්වන ලදී.

- යුරෝපා සංගමයේ බාහිර ක්‍රියා සේවා පිළිබඳ දකුණු ආසියානු ශාඛාවේ හා කලාපීය කටයුතු ප්‍රධානී කැරොලින් විනොට් මෙනෙවිය 'ඉන්දියානු සාගර සමුළුවට සහභාගි වන අතරතුර 2018 ඔක්තෝම්බර් මස 09 වන දින විදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්තුමා හමුවන ලදී. 2018 ජූනි මස 05 වැනි දින බ්‍රසල්ස් හි පැවති මානව හිමිකම් පිළිබඳ ශ්‍රී ලංකා යුරෝපා සංගම් එකමුතුව සහ 2016 කොළඹ දී පැවැති 19 වැනි ඒකාබද්ධ කමිටුවේ දී ආරම්භ කළ නිරීක්ෂණ ක්‍රියාකාරී ලකුණු පිළිබඳ සාකච්ඡාවේ දී අවධානය යොමු කරන ලදී.

III. <u>යුරෝපා සංගමයේ සහය සංවර්ධන සහයෝගීතා සහය</u>

වසර 5 ක බැඳීමක් වූ බහුවාර්ෂික පුවත වැඩසටහන යටතේ යුරෝපා සංගමය විසින් ශ්‍රී ලංකාවට සංවර්ධන සහය ලබා දෙන ලදී. බහුවාර්ශ්වික පුවත වැඩසටහන යටතේ 2007 - 2013 දක්වා වෙන් කළ මුදලට වඩා දෙගුණයක් පමණ වූ එනම් යුරෝ මිලියන 210 ක් 2016 - 2020 දක්වා බහුවාර්ෂික පුවත වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවට වෙන් කොට ඇත.

පහත සඳහන් වැඩසටහන් බහුවාර්ශික පුවත වැඩසටහන යටතේ වාර්තමනයේ මුල්‍යනය කරනු ලබන අතර මුදල්, ලෝක බැංකුව, එක්සත් ජාතීන්ගේ නියෝපිතායතන සහ අන්තර් ජාතික රාජ්‍ය නොවන සංවිධාන හරහා බෙදා හරිනු ලබයි.

- උඟව සහ මධ්‍යම පළාතට විශේෂයෙන් අවධානය යොමු කරමින් ක්‍රියාත්මක ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන. මෙම වැඩ සටහන සම්පූර්ණයෙන් ක්‍රියාත්මකවීමට ආසන්නතව පවතී. කෙයා ඉන්ටර්නැෂනල්, ස්ටිවින් පොලිඩැරිඩාව්, ඇන්ටඩ්, අඩ්වෙන්ටිස් සංවර්ධන හා පහත නියෝජිතායතනය, මැක්ස්ෂාම් යන ආයතන හරහා අරමුදල් බෙදා හරිනු ලබයි. සම්පූර්ණ වෙන් කිරීම යූරෝ මිලියන 60 කි.

- ලෝක බැංකව සමග ඒකාබද්ධව මුල්‍යනය කරනු ලබන කෘෂිකර්මික නව්‍යකරණ ව්‍යපෘතියකි. යුරෝපා සංගමය මේ සඳහා යූරෝ මිලියන 12 ක් ප්‍රදානය කර ඇත.

- උතුරු හා නැගෙනහිර පළාත්වල ක්‍රියාත්මක ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය. එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන 5 ක් විසින් යූරෝ මිලියන 60 ක් මේ සඳහා වැය කරනු ලබයි. සුළු හා මධ්‍ය පරිමාන ව්‍යාපෘතීන් අතර තරඟය වැඩි කිරීම සහ ආහාර කාර්මාන්තයේ වටිනාකම් දාම ධාරිතා වැඩි දියුණු කිරීම සඳහා වෙළඳ පහසුකම් තාක්ෂණ සහය වැඩසටහන් සහය සඳහා සම්පූර්ණ යූරෝ මිලියන 8 ක් වෙන්කර ඇති අතර වෙළඳ සාකච්ඡා හා අන්තර්ජාතික වෙළඳ මධ්‍යස්ථානය මඟින් පහසුකම් සැපයීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකික නිලධාරීන්ගේ ධාරිතා සම වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය කෙරෙහි ද මෙය අවධානය යොමු කරයි. අන්තර්ජාතික වෙළඳ මධ්‍යස්ථානය සහ එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය හරහා මේ මුදල් ලබා දෙනු ලබයි.

- රාජ්‍ය මුදල් කළමනාකරණ සංවර්ධන වැඩසටහන සඳහා ලෝක බැංකුව හරහා වැය කිරීමට යූරෝ මිලියන 40 ක මුදලක් වෙන් කොට ඇත.

- කොළඹ දිස්ත්‍රික්කයේ ජලය හා සනීපාරක්ෂක පහසුකම් ව්‍යාපෘතිය ප්‍රංශ සංවර්ධන නියෝජ්තායතනය මේ සඳහා මුදල් වැය කරයි. මුළු ප්‍රතිපාදන වෙන්කිරීම යූරෝ මිලියන 6 ක් වන අතර ව්‍යාපෘතිය සිදු කෙරෙමින් පවතී.

- ශ්‍රී ලංකා රජයේ සංහිඳියා වැඩසටහන සඳහා සහය ලබා දීම, වැඩසටහන ආරම්භ කිරීම සඳහා පාර්ශ්වයන්ගේ මන්ත්‍රණයන් ඇතුළු කාර්යයන් සිදු කෙරෙමින් පවතී. මෙම වැඩසටහන සඳහා ඇස්තමේන්තුගත පිරිවැය යූරෝ මිලියන 14.5 ක් වන අතර ඉන් යූරෝ මිලියන 12 ක් යුරෝපා සංගමය ලබා දෙන අතර ජර්මන් ෆෙඩරල් ජනරජයේ විදේශ කාර්යාලය සහ බ්‍රිතාන්‍ය කවුන්සිලය වැඩසටහනේ ඉතිරි මුදල සඳහා සම ලෙස මුල්‍යනය කරයි.

<u>ආපදා සහන සහය</u>

අපදා සහන සහ යුරෝපීය මානුෂිය ආධාර සහ සිවිල් රැකීම් සංවිධානය (ECHO) විසින් ලබා දේ. යුරෝපීය මානුෂීය ආධාර හා සිවිල් රැකීම් සංවිධානය (ECHO). හදිසි ගංවතුර සහන සහය සඳහා ශ්‍රී ලංකා රතු කුරුස සමාජය වෙත යූරෝ 300,000 ක මුදලක් ප්‍රදානය කර ඇත.

IV. **<u>සළකා බලනු ලබන කාලය තුළ සිදු කරන චාරිකා සඳහා පහසුකම් සැපයීම</u>**

- අන්තර්ජාතික වෙළඳ කමිටුවේ (INTA) සාමාජකයන් වන යුරෝපීය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 2018 අප්‍රේල් මස 4 - 6 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවට පැමිණි අතර ඔවුහු ගරු අගමැතිතමා සඳහා අනෙකුත් සම්භාවනීය අමුත්තන් හමු වූහ. එම චාරිකාවට පසුව යුරෝපා සංගමයේ GSP+ නිරීක්ෂණ කමිටුව 2017 සැප්තැම්බර් මාසයේ පැමිණි අතර යුරෝපීය පාර්ලිමේන්තුවේ දකුණු ආසියා රාජ්‍යතාන්ත්‍රික දූත ගමන 2017 ඔක්තෝබර් මාසයේ සිදු විය. ශ්‍රී ලංකාව GSP+ භාගත කරමින් ශ්‍රී ලංකාව අත් කර ගෙන ඇති ප්‍රගතිය විමසා බැලීම සහ තවමත් තිබෙන අභියෝග සම්බන්ධව ශ්‍රී ලංකාව සමඟ වන සංවාදය තවදුරටත් වර්ධනය කිරීම පිළිබඳව මෙම චාරිකාවේ දී අවධානය යොමු විය. 2018 ජූනි මාසයේදී, හදිසි ගංවතුර සහනාධාර වශයෙන් යුරෝපීය මානුෂීය ආධාර හා සිවිල් රැකීම් සංවිධානය (ECHO), යූරෝ 300, 000ක මුදල් ප්‍රදානයක් ශ්‍රී ලංකා රතු කුරුස සංගමය හරහා ලබා දුණි.

- ගරු ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ රජ්‍ය ඇමති සුජීව සේනසිංහ මැතිතුමා 2018 මැයි 16 වන දින ලක්සම්බර්ග් හිදී යුරෝපීය ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා හමු වී යුරෝපීය ආයෝජන බැංකුවෙන් අර මුදල් සපයනු ලබන කොළඹ අප ජලය කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡා කරන ලදී.

- 'ශ්‍රී ලංකා මිතුරන් සංවිධානය' 2019 ජනවාරියෙදී යුරෝපීය පාර්ලිමේන්තුවේ වාර්තා කිරීම සම්බන්ධ වැඩකටයුතු සුදානම් කිරීම අංශය විසින් භාර ගන්නා ලදී.

V. **<u>LTTE සංවිධානය යුරෝපීය සංගමය තුළ ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස ලැයිස්තුගත කිරීමේ අඛණ්ඩ වෑයම.</u>**

- යුරෝපයේ සාමාන්‍ය අධිකරණය හා සාධාරණාත්වය පිළිබඳ අධිකරණය විසින් ලබා දුන් තීන්දු නොතකා යුරෝපියානු කවුන්සලය හා එහි සාමාජික රාජ්‍යයන් විසින් ශ්‍රී ලංකාවේ ඉහළ මට්ටමින් මැදිහත් වීම හා ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කිරීම මත මාර්තු මාසයේදී යුරෝපියානු රෙගුලාසි EU 2580/2001 අනුව LTTE සංවිධානය ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස තවදුරටත් සිටිය යුතු බවට නොසැලෙන ස්ථාවරයක් ගන්නා ලදී.

- මේ තීරණය 2018 ජූලි මාසයේදී තවදුරටත් දීර්ඝ කරන ලද අතර ඒකකය විසින් අඛණ්ඩව LTTE ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස ලැයිස්තු ගත කිරීමට අදාළ පාර්ශ්වයන් සමඟ සම්බන්ධීකරණයෙන් හා ජනාධිපති ලේකම්ගේ මග පෙන්වීම අනුව යුරෝපා සංගමයට හා එහි සාමාජික රාජ්‍යයන්ට ඉදිරිපත් කිරීම සඳහා තොරතුරු රැස් කිරීම එම අදාළ රටවල ශ්‍රී ලංකා තානාපති කාර්යාල හරහා සිදු කරන ලදී.

- බුද්ධි ආයතන හා අදාළ පාර්ශ්වකරුවන් සමඟ කටයුතු සම්බන්ධීකරණයෙන් LTTE සංවිධානය විසින් අඛණ්ඩව එල්ල කරනු ලබන තර්ජනය පිළිබඳ වූ යාවත්කාලීන තොරතුරු රැගත් ලිපි ලේඛන රැසක්, තවදුරටත් අඛණ්ඩව LTTE සංවිධානය ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස යුරෝපා සංගමය තුළ ලැයිස්තු ගත කර තබා ගැනීම සඳහා 2018 නොවැම්බර් මස 14 වන දින ඉදිරිපත් කරන ලදී. මෙය යුරෝපීය සංගමයේ රටවල් තුළ පවතින තානාපති කාර්යාල හරහා තවදුරටත් සිදු කරගෙන යනු ලැබේ.

- ත්‍රස්තවාදීන්ට එරෙහිව සහය සඳහා සීමා කිරීමේ ක්‍රමෝපායන් පිළිබඳ යුරෝපා සංගමයේ කාර්ය පාර්ශ්වය (COMET) 2018 දෙසැම්බර් මස 04 දින පැවති ඔවුන්ගේ අවසාන සමාලෝචනය රැස්වීමේදී වර්තමාන ලැයිස්තුව යාවත්කාලීන කළ අතර එයට LTTE සංවිධානය ද ඇතුළු කරන ලදී. යුරෝපා සංගමයේ විදේශ කටයුතු කවුන්සලය 2019 ජනවාරි මස අග හෝ පෙබරවාරි මස මුල මේ සම්බන්ධව විධිමත් තීරණයක් ගැනීමට අපේක්ෂා කරයි.

- ශ්‍රී ලංකා රජය යුරෝපා සංගමයේ කාලානුරූප සමාලෝචනයට පහසුකම් සැලසීම සඳහා අඛණ්ඩව LTTE සංවිධානය විසින් සිදු කරන අඛණ්ඩ තර්ජනය සම්බන්ධව තොරතුරු ලබා දෙයි.

2. **<u>පොදු රාජ්‍ය මණ්ඩලය</u>**

අප්‍රේල් මස ලන්ඩනයේදී පැවැති පොදු රාජ්‍ය මණ්ඩල රාජ්‍ය නායක සමළුවේ ක්‍රියාකාරී සහභාගිත්වය ඇතුළුව ශ්‍රී ලංකාව පොදු රාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාල සහ සාමාජික රාජ්‍යයන් අතර සමීප සම්බන්ධතාව 2018 තුළදී ද අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

ශ්‍රී ලංකා රජය පොදු රාජ්‍ය මණ්ඩලය හරහා සිදු කරන කර්තව්‍යන් අතර අන්තර් පොදු රාජ්‍ය මණ්ඩල වෙළඳාම, සයිබර් ආරක්ෂාව, කඩොලාන නැවත වගා කිරීම, තිරසර සාගර භාවිතය හා වෙනත් දෑය.

අමාත්‍යාංශය විසින් මාල්බරෝ හමුව හා ලන්ඩන් පිහිටි විදේශ හා පොදු රාජ්‍ය මණ්ඩල කාර්යාලයේ පැවැත්වෙන සියලුම පොදු රාජ්‍ය මණ්ඩල කාර්යයන් සඳහා ක්‍රියාකාරී ලෙස සහභාගි වීමට පොදු රාජ්‍ය මණ්ඩලය හා විදේශ කටයුතු අමාත්‍යාංශය අතර සම්බන්ධතාව ඇති කරන ප්‍රධාන සම්බන්ධීකරණ කාර්යාලය ලෙස කටයුතු කරන ලන්ඩන් හි පිහිටි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලයට විදේශ කටයුතු අමාත්‍යාංශය සහයෝගය දක්වයි.

1. **<u>පොදු රාජ්‍ය මණ්ඩල රැස්වීම් / අංග සඳහා ශ්‍රී ලංකාවට සහභාගි වීමේදී පහසුකම් සැලසීම</u>**

- පහත දැක්වෙන පොදු රාජ්‍ය මණ්ඩල රැස්වීම් සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීමේදී මෙම ඒකකය විසින් අවශ්‍ය සංක්ෂිප්ත විස්තර හා පහසුකම් සැපයීම සිදු කරයි.

- 2018 අප්‍රේල් 19 - 20 දක්වා "පොදු අනාගතයක් දක්වා'' යන තේමාව යටතේ පොදු රාජ්‍ය මණ්ඩල රාජ්‍ය නායක රැස්වීම (CHOGM) ලන්ඩනයේදී පවත්වන ලදී. චෝගම් සමුළුව සඳහා රාජ්‍ය තාන්ත්‍රිකයන් අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහභාගි වූ අතර ජනාධිපතිතුමාන් තිරසාර සංවර්ධනයක් ඇති කිරීම සඳහා ව්‍යාපාර, සංවිධාන හා රාජ්‍යයන් ඒකාබද්ධ කිරීමේ හා තේමාව යටතේ පොදු රාජ්‍ය මණ්ඩල ව්‍යාපාරික සමුළුවේ ප්‍රධාන කථිකයා ලෙස ඊට සහභාගි වන ලදී.

  2018 චෝගම් සමුළුව පවත්වන අතරතුර 'පොදු රාජ්‍ය මණ්ඩල නීල ප්‍රඥප්තිය යන ලේඛනය මඟින් කඩොලාන නැවත වගාව සඳහා පොදු රාජ්‍ය මණ්ඩල නිල ප්‍රඥප්ති ක්‍රියාකාරී කණ්ඩයම් ශූරතා ප්‍රධානය කරන ලදී. 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සමුළු (CBF) වාර්තාගත ශ්‍රී ලාංකික සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික රාජ්‍යතාන්ත්‍රිකයන්ගේ සහභාගිත්වයෙන් පොදු රාජ්‍ය මණ්ඩල නායක සමුළුවට සමගාමිව පැවැත්විණි. තොරතුරු තාක්ෂණය / ව්‍යාපාරික ක්‍රියාවලිය බැහැරින් ගැනීම / ඉලෙක්ට්‍රොනික, ඇගළුම්, අත්කම්, පොල්, සංචාරක, මැණික් හා ස්වර්ණාභරණ, සමුද්‍රීය හා බෝට්ටු තැනීම යන අංශයන් නියෝජනය කරමින් 40 කට වැඩි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් පිරිසක් මෙම සමුළු සහභාගී වුහ. පොදු රාජ්‍ය මණ්ඩල ව්‍යාපාරික සමුළුවේ ශ්‍රී ලාංකික රාජ්‍යතාන්ත්‍රිකයන්ට නායක්තවය ලබා දුන් ගරු රිෂාඩ් බදුර්දීන් මහතා සුළු හා මධ්‍ය පරිමාණ සමුළුවේ කණ්ඩායම් සාමාජිකයෙකු ලෙස සහභාගි විය. මෙයට අමතරව 170 ක් පමණ වූ පොදු රාජ්‍ය මණ්ඩල ව්‍යවසායකින්, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ වෘත්තිකයන්ට ශ්‍රී ලංකාවේ තොරතුරු සන්නිවේදන තාක්ෂණය / BPM, සමුද්‍රීය ක්ෂේත්‍රය, බෝට්ටු තැනීම, මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ පවතින අවස්ථා පෙන්වා දීම සඳහා ශ්‍රී ලංකාවේදී උදැසන ආහාර ගන්නා අතරතුර පවත්වනු ලබන රැස්වීම සඳහා ආරාධනා කරන ලදී.

මෙම රැස්වීමේ ප්‍රධානම අංග ලක්ෂණය වුයේ 'කුසලතා පූර්ණ දිවයනකි' මැයෙන් ලන්ඩනයේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සඳහා ජාතික සන්නාමයක් දියත් කිරීමයි.

පහත පොදු රාජ්‍ය මණ්ඩල රාජ්‍ය නායක සමුළුවේ ප්‍රතිඵල ලෙස එළි දක්වන ලේඛන පිළියෙළ කිරීම සඳහා පොදු රාජ්‍ය මණ්ඩල රාජ්‍ය නායක රැස්වීමට කලින් පොදු රාජ්‍ය මණ්ඩලයේ ඉහළ නිලධාරීන්ගේ සමුළුව හා පොදු රාජ්‍ය මණ්ඩලයේ විදේශ අමාත්‍යතුමන්ගේ රැස්වීම පැවැති අතර ඊට පිළිවෙළින් ඉහළ නිලධාරීන් සහ විදේශ කටයුතු අමාත්‍යවරයා සහභාගී වන ලදී.
නිල නිවේදනය සහ ප්‍රකාශන 4 නම් වශයෙන්

I. පොදු රාජ්‍ය මණ්ඩල නීල ප්‍රඥප්තිය
II. පොදු රාජ්‍ය මණ්ඩල සයිබර් ප්‍රකාශනය
III. පොදු රාජ්‍ය මණ්ඩලයේ වෙළඳාම හා ආයෝජන සම්බන්ධතා න්‍යාය පත්‍ර ප්‍රකාශනය
IV. සාමාජික රටවල්වල මැතිවරණ නිරීක්ෂණය සඳහා පොදු රාජ්‍ය මණ්ඩලයීය සංශෝධිත මර්ගෝපදේශ

- පොදු රාජ්‍ය මණ්ඩලයේ මහලේකම්වරයා පත් කිරීමේ නිර්ණායක ඇතුළු පොදු රාජ්‍ය මණ්ඩල පාලන ව්‍යුහයේ සමාලෝචනය පිළිබඳ වැදගත් සාකච්ඡාවක් ලෙස 2018 සැප්තැම්බර් මස 27 දින නිව්යෝර්ක් හිදී පැවැති 18 වන විදේශ අමාත්‍යවරුන්ගේ රැස්වීමට ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා සහභාගී විය.

- ශ්‍රී ලංකාවේ රේඛීය අමාත්‍යාංශ සම්බන්ධීකරණයෙන්

- 2018 පෙබරවාරි 19 - 23 දක්වා ෆිජි හිදි පැවති පොදු රාජ්‍ය මණ්ඩල අධ්‍යාපන ඇමතිවරුන්ගේ 2 වන සමුළුව
- 2018 අප්‍රේල් 2 - 3 දක්වා ඕස්ට්‍රේලියාවේ ගෝල්ඩ් කෝස්ට්හි පැවැති පොදු රාජ්‍ය මණ්ඩල ක්‍රීඩා අමාත්‍යවරුන්ගේ 9 වන සමුළුව
- 2018 මැයි 20 දින ජිනීවා හිදි පැවැති පොදු රාජ්‍ය මණ්ඩල සෞඛ්‍ය අමාත්‍යවරුන්ගේ රැස්වීම
- 2018 පෙබරවාරි මස එක්සත් රාජධානියේ පාර්ලිමේන්තු සංවිධානය විසින් සංවිධානය කරන ලද පුහුණු වැඩසටහනට සහභාගි වීම සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් කමිටුවේ සාමාජිකයන්ගේ චාරිකාව
- ලන්ඩන් හි පොදු රාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාලයේදී 2019 ජනවාරි මස 24 දින පැවැති අධ්‍යාපන අමාත්‍යවරුන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම සඳහා සහභාගි වන ලදී.

- ප්‍රජාතාන්ත්‍රවාදී වැඩසටහන යටතේ පොදු රාජ්‍ය මණ්ඩල වටිනාකම් හා ප්‍රතිපත්තිවලට අනුගත වීමට පොදු රාජ්‍ය මණ්ඩල සාමාජික රටවලට සහය වීම සඳහා පොදු රාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාලයෙන් ලැබෙන සහයේ අදාළ බව, කාර්ය මණ්ඩලයේ ඵලදායිතාව, බලපෑම සහ තිරසාර බව ඇගයීම සඳහා පොදු රාජ්‍ය මණ්ඩලයේ ඇගයීම් කණ්ඩායම සමඟ ස්වාධීන ඇගයුම්කරුවෙකු 2018 ජූනි 12 - 15 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරය කරන ලදී. මේ කර්තව්‍යය සඳහා, අගවිනිසුරු කාර්යාලය, නීතිපති දෙපාර්තමේන්තුව, පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා, ව්‍යවස්ථාදායක සභාවේ අතිරේක ලේකම්වරයා, ජාතික එකබද්ධතා හා සංහිඳියා අමාත්‍යාංශයේ ලේකම්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ සභාපතිවරයා, මැතිවරණ කොමිසමේ සහකාර කොමසාරිස්වරයා හා රාජ්‍ය නොවන සංවිධාන පාර්ශ්වකරුවන් හමුවිය. මෙම කණ්ඩායම 2018 ජූනි මස 14 වන දින පොදු රාජ්‍ය මණ්ඩල අධ්‍යක්ෂ ජනරාල්වරයා ඇගයීමේ කොටසක් ලෙස හමුවන ලදී.

ii. **<u>පොදු රාජ්‍ය මණ්ඩල මහලේකම්වරයා සමඟ රැස්වීම්</u>**

- ගරු අග්‍රාමාත්‍යතුමා පොදු රාජ්‍ය මණ්ඩල මහ ලේකම්වරයා 2018 ජූනි මස 15 වන දින ලන්ඩනයේදී හමු වූ අතර අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් වන ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳ සාකච්ඡා කරන ලදී.
- 2016 ධුරයේ රාජකාරී ඇරඹීමෙන් අනතුරුව පොදු රාජ්‍ය මණ්ඩල මහලේකම්වරිය සිය කුළුදුල් සංචාරය සඳහා 2018 අගෝස්තු 04 වන දින ශ්‍රී ලංකාවට පැමිණෙන ලදී. එහිදී ගරු අග්‍රාමාත්‍යතුමා, කථානායකතුමා, විපක්ෂ නායකතුමා, විදේශ, ක්‍රීඩා, අධ්‍යාපන, යෞවන කටයුතු නීතිය හා සාමය, අන්තර්ජාතික වෙළඳාම යන අමාත්‍යවරුන් මුණ ගැසුණු අතර පරිසරය, දේශගුණ වෙනස්වීම් සහ සමුද්‍රීය සම්පත්වලට අදාළ සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් පරිසර අමාත්‍යාංශයේ දී වැදගත් සාකච්ඡාවකටද ඇය සහභාගි වුවාය. මහලේකම්වරිය කල්පිටිය හා ප්‍රදේශවල කඩොලාන නැවත වගා කරන ප්‍රදේශයේ සංචාරය කරන ලද අතර කඩොලාන නැවත වගා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති උත්සාහය ඇය අගය කළාය.
- එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනයෙහි 73 වන සැසිවාරය නිව්යෝර්ක් හි පැවැත්වෙන අවස්ථාවේ සැප්තැම්බර් 28 වන දින අතගරු ජනාධිපතිතුමා පොදු රාජ්‍ය මණ්ඩල මහලේකම්වරිය හමුවිය. මහලේකම්වරිය ප්‍රජාතන්ත්‍රවාදය සහ සංහිඳියාව ශක්තිමත් කිරීමේදී ශ්‍රී ලංකාවේ ප්‍රගතිය පැසසුමට ලක් කළ අතර 2018 අගෝස්තු මාසයේ ඇය ශ්‍රී ලංකාවේ සංචාරය තුළ දී දැකීමට සමත් වූ රටේ සියලුම අංශයන්හි ධනාත්මක සංවර්ධනය පිළිබඳ ඇය ජනාධිපතිතුමන්ට තම සුභ පැතුම් එක් කළේය.

iii. **<u>රැපිණාගේ පොදු රාජ්‍ය මණ්ඩල ආවරණ ක්‍රියාකාරකම</u>**

අතිගරු ජනාධිපතිතුමා විසින් එළිසෙබෙත් රැපිනට ඇගේ පොදු රාජ්‍ය මණ්ඩල ආවරණයට සහය පළකරමින් ලියන ලද ලිපියේ ප්‍රතිඥා දුන් පරිදි රැපිණාගේ පොදු රාජ්‍ය මණ්ඩල ආවරණ ක්‍රියාකාරකම සඳහා පරිසර අමාත්‍යාංශය සමඟ එක් වී වන රක්ෂිත හඳුනා ගැනීමේ යෙදුණු අතර ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා කටයුතු සම්පාදනය කරන ලදී. මේ සඳහා පරිසර අමාත්‍යාංශය ගැටුම් සහ ස්වාභාවික ආපදාවක් වන නියඟය නිසා අත්හැර දමන ලද හෙක්ටයාර 10 ක වන රක්ෂිතයන් නැවත වගා කිරීම සඳහා තෝරා ගන්නා ලදී. ප්‍රදේශයේ ප්‍රජාව සහ සත්ත්ව විශේෂ සඳහා ශක්‍යතාවයෙන් යුතු පරිසර පද්ධතියක් ලෙස ස්වභාවික වනයත් බවට නැවත පත් කිරීම ව්‍යාපෘතියේ අරමුණ විය.

- පොදු රාජ්‍ය මණ්ඩල මහලේකම්වරිය මෙම ව්‍යාපෘතිය අගය කළ අතර ප්‍රදේශයේ ජනයාට ස්පෘෂ්‍ය ලෙස දැනෙන ප්‍රතිඵල සහිත විනාශ වූ ප්‍රදේශයක් නැවත ප්‍රතිස්ථාපනය කිරීම සඳහා අවධානය යොමු කර ඇති රැපිණාගේ පොදු රාජ්‍ය මණ්ඩල ආවරණ ක්‍රියාකාරකම් යටතේ දරනු ලබන සුවිශේෂී උත්සහයක් ලෙස එය හඳුනා ගන්නා ලදී.

iv. **<u>පොදු රාජ්‍ය මණ්ඩලය සමඟ දැනට පවත්වාගෙන යන සහයෝගීතාව</u>**

- මෙම වර්ෂයේදී ලන්ඩනයේ සංචාරය කරන ලද රාජ්‍ය තාන්ත්‍රිකයන් විසින් සිදු කළ ඉල්ලීම් පරිදි පොදු රාජ්‍ය මණ්ඩල මහ ලේකම් කාර්යාලය ශ්‍රී ලංකාවේ විද්‍යුත් වාණිජ ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා තාක්ෂණික සහය ලබා දීමේ හැකියාව සහ ශ්‍රී ලංකාවේ නීති ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ගේ හැකියාව පිළිබඳ සොයා බලනු ලැබේ.

- ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනය සඳහා සහ යහපත් පරිචයන් පුළුල් ලෙස පොදු රාජ්‍ය තුළ බෙදා ගැනීමේ අරමුණින් යුතුව අමාත්‍යාංශ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය ඇතිව අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා පොදු රාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාලයේ සහයෝගයෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි.

v. **<u>පොදු රාජ්‍ය මණ්ඩල ඇබෑර්තු සඳහා නාමයෝජනා කිරීම</u>**

අමාත්‍යාංශය අධිකරණය අමාත්‍යාංශය, නීතිපති දෙපාර්තමේන්තුව හා ලන්ඩන් හි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලයේ සහයෝගය ඇතිව ජනාධිපති නීතිඥ, නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජෙනරාල් නිල් උනම්බුව මහතා පොදු රාජ්‍ය මණ්ඩලය ලේකම් කාර්යාලයේ තීරණාත්මක විනිශ්චයාධිකාරයේ සභාපතිවරයා සහ සාමාජිකයෙකු ලෙස පත් කිරීමට නාම යෝජනා ඉදිරිපත් කරන ලදී.

3. **<u>බහුපාර්ශ්වික ගිවිසුම්</u>**

රටේ විනිවිදභාවය සහ සියලුම ප්‍රජා ඇතුළත් කර ගැනීම පිළිබඳ රජයේ ප්‍රතිපත්තියට අනුව එක්සත් ජාතීන්ගේ අංශයේ සහයෝගය ඇතිව මෙම අංශය පහත මහජන උපදේශන සංවිධානය කරන ලදී.

- 2017 නොවැම්බර් මසයේ පිනීවා මානව හිමිකම් කොමිසමේදී නිකුත් කරන ලද ශ්‍රී ලංකාවේ සර්වජන කාලීන සමාලෝචනය සඳහා ලැබුණු නිර්දේශ සඳහා මධ්‍ය කාලීන සමාලෝචන සම්බන්ධයෙන් මහජන උපදේශනයක් 2018 අගෝස්තු මස 23 වන දින පවත්වන ලදී.

- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්බන්ධ අන්තර්ජාතික සම්මුතිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් කෙටුම්පත් කළ වාර්තාව සම්බන්ධව 2018 සැප්තැම්බර් මස 13 වන දින මහජන උපදේශනයක් පවත්වන ලදී.

ii. අබාධ සහිත වුවන්ගේ අන්තර්ජාතික සම්මුතිය ශ්‍රී ලංකාව තුළ ජාතික වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා ආබාධ සහිත වුවන්ගේ අයිතිවාසිකම් සම්බන්ධ කමිටුවට ශ්‍රී ලංකාවෙන් සම්පාදනය කළ යුතු වාර්තාව සම්පාදනය කිරීම සඳහා පාර්ශවකරුවන් සමග සිදු කරනු ලබන කටයුතු.

4. **<u>ජාතික මානව අයිතිවාසිකම් කාර්ය සැලැස්ම 2017.02.21</u>**

කාර්ය සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කාලීන ප්‍රගතිය තහවුරු කිරීම සහ එය අන්තර් අමාත්‍ය කමිටුවට වාර්තා කිරීම සඳහා ජාතික මානව අයිතිවාසිකම් කාර්ය සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ස්ථර දෙකක යාන්ත්‍රණ මඟින් සමාලෝචනය කරමින් පවතින අතර එය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇත. i. අග්‍රාමාත්‍යවරයා ප්‍රධානත්වය දරණ අන්තර් අමාත්‍ය කමිටුව, ii. අග්‍රාමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලවල ප්‍රධානීන් යටතේ නිලධාරී කමිටුව.

- ජාතික මානව අයිතිවාසිකම් කාර්ය සැලැස්ම ආංශික පාර්ශ්ව 10 ක් යටතේ ක්‍රියාත්මක වන අතර එම සෑම එකක්ම අදාල අමාත්‍යාංශයේ ලේකම්වරයා ප්‍රධානත්වය දරයි. එම සෑම ආංශික කමිටුවක්ම අදාළ නියෝජිතායතන සමග මාසික රැස්වීම් පවත්වන අතර කෙටි කාලීන මධ්‍යකාලීන හා දිගු කාලීන ඉලක්ක සපුරා ගැනීමේදී මුහුණ දෙන අභියෝග හා ඇති ප්‍රගතිය පිළිබඳ ඉහත කමිටුවලට වාර්තා කරයි.

- ක්‍රියාකාරී ලකුණු ක්‍රියාත්මක කිරීමේදී ප්‍රගතියක් තිබෙන බව තහවුරු කිරීම සඳහා යුරෝපා සංගම් ඒකකය එක්සත් ජාතීන්ගේ ඒකකය සමඟ සම්බන්ධීකරණයෙන් මෙම පර්ශද රැස්වීම් සඳහා සහභාගි වූ අතර සුදුසු ලෙස ඒ සඳහා මැදිහත් විය.

මුදල් අංශය

මුදල් අංශය

ශීර්ෂ : 112

විදේශ කටයුතු අමාත්‍යාංශය

අමාත්‍යාංශයේ සංවර්ධන කටයුතු පිළිබඳ කළමණාකරණය සහ මූල්‍ය සැලසුම්කරණය සඳහා සහය සේවාවන් සපයා දීමේ වගකීම මුදල් අංශය වෙත පැවරේ. එම අංශය, අමාත්‍යාංශයේ සහ විදේශීය දූත මණ්ඩල/දූත කාර්යාල මුදල් ගනුදෙනුවලට අදාළව ගිණුම් වර්ග දෙකක් පවත්වාගෙන යන අතර ඒවා සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයට වාර්තා කළ යුතු ය.

ප්‍රධාන කාර්යයන්

- අවශ්‍ය මූල්‍යමය වගකීම් ඉටු කිරීම සඳහා අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වන විදේශ කටයුතු ලේකම්ට සහාය වීම.
- වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම, අයවැය සාකච්ඡා වලට සහභාගී වීම සහ ඒවා සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම.
- මෙහෙයුම් කටයුතු හා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පවතින මූල්‍ය සම්පත්වලට අනුකූල වන ලෙස සහ රාජ්‍ය වගවීම තහවුරු වන අන්දමෙන් මූල්‍ය සැලසුම් සකස් කිරීම.
- වියදම් පියවීම සඳහා වූ අක්මුදල්, අමාත්‍යාංශයේ කටයුතු රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල / කාර්යාල සඳහා ක්‍රමවත් පදනමෙන් වෙන් කොට වියදම් කිරීම.
- අමාත්‍යාංශයේ සහ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල / කාර්යාලවල සමස්ත ගෙවීම් සහ ඒවායේ වාර්තාකරණ කටයුතු මුදල් රෙගුලාසි හා අනෙකුත් ව්‍යවස්ථාමය අවශ්‍යතාවලට අනුකූලව සිදු කෙරෙන බව තහවුරු කරමින් සම්පූර්ණ මූල්‍ය වාර්තාකරණය පාලනය කිරීම.
- විගණන විමසුම්, විගණන වාර්තා සහ අනෙකුත් අනාවරණ සම්බන්ධයෙන් , විගණකාධිපති දෙපාර්තමේන්තුව සමඟ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

මුදල් අංශයේ අනු අංශ පහත දැක්වේ.

- අමාත්‍යාංශ ගෙවීම් ඒකකය
- අයවැය පාලන ඒකකය
- දූත මණ්ඩල ඒකක

112-විදේශ කටයුතු අමාත්‍යාංශය				
1)2017 වසරේ ප්‍රතිපාදන අනුව වියදම පහත පරිදි වේ. අ)පුනරාවර්තන:-				
	විස්තරය	2018.12.31 දිනට මුළු ප්‍රතිපාදන	2018.12.31 දිනට මුළු වියදම	ප්‍රතිපාදන මත වියදම් ප්‍රතිශතය
		රු	රු	%
	පුද්ගලික පඩිනඩි	6,454,197,450	6,452,857,210	100
	වෙනත් පුනරාවර්තන	4,723,866,050	4,687,798,515	99
	එකතුව	**11,178,063,500**	**11,140,655,725**	**100**
(ආඅ)				
විෂයය	විස්තරය	2018.12.31 දිනට මුළු ප්‍රතිපාදන	2018.12.31 දිනට මුළු වියදම	ප්‍රතිපාදන මත වියදම් ප්‍රතිශතය
		ඣ	ඣ	%
	ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම			
2001	ගොඩනැගිලි සහ ව්‍යුහයන්	519,782,100	244,189,622	47
2002	පිරියත, යන්ත්‍ර හා උපකරණ	13,400,000	2,361,673	18
2003	මෝටර් රථ	43,689,350	23,074,431	53
	ප්‍රාග්ධන වත්කම් අත්කර ගැනීම			
2101	මෝටර් රථ	96,779,700	95,156,848	98
2102	ලී බඩු හා කාර්යාල උපකරණ	96,109,750	96,008,470	100
2103	පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	44,139,875	42,983,232	97
2104	ගොඩනැගිලි සහ ව්‍යුහයන්	734,300,000	734,277,546	100
2105	ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම්			
2106	මෘදුකාංග සංවර්ධනය			
	ප්‍රාග්ධන හුවමාරු කිරීම්			
2201(01)	ජාත්‍යන්තර සම්බන්ධතා සහ උපායමාර්ගික අධ්‍යයන සඳහා ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය(LKIIRSS)	8,990,400	7,256,869	81
2201(02)	ජාතික සාගර කටයුතු කමිටු ලේකම් කාර්යාලය(NOAC)	2,229,050	2,229,040	100
	ධාරිතා සංවර්ධනය			
2401	කාර්ය මණ්ඩල පුහුණුව	5,678,290	5,678,290	100
	වෙනත් ප්‍රාග්ධන වියදම්			
2509	ඉන්දියානු සාගර වටදේදර සංගමයේ ක්‍රියාකාරී කණ්ඩායම් සමුළුවට අදාළ ඕස්ට්‍රේලියානු රජයෙන් ලැබුණු ප්‍රදානය	5,576,000	5,337,884	96

	මූල්‍ය කේතය (13)			
1-2509	ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය පිළිබඳ මූලික පියවර ගැනීම(EDI)	79,846,485	36,398,635	46
	එකතුව	**1,650,521,000**	**1,294,952,540**	**78**
සම්පූර්ණ එකතුව ((අ) +(ආ))		**12,828,584,500**	**12,435,608,265**	**97**
(2) අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් නියමිත සීමාවන් අනුව තථ්‍ය වියදම				**(රු.)**
විස්තරය		**උපරිම හර**	**අවම බැර**	**උපරිම හර ශේෂය**
නියමිත සීමාව		35,000,000	25,000,000	130,000,000
1120011-31.12.2018 දක්වා තථ්‍ය ප්‍රමාණය		34,942,177	35,955,484	116,775,476
(3)ආදායම				
(අ)අමාත්‍යාංශය-				
			රු.	
	විස්තරය	**ආදායම් කේතය**	**2018.12.31 දක්වා තථ්‍ය ප්‍රමාණය**	
	රජයේ ගොඩනැගිලි සහ නිවාස සඳහා කුලී	2002-01-01	2,040,171	
	වෙනත් පොළී	2002-02-99	3,350,502	
	විදේශ ගමන් බලපත්‍ර,වීසා සහ ද්විත්ව පුරවැසිභාවය පිළිබඳ ගාස්තු	2003-02-07	12,500	
	කොන්සියුලර් ගාස්තු	2003-02-99	247,120,776	
	වෙනත් ලැබීම්	2003-99-00	135,904,663	
	සමාජ ආරක්ෂණ දායකත්වයන්-(මධ්‍යම රජය)	2004-01-00	13,458,521	
	ප්‍රාග්ධන වාහන විකිණීම	2006-02-01	10,022,720	
	එකතුව		**411,909,853**	
(ආ) විදේශීය දූත මණ්ඩල:-				
			රු.	
	විස්තරය	**ආදායම් කේතය**	**2018.12.31 දක්වා තථ්‍ය ප්‍රමාණය**	
	රජයේ ගොඩනැගිලි සහ නිවාස සඳහා කුලී	2002-01-01	581,342	
	වෙනත් වියදම්	2002-02-99	2,292,832	
	විදේශ ගමන් බලපත්‍ර,වීසා සහ ද්විත්ව පුරවැසිභාවය පිළිබඳ ගාස්තු	2003-02-07	1,369,685,730	
	විභාග සහ අනෙකුත් ගාස්තු	2003-02-13	15,429	
	මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුව	2003-02-14		

			737,666	
	කොන්සියුලර් ගාස්තු	2003-02-99	431,289,676	
	වෙනත් ලැබීම්	2003-99-00	154,096,411	
	සමාජ ආරක්ෂණ දායකත්වයන්- (මධ්‍යම රජය)	2004-01-00	13,267,142	
	සමාජ ආරක්ෂණ දායකත්වයන්- (පළාත් සභා)	2004-02-00	711,505	
	ප්‍රාග්ධන වත්කම් විකිණීම (මෝටර් රථ)	2006-02-01	1,934,999	
	ප්‍රාග්ධන වත්කම් විකිණීම (වෙනත්)	2006-02-02	3,154,559	
	එකතුව		**1,977,767,291**	
	සම්පූර්ණ එකතුව ((අ) +(ආ))		**2,389,677,144**	
14.02.2019				

සාමාන්‍ය පාලන අංශය

සාමාන්‍ය පාලන අංශය

අ. හැඳින්වීම

1. අමාත්‍යාංශයේ ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කර ඇති මෙම අංශය, අමාත්‍යාංශයේ ඉලක්ක සපුරා ගැනීම පිණිස මානව සම්පත් උපයෝජන ක්‍රියාදාමය මෙහෙයවීමේ කේන්ද්‍රීය ක්‍රියාකාරකය වේ. මානව සම්පත් කළමණාකරණය, පාර්ලිමේන්තු ප්‍රශ්න, අමාත්‍ය මණ්ඩල සංදේශ, සැපයුම් සේවා, ගොඩනැගිලි සහ උපකරණ නඩත්තුව, ප්‍රසම්පාදනය, ප්‍රවාහන, සන්නිවේදන පහසුකම්, ධාරිතා සංවර්ධන වැඩ සටහන්, සීමා වාසික පුහුණු අවස්ථා ලබාදීම තුළින් කොටස්කාර පාර්ශ්වයන්ට පහසුකම් සැලසීම සහ අමාත්‍යාංශයේ එකිනෙකට බැඳී පවතින අනෙකුත් සියළුම ක්‍රියාකාරකම්වලට අදාළව ක්‍රියාත්මක කෙරෙන්නා වූ වගකීම් මෙම අංශයට පැවරී ඇත.

ආ) මානව සම්පත් කළමණාකරණය

2. මානව සම්පත් කළමණාකරණයට අදාළව, 2018 වර්ෂයෙ දී, ස්වකීය භාෂා නිපුණත්වය, තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කර ගැනීම පිණිස විවිධ ශ්‍රේණිවල සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ට (ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන් හැර) පුහුණුවීමේ අවස්ථා සැලසීම මඟින් අපේක්ෂිත කාර්ය සාධනය සහ පවත්නා කාර්ය සාධනය අතර ඇති හිඩැස අවම කිරීමට සාමාන්‍ය පාලන අංශය විසින් පහසුකම් සැලසිණ.

දෙමළ භාෂාවෙහි භාෂා නිපුණත්වය වර්ධනය කිරීමේ අරමුණින්, මුදල් අමාත්‍යාංශය යටතේ ගැණෙන මිලෝදා ආයතනයේදී කේවල පුහුණු පාඨමාලා හැදෑරීමේ අවස්ථාව නිලධාරීන් 11 දෙනෙකුට උදා කර දෙන ලදී. මෙයට අමතරව, සෙනසුරාදා දිනවල නිශ්චිත පංති පැවැත්වීම මඟින් රියැදුරන් හා කා.කා.සේ. 33 දෙනෙකුට දෙමළ භාෂා ව්‍යක්තභාවය සපුරා ගැනීම පිණිස පහසුකම් සැලසිණ.

දැනට පවත්නා කාර්ය මණ්ඩල හිඟය මැඩලීමේ පියවරක් ලෙස, සංවර්ධන නිලධාරීන් 7ක සේවක සංඛ්‍යාවෙහි ඇති පුරප්පාඩු පිරවීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හරහා කටයුතු කෙරිණ. මෙයට අමතරව, අමාත්‍යාංශයේ පවතින අධිකතර කාර්යාලීය කටයුතු සමනය කර ගැනීම සඳහා ඉංග්‍රීසි/දෙමළ/සිංහළ පරිවර්තකයින්ගේ හිඟය අවම කර ගැනීම පිණිස පරිවර්තයින් සිවු දෙනෙකු බඳවා ගන්නා ලදී.

මෙයට අමතරව, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ සහාය ඇතිව, ලිංගික හිංසනය යන සංකල්පය මත සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ සහභගිත්වයෙන් විවිධ අදියරවල වැඩ මුළු 5 ක් පවත්වන ලදී.

ඈ. නඩත්තු කටයුතු

බ්‍රිතාන්‍ය පාලන සමයේ ඉදි කරන ලද ශත වර්ෂයකට වඩා පැරණි ගොඩනැගිල්ලක විදේශ කටයුතු අමාත්‍යාංශය ස්ථානගත කර ඇති අතර, ක්‍රමිකව නඩත්තු සහ අළුත්වැඩියාවන් අවශ්‍ය වේ. එසේම, අමත්‍යාංශය යටතේ ගැණෙන ආයතනයන්හි, එනම්, ජාත්‍යන්තර සබඳතා සහ උපායමාර්ගික අධ්‍යයනයන් සඳහා වූ ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය වැනි ආයතනවල 27 ක් පමණ වූ නිලනිවාස සහ ගොඩනැගිලි හොඳ තත්වයෙන් පවත්වා ගෙනයාම සඳහා ක්‍රමික නඩත්තු කටයුතු සිදු කෙරේ.

අමාත්‍යාංශයේ ප්‍රධාන රැස්වීම් ශාලාව විධිමත්ව පවත්වා ගෙන යාම පිණිස, බුරුත දැව ආශ්‍රයෙන් ගෙඹිම සකස්කර, නවීනතම ශබ්ද පාලන පද්ධතියක් සවිකර අලංකාරව සකසා ඇත. ජනරජ ගොඩනැගිල්ලෙහි සාමාන්‍ය නඩත්තු කටයුතුවලට අමතරව, 2018 වර්ෂයෙ ී දී ගෙඹිම සකස් කිරීමෙන් සහ නව ශබ්ද පරිපාලන පද්ධති සවිකිරීමෙන් කුඩා රැස්වීම් ශාලාවෙහි නඩත්තු කටයුතු ද විධිමත් කර ඇත.

ජනරජ ගොඩනැගිල්ලෙහි ප්‍රධාන පිවිසුම ප්‍රතිසංස්කරණයට භාජනය කරමින්, ආරක්ෂක සේවාවන්හි නිරත සේවකයින්ගේ භාවිතය සඳහා රුපියල් 756,000.00 ක පිරිවැයකින් මුර පොලක් තනා ඇත. අමාත්‍යාංශයේ ක්‍රියාකාරිත්ව පරිසරයෙහි සාමාජීය ආරක්ෂාව සහ ජීවන ප්‍රමිතිය වැඩි දියුණුකිරීම පිණිස ගත් හොඳ පරිශ්‍රමයක් ලෙස මෙය හැඳින්විය හැකිය. මෙයට අමතරව, ජනරජ ගොඩනැගිල්ලෙහි පඩිපෙළ ආරක්ෂා කර ගැනීම පිණිස වර්ෂා ආවරණයක්, රුපියල් මිලියන 2.5 ක පිරිවැයකින් සකස් කර ඇත.

අමාත්‍යාංශයේ නවමු ව්‍යාපෘතියක් ලෙස, නවීන කාර්යාලීය පරිසරයකින් හෙබි, අවශ්‍ය තොරතුරු තාක්ෂණ යටිතල සහ මනාව පුහුණුවක් ලත් කාර්ය මණ්ඩලයකින් සමන්විත මාතර ප්‍රදූත කාර්යාලය 2019 ජනවාරි මාසයේදී විවෘත කිරීම සඳහා සැලසුම් ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම කාර්යාලය විවෘත කිරීමත් සමඟම, ප්‍රදූත සේවා ලබා ගැනීම, විදේශගත පුද්ගලයන්ගේ උපත්,විවාහ සහ මරණ සහතික ආදී ලේඛන සහ වෙනත් නෛතික ලේඛන සහතික කිරීම්, එතෙර අසරණාව සිටින්නා වූ පුද්ගලයන්ගේ පවුල්වල සාමාජිකයින්ට සහායවීම්, සංක්‍රමික ශ්‍රමිකයන්ගේ පවුල්වල සහන සහ වන්දි ඉල්ලීම් සඳහා අවශ්‍ය කටයුතු කිරීම සහ එතෙර මියගිය පුද්ගලයින්ගේ මෘත ශරීර ගෙන්වා ගැනීම ආදී කටයුතු ඉටු කර ගැනීම පහසු වනු ඇත.

ඈ. ප්‍රසම්පාදනය සහ තොගපොත් පාලනය

වර්ෂයේ පශ්චිම භාගයේදී, පහසුවෙන් හා ක්‍රමවත්ව ටෙන්ඩර් කටයුතු ඉටුකරමින්, අමාත්‍යාංශයේ අවශ්‍යතාවයන් සැපයීම සඳහා වඩාත් යෝග්‍ය සැපයුම්කරුවන් තෝරා ගැනීමේ බලවත් එහෙත් පහසු ක්‍රියාදාමයක් ලෙස වෙළඳුන් ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදයක් මෙම අංශය විසින් ක්‍රියාත්මක කෙරිණ. මෙයට අමතරව, වසර පුරා එකම මිලකට සැපයුම් ලබා ගැනීමේ අරමුණින්, ලියාපදිංචි කිරීමේ නිර්නායකයන් සංශෝධනය කර ඇත.

මෙයට අමතරව, සෑම වර්ෂයකම ආරම්භයේදී, අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අවශ්‍යතාවයන් පුරෝකථනය කෙරෙන ප්‍රසම්පාදන සැලසුමක් සකස් කර ඇති අතර, එමඟින් 100 කට අධික ප්‍රසම්පාදන ක්‍රියාදාමයන් ක්‍රියාත්මක කෙරේ. මෙම වර්ෂයේදී ගණනය කරන ලද වටිනාකම රුපියල් මිලියන 102 කි.

ඉ. පාර්ලිමේන්තු සහ අමාත්‍ය මණ්ඩල කටයුතු

කැබිනට් අමාත්‍යවරුන් සහ පාර්ලිමේන්තු ප්‍රශ්න ක්‍රියාදාමය සම්බන්ධීකරණය සඳහා මෙම අංශය කේන්ද්‍රීය කාරකයක් ලෙස ක්‍රියා කරයි. මෙම අංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ 51 ක් ඉදිරිපත් කර ඇති අතර, මෙම අමාත්‍යාංශයට යොමු කරන ලද පාර්ලිමේන්තු ප්‍රශ්න 03 කට පිළිතුරු සපයා ඇත. මෙයට අමතරව, වෙනත් අමාත්‍යාංශවල අමාත්‍ය මණ්ඩල සංදේශ සම්බන්ධයෙන් නිරීක්ෂණ ඉදිරිපත් කිරීමට ද නොවළහා කටයුතු කර ඇත.

ඊ. ආනුෂංගික සේවා සහ වෙනත් කටයුතු

අමාත්‍යාංශයේ වාහන සමූහය විධිමත්ව නඩත්තු කිරීමේ වැදගත්කම සැලකිල්ලට ගෙන, අමාත්‍යාංශ වාහන සංචිතයේ වාහන 110 ක නඩත්තු කටයුතු මෙම අංශයට පැවරී ඇත. සියළුම වාහන අළුත්වැඩියාවන්, රක්ෂණ කටයුතු, හිලව් කිරීම් සහ නව වාහන මිළදී ගැනීම් කටයුතු මෙම අංශයෙන් සිදු කෙරේ. මෙයට අමතරව, විදේශීය තානාපතිවරුන්ගේ, මහ කොමසාරිස්වරුන්ගේ අක්තපත්‍ර පිරනැමීම්, රාජ්‍ය නායකයන්, ප්‍රභූවරුන් සහ වෙනත් වැදගතුන්ගේ සම්ප්‍රාප්තවීම් ආදියට අදාල කටයුතු, මෙම අංශය විසින් ඉටු කරන ලදී. 2018 වසර තුළ, අක්තපත්‍ර පිරිනැමීම් 06 ක් සහ ප්‍රභූ සම්ප්‍රාප්තවීම් 26 ක් සිදු විය. එසේම, කොළඹ දී පවත්වන ලද "ඉන්දියන් සාගරය-අනාගත විග්‍රහය" සම්මන්ත්‍රණයේ නියෝජිතයින්ට ප්‍රවාහන පහසුකම් සැලසීම ද නොපිරිහෙළා ඉටු කෙරිණ. වාහන සංචිතයට අළුතින් වාහන ලබා ගැනීම ද මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය හා සමඟ ප්‍රමන්ත්‍රණයට භාජනය වෙමින් පවතී.

උ. පුස්තකාලය

පවත්නා පුස්තකාලය වැඩි දියුණු කිරීම ද මෙම අංශයට පැවරී ඇති තවත් කාර්ය භාරයකි. ප්‍රමිත සම්පාදනය සහ යාවත්කාලීන කිරීම, ප්‍රස්තකාල ද්‍රව්‍ය සංවිධානය කිරීම සහ එක්රැස් කිරීම මෙම අංශය මඟින් සිදු කෙරේ. විදේශ රාජ්‍යතාන්ත්‍රීය කටයුතු, ආර්ථිකය, ජාත්‍යන්තර නීති පද්ධතිය, පර්යේෂණාභිමුඛ ග්‍රන්ථ ප්‍රකාශන ආදියට වඩාත් අදාළ පොත්පත් මිළදී ගැනීම කෙරෙහි කේන්ද්‍රීය අවධානය යොමු කර ඇත.

ලතින් ඇමෙරිකා සහ කැරිබියානු අංශය

ලතින් ඇමෙරිකා සහ කැරිබියානු අංශය

ලතින් ඇමෙරිකානු සහ කැරිබියානු කලාපයෙහි රටවල් හා සමග පවතින ශ්‍රී ලාංකීය ද්විපාර්ශික සබඳතා වලට අදාල කාර්යභාරය ලතින් ඇමෙරිකානු සහ කැරිබියානු අංශයෙන් ආවරණය වේ.මෙම අංශයේ කාර්ය භාරයට මාර්ගෝපදේශණය සැපයෙන්නේ මෙහි පහත පුළුල්ව විග්‍රහ කරනු ලබන ශ්‍රී ලංකා රාජ්‍ය විදේශ ප්‍රතිපත්තිමය අරමුණු දාමයෙනි.

- දේශපාලනික, ආර්ථික,සමාජීය, ආරක්ෂා සහ සංස්කෘතික සහයෝගිතාවය ආවරණය කෙරෙන ද්විපාර්ශික සම්බන්ධතා ප්‍රවර්ධනය සහ වැඩි දියුණු කිරීම
- ලතින් ඇමෙරිකානු සහ කැරිබියානු කලාපයෙහි රටවල් හා සමග වඩාත් පුළුලවූ සම්බන්ධතා සහ සංවාද ප්‍රවර්ධනය
- වාණිජමය ප්‍රවාහයන් සහ සෘජු විදේශ ආයෝජන ව්‍යාප්තකරලීම පිණිස ආර්ථික රාජ්‍යතාන්ත්‍රික මාර්ග ප්‍රවර්ධනය
- ශ්‍රී ලාංකීය ප්‍රතිමූර්තිය සහ ලැදියාවන් ලතින් ඇමෙරිකානු සහ කැරිබියානු කලාපයෙහි ප්‍රවර්ධනය කිරීම

භෞමික ආවරණය: 33

කියුබාව, ආජෙන්ටිනාව, ඇන්ටිගුආ සහ බර්බුඩා, බහමාස්, බාර්බඩෝස්, බෙලි'ස්, බොලිවියා, චිලී. කොළොම්බියා, කොස්ටා රිකා, ඩොමිනිකා, ඩොමිනිකන් ජනරජය, ඉක්වදෝරය, එල් සැල්වදෝරය,ග්‍රෙනාඩාව, ගෝතමාලා, ගයනා, හයිටි, ජැමෙයිකා, කේසිකෝ, නිකරගුආ, පැනමා, පැරගුවේ,පීරු, සෙන්ට් කිට්ස් සහ නෙවිස්, සෙන්ට් වින්සන්ට් සහ ග්‍රෙනේඩියන්ස්, ශාන්ත ලූසියා, හොන්දුරාස්, සූරිනාම්, ට්‍රිනිඩෑඩ් හා ටොබාගෝ, උරුගුවේ, වෙනින්සියුලා.

නේවාසික දූත මණ්ඩල සංඛ්‍යාව: 02

කියුබාව, බ්‍රසීලය

සමගාමීව අක්ත ගන්වා ඇති රටවල් සංඛ්‍යාව: 13

හවානා , කියුබා - වෙනින්සියුලා, ජැමෙයිකා, එල්සැලවදෝරය, ඩොමිනිකන් ජනරජය, ඉක්වදෝරය, ඩොමිනිකා, හයිටි, හොන්දුරාස් සහ පැනමා

බ්‍රසිලියා, බ්‍රසීල් - ආජෙන්ටිනා, කොළාම්බියාව, සුරිනාම්, පැරගුවේ

නිර්වේතනික කොන්සල් නියෝජනය

ශ්‍රී ලංකාව විසින් , බුවනෝස් අයර්ස්(ආජෙන්ටිනා), නසායු(බහමාස්), බොලිවියා

(බොලිවියාව), සාඕ පවුලෝ, රියෝ ද ජැනෙයිරෝ, බහියා (බ්‍රසීලය), බොගොටා(කොළොම්බියාව), ඉකවදෝර්(ඉක්වදෝරය), කින්ග්ස්ටන්(ජැමෙයිකා), මෙක්සිකෝ (මෙක්සිකෝව), ලිමා(පේරු), පරමාරිබෝ(සූරිනෑම්) හි නිර්වේතනික කොන්සල් නියෝජන පවත්වා ගෙන යනු ලැබේ.

1. බ්‍රසීලය

1.1. ද්විපාර්ශ්වීය සබඳතා

I. බ්‍රසීලයේ, ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, ශ්‍රී ලංකා රජය සහ බ්‍රසීල රජය අතර පවත්නා මිත්‍රශීලී ද්විපාර්ශ්වික සබඳතාවයන් වැඩිදියුණු කරලීමේ අරමුණින්, ඒ ඒ බ්‍රසීල අමාත්‍යාංශය සහ අනුබද්ධිත ආයතන, බ්‍රසීලියානු ආයතන,, ව්‍යාපාරික ආස්ථිති මෙන්ම බ්‍රසීලියානු සමූහාණ්ඩු ජනරජයේ දේශපාලන නායකත්වය සහ ජාතික මන්ත්‍රණ සභාවේ සභිකයින්, ප්‍රතිපත්ති සම්පාදකයින් හා නිලධාරීන් හා සමඟ සම්බන්ධතා පෝෂණය කිරීමෙහි නියැලී සිටී.

II. එම්. එම්. ජෆීර් මැතිතුමා 2018 අගෝස්තු මස 31 වන දින ශ්‍රී ලංකා තනාපතිධූරයේ රාජකාර්ය කටයුතු භාරගත් අතර, 2018 සැපතැම්බර් මස 05 වනදින ස්වකීය අක්තපත්‍ර ජනාධිපති මිචෙල් ටෙමර් වෙත පිළිගන්වන ලදී. එසේම, අප තානාපතිතුමා 2018 දෙසැම්බර් මස 12 වන දින ස්වකීය අක්තපත්‍ර සුරිනාමයේ, ජනාධිපති අතිගරු ඩිසායර් ඩෙලානෝ බවුටර්ස් වෙත පිළිගන්වන ලද අතර, වෙළඳ, අධ්‍යාපන සහ විදේශ කටයුතු අමාත්‍යවරුන් සහ සුරිනාමයේ වාණිජ මණ්ඩලීය නිලධාරීන් සමඟ රැස්වීම් ගණනාවකටම සහභාගී විය.

III. තානාපති ජෆීර් මැතිතුමා, බලයලත් තානාපතිවරයා ලෙස කොළොම්බියාවේ සහ ආජෙන්ටිනා ජනරජයේ රාජ්‍ය ප්‍රධානීන් වෙත ස්වකීය අක්තපත්‍ර පිළිගන්වනු ඇත.

IV. දේශපාලනික උපදේශනය උදෙසා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම පිණිස 2011 මාර්තු මාසයේදී ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය සහ බ්‍රසීලයේ විදේශ සබඳතා අමාත්‍යාංශය අතර ගිවිසගන්නා ලද අවබෝධතා ගිවිසුමේ විධිවිධානයන් ක්‍රියාත්මක කිරීම පිණිස, ශ්‍රී ලංකාව සහ බ්‍රසීලය අතර ඊළඟ ද්විපාර්ශ්වික දේශපාලනික උපදේශන රැස්වීම් 2019 පළමුවන කාර්තුවේදී කැඳවීම සහ දේශපාලනමය හා ආර්ථිකමය සහයෝගිතා නව ප්‍රවේශයන් ගැන විමසා බැලීම සම්බන්ධයෙන් දෙරට අතර සාකච්ඡා පැවැත්විණ.

1.2.ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන

i. ශ්‍රී ලංකාවට සහ බ්‍රසීලයට අදාළ ද්විපාර්ශ්වික ගැටළු හඳුනාගැනීම පිණිස බ්‍රසීල විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ තානාපති මට්ටමේ සාකච්ඡා මාලාවන් දෙකක් පැවැත්විණ. එසේම, ශ්‍රී ලාංකීය සහසම්බන්ධතාවයන් උපරිමයෙන් එළිදැක්විය හැකි සම්භාව්‍යමය වෙළඳ ඉසව් හඳුණාගැනීම සඳහා රියෝද ජැනෙයිරෝ සහ සාඕ පෝලෝහි නිර්වේතනික කොන්සල්වරුන් සමඟද සාකච්ඡා පැවැත්විණ.

ii. තානාපති කාර්යාලය, පොදු රාජ්‍යතාන්ත්‍රික වැඩ සටහනෙහි කොටසක් ලෙස, 2018 නොවැම්බර් මාසයේදී පැවැත්වුණ ජාත්‍යන්තර තානාපති කාර්යාලීය වෙළඳ ප්‍රදර්ශනයට සහභාගී වී, සහභාගීවූවන් අතර ශ්‍රී ලංකා සූපවේදය ප්‍රචලිත කිරීමෙහි නියැලිණ.

iii. 2018 මාර්තු මස 19-23 දක්වා, අට වන ලෝක ජල සංසදයට සහභාගීවීම පිණිස, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍ය, ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා බ්‍රසීලයේ චාරිකාවක නියැලුණි.

iv. බ්‍රසීලියානු නගර 03ක නිර්වේතනික කොන්සල්වරුන් පත්කිරීමද (1) රියෝද ජැනෙයිරෝ (ආචාර්ය සොහාකු රේමුන්ඩෝ සිසර් බැස්ටෝස්), (2) සාඕ පෝලෝ (එඩියුර්ඩෝ පෙරෙයිරා ද ඔලිවේරා මහතා) සහ (3) බහියා (ජෝස් ඔගස්ටෝ මැසිල් ටොරෝස් මහතා) තානාපති කාර්යාලයේ මෙහෙයවීමෙන් සිදු කෙරිණ. ආජෙන්ටිනාවේ, බුවනෝස් අයර්ස්හි නව නිර්වේතනික කොන්සල්වරයා ලෙස, 2018 ජූනි මස 14 වන දින සිට දෙවසරක කාලයක් සඳහා රැලීස් එල්ඩුආඩෝ ප්ලියෝසර් මහතා පත් කෙරිණ.

v. බ්‍රසීලයේ චාරිකා මෙහෙයවන්නන් / චාරිකා නියෝජිතවරුන් උදෙසා වීඩියෝ සහ රට පිළිබඳ ඉදිරිපත් කිරීම් ගණනාවක්ම පිරිනැමීමටද , බ්‍රසීලියානු මාධ්‍ය හරහා ශ්‍රී ලංකා සංචාර ප්‍රචලිත කිරීමටද කටයුතු කළ තානාපති කාර්යාලය, බ්‍රසීලියානු චාරිකා සංගම් සහ වාණිජ මණ්ඩල හා එක්ව දැනුවත් කිරීමේ වැඩ සටහන් සහ ඉසව්ද පවත්වන්නට යෙදුණි. සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වාර්තාමය චිත්‍රපට වැඩසටහනක් සම්පාදනය කිරීම පිණිස 2018 අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකාවට පැමිණි ටීවී ග්ලෝබෝ ඉන්ටනැෂනල් නම් බ්‍රසීලියානු රූපවාහිනී පද්ධතියේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් පහසුකම් සැලසීමෙහි නියැලීමටද තානාපති කාර්යාලය විසින් කටයුතු කෙරිණ.

vi. ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන සන්දර්භයෙහි ලා, ප්‍රධාන වශයෙන් තේ, කුළුබඩු, පොල්, ඇඟලුම් සහ රබර් නිෂ්පාදන සඳහා සම්භාව්‍යමය බ්‍රසීලියානු ආනයනකරුවන් හා සබඳතා ගොඩනැගීමෙන් ශ්‍රී ලංකා අපනයනකරුවන් හා සමඟ ස්වකීය සම්බන්ධතා පවත්වා ගෙනයාමටද දූත මණ්ඩලය විසින් පියවර ගැණින.

vii. දූත මණ්ඩලය විසින්, බ්‍රසීලයේ උපනගරවල වෙළඳ ප්‍රවර්ධන වැඩසටහනක් ආරම්භ කරන ලද අතර, අගනුවර වන පරානාහි වාණිජ මණ්ඩලය හා එක්ව සාර්ථක ඉසව්වක් දියත් කරන ලදී. එසේම, සම්භාව්‍ය ආනයනකරුවන්, වාණිජ

කර්මාන්තය සහ සංචාරක සංගම් සහ රාජ්‍ය නිලධාරීන් සමඟ ව්‍යාපාරික රැස්වීම් ගණනාවක්ම පවත්වන ලද අතර, කුඩ ප්‍රදර්ශනයක් සහ තේ රසබැලීමේ අංගයක් පැවත්වීමට දූත මණ්ඩලය විසින් කටයුතු කෙරිණ.

1.3. සංස්කෘතික සබඳතා

i. බ්‍රසීලියාහි බෞද්ධ රටවල් නියෝජනය කෙරෙන්නාවූ තානාපති කාර්යාල හා සමඟ එක්ව බ්‍රසීලියාවේ ෂින් බෞද්ධ විහාරස්ථානයෙහි සංවිධානය කරන ලද වෙසක් උත්සවයට(මැයි) සහ ආහාර උත්සව මාලාවටද සහභාගී වන ලදී. මෙම උත්සව දෙකට බ්‍රසීලියානු ප්‍රභූන් මෙන්ම 3,500 ක පමණ බ්‍රසීලියානු ජාතිකයින්ද සහභාගී වූහ.

2. කියුබාව

2.1. ද්විපාර්ශ්වික සබඳතා

I. කියුබාව හා සමඟ විවිධාකාර ලැදියා ක්ෂේත්‍රයන්හි, ශක්තිමත් ද්විපාර්ශ්වික සබඳතාවයන් හා අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනවත් සහයෝගිතා පවත්වා ගෙන යාමට ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් අඛණ්ඩව කටයුතු කෙරේ.

II. ශ්‍රී ලංකාවෙහි නව ප්‍රවණතාවයන් සම්බන්ධයෙන් කියුබානු දේශපාලන නායකත්වය දැනුවත් කිරීම පිණිස සහ ද්විපාර්ශික සබඳතාවයන් ව්‍යාප්ත කිරීමේ නව මංපෙත් විමසා බැලීම පිණිස තානාපති කාර්යාලය විසින් සාකච්ඡා පවත්වන ලදී.

III. කියුබාවේ සහ වෙනත් අක්තගන්වන ලද රටවල වෙසෙන ශ්‍රී ලාංකිකයන්, විශේෂයෙන්ම ශ්‍රී ලාංකික ශිෂ්‍යයින් සඳහා කාර්යක්ෂම සේවාවන්, සහාය සහ අනුබලය දැක්වීම දූත මණ්ඩලය විසින් අඛණ්ඩව සිදු කෙරේ.

IV. විද්‍යා හා තාක්ෂණ සහයෝගිතා පළමුවන ඒකාබද්ධ කාරක සභා රැස්වීමට සහභාගීවීම පිණිස, 2018 ජනවාරි මස 21-25 කාල වකවානුව තුළ, විද්‍යා,තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශයේ සයසාමාජික නියෝජිත පිරිසක් කියුබාවේ සංචාරයක නියැලුණි. සහයෝගිතා ක්‍රියාකාරකම් සිදු කෙරෙමින් පවතී.

V. 2018 අප්‍රේල් මස 23-27 දක්වා පැවැත්වුණ "කියුබා-සලුද් 2018" ජාත්‍යන්තර මහජන සෞඛ්‍ය සමුළුවට සහභාගීවීම පිණිස, සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මහතා සහ සිවි සාමාජික නියෝජිත පිරිසක් කියුබාවේ සංචාරයක නියැලුණි.කියුබාවේ සෞඛ්‍ය අමාත්‍යවරයා සමඟ සාකච්ඡා පවත්වන ලද අතර, එහිදී ශ්‍රී ලංකා රජයේ ආරෝග්‍යශාලා සඳහා රජයෙන්-රජයට පදනමින් කියුබානු ඖෂධ ලබාදීම පිණිස සහයෝගිතා ක්‍රියාදාමයක් සම්පාදනය කර ගැනීමට අමාත්‍ය දෙපළ එකඟත්වයට පත්වූහ. මෙම වැඩසටහනෙහි ක්‍රමවේදයන් සාකච්ඡා කිරීම පිණිස තාක්ෂණික මට්ටමේ නියෝජිත පිරිසක් 2019 දී කියුබාවට යාමට නියමිතය.

VI. විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය, ගරු වසන්ත සේනානායක මහතා 2018 ඔක්තෝබර් මස 06-09 දිනවල කියුබාවේ නිල චාරිකාවක නියැලුණි. මෙම චාරිකාවේ අරමුණ වූයේ, සම්ප්‍රදායික මිත්‍රත්වය තවදුරටත් සවිමත් කිරීම සහ පුළුල් කිරීම පිණිස දෙරට අතර සහයෝගිතාවය සමාලෝචනයට භාජනය කිරීමයි.

2.2. බහුපාර්ශ්වීය සබඳතා

i. එක්සත් ජාතීන්ගේ විවිධ සංසද වලදී කියුබාව විසින් ශ්‍රී ලංකා නියෝජනයන් සඳහා සහාය දක්වා ඇත.

ii. එක්සත් ජනපදය විසින් පනවන ලද ආර්ථික, වෙළඳ සහ මුල්‍යමය තහනම් කිරීම් අවසන් කිරීම පිණිස ශ්‍රී ලංකාව විසින් සංගතව, එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සම්මුති යෝජනාවන්ට පක්ෂව ඡන්දය භාවිත කර ඇත.

2.3. ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන

I. දෙරට අතර ව්‍යාපාරික සහසම්බන්ධතාවයක් ගොඩගැනීමේ අරමුණින්, 2018 අප්‍රියෙල් මාසයේදී ශ්‍රී ලංකාවේ "යාදෙන් ඉන්ටනැෂනල්" ඖෂධ සමාගම සහ කියබානු ඖෂධ නිෂ්පාදන අංශය අතර ව්‍යාපාරික රැස්වීමක් සඳහා පහසුකම් සැලසීමට තානාපති කාර්යාලය විසින් පියවර ගන්නා ලදී.

II. නවතම සහයෝගිතා ක්‍රියාදාම හඳුන්වාදීම පිණිස තානාපති කාර්යාලය සහ කියුබාවේ ජාතික ක්‍රීඩා, ශාරීරික අධ්‍යාපනය සහ විනෝද ක්‍රීඩා ආයතනය අතර සාකච්ඡා සිදු වෙමින් පවතී. එකී ආයතනය සහ ශ්‍රී ලංකාවේ ක්‍රීඩා අමාත්‍යාංශය අතර ගිවිස ගනු ලැබූ අවබෝධතා ගිවිසුමේ කාර්ය භාරය පුළුල් කිරීම පිණිස සාමූහික ප්‍රයත්නයන් දරමින්, අදාළ කියුබානු නිලධාරීන් හා සමඟ සාකච්ඡා පැවැත්වෙයි. ශ්‍රී ලංකා වොලිබෝල් කණ්ඩායම පුහුණු කිරීම පිණිස 2018 දී අතිරේක කියුබානු වොලිබෝල් පුහුණුකරුවෙකු ශ්‍රී ලංකාවට එවන ලදී.

III. ශ්‍රී ලාංකික ශිෂ්‍යයින් උදෙසා පීව තාක්ෂණය, නැනෝ තාක්ෂණය සහ පර්යේෂණ හා සංවර්ධනයෙහි ලා වැඩිමනත් පුහුණුව සහ ශිෂ්‍යත්ව ලබාදීමේ හැකියාව විමසා බැලීම පිණිස අදාල කියුබානු නිලධාරීන් සමඟ සාකච්ඡා පැවැත්වීමට තානාපති කාර්යාලය විසින් කටයුතු කෙරිණ.

3. එල්-සැල්වදෝරය

i. විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය, ගරු වසන්ත සේනානායක මහතා 2018 ජූලි මස 06-12 දින තුළ එල්-සැල්වදෝරයෙහි නිල චාරිකාවක නියැලුණි. ශ්‍රී ලංකාව සහ එල් සැල්වදෝරය අතර උපදේශන මාලාවෙහි පළමු වටයේ රැස්වීමට සහභාගි වීම මෙම නිල චාරිකාවේ අරමුණ විය. ද්විපාර්ශ්වික වාණිජ කටයුතු හා ආයෝජනය සහ සංස්කෘතික, විද්‍යා හා තාක්ෂණ, අධ්‍යාපන, කෘෂිකර්ම සහ

සංචාරක කටයුතු යන ක්ෂේත්‍රයන්හි සහයෝගිතාවය කේන්ද්‍රීය කොටගත් සාකච්ඡා පවත්වන ලද අතර, අසාධ්‍ය වකුගඩු රෝගය පිළිබඳව ඒකාබද්ධ අධ්‍යයනයක් කිරීමට යෝජනා විය. උපදේශන මාලාව අවසානයේදී ඒකාබද්ධ නිවේදනයක් නිකුත් කෙරිණ.

ii. ශ්‍රී ලංකාවේ අසාධ්‍ය වකුගඩු රෝගය සම්බන්ධයෙන් කරන ලද පර්යේෂණයන් අධ්‍යයනය කිරීම පිණිස 2019 මාර්තු මාසයේදී එල්-සැල්වදෝර් නියෝජිත කණ්ඩායමක් රජරට විශ්ව විද්‍යාලයේ චාරිකාවක නියැලෙනු ඇත.

iii. ශ්‍රී ලංකා තානාපතිතුමා 2018 ජූලි මස 06 වන දින එල් සැල්වදෝරයේහි ස්වකීය අක්තපත්‍ර පිළිගන්වන ලදී.

4. ජැමෙයිකාව

I. විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය, ගරු වසන්ත සේනානායක මහතා 2018 ඔක්තෝබර් මස 03-06 දිනයන් තුළ ජැමෙයිකාවෙහි නිල චාරිකාවක නියැලුණි. දෙරට අතර පවත්නා ද්වපාර්ශ්වික සබඳතාවයන් අන්‍යොන්‍ය ප්‍රතිලාභ උදෙසා තවදුරටත් ශක්තිමත් කිරීම පිණිස දෙරට අතර සහයෝගිතාවය සමාලෝචනයට භාජනය කිරීම මෙම නිල චාරිකාවේ අරමුණ විය.

II. අප තානාපතිතුමා 2018 මැයි මස 29 වන දින ජැමෙයිකාවේදි තම අක්තපත්‍ර පිළිගන්වන ලදී.

III. 2019-2021 කාල පරාසය තුළ එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජීය කවුන්සිලයේ, ලතින් ඇමෙරිකානු සහ කැරිබියානු රාජ්‍යයන් සඳහා වෙන්කර ඇති ආසන තුනෙන් එකක් සඳහා ජැමෙයිකාව ඉදිරිපත් කර ඇති ඉල්ලීමට ස්වකීය සහාය පළකිරීම ශ්‍රී ලංකාව විසින් තහවුරු කර ඇත.

5. ඩොමිනිකන් ජනරජය

i. විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය, ගරු වසන්ත සේනානායක මහතා 2018 ඔක්තෝබර් මස 09-12 දින තුළ ඩොමිනිකන් ජනරජයෙහි නිල චාරිකාවක නියැලුණි. දෙරට අතර පවත්නා ද්වපාර්ශ්වික සබඳතාවයන් අන්‍යොන්‍ය ප්‍රතිලාභ උදෙසා තවදුරටත් ශක්තිමත් කිරීම පිණිස දෙරට අතර සහයෝගිතාවය සමාලෝචනයට භාජනය කිරීම මෙම නිල චාරිකාවේ අරමුණ විය.

ii. ශ්‍රී ලංකාව සහ ඩොමිනිකන් ජනරජය අතර දේශපාලනමය උපදේශනය පිළිබඳ අවබෝධතා ගිවිසුමක සහ දෙරට අතර අධ්‍යයන සහයෝගිතා අවබෝධතා ගිවිසුමක කටයුතු නිම කර ගැනීම පිණිස දූත මණ්ඩලය කටයුතු කරමින් සිටි යි.

නීති අංශය

නීති අංශයේ ක්‍රියාකාරකම්වල ප්‍රධාන විෂයයන් පිළිබඳව සාමාන්‍ය විස්තරයක්

විදේශ කටයුතු අමාත්‍යාංශයේ නීති අංශය 1967 වර්ෂයේදී පිහිටුවන ලදී. අමාත්‍යාංශයේ ලේකම්වරයා හරහා අමාත්‍යවරයා වෙත විදේශ කටයුතු අමාත්‍යාංශයේ අනෙකුත් අංශ වෙත, ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩල වෙත, ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ දූත මණ්ඩල වෙත, මෙන්ම අනෙකුත් අමාත්‍යාංශ වෙත ජාත්‍යන්තර නීතිය පිළිබඳව කරුණු සම්බන්ධයෙන් නෛතික උපදෙස් සැපයීම නීති අංශයේ කාර්යයකි. නීති අංශය ශ්‍රී ලංකා රජයේ ගිවිසුම් සුරක්ෂිතාගාරයක් ලෙස කටයුතු කරයි.

මෙම අංශය විසින් උපදෙස් ලබාදෙන ප්‍රධාන විෂය ක්ෂේත්‍ර

සියලුම ප්‍රතිපත්ති තීරණවල නෛතික ස්වරූපයන් සම්බන්ධයෙන් නීති අංශය මගින් උපදෙස් ලබාදෙන අතර විශේෂයෙන්ම දේශ භූමි අයිතීන් හා සීමා මායිම්, ගිවිසුම් සබඳතා හඳුනාගැනීම, රාජතාන්ත්‍රික මුක්තීන් හා වරප්‍රසාද ආදිය වැනි කාලයෙන් කාලයට පැන නඟින ජාත්‍යන්තර ගැටළු සම්බන්ධයෙන් කටයුතු කරයි.

නැව් කටයුතු, සිවිල් ගුවන් සේවා, ජාත්‍යන්තර වෙළෙඳාම, ආයෝජනය, සංචාර හා විගමනය ආදී පුළුල් පරාසයක විෂයන් ආවරණය කරමින් විදේශ ගනුදෙනුවල නියැලෙන අනෙකුත් සෑම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට ජාත්‍යන්තර නීතිය පිළිබඳව කරුණු සම්බන්ධයෙන් නීති අංශය විසින් උපදෙස් ලබාදෙයි. තව ද, සාකච්ඡා පැවැත්වීම, කැඳවීම හා විදේශයන්හි සිටින්නවුන් සිය රටට ගෙන්වා ගැනීම, අපරාධ සිවිල් හා වාණිජ කටයුතු යන අන්‍යෝන්‍ය නීති ආධාර ලබාදීම, ද්වි බදු ගණනය කිරීම, වළක්වාගැනිම, ආයෝජනය, ආරක්ෂණය හා ප්‍රවර්ධනය, සිරකරුවන් හුවමාරු කරගැනීම, නැවත ඇතුළත් කරගැනීම, සංක්‍රමණය, කම්කරු හා මිනිස් බලය හා මුහුදු නීතිය ආදිය සම්බන්ධයෙන් ද මෙම අංශය කටයුතු කරයි.

ශ්‍රී ලංකාවේ විදේශ සේවය අදාළ අමාත්‍යාංශයේ උපදෙස් මාලාව අර්ථකථනය කිරීම, ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල විසින් එළඹී ගිවිසුම් හා එකඟතාවන්, අපගේ දූත මණ්ඩල විසින් දේශීය කම්කරුවන් බඳවා ගැනීම, රාජ්‍යතාන්ත්‍රික හා කොන්සියුලර් වරප්‍රසාද හා ශ්‍රී ලංකාවේ විදේශ රටවල දූත මණ්ඩල වල මුක්තීන් මෙන් ම ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ රටවල දූත මණ්ඩල ආශ්‍රිත ගැටළු ආදිය මෙම අංශය විසින් සාකච්ඡාවට ගැනෙන විෂයන් කිහිපයකි.

විදේශ කටයුතු අමාත්‍යාංශයේ සෑම ද්විපාර්ශ්වීය රැස්වීමක දී ම නීති අංශය මගින් වැදගත් හා සක්‍රීය භූමිකාවක් ඉටුකරන අතර ආයෝජන ප්‍රවර්ධන හා ආරක්ෂණය, ද්විත්ව බදුකරණය, ගුවන් සේවා, නැවත ප්‍රවේශ වීම හා වීසා නිදහස් කිරීම වැනි විෂයන් සම්බන්ධයෙන් ද්විපාර්ශ්වික සාකච්ඡාවලට මූලිකත්වය ගනියි.

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා ප්‍රසිද්ධ කිරීම

1. 2018 ජූලි 17 වැනි දිනැති අංක 2080/34 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රිකාවේ ප්‍රකාශයට පත් කළ ඉරානයට සම්බාධක පැනවීම සම්බන්ධයෙන් වූ 2018 ජූලි රෙගුලාසි මගින් සමූල විනාශකාරී අවි ව්‍යාප්තිය මැඩලීම සඳහා එක්සත් ජාතින්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා විසදුම්වලිය.

සාගර නීතිය

මහාද්වීපික තටාක පිළිබඳ ශ්‍රී ලංකාව කරුණු ඉදිරිපත් කිරීම

1) (LLC) 2009 මැයි මස 8 වන දින පිළියෙල කරන ලද මහාද්වීපික තටාකය පිළිබඳ ශ්‍රී ලංකාවේ කරුණු ඉදිරිපත් කිරීම සලකා බැලීම සඳහා මහාද්වීපික තටාකයේ සීමාවන් පිළිබඳ කොමිෂම විසින් උප කමිටුවක් පත් කළේය. මෙම ඉදිරිපත් කිරීම පිළිබඳ කරුණු දැක්වීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

ඒ අනුව උප කොමිෂන් සභාව සමග රැස්වීම් පහක් මෙතෙක් සිදු කර ඇත. විදේශ කටයුතු අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ජාතික සාගර කටයුතු පිළිබඳ කමිටුව (NOAC), අදාළ පාර්ශවකරුවන් සමග මෙන්ම නීති අංශය සමග අඛණ්ඩව කටයුතු කරමින් සිටින අතර පවතින ගැටළු සම්බන්ධ කටයුතු නිමකිරීම සඳහා නීති අංශය සමග අඛණ්ඩව කටයුතු කරමින් සිටියි.

2)ජාතික අධිකරණ බලයට ඔබ්බෙහි (BBNJ) සඳහා වන සමුද්‍රීය ජෛව විවිධත්වය පිළිබඳ සම්මුතිය සාකච්ඡා කිරීම සඳහා අන්තර් රාජ්‍ය සම්මේලනය (IGC).

ඉහත කී සම්මුතියේ මූලධර්ම සැකසීම නිමකිරීම සඳහා පිහිටුවන සූදානම් කිරීමේ කමිටුවට විදේශ කටයුතු අමාත්‍යාංශයේ නීති කටයුතු අංශය ක්‍රියාකාරීව සහභාගී විය. මෙම සම්මේලනයේ සාකච්ඡා කිරීම සඳහා ප්‍රධාන මූලධර්ම හඳුනා ගැනීම සඳහා නීති අංශය විසින් අවධානය යොමු කළ අතර, 2018 සැප්තැම්බර් මස 4 වන දින සිට 17 වන දින දක්වා එම සමුළුවේ වැඩකටයුතු සිදුකරන ලදී. BBNJ පිළිබඳ ජාතික උපාය මාර්ග සකස් කිරීම සඳහාත් ශ්‍රී ලංකාව තුළ විශේෂඥතාව වර්ධනය කිරීම සඳහාත් ක්‍රියාකාරී කණ්ඩායමක් නිර්මාණය කරනු ඇත.

තව ද, 2019 මාර්තු 25 සිට අප්‍රේල් 05 වැනි දින දක්වා පැවැත් වීමට නියමිත IGC iiට සහභාගී වීමට නීති අංශය සැලසුම් කර ඇත.

ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UNCITRAL)

ආයෝජක රාජ්‍ය ආරවුල් නිරවුල් කිරීම පිළිබඳ (ISDS) ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුති කාර්ය මණ්ඩල III වන කණ්ඩායමේ දෙවන රැස්වීම 2018

නිව්යෝර්ක් හිදී පවත්වන ලදී. ආයෝජන ප්‍රවර්ධන හා ආරක්ෂණ ගිවිසුම්වල සාමාජිකයකු ලෙස නීති අංශය විසින් මෙම රැස්වීම නියෝජනය කරන ලදී. අත්සන් කරන ලද පැරණි ද්විපාර්ශ්වික ආයෝජන ගිවිසුම් පුනරුත්ථාපනය කිරීම පිණිස කාර්යය කණ්ඩායමේ නිර්දේශ පිළිබඳ සොයා බැලීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව, ආයෝජන මණ්ඩලය සහ විදේශ කටයුතු අමාත්‍යාංශය (නීති අංශයේ) නියෝජිතයින්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීමට නියමිතය.

බුද්ධිමය දේපල (IP)

බුද්ධිමය දේපළ පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අදාළ පාර්ශ්වකරුවන් සමඟ තවමත් සාකච්ඡා කරමින් සිටින අතර මේ සම්බන්ධයෙන් නීති අංශය සහාය ලබා දෙයි.

නැවත ප්‍රවේශවීම

ශ්‍රී ලංකාව සහ පෝර්ටියාව අතර නැවත ප්‍රවේශවීම පිළිබඳ ගිවිසුමේ කටයුතු නිමකර ඇති අතර අත්සන් කිරීමට සූදානම්ව ඇත.

සංක්‍රමණය

2018 අගෝස්තු 6 වැනි දින කොළඹ දී අතර අත්සන් කළ සංක්‍රමණ සහයෝගිතාව පිහිටුවීම පිළිබඳ ශ්‍රී ලංකා රජය හා ස්විට්සර්ලන්ත ෆෙඩරේෂනය අතර අත්සන් කළ අවබෝධතා ගිවිසුම.

ගුවන් සේවාවන්

සර්බියානු රජයේ විදේශ කටයුතු අමාත්‍යවරයාගේ රාජ්‍ය සංචාරයේ දී 2018 මැයි 8 වැනි දින ශ්‍රී ලංකාව හා සර්බියාව අතර ගුවන් සේවා ගිවිසුමක් අත්සන් කරන ලදී.

දැනට පවතින ගුවන් සේවා ආධිපත්‍යය සංශෝධනය කිරීම සඳහා කොරියානු ජනරජය, ඇමරිකා එක්සත් ජනපදය, භූතානය, කැනඩාව, කටාර්, එක්සත් අරාබි එමීර් රාජ්‍යය ආදි රටවල් සමඟ සාකච්ඡා කරගෙන යාම.
ශ්‍රී ලංකාව හා ලක්සම්බර්ග් අතර ගුවන් සේවාවලට අදාළ කටයුතු සාකච්ඡා කිරීම සඳහා 2018 ජූලි 26 වැනි දින ලක්සම්බර්ග්හි දී පැවැත්වෙන දෙරට අතර ද්විපාර්ශ්වික ගුවන් සේවා පිළිබඳ සාකච්ඡාවලට නීති අංශය සහභාගී විය.

ICAO ගුවන් සේවා සාකච්ඡාමය සමුළුව (ICAN) 2018

ICAO ගුවන් සේවා සාකච්ඡාමය සමුළුව (ICAN) 2018 දෙසැම්බර් 10-14 දිනවල දී කෙන්යාවේ නයිරෝබිහි දී පවත්වන ලදී. මෙම සමුළුව අතරතුර දී ගුවන් සේවා සඳහා නියාමන රාමුව තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා ගුවන් සේවා සබඳතා පිළබඳව සමාලෝචනය කිරීමට ඕස්ට්‍රේලියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, පෘතුගාලය, කටාර් රාජ්‍යය, ටැන්සානියාව, නෙදර්ලන්තය, ටර්කියාව, බහමාස්, නැම්බියාව හා කොරියානු ජනරජය සමඟ ශ්‍රී ලංකාව සාකච්ඡා පවත්වා තිබේ.

ආයෝජන ප්‍රවර්ධනය හා අන්‍යෝන්‍ය ආයෝජන ආරක්ෂණය පිළිබඳ ගිවිසුම

තුර්කිය සමග ආයෝජන ප්‍රවර්ධනය සහ අනෝන්‍ය ආරක්ෂාව පිළිබඳ ගිවිසුම

2018 පෙබරවාරි මස 21 වැනි දින කොළඹ දී පැවැත් වූ දෙවන සාකච්ඡා වටයේ දී ශ්‍රී ලංකා රජය සහ තුර්කියේ රජය අතර ආයෝජන ප්‍රවර්ධනය සහ අන්‍යෝන්‍ය ආරක්ෂාව පිළිබඳ ගිවිසුම ආරම්භ කරන ලදී.

බෙලරුසය සමග ආයෝජන ප්‍රවර්ධනය සහ අන්‍යෝන්‍ය ආරක්ෂාව පිළිබඳ ගිවිසුම

ආයෝජන සුරක්ෂිතතා ගිවිසුම පිළිබඳ ශ්‍රී ලංකාව සහ බෙලරුසය අතර ලිපි හුවමාරු කර ගැනීම ඔස්සේ ගැටලූ සාකච්ඡා වෙමින් පවතී.

එක්සත් අරාබි එමීර් රාජ්‍ය සමග ආයෝජන ප්‍රවර්ධනය සහ අන්‍යෝන්‍ය ආරක්ෂාව පිළිබඳ ගිවිසුම

ශ්‍රී ලංකාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය අතර ආයෝජන ප්‍රවර්ධනය හා ආරක්ෂණ පිළිබඳ ගිවිසුමේ දෙවන සාකච්ඡා වටය 2018 අප්‍රේල් 25 සිට 27 දක්වා අබුඩාබිහි දී පැවැත්විණි.

නිදහස් වෙළඳ ගිවිසුම් සාකච්ඡා

විදේශ කටයුතු අමාත්‍යාංශයේ නීති අංශය, ඉන්දියාව සමග ආයෝජන පරිච්ඡේද (ETCA) පිළිබඳ සාකච්ඡා සිදුකරමින් සිටින අතර, තායිලන්තය හා චීනය සමග සාකච්ඡා අවසාන අවසන් අදියරේ පවතියි.

ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ රාජ්‍ය මූදල් වංචා වැළැක්වීම පිළිබඳ ගිවිසුම

ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ ශ්‍රී ලංකාව හා ඕමාන් රාජ්‍ය අතර රාජ්‍ය මූදල් වංචා වැළැක්වීමේ ගිවිසුම 2018 අගෝස්තු මස 15 වැනි දින කොළඹ දී අත්සන් කරන ලදී.

අන්තර්ජාතික පරමාණුක බලශක්ති ඒජන්සියේ (IAEA) න්‍යෂ්ටික විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධ පර්යේෂණ, සංවර්ධනය සහ පුහුණුව සඳහා කලාපීය සහයෝගිතා ගිවිසුම දීර්ඝ කිරීම (RCA)

2016 මැයි මාසයේ දී මොන්ගෝලියාවේ උලන්බර්ටෝහි පැවැත්වූ වාර්ෂික රැස්වීමේ තීරණයට අනුව, රාජ්‍ය පාර්ශ්වයන්ගේ RCA නියෝජිතයින් විසින් සීමිත කාලයක් සඳහා RCA ගිවිසුම දිගු කිරීම පිළිගන්නා ලදී.

ඒ අනුව, න්‍යෂ්ටික විද්‍යාව හා තාක්ෂණය ආශ්‍රිත පර්යේෂණ, සංවර්ධන හා පුහුණුව සඳහා 1987 දරන කලාපීය සහයෝගිතා ගිවිසුම දීර්ඝ කිරීම සම්බන්ධයෙන් පිළිගත් ලිපිලේඛන 2018 සැප්තැම්බර් 07 වැනි දින ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අත්සන් කරන ලදී.

කිගාලි සංශෝධනය අපරානුමත කිරීම

මොන්ට්‍රියල් ප්‍රොටෝකෝලය සඳහා සිදු කළ කිගාලි සංශෝධනය පිළිබඳ අපරානුමත කිරීමේ ලිපිලේඛනය ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අත්සන් කළ අතර එය 2018 මැයි මස 21 වන දින නිව්යෝර්ක්හි පිහිටි එක්සත් ජාතීන්ගේ මහලේකම් කාර්යාලයේ තැන්පත් කරන ලදී.

කිගාලි සංශෝධනය මගින් රාජ්‍ය පාර්ශ්වකරුවන් විසින් මොන්ට්රියල් ප්‍රොටෝකෝලය යටතේ ක්‍රමාංකනය කරන ලද ක්ලෝරෝ ෆ්ලෝරෝ කාබන් (CFC) වෙනුවට විකල්පයක් ලෙස භාවිත කරන හයිඩ්රෝ ෆ්ලෝරෝකාබන් (HFC) අඩු කිරීමේ වගකීම භාරගනු ලබයි.

දැනට පවත්නා IAEA ආරක්ෂණ ගිවිසුමට අතිරේක ප්‍රොටෝකෝලයක් ගෙන ඒම

ශ්‍රී ලංකාව සිය ව්‍යවස්ථාපිත අවශ්‍යතා සම්පූර්ණ කරන තෙක්, අන්තර්ජාතික පරමාණුක බලශක්ති අධිකාරියේ (ශ්‍රී ලංකාව) ආරක්ෂණ ගිවිසුමට සමගාමීව අතිරේක ප්‍රොටෝකෝලයක් අත්සන් කිරීම සඳහා ශ්‍රී ලංකා රජයේ එකඟතාවය පළ කරන ලද ලිපියක්, 2018 ජූලි මස 23 වන දින විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අත්සන් තබන ලදී.

මැද පෙරදිග අංශය

මැද පෙරදිග අංශය

අංශයේ කාර්යයන්

1. අතිගරු ජනාධිපති, ගරු අග්‍රාමාත්‍ය සහ විදේශ කටයුතු අමාත්‍යවරයා සහ අමාත්‍ය මණ්ඩල සාමාජිකයන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ ද්විපාර්ශ්වික සංචාර සම්බන්ධීකරණය කිරීම.

2. එවැනි ඉහළ පෙළේ සංචාර, අක්ත පත්‍ර භාරදීමේ උත්සව සහ වෙනත් සියලුම රැස්වීම් සඳහා සාකච්ඡා සටහන් සහ රට පිළිබඳ විස්තර සකස් කිරීම.

3. ද්විපාර්ශ්වීය දේශපාලන සාකච්ඡා, දේශපාලන සංවාද හා ඒකාබද්ධ කොමිෂන් සභා ආදිය පැවැත්වීම.

4. එළැඹීමට නියමිත අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් සකස්කොට අවසන් කිරීම.

5. අමාත්‍ය මණ්ඩල සංදේශ සකස්කිරීම සහ අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.

6. අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා සහ විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන ශෝක පණිවුඩ,ජාතික දින පණිවිඩ, එම උත්සව වලදී පවත්වන කතාව සහ සුභ ප්‍රාර්ථනා පණිවිඩ සකස් කිරීම.

7. මැද පෙරදිග කලාපයේ රටවලින් ශ්‍රී ලංකාවට පත් කරනු ලැබ සිටින තානාපතිවරුන්/මහ කොමසාරිස්වරුන් සමඟ කොළඹ දී අභ්‍යන්තර රැස්වීම් පැවැත්වීම සඳහාත් සුහද බැහැදැකීම් සඳහාත් පහසුකම් සැලසීම.

8. මැද පෙරදිග කලාපය වෙනුවෙන් ක්‍රියාකාරී සැලසුම්, කාර්යසාධනය සහ අයවැය වාර්තා ආදිය සකස් කිරීම.

9. එදිනෙදා කාර්යයන් වල දී විදේශීය රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල, කොළඹ පිහිටි මැද පෙරදිග කලාපීය රටවල දූත මණ්ඩල, රේඛීය අමාත්‍යංශ/දෙපාර්තමේන්තු සහ වෙනත් නියෝජිතායතන සමඟ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

10. ශ්‍රී ලංකාවේ සංචාරය කරන/පිටත්ව යන මැද පෙරදිග කලාපයේ ජාතීන්ට අදාළව කොන්සියුලර් කටයුතු, නෛතික නඩු විභාග,හා වෙනත් කරුණු

11. රාජ්‍ය සංචාර, දේශපාලන සාකච්ඡා, ඒකාබද්ධ කොමිෂන් හා මැද පෙරදිග කලාපයේ සිදුකරන වෙනත් සංචාර අතර තුර දී ගනු ලබන තීරණ පිළිබඳ පසුවිපරම් කිරීම.

දේශ භූමි ආවරණය

අ. විකිපීඩියාවලට අනුව මැද පෙරදිග කලාපයේ රටවල් 17ක් තිබේ. පලස්තීනය හැර ශ්‍රී ලංකාව රාජ්‍යතාන්ත්‍රික සබඳතා පවත්වාගෙන යන රටවල් 13 ද ඇතුළුව ඊජිප්තුව, ලිබියාව (අප්‍රිකා අංශය) තුර්කිය (බටහිර අංශය) මෙම රටවල් 17 අතර වේ.

ආ. පහත දැක්වෙන මැද පෙරදිග රටවල් 14 සමඟ ශ්‍රී ලංකාව රාජ්‍යතාන්ත්‍රික සබඳතා පවත්වයි.

1. බහරේන් රාජධානිය
2. ඉරාන ඉස්ලාමීය ජනරජය
3. ඉරාක ජනරජය
4. ඊශ්‍රායල් රාජ්‍ය
5. ජෝර්දානයේ හෂිමයිට් රාජධානිය
6. කුවෙට් රාජ්‍ය
7. ලෙබනන ජනරජය
8. ඕමාන් සුල්තාන් රාජ්‍ය
9. පලස්තීන රාජ්‍යය
10. කටාර් රාජ්‍යය
11. සවුදි අරාබි රාජධානිය
12. සිරියා අරාබි ජනරජය
13. එක්සත් අරාබි එමීර් රාජ්‍ය
14. යේමන් ජනරජය

ඇ. ශ්‍රී ලංකාව, ඉහත රටවල් 14 අතුරින් රටවල් 12ක නේවාසික දූත මණ්ඩල ස්ථාපිත කර ඇත. ඒවා නම්;

1. බහරේන් (මැනමා)
2. ඉරානය (ටෙහෙරාන්)
3. ඉරාකය (බැග්ඩෑඩ්)
4. ඊශ්‍රායල් (ටෙල් අවිව්)
5. ජෝර්දානය (අම්මාන්)
6. කුවෙට් (කුවෙට් නගරය)
7. ලෙබනන් (බීරුට්)
8. ඕමානය (මස්කට්)
9. කටාර් (දෝහා)
10. සවුදි අරාබිය (රියාද්)
11. එක්සත් අරාබි එමීර් රාජ්‍යය (අබුඩාබි)
12. රාමල්ලාහ් නගරයේ (පලස්තීනය) නියෝජිත කාර්යාලය
13. එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ (ඩුබායි) සහ 14. සවුදි අරාබියේ (ජෙඩා) හි කොන්සල් ජනරාල් කාර්යාල ද්විත්වය

ඈ. එහෙයින්, යේමනය සහ සිරියාව යන රටවල් දෙකේ පමණක් ශ්‍රී ලංකා නේවාසික දූත මණ්ඩල පිහිටුවා නොමැති අතර එම රටවල් ඕමානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය

(යේමනය) සඳහා සහ ලෙබනනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය (සිරියා) සඳහා සමගාමීව අක්තගන්වා ඇත.

- ඉරානයේ ශ්‍රී ලංකා දූත මණ්ඩලය අසර්බයිජාන් හා ටර්ක්මෙනිස්ථානය සඳහා සමගාමීව අක්තගන්වා ඇත.

- මැද පෙරදිග කලාපයේ නිර්වේතනික කොන්සල් නියෝජනයන් 4ක් තිබෙන අතර ඒවා මෙසේය;

    1 ඊශ්‍රායල රාජ්‍යය (ජෙරුසෙලම)

    2 පලස්තීන රාජ්‍යය (බෙත්ලෙහෙම)

    3 ඉරාක ජනරජය (කර්ඩිස්තානය)

    4 සිරියානු අරාබි ජනරජය (ඩැමැස්කස්)

අංශයේ කාර්යයන්

1. අතිගරු ජනාධිපති, ගරු අග්‍රාමාත්‍ය සහ විදේශ කටයුතු අමාත්‍යවරයා සහ අමාත්‍ය මණ්ඩල සාමාජිකයන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ ද්විපාර්ශ්වික සංචාර සම්බන්ධීකරණය කිරීම.
2. එවැනි ඉහළ පෙළේ සංචාර, අක්ත පත්‍ර භාරදීමේ උත්සව සහ වෙනත් සියලුම රැස්වීම් සඳහා සාකච්ඡා සටහන් සහ රට පිළිබඳ විස්තර සකස් කිරීම.
3. ද්විපාර්ශ්වීය දේශපාලන සාකච්ඡා, දේශපාලන සංවාද හා ඒකාබද්ධ කොමිෂන් සභා ආදිය පැවැත්වීම.
4. එළැඹීමට නියමිත අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් සකස්කොට අවසන් කිරීම.
5. අමාත්‍ය මණ්ඩල සංදේශ සකස්කිරීම සහ අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.
6. අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා සහ විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන ශෝක පණිවුඩ,ජාතික දින පණිවිඩ, එම උත්සව වල දී පවත්වන කතාව සහ සුභ ප්‍රාර්ථනා පණිවිඩ සකස් කිරීම.
7. මැද පෙරදිග කලාපයේ රටවලින් ශ්‍රී ලංකාවට පත් කරනු ලැබ සිටින තානාපතිවරුන්/මහ කොමසාරිස්වරුන් සමඟ කොළඹ දී අභ්‍යන්තර රැස්වීම් පැවැත්වීම සඳහාත් සුහද බැහැදැකීම් සඳහාත් පහසුකම් සැලසීම.
8. මැද පෙරදිග කලාපය වෙනුවෙන් ක්‍රියාකාරී සැලසුම්, කාර්යසාධනය සහ අයවැය වාර්තා ආදිය සකස් කිරීම.

9. ඒදිනෙදා කාර්යයන් වල දී විදේශීය රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල, කොළඹ පිහිටි මැද පෙරදිග කලාපීය රටවල දූත මණ්ඩල, රේඛීය අමාත්‍යංශ/දෙපාර්තමේන්තු සහ වෙනත් නියෝජිතායතන සමඟ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
10. ශ්‍රී ලංකාවේ සංචාරය කරන/පිටත්ව යන මැද පෙරදිග කලාපයේ ජාතීන්ට අදාළව කොන්සියුලර් කටයුතු, නෛතික නඩු විභාග,හා වෙනත් කරුණු
11. රාජ්‍ය සංචාර, දේශපාලන සාකච්ඡා, ඒකාබද්ධ කොමිෂන් හා මැද පෙරදිග කලාපයේ සිදුකරන වෙනත් සංචාර අතර තුර දී ගනු ලබන තීරණ පිළිබඳ පසුවිපරම් කිරීම.

මැද පෙරදිග කලාපය : දේශ භූමි ආවරණය

අ) රටවල් 16 - බහරේන්, ඉරානය, ඉරාකය, ඊශ්‍රායලය, ජෝර්දානය, කුවේට්, ලෙබනන්, ඕමාන්, පලස්තීනය, කටාර්, සෞදි අරාබියාව, සිරියාව,එක්සත් අරාබි එමීර් රාජ්‍යය, අසර්බයිජානය, ටර්ක්මෙනිස්ථානය, යේමනය.

ආ) නේවාසික දූත මණ්ඩල/දූත කාර්යාල සංඛ්‍යාව

i. තානාපති කාර්යාල 11 : මැනමා (බහරේනය), ටෙහෙරාන් (ඉරානය), බැග්ඩෑඩ් (ඉරාකය) , ටෙල් අවිව් (ඊශ්‍රායලය), අම්මාන් (ජෝර්දානය), කුවේට් (කුවේට්), බේරූට් (ලෙබනනය), මස්කට් (ඕමානය), දෝහා (කටාර්), රියාද් (සෞදි අරාබියාව), අබුඩාබි (එක්සත් අරාබි එමීර් රාජ්‍යය)

ii. කොන්සල් ජනරාල් කාර්යාල 02 : ඩුබායි- එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ජෙඩා (සෞදි අරාබියාව)

iii. නියෝජිත කාර්යාල 01 : රාමල්ලා නගරය-පලස්තීනය

iv. සමගාමී අක්තගැන්වීම් 04 : සිරියාව (ලෙබනනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය), යේමනය (ඕමානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය), ටර්ක්මෙනිස්ථානය (ඉරානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය), අසර්බයිජානය (ඉරානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය)

v. නිර්වේතනික කොන්සල් නියෝජනයක්: ඊශ්‍රායල රාජ්‍යය (ජෙරුසෙලම) පලස්තීන රාජ්‍යය (බෙත්ලෙහෙම), ඉරාක ජනරජය (කුර්දිස්ථානය)

1. බහරේනය

අ. ද්විපාර්ශ්වික සබඳතා

තානාපතිවරයා විසින් විවිධ අවස්ථාවලදී, බහරේනයේ අමාත්‍ය මණ්ඩලය, රාජෝත්තමයාණන් වහන්සේ, අග්‍රාමාත්‍යවරයා, ඔටුන්න හිමි කුමරුවන් හා නියෝජ්‍ය අග්‍රාමාත්‍යවරුන් බැහැ දැක ඇත.

කම්කරු හා සමාජ සංවර්ධන අමාත්‍යාංශයේ උප ලේකම්, සුබාහි සාලම් රෂිඩ් සචර් අල්ඩොසරි මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් බහරේන් නියෝජිත පිරිසක්, 2018 මැයි මස 8

වැනි දින කොළඹ දී පැවැති අබුඩාබි කතිකාවතේ ජේෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීමකට සහභාගී විය.

බහරේන් හි නේවාසික තානාපතිවරුන් 25 දෙනකු සමග 2018 සැප්තැම්බර් 03 වන දින මැනමා කතිකාවත පිළිබඳ වට මේස සාකච්ඡා සඳහා තානාපතිවරයා සහභාගී විය. මෙම කතිකාවත මගින් 2018 ඔක්තෝබර් මාසයේ දී කලාපය මුහුන දෙන ප්‍රධාන ගැටළු සාකච්ඡා කිරීම සඳහා ලොව වටා බුද්ධිමතුන්, ප්‍රධානීන් හා විද්වතුන් එක්රැස් වනු ඇත.

ආ. බහුපාර්ශ්වික සබඳතා

- යුනෙස්කෝ ලෝක උරුම කමිටුවේ 42 වැනි සැසිවාරය 2018 ජූලි මස 24 වන දින සිට 4 වැනි දින දක්වා බහරේන් හි පිහිටි මැනමාහි පවත්වන ලදී. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් මහාචාර්ය පී.බී. මෙන්ඩාවල ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ඉහත සමුළුව සඳහා සහභාගි විය.

- රාජ්‍ය පාර්ශ්වයන්ගේ 7 වැනි මහා සභා රැස්වීමේ දී 2018 ජූනි මස පැවැති ජන්ද විමසීමේ දී අස්පෘෂ්‍ය සංස්කෘතික උරුමයන් ආරක්ෂා කරගැනීම පිළිබඳ අන්තර් රාජ්‍ය කමිටුව සඳහා ශ්‍රී ලංකා අපේක්ෂකත්වය බහරේන රජයෙන් ලැබුණ සහයෝගයට ප්‍රතිචාර වශයෙන් 2018 ජූනි මස 7 වැනි දින නිව් යෝර්ක් හි පැවැති ජන්ද විමසීමේ දී 2019-2022 කාලය සඳහා කාන්තාවන්ට එරෙහිව සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම තුරන් කිරීම සම්බන්ධ කමිටුව සඳහා බහරේන රාජධානියේ අපේක්ෂකත්වය වෙනුවෙන් ශ්‍රී ලංකා රජය සහයෝගය ලබාදුනි. ඉහත සඳහන් අපේක්ෂකත්වය ශ්‍රී ලංකාව ලබාගන්නා ලදී.

- 2018 ඔක්තෝබර් මාසයේදී නිව්යෝර්ක් හි දී පැවැති ජන්ද විමසීමේ දී 2019-2021 කාලසීමාව සඳහා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ සාමාජිකත්වය වෙනුවෙන් බහරේන රාජධානි අපේක්ෂකත්වය සඳහා සහයෝගය ලබාදීම ශ්‍රී ලංකා රජය තහවුරු කළේය.

ආ. ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන

- බහරේනයේ වානිජ හා කර්මාන්ත මණ්ඩලයේ, රන් සහ ස්වර්ණාභරණ කමිටුවේ සභාපති සහ බහරේන රාජධානියේ අල් ජබේරියා සමූහයේ කළමනාකරණ අධ්‍යක්ෂ මොහොමඩ් සපිඩ් මහතාගේ නායකත්වයෙන් යුත් දස සාමාජික වාණිජ නියෝජිත පිරිසක්, 2018 ජූනි මස 19 වැනි දින සිට 21 වැනි දක්වා පැවැති 'ශ්‍රී ලංකා ආයෝජන හා වාණිජ සාකච්ඡාව-2018'ට සහභාගි විය.

ඇ. සංස්කෘතික සබඳතා

- බහරේනයේ ශ්‍රී ලංකා සංගමය සහ ශ්‍රී ලාංකික සංවිධානය විසින් සංවිධානය කෙරුණු සංස්කෘතික ක්‍රියාකාරකම් (වෛද්‍ය කඳවුරු/සායන, ලේ දන්දීම්, තෙපොංගල්, සිංහල හින්දු අලුත් අවුරුද්ද, වෙසක් සහ පොසොන් උත්සව, ඊඩ්-උල්-ෆිතර් සහ ඊඩ්-උල්-අල්හා වැනි උත්සව සැමරුම්) සඳහා දූත මණ්ඩලය පහසුකම් සැලසුවේය.

- 2018 පෙබරවාරි 09 වන දින 70 වන නිදහස් උත්සවයේ කොටසක් ලෙස තානාපති කාර්යාලය විසින් සංවිධානය කරන ලද 'ශ්‍රී ලාංකේය සංස්කෘතික සංදර්ශනය' සංවිධානය කරන ලද අතර, 70 වැනි නිදහස් උත්සවය සැමරීම සඳහා බහරේන් හි වෙසෙන ශ්‍රී ලංකා ප්‍රජාව විසින් සම්ප්‍රදායික ශ්‍රී ලාංකික නර්තන, ගායන, හා නාට්‍ය අංග ඉදිරිපත් කරන ලදී.

- ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සභාව විසින් සංවිධානය කළ ශ්‍රී ලංකාවේ නිකවැරටියේ පිහිටි 'යොවුන් පුර' මැයෙන් වූ තරුණ උත්සවයට 2018 මාර්තු 28 දින සිට අප්‍රේල් 28 දින දක්වා බහරේන් තරුණ නියෝජිත කණ්ඩායම සහභාගී විය.

- ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ප්‍රධානත්වයෙන් හා සහයෝගයෙන් බහරේනයේ පිහිටි ඇමරිකානු මි ෂන් රෝහල හා ශ්‍රී ලංකා ඉංජිනේරු සමාජය විසින් වෙසක් උත්සවයට සමගාමිව තානාපති පරිශ්‍රයේ දී 2018 මැයි 18 දින මහා වෛද්‍ය සායනයක් හා කදවුරක් ද ශ්‍රී ලංකාවේ 70 වැනි නිදහස් දින සැමැරුම සැමරීම සඳහා සල්මනියා රෝහලින් 2018 ජනවාරි මාසයේදී ලේ දන් දීමේ උත්සවයක් ද පවත්වන ලදී.

ඈ. කම්කරු සුභසාධනය

- සතියේ දිනයන් හිදී තානාපති කාර්යාලයට පැමිණීමට නොහැකි විදේශයන් හී සිටින ශ්‍රී ලාංකික සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීමට 2018 ජූනි 8 වැනි දින (සිකුරාදා) 'විශේෂිත කොන්සියුලර් දිනයක්' දුත මණ්ඩලය විසින් පවත්වන ලදී. කිසිදු වලංගු ගමන් හෝ නෛතික ලිපිලේඛනයක් නොමැතිව දීර්ඝ කරන ලද කාල සීමාවක් සඳහා බහරේනයේ වෙසෙන ලියාපදිංචි නොවූ ශ්‍රමිකයන් පිළිබඳ මෙය මූලික ඉලක්කයකි.

- මෙම දුත මණ්ඩල කම්කරු අංශය මගින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයේ ලියාපදිංචි සංක්‍රමණික ශ්‍රමිකයන් සඳහා සුභ සාධන ප්‍රතිලාභ හා හිමිකම් සම්බන්ධයෙන් විදේශයන් හි වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා බහරේනයේ ශ්‍රී ලංකා සංවිධාන තේරීමේ වැඩමුළු කිහිපයක් පැවැත්වූ අතර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයෙන් ලබාගත හැකි ප්‍රතිලාභ හා උපයෝගිතා ඇතුළත් කරමින් දූත මණ්ඩලය විසින් සම්පාදනය කළ අත් පොත් බෙදාහරින ලදී. මෙම අංගයේ අරමුණ වනුයේ බහරේනයේ වෙසෙන ශ්‍රීලාංකික සේවකයන් දැනුවත් කිරීමත්, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයේ ලියාපදිංචි කිරීම සඳහා ඔවුන්ව දිරිගැන්වීමයි.

- බහරේනයේ රැකී රක්ෂා හා මිනිස්බල නියෝජිතායතනයන්හි සහයෝගයෙන් අර්ධ පුහුණු හා පුහුණු ශ්‍රමික අංශයේ ශ්‍රී ලාංකික මිනිස්බල ප්‍රවර්ධනය කිරීම සඳහා කම්කරු අංශය මගින් රැකියා ප්‍රවර්ධන ක්‍රියාකාරකම් 10ක් පවත්වා ඇත.

2. ඉරානය

අ. ද්විපාර්ශ්වික සබඳතා

- අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා 2018 මැයි මස 14 දින සිට 12 දක්වා ඉරානයේ රාජ්‍ය සංචාරයක නිරත විය.

- අතිගරු ජනාධිපතිතුමා කැටුව විදේශ කටයුතු අමාත්‍ය, ගරු තිලක් මාරපන මැතිතුමා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය රාජිත සේනාරත්න, නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍ය ගරු. රවුෆ් හකීම්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය, රිෂාද් බදියුදීන්, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය, විපේදාස රාජපක්ෂ සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කේ. කාදර් මාස්තාන් රාජ්‍ය සංචාරයක නිරත විය.

- රාජ්‍ය සංචාරය අතරතුරදී පහත සඳහන් අවබෝධතා ගිවිසුම්වලට එළඹුණි.

- ප්‍රමිතිකරණය, මිනුම් විද්‍යාව, පුහුණු ක්ෂේත්‍රයේ සහයෝගිතාව පිළිබඳ ඉරානයේ ISO ප්‍රමිති හා කාර්මික පර්යේෂණ ආයතනය (ISIRI) සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) අතර අවබෝධතා ගිවිසුම.

- සෞඛ්‍ය, වෛද්‍ය විද්‍යාව, ඖෂධ හා වෛද්‍ය උපකරණ ක්ෂේත්‍රයේ අවබෝධතා ගිවිසුම.

- නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීම වැළැක්වීම සඳහා සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම.

- සිනමා හා ටෙලිවිෂන් ක්ෂේත්‍රයේ සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම.

- සංස්කෘතික, විද්‍යාත්මක සහ තාක්ෂණික සහයෝගිතා වැඩසටහන පිළිබඳ අවබෝධතා ගිවිසුම.

- ඉහත අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම් ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසු විපරම් කටයුතු සිදු කරන ලදී.

- ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිතුමාගේ (ශ්‍රී ලංකා මහ බැංකුවේ) ආරාධනාවක් මත, ඉරාන මහ බැංකුවේ විදේශ විනිමය කටයුතු පිළිබඳ නියෝජ්‍ය අධිපති, සීයෙඩ් අහමඩ් ආග්රිව් මහතා ශ්‍රී ලංකාවට පැමිණ බැංකු සම්බන්ධතා යලි පිහිටුවීම පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුවේදී 2018 ජූලි 12 වන දින සාකච්ඡා පැවැත්වීය.

ආ. බහුපාර්ශ්වීය සබඳතා

- කලාපීය මධ්‍යස්ථානයේ උපදේශන කවුන්සිලයේ (RCSTT) උපදේශන සභාව: ටෙහෙරානයේ විද්‍යා හා තාක්ෂණ මාරුකිරීම් පිළිබඳ ඉන්දියානු සාගරය ආශ්‍රිත රටවල සංවිධාන කළාපීය මධ්‍යස්ථානයේ උපදේශන කවුන්සිලයේ (RCSTT) ක්‍රියාකාරකම්වලදී මෙම දූත මණ්ඩලය සහභාගි වන අතර ශ්‍රී ලංකාවේ අදාළ බලධාරීන් සමග සාකච්ඡා කර ක්‍රියාමාර්ග ගනු ලැබේ.

- IAEA හි පාලන මණ්ඩලය සහ RCA හි සාමාජිකත්වය සඳහා පැවති නිලවරණයේ ඉරාන අපේක්ෂකත්වයට ශ්‍රී ලංකා සහයෝගය පළවිය.

ඇ. ආර්ථික සබඳතා හා විදේශ ආයෝජන

- 2018 මැයි මස 12 සිට 14 දක්වා සිදුකළ අතිගරු ජනාධිපතිතුමාගේ ඉරාන රාජ්‍ය සංචාරයේ දී, ඉරාන ජනාධිපති අතිගරු හසන් ෙරෙයිඩම් රොහානි සමග පැවැති ද්විපාර්ශ්වික සාකච්ඡා සහ අති උතුම් අධ්‍යාත්මික නායක අයතුල්ල අල් කමේනි සමග පැවැත්වූ හමුව, පැරණි ඉතිහාසය හා සංස්කෘතිය කෙරෙහි අවධානය යොමුකරමින් අනෝන්‍ය කරුණු, නූතන දේශපාලනය හා රාජ්‍යතාන්ත්‍රිකත්වය පිළිබඳ සියලුම ගැටළු මත පදනම් විය. සමාජ දේශපාලන, ආර්ථික හා වෙළඳ, ආයෝජන, කෘෂිකර්ම, ධීවර, ජල ජීවී, කිරිගව පාලනය, සංචාරක, රෙදිපිළි කර්මාන්තය, ආරක්ෂක, දුම්රිය, සිවිල් ගුවන් සේවා හා සෘජු ගුවන් සම්බන්ධකතා ස්ථාපනය කිරීම පිළිබඳ ක්ෂේත්‍රයේ සහයෝගිතාවය ඉහළ නැංවීම පිළිබඳ දෙපාර්ශ්වයම සාකච්ඡා පැවැත්වීය.
- රාජ්‍ය සංචාරයේ දී ගන්නා ලද තීරණ වලදී පසු විපරම් කටයුතු සිදු කරන ලදි.
- ඉරානයෙන් මූල්‍යාධාරවලින් ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති.
    i. ග්‍රාමීය විදුලි ව්‍යාපෘතිය (RE 8) : මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතියි.
    ii. උමා ඔය බහුකාර්ය ව්‍යාපෘතිය : මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතියි.
- ඉරාන වෙළෙන්දන් සමග පැවති සාකච්ඡාවන්ගේ ප්‍රතිඵලයන් හී එකක් ලෙස, ඉරානයෙන් සන්ජන් නුවර පිහිටි අපනයන මධ්‍යස්ථානයේ අපගේ ද්විපාර්ශ්වික වෙළඳ කටයුතු සඳහා වර්ග අඩි 500 ක් ඉඩකඩ (නොමිලේ) ලබා දීමට පුද්ගලික අපනයන ප්‍රදර්ශන සමාගමක් (කැස්පියන් ජාත්‍යන්තර ප්‍රදර්ශන සමාගම)විසින් එකඟතාවය පළකර ඇත.

අසර්බයිජානය

- 2018 ජූනි මස 4-6 දක්වා පැවැති ජන්ද විමසීමේ දී ශ්‍රී ලංකා අපේක්ෂකත්වයට අසර්බයිජානයෙන් ලැබුණ සහයෝගයට ප්‍රතිචාර වශයෙන්, සියලුම සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අයිතීන් සුරක්ෂිත කිරීමේ කමිටුවේ (CMW) 2018-2021 වාරයට යළි තේරී පත්වීම සඳහා වූ අසර්බයිජාන අපේක්ෂකත්වයට ශ්‍රී ලංකාව සහයෝගය ලබාදුනි.
- අසර්බයිජානය වෙත සමගාමිව අක්තගන්වන ලද අසර්බයිජානයේ ඉල්හාන් අලියෙව් මැතිතුමා ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙස සිය අක්තපත්‍රය 2018 අගෝස්තු මස 08 වැනි දින ඉරානය වෙනුවෙන් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වෙත භාර දුනි.

ටර්ක්මෙනිස්ථානය

- ටර්ක්මෙනිස්ථානය වෙත සමගාමිව අක්තගන්වන ලද ටර්ක්මෙනිස්ථානයේ ගුල්ෂට් මැමෙඩෝවා මැතිනිය ශ්‍රී ලංකා තානාපතිවරිය ලෙස සිය අක්තපත්‍රය 2018 අප්‍රේල් මස 16 වැනි දින ටර්ක්මෙනිස්ථානය වෙනුවෙන් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වෙත භාර දුනි.

3. ඉරාකය

අ. ද්විපාර්ශ්වික සබඳතා

- ඉරාකයේ බැග්ඩෑඩ් හී පැවැති හරිත කලාපයේ සන්නද්ධ හමුදා දිනය සැමරීමේ උත්සවයේ මල්කළඹක් තැබීමට සහභාගි විය.
- ආසියා ඕඑස් ආයතනයේ නව අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමල් අල්රුබායී මහත්මිය හා නව සන්ධාන ප්‍රධානී අම්බ් අල් මන්හල් අල් ෂෆී සමග තානාපතිවරයා සාකච්ඡා පවත්වා ඇත.
- කුර්දිස්තාන් කලාපය සමග වෙළඳ හා සංචාරක කටයුතු වැඩිදියුණු කිරීම සඳහා ආචාර්ය අහමඩ් ජලාල් සමග රැස්වීමක් පැවැත්වීය.
- ආබාධිත රණවිරුවන් රැකබලා ගැනීම ගැන සාකච්ඡා කිරීමට ඉරාක දූත පිරිසක් තානාපතිවරයා හමුවිය.
- ශ්‍රී ලංකාවේ තේ සහ සංචාරක කටයුතු පිළිබඳ අවධාරණය කළ සම්මුඛ පරීක්ෂණයක් තානාපතිතුමා පවත්වන ලදී.
- ඉරාකයේ රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් පුහුණු කිරීම සඳහා අමතර අවස්ථාවන් ඉරාකය විසින් ඉල්ලා සිටියේය.
- ආර්ථික තාක්ෂණික සහයෝගිතා රැස්වීම සඳහා ඉරාක ශ්‍රී ලංකා ඒකාබද්ධ කමිටුවේ 8 වැනි සැසිවාරයේ ප්‍රගතිය තානාපතිවරයා සාකච්ඡා කළේය.
- ISIS සංවිධානය විසින් යුද්ධයේ ආයුධයක් ලෙස යොදාගත් ලිංගික හිංසනය සම්බන්ධයෙන් බැග්ඩෑඩ් හි තානාපතිවරුන් දැනුවත් කරන ලදී.
- කුර්දිස්තාන් ප්‍රදේශයෙන් විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් 5 දෙනෙකු හුවමාරු කර ගැනීමට යෝජනාවක් ඉදිරිපත් කරන ලදී.
- 2018 ජූලි 23 දින සිට දින හතරක් තානාපතිවරයා කුර්දිස්තාන් ප්‍රදේශයේ සංචාරය කරන ලදී.
- තානාපතිවරයා විසින් කුර්දිස්තාන් ප්‍රාන්ත රාජ්‍ය අමාත්‍යවරුන් කිහිප දෙනකු සමග රැස්වීම් පැවැත්වීය.
- තානාපති කාර්යාලය ආරක්ෂා කිරීම පිණිස ආරක්ෂක පියවර පිළිබඳව විදේශ කටයුතු අමාත්‍යාංශයේදී තානාපතිතුමා සාකච්ඡා කරන ලදී.
- ආසියා ඕඑස් ආයතනයේ නව අධ්‍යක්ෂ ජනරාල් අම්සාඩ් ජාවාඩ් කිංඩෙල් සමග තානාපතිවරයා සාකච්ඡා පවත්වා ඇත.

- ආර්ථික තාක්ෂණික සහයෝගිතාව සඳහා ශ්‍රී ලංකා - ඉරාක කමිටුවේ 9 වැනි සැසිවාරය සඳහා ඉරාකයේ බැග්ඩෑඩ්හි විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් නව දිනයන් ඉල්ලා සිටියේය.
- බැග්ඩෑග්හි විදේශ කටයුතු අමාත්‍යාංශයේ බෝම්බ ප්‍රහාරය පිළිබඳ 9 වන සැමරුම් උත්සවය සඳහා තානාපතිවරයා සහභාගී විය.
- ඉරාකයේ සිවිවන පාර්ලිමේන්තුවේ සමාරම්භක සැසිවාරයට තානාපතිවරයා සහභාගි විය.
- 70 වන නිදහස් දිනය බැග්ඩෑග්හි දී සමරනු ලැබීය.
- ඉරානයේ 39 වන සංවත්සරය සැමරීම සඳහා තානාපතිවරයා සහභාගී විය.

ආ. බහුපාර්ශ්වීය සබඳතා

- එක්සත් ජාතීන්ගේ ඉරාක ආධාර මෙහෙවරෙහි ප්‍රධානියා විසින් කැඳවනු ලැබූ සියලූ රාජ්‍ය තාන්ත්‍රිකයින්ගේ රැස්වීමට තානාපතිවරයා සහභාගී විය.
- ඉරාකයේ නැවත ඉදිකිරීම සඳහා ජාත්‍යන්තර සමුළුවට තානාපතිවරයා සහභාගි විය.
- මහා මැතිවරණය සඳහා නව තාක්ෂණය සම්බන්ධයෙන් සියලුම රාජ්‍යතාන්ත්‍රිකයන් සඳහා එක්සත් ජාතීන්ගේ ඉරාක ආධාර මෙහෙවරෙහි ප්‍රධානියා විසින් සාකච්ඡාවක් පවත්වන ලදී.
- මැතිවරණ කොට්ඨාශ, දේශපාලන හා මානව හිමිකම් පිළිබඳ සියලු රාජ්‍ය තාන්ත්‍රිකයින් සඳහා එක්සත් ජාතීන්ගේ ඉරාක ආධාර මෙහෙවරෙහි ප්‍රධානියා විසින් සාකච්ඡාවක් පවත්වන ලදී.
- ඉරාකයේ උත්තරීතර ඉස්ලාමීය කවුන්සිලය විසින් සංවිධානය කරන ලද සමුළුව සඳහා තානාපතිවරයා සහභාගි විය.

ඇ. ආර්ථික සබඳතා හා විදේශීය ආයෝජන

- ශ්‍රී ලංකා තානාපතිවරයා විසින් බැග්ඩෑග් හි වැදගත් තේ ආනයනකරුවෙක් වන හයිඩර් අබ්බාස් මහතා හමුවිය.
- තානාපතිවරයා බැග්ඩෑඩ්හි ප්‍රධාන පෙළේ සංචාරක නියෝජිතයන් වන මොහොමඩ් මාෂ් මහතා සහ ලුමා සෝබි ජුඩේ මහත්මිය යන දෙපළ සංචාරක පැකේජ සංවිධානය කිරීම සඳහා හමුවිය.
- ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් 2017 වර්ෂයේ දී ඉරාකය දෙවන විශාලතම සිලෝන් තේ ආනයනකරු බවට තහවුරු කළේය.
- 2018 වර්ෂයේ දී (පළමු මාස අට ඇතුලත) ඉරාකය, අංක 1 සිලෝන් තේ ආනයනකරු බවට පත්ව ඇත.
- කුර්දිස්තාන්හි අපගේ නිර්වේතනික කොන්සල්වරයාගේ මූලිකත්වයෙන් ව්‍යාපාරික දූත පිරිසක් ශ්‍රී ලංකාවේ සංචාරය කළේය.

- ඉරාක සංචාරක ප්‍රදර්ශනය සඳහා අරාබි භාෂාවෙන් සකස් කරන ලද සංචාරක පොත්පත් බෙදා දෙන ලදී.
- උන් කෂාර් වරායෙහි ප්‍රයෝජනය සඳහා යාත්‍රා 2 ක් තැනීමට කොළඹ ඩොක්යාර්ඩ් සමාගම තෝරාගෙන තිබේ.
- 2018 වර්ෂයේ දී ශ්‍රී ලංකා ආයෝජන හා ව්‍යාපාරික කතිකාවතට නියෝජිත පිරිසක් සහභාගී විය.
- කුර්දිස්තාන් කලාපයේ සිලෝන් තේ වෙළඳාම වැඩිදියුණු කිරීම සඳහා සාකච්ඡාවක් පැවැත්විණි.
- තානාපතිතුමා විසින් Erbil වාණිජ මණ්ඩලය හා සුලෙයිමනියා වාණිජ මණ්ඩලය සමග රැස්වීම් පැවැත්වීය.
- විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ලබා දී ඇති වෙළඳ සහ සංචාරක ඉලක්කයන් සපුරා ගැනීමට ඉරාකයට කදිම අවස්ථාවක් ඇත.

ඈ. සංස්කෘතික සබඳතා

- සංස්කෘතික සිදුවීම් පිළිබිඹු කරමින් ශ්‍රී ලංකාව පිළිබඳ මිනිත්තු 44 වීඩියෝ වැඩසටහනක් විශාල තිරයක් මත ප්‍රදර්ශනය කෙරිණි.
- ඉරාක සංචාරක ප්‍රදර්ශනයේ දී ශ්‍රී ලංකාවේ සංස්කෘතික හා සංචාරක කටයුතු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන ලදී.

ඉ. කම්කරු සුභසාධනය

- කුර්දිස්තාන් කලාපයේ සංක්‍රමණික කම්කරුවන් මුහුණ දෙන ගැටළු පිළිබඳව තානාපතිතුමා සාකච්ඡා කළේය.
- ඉරාකය තුළ ශ්‍රී ලාංකික සංක්‍රමණික කම්කරුවන් සඳහා අවස්ථා 1150 ක් ලබා දීමට කටයුතු කරන ලදී.
- ඉරාකයේ ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන්ගේ ලැයිස්තුවක් සකස් කිරීම සඳහා තානාපති කාර්යාලය කටයුතු කරමින් ඇත.
- ඉරාකයේ කුර්දිස්තාන් ප්‍රදේශයේ රැකියා ඇණවුම් ශ්‍රී ලංකා බලධාරීන්ට ලබා දී ඇත.
- එම්බිල්හි සංක්‍රමණික සේවකයන්ගේ නවාතැන් පහසුකම් තානාපතිවරයා විසින් පරීක්ෂාවට ලක්කළ අතර ඒ පිළිබඳව කොළඹට වාර්තා කළේය.

4. ඊශ්‍රායලය

අ. ද්විපාර්ශ්වික සබඳතා

- ගුවන් හමුදාපති, එයර් මාර්ෂල් කේ.වී.බී. ජයම්පති මහතාගේ නායකත්වයෙන් යුත් ද්විත්ව සාමාජික නියෝජිත පිරිසක් 2018 පෙබරවාරි මස 09 වැනි දින සිට 13 දක්වා ඊශ්‍රායලයේ සංචාරයක නිරත විය.

- විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ප්‍රසාද් කාරියවසම් මහතා 2018 ජුනි මස 10 සිට 13 දක්වා ඊශ්‍රායලයේ සංචාර කළේය. 2018 ජුනි 12 වන දින පෙරුසලමේ පිහිටි විදේශ අමාත්‍යාංශයේ දෙවන දේශපාලන කතිකාවත සඳහා ශ්‍රී ලංකා නියෝජිත පිරිසට එතුමා නායකත්වය ලබාදුන්නේ ය. පළමුවන දේශපාලන සාකච්ඡාවලදී ගනු ලැබූ තීරණ දෙපාර්ශ්වයම සමාලෝචනය කළ අතර, කෘෂි, අධ්‍යාපන, උසස් අධ්‍යාපන, වෙළඳ, ආර්ථික, ආයෝජන, සංචාරක, ධීවර, ආරක්ෂක, ජලජ, නගර සැලසුම්, විදුලි සංදේශ සහ බලශක්ති අංශවල ද්විපාර්ශ්වික සම්බන්ධතා වැඩිදියුණු කර ගැනීමේ ආකාර සාකච්ඡා කරන ලදී. මෙම සංචාරය අතරතුර දී, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන ආරාධිත දේශකයා ලෙස 2018 ජූනි මස 11 වන දින පවත්වන ලද වාර්ෂික සමුළුවට සහභාගි විය.

- ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් කොමදෝරු සී.බී. ලැබ්රෝයිගේ නායකත්වයෙන් යුත් 17 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත කණ්ඩායමක් 2018 අගෝස්තු 03 සිට 15 දක්වා ඊශ්‍රායලයේ සංචාරයක නිරත විය.

- කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් බී බී විජයරත්න මහතාගේ මූලිකත්වයෙන් 20 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත පිරිසක්, නවීන කෘෂිකාර්මික තාක්ෂණ අධ්‍යයනය කිරීම සඳහා 2018 අගෝස්තු මස 15 වන දින සිට 21 වන දින දක්වා ඊශ්‍රායලයේ සංචාරයක නිරත විය.

ආ. බහුපාර්ශ්වීය සබඳතා

- ආසියානු සංවර්ධන බැංකුව සඳහා ඊශ්‍රායල් සාමාජිකත්වය. ආසියානු සංවර්ධන බැංකුවේ ඊශ්‍රායල සාමාජිකත්වයේ අයදුම්කිරීමට සහයෝගය ලබාදීමට ශ්‍රී ලංකාව තීරණය කර තිබේ.

- 2020 - 2022 යන කාල පරිච්ඡේදය සඳහා පරිපාලන හා අයවැය ප්‍රශ්න පිළිබඳ උපදේශක කමිටුව (ACABQ). නිව්යෝර්ක්හි දී 2019 නොවැම්බර් මාසයේ දී පැවැත්වීමට නියමිත එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනයේ 74 වැනි සැසිවාරයේ ඡන්ද විමසීමේදී ඊශ්‍රායල් අපේක්ෂකත්වය සඳහා සහයෝගය ලබාදීම ශ්‍රී ලංකාව විසින් තහවුරු කර ඇත.

ඇ. ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන

- ඊශ්‍රායලයේ සිට ශ්‍රී ලංකාව වෙත සංචාරක පැමිණීම් ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් ශ්‍රී ලංකාව සහ ඊශ්‍රායලය අතර කුලී පදනම මත ගුවන් ගමන් මෙහෙයවීම සම්බන්ධයෙන් ඊශ්‍රායල සංචාරක මෙහෙයවන්නන් සමඟ තානාපති කාර්යාලය සාකච්ඡා පැවැත්විය.

- ශ්‍රී ලංකාවෙන් ඊශ්‍රායලය වෙත රෙදිපිළි අපනයනය කිරීමේ හැකියාව සොයාබැලීම සඳහා ප්‍රමුඛතම ඇගළුම් ආනයනකරුවන්ගෙන් කෙනෙකු වන ෆොක්ස් සමාගම සමග තානාපති කාර්යාලය සාකච්ඡා පවත් වන ලදී.

- ඊශ්‍රායල් වෙළඳපොළේ කුළුබඩු, පොල් නිෂ්පාදන, තේ සහ වෙනත් දෑ වැනි ශ්‍රී ලාංකික නිෂ්පාදන හඳුන්වාදීම සඳහා තානාපති කාර්යාලය විසින්, සුපිරි වෙළඳසැල් කිහිපයක් සමග සාකච්ඡා පැවැත් විය. සාකච්ඡාවෙන් පසුව, ආහාර නිෂ්පාදන සඳහා කොෂර් සහතිකය තිබිය යුතු බව අප හට දැනුම් දුන්හ. ශ්‍රී ලංකාව සමග සංසන්දනය කිරීමේදී මිල ගණන් ඉතා අඩු බැවින් එම නිෂ්පාදන තායිලන්තය, වියට්නාමය සහ පිලිපීනයේ සිට එම භාණ්ඩ ආනයනය කරන බව ඔවුහු පැවසූහ.

- 438 වන ජාත්‍යන්තර කලා හා ශිල්ප කලා උත්සවය 2018 අගෝස්තු මස 06 වන දින සිට 18 වන දින දක්වා පේරුසලමේ දී පැවැත් විය. තානාපති කාර්යාලයේ ආරාධනයකට අනුව, ශ්‍රී ලංකාවේ සමාගම් දෙකක් වන රන් රුවන් සමාගම (පුද්.) සහ බ්ලු ස්ටාර් සමාගම මෙම උත්සවයට සහභාගි වූ අතර ශ්‍රී ලාංකේය කලා හා අත්කම් භාණ්ඩ ඊශ්‍රායල් ජාතිකයන්ට ප්‍රදර්ශනය කළේය.

- 24 වන වාර්ෂික අන්තර්ජාතික මධ්‍යධරණීය සංචාරක වෙළඳපොළ 2018 (IMTM 2018) 2018 පෙබරවාරි 06-07 දක්වා පැවැත්වුණි. තානාපති කාර්යාලය IMTM 2018 (අන්තර්ජාතික මධ්‍යධරණීය සංචාරක වෙළඳපොළ 2018) තවත් රටවල් 50 ක් සමග මේ සඳහා සහභාගී වූ අතර සහ ආසන්නවශයෙන් නරඹන්නෝ 25,500 ක් පමණ මෙම ප්‍රදර්ශන මධ්‍යස්ථානයට පැමිණියහ.

- මෙම වසර තුළ දී, පැමිණිලි නිරාකරණය කිරීම සඳහා තානාපති කාර්යාලය වෙත වෙළඳ පැමිණිලි 02 ක් ලැබුණු අතර ඊශ්‍රායල් - ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය මෙහි සම්බන්ධීකරණය සිදුකළේය.

- තානාපතිවරයා විසින් ශ්‍රී ලංකා - ඊශ්‍රායලයේ වාණිජ මණ්ඩල සභාපතිවරයා ද පේරුසලමේ ශ්‍රී ලංකා සඳහා නිර්වේතනික කොන්සල්වරයා ද අනෙකුත් අනාගත ආයෝජකයින් ද හමුවී ශ්‍රී ලංකාවේ ආයෝජන වාතාවරණය, ප්‍රවාහන, සංචාරක හා යටිතල පහසුකම් පිළිබඳ පැහැදිලි කර දුන්හ.

ඈ. සංස්කෘතික සබඳතා

- සිංහල හා හින්දු අලුත් අවුරුද්ද පේරුසලමේ දී 07 වැනි දා සමරනු ලැබීය.

- චාන්සරි හි ශ්‍රී ලාංකික හා ඊශ්‍රායල් භික්ෂූන් වහන්සේලාගේ සහභාගීත්වයෙන් වෙසක් උත්සවය අප්‍රේල් මස 29 වන දින සමරනු ලැබීය.

- වෙසක් සීල වැඩසටහන 2018 මැයි 05 දින ටෙල් අව්විහි දී පවත්වන ලදී.

- 2016.05.10 දින ටෙල් අවිවිහි ශ්‍රී ලංකා ප්‍රජාව විසින් සංවිධානය කරන ලද සංස්කෘතික වැඩසටහන්.
- ටෙල් අවිව් හිදී 2018 මැයි 12 වන දින වෙසක් උත්සවය සංවිධානය කරන ලද්දේ ටෙල් අවිවිහි ශ්‍රී ලංකා ප්‍රජාව විසිනි.
- පොසොන් උත්සවය 2018 ජූනි මස 30 දින තානාපති කාර්යාල පරිශ්‍රයේ දී සමරනු ලැබීය.
- 2018 ජූලි මස 28 වන දින ටෙල් අවිවිහි තානාපති කාර්යාලයේ කාර්ය මණ්ඩලය සහභාගීත්වයෙන් ආගමික වැඩසටහනක් පවත්වන ලදී. ස්විට්සර්ලන්තයේ වෙසෙන ශ්‍රී ලාංකික භික්ෂූන් වහන්සේලා දෙනමක් මෙම වස් පින්කම් වැඩසටහනට සහභාගි වූ අතර, තාවකාලික මෙම විහාරය පටිවේද විහාරය ලෙස නම් කරන ලදී.
- 2018 අගෝස්තු 18 වන දින ටෙල් අවිවිහි ශ්‍රී ලංකා ප්‍රජාව විසින් පොසොන් වැඩසටහන සංවිධානය කරන ලදී.
- තානාපති කාර්යාලය නේවාසිකාගාරයේ දී දෙසැම්බර් 28 වන දින දානමය උත්සවයක් සංවිධානය කරන ලදී.
- 70 වැනි ශ්‍රී ලංකා නිදහස් දිනය 2009 පෙබරවාරි 04 වන දින තානාපති කාර්යාල පරිශ්‍රයේදී පවත්වන ලදී.

ඉ. කම්කරු සුභසාධනය

- තානාපති කාර්යාලය මගින් ශ්‍රී ලංකා සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ යහපත උදෙසා 2012.02.18 දිනදී හයිෆාහි එක් දින ජංගම සේවාවක් සංවිධානය කරන ලදී. SLBFE ලියාපදිංචි කිරීම් 34 ක් සිදු කරන ලදී. පුද්ගලයින් 11 දෙනෙකු සඳහා විදේශ ගමන් බලපත්‍ර ඉල්ලුම්පත් නිකුත් කර, එක් නව විදේශ ගමන් බලපත්‍රයක් ලබා දුනි.
- 'ඊශ්‍රායල් රාජ්‍යයේ සෘතුමය කෘෂිකාර්මික කටයුතුවල මාස 5 සිට 8 දක්වා කාලයක් නියලීම සඳහා සෘතුමය කෘෂිකාර්මික සේවකයින් බඳවා ගැනීම සඳහා ඊශ්‍රායල් රාජ්‍යයේ PIBA ආයතනය සහ ශ්‍රී ලංකා රජයේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය අතර කටයුතු සංවිධානය කිරීමේ' ආණ්ඩු ද්විත්වය අතර වැඩසටහන යටතේ, සෘතුමය කෘෂිකාර්මික කම්කරුවන් 257 දෙනෙක් ඊශ්‍රායල් රාජ්‍යයට පැමිණියේය.
- 'ඊශ්‍රායලයේ වැඩිහිටි ආබාධිත වූ සේවායෝජකයන් හට ශ්‍රී ලංකාවෙන් රැකබලාගැනීමේ සේවකයින් 50 දෙනකු බඳවා ගැනීමට හා ස්ථානගතකිරීමේ' ආණ්ඩු ද්විත්වය අතර ඒකාබද්ධ නියමු වැඩසටහන යටතේ රැකබලාගන්නන් 10 දෙනෙකු පැමිණියේය.
- සිය රැකියා සම්බන්ධ ගැටළු විසඳා ගැනීම සඳහා ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන් 169කට සහාය විය. රෝහල්ගත කරන ලද ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයින් 08

දෙනෙකුට සහය විය. රැඳවුම් මධ්‍යස්ථාන වල රැඳී සිටින හා සිරගත වූ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් 04 දෙනෙකුට සහය විය. තානාපති කාර්යාලයේ නිලධාරීන් අසනීපව මානසික පසුබෑමට ලක්ව සිටි සෑතුමය කෘෂිකාර්මික ශ්‍රමිකයකු ශ්‍රී ලංකාවට ආපසු යැවීය.

- ඊශ්‍රායලයේ විශේෂිත ශ්‍රම වෙළෙඳ පොළේ අංශයන්ගේ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ තාවකාලික රැකියා පිළිබඳ කෙටුම්පත කළ ගිවිසුම ඊශ්‍රායලයේ විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා බලධාරීන්ට වෙත ඉදිරිපත් කළ අතර ඒ පිළිබඳ ශ්‍රී ලංකා පාර්ශ්වය සලකාබලමින් සිටියි.

- ඉහත මානව ගිවිසුම සඳහා කෙටුම්පත්ගත ක්‍රියාත්මක කිරීම, රැකබලාගන්නන්ගේ අංශයේ නියමු වැඩසටහන පුළුල්කිරීමක් ලෙස සලකා, ඊශ්‍රායල් බලධාරීන් විසින් ඉදිරිපත් කර ඇති අතර ඒ පිළිබඳ ශ්‍රී ලංකා පාර්ශ්වය සලකාබලමින් සිටියි.

- පේරුසලමේ දී 2018.09.13 වෙනිදා ඊශ්‍රායලයේ සංචාරය කළ සංචාරකයෙක් වන අභාවප්‍රප්ත ටී.එච්.ඩී. වයලට් විනිප්රඩ් මහත්මියගේ දේහය සිට රටට ගෙන්වාගැනීම. ඇයගේ දේහය ජී 778 ගුවන් යානයෙන් 2018.09.18 දින යළි ශ්‍රී ලංකාවට ගෙන්වා ගන්නා ලදී.

5. ජෝර්දානය

අ. ද්විපාර්ශ්වික සබඳතා

- තානාපතිවරයා විසින් ජෝර්දානයෙහි විදේශ කටයුතු අමාත්‍යාංශයේ මහ ලේකම් ගරු. සයිඩ් අල් ලූසි මැතිතුමා 2012.01.08 දින හමු වූ අතර, විදේශ කටයුතු අමාත්‍ය මට්ටමේ අනෝන්‍ය සංචාරයක් පිළිබඳව සාකච්ඡා කළේය.

- තානාපතිවරයා විසින් ශ්‍රී ලංකා ජාතික දිනයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස බාමාමා කුමරියට ආරාධනා කිරීම පිණිස 2015.01.15 දින බෑස් කුමරිගේ කාර්යාලයේ මයී මහත්මිය හමුවිය.

- තානාපතිවරයා විසින් සිලිකන් විද්‍යුත් තාක්ෂණ ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂ රහද් සුල්තාන් මහතා, සෙයිඩ් රයිද් අල් හුසේන් මහතාගේ සොහොයුරා හා මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ හිටපු මහ කොමසාරිස්වරයා 2018.02.15 දින හමුවිය.

- පුද්ගලනාශක බිම් බෝම්බ තහනම් කිරීමේ සම්මුතිය පිළිබඳ විශේෂ නියෝජිත රාවඩ් ෂෙයිඩ් අල් හුසේන් කුමරා 2018 මාර්තු 05-07 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරය කළේය. එතුමන් විසින් අතිගරු ජනාධිපතිතුමා, ගරු අගමැති හා ගරු විදේශ කටයුතු ඇමතිවරයා බැහැදැකීය. එතුමා පුනරුත්ථාපන හා නැවත පදිංචිකිරීම් අමාත්‍ය ඩී.එම්. සුමන්තිරන් මැතිතුමා සමග එක්ව උතුරු පළාතේ සංචාරයක නිරත විය.

- තානාපතිතුමා විසින් ශාක ආරක්ෂණ සහ පොහොර නිෂ්පාදන අධ්‍යක්ෂ කාර්යාලයේ අධ්‍යක්ෂ ඉංජිනේරු, කෝලුඩ්.ඒ.ආරන්කි මහතා හමුවී ශ්‍රී ලාංකික පළතුරු සම්බන්ධයෙන් ජෝර්දාන බලධාරීන් විසින් නිකුත් කරන ලද තහනම පිළිබඳව සාකච්ඡා කළේය.

- ගරු. විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය වසන්ත සේනානායක මහතා 2012 මැයි 09 සිට 11 දක්වා ජෝර්දානයේ සංචාරය කළේය. අම්මාන් වාණිජ මණ්ඩලයේ සභාපති, ජෝර්දාන සංචාරක මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ ශ්‍රී ලංකා ඇගලුම් කම්හල් හිමියන්, ප්‍රධාන විධායක නිලධාරීන් සහ මානව සම්පත් කළමනාකරුවන් සමග සාකච්ඡා පැවැත්විය. මීට වසර කිපයකට පෙර නතර වී තිබූ රාජකීය ජෝර්දානය නොනවතින ගුවන්ගමන් කොළඹ දක්වා නැවැත ආරම්භ කිරීමටත්, ජෝර්දානයට වැඩිවශයෙන් අර්ධ පුහුණු හා පුහුණු ශ්‍රමිකයන් බඳවාගැනීමටත් සාකච්ඡා විය.

- තානාපතිතුමා විසින් 2018-2022 දක්වා කාලය තුළ යුනෙස්කෝහි අස්පෘෂ්‍ය සංස්කෘතික උරුමයන් සුරක්ෂිත කිරීම පිළිබඳ අන්තර් රාජ්‍ය කමිටුව සඳහා ශ්‍රී ලංකා අපේක්ෂකත්වයට සහයෝගය අපේක්ෂාකරමින් විදේශ කටයුතු අමාත්‍යාංශයේ ආසියානු අංශයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය මහාර් තාරෝන් මහතා හමුවිය.

- තානාපතිවරයා විසින් ජෝර්දානය අභ්‍යන්තර කටයුතු අමාත්‍යතුමිය හමුවූ අතර ශ්‍රී ලාංකිකයින් සඳහා පොදු සමාවක් ලබා දීම පිළිබඳ සාකච්ඡා කළේය.

ඇ. ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන

- තානාපතිවරයා විසින් 22.02.2018 දින අම්මාන් වාණිජ මණ්ඩලයේ සභාපති, ඉස්සා මුරඩ් මහතා හමුවිය.

- තානාපතිවරයා විසින් අල් මට්ටෝඩෝ අන්තර්ජාතික වෙළඳ ආයතනයේ පොදු ආයෝජන හා වෙළඳ කටයුතු සභාපති, මජීඩ් මෙහෙනාඩි මහතා 28.02.2018 දින හමු විය. ලංසු නිවේදන ඔහුට ලබා දී ඇති අතර, අමාත්‍ය හරින් ප්‍රනාන්දු මහතා සමග රැස්වීමක් එතුමාගේ ජෝර්දාන නිල සංචාරයේ දී 2018.02.20 දින පැවැත්වීමට කටයුතු යොදා ඇත.

- ජෝර්දාන් වාණිජ මණ්ඩලයේ සභාපති සැන්ටේටර් නයෙල් අල් කබාරිටි මහතා හමුවූ අතර ශ්‍රී ලංකා 'ආර්ථික කලාපය' සඳහා ජෝර්දානු වෙළඳ නියෝජිත කණ්ඩායමක් පිළියෙල කිරීම සම්බන්ධයෙනුත්, ලංකා වාණිජ මණ්ඩලය සමග අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීමටත් තානාපතිවරයා සාකච්ඡා පැවැත්විය.

- 10 වන ජෝර්දාන් ආර්ථික සංසඳයේ ක්‍රොවන් ප්ලාසා / මළ මුහුදු පිළිබඳ මැද පෙරදිග කලාපයේ බොලොක් චේන් හා ෆින්ටෙක් සමුළුව විවෘත කිරීමේ උත්සවයට තානාපතිවරයා සහභාගි විය.

- තානාපතිවරයා 2018.04.25 දින වෘත්තීය සමිති සම්මේලනයෙහි මැසෙන් මයලා මහතා හමුවිය.

- තානාපතිවරයා 2018.05.27 දින ජෝර්දාන් ගාමන්ට්ස්, උපාංග සහ රෙදිපිළි අපනයනකරුවන්ගේ සංගමයේ සභාපති හුසම් සාලේ මහතා හමුවූයේ දීය.

- තානාපතිවරාය අම්මාන් වාණිජ මණ්ඩලයේ නිළධාරීන් වන මාර්වාන් ගයිත් සහ රියාඩ් අල් සයිෆි යන මහත්වරුන් හමුවීමට අම්මාන් වාණිජ මණ්ඩලය වෙත සිව් වතාවක් සංචාරය කළහ.

- 2018.08.13 දින ලංකා සහ ජෝර්දාන් වෙළඳ සබඳතා පිළිබඳ සභාපති මොහාන්නාඩ් එච්. ටුබට් මහතා ශ්‍රී ලංකා තානාපතිවරයාව හමු වූ අතර ශ්‍රී ලංකා උල්පත් ජලය සහ කුළු බඩු ආනයනය පිළිබඳව සාකච්ඡා කළේය. ශ්‍රී ලංකාවේ පිහිටි නකල්ස් ජල සමාගම සමග සම්බන්ධතා ඇති කර ගැනීමට ද පහසුකම් සැලසීය.

- ජෝර්දානයේ ව්‍යාපාරිකයින්ට ශ්‍රී ලාංකේය නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම හා හඳුන්වාදීම අරමුණින් ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් තානාපති කාර්යාල පරිශ්‍රයේ දී වෙළෙඳපල කඩමණ්ඩියක් සැප්තැම්බර් මස 07 සහ 08 යන දිනයන් හිදී සංවිධානය කර ඇත.

- තානාපතිවරයා විසින් තලල් අබු හසෙල් සංවිධානයේ (TAG-Org) සභාපති සෙනාලාල් තලාල් අබු හසීලේ මහතා හමුවිය. මෙම සංවිධානය බුද්ධිමය දේපල ලියාපදිංචි කිරීමේ හා ආරක්ෂා කිරීමේ (IPRP) ක්ෂේත්‍රයේ වෘත්තීමය සේවා සපයන සමාගම්වල විශාලතම ගෝලීය සමූහය වේ. TAG-Org සංවිධානය මෑතකදී ශ්‍රී ලංකාව තුළ IPRP හි ශාඛාවක් පිහිටුවීම සඳහා ශ්‍රී ලංකාවට ඩොලර් 200,000 ක් ලබා දෙන ලදී.

- තානාපතිවරයා ඕෂන් සී පුඩ් රෙස්ටෝරන්ට් ආයතනයේ සභාපතිතුමා හමුවිය. මුහුදු ආහාර ආපනශාලා ආයතනය මගින් ජෝර්දානයේ මුහුදු ආහාර ආපන ශාලා 25 ක් සහ මුහුදු ආහාර වෙළඳ කවුළු 22 ක් මෙහෙයවන අතර ශ්‍රී ලංකාවෙන් මුහුදු ආහාර ආනයනය කිරීම පිළිබඳව සාකච්ඡා කර ඇත.

ඈ. සංස්කෘතික සබඳතා

- 500 දෙනෙකුට අධික පිරිසකගේ සහභාගිත්වයෙන් 2018 ජාතික දිනය සැමරීම සම්බන්ධයෙන් ශ්‍රී ලාංකික සංස්කෘතික නැටුම් සංවිධානය කරන ලදී.

- 2018 සංහිඳියාව සඳහා වූ ජාතික සතිය පැවැත්විණි.

- මෙහෙවර සිංහල හා හින්දු අලුත් අවුරුද්ද, වෙසක්, පොසොන් හා පාස්කු උත්සවය සමරමින් ශ්‍රී ලාංකිකයින් විශාල පිරිසක් හා බහු ආගමික සම්භාවනීයන් සහභාගී වූහ.

- ශ්‍රී ලංකාවෙන් ආරාධිත භික්ෂූන් වහන්සේලා හරහා ශ්‍රී ලාංකික ඇඟලූම් කම්හල් සේවකයින් සඳහා ආගමික සහ අධ්‍යාත්මික සේවාවන් සපයන ලදී. තානාපති කාර්යාලය මගින් බෞද්ධ ආගමික උත්සව හතරක්, කිතුනු ආගමික උත්සව දෙකක්, හින්දු ආගමික උත්සව එකක් සහ ඉස්ලාම් ආගමික උත්සව එකක් සංවිධානය කර තිබේ.

- අල් වක්ලට් වීදියේ දී ශ්‍රී ලාංකික සාම්ප්‍රදායික උත්සව 40 කට අධික ප්‍රමාණයක් ඉදිරිපත් කිරීමටත්, ප්‍රවර්ධනය කිරීමටත්, ශ්‍රී ලාංකික සංස්කෘතික පෙරට්ටුවක් තානාපති කාර්යාල මගින් සංවිධානය කරන ලදී.

ඉ. කම්කරු සුභසාධනය

- තානාපතිවරයා 2011.02.28 දින කම්කරු අමාත්‍ය ආචාර්ය අලි අල් හසාවි මහතා හමු වූ අතර ගිවිසුම්ගත සංවර්ධනයේ දී ශ්‍රමය අපනයන හා ආනයනය කිරීම හා එවැනි ශ්‍රමය ස්ථානගත කිරීම සම්බන්ධ ගැටළු සඳහා විසඳුම් සොයා ගැනීමේ ආකාර හා මාධ්‍යයන් සංවර්ධනය කිරීම හා පොදු සමාව පිළිබඳ ගිවිසුම් අළුත්කිරීම සාකච්ඡා කෙරිණි.

- තානාපතිවරයා ජෝර්දානයේ IOM හි ප්‍රදේශීය ප්‍රධානී එන්රිකෝ පොන්සිආනි මහතා හමුවූ අතර, පොදු සමාව ප්‍රකාශයට පත් කිරීම සඳහා ඔහුගේ සහාය ලබා ගත්තේය.

- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිත පිරිසක් 2018 අගෝස්තු 14 දින මිනිස් ජාවාරම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනකට ජෝර්දානයේ සංචාරය කළ අතර, ජෝර්දානයේ කම්කරු අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවතින සංක්‍රමණිකයන් සඳහා තම්කීන් නීති ආධාර හා පුද්ගල ජාවාරම් විරෝධී අංශයේ සංචාරය කළේය .

- ගරු. විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් සහ විදේශ රැකියා පිළිබඳ අමාත්‍ය හරින් ප්‍රනාන්දු මහතා 2018 අගෝස්තු මස 19 වන දින ජෝර්දානය වෙත ගොස් ජෝර්දානයේ බඳවා ගැනීමේ නියෝජිතයින්ගේ සංගමයේ විධායක කමිටු සාමාජිකයන් හා ඇඟලුම් කර්මාන්තශාලා හිමියන් සමග සාකච්ඡා කළේය. එතුමා වැඩ තත්වයන් නිරීක්ෂණය කිරීමට ඇඩ් දුලේයිල් ප්‍රදේශයේ පිහිටි මැලිබන් ඇඟලුම් කර්මාන්තශාලාවේ සංචාරයක නිරත වූවේය.

- තානාපතිතුමා, කැමැල්, අෂිල්, හාමාස් සහ මැලිබන් වැනි ඇඟලූම් කර්මාන්තශාලාවල සංචාරය කළේය.

- ආරක්ෂිත සංක්‍රමණික වැඩසටහන යටතේ ශ්‍රී ලංකා නියෝජිත පිරිසක් 2018 සැප්තැම්බර් මස 17 වන දින රතු කුරුස සංවිධානයේ ජාත්‍යන්තර කමිටුව, ජාත්‍යන්තර සංක්‍රමණික සංවිධානට, ජාත්‍යන්තර සංක්‍රමණික නියෝජිතයින් සඳහා තම්මින්-නීති ආධාර ලබා දීම, කම්කරු අමාත්‍යාංශය, අරාබි සංක්‍රමණික සම්පත් මධ්‍යස්ථානය, බඳවා ගැනීමේ නියෝජිතයින්ගේ සංගමය හමුවීම සඳහා රැස්වීම සඳහා ජෝර්දානයේ සංචාරයක නියළිණ.

- ජෝර්දානයේ නීති විරෝධී ලෙස රැඳී සිටින ශ්‍රී ලාංකිකයින් 11 දෙනෙකු නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සඳහා දූත මණ්ඩලය සහාය විය.

- දූත මණ්ඩලය විසින් ජෝර්දානයේ මිනිස් ජාවාරම් විරෝධී ආයතන ප්‍රධානී, කම්කරු අධ්‍යක්ෂ යැසෙන් ජෙරා මහතා කැරිටාස්,රෙඩ් ක්‍රෙසන්ට් වැනි රාජ්‍ය නොවන

සංවිධාන,තම්කීන් හි විධායක අධ්‍යක්ෂිකා ලින්ඩා එම් අල්-කලාෂ් මහත්මිය සමග රැස්වීම් පැවැත්විය.

- කම්කරු නිලධාරීන් දෙනිකව කර්මාන්තශාලාවන් හි සංචාරය කරන අතර 2018 ජනවාරි මස සිට, හදිසි අවස්ථාවන්හි දී දෛනික සංචාර 36 ක් සහ හදිසි සංචාර 10 ක් සිදුකර ඇත.

- සංක්‍රමණිකයන් සඳහා සාධාරණ බඳවාගැනීම යන තේමාව යටතේ, ජෝර්දානයේ ඇඟලූම් අංශයේ මානව සම්පත් කළමණාකරණ සංසදය විසින් සංවිධානය කරන ලද 2018 ජූලි මස පැවැති සම්මන්ත්‍රණයක් සඳහා කම්කරු නිලධාරීන් සහභාගි විය.

- මසකට වරක් දූත මණ්ඩල නිලධාරීන් විසින් සිර මැදිරිවල සංචාර සිදු කරන ලදී.

6. කුවේට්

අ. ද්විපාර්ශ්වික සබඳතා

- 2018 ජූලි මස 22-25 දක්වා කුවේට්හි ආසියානු කටයුතු සඳහා විදේශ කටයුතු සහකාර අමාත්‍ය ගරු අලි සුලෙයිමාන් අල් සයිඩ් මහතා ශ්‍රී ලංකාවේ සංචාරය කළේය. එතුමා විසින් විදේශ කටයුතු අමාත්‍ය ගරු තිලක් මාරපන මහතා 2018 ජූලි මස 24 වන දින බැහැ දැක ඇති අතර විදේශ අමාත්‍යාංශයේ සහ අනෙකුත් රේඛීය අමාත්‍යාංශ / නියෝජිතායතන වල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමග කොළඹ පිහිටි විදේශ කටයුතු අමාත්‍යාංශයේ දී සාකච්ඡා පවත්වා ඇත. සංස්කෘතිය, මාධ්‍ය, අධ්‍යාපන, විද්‍යා හා තාක්ෂණ, ආයෝජන හා ශ්‍රමය යන ක්ෂේත්‍රවල අනාගත සහයෝගිතාව පිළිබඳව දෙපාර්ශ්වයම සාකච්ඡා කළහ. අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන කුවේට් අරමුදලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන ව්‍යාපෘති සඳහා ආධාර සැපයීමට ද ශ්‍රී ලංකාවේ අනාගත කුවේට් ආයෝජන සඳහා ද මෙහිදී සාකච්ඡාවට ලක් කෙරිණි. මොරගහකන්ද වාරිමාර්ග හා කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපෘතිය සහ මොරගොල්ල ජලවිදුලි ව්‍යාපෘතිය ඇතුළු ව්‍යාපෘති 15 ක් සඳහා කුවේට් ඩිනාර් මිලියන 77 ක් (ඩොලර් මිලියන 256 ක්) ණය ආධාර ලෙස ලබා දී ඇත. මෙම සාකච්ඡා මගින් 2018 ඔක්තෝබර් 09-11 දින දක්වා කුවේට් හී වෙළඳාම පිළිබඳ ශ්‍රී ලංකා-කුවේට් ඒකාබද්ධ කමිටුවේ 02 වන සැසිවාරය සඳහා පදනම වැටිණි. (1997 දී පැවැත්වූ පළමු රැස්වීමෙන් වසර 21ට පසුව)

- 2018 අප්‍රේල් මස 30 වන දින කුවේට්හි විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් පවත්වන ලද 'මානව හිමිකම් සඳහා සහයෝගය ලබාදීමේ දී පෞද්ගලික අංශයේ සමාජ වගකීම' පිළිබඳ සම්මන්ත්‍රණයේදී තානාපති කාර්යාලය මගින් ශ්‍රී ලංකා නියෝජනය කළේය.

- 2018 මාර්තු 22-26 දක්වා කුවේට් රාජ්‍යයේ ඇන්කාන් හා ඉස්ලාමීය කටයුතු අමාත්‍යාංශයේ ආරාධනය යටතේ ශ්‍රී ලංකා තැපැල්, තැපැල් සේවා සහ මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍ය අබ්දුල් හාලීම් මහතාගේ නිල සංචාරය සම්බන්ධීකරණය කිරීම.

- 2018 පෙබරවාරි, මාර්තු හා අප්‍රේල් මාසයන් හිදී විදේශ කටයුතු අමාත්‍යාංශය හා අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය රැස්වීම් පවත්වා ඇති අතර කුවේට් රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද මහා ක්ෂමා කාලයේ දී උපරිම ඵල නෙළා ගැනීමට සමත් විය.

ආ. බහුපාර්ශ්වීය සබඳතා

- 2018-2022 යන කාලසීමාව සඳහා අස්පෘෂය සංස්කෘතික උරුමය සුරක්ෂිත කිරීම සඳහා අන්තර් රාජ්‍ය කමිටුව වෙත ශ්‍රී ලංකාවේ අපේක්ෂකත්වය සඳහා වූ කුවේටය අනෝන්‍ය සහයෝගය ලැබුණි.

- 2018 ජූනි 23 වන දින සන්දිගන් කුවේට් ගෘහ සේවිකාවන්ගේ සංගමය (SKDWA) විසින් සංවිධානය කරන ලද 'ජාත්‍යන්තර ගෘහ සේවක දිනයේ දී' ශ්‍රී ලංකාව නියෝජනය කළේය.

- ආසියානු සහයෝගීතා කතිකාවතේ (ACD) පහත දැක්වෙන උත්සවයේ දී මෙම දූත මණ්ඩලය මගින් ශ්‍රී ලාංකිකයන්ගේ සහභාගිත්වය තහවුරු කළේය.

- 3 වැනි ACD සමුළුව, 2018 ඔක්තෝබර් 15, ටෙහ්රානය, ඉරානය
- 16 වැනි ආසියානු සංවර්ධන කමිටු රැස්වීම, 2018 ඔක්තෝබර් 14
- 2 වන පරිපූර්ණ හා තිරසාර සංවර්ධනය පිළිබඳ ACD ක්‍රියාකාරී කණ්ඩායම 2018 මාර්තු 12 සිට 13 දක්වා කුවේටයේ දී පවත්වයි.
- 2018 සැප්තැම්බර් 04-05 දක්වා, 3 වන ACD සංචාරක අමාත්‍ය සමුළුව, පැසිෆික් කලාපයේ සෝනර්ගාන් හෝටලය, ඩකා හිදී පවත්වයි
- ඇමෙරිකා එක්සත් ජනපදයේ 73 වැනි එක්සත් ජාතීන්ගේ මහා සභා රැස්වීමේ දී පැවැති ආසියා සහයෝගීතා කතිකාවතේ අමාත්‍යවරුන්ගේ රැස්වීම 2018 සැප්තැම්බර් 27 දින නිව් යෝර්ක් හි දී පැවැත්වීමට නියමිතය.
- ආසියානු බලශක්ති ආරක්ෂණය සහ සංක්‍රාන්ති සහයෝගීතා සංසදය, 2018 සැප්තැම්බර් 13 දින, බීජිං හි දී පවත්වයි.
- 'ආසියා සහයෝගීතා කතිකාවත සහ ආසියානු ප්‍රජාවගේ පොදු අනාගතය ගොඩනැගීම' පිළිබඳ සම්මන්ත්‍රණය, 2017 දෙසැම්බර් 8 දින, චීනයේ ගුවැන්ෂෝ හිදී පැවැත්වුණි.

ඇ. ආර්ථික සබඳතා හා විදේශීය ආයෝජන

- 2018 ඔක්තෝබර් 9 සිට 11 දක්වා කුවේට්හි පැවැති දෙවන ඒකාබද්ධ වෙළඳ කමිටු රැස්වීම පැවැත්වීම සඳහා කුවේට් අධිකාරීන් සමග සම්බන්ධීකරණය කර ඇත.

- 2018 ජනවාරි 27 දින පාම් බීච් හෝටලයේ පැවැති ආසියානු කඩමණ්ඩියට තානාපති කාර්යාලය සහභාගී වූ අතර 2018 මාර්තු මස 21 වන දින සහිඩ් උද්‍යානයේ පැවැති සරත් උත්සවයට ද සහභාගි විය.

- කුවේට් වෙළඳුන්ගේ ශ්‍රී ලංකා සංචාරය සංවිධානය කළ අතර ශ්‍රී ලාංකික අපනයනකරුවන් හමුවිය.
- වෙළඳ ආරවුල් රාශියක් විසඳා ඇත.

ඉ. සංස්කෘතික සබඳතා

- 2018 පෙබරවාරි 8 දින නිල නිවසේ පැවති ජාතික දින පිළිගැනීමේ උත්සවය.
- කුවේට්හි ජාත්‍යන්තර කාන්තා සංවිධානයේ සහයෝගිතාවය ඇතිව තානාපති කාර්යාලය මගින් 2018 මාර්තු 4 දින ක්‍රවුන් ප්ලාසා හෝටලයේ දී ශ්‍රී ලංකා දිනය සංවිධානය කරන ලදී.
- කුවේට්හි ශ්‍රී ලංකා අවමංගල අරමුදල සහ සමාජ සේවා සංගමය සහ ශ්‍රී ලංකා සංස්කෘතික සංගමය සමග එක්ව 2011 නොවැම්බර් 6 සහ 13 යන දිනවල නව අවුරුදු උත්සව දෙකක් සංවිධානය කරන ලදී.
- 2018 මැයි 3-4 දිනයන් හිදී තානාපති කාර්යාල පරිශ්‍රයේදී තානාපති කාර්යාලය විසින් වෙසක් දින වැඩසටහන් දෙකක් සංවිධානය කරන ලදී.
- 'ශ්‍රී ලාංකිකයන් වෙමු සමාජය' සමග එක්ව තානාපති කාර්යාලය විසින් 2018 ජූනි 28-29 දිනයන් හිදී දින දෙකක පොසොන් වැඩසටහන සංවිධානය කරන ලදී.
- 2018 ජූනි මස 1, 7, 8 යන දිනයන් හිදී තානාපති කාර්යාලය විසින් ශ්‍රී ලාංකික සම්භවයක් සහිත මුස්ලිම් ප්‍රජාව වෙනුවෙන් ඉෆ්තාර් වැඩසටහන් කිහිපයක් සංවිධානය කරන ලදී.
- 2018 අගෝස්තු 10-11 දිනයන් හිදී අත්තරගම පඤ්ඤාලංකාර නාහිමියන්ගේ විශේෂ ධර්ම දේශනාවක් සංවිධානය කරන ලදී.

ඊ. කම්කරු සුභ සාධනය

- ශ්‍රී ලංකා විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් සහ විදේශ රැකියා අමාත්‍යාංශය නියෝජනය කරන නියෝජිත පිරිසක් 2018 ජූලි 11 සිට 12 දක්වා කුවේට් රාජ්‍යයේ සංචාරය කළේය. මෙම නියෝජිත පිරිස කුවේට්හි පිහිටි රාජ්‍ය මිනිස්බල අධිකාරිය, ජාත්‍යන්තර සංක්‍රමණික සංවිධානය සහ රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක සහ බඳවා ගැනීමේ නියෝජිතායතනවල ජේෂ්ඨ නිලධාරීන් හමුවූහ.
- දූත මණ්ඩලය විසින් 2012 වර්ෂයේ දී අත්සන් කරන ලද කම්කරු, බඳවා ගැනීම් හා මිනිස් බල සංවර්ධන කටයුතු පිළිබඳ අවබෝධතා ගිවිසුම යටතේ, ඒකාබද්ධ කියාකාරී කණ්ඩායමක් පිහිටුවීම සම්බන්ධයෙන් කුවේට් හි රාජ්‍ය මිනිස්බල අධිකාරිය සමග සම්බන්ධ විය.
- මිනිස් ජාවාරම පිළිබඳ ගැටළු විසඳීමෙහිලා දූත මණ්ඩලය විසින් කුවේටයේ පිහිටි විදේශ කටයුතු අමාත්‍යාංශය, රාජ්‍ය මිනිස්බල අධිකාරිය , දේශීය කම්කරු දෙපාර්තමේන්තුව,

ජාත්‍යන්තර සංක්‍රමණික සංවිධාන කාර්යාලය සහ තානාපති කාර්යාල කීපයක් වෙත ඉදිරිපත් කිරීම් සිදුකර ඇත.

- මෙම දූත මණ්ඩලය සංක්‍රමණික ශ්‍රමිකයින් මුහුණ දෙන විවිධ අභියෝග ජය ගැනීම සඳහා ඔවුන් වෙත සහයෝගය ලබා දී ඇත. 2018 ජනවාරි මස සිට 2018 දක්වා කාලය තුළ සේවස්ථ ගෘහ සේවිකාවන්ට සහ සේවස්ථ නොවන ගෘහ සේවිකාවන්ට අදාළව වාර්තා වූ මුළු පැමිණිලි සංඛ්‍යාව 577 කි. (ස්ත්‍රීන් 48, පිරිමි 529 වෙයි)

- සංක්‍රමණික සේවකයන් කිහිපදෙනෙකුට අයවිය යුතු වැටුප් ලබාදීම සඳහා මෙම දූත මණ්ඩලය මැදිහත් විය. එම නිසා මෙම දූත මණ්ඩලයට 2018 ජනවාරි 01 සිට 2018 සැප්තැම්බර් 30 දක්වා කාලය තුළ සංක්‍රමණික සේවකයින් 25 කගේ වැටුපක් ලෙස කුවේට් ඩිනාර් 6,971 / =ක් (ශ්‍රී.ලං.රු මිලියන 3.6ක්) අයකර දීමට හැකි විය.

- ශ්‍රී ලාංකික රෝගීන්ට සහාය වීම සඳහා දූත මණ්ඩලය විසින් සංචාර 14 ක් සිදුකර ඇත. කුවේට් ඩිනාර් 19,120 / = (ශ්‍රී.ලං.රු මිලියන 10)ක මුදලක් ගෙවා රෝහල් ගාස්තු නිදහස්කර ඉන් රෝගීන් 05 දෙනෙක් නැවත මෙරටට ගෙන්වා ගත්හ.

- විවිධ දුෂ්කරතා නිසා සිය රැකියා ස්ථානයෙන් පළායන ගෘහ සේවිකාවන් සඳහා ආරක්ෂාව සලසන අතර සතියේ 24/7 ක්‍රියාත්මක පිළිගැනීමේ කවුළුවක් පවත්වා ගෙන යයි. 2018 ජනවාරි මස 01 වන දින සිට අඛණ්ඩව 2018 සැප්තැම්බර් 30 දක්වා මෙලෙස පැමිණි ගෘහ සේවිකාවන් 771ක් ආරක්ෂිත නිවස වෙත යැවූ අතර මෙම දූත මණ්ඩලය මගින් සාමාන්‍යයෙන් ගෘහ සේවිකාවන් 75 දෙනෙකු ආරක්ෂක නිවස්නේ සිටිති.

- 2018 ජනවාරි 01 වන දින සිට 2013 සැප්තැම්බර් 30 දක්වා කාලය තුළ ශ්‍රී ලාංකිකයන් 742 ක් මෙරටට ගෙන්වා ගැනීම සඳහා මැදිහත් විය.ආරක්ෂිත නිවසට වාර්තා කළ ශ්‍රමිකයන් 742 දෙනාගෙන් 630 දෙනෙකු සේවිකාවන් වූ අතර ඉතිරි 112 නීති විරෝධී සංක්‍රමණිකයන් විය.

- ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා පුහුණු හා අර්ධ පුහුණු ශ්‍රමිකයින් සඳහා නව රැකියා අවස්ථා ලබා ගැනීම සඳහා කුවේට්හි විදේශ රැකියා නියෝජිත ආයතන සහ ව්‍යාපාරික ආයතන කීපයක දූත මණ්ඩලය සංචාරය කළ අතර කීර්තිමත් සමාගම් සහ නියෝජිතායතනවලින් රැකියා 434 ක් ලබා ගත්හ.

- ශ්‍රී ලාංකිකයින් 192ක් (පිරිමි: 160, ගැහැණු: 32) කුවේට්හි සිරමැදිරිවල රඳවා තබා ඇත. මෙම දූත මණ්ඩලය විසින් අවස්ථා 11 කදී මධ්‍යම සිරකඳවුරෙහි සංචාරය කර ඇත. තවද පිටුවහල් කඳවුරු සහ රජයේ ආරක්ෂක ස්ථානවල සංචාරය කර ඇත.

- 2009 වසරේදී මිනීමැරුම් චෝදනාව යටතේ මරණ දඬුවම් නියමවූ බස්තියාන් කෝරලගේ සම්පත් මහතාට තානාපති කාර්යාලය මගින් සමාව ලබා ගත්තේය. බස්තියාන් මහතාගේ මරණ දඬුවම ජීවිතාන්තය දක්වා සිරදඩුවමක් බවට ලිහිල් කර ඇත.

- කුවේට් හි අතිගරු අමීර් රජතුමාගේ පොදු සමාව යටතේ, ශ්‍රී ලාංකික සිරකරුවන් 139 දෙනෙක් වෙනුවෙන් මෙම දූත මණ්ඩලය මගින් සමාව ලබාගත් අතර මේ සඳහා සිරකරුවන් 32 දෙනෙකුගේ ජීවිතාන්තය දක්වා වූ සිරදඩුවම වසර 10 ක් දක්වා ලිහිල් කිරීම සහ සිරකරුවන් 74 දෙනෙකුගේ වසර 15 ක සිර දඩුවම වසර 10 දක්වා ලිහිල් කරන ලදී.

7. ලෙබනනය

අ.ද්විපාර්ශ්වික සබඳතා

- රාජ්‍යතාන්ත්‍රික පිළිගැනීමේ උත්සවය 2018.02.07 නිල නිවසේදී පැවැත්විණ.
- ලෙබනන ජාතික සම්මේලනයේ මහලේකම් කාර්යාලය විසින් සංවිධානය කරන ලද මහ සභා සැසියේ හා කාර්යාංශයේ සභාපතිවරයා තෝරාපත් කරගැනීම සඳහා 2018.05.07 දින ජන්ද විමසීමට සහභාගී විය.
- 2018 ජූනි 28 දින ලෙබනනයේ සංක්‍රමණික ගෘහ සේවිකාවන්ගේ ජාතික ආරක්ෂාව සඳහා බ්‍රිටිහි ඇමරිකානු විශ්වවිද්‍යාලයේ 'බහු පාර්ශ්වකරුවන්ගේ සම්මේලනය' සහභාගි විය.
- 2018 ජනවාරි 16 වන දින ලෙබනන් ජනරජයේ ජනාධිපතිවරයා විසින් සංවිධානය කරන ලද නව වසර හා නත්තල් උත්සවය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී විය.
- 2018.02.09 වන දින අති උතුම් කාඩිනල් මාර් බෙකාරා බුටෝස් එල් රාහීගේ ප්‍රධානත්වයෙන් සහ ලෙබනන් ජනරජයේ අතිගරු ජනාධිපතිතුමාගේ සහභාගීත්වයෙන් ජනතා උත්සවයක් වන ශාන්ත මරෝන් මංගල්‍යය පැවැත්විණි.
- 2018.02.14 වන දින විරු සමරු දින උත්සවයේ 13 වන සංවත්සරය සමරනු ලැබීය.
- 'ලෙබනන් සඳහා විශේෂ විනිශ්චය සහා කටයුතුවල මෑත සිදුවීම් පිළිබඳව අවධානය යොමු කිරීම පිළිබඳ වාර්තාවක්' මැයෙන් ලෙබනනය සඳහා විශේෂිත විනිශ්චය සභා සභාපතිවරයා විසින් පැවැත්වූ දේශනයට 2018.04.17 දින සහභාගී විය.
- 2018.03.01 දින මේ විඩික් පදනම විසින් සංවිධානය කරන ලද 'ඉදිරි පෙළ කාන්තාවන්' මැයෙන් වූ සම්මන්ත්‍රණයට තානාපති කාර්යාලය සහභාගි විය.
- තානාපති කාර්යාලය විසින් '2020 සිට 2030 දක්වා නිශ්චිත ඉලක්කයන්' මැයෙන් ලෙබනනයේ තිරසාර බලශක්ති පිළිබඳ සම්මන්ත්‍රණය 2018 මාර්තු 13 වැනි දින පැවැත්විය.
- සෞඛ්‍ය අමාත්‍යාංශය හා ලෝක සෞඛ්‍ය සංවිධානය හා බ්‍රිටි හී ඇමරිකානු විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය විසින් සංවිධානය කරන ලද 'සහයෝගී සෞඛ්‍ය ප්‍රතිපත්ති' මැයෙන් සම්මන්ත්‍රණයට තානාපති කාර්යාලය 2018.04.16 දින සහභාගී විය.

ආ. බහුපාර්ශ්වික සබඳතා

- ලෙබනනයේ සිටින එක්සත් ජාතීන්ගේ අන්තර්කාලීන හමුදා බලකායන් විසින් සංවිධානය කරන ලද සමුළුවට 2018.03.05 දින තානාපති කාර්යාලය නියෝජනය කරන ලදි.
- 2013.03.19 දින ලෙබනනයේ සිටින එක්සත් ජාතීන්ගේ අන්තර්කාලීන හමුදා බලකාය පිහිටුවීමේ දිනයේ 40 වන සංවත්සරය නියෝජනය කරන ලදි.
- 2018.03.22 වන දින 'මගේ ලස්සන නිවස' මැයෙන් වැඩසටහන දියත් කරන ලදී.
- ශ්‍රී ලංකා හමුදා ආරක්ෂක අංශය සඳහා වාර්ෂික පදක්කම් ප්‍රදානෝත්සවයට සහභාගී විය.
- ලෝක ක්ෂය රෝග දිනය සමරමින් පැවැති සමුළුවට 2018.03.23 දින සහභාගී විය.
- කාන්තා හා මානව අයිතිවාසිකම් පිළිබඳ ඉන්සාන් සංගමය විසින් සංවිධානය කරන ලද සමුළුවට 2014.04.03 වැනි දින සහභාගී විය.
- බටහිර ආසියාව සඳහා එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිසම විසින් සංවිධානය කරන ලද එම සංවිධානයේ 30 වැනි අමාත්‍යවරුන්ගේ සැසියට 2018.06.27 දින නියෝජනය කරමින් සහභාගී විය.

ඇ.ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන

- 2018.02.24 දින ට්‍රිපොලිහි වාණිජ මණ්ඩලයේ සභාපති ටුෆික් ඩබ්බස්සි මහතා හමුවිය.
- 2018.03.13 දින ලෙබනන් හි ඉස්ලාමීය විශ්ව විද්‍යාලයේ සංචාරක හා විද්‍යා පීඨයේ සහභාගීත්වයෙන් ශ්‍රී ලංකා දිනය සංවිධානය කරන ලදි.
- සිරියාවේ ශ්‍රී ලංකා කොන්සාල් ගරු ආචාර්ය එම්. මොහොමඩ් අල් ඩෲබි මැතිතුමා, 2018 ජූනි මස 19 සිට 21 දක්වා කොළඹ දී පැවැති ශ්‍රී ලංකා ආයෝජන හා ව්‍යාපාර පිළිබඳ සාකච්ඡාවට සහභාගි විය.
- තානාපති කාර්යාලය මගින් ලෙබනන්හි ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ විකුණුම් නියෝජිත ජමීල් බයිරාම් මහතාට බීරූට් හී මැද පෙරදිග ගුවන් සේවා සමාගම සමග සාකච්ඡා පැවැත්වීම සඳහා පහසුකම් සැපයීය.
- 2018 පෙබරවාරි මාසයේ දී 'ශ්‍රී ලංකාව - ඉන්දියන් සාගර දූපත් දිවයින' යන මැයෙන් ප්‍රමුඛ පෙළේ සඟරාවක ලිපියක් පළකළ අතර එහි පිටපත් 30,000 ක් මුද්‍රණය කර ඇත.
- 2018 පෙබරවාරි මස 7 වැනි දින නිල නිවසේදී ඉතාමත් වැදගත් පුද්ගලයින්, වැදගත් පුද්ගලයින්, රාජ්‍ය තාන්ත්‍රිකයන් සහ රාජ්‍ය නිලධාරීන් සඳහා රාජ්‍යතාන්ත්‍රික පිළිගැනීමේ දී මිනිත්තු 20ක ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

- 70 වැනි ජාතික දින සැමරුම් සඳහා විශේෂ අතිරේකයක් ද ප්‍රකාශයට පත් කෙරිණි.
- ලෙබනනයේ නවෝත්පාදන කටයුතු වැඩි දියුණු කිරීමටත්, ව්‍යාපාර පරිසරය වැඩි දියුණු කිරීමටත්, ජංගම අනෝන්‍ය ක්‍රියාකාරකම් දියත්කිරීමේ අවස්ථාවට 2018.02.19 දින සහභාගී විය.
- ෂාලේ වාණිජ මණ්ඩලය සමග රැකියා ප්‍රවර්ධන හමුවක් 2018.02.14 දින සංවිධානය කරන ලදී.
- රැකියා ප්‍රවර්ධන රැස්වීමක් ඇලේ නගරසභාවේ දී 2018.02.14 දින පවත්වන ලදී.

ඇ. සංස්කෘතික සබඳතා

- 2018 ජනවාරි 25 වන දින අධ්‍යාපන අමාත්‍යාංශය හා ඇලේ මහනගර සභාව සමග එක්ව 'ශ්‍රී ලංකාවේ පින්තූර' මැයෙන් චිත්‍ර තරගයක් සංවිධානය කළේය.
- 2018.02.05 දින හස්මිහා මහ නගර සභා ශාලාවේදී මහාචාර්ය නජී එල් ජල්ක් විසින් ඉදිරිපත් කරන ලද "Enter fiel et ciel", මැයෙන් ශ්‍රී ලංකා ඡායාරූප ප්‍රදර්ශනයක් සංවිධානය කරන ලදී.
- සංස්කෘතික හුවමාරු හා ප්‍රදර්ශනයක් පැවැත්වීමේ ආරම්භක සහයෝගිතාවයේ හැකියාව පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා 2018.02.17 දින බීරූට් කෞතුකාගාරයේ අධ්‍යක්ෂකවරයා සමග හමුව.
- අන්තර්ජාතික යොවුන් කඳවුර 2018 මාර්තු 28 සිට අප්‍රේල් 01 දක්වා නිකවැරටියේ දී පැවැත්විණ.
- 2018 මැයි මස 08 වන දින ලෙබනනයේ ඇමරිකානු විශ්වවිද්‍යාලය මගින් සංවිධානය කරන ලද ලෙබනනයේ මුල් පෙළේ බැලේ නර්තන ශිල්පියෙකුට ගෞරවය පිරිනැමීම සඳහා පැවැති උත්සවයට සහභාගී විය.
- විල්මා සංගීත පාසැල විසින් සංවිධානය කරන ලද Amchit සංස්කෘතික උත්සවය 2018.06.30 වන දින අමීට් අල් සෙයිඩ් දේවස්ථාන චතුරශ්‍රයේදී පවත්වන ලදී.

ඈ.කම්කරු සුභසාධනය

- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අතිරේක සාමාන්‍යාධිකාරී (ආයතනික කටයුතු) චෙකා පේරමසිරි මහත්මිය සහ තවත් දෙදෙනෙකු විසින් 2013.02.14 දිනයේදී රැකියා ප්‍රවර්ධනය, මිනිස් ජාවාරම පිළිබඳ උපදෙස් ලබා දීමේ සංචාරවලට පහසුකම් සලසන ලදී.
- 2018.02.04 දින, 70 වන ජාතික නිදහස් දිනය සමරනු ලැබීය.
- 2018.02.04 වන දින ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ ලෙබනනයේ ශ්‍රී ලංකා ප්‍රජාව විසින් එක්ව සංවිධානය කරන 'රංග සාරා' සංස්කෘතික අංගය.

- 2018.03.25 දින සෝලූමේමේ හී ෆ්රේරෙස් යුනිස් පාසලේ ක්‍රීඩාංගණයේ දී ජාත්‍යන්තර කාන්තා දිනය සමරනු ලැබීය.

- 2018.04.15 දින සිංහල හා හින්දු අලුත් අවුරුද්ද සමරනු ලැබිණි.

- 2018.06.23 හා 24: මීරා සුභසාධක සංගමය විසින් සංවිධානය කරන ලද පොසොන් උලෙළේ ආගමික වැඩසටහනක් 2018 ජූනි 23 සහ 24 යන දිනවල තානාපති කාර්යාලීය පරිශ්‍රයේ දී පවත්වන ලදී. හොරණ පිහිටි 'බක්කුල මහාසෑය' භික්ෂු රෝහල වෙත ඩොලර් 12000 ක මුදල් පරිත්‍යාගයක් සිදු කරන ලදී.

- 2018.06.28 හා 29: ශ්‍රී ලංකා රජයේ විදේශ ප්‍රතිපත්තියට අනුව ලෙබනන් ශ්‍රී ලංකා තානාපති විසින් වෙසක් දිනය සමරනු ලැබීය.

- නඩු පවතින ලියකියවිලි හි කිසිදු සටහනක් නොමැති කම්කරුවෝ 100 ක් නැවත මෙරටට ගෙන්වා ගැනීම සඳහා බාබ්ඩා අභිචෝදක සමග සාකච්ඡා කර ඇත.

- වර්දුන් බන්ධනාගාරයේ සිටින බුද්ධිකා ජයරත්න හා ට්‍රිපොලි බන්ධනාගාරයේ සිටින ලිලි නෝනා යන සිරකාරියන් දෙපළගේ දිගුකාලීන සිර දඩුවම සඳහා සමාව ලබාගැනීමේ හැකියාව.

- වසර 15 ක් සඳහා වැටුප් නොගෙවූ ආරක්ෂිත නිවසේ පදිංචිකාරියක වන පංචවර්ණාං මියගේ වැටුප් නොගෙවීම සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යාංශයේ මැදිහත්වීම ඉල්ලා සිටියාය.

- 2018.06.26 වැනි දින ශ්‍රී ලාංකික ප්‍රජාවගේ සහ සුභ පතන්නන්ගේ සහාය ඇතිව මහරගම අපේක්ෂා රෝහල වෙත ශ්‍රී.ලං.රු 306,150.00ක් වටිනා වීඩියෝ ලැරිංගෝස්කෝප් යන්ත්‍රයක් පරිත්‍යාග කළේය.

- 2018.07.23 වැනි දින ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයකු වන පී.ජේ. මුණසිංහ මහත්මිය හා ලෙබනන් ජාතික නඩීන් මවුජ්බර් මහතාගේ සහයෝගයෙන් දෙහිවල, අත්තිඩිය මිහිඳු සෙත් මැදුර ප්‍රදේශයේ පදිංචි සාජන්ට් රණසිංහට විදුලි රෝද පුටුවක් පරිත්‍යාග කරන ලදී.

- ත්‍රපාදු සමාව යටතේ 2018 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා නීතිවිරෝධී ශ්‍රී ලංකා සංක්‍රමණික සේවකයින් 131 ක් නැවත ගෙන්වා ගෙන ඇත.

- ඉහත කාල සීමාව තුළ වන්දි මුදලක් ලෙස අමෙරිකානු ඩොලර් 62,892.93 ක් එකතු කර ඇත.

8. ඕමානය

ආ.ද්විපාර්ශ්වික සබඳතා

- 70 වන නිදහස් දිනය සමරමින් 2018 පෙබරවාරි මස 6 වැනි දින රාජ්‍යතාන්ත්‍රික පිළිගැනීමේ උත්සවය සංවිධානය කරන ලදී. එම අවස්ථාව ඕමානයේ ටයිම්ස් පුවත්පතේ අතිරේකයක් ලෙස පළ විය.
- 1981 දී දෙරට අතර රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ස්ථාපිත කිරීමෙන් පසු, ශ්‍රී ලංකාවෙන් ඕමානයේ ඉහළම මට්ටමේ නියෝජිත පිරිසකගේ සංචාරයක් වන 2018 මාර්තු 11-16 දින දක්වා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායකතුමාගේ නායකත්වයෙන් පාර්ලිමේන්තු නියෝජිත පිරිසගේ නිල සංචාරය ආරම්භ කිරීමට හා සම්බන්ධීකරණය කිරීමට දූත මණ්ඩලය කටයුතු කළේය.
- 2018 අගෝස්තු මස 15 වැනි දින ඕමාන් සහ ශ්‍රී ලංකා විදේශ අමාත්‍යාංශය අතර 02 වන දේශපාලන උපදේශනය පවත්වන ලදී. ශ්‍රී ලංකා දූත පිරිස විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ප්‍රසාද් කාරියවසම් මහතා විසින් මෙහෙයවන ලද අතර ඕමාන් නියෝජිතයින් පිරිස ඕමාන් විදේශ අමාත්‍යාංශයේ රාජ්‍යතාන්ත්‍රික හා ප්‍රධාන මාස්ටර් දෙපාර්තමේන්තුවේ උප ලේකම් මහ්මුද් අවාඩ් අල් හසන් මහතා නායකත්වය දැරීය.
- වෙළඳ , සංචාරක, ආගමන හා විගමන, ශ්‍රම බලකාය සහ මිනිස්බල පුහුණුව, ආරක්ෂක, කෘෂිකර්ම, උසස් අධ්‍යාපනය, සහ සංස්කෘතිය ක්ෂේත්‍රයේ අන්‍යෝන්‍ය සහයෝගිතාව සඳහා පුළුල් පරාසයක කරුණු සමාලෝචනය කර හා සාකච්ඡාවට ලක් කෙරිණි. මීට අමතරව, අනාගත සහයෝගිතාව සඳහා නව ක්ෂේත්‍ර ලෙස ධීවර, ක්‍රීඩා, තෙල් හා ගෑස් හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය හා ඕමාන් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය අතර ශ්‍රී ලංකා-ඕමාන ව්‍යාපාරික කවුන්සිලයක් පිහිටුවීම සඳහා ද එකඟ විය.
- දෙපාර්ශ්වයම හැකි ඉක්මනින් ආයෝජන ප්‍රවර්ධනය සහ අන්‍යෝන්‍ය ආරක්ෂාව පිළිබඳ ගිවිසුමකට එළඹීමටත්, ශ්‍රී ලංකාවෙන් ඕමානයට පුහුණු ශ්‍රමිකයින් චලනය කිරීමට පහසුකම් සැලසීම සඳහා නිපුණතා සංවර්ධනය සහ අන්‍යෝන්‍ය සුදුසුකම් හඳුනාගැනීම පිළිබඳ අවබෝධතා ගිවිසුමකට එළඹීමට සලකා බැලීමටත් එකඟ විය. ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ ආදායම් මත බදු ආදායම් බදු සම්බන්ධව වැළැක්වීම පිළිබඳ ගිවිසුමට දෙරට අත්සන් කළහ.
- ගරු. විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා පිළිබඳ අමාත්‍ය හරින් ප්‍රනාන්දු මහතා 2018 අගෝස්තු මස 15 සිට 16 දක්වා ඕමාන් හි සංචාරය කළ අතර, ඕමානයේ පුහුණු ශ්‍රමිකයන් සඳහා රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීමේ හැකියාව පිළිබඳව සාකච්ඡා කළ අතර වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ සභාපතිතුමා හා ශ්‍රී ලංකා ප්‍රජාව හමු විය.
- 2018 ජූලි මස 03 වන දින සිට 04 දින දක්වා කම්කරු හා පුහුණු පිළිබඳ අවබෝධතා ගිවිසුම යටතේ පිහිටුවන ලද තාක්ෂණික කමිටුවේ තෙවන ඒකාබද්ධ රැස්වීම ශ්‍රී ලංකාවේ පැවැත්විය. රැකියා නියෝජිතයින් විසින් නීතිවිරෝධී බඳවා ගැනීමේ පරිචයන් කප්පාදු

කිරීම සඳහා ශ්‍රී ලාංකික කාන්තා විදෙස් ශ්‍රමිකයන් ඕමානයේ බඳවා ගැනීම විධිමත් කිරීමට නව වැඩපිළිවෙළක් සකස් කර ඇත.

- 2018 මැයි මස කොළඹ දී අබුඩාබි ද්විපාර්ශ්වික සාකච්ඡාවට සහභාගි වීමට මිනිස් බල අමාත්‍යාංශයෙන් පැමිණි නියෝජිත කණ්ඩායමක් සඳහා පහසුකම් සැපයීය.
- මෙම දූත මණ්ඩලය සිදුකළ ඉල්ලීම මත, ඕමාන් රජය විසින් ඕමාන රජයේ ප්‍රතිපාදන යටතේ 2018/19 අධ්‍යයන වර්ෂය සඳහා ශ්‍රී ලාංකික සිසුන්ට එක් ශිෂ්‍යත්වයක් පිරිනමා ඇත. මෙම දූත මණ්ඩලය මගින් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සීමාවාසික පුහුණුව සඳහා සුල්තාන් කබූස් විශ්ව විද්‍යාලයෙන් ඕමාන් ශිෂ්‍යයින් තිදෙනෙකු එවීමට පහසුකම් සලසා ඇත.
- 2018 මාර්තු 28 වන දින සිට අප්‍රේල් 2 වන දින දක්වා යොවුන් පුර උත්සවයේදී ඕමාන ශිෂ්‍යයන් දෙදෙනෙකුගේ සහභාගීත්වයට මෙම දූත මණ්ඩලය කටයුතු සංවිධානය කරන ලදී.

ආ. බහුපාර්ශ්වීය සබඳතා

- 2018-2022 කාලය සඳහා යුනෙස්කෝහි අස්පෘෂ්‍ය සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම පිළිබඳ අන්තර් රාජ්‍ය කමිටුවට ශ්‍රී ලංකාවේ අපේක්ෂකත්වයට ඕමාන් රජය සහයෝගය ලබා දුන්නේය.

ඇ. ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන

- නිදහසේ 70 වැනි සංවත්සරය සැමරීම සඳහා ලුලු හයිපර් මාර්කට් සමඟ එක්ව 2018 පෙබරවාරි මස 5 වැනි දින සිට 10 දක්වා මස්කට්හි ශ්‍රී ලංකා නිෂ්පාදන සතිය මෙම දූත මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකා සංචාරක, ආයෝජන ප්‍රවර්ධන, සිලෝන් ටී, මැණික් හා ස්වර්ණාභරණ පිළිබඳ ලිපි ඇතුළත් අතිරේකයක් ඕමාන් ටයිම්ස් හි 2018 පෙබරවාරි මාසයේ 4 වැනි දා ප්‍රකාශයට පත් කෙරිණි .
- 2018 සැප්තැම්බර් 08 සිට 11 දින දක්වා ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙලඳපොලවල ආයෝජන සිදුකිරීම ගරු මහ බැංකු අධිපතිතුමාගේ නායකත්වයෙන් යුත් බැංකු අංශයේ නිල සංචාරය සඳහා මෙම දූත මණ්ඩලය සම්බන්ධීකරණ හා පහසුකම් සලසන ලදී. අනෙකුත් කරුණු අතර, ශ්‍රී ලංකාව වෙත ඕමාන රාජ්‍ය මහා සංචිත අරමුදලින් ආයෝජන ආකර්ෂණය කරගැනීමේ අරමුණින් ඕමාන රාජ්‍ය මහා සංචිත අරමුදලේ විධායක සභාපති හා ඕමාන මහ බැංකුවේ විධායක සභාපතිවරයා සමග රැස්වීම සාර්ථක ලෙස ඵලදායී විය. ශ්‍රී ලංකා ආගන්තුක සත්කාරක කර්මාන්තය සඳහා ආයෝජන සිදුකිරීම සඳහා රාජ්‍ය මහා සංචිත අරමුදල විසින් මෙරට සංචාරයක් සිදුකිරීමට නියමිතය.
- ලලාන් සමූහ ව්‍යාපාරය යටතේ, ඕමාන්හි අනාගත ගැනුම්කරුවන් සමග B2B රැස්වීම් සංවිධානය කිරීම සඳහා දූත මණ්ඩලය විසින් ලලාන් රබර් සමාගම ඇතුළු බොහෝ සමාගම් වලට සහාය ලබා දී ඇත. 2018 ජූනි මස 19 වැනි දින සිට 21 වැනිදා දක්වා

ශ්‍රී ලංකා ආයෝජන හා ව්‍යාපාර සමුළුවේ දී සන්සෙට් බයර්නිට්ස් LLC හි නියෝජිතයන් දෙදෙනෙකුගේ සහභාගීත්වයට දූත මණ්ඩලය විසින් කටයුතු සැලසුම් කිරීමට හැකිවිය. දූත මණ්ඩලය මගින් බොරැල්ල පිහිටි කාර්යාල සංකීර්ණයක් සඳහා දේපළක් ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි කිරීමටත්, ඕමාන් හි ශ්‍රී ලාංකිකයකුට අයත් සමාගමකටත්, 'සංවර්ධකයින් 88'කුටත් පහසුකම් සලසන ලදී.

- ඕමාන් ඔයිල් සමාගම (OOC) සහ රිචඩ් පාර්ක් ඉන්ටර්නැෂනල් සමාගම අතර හම්බන්තොට බනිජ තෙල් විශේෂිත කලාපයේ තෙල් පිරිපහදු කර්මාන්තයක් පිහිටුවීම සඳහා යෝජිත හවුල්කාරිත්වය සඳහා සහයෝගය ලබාගැනීමට ඕමානි තෙල් හා ගෑස් අමාත්‍යාංශය සමඟ දූත මණ්ඩලය කටයුතු කරනු ලබයි.

ඉ. සංස්කෘතික සබඳතා

- ශ්‍රී ලංකා ප්‍රජා සමාජ සංගමය සහ එහි අනෙකුත් අනුබද්ධ සංවිධාන සමඟ එක්ව 2018 පෙබරවාරි 9 වැනි දින තෙපොංගල් උත්සවයත්, 2018 පෙබරවාරි 02 සහ 03 දිනවල 'ප්‍රතිභා ප්‍රභා' කුසලතා ප්‍රදර්ශනයත්, 2018 අප්‍රේල් 13 වැනි දින 2018 සිංහල හා දෙමළ අළුත් අවුරුදු උත්සවයත්, 2018 අප්‍රේල් 27 සිට මැයි මස 05 වන දින දක්වා ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති විහාරස්ථානයේ වෙසක් උත්සවයත්, 2018 ජූනි 1 වැනි දින රාමදාන් උත්සවයත්, 2018 සැප්තැම්බර් 14 ඊද් හා පළමු මුහරම් උළෙලත් සංවිධානය කළේය. ඩාර් අල් අටා මගින් සංවිධානය කරන ලද ආහාර උත්සවයට සහභාගී වූ අතර, 2018 මාර්තු මස 10 වන දින ඕමාන් සමාජ සංවර්ධන අමාත්‍යාංශය සමඟ පුණ්‍ය අරමුදලක් නිල වශයෙන් ලියාපදිංචි කරන ලදී.
- ඕමානයේ පිහිටි ජර්මන් තාක්ෂණික විශ්ව විද්‍යාලයේ (Gutech) ජාත්‍යන්තර ශිෂ්‍ය සංගමය විසින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර රාත්‍රියේ දී මස්කට්හි පිහිටි ශ්‍රී ලාංකේය සාම්ප්‍රදායික නර්තන කණ්ඩායමට සහභාගීවීම සඳහා මෙම දූත මණ්ඩලය පහසුකම් සලසන ලදී.

ඊ. කම්කරු සුභසාධනය

- මෙම දූත මණ්ඩලයට ප්‍රධානවශයෙන් ගෘහ සේවිකාවන්ගෙන් පැමිණිලි 275 ක් ලැබී ඇත. මෙයින් පැමිණිලි 216 ක් විසඳා ඇත. මෙම දූත මණ්ඩලය අබණ්ඩව අතරමං වූ කාන්තා සංක්‍රමණිකයන්ට ආරක්ෂාව සැපයීමටත්, අදාළ රාජ්‍ය නිලධාරීන් / අනුග්‍රාහකයින් / නියෝජිත ආයතනවල මැදිහත්වීමෙන් ඔවුන්ගේ ගැටළු නිරාකරණය කිරීමට කටයුතු යොදා ඇත. කාන්තා කම්කරුවන් 270 දෙනෙකු සහ පිරිමි සංක්‍රමණිකයන් 23 දෙනෙකුට රැකවරණ/රැකවරණයක් ඉල්ලා ඇත. ගැටුම් නිරාකරණය කිරීම සම්බන්ධව පොලිස් නිලධාරීන්, මිනිස්බල අමාත්‍යාංශය, රෝහල්, ආගමන කටයුතු ආදී සමග රැස්වීම්/සංචාර 354 කට දූත මණ්ඩල නිලධාරීන් සහභාගී වී ඇති අතර රැඳවියන් 121 දෙනෙකු දූත මණ්ඩලය විසින් ඔවුන්ගේ පැමිණිලි නිරාකරණය කර ගැනීමෙන් අනතුරුව සිය රටට ගෙන්වාගෙන තිබේ. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි නොවූ ගෘහ

සේවිකාවන් සම්බන්ධව කොන්සියුලර් අංශය වෙතින් ලැබුණු පැමිණිලි 54 ක් සම්බන්ධයෙන් මෙම දූත මණ්ඩලය කටයුතු කර ඇත.

මැදපෙරදිග අංශය

මිනිස් ජාවාරම් සිදුවීම් පිළිබඳ කටයුතු කරන කම්කරු අංශයේ නිලධාරීන් හට පුහුණුව ලබා දීම සඳහා 2018 පෙබරවාරි 15 දින සිට 19 දින දක්වා පැවති ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ, නීතිපති දෙපාර්තමේන්තුවේ හා පොලිසියේ, මිනිස් ජාවාරමට එරෙහි විශේෂඥ කණ්ඩායමේ සංචාරයට මෙම දූත මණ්ඩලය පහසුකම් සැපයීය. දූත කණ්ඩායම, ඕමාන රජයේ නිලධාරීන් හමු වී මිනිස් ජාවාරමට එරෙහිවීම පිළිබඳ සහයෝගිතාව සම්බන්ධව සාකච්ඡා කළේය.

- තානාපති කාර්යාලයේ සුරක්ෂා නිවස්නයෙහි රඳවා සිටි මිනිස් ජාවාරමේ වින්දිතයන් යයි සැලකෙන පුද්ගලයන්ගේ ප්‍රකාශ සටහන් කරගැනීම පිණිස 2018 මාර්තු 10 වැනි දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 04 දෙනෙකුගෙන් සමන්විත විශේෂඥ කණ්ඩායමක සංචාරය, මෙම දූත මණ්ඩලය සම්බන්ධීකරණය කොට පහසුකම් සැලසීය.

- තානාපති කාර්යාලයෙහි ලියාපදිංචි වී සිටින රැකියා ඒජන්තවරුන් සඳහා 2018 ජූලි 1 වැනි දින දැනුවත් කිරීමේ සැසියක් හා රැකියා ප්‍රවර්ධන වැඩසටහනක් සඳහා මෙම දූත මණ්ඩලය කටයුතු සම්පාදනය කළේය.

9. පලස්තීනය

අ. ද්විපාර්ශ්වික සබඳතා

- ශ්‍රී ලාංකික නියෝජිතවරයා පලස්තීන - ශ්‍රී ලංකා මිත්‍රත්ව සංගමයේ සභාපති නසාර් යාකින් මහතා හා සාමාජිකයන් හමුවී, සංගමයේ කටයුතු ප්‍රවර්ධනය කිරීම පිළිබඳව සාකච්ඡා කළේය.

- ශ්‍රී ලංකාවේ 70 වැනි නිදහස් සමරු උළෙල ග්‍රෑන්ඩ් පාක් හෝටලයේ දී පැවති අතර, පලස්තීනයේ ගරු අධිකරණ අමාත්‍ය අලි අබු ඩියක් මැතිතුමා එහි ප්‍රධාන අමුත්තා විය. එහි දී, පහත සඳහන් පලස්තීන ජාතිකයන් තිදෙනාට "ශ්‍රී ලංකා ප්‍රණාම" සම්මානය පිරිනමන ලදී.

    - ශ්‍රී ලංකාවේ 'යුනිවර්ල්ඩ් ටීස්' (UNIWORLD TEAS) සමාගමේ සභාපති සලේ ජාබර් ඉහ්මයිඩ් මහතා
    - පෙනින් හි ප්‍රධාන පෙළේ තේ වෙළෙන්දෙකු හා 'සිලත් අල්දහෙර්' වෙළෙඳ සමාගමේ හිමිකරු වන ශඩාඩ් මහතා
    - අල්-නබාලි හා අල්-ෆාරිස් ආයෝජන සමූහ ව්‍යාපාරයේ සභාපති දුර්ඝම් අල්නාබලි මහතා

- ශ්‍රී ලාංකික නියෝජිතවරයා ඉෆ්තාර් සංවිධානය කළ අතර, ෂෙයික් රෆාත් මැතිතුමා නිල නිවසෙහි දී විශේෂ රාමදාන් උත්සවයක් පැවැත්වීය. ශ්‍රී ලංකාවට හා එහි ස්වාභාවික විපත්වලින් පීඩා විඳි ජනතාවට සෙත් පතා යාඥා මෙහෙය පැවැත්විණ.

- අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාගේ සුභසිද්ධිය හා ශ්‍රී ලංකාවේ හා පලස්තීනයේ සියලු ප්‍රජාවන්ගේ සමෘද්ධිය හා එකමුතුකම පතා යාඥාවක් ද ෂෙයික් රහුෆත් විසින් පවත්වන ලදී.

- ශුද්ධ වූ රාමදාන් මාසය තුළ, චාරිත්‍රානුකූල උපවාසය අත්හැරීමට ආසන්නව තිබිය දී, සයිෆුල්ලා දේවස්ථානයේ ප්‍රූජක ෂෙයික් අහ්මඩ් සුකී කුරානය පිරුවනය හා ගාථා සජ්ඣායන සිදුකොට, ශ්‍රී ලංකාවේ, පලස්තීනයේ හා අනෙකුත් සියලු රටවල සියලු ප්‍රජාවන් හට දෙවියන්ගේ ආශීර්වාදය ඉල්ලා සිටියේය.

- ශ්‍රී ලංකා නියෝජිතවරයා පුණ්‍ය කටයුතු හා ආගමික කටයුතු පිළිබඳ අමාත්‍ය ෂෙයික් යූසෙෆ් ඒදායිස් සමඟ සාකච්ඡාවක් පැවැත්වීය.

ආ. බහුපාර්ශ්වික සබඳතා

- ඉන්දියාව, අයර්ලන්තය, මොරොක්කෝව, ඕස්ට්‍රේලියාව හා පෝලන්තය යනාදී රටවල් ගණනාවක පලස්තීනයේ පිහිටි නියෝජිත කාර්යාල හා කොන්සල් කාර්යාලවල පැවති නිදහස් සමරු උළෙලවලට සහභාගී වන ලදී.

- පලස්තීනයේ සිටින නියෝජිතයන් ගණනාවක්ම හමුවී ශ්‍රී ලංකාවේ වර්තමාන තත්වය පිළිබඳ පැහැදිලි කරන ලදී.

ඇ. ආර්ථික සබඳතා හා විදේශීය ආයෝජන

- ශ්‍රී ලංකා නියෝජිතවරයා සිවිල් කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු හුසේන් අල්-ෂෙයික් මැතිතුමා හමු වී, ශ්‍රී ලංකාවේ සිට ජෝර්දානයට/බටහිර ඉවුරට (ජෝර්දානයේ නැවතීමට විශේෂ අවසරයක් අවශ්‍ය බැවින්, නැවතීමකින් තොරව හරහා ගමන් කරන) නොඑසේ නම්, ජෝර්දානයේ සිට ඇලන්බි පාළම හරහා පැමිණෙන, සංක්‍රමණික ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවන් භාර ගැනීමට කටයුතු කරන මෙන් ඉල්ලීමක් කළේය.

- ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවන්ට පලස්තීනයේ සේවයෙහි යෙදීමට හා වඩා හොඳ වැටුප් ලබාගැනීමට හැකි වන පරිදි විශේෂ රැකියා බලපත්‍ර ලබාදීම සඳහා ඊශ්‍රායල් බලධාරීන් සමඟ එක්ව අවශ්‍ය සියලු කටයුතු සම්පාදනය කිරීමට ගරු අමාත්‍යතුමා පොරොන්දු විය.

- ශ්‍රී ලංකා නියෝජිතවරයා, පලස්තීනයේ අනඛිතාවි ආයෝජන හා සංවර්ධන සමූහ ව්‍යාපාරයේ සමාජීය හා ආචාර ධර්මීය ආයෝජනය ලෙස ඉස්මතු වී සිටින අලි-ආර්ද් පලස්තීනියානු කෘෂි-නිෂ්පාදන සමාගමේ සභාපති සියාද් අනඛිතාවි මහතා හමුවිය.

අනබ්තාවි මහතා, 1950 දී පලස්තීනයේ නබ්ලුස් හි දී විවෘත කරන ලද හා මෙන්ම පසුගිය දස වසර තිස්සේ අරාබි ලෝකයේ රටවල් බොහොමයක විදේශ වෙළෙඳපොළවලට අපනයනය කිරීමට අමතරව, දේශීය වෙළෙඳපොළේ වැඩිම කොටසකට හිමිකම් කියන පලස්තීනයේ විශාලතම අයිස් ක්‍රීම් කර්මාන්ත ශාලාව වන අල්-ආර්ස් හි සභාපතිවරයා වෙයි. 2017 දී අනබ්තාවි මහතා, ශ්‍රී ලාංකික හවුල්කරුවන් සපයාගැනීමෙන් හෝ ශ්‍රී ලංකාව වෙත අපනයනය කිරීමෙන් හෝ කර්මාන්ත ශාලාවට අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීමෙන් හෝ හවුල් ව්‍යාපාරයකට එළඹීමේ ශක්‍යතාව පිළිබඳව දූත මණ්ඩලය සමඟ සාකච්ඡා කළේය. මෙම 2018 වර්ෂයේ දී අනබ්තාවි මහතා ශ්‍රී ලාංකික සමාගමක් සමඟ කොන්ත්‍රාත් ආරම්භ කොට ඇති අතර, ඔහු කොළඹ පිහිටි මැක්සන්ස් හෝල්ඩිංස් සමාගම හරහා අයිස්ක්‍රීම් අපනයනය ආරම්භ කරනු ඇත.

- පලස්තීනයේ වාණිජ මණ්ඩලය සමඟ සාකච්ඡාවක් පවත්වන ලදී.

- පලස්තීන ව්‍යාපාරිකයෙකු විසින් 2018 වර්ෂය තුළ දී කොළඹ, සමුද්‍රාසන්න මාවතේ ආපන ශාලාවක් විවෘත කිරීමට කටයුතු සලසා ඇත.

- පේරුසලමෙහි සංචාරක ඒජන්තවරුන් දෙදෙනෙකු වන, නේෂන්ස් ටුවර්ස් ඇන්ඩ් ට්‍රැවල්ස් ආයතනයේ කළමනාකාර වප්ඩි නම්මාරි මහතා සහ හෝලි පේරුසලම් ටුවර්ස් ඇන්ඩ් ට්‍රැවල්ස් ආයතනයේ මෙහෙයුම් කළමනාකරු ඩුනියා කඩොවුමි මහත්මිය සමඟ හමුවක් පවත්වන ලද අතර, ශ්‍රී ලංකාවේ සහ සිංගප්පූරුවේ සිට ශුද්ධ භූමිය වෙත වන්දනා ගමන් දිරිගැන්වීම පිළිබඳ සහයෝගිතාව ඇතිකරගත හැකි ආකාරයන් පිළිබඳ සාකච්ඡා කරන ලදී.

ඈ. කම්කරු සුභසාධනය

- ශ්‍රී ලංකා නියෝජිතවරයා, කම්කරු අමාත්‍ය ගරු මමොවුන් අබු ෂහ්ලා මැතිතුමා හමු වී පලස්තීනය/බටහිර ඉවුර ප්‍රදේශවල ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවන් සඳහා ඇති ඉල්ලුම පිළිබඳව සාකච්ඡා කළේය.

- පලස්තීනයේ රැකියාවල නිරත ශ්‍රී ලාංකිකයන් ටික දෙනා හමු වී ඔවුන් මුහුණ පාන ගැටලු පිළිබඳව තොරතුරු ලබා ගන්නා ලදී. මේ පිළිබඳව අදාල පලස්තීන බලධාරීන් ද හමු වී සාකච්ඡා කරන ලදී.

10. කටාරය

අ. ද්විපාර්ශ්වික සබඳතා

- විදේශ කටයුතු අමාත්‍ය ගරු තිලක් මාරපන මැතිතුමා 2018 අප්‍රේල් 15 දින කටාරයේ සංචාරයක යෙදුණේය. ඔහු දේශපාලනය, ආර්ථික තත්වය, කටාරයේ වෙසෙන ශ්‍රී

ලාංකිකයන්ගේ සුබසාධනය හා කටාරයේ රැකියා අවස්ථාවන් පිළිබඳව තානාපතිතුමා සමඟ සාකච්ඡා කළේය.

- විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය වසන්ත සේනානායක මැතිතුමා ඩෝහා හි පිහිටි ස්ටැෆර්ඩ් ශ්‍රී ලාංකික පාසල පිළිබඳ ගැටලු විසඳීමේ අරමුණින් 2018 මැයි 11-13 දිනවල කටාරයේ සංචාරයක යෙදුණේය.

- විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුනතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍ය ගරු කරුණාරත්න පරණවිතාන මැතිතුමා 2018 අගෝස්තු 20-21 දිනවල කටාරයේ සංචාරයක යෙදුණ්ය. දෝහා හි පිහිටි ස්ටැෆර්ඩ් ශ්‍රී ලාංකික පාසලෙහි ද ඔහු සංචාරය කළේය. පාසලේ නව කළමනාකරණය පිළිබඳව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට විස්තර කරන ලද අතර, ඔහු තානාපතිතුමා විසින් ගෙන ඇති ක්‍රියාමාර්ගයන් අගය කළේය.

- කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ගරු රවීන්ද්‍ර සමරවීර මැතිතුමා 2018 අගෝස්තු 27 දින කටාරයේ සංචාරයක යෙදුණේය. ඔහු දෝහා හි පිහිටි ස්ටැෆර්ඩ් ශ්‍රී ලාංකික පාසලෙහි ද සංචාරය කළේය. පාසලේ නව කළමනාකරණය පිළිබඳව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට විස්තර කරන ලද අතර, ඔහු තානාපතිතුමා විසින් ගෙන ඇති ක්‍රියාමාර්ගයන් අගය කළේය.

- රාජ්‍යතාන්ත්‍රික, විශේෂ හා රාජකාරී ගමන් බලපත්‍ර දරන්නන් සඳහා ශ්‍රී ලංකාව හා කටාරය අතර වීසා නිදහස් කිරීම සඳහා අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම පිළිබඳ පසුවිපරම් කටයුතු සිදුකොට එය 2018 අගෝස්තු 22 දින සිට ක්‍රියාත්මක වන පරිදි ක්‍රියාවට නංවන ලදී.

- 2017 ඔක්තෝබර් 25-26 දිනවල අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ කටාරයේ රාජ්‍ය සංචාරය අතරතුර දී අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් හා එළැඹි තීරණ පිළිබඳ පසුවිපරම් කටයුතු සිදු කරන ලදී.

ආ. බහුපාර්ශ්වික සබඳතා

- අස්පෘශ්‍ය ලෝක උරුමය සුරක්ෂිත කිරීම සඳහා යුනෙස්කෝ අන්තර් රාජ්‍ය කමිටුවේ (ICH) 2018-2022 වාරයේ අසුනක් සඳහා තරඟ කිරීම පිණිස කටාර රාජ්‍යය ශ්‍රී ලාංකික අයදුම්කරුවන් හට සහයෝගය දැක්වීය.

ඇ. ආර්ථික සබඳතා හා විදේශ ආයෝජන

- ශ්‍රී ලාංකිකයන් හට කටාරයේ වැඩි රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම සඳහා කටාර්හි වාණිජ මණ්ඩලය සමඟ සහයෝගයෙන් යුතුව රැකියා ප්‍රවර්ධන වැඩසටහනක් දූත මණ්ඩලය විසින් 2018 ජනවාරි 25 දින දෝහා හි ෂෙරටන් ග්‍රෑන්ඩ්හි දී පවත්වන ලදී.

- ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ගරු ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මැතිතුමා ඇතුළු නියෝජිත කණ්ඩායම 2018 සැප්තැම්බර් 13 දින කටාරයේ සංචාරයක යෙදුණි. ගරු මහ බැංකුවේ අධිපතිතුමා දෝහා හි පිහිටි ස්ටැෆර්ඩ් ශ්‍රී ලාංකික පාසලේ ද සංචාරයක යෙදුණේය.

- ගරු මහ බැංකුවේ අධිපතිතුමා ඇතුළු නියෝජිත කණ්ඩායම පහත සඳහන් අය හමුවූහ:

  - කටාර්හි මහ බැංකුවේ අධිපති ගරු ෂෙයික් අබ්දුල්ලා බින් සාඔද් බින් අබ්දුලාසිස්-අල්-තානි මැතිතුමා හා ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලය

  - කටාර් නැෂනල් බැංකුවේ සමූහ ප්‍රධාන විධායක නිලධාරි අලි අහ්මඩ් අල් කුවාරි මහතා හා ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලය

  - කටාර් කොමර්ෂල් බැංකුවේ, ජාත්‍යන්තර බැංකුකරණය පිළිබඳ විධායක සාමාන්‍යාධිකාරී ෆාහඩ් බාදර් මහතා, ආයෝජන හා ක්‍රමෝපාය පිළිබඳ විධායක සාමාන්‍යාධිකාරී පර්වේස් බාන් මහතා හා වැඩබලන මූල්‍ය ආයතන ප්‍රධානි මන්සූර් සලෙම් මහතා.

  - කටාර් වාණිජ මණ්ඩලයේ උප සභාපති ගරු මොහම්මඩ් බින් අහ්මඩ් තවාර් අල් - කුවාරි මැතිතුමා.

- බැංකුකරණ, මූල්‍ය හා වෙනත් ආර්ථික ක්ෂේත්‍ර තුළ පවතින නව ආයෝජන අවස්ථා පිළිබඳව නියෝජිත කණ්ඩායම දැනුවත් කරන ලද අතර, ශ්‍රී ලංකාවේ දේශීය බැංකු පද්ධතියට ප්‍රතිලාභ සුරක්ෂිත කිරීම සඳහා නව මං හා වෙළඳපොළ පිළිබඳ ගවේෂණය කරන ලදී.

- මහ බැංකු අධිපතිතුමා ඇතුළු නියෝජිත කණ්ඩායම දෝහා බැංකුව විසින් සංවිධානය කරන ලද මාර්ග ප්‍රදර්ශනයකට ද සහභාගී වූහ.

- ශ්‍රී ලංකා තානාපතිමාගේ මූලාරම්භයෙන් ශ්‍රී ලංකා - කටාර් ව්‍යාපාරික කවුන්සිලය පිහිටුවා, තානාපතිතුමා සහ දෝහා බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරි විසින් 2018 සැප්තැම්බර් 13 දින නිල වශයෙන් විවෘත කරන ලදී.

- තානාපතිතුමාගේ මූලාරම්භය මත, දෝහා බැංකුවේ නියෝජිත කාර්යාලයක් 2018 ජුනි 07 දින ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද අතර, එමඟින් විදේශවල වෙසෙන ශ්‍රී ලාංකිකයන් හට ඔවුන්ගේ මුදල් ගනුදෙනු පහසු කිරීමටත් ණය පහසුකම් ලබා දීමටත් සහය දෙනු ලැබේ.

- ස්ටැෆර්ඩ් ශ්‍රී ලාංකික පාසලට නව සභාපතිවරයෙකු හා පාලන අධිකාරියක් පත් කිරීමට තානාපති කාර්යාලය විසින් 2018 ජූලි 04 දින පියවර ගන්නා ලදී. තානාපති කාර්යාලයේ අධීක්ෂණය යටතේ පාසල සුමට ලෙස ක්‍රියාකාරී වෙයි.

- තානාපතිතුමාගේ මූලාරම්භය මත, ලුලු සමූහ ව්‍යාපාරය විසින් එකතුකිරීමේ මධ්‍යස්ථානයක් කටුනායක දී විවෘත කරන ලද අතර, එමඟින් පළතුරු හා එළවළු එක්රැස් කොට මැදපෙරදිග කලාපයට අපනයනය කරනු ලැබේ.

- කොළඹ "කටාර් සිටි" නම් ව්‍යාපෘතියක් සිදු කිරීමට කටාර් වාණිජ මණ්ඩලය යෝජනා කළේය.

- කටාර් චැරිටි පුණ්‍යායතනය 2018 අගෝස්තු 03 දින ශ්‍රී ලංකාවේ දී ශාඛා කාර්යාලයක් විවෘත කළේය.

ඈ. සංස්කෘතික සබඳතා

- 2018 පෙබරවාරි 8 දින දූත මණ්ඩලය දෝහා හි ෂෙරටන් හෝටලයේ දී නිදහස් දින උත්සවය පැවැත්වීය.

- දූත මණ්ඩලය, තෙපොංගල් උත්සවය 2018 ජනවාරි 19 දින ද, වෙසක් උත්සවය 2018 අප්‍රේල් 26-30 දිනවල ද, ඉෆ්තාර් 2018 ජුනි 24 දින ද තානාපති කාර්යාලයේ දී පවත්වන ලදී.

ඉ. කම්කරු සුභසාධනය

- බඳවාගැනීමේ කාර්යාවලිය සරල කිරීම මඟින්, කම්කරු අංශය රැකියා ඒජන්තවරුන්/සමාගම්/ සේවයයන් හට ශ්‍රී ලාංකික සංක්‍රමණික කම්කරුවන් බඳවාගැනීම් සඳහා අවශ්‍ය මාර්ගෝපදේශයන් ලබා දීමෙන් සහය වෙයි.

- ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවන් තනි වශයෙන් (ශ්‍රී ලාංකික රැකියා ඒජන්සියක සම්බන්ධයක් නොමැතිව) බඳවා ගැනීමේ දී නැවත ආපසු ගෙවනු ලබන ඇප තැන්පතුවක් අය කරනු ලැබේ. මෙම මුදල කටාර් රියාල් 3,650/- කි. ආපසු ගෙවනු ලබන තැන්පතුව, යෝග්‍ය අනුග්‍රාහකයා හට නිදහස් කරනු ලැබේ.

- ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවන් තනි වශයෙන් (ශ්‍රී ලාංකික රැකියා ඒජන්සියක සම්බන්ධයක් නොමැතිව) බඳවා ගැනීමේ දී නැවත ආපසු නොගෙවනු ලබන ඇප තැන්පතුවක් අය

කරනු ලැබේ. මෙම මුදල කටාර් රියාල් 1,460/- කි. ආපසු නොගෙවනු ලබන තැන්පතුව, යෝග්‍ය අනුග්‍රාහකයා හට නිදහස් කරනු ලැබේ.

- ඉහත සඳහන් ගෙවීම්වලින් කටාර් ජාතික අනුග්‍රාහකයන් බැහැර කෙරෙන අතර, කටාර් ජාතික නොවන අනුග්‍රාහකයන් ආපසු ගෙවනු ලබන හෝ ආපසු නොගෙවනු ලබන ඇප තැන්පතුවක් කළ යුතු වේ. (ඔවුන්ගේ තීරණය පරිදි)

- 2018 ජනවාරි 1 දින හා 2018 සැප්තැම්බර් 30 දින අතර කාල සීමාවේ දී ගෘහ සේවිකාවන් (ගෘහ සේවිකාවන්/ළදරුවන් බලාගන්නියන්/නැනීවරියන් හා සේවිකාවන්) 136 දෙනෙකු තානාපති කාර්යාලය වෙත වාර්තා කොට ඇත. කටාර් රාජ්‍යයේ බලධාරීන්ගේ (උදා: අපරාධ සාක්ෂි හා තොරතුරු දෙපාර්තමේන්තුව (CEID), පොලිසිය, විදේශීය නියෝජිතායතන, යනාදී) මාර්ගයෙන් ඔවුන් ආපසු ශ්‍රී ලංකාවට එවීම හෝ නැවත රැකියාවලට යොමු කිරීම සිදු කරන ලදී.

- 2018 ජනවාරි 1 දින හා 2018 සැප්තැම්බර් 30 දින අතර කාල සීමාවේ දී පිරිමි සේවකයන්ගෙන් කම්කරු පැමිණිලි 1,014 ක් ලැබී ඇත. සියලුම පැමිණිලි පිළිබඳව කටයුතු කරන ලදී.

- වරින් වර සිර ගෙවල්/පිටුවහල් කිරීමේ මධ්‍යස්ථානවලට ගොස්, අත්‍යවශ්‍ය ද්‍රව්‍යයන් ලබා දෙන ලදී.

- තානාපති කාර්යාලයේ සුරක්ෂා නිවස්නයෙහි රඳවා සිටි ළදරුවන් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සහ දරු ආහාර ලබාදෙන ලදී.

- නැවත ශ්‍රී ලංකාවට යාම පිණිස සහාය අපේක්ෂා කළ, ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ අත්අඩංගුව යටතේ සුරක්ෂා නිවස්නයෙහි රඳවා සිටි කාන්තා රැඳවියන් හට අදාල ටිකට්පත් ගාස්තුව අපරාධ සාක්ෂි හා තොරතුරු දෙපාර්තමේන්තුව (CEID) හරහා ලබාදෙන ලදී.

- රෝහල්ගත කරන ලද රෝගීන් බැලීමට රෝහල්වලට සහ පැමිණිලි/ගැටලු පිළිබඳ සොයා බැලීමට සංක්‍රමණික කම්කරුවන්ගේ කම්කරු කඳවුරු වෙත යන ලදී.

- රැකියා අවස්ථාවන් වැඩිදියුණු කිරීම සඳහා රැකියා ප්‍රවර්ධන වැඩසටහනක් පැවැත්වූ අතර, සමාගම් වෙත යන ලදී.

- 2018 ජනවාරි 01 සිට 2018 සැප්තැම්බර් 30 දක්වා කාල සීමාව තුළ දී ගිවිසුම් 17,932 ක් සහතික කරන ලද අතර, රැකියා ඇනවුම් 274 ක් ක් සහතික කරන ලදී.

- 2018 ජනවාරි 01 සිට 2018 සැප්තැම්බර් 30 දක්වා කාල සීමාව තුළ දී සුරක්ෂා නිවස්නවල රැඳවියන් හට ආහාර හා ඖෂධ සැපයීම සඳහා රු. 1,112,534.64 ක මුදලක් වැය කරන ලදී.

11. සවුදි අරාබිය

අ. ද්විපාර්ශ්වික සබඳතා

- තානාපතිතුමා පහත සඳහන් අය සමඟ සාකච්ඡා පවත්වා ඇත:

- හජ් හා උම්රා පිළිබඳ අමාත්‍ය ගරු ආචාර්ය මොහමඩ් සලේ බින් තාහිර් බෙන්ටන් මැතිතුමා

- නැගෙනහිර පළාතේ ආණ්ඩුකාර සවුද් බින් නයිෆ් බින් අබ්දුලාසිස් රජ කුමරු

- රියාද්හි නියෝජ්‍ය ආණ්ඩුකාර මොහමඩ් බින් අබ්දුර්රහ්මන් බින් අබ්දුලාසිස් රජ කුමරු

- අභ්‍යන්තර කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු ආචාර්ය නසර් අල් ඩාවුඩ් මැතිතුමා

- විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ කොන්සියුලර් කටයුතු පිළිබඳ නියෝජ්‍ය අමාත්‍ය ගරු තමීම් බින් මජිඩ් අල් ඛවිසරි මැතිතුමා

- විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ දේශපාලන හා ආර්ථික කටයුතු පිළිබඳ නියෝජ්‍ය අමාත්‍ය ගරු ආචාර්ය අඩෙල් සිරජ්මිර්ඩාඩ් මැතිතුමා

- තානාපති කාර්යාලයේ '2020 දැක්ම' වැඩසටහන යටතේ අපේක්ෂිත ව්‍යාපෘති මෙම සම්පූර්ණ කාල සීමාව තුළදීම ක්‍රියාත්මක කරන ලදී.

- ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සවුදි අරාබි රාජධානියෙන් ලැබෙන දායකත්වය උපරිම කිරීමටත්, සවුදි අරාබි රාජධානියේ වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාවගේ සුබසාධනය වැඩිදියුණු කිරීමටත්, සවුදි අරාබි රාජධානියේ වෙසෙන ශ්‍රී ලාංකිකයන් හට තානාපති කාර්යාලයෙන් සැලසෙන සේවාවන්ගේ ප්‍රමිතිය වැඩිදියුණු කිරීමටත් සඳහා තානාපතිතුමා, තානාපති කාර්යාලයේ කාර්ය මණ්ඩලය හා ශ්‍රී ලාංකික වෘත්තිකයන් විසින් මෙම වැඩසටහන සකස් කරන ලදී.

- කළුගඟ සංවර්ධන ව්‍යාපාරය පිළිබඳ ණය ගිවිසුම අත්සන් කිරීම සඳහා සවුදි සංවර්ධන අරමුදලේ නියෝජිත කණ්ඩායම 2018 ජූලි 18-19 දිනවල ශ්‍රී ලංකාවේ සංචාරය කළේය.

- ශ්‍රී ලංකාවේ සවුදි තානාපති අබ්දුල්නසර් එච්.ඕ. අල් හාර්ති මැතිතුමා 2018 මැයි 25 දින අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වෙත සිය අක්තපත්‍රය පිළිගැන්වීය.

ආ. බහුපාර්ශ්වික සබඳතා

- තානාපති කාර්යාලය, ඉස්ලාමීය රටවල සංවිධානයේ (OIC) මහලේකම් ආචාර්ය යූසෙෆ් බින් අහ්මඩ් අල් ඔතයිමීන් මැතිතුමා සමඟ සාකච්ඡා පැවැත්විය.

ඇ. ආර්ථික සබඳතා හා විදේශ ආයෝජන

- තානාපති කාර්යාලය, ශ්‍රී ලංකාවට පැමිණෙන සවුදි ව්‍යාපාරිකයන් හට නිරතුරුවම පහසුකම් සපයයි. සවුදි ව්‍යාපාරිකයෝ කණ්ඩායමක් 2018 ශ්‍රී ලංකා ආයෝජක හා ව්‍යාපාරික සමුළුවට සහභාගී වූහ. ශ්‍රී ලාංකික සමාගම් සඳහා සවුදි අපනයන වැඩසටහන (SEP) හරහා 'මූල්‍ය මාර්ග' පහසුකම් සළසා ගැනීමට ද තානාපති කාර්යාලය සහාය විය. මෙය, ලංකා වාණිජ මණ්ඩලය (CCC) හා සවුදි වාණිජ මණ්ඩල සභාව අතර 2017 දෙසැම්බර් මාසයේ දී අත්සන් කරන ලද ද්විපාර්ශ්වික සහයෝගිතා ගිවිසුමෙහි ප්‍රතිඵලයක් විය. තානාපති කාර්යාලය, දමාම් වාණිජ මණ්ඩලය සමඟ ද රැස්වීම් පැවැත්වූ අතර, සවුදි සංවර්ධන අරමුදල හා ශ්‍රී ලාංකික බලධාරීන් අතර සබරගමුව විශ්වවිද්‍යාලය හා කළුගඟ ව්‍යාපෘති පිළිබඳ සාකච්ඡාවලට පහසුකම් සැලසීය.

- තානාපති කාර්යාලය, පේටීටීඑක්ස් සංචාරක පොළ, රියාද් සංචාරක පොළ සහ රියාද්, පේඩා හා දමාම්වල පැවති මාර්ග ප්‍රදර්ශන වැනි සංචාරක ප්‍රවර්ධන අංගයන්වල දී ශ්‍රී ලංකාව නියෝජනය කළේය.

- '2020 දැක්ම' වැඩසටහන යටතේ තානාපති කාර්යාලය අරාබි සමාජ ජාලා පරිශීලකයන් අතර ශ්‍රී ලාංකික සංචාරක කටයුතු ක්ෂේත්‍රය ප්‍රවර්ධන කිරීම සඳහා වීඩියෝ පටයක් ද නිර්මාණය කළේය.

ඈ. සංස්කෘතික සබඳතා

- 2018 පෙබරවාරි 27 දින තානාපති කාර්යාලය, විශේෂ අමුත්තා ලෙස රියාද්හි ආණ්ඩුකාර ෆයිසාල් බින් බන්දාර් බින් අබ්දුල් අසිස් අල් සවුද් රජ කුමරුගේ සහභාගිත්වයෙන් ශ්‍රී ලංකාවේ 70 වැනි නිදහස් සමරු උළෙල පැවැත්විය. මෙහි දී ශ්‍රී ලංකාවේ සාරවත් සංස්කෘතික උරුමය විදහා දක්වන සංස්කෘතික ප්‍රදර්ශනයක් ද සංවිධානය කොට තිබුණි.

- ශ්‍රී ලාංකික බෞද්ධ, හින්දු හා ක්‍රිස්තියානි ප්‍රජාවන් හට තම ආගමික හා සංස්කෘතික ක්‍රියාකාරකම් සිදුකිරීම සඳහා තානාපති කාර්යාල පරිශ්‍රය තුළ පහසුකම් සලසන ලදී. තානාපති කාර්යාලය ඔවුනට සිංහල/දමිළ අලුත් අවුරුදු උත්සවය පැවැත්වීමට මෙන්ම, වෙසක් උත්සවය හා සීල ව්‍යාපාර ඇතුළු බෞද්ධ ආගමික කටයුතු 11 ක් ද, නත්තල් උත්සවය ඇතුළු කතෝලික ආගමික කටයුතු 38 ක් ද, තෙපොංගල් ඇතුළු හින්දු ආගමික කටයුතු 39 ක් ද සංවිධානය කිරීමට සහාය දුන් අතර, බෞද්ධ හා කතෝලික දහම්පාසල් වැඩසටහන් 28 ක් පවත්වන ලදී.

ඉ. කම්කරු සුභසාධනය

- තානාපති කාර්යාලය රාජධානියේ නැගෙනහිර පළාතේ ජංගම සේවාවන් 09 ක් පැවැත්වීය. වාර්තා වූ මරණ 55 ක් සම්බන්ධයෙන් කටයුතු කරන ලද අතර, එයින් 14 ක් භූමදානය කිරීමටත්, 36 ක් ශ්‍රී ලංකාවට යැවීමටත් කටයුතු කළ අතර, සිද්ධීන් 05 ක් පිළිබඳව කටයුතු කෙරෙමින් පවතී.

- තානාපති කාර්යාලයේ පුරුෂ අංශයට පිරිමි සේවකයන්ගෙන් පැමිණිලි 323 ක් ලැබුණු අතර, එයින් ගැටලු 218 ක් විසඳා දෙන ලදී. පීඩාවට පත් ශ්‍රී ලාංකික පිරිමි හා කාන්තා සේවකයන් හට පහසුකම් සැලසීම සඳහා, තානාපති කාර්යාලය 152 වතාවක් විවිධ පිටුවහල් කිරීමේ කඳවුරු, රෝහල්, පොලිස් ස්ථාන, සමාගම් හා කම්කරු උසාවිවලට යන ලදී. තානාපති කාර්යාලයේ ස්ත්‍රී අංශය ශ්‍රී ලාංකිකයන් සඳහා පහසුකම් සැලසීමට කාන්තා සුබසාධන/සමාජ සත්කාරක ආයතනවලට 76 වාරයක් ගොස් ඇති අතර, කම්කරු නඩු 30 සඳහා උසාවිවලට ද, බරපතල රෝගී අවස්ථා 25 ක් වෙනුවෙන් රෝහල්වලට ද, අවස්ථා 56 ක දී පොලිස් ස්ථානවලට ද ගොස් ඇත. දූත මණ්ඩලය විසින් සාමාන්‍ය වශයෙන් රැඳවියන් 33 දෙනෙකු පමණ තානාපති කාර්යාලයේ සුරක්ෂා නිවස්නයෙහි රඳවා ගනී. අදාළ කාලසීමාව තුළ දී කාන්තා ගෘහ සේවිකාවන් 299 දෙනෙකුට සුරක්ෂා නිවස්නයෙහි රැකවරණය ලබා දෙන ලදී. රැඳවුම් බාරයේ සිටින ශ්‍රී ලාංකිකයන් සඳහා පහසුකම් සැපයීම පිණිස තානාපති කාර්යාලයේ රැඳවියන් පිළිබඳ අංශය 32 වාරයක් සිරගෙවල්වලට ද, 48 වාරයක් උසාවිවලට ද ගොස් ඇත.

12. එක්සත් අරාබි එමීර් රාජ්‍යය

12.1 අබුඩාබි, එක්සත් අරාබි එමීර් රාජ්‍යය

අ. ද්වි පාර්ශ්වික සබඳතා

- ඉදිරියේ දී, ශ්‍රී ලංකාවේ සිට එක්සත් අරාබි එමීර් රාජ්‍යය වෙත සිදුකෙරෙන අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා හා ගරු විදේශ කටයුතු අමාත්‍යතුමාගේ ඉහළ මට්ටමේ සංචාරයන් සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කිරීම.

- අර්ජුන රණතුංග, හරින් ප්‍රනාන්දු, ඒ.එච්.එම්, ෆවුසි හා රිෂාඩ් බදියුදීන් ගරු අමාත්‍යවරුන්ගේ සංචාරයන් ඇතුළුව එක්සත් අරාබි එමීර් රාජ්‍යය වෙත අමාත්‍ය සංචාරයන් කිහිපයක් සිදුවිය.

- ශ්‍රී ලංකා ආරක්ෂක විද්‍යාලයේ උසස් හමුදා නිලධාරීන් විසින් එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙහි සිදුකළ අධ්‍යයන චාරිකාවක් සම්බන්ධීකරණය කරන ලද අතර, එක්සත් අරාබි එමීර් රාජ්‍යය විසින් එම නියෝජිත කණ්ඩායමට පහසුකම් සලසන ලදී.

- 02 වැනි ශ්‍රී ලංකා - එක්සත් අරාබි එමීර් රාජ්‍ය ඒකාබද්ධ කොමිසම කොළඹ දී පැවැත්වීම සඳහා කටයුතු සූදානම් කිරීම.

- ශ්‍රී ලංකාවේ එක්සත් අරාබි එමීර් රාජ්‍ය තානාපති ගරු අල් අහ්මඩ් අලි අල් මුල්ලා මැතිතුමා 2018 අප්‍රේල් 11 දින අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වෙත සිය අක්තපත්‍රය පිළිගැන්වීය.

ආ. බහුපාර්ශ්වික සබඳතා

- තානාපති කාර්යාලය, ජාත්‍යන්තර පුනර්ජනනීය බලශක්ති නියෝජිතායතනයේ (IRENA) රැස්වීම්වලට සහභාගී විය.

- අබුඩාබි සංවාදයේ ශ්‍රී ලංකා සහභාගිත්වයට තානාපති කාර්යාලය පහසුකම් සැලසීය.

ඇ. ආර්ථික සබඳතා හා විදේශ ආයෝජන

- ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමාගේ නායකත්වයෙන් යුත් නියෝජිත කණ්ඩායම හා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ මහ බැංකුවේ අධිපතිතුමා අතර සාකච්ඡා පහසුකම් සලසන ලදී. ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික බැංකු ක්ෂේත්‍රවල උසස් නිලධාරීන් කිහිප දෙනෙකු ද සාකච්ඡා සඳහා සහභාගී වූහ.

- ඩුබායිහි පැවති ආයෝජන සමුළුවට සහභාගී වූ අතර, ශ්‍රී ලංකාවෙහි ආයෝජන ප්‍රවර්ධනය කරන ලදී.

ඈ. සංස්කෘතික සබඳතා

- අබුඩාබිහි වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාවේ සාමාජිකයන් විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලාංකික සංගීත ප්‍රසංග, චිත්‍ර පන්ති හා තරඟ, පොත් ප්‍රදර්ශන, සංස්කෘතික අංග, ඉෆ්තාර්, අලුත් අවුරුදු උත්සවය, දහම් පාසල්, යනාදිය ඇතුළුව, සංස්කෘතික අංග කිහිපයකට තානාපති කාර්යාලය පහසුකම් සැලසීය.

- එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාව සඳහා එහි බෞද්ධ මධ්‍යස්ථානයක් පිහිටුවීම පිළිබඳව ශ්‍රී ලංකාවේ හා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ විදේශ අමාත්‍යාංශයන් අතර පැවති සාකච්ඡා සඳහා පහසුකම් සැලසීය.

ඉ. කම්කරු සුබසාධනය

- තානාපති කාර්යාලය, එම කාර්යාල පරිශ්‍රයේ දී රැකියා ප්‍රවර්ධන රැස්වීම් පැවැත්වූ අතර, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ කම්කරු සුබසාධන වාර්තාව එළිදැක්වීමට ද සහභාගී විය. නීතිවිරෝධී සංක්‍රමණික සේවකයන් පිළිබඳ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ක්ෂමා

වැඩපිළිවෙල යටතේ නීතිවිරෝධී පදිංචිකරුවන් නීත්‍යානුකූල කිරීම/නැවත සියරටට එවීම සඳහා ද තානාපති කාර්යාලය දැනට පහසුකම් සලසයි.

12.2 ඩුබායි, එක්සත් අරාබි එමීර් රාජ්‍යය

අ. ආර්ථික සබඳතා හා විදේශ ආයෝජන

- වාර්ෂිකව ඩුබායිහි පැවැත්වෙන ලෝකයේ විශාලතම ආහාර පාන ප්‍රදර්ශනය වන '2018 ගල්ෆ් ආහාර ප්‍රදර්ශනය' (Gulf Food 2018) ට සහභාගී වීම පිණිස මෙතෙක් යවන ලද විශාලතම ශ්‍රී ලාංකික ආහාර පාන අපනයන සමාගම් කරුවන්ගේ කණ්ඩායමට අපනයන සංවර්ධන මණ්ඩලයේ හා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සහයෝගය ඇතිව පහසුකම් සලසන ලදී. මෙයට ශ්‍රී ලාංකික අපනයනකරුවන් 43 දෙනෙකු සහභාගී වූහ.

- ශ්‍රී ලංකාවේ 70 වන නිදහස් සමරුව හා ඩුබායිහි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය පිහිටුවීමේ 25 වැනි සංවත්සරය නිමිත්තකොට ගෙන, 2018 පෙබරවාරි 4 වැනි දින එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ප්‍රධාන ඉංග්‍රීසි පුවත්පත් වන 'Khaleej Times' හා 'Gulf News' හි පිටු 4 කින් සමන්විත විශේෂ අතිරේකයන් පළකරන ලදී.

- ශ්‍රී ලංකාවේ 70 වන නිදහස දිනය හා ඩුබායිහි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය පිහිටුවීමේ 25 වැනි සංවත්සරය වෙනුවෙන් 2018 පෙබරවාරි 4 වැනි දින බර්ජ් කලිෆාහි ආමනි හෝටලයේ දී පැවති නිදහස් සමරු උළෙලට සත්කාරකත්වය සපයන ලදී.

- ශ්‍රී ලංකාවේ 70 වන නිදහස දිනය හා ඩුබායිහි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය පිහිටුවීමේ 25 වැනි සංවත්සරය සමරමින්, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ පැවති විශාලතම ශ්‍රී ලාංකික උත්සව අංගය වන "2018 ශ්‍රී ලාංකික දිනය" (Sri Lankan Day 2018) ට සත්කාරකත්වය සපයන ලදී.

- ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය හා ශ්‍රී ලංකන් ගුවන් සේවය සමඟ එක්ව, ශ්‍රී ලාංකික සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කරමින්, 11 වැනි "Taste of Dubai" ආහාර උත්සවයේ තෙදිනක ශ්‍රී ලාංකික සහභාගිත්වයට පහසුකම් සලසන ලදී.

- ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය සමඟ එක්ව, 2018 අප්‍රේල් 22 සිට 25 දක්වා පැවති මැද පෙරදිග හා අරාබි කලාපවල ප්‍රධාන සංචාරක ප්‍රදර්ශනය වන 'අරාබියානු සංචාරක වෙළඳපොළ' (ATM) හි ශ්‍රී ලාංකික සහභාගිත්වයට පහසුකම් සලසන ලදී. සංචාරක කර්මාන්තයේ නියැළි ශ්‍රී ලාංකික සමාගම් 60 කට අධික සංඛ්‍යාවක් මෙයට සහභාගී වූහ. 2018 අප්‍රේල් 23 දින පුවත්පත් සාකච්ඡාවක් පැවැත්විණ.

- අප්‍රේල් 17 හා 19 දිනවල පිළිවෙලින් සාජා හා ඩුබායිහි සංචාරක ප්‍රවර්ධන සඳහා වූ මාර්ග ප්‍රදර්ශන වැඩසටහන් 2 ක් පැවැත්විණ.

- යෝජිත කොළඹ ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානය සඳහා භාවිත කිරීම සඳහා ඩුබායි ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානයේ නීතිමය රාමුව පිළිබඳ තොරතුරු ලබාගැනීම පිණිස, ශ්‍රී ලංකා රජයේ උපදේශක වයි. විජේතිලක මහතාට ඩුබායි ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානයේ ප්‍රධාන නීති උපදේශකවරයා හා අනෙකුත් අදාළ නිලධාරීන් හමුවීම සඳහා සාර්ථකව කටයුතු සලසන ලදී.

- ශ්‍රී ලංකාව සඳහා සුදුසු ස්ථානයක් හඳුණාගැනීම ඇතුළුව, 'එක්ස්පෝ 2020' ප්‍රදර්ශනයෙහි ශ්‍රී ලාංකික සහභාගිත්වය සඳහා අවශ්‍ය සහය ඩුබායිහි එක්ස්පෝ ලේකම් කාර්යාලය සමඟ එක්ව ලබා දෙන ලදී.

- සති 3 ක් ඇතුළත විදේශ ගමන් බලපත්‍ර ලබාදීම ඇතුළුව, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ රැඳී සිටින නීතිවිරෝධී සංක්‍රමණික විදේශිකයන්ට සහය වීම පිණිස එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙන් ප්‍රකාශිත විශේෂ ක්ෂමා කාලසීමාව යටතේ තම ශ්‍රී ලංකාවට පැමිණ තම වීසා තත්වය නීත්‍යානුකූල කරගැනීමට අපේක්ෂා කරන ශ්‍රී ලාංකිකයන් හට සහාය වීම සඳහා, ශ්‍රී ලංකාවේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සමඟ විශේෂ වැඩ සැලැස්මක් ඇතිකර ගන්නා ලදී.

- එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ජාතික ප්‍රවාහන හා සැපයුම් සේවා සංගමයේ සභාපතිතුමා හා ජාත්‍යන්තර භාණ්ඩ නැවිගත කරන්නන්ගේ සංගමයේ ව්‍යාප්ත මණ්ඩලයේ උපසභාපතිවරයාට කොළඹ පැවති නාවුක, සැපයුම් සේවා හා ප්‍රවාහන ප්‍රතිසංස්කරණ සංසදයේ රාජ්‍ය හා පෞද්ගලික අංශවල ජාතික සංවාදයට සහභාගී වීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දෙන ලදී.

- ශ්‍රී ලංකාවේ සිට ඩුබායි වෙත ගිය අමාත්‍ය සංචාරයන් 7 ක් සඳහා පහසුකම් සලසන ලදී.

- ව්‍යාපාරික සබඳතා ඇතිකර ගැනීම සඳහා තේ, කුළුබඩු, පොල් ආශ්‍රිත නිෂ්පාදන හා තොරතුරු තාක්ෂණ නිෂ්පාදන යනාදී නිෂ්පාදන පිළිබඳව ශ්‍රී ලංකාවෙන් ලැබුණු වෙළඳ තොරතුරු විමසීම් 6 ක් සඳහා මෙම නිෂ්පාදන පිළිබඳ විභව ආනයනකරුවන් පිළිබඳ තොරතුරු ලබා දෙන ලදී.

- ශ්‍රී ලාංකික නිෂ්පාදන/සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ඩුබායි වෙත ගිය ශ්‍රී ලාංකික අපනයනකරුවන්/සමාගම් 141 කට ව්‍යාපාරික සබඳතා ඇතිකර ගැනීම සඳහා විභව ආනයනකරුවන්/සංචාරක කර්මාන්තයේ නියැලි සමාගම් හඳුන්වා දෙන ලදී.

- විශාලතම වාර්ෂික ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන වන, 2018 අප්‍රේල් 2 සිට 4 දක්වා ඩුබායිහි පැවති වාර්ෂික ආයෝජන රැස්වීමට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වන ලදී.

- ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමට කැමැත්ත පළකළ විශාල සංචාරක ආයතන ජාලයක් හමු වී, ආයෝජනයට අදාළ පාර්ශ්ව හඳුන්වා දීම මඟින් එම ආයෝජනය සාක්ෂාත් කර ගැනීම සඳහා අපේක්ෂිත සහය ලබා දෙන ලදී.

- මොහම්මඩ් ඕමාර් බින් හයිඩර් හෝල්ඩිං සමූහ ව්‍යාපාරයේ සභාපතිතුමා හමු වී, ඔවුන් ඉදිරියේ දී ශ්‍රී ලංකාවේ සිදුකිරීමට අපේක්ෂා කරන තෙල් පිරිපහදුවක් ඉදිකිරීම සඳහා වූ ආයෝජනය පිලිබඳ සාකච්ඡා කරන ලදී. ඔවුහු ශ්‍රී ලංකාවට පැමිණ තමන් සිදුකිරීමට අපේක්ෂා කරන ඇ.ඩො. බිලියන 5 ක ආයෝජනය පිළිබඳව ගරු අග්‍රාමාත්‍යතුමා සමඟ සාකච්ඡා කළහ.

- එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සමාගමකට ශ්‍රී ලංකාවේ ඇ.ඩො. මිලියන 10 ක මුළු ආයෝජනයකින් යුතු කෘෂිකර්ම ආශ්‍රිත ව්‍යාපෘතියක් සඳහා ආයෝජනය කිරීමට අවශ්‍ය සහය සලසා දෙන ලදී.

- ශ්‍රී ලංකාවේ හෝටල් ව්‍යාපෘතියක් හා හෝටල් සාමාන්‍යාධිකාරීවරුන් සඳහා පුහුණු වැඩසටහනක් පැවැත්වීම පිණිස, ඇ.ඩො. මිලියන 200 ක ආයෝජනයක් සිදුකිරීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර හෝටල් සාමාන්‍යාධිකාරීවරුන්ගේ සංගමයේ සභාපතිතුමා සමඟ සාකච්ඡාවක් පවත්වන ලදී. එම ආයෝජනය සාක්ෂාත් කරගැනීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත හඳුන්වා දෙන ලදී.

අ. ආර්ථික සබඳතා හා විදේශ ආයෝජන

- ශ්‍රී ලාංකික ප්‍රජාවගේ සහය ඇතිව, කොන්සල් ජනරාල් කාර්යාලය විසින් පහත සඳහන් අංග සංවිධානය කරන ලදී:
- ජාතික දින උත්සවය
- වෙසක් හා පොසොන් උත්සව
- අභිනවයෙන් පිහිටුවන ලද ලංකාරාමය පන්සලේ දී මාසික බෞද්ධ ආගමික වැඩසටහන්
- 600 කට අධික ශිෂ්‍යයන් (ඩුබායි හා උතුරු එමීර් රාජ්‍යයේ වෙසෙන ශ්‍රී ලාංකික බෞද්ධ ප්‍රජාවගේ දරුවන්) ගේ සහභාගිත්වයෙන් සෑම සිකුරාදා දිනකම කොන්සල් ජනරාල් කාර්යාල පරිශ්‍රයේ දහම් පාසල පැවැත්වීම

ඇ. කම්කරු සුභසාධනය

- සමාලෝචන කාලසීමාව තුළ දී රැකියා කොන්ත්‍රාත් 257 ක් ක්‍රියාත්මක කරන ලද අතර, නව රැකියා ඇනවුම් 179 ක් ලබාදෙන ලදී.

- සිරගෙවල සිටි ශ්‍රී ලාංකිකයන්ගේ අවශ්‍යතාවයන් වෙනුවෙන් 20 වතාවක් සිරගෙවල්වලට යන ලදී. ඩුබායි හා උතුරු එමීර් රාජ්‍යයේ පිහිටි ආගමන කාර්යාල හා පොලිස් ස්ථානවලට 202 වතාවක් ගොස් ඇත.

- රෝගී වූ ශ්‍රී ලාංකිකයන්ගේ සුබසාධනය පිළිබඳ සොයාබැලීමට ඩුබායි හා උතුරු එමීර් රාජ්‍යයේ පිහිටි රෝහල්වලට 36 වාරයක් ගොස් ඇත.

- බලධාරීන්ගේ ඉල්ලීම මත, ශ්‍රී ලාංකිකයන්ගේ අවශ්‍යතා පිළිබඳව සොයාබැලීමට අවස්ථා ගණනාවක දී කම්කරු කඳවුරුවලට යන ලදී.

- ශ්‍රී ලාංකිකයන්ගේ වන්දි ඉල්ලීම් සම්බන්ධව ප්‍රමුඛතා පදනමක් යටතේ කටයුතු කරන ලදී.

- ළඟම ඥාතීන් විසින් විසින් ඉල්ලා ඇති පරිදි මෘත දේහයන් ආපසු සියරටට එවීම: මෘත දේහයන් 31 ක් ආපසු මෙරටට එවන ලදී.

- ආගමන නිෂ්කාශනයෙන් අනතුරුව, සුරක්ෂා නිවස්න රැඳවියන් ඇතුළුව සේවකයන් 120 දෙනෙකු ආපසු මෙරටට එවන ලදී.

- දූත මණ්ඩලය වෙත පැමිණිලි 94 ක් හා ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය හරහා පැමිණිලි 122 ක් ලැබී ඇති අතර, එයින් 102 ක් පිළිබඳව කටයුතු කරන ලදී.

- එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ කම්කරු සහයෝගිතාව හා ගෘහස්ථ කම්කරුවන් පිළිබඳ ද්විපාර්ශ්වික සහයෝගිතාව සඳහා වූ සම්මත ප්‍රොටොකෝලය පිළිබඳ අවබෝධතා ගිවිසුමකට අත්සන් තබන ලදී.

- කොන්සියුලර් කටයුතු හා කම්කරු කටයුතු පිළිබඳ කාර්ය මණ්ඩලවලට මිනිස් ජාවාරම වැළැක්වීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් කොන්සල් ජනරාල් කාර්යාලයේ දී පවත්වන ලදී.

- අමාත්‍ය නිල සංචාරයන් දෙකක් සිදුවිය. විදේශ රැකියා අමාත්‍ය ගරු හරින් ප්‍රනාන්දු මැතිතුමා පැමිණ සුරක්ෂා නිවස්නය පරීක්ෂා කර බැලීය.

සාගර කටයුතු ක්‍රමෝපායික ආරක්ෂාව හා දේශගුණික විපර්යාස පිළිබඳ අංශය

සාගර කටයුතු, පරිසර හා දේශගුණික විපර්යාස අංශය

සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළ අංශයේ ප්‍රධාන කාර්ය ක්ෂේත්‍ර පහත දැක්වේ:

අ. ද්විපාර්ශ්වික සබඳතා

1. සාගර ආශ්‍රිත ගැටලු පිළිබඳව රටවල් කිහිපයක් සමඟ සබඳතා තරකර ගැනීමට මෙම අංශය කටයුතු කර ඇත. විශේෂයෙන්ම, නෝර්වේ, ජපානය, නෙදර්ලන්තය, ඕස්ට්‍රේලියාව ජර්මනියේ මැක්ස් ප්ලාන්ක් පදනම සහ ඕස්ට්‍රේලියාවේ පොදුරාජ්‍ය මණ්ඩලීය විද්‍යා හා කාර්මික පර්යේෂණ සංවිධානය වැනි සංවිධාන සමඟ සාකච්ඡා පවත්වන ලදී.

2. මෙම අංශය විසින් සංවිධානය කරන ලද සමුද්‍රීය ආරක්ෂාව, සුරක්ෂිතතාව සහ සාගර ගැටලු පිළිබඳ 3 වැනි ශ්‍රී ලංකා-ජපාන සංවාදය ජූලි මස 19 වන දින කොළඹ පිහිටි විදේශ කටයුතු අමාත්‍යාංශයේ දී පවත්වන ලදී. මෙම සංවාදයේ දී පහත දැක්වෙන තීරණාවලට එළඹ ඇත:

(i) ජපාන සමුද්‍රීය ස්වයං ආරක්ෂක හමුදා සහ ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව හා ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක හමුදාව අතර සහයෝගීතාව වර්ධනය කිරීමට දෙපාර්ශ්වය එකඟ විය.

(ii) ආසියාන් කලාපීය සංසදය (ARF) හා ආසියාවේ නැව්වලට එරෙහි මුහුදු කොල්ලකෑම් හා සන්නද්ධ කල්ලිවල සොරකම්වලට විරුද්ධව සටන් කිරීම සම්බන්ධ කලාපීය සහයෝගීතා ගිවිසුම් (ReCAAP) ඇතුළු බහු පාර්ශ්වීය රාමුවල වැඩිදියුණු කළ සහයෝගීතාව පිළිබඳව, එම කටයුතුවල වැඩි වශයෙන් නිරත වීමෙහි ඇති වැදගත්කම අවබෝධ කර ගනිමින් දෙපාර්ශ්වයම සාකච්ඡා කළ අතර

(iii) සාමුද්‍රීය ප්‍රදේශය පිළිබඳ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම පිළිබඳ විය හැකි සහයෝගීතා පිළිබඳ ගවේෂණය.

සාගර කටයුතු හා දේශගුණික විපර්යාස අංශය අදාළ දේශීය පාර්ශ්වකරුවන් හා ජපාන පාර්ශ්වය සමඟ ඉහත සඳහන් ගැටලු පිළිබඳව පසුවිපරම් කරනු ලැබේ.

3. ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (නාරා) සහ ඕස්ට්‍රේලියාවේ පොදුරාජ්‍ය මණ්ඩලයීය විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ සංවිධානය (CSIRO) අතර හවුල්කාරිත්වයක් ස්ථාපිත කිරීමේ ක්‍රියාවලිය මෙම අංශය විසින් යෝජනා කොට, ගවේෂණය කොට, ආරම්භ කරන ලදී. විද්‍යාත්මක පර්යේෂණ සහයෝගීතාව තවදුරටත් වර්ධනය කිරීම පිළිබඳ අභිප්‍රාය ලිපියක් දෙපාර්ශ්වය 2018 සැප්තැම්බර් 5 වැනි දින කොළඹ දී අත්සන් කළහ.

4. ශ්‍රී ලංකාවට අයත් මුහුදු ප්‍රදේශයේ විදේශ යාත්‍රාවන්හි සමුද්‍ර විද්‍යාත්මක පර්යේෂණ සඳහා අයදුම්පත්වලට අනුමැතිය ලබා දීම පිණිස සරල හා පහසු ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම පිළිබඳ සාකච්ඡා ආරම්භ කර ඇත. මෙම ක්‍රියාවලිය කඩිනමින් අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

5. සාමුද්‍රික අවකාශ සැලසුම්කරණය හා ඒකාබද්ධ වෙරළ කලාප කළමනාකරණය පිළිබඳ ජාතික පාර්ශ්වකරුවන්ගේ සම්මේලනයක් කැඳවීම සඳහා නෝර්වීජියානු රජයේ සහාය ලබා ගැනීමේ හැකියාව පිළිබඳව මෙම අංශය ගවේෂණය කරමින් සිටී.

6. 2018 දී සිදු වූ ඉහළ මට්ටමේ ද්විපාර්ශ්වික සංචාර හා සම්මන්ත්‍රණ සඳහා සාගර කටයුතු හා දේශගුණික විපර්යාස පිළිබඳව දේශන/යෙදවුම් ලබා දෙන ලදී. එනම්:

අ. 2018 මුල් භාගයේ දී සිංගප්පූරු අග්‍රාමාත්‍යතුමා, ඉන්දුනීසියාවේ ජනාධිපතිතුමා සහ වියට්නාම අගමැතිතුමා ගේ සංචාර පිළිබඳ සාකච්ඡා සටහන් සඳහා වූ යෙදවුම්.

ආ. 2018 මුල් භාගයේදී පවත්වන ලද 12 වන ආසියාන් කලාපීය සංසද විශේෂඥයින් හා ගෞරවනීය පුද්ගලයින්ගේ (ARF - EEPs) සමුළුව - සමුද්‍රීය ආරක්ෂාව පිළිබඳ හා ඉන්දු පැසිෆික් සහයෝගීතාව පිළිබඳ සාකච්ඡා සටහන්.

ඇ. 2018 අප්‍රේල් 11 වන දින කොළඹ දී පවත්වන ලද 3 වැනි ශ්‍රී ලංකා - වියට්නාම දේශපාලන උපදේශන සඳහා වූ යෙදවුම්.

ඈ.2018 ජූනි 20 දින විදේශ කටයුතු ලේකම්තුමා හා රාජ්‍ය ලේකම් පෙන්ස් ෆ්‍රොලිච්හොල්ට් මහතා සමඟ පවත්වන ලද නෝර්වේ සංවර්ධන සහයෝගීතාව පිළිබඳ රැස්වීම සඳහා යෙදවුම්.

ඉ. 2018 ජූනි 21 දින කොළඹ දී පවත්වන ලද "තිරසර සංවර්ධන ඉලක්කය 14 පිළිබඳ කලාපීය සම්මන්ත්‍රණය - ජලය යට ජීවිතය (නීල තිරසර සංවර්ධන ඉලක්කය)" සඳහා විදේශ කටයුතු ලේකම්තුමාගේ කථාව.

ඊ. 2018 අගෝස්තු 27-28 සිට වියට්නාමයේ හැනෝයිහි පැවැති 3 වැනි ඉන්දියානු සාගර සමුළුව සඳහා ගරු අග්‍රාමාත්‍යතුමාගේ කථාව.

උ.2018 අගෝස්තු 30-31 දිනවල දී පැවති කොළඹ ආරක්ෂක සමුළුවේ දී විදේශ කටයුතු ලේකම්වරයා විසින් පවත්වන ලද දේශනය සඳහා අවශ්‍ය කරුණු.

ඌ. ට්‍රැක් 1.5 "ඉන්දියානු සාගරය: අපේ අනාගතය අර්ථ දැක්වීම" සමුළුවේ දී ගරු අග්‍රාමාත්‍යතුමා හා සිංගප්පූරුවේ ගරු අග්‍රාමාත්‍යතුමා අතර පැවති හමුව සඳහා සාකච්ඡා සටහන්.

එ. 2018 සැප්තැම්බර් මාසයේ දී පොදුරාජ්‍ය මණ්ඩලයීය මහලේකම්වරයාගේ ශ්‍රී ලංකා සංචාරය සඳහා යෙදවුම්.

ඒ.2018 ඔක්තෝබර් 29-30 දිනවල දී පැවති අපගේ සාගර සමුළුවට සහ 2018 නොවැම්බර් 1-2 දිනවල දී ඉන්නිසියාවේ පැවති AIS සංසදයට සහභාගී වූ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායම සඳහා ප්‍රකාශ සහ සාකච්ඡා සටහන්.

ඒ. ඉන්දුනිසියාවේ බාලිහි දී පැවති 2018 දෙසැම්බර් 7-8 දිනවල දී පැවති ඉන්දියානු සාගරයේ සියළුම ප්‍රජාවන් ඇතුළත් වර්ධනයක් සඳහා සාමුද්‍රික සහයෝගීතාව වැඩිදියුණු කිරීම පිළිබඳ ඉන්දියානු සාගර වටදේදර රටවල සංගමයේ ඉහළ මට්ටමේ කණ්ඩායම සඳහා ඉදිරිපත් කිරීම හා කථාව.

ඔ.2018 දෙසැම්බර් 08 වැනි දින පැවති 2018 IOMAC-ONS සහතික පත්‍ර පාඨමාලාවේ දී පවත්වන ලද විදේශ කටයුතු / ලේකම්තුමාගේ කථාව

7. ගරු අමාත්‍යතුමා, ගරු රාජ්‍ය අමාත්‍යතුමා, ලේකම්තුමා සහ ජාත්‍යන්තර මට්ටමේ දී ශ්‍රී ලංකාව නියෝජනය කරන අනෙකුත් ඉහළ පෙළේ නියෝජිතයින්ගේ අවශ්‍යතාව හා ඉල්ලීම පරිදි සාගර කටයුතු සහ දේශගුණය පිළිබඳ තොරතුරු ලබා දෙන අංශය ලෙස මෙම අංශය ක්‍රියා කරයි.

8. මෙම අංශය, ජාත්‍යන්තර, අන්තර්ජාතික, කලාපීය සහ ජාතික මට්ටම්වල දී විදේශ කටයුතු අමාත්‍යාංශය නියෝජනය කරන අතර, වෙනත් රේඛීය අමාත්‍යාංශ, නියෝජිතායතන හා ආයතන සමඟ සාගර කටයුතු හා දේශගුණික වෙනස්වීම් පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් කටයුතු කරයි.

ආ. බහුපාර්ශ්වික සබඳතා

2018 සැප්තැම්බර් 4-5 දිනවල ශ්‍රී ලංකාවේ කොළඹ දී පැවති ඉන්දියානු සාගර වටදේදර රටවල සංගමයේ (IORA) සමුද්‍රීය සුරක්ෂිතතාව හා ආරක්ෂාව පිළිබඳ වැඩමුළුව.

1. 2017 දී දකුණු අප්‍රිකාවේ ඩර්බන්හි පවත්වන ලද 17 වන අමාත්‍යවරුන්ගේ සමුළුවේ දී සමුද්‍රීය සුරක්ෂිතතාව හා ආරක්ෂාව පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම පිහිටුවීම ඇතුළු තවත් කරුණු සම්බන්ධයෙන්, සමුද්‍රීය සුරක්ෂිතතාව හා ආරක්ෂාව පිළිබඳ 2017-2021 IORA ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකාව විසින් සම්බන්ධීකරණය කරනු ලබන බව තීරණය කරන ලදී. එබැවින්, ශ්‍රී ලංකාව IORA සමුද්‍රීය සුරක්ෂිතතාව හා ආරක්ෂාව පිළිබඳ ප්‍රමුඛතා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ප්‍රධාන සම්බන්ධීකාරක ලෙස කටයුතු කරයි.

2. ශ්‍රී ලංකාව භාරගත් මෙම ජාත්‍යන්තර ප්‍රයත්නය බලාත්මක කිරීම පිණිස, සාගර කටයුතු සහ දේශගුණික විපර්යාස අංශය විසින් 2018 සැප්තැම්බර් 4-5 දිනවල IORA සමුද්‍රීය සුරක්ෂිතතාව හා ආරක්ෂාව පිළිබඳ මූලික වැඩමුළුවක් කොළඹ දී සංවිධානය කරන ලදී. මෙම වැඩමුළුවේ දී IORA සාමාජික රාජ්‍යයන් හමු වී සමුද්‍රීය සුරක්ෂිතතාව හා ආරක්ෂාව පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම පිහිටුවීම සඳහා යොමුකිරීමේ අනුදේශ (TOR) සපුරා අවසන් කළේය.

3. වැඩමුළුවෙහි දී, ක්‍රියාකාරී කණ්ඩායම පිහිටුවීම සඳහා යොමුකිරීමේ අනුදේශ අවසන් කිරීම, IORA සමුද්‍රීය සුරක්ෂිතතාව හා ආරක්ෂාව පිළිබඳ ප්‍රමුඛතා ක්ෂේත්‍රයෙහි කටයුතු සම්බන්ධයෙන් වැදගත් සන්ධිස්ථානයක් සලකුණු කරයි. පාර්ශ්වකරුවන් අතර ප්‍රායෝගික

සම්බන්ධීකරණය සඳහා පහසුකම් සැපයීමෙන්, කලාපීය සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා සාමාජික රටවල්වල නාවික නිලධාරීන් සහ විශේෂඥයින් යෙදවීම පිණිස ක්‍රියාකාරී කණ්ඩායම යාන්ත්‍රණයක් සපයයි.

4. මෙම යොමුකිරීමේ අනුදේශ, සමුද්‍රීය සුරක්ෂිතතාව හා ආරක්ෂාව පිළිබඳ ක්ෂේත්‍රයෙහි ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාවන් ඉදිරියට ගෙනයාම සඳහා ක්‍රියාකාරී කණ්ඩායමෙහි අරමුණු පහත සඳහන් කරුණු ඇතුළත්ව විස්තර කරයි: ඉන්දියානු සාගර කලාපයේ සමුද්‍රීය සුරක්ෂිතතාව හා ආරක්ෂාව පිළිබඳ සාමූහික අවදානම, තර්ජන හා අවස්ථාවන් පිළිබඳව IORA සාමාජික රටවල් අතර පොදු අවබෝධතාවක් ඇති කිරීම, සමුද්‍රීය සුරක්ෂිතතාව හා ආරක්ෂාව පිළිබඳ ක්ෂේත්‍රයෙහි ශක්නුතාව හා ධාරිතාව ගොඩනැංවීම ඇතුළුව ඒකාබද්ධ ප්‍රතිපත්තිමය ප්‍රවේශයක් ඇති කිරීම, සමුද්‍රීය සුරක්ෂිතතාව හා ආරක්ෂාව ක්ෂේත්‍රයෙහි ධාරිතාව හා ශක්නුතාව ශක්තිමත් කිරීම මෙන්ම, ආයතන ගොඩනැඟීම සඳහා IORA රාමුව තුළ හවුල්කාරිත්වයක් ඇතිකිරීම සහ IORA සාමාජික රටවල් අතර සමුද්‍රීය ක්ෂේත්‍රයෙහි දැනුවත්භාවය (MDA) වැඩිදියුණු කිරීම.

5. ශ්‍රී ලංකාව හා ඕස්ට්‍රේලියාව මූලික වැඩමුළුව සඳහා සම සත්කාරකත්වය දැරූ අතර, ශ්‍රී ලංකාව, ඕස්ට්‍රේලියාව, ඉන්දියාව, ඉන්දුනීසියාව, මැඩගස්කරය හා දකුණු අප්‍රිකාව එහි සම සභාපතිත්වය දැරීය.

6. වැඩමුළුවේ සත්කාරකත්වය සඳහා අරමුදල් වශයෙන් ඕස්ට්‍රේලියා රජයෙන් ඕස්ට්‍රේලියානු ඩොලර් 50,000 ක මුදලක් මෙම අංශය ලබාගත්තේය.

7. සමුද්‍රීය සුරක්ෂිතභාවය හා ආරක්ෂාව පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම සඳහා කාර්යය නිර්දේශය සැකසීමේ මූලික වැඩමුළුව පිළිබඳ වාර්තාව, දකුණු අප්‍රිකාවේ බර්බන් නුවර දී 2018 ඔක්තෝබර් 31- නොවැම්බර් 2 දක්වා පැවති ඉන්දියානු සාගර වටද්දර රටවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කමිටුවට එහි 20 වැනි රැස්වීමේ හා දකුණු අප්‍රිකාවේ බර්බන් නුවර දී 2018 ඔක්තෝබර් 31- නොවැම්බර් 02 දක්වා වූ දින වලදී පැවති 18 වැනි අමාත්‍ය මණ්ඩලයීය රැස්වීමේ දී ඉදිරිපත් කරන ලදි. 2019 ක්‍රියාකාරී කණ්ඩායමේ පළමුවැනි රැස්වීමෙහි සත්කාරකත්වය දැරීමට ශ්‍රී ලංකාව සැලසුම් කරන අතර, මෙම අංශය මේ සම්බන්ධයෙන් මූලික සැකසුම් සිදු කිරීමේ ක්‍රියාවලියෙහි යෙදී සිටී.

8. සාමුද්‍රික සුරක්ෂිතභාවය හා ආරක්ෂාව පිළිබඳව ප්‍රධාන සම්බන්ධීකරණ රට වශයෙන් ශ්‍රී ලංකාව දරා ඇති ප්‍රයත්න සහ ලබා ඇති ප්‍රගතිය පිළිබඳව ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය සිය සතුට පළ කළේ ය.

9. පැවැත්වීමට යෝජිත ක්‍රියාකාරී කණ්ඩායමේ පළමු රැස්වීම, 2019 මැයි/ජුනි මාසවල දී පැවැත්වීමට නියමිතය. එය, ඉන්දියානු සාගර වටද්දර රටවල සංගමයේ කාර්ය සැලැස්මේ (2017-2021) දක්වා ඇති අරමුණු ඉටු කරගැනීමට හැකි වන පරිදි මුල් වසර දෙකක (2)

කාලසීමාවක් සඳහා සකසනු ලබන කෙටුම්පත් කාර්ය සැලැස්ම සමාලෝචනය සහ සාමාජික රටවල සාමූහික ප්‍රමුඛතා පිළිබඳව සාකච්ඡා කිරීම මෙහි අරමුණ වෙයි.

ඉන්දියානු සාගරයෙහි යාත්‍රාකිරීමේ නිදහස පිළිබඳ වැඩසටහන

1. ගරු අග්‍රාමාත්‍යතුමා විසින් දියත් කරන ලද වැඩසටහනකට අනුව, මෙම අංශය දැනට වෙරළාසන්න රාජ්‍යයන්ගේ හා සමුද්‍රය භාවිත කරන්නන්ගේ යහපත සඳහා ඉන්දියානු සාගරයේ යාත්‍රා කිරීමේ නිදහස සංරක්ෂණය කොට සුරක්ෂිත කිරීම පිළිබඳ ගවේෂණාත්මක සාකච්ඡා ආරම්භ කිරීමට කටයුතු කරමින් පවතී. මෙය අග්‍රාමාත්‍ය කාර්යාලය සහ ගරු අග්‍රාමාත්‍යතුමා විසින් පත් කරන ලද යාත්‍රාකිරීමේ නිදහස පිළිබඳ කාර්ය සාධන බලකාය සමඟ සාකච්ඡාවලින් අනතුරුව සිදු කෙරේ. මෙම වැඩසටහනේ කොටසක් ලෙස පහත සඳහන් පරිදි අංග 3 ක් සංවිධානය කොට/කෙරෙමින් ඇත:

   i. ට්‍රැක් II විද්වත් සම්මන්ත්‍රණයක් මෙල්බර්න්හි ඩීකින් විශ්වවිද්‍යාලයේ දී පවත්වන ලද අතර, ඊට මෙම අංශයේ නිලධාරීහු සහභාගී වූහ.

   ii. 2018 ඔක්තෝබර් 11-12 දිනවල ට්‍රැක් 1.5 අංගයක් පවත්වන ලදී.

   iii. ට්‍රැක් 1 අමාත්‍යවරුන්ගේ සමුළුවක් 2019 මැයි/ජූනි මාසවල පැවැත්වීමට නියමිතය.

ඉහත (ii) හි සඳහන් ට්‍රැක් 1.5 සංවාදය පිළිබඳ විස්තර පහත දැක්වේ:

ඉන්දියානු සාගරය: අපගේ අනාගතය අර්ථදැක්වීම, ට්‍රැක් 1.5 සංවාදය, 2018 ඔක්තෝබර් 11-12

1. වැඩසටහනේ අංගයක් ලෙස "ඉන්දියානු සාගරය: අපගේ අනාගතය අර්ථදැක්වීම" සමුළුව 2018 ඔක්තෝබර් 11-12 දිනවල ශ්‍රී ලංකාවේ, කොළඹ දී පැවැත්විණ. මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ (UNODC) ගෝලීය සමුද්‍රික අපරාධ වැඩසටහන සමඟ සහයෝගයෙන් යුතුව, අග්‍රාමාත්‍ය කාර්යාලයේ අනුග්‍රහය මත, විදේශ කටයුතු අමාත්‍යාංශය, ජාත්‍යන්තර සබඳතා හා ක්‍රමෝපායික අධ්‍යයන සඳහා වූ ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනය විසින් මෙම සමුළුව සංවිධානය කරන ලදී.

2.ඉන්දියානු සාගරයේ ආරක්ෂාව පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා 2018 ඔක්තෝබර් 11-12 දිනවල දී රටවල් 40 නියෝජිතවරු ශ්‍රී ලංකාවට පැමිණිය හ. අනාගතයේ දී ලෝක ආර්ථිකයේ වර්ධන ධ්‍රැවයක් බවට පත් වීම සඳහා හැකියාවක් ඇති සාගරයක් පිළිබඳ අවධානය යොමු කිරීම සඳහා ඉන්දියානු සාගර වෙරළාසන්න රටවල ජ්‍යෙෂ්ඨ නියෝජිතයන් සහ සමුද්‍රය ප්‍රධාන වශයෙන් භාවිත කරන්නන් ට්‍රැක් 1.5 සංවාදය මඟින් කොළඹට ඒකරාශී කරන ලදි.

3.අනෙකුත් නිලධාරීන් අතර ඉන්දියාව දකුණු අප්‍රිකාව, ඇ.ඒ.ජ, චීනය, ජර්මනිය, නෙදර්ලන්තය, සිංගප්පූරුව, ඉන්දුනීසියාව, ජපානය සහ යුරෝපා සංගමය යන රටවල හා සංවිධානවල ප්‍රධාන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ කලාපයෙන් ඔබ්බෙහි සිටින බුද්ධි මණ්ඩල නියෝජිතයන් මෙම නියෝජිත

පිරිසට අයත් විය. සාගර පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයාගේ විශේෂ නියෝජිත තනාපති පීටර් තොම්සන් මහතා ද මෙම සමුළුවට සහභාගී වීම සඳහා කොළඹට පැමිණියේ ය. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මෙම අවස්ථාව වර්ණාවත් කළේ ය.

4. අග්‍රාමාත්‍ය කාර්යාලය හා මෙම වැඩසටහන සම්බන්ධීකරණය කිරීම සඳහා ගරු අග්‍රාමාත්‍යතුමා විසින් පත් කරන ලද කාර්ය සාධන බලකාය සමඟ සාකච්ඡාවලින් අනතුරුව ඒවායෙහි සහයෝගය ද ඇතිව, සංකල්පීය රාමුව සකස් කිරීම හා පාර්ශ්වකරුවන්ගේ අන්තර් ක්‍රියාකාරිත්වය සඳහා පහසුකම් සැලසීම ඇතුළුව, ඉහත දක්වා ඇති සමුළු සඳහා සූදානම් වීමේ කටයුතු සිදු කිරීමේ ප්‍රධාන වගකීම මෙම අංශය දැරීය.

තිරසර සංවර්ධනය ඉලක්කය 14 පිළිබඳ කලාපීය සම්මන්ත්‍රණය - ජලය යට ජීවිතය (නීල තිරසර සංවර්ධනය ඉලක්කය)

1. 2018 ජුනි 21-22 දිනවල කොළඹ දී පැවති නෝර්වීජියානු රජයේ අනුග්‍රහය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථික අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද "තිරසර සංවර්ධනය ඉලක්කය 14 පිළිබඳ කලාපීය සම්මන්ත්‍රණය - ජලය යට ජීවිතය (නීල තිරසර සංවර්ධනය ඉලක්කය)" සංවිධාන කටයුතු සඳහා මෙම අංශය සහාය විය. සාගර කටයුතු හා දේශගුණික විපර්යාස අංශයේ අධ්‍යක්ෂ ජනරාල් සම්මන්ත්‍රණයේ සැසි දෙකෙහි මුලසුන දැරීය.

2. සම්මන්ත්‍රණයෙහි තවත් ප්‍රතිඵලයක් වූයේ ආචාර්ය ෆ්‍රිඩොෆ් නැන්සෙන් නෝර්වීජියානු පර්යේෂණ නෞකාව මඟින් ශ්‍රී ලාංකික මුහුදු ප්‍රදේශවල සිදුකළ මාළු තොග සමීක්ෂණය මඟින් වඩාත් යහපත් ධීවර කළමනාකරණයක් ඇතිකරගත හැකි වීමයි. මෙම සමීක්ෂණයේ මූලික ප්‍රතිඵල නාරා ආයතනයට දැනටමත් ඉදිරිපත් කර තිබේ. 1980 ගණන්වලින් පසුව මෙවැනි මත්ස්‍යගහන තක්සේරුවක් සිදු කළ පළමු වතාව මෙය වෙයි.

ඉන්දියානු සාගර වටද්දර රටවල් සඳහා සාගර විද්‍යාවන් හා පරිසරය පිළිබඳ IORA විශිෂ්ටතා කේන්ද්‍රය

- ඉන්දියානු සාගර වටද්දර රටවල් සඳහා සාගර විද්‍යාවන් හා පරිසරය පිළිබඳ විශිෂ්ටතා කේන්ද්‍රයක් (CoE) පිහිටුවීමට ශ්‍රී ලංකාව එකඟ විය.

- සමුද්‍ර ගවේෂණ කටයුතු සඳහා පහසුකම් සැලසීමේ ප්‍රධාන අරමුණින් යුතුව සම්බන්ධීකාරක ආයතනයක් ලෙස ක්‍රියා කිරීමට අපේක්ෂිත මෙම විශිෂ්ටතා කේන්ද්‍රය පිහිටුවීම සඳහා පහසුකම් සැලසීමට, මෙම අංශය රේඛීය නියෝජිතායතනයන් සමඟ සම්බන්ධීකරණය කරයි. විශිෂ්ටතා කේන්ද්‍රය නුදුරේ දී ක්‍රියාකාරී වීමට අපේක්ෂිතය.

පොදුරාජ්‍ය මණ්ඩලයීය නිල් ප්‍රඥප්තිය යටතේ කඩොලාන ප්‍රතිස්ථාපනය සඳහා වූ පොදුරාජ්‍ය මණ්ඩලයීය ක්‍රියාකාරී කණ්ඩායම

1. ශ්‍රී ලංකාව, පොදුරාජ්‍ය මණ්ඩලයීය නිල් ප්‍රඥප්තිය යටතේ කඩොලාන ප්‍රතිස්ථාපනය සඳහා වූ පොදුරාජ්‍ය මණ්ඩලයීය ක්‍රියාකාරී කණ්ඩායමෙහි පෙරමුණ ගෙන සිටී. මෙම වැඩසටහන යටතේ, පොදුරාජ්‍ය මණ්ඩලය හරහා කඩොලාන ආවරණය සුරැකීම හා ප්‍රතිස්ථාපනය සඳහා පොදුරාජ්‍ය මණ්ඩලයීය රටවල් කණ්ඩායමකට ශ්‍රී ලංකාව නායකත්වය සපයනු ඇත. අංශය, පොදුරාජ්‍ය මණ්ඩලයීය ලේකම් කාර්යාලය හා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සමඟ මූලික සැකසුම් සම්බන්ධීකරණය කළ අතර, රෝබීය නියෝජිතායතනයේ යෙදවුම් සමඟ වැඩසටහන සඳහා සංකල්ප පත්‍රය සැකසීය.

2.2018 නොවැම්බර් 26-28 දිනවලදී කෙන්යාවේ නයිරෝබිහි දී ආර්ථික සමුළුව පිළිබඳ ඉහළ මට්ටමේ සමුළුවට සමගාමීව පැවති නිල් ප්‍රඥප්තිය පිළිබඳව පොදු රාජ්‍ය මණ්ඩලයීය රැස්වීමට මෙම අංශයේ අධ්‍යක්ෂවරයා සහභාගි විය. 2018 ඔක්තෝම්බර් 27 වැනි දින කෙන්යාවේ දී පැවති නිල් ප්‍රඥප්තිය, කඩොලාන ආරක්ෂාව පිළිබඳ ශ්‍රී ලංකාවේ පසු විපරම් කටයුතු පිළිබඳව නියෝජනයක් සිදු කරන ලදී.

වෙනත් වැඩසටහන්

1. සිංගප්පූරුවේ හා ටෝකියෝහි පිහිටි අපගේ දූතමණ්ඩල හා එක්ව ආසියාවේ නැව්වල මුහුදු කොල්ලකෑම් හා සන්නද්ධ කල්ලිවල සොරකම්වලට (ReCAAP) එරෙහිව සටන් කිරීම සඳහා වූ කලාපීය සහයෝගිතා ගිවිසුම පිළිබඳ කටයුතුවල දී, මෙම අංශය ශ්‍රී ලංකා නාවික හමුදාවට හා ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකායට සහය වෙයි.

2. ජාත්‍යන්තර සූර්යබල එකමුතුව (ISA) සම්බන්ධ කටයුතුවල දී මෙම අංශය, අමාත්‍යාංශයේ ආර්ථික කටයුතු අංශය හා එක්ව, ජනාධිපති ලේකම් කාර්යාලය සහ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය සමඟ සමීපව කටයුතු කරයි.

3. 2018 සැප්තැම්බර් මස පැවති එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනයෙහි (UNGA) 73 වැනි සැසියේ දී ශ්‍රී ලංකාව මොන්ට්‍රියල් සංධානයේ කිගාලි සංශෝධනය අපරානුමත කළාය. මෙම අංශය, නීති අංශය හා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය හා එක්ව අපරානුමත කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධීකරණය කළේය.

4. මෙම අංශය, හරිත දේශගුණික අරමුදල (GCF), ගෝලීය හරිත වර්ධන ආයතනය (GGGI), කෘෂි වනවගා පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICRAF) හා ජාත්‍යන්තර කොරල් පර වැඩසටහන (ICRI) සඳහා වූ ගිවිසුම් පිළිබඳ කටයුතු සම්බන්ධීකරණය කරයි. ශ්‍රී ලංකාව, ගෝලීය හරිත වර්ධන ආයතනයේ (GGGI) සාමාජිකත්වය ලබා ගැනීම පිළිබඳ අභිප්‍රාය ලිපියක් 2018 දෙසැම්බර් මස දී ඉදිරිපත් කළාය. 2019 ජනවාරි මස දී ශ්‍රී ලංකාවට සාමාජිකත්වය ලබා ගැනීමේ ක්‍රියාවලිය සඳහා මෙම අංශය පහසුකම් සැලසීය.

5. මෙම අංශයේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා විසින් කොළඹ දී නෙදර්ලන්ත තානාපතිතුමා සමඟ පවත්වන ලද රැස්වීමක දී කරන ලද ඉල්ලීමකට අනුව හේග්හි පිහිටි ක්ලින්පෙන්ඩාල් ආයතනයේදී ශ්‍රී ලාංකික රාජ්‍ය තාන්ත්‍රිකයන්/නිලධාරීන් 10 දෙනෙකු සඳහා පූර්ණ අරමුදල් සහිතව පුහුණු ඉඩ ප්‍රස්ථා ලබා ගැනීමට හැකිවිය. මෙම පුහුණු වැඩසටහන 2018 නොවැම්බර් 5-16 දිනවල දී පවත්වන ලද අතර විදේශ කටයුතු අමාත්‍යාංශය මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යන අමාත්‍යාංශවල හා ශ්‍රී ලංකා නාවික හමුදාවේ නියෝජිතවරු මීට සහභාගී වූහ.

වැඩමුළු/සමුළු/සම්මන්ත්‍රණ

1. **නිල් කාබන් පිළිබඳ ඉන්දියානු සාගර සමුළුව** - ඉන්දියානු සාගර වටද්දර රටවල සංගම් ලේකම් කාර්යාලයේ සහ ඕස්ට්‍රේලියානු රජයේ විදේශ කටයුතු හා වෙළඳ දෙපාර්තමේන්තුවේ සහය ඇතිව, පොදුරාජ්‍ය මණ්ඩලයීය විද්‍යා හා කර්මාන්ත පර්යේෂණ සංවිධානය (CSIRO) සහ ඕස්ට්‍රේලියාවේ ජාතික විද්‍යා නියෝජිතායතනය විසින් සංවිධානය කොට, 2018 මාර්තු 19-23 දිනවල ඕස්ට්‍රේලියාවේ පර්ත්හි දී පවත්වන ලදී. මෙම අංශයේ සහකාර අධ්‍යක්ෂ සමුළුවට සහභාගී විය.

2. **ඉන්දියානු සාගරයේ සමුද්‍රීය සාමය පිළිබඳ ට්‍රැක් II සම්මන්ත්‍රණය** - 2018 අප්‍රේල් 30 දින සිට මැයි 1 දින දක්වා මෙල්බර්න්හි ඩීකින් විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලදී. මෙම අංශයේ අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායම සමඟ සහභාගී විය. මෙය 2018 ඔක්තෝබර් මස සංවිධානය කෙරුණු ට්‍රැක් 1.5 සම්මන්ත්‍රණය සඳහා මඟ පෙන්වන අංගයක් විය.

3. **2018 ජූලි 30-31 දිනවල ඩර්බන් හි පැවති ජ්‍යේෂ්ඨ නිලධාරීන්ගේ කමිටුවේ 8 වැනි අර්ධ වාර්ෂික රැස්වීම** - IORA ලේකම් කාර්යාලයේ සහයෝගය ඇතිව IORA හි වර්තමාන සභාපතිත්වය දරන දකුණු අප්‍රිකා ජනරජය විසින් කැඳවන ලදී. මෙම රැස්වීම මඟින්, 2017-2021 IORA ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිළිබඳව විශේෂ අවධානයකින් යුතුව, ප්‍රගතිය විමසා බැලීමට හා ඉදිරි ක්‍රියාමාර්ග සැලසුම් කිරීම පිණිස සාමාජික රටවල් 21 හා නියෝජිතායතන එක්රැස් කරන ලදී. මෙම අංශයේ අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායම සමඟ සහභාගී විය.

4. **2018 අගෝස්තු 27-28 වියට්නාමයේ හැනෝයි පැවති 3 වැනි ඉන්දියානු සාගර සමුළුව** - මෙම අංශය, වියට්නාමයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ එක්ව ගරු අග්‍රාමාත්‍යතුමාගේ සහභාගිත්වය සඳහා පහසුකම් සැලසීය. ගරු අග්‍රාමාත්‍යතුමාගේ නායකත්වයෙන් යුතු ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමට සාගර කටයුතු හා දේශගුණික විපර්යාස අංශයේ අධ්‍යක්ෂ ජනරාල් ද සහභාගී විය. විශේෂයෙන්ම, සමගාමීව පැවති ද්විපාර්ශ්වික රැස්වීම් හා සම්මන්ත්‍රණයේ ගරු අග්‍රාමාත්‍යතුමා පැවැත්වූ කථාව ඇතුළුව සංචාරයේ විස්තරාත්මක කරුණු සම්බන්ධයෙන් අංශය සහය ලබා දුන්නේය. මීට අමතරව, ගරු අග්‍රාමාත්‍යතුමා සමුළුවෙහි සංවිධායක කමිටුවේ සභාපතිත්වය දැරූ

බැවින්, මෙම අංශය රාජ්‍ය නායකයන් හා රජයයන් සමඟ සම්බන්ධ වීමට අග්‍රාමාත්‍ය කාර්යාලයට සහය ලබා දුන්නේය.

5. **ගාලු සංවාදය, ශ්‍රී ලංකාව - 2018 ඔක්තෝම්බර් 22-23** - එක්සත් ජාතීන්ගේ හා මානව සම්පත් අංශය සමඟ කටයුතු සම්බන්ධීකරණය කරමින් මීට සහභාගීවුවන්ට අවශ්‍ය වීසා බලපත් ලබාදීමේදී මෙම අංශය මඟින් අවශ්‍ය පහසුකම් සැලසන ලදී. මෙම අංශයේ අධ්‍යක්ෂක ජනරාල්වරයා සහ සහකාර අධ්‍යක්ෂකවරයා මෙම අවස්ථාවට සහභාගී වුහ.

6. **අපගේ සාගර සමුළුව, බාලි, ඉන්දුනීසියාව, 2018 ඔක්තෝම්බර් 29-30 සහAIS අමාත්‍ය මට්ටමේ රැස්වීම, මනාඩු, ඉන්දුනිසියාව, 2018 නොවැම්බර් 1-2** - මෙම අවස්ථාවට ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ සහභාගීත්වය සඳහා අවශ්‍ය පහසුකම් මෙම අංශය විසින් සලසන ලදි. මෙම අංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මීට සහභාගී වූ නේවාසික පිරිසට අයත් වූ අතර අදාළ පසු විපරම් කටයුතු ආරම්භ වී තිබේ.

7. **නිල් ආර්ථික සමුළුව පිළිබඳ ඉහළ මට්ටමේ සමුළුව, නයිරෝබි කෙන්යාව 2018 නොවැම්බර් 26-28-** මෙම සමුළුව කැඳවන ලද්දේ කෙන්යා රජය විසිනි. අදාල රේඛීය නියෝජිත ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත වූ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමක සහභාගිත්වය සඳහා අවශ්‍ය පහසුකම් මෙම අංශය විසින් සලසන ලදි. විදේශ කටයුතු අමාත්‍යාංශය නියෝජනය කරමින් මෙම අංශයේ අධ්‍යක්ෂවරයා ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමට එක් වූ අතර මේ පිළිබඳ පසු විපරම් කටයුතු ආරම්භ කොට තිබේ.

8. **'සාමුද්‍රික ආරක්ෂාවට හා ත්‍රස්තවාදය මැඩ පැවැත්වීමට අදාළ ජාත්‍යන්තර නෛතික ලේඛන හා ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ UNODC/IMO උප කලාපීය වැඩමුළුව, ලන්ඩන්, නොවැම්බර් 27-29** - ජාත්‍යන්තර සමුද්‍රිය සංවිධානය (IMO) සමඟ හවුල්කාරීත්වයෙන් UNODC ත්‍රස්තක්‍රියා වඅළැක්වීමේ අංශය, සමුද්‍රීය ආරක්ෂාව හා ත්‍රස්තවාදය මැඩ පැවැත්වීමට අදාළ ජාත්‍යන්තර නෛතික ලේඛන හා ප්‍රමිති ක්‍රියාත්මක කිරීම පිළිබඳව බංග්ලාදේශය, ශ්‍රී ලංකාව හා මාලදිවයින සඳහා උප කලාපීය වැඩමුළුවක් සංවිධානය කළේ ය. මෙය 2018 නොවැම්බර් 27-29 දිනවල දී එක්සත් රාජධානියේ ලන්ඩන් නුවර දී පවත්වන ලදි. මෙම වැඩමුළුවට සහභාගී වූ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමට මෙම අංහයේ සහකාර අධ්‍යක්ෂවරයා එක් වූ අතර ඒ පිළිබඳ පසු විපරමු කටයුතු ආරම්භ කොට තිබේ.

9. **දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්ය රාමුවේ පාර්ශ්ව සමුළුව (COP24) කටෝවයිස්, පෝලන්තය-** මෙම සමුළුවට සහභාගි වූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමට අවශ්‍ය පහසුකම් මෙම අංශය විසින් සලසන ලදි. මෙම නියේජිත පිරිසට මෙම අංශයේ අධ්‍යක්ෂවරයා එක් වූ අතර ඒ පිළිබඳ පසු විපරම් කටයුතු ආරම්භ කර තිබේ.

විදේශ දූත මණ්ඩල පාලන අංශය

විදේශ දූත මණ්ඩල පාලන අංශය

විදේශ දූත මණ්ඩල පාලන අංශයේ මූලික කාර්යභාරය වන්නේ මූල්‍ය පහසුකම් සහ ඒදිනෙදා කටයුතු සඳහා උපදේශකත්වය ඇතුළු අවශ්‍ය සම්පත් සැපයීමෙන්, රටින් බැහැරව පිහිටා ඇති ශ්‍රී ලංකා දූත මණ්ඩල / දූත කාර්යාලවල යහපැවැත්ම සඳහා පහසුකම් සැපයීමයි. එම දූත මණ්ඩල කාර්යාලවල චංචල සහ නිශ්චල වත්කම් කළමනාකරණය කිරීම සහ අමාත්‍යාංශය හා ලොව පුරා විහිදී ඇති දූත මණ්ඩල ජාලය අතර සිදුවන දෛනික සන්නිවේදන කටයුතු අධීක්ෂණය කිරීම ද මෙම අංශයට පැවරී ඇති වගකීම් අතරින් කොටසකි.

වර්තමානයේ රටින් බැහැරව පහත සඳහන් දූත මණ්ඩල සහ ඒකක ශ්‍රී ලංකාව පවත්වාගෙන යනු ලැබේ.

තානාපති / මහකොමසාරිස් කාර්යාල	-	50
එක්සත් ජාතීන්ගේ ස්ථිර දූත මණ්ඩල	-	02
නියෝජ්‍ය මහකොමසාරිස් කාර්යාල	-	01
නියෝජිත කාර්යාල	-	01
කොන්සල් ජනරාල් කාර්යාල	-	13
එකතුව	-	67

සටහන: සයිප්‍රසයේ සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහාත්, සයිප්‍රස් රජය සමඟ ද්විපාර්ශ්වීය සබඳතා ප්‍රවර්ධනය කිරීමටත්, අමාත්‍යාංශය විසින් සයිප්‍රස්හි නිකෝෂියා හි නව වෘත්තීය කොන්සාල් ජනරාල් කාර්යාලයක් ආරම්භ කිරීමට කෙටිකලකින් කටයුතු සැලසුම් කළ අතර එහි කොන්සාල් ජනරාල්වරයා සිය රාජකාරී කටයුතු ආරම්භ කළේය.

1. විදේශීය වත්කම් අත්පත් කරගැනීම සහ පවත්වාගෙන යෑම

(i) නිශ්චල දේපල

ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩල/තනතුරු සමඟ සාකච්ඡා කර සෑම වර්ෂයකම අපගේ විදේශ දූත මණ්ඩලවල භාවිතය සඳහා අඩුකරමින් නව දේපළ ද්විත්වයක් මිලදී ගැනීම සඳහා වැඩසටහනක් ඇත. 2018 වසරේදී හදිසි නවීකරණ සහ අලුත් වැඩියා කටයුතු පවතින දේපළ නවීකරණය කිරීමට/ඉදිකිරීමට අවධානය යොමු විය. මේ සම්බන්ධයෙන් සම්පූර්ණ ශ්‍රී.ල.රු. 187,703,579.26ක පිරිවැයක් දරා දූත මණ්ඩල 23ක දේපළ නවීකරණය කරන ලදී. අමාත්‍ය මණ්ඩල හෝ අමාත්‍යාංශයීය ප්‍රසම්පාදන කමිටු :(MPC) තීරණය පරිදි මේ සඳහා අවශ්‍ය අරමුදල් භාණ්ඩාගාරය ඔස්සේ සැලසුම් කරගන්නා ලදී.

2018 වර්ෂයේදී ශ්‍රී ලංකා රජයට අයත් දේපළ වල සිදුකළ ඉදිකිරීම්,නවීකරණය කිරීම්,ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳ විස්තර

	විස්තරය	ප්‍රමාණය (ශ්‍රී ල.රු.)
01	**බ්‍රසල්ස් - නිල නිවස්නය සහ චාන්සරිය** -චාන්සරි ගොඩනැගිල්ලේ අලුත් වැඩියා කටයුතු කිරීම - නිල නිවස්නය අලුත් වැඩියා කටයුතු කිරීම - නිල නිවස්නයට ගේට්ටුවක් සවි කිරීම - චාන්සරියට නව තිර රෙදි යෙදීම - චාන්සරියට නව පියන් යෙදීම - චාන්සරි ගොඩනැගිල්ල සහ නිල නිවස්නය නවීකරණය කිරීම හා නිල නිවස්නයට හිරු එළිය ලැබෙන ප්‍රමාණය අනුව සැකසිය හැකි වහළයක් සවි කිරීම	24,045,329.00
02	**ඔටාවා - නිල නිවස්නය** - නිල නිවස්නය නවීකරණය කිරීම - චාන්සරියෙහි නව දුරකථන/අභ්‍යන්තර දුරකථන පද්ධති සවි කිරීම	24,803,881.00
03	**කයිරෝ- චාන්සරිය** - චාන්සරිය නවීකරණය කිරීම	812,646.00
04	**පැරිස්- චාන්සරිය** - චාන්සරියේ මධ්‍යම උණුසුම් කිරීමේ පද්ධතිය අලුත් වැඩියා කිරීම	520,000.00
05	**බර්ලින්- චාන්සරිය** - චාන්සරියේ තාප්පය නවීකරණය කිරීම	9,436,194.00
06	**නව දිල්ලිය- නිල නිවස්නය,චාන්සරිය සහ කාර්යය මණ්ඩල නිල නිවාස** - නිල නිවස්නය නවීකරණය කිරීම -කවුළු ආවරණ අලුත් වැඩියා කිරීම සහ මහල් හතරකින් යුත් කාර්යය මණ්ඩල නිල නිවාසයේ තීන්ත	10,223,321.00

	ආලේපනය කිරීම -චාන්සරියේ විද්‍යුත් ට්‍රාන්ස්පෝමර පරීක්ෂා කිරීම සහ විදුලි සැපයුම් පද්ධති බෙදාහැරීමේ පුවරු අලුත් වැඩියා කිරීම /සේවා සැපයීම - චාන්සරියේ සහ නිල නිවස්නයේ බිම පිරිසිදු කිරීම සහ ඔප දැමීම -චාන්සරියේ මධ්‍යම වායු සමීකරණ පද්ධතිය අලුත් වැඩියා කිරීම සහ සේවා සැපයීම	
07	**චෙන්නායි- නිල නිවස්නය සහ චාන්සරිය** - චාන්සරියේ සූර්ය පැනල සවි කිරීම -චාන්සරි ගොඩනැගිල්ලේ සහ නියෝජ්‍ය මහ කොමසාරිස් නිල නිවස්නයේ ආරක්ෂිත කැමරා පද්ධති සවි කිරීම	**6,427,474.50**
08	**මුම්බායි- චාන්සරිය** - චාන්සරියේ බිම අලුත් වැඩියා කිරීම	**888,561.00**
09	**ජකර්තා-චාන්සරිය** -තානාපති කාර්යාල භූමියේ පිටුපස පරිශ්‍රයේ සිමෙන්ති ඇතිරීම	**1,201,596.00**
10	**ටෙහෙරාන්-චාන්සරිය** -නව චාන්සරිය කොටස්වලට වෙන් කිරීම	**1,490,000.00**
11	**ටෝකියෝ-චාන්සරිය** -චාන්සරියේ තිබූ උණුසුම් කිරීමේ සහ සිසිලන පද්ධතිය වෙනුවට නව පද්ධතියක් සවි කිරීම -චාන්සරියේ දෙවන මහලේ බිම සැකසීම	**13,788,376.00**
12	**කුවෙට්-චාන්සරිය** -චාන්සරියේ ආරක්ෂිත කැමරා පද්ධති සවි කිරීම	**526,333.00**
13	**ක්වාලා ලාම්පූර්- නිල නිවස්නය** - නිල නිවස්නයේ අභ්‍යන්තර අලංකරණය සහ ගෘහ භාණ්ඩ සැපයීම	**8,056,920.00**

	- නිල නිවස්නය නවීකරණය සහ අලුත් වැඩියා කිරීම	
14	**හේග්-චාන්සරිය** - නව චාන්සරියේ ආරක්ෂණ අනතුරු ඇඟවීමේ සංඥා සහ ආරක්ෂිත කැමරා පද්ධති සවි කිරීම - නව චාන්සරියේ අන්තර්ජාල සහ සන්නිවේදන පද්ධති සවි කිරීම	**6,603,826.00**
15	**මස්කට්-චාන්සරිය** - චාන්සරියේ ආරක්ෂිත කැමරා පද්ධති සවි කිරීම	**584,000.00**
16	**ප්‍රිටෝරියා -චාන්සරිය සහ කාර්යය මණ්ඩල නිල නිවාසය** - චාන්සරිය සහ කාර්යය මණ්ඩල නිල නිවාසය අලුත් වැඩියා කිරීම	**904,435.00**
17	**ඩුබායි-චාන්සරිය** -චාන්සරියට නව ප්‍රධාන ගේට්ටුවක් සවි කිරීම	**1,291,395.00**
18	**පිනීවා- නිල නිවස්නය** -නිල නිවස්නයේ ගේට්ටුව අලුත් වැඩියා කිරීම - නිල නිවස්නය අලුත් වැඩියා කිරීම -නිල නිවස්නයට තිර රෙදි සවි කිරීම -නිල නිවස්නයේ පැරණි විදුලි රැහැන් පද්ධතිය වෙනුවට නව පද්ධතියක් යෙදීම	**13,795,708.84**
19	**රියාද්- චාන්සරිය** - චාන්සරියේ ආරක්ෂිත කැමරා සවි කිරීම	**1,348,515.00**
20	**ලන්ඩන්- නිල නිවස්නය, චාන්සරී ගොඩනැගිල්ල සහ කාර්යය මණ්ඩල නිල නිවාස** -මහ කොමසාරිස් කාර්යාලයේ පිටුපස කොටස අලුත් වැඩියා කිරීම - මහ කොමසාරිස් කාර්යාලය, චාන්සරියේ ප්‍රධාන ශාලාව සහ පුස්තකාලය අලුත් වැඩියා කිරීම	**11,592,951.00**

21	**නිව් යෝර්ක්- චාන්සරිය** -චාන්සරි පරිශ්‍රය අලුත් වැඩියා කිරීම	**3,193,025.00**
22	**වොෂින්ටන් - නිල නිවස්නය, චාන්සරිය සහ පැරණි චාන්සරි ගොඩනැගිල්ල** -පැරණි චාන්සරියේ තින්ත ආලේප කිරීම -චාන්සරියේ පැරණි කුඩා උණුසුම් කිරීමේ පද්ධතිය වෙනුවට නව පද්ධතියක් සවි කිරීම - දූත මණ්ඩලවලට අයත් දේපළ 3ක් අලුත් වැඩියා කිරීම/වැඩි දියුණු කිරීම -චාන්සරියේ භූගත ජලවහන පද්ධතිය අලුත් වැඩියා කිරීම -නිල නිවස්නයේ ආරක්ෂකයින්ගේ කාමර සහ නාන කාමර අලුත් වැඩියා කිරීම	**45,234,062.00**
23	**නිකෝසියා- චාන්සරිය** -අලුතින් ඉදි කළ චාන්සරියෙහි දුරකථන/අභ්‍යන්තර දුරකථන පද්ධති,ෆැක්ස් සහ අන්තර්ජාල පද්ධති සවි කිරීම	**935,029.00**
	එකතුව	**187,703,579.00**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අත්පත් කරගත් නිව්යෝර්ක් හා බ්‍රසීලියා හා පිහිටි ගොඩනැගිලි දේපළ, විදේශ කටයුතු අමාත්‍යාංශයට (අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි) පවරා දීමේ කටයුතු 2018 මැයි මස ඔප්පුව පවරාදීම අත්සන් කර අවසන් කරන ලදී.

(ii) චංචල දේපළ

අ. වාහන

මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර විදේශ දූත මණ්ඩල පාලන අංශය විසින් අවශ්‍ය/ තනතුරු සඳහා අලුතින් වාහන මිලදී ගැනීමට හෝ මාරු කිරීමට පහසුකම් සලසයි.

විදේශයන්හි පිහිටි දූත මණ්ඩලවල භාවිතය සඳහා අදාළ කාලසීමාව තුළදී රු. 111,688,674.46 වාහන 15 ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදුනි.

නිව් යෝර්ක්, ඩුබායි, ප්‍රිටෝරියා, ඉස්ලාමාබාද්, බීරූට්, ක්වාලා ලාම්පූර්, හේග්, දෝහා හ ිදූත මණ්ඩල සඳහා කාර්ය මණ්ඩල වාහන මිලදී ගැනීම සඳහා ඉල්ලීම සලකා බැලීමට භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇත.

ආ. අනෙකුත් ප්‍රාග්ධන වත්කම්

(I) විදේශයන්හි පිහිටි විදේශ දූත මණ්ඩල කිහිපයක් විසින් සිදුකළ ඉල්ලීම මත, 2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා රුපියල් 133,615,559.63ක පිරිවැයකින් යුත් කාර්යාලීය උපකරණ හා දැව භාණ්ඩ, පිරියත, යන්ත්‍ර සූත්‍ර හා අනෙක් උපකරණ මිලදී ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් අනුමැතිය ලබාදී ඇත.

(II) **ගෘහ භාණ්ඩ හා උපකරණ ලබා ගැනීම පිළිබඳ වියදම් ප්‍රතිපූරණය කිරීම**

විදේශ රටවල පිහිටි දූත මණ්ඩල / දූත කාර්යාල සහ ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ වැනි අත්‍යවශ්‍ය බඩුබාහිරාදිය මිලදී ගැනීම ක්‍රමානුකූල කිරීම සඳහා අමාත්‍යාංශය අංක 27 හා 2018.08.19 දිනැති චක්‍රලේඛය නිකුත් කොට තිබේ. මේ අනුව, ඉහත චක්‍රලේඛයේ දක්වා ඇති උපදෙස් පිළිපදින ලෙස විදේශ රටවල පිහිටි දූත මණ්ඩල / දූත කාර්යාලවලට උපදෙස් ලබා දී තිබේ.

2. විගණන පරීක්ෂණ

අභ්‍යන්තර විගණන අංශය සමඟ සාකච්ඡා කර විදේශයන්හි පිහිටි දූත මණ්ඩල / තනතුරුවල විධිමත් විගණන පරීක්ෂණ සඳහා මෙම අංශය විසින් පහසුකම් සපයන ලදී. එක්සත් ජනපදය, කැනඩාව, කොරියාව,පිලිපීනය,ඉන්දුනීසියාව, ඔස්ට්‍රියාව,ප්‍රංශය හා ඉන්දියාවේ පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල විගණන පරීක්ෂණයක් පවත්වන ලදී.

3. නිල සංචාර පිළිබඳ පහසුකම් සැලසීම

විදේශ දූත මණ්ඩල යටතේ පවතින සංචාරක අංශය මගින් 2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා අමාත්‍යාංශයේ නිල සංචාර 140 ක් සඳහා වීසාපත් ලබාදීමට පහසුකම් සලසා ඇති අතර එම කාලසීමාව තුළදී නිලධාරීන් 282 සඳහා අවශ්‍ය සංචාරක දීමනා හා අනෙකුත් හිමිකම් පිළිබඳව ගෙවීම් කිරීමට කටයුතු කර තිබේ. විවිධ ආයතන වලින් රජයේ නිලධාරීන් සඳහා වීසා පහසුකම් සැලසීමට තෙවන පාර්ශ්වීය සටහන් 2,200ක් නිකුත් කර ඇත.

4. ආරක්ෂක තැපැල් අංශය

ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩල/තනතුරු සඳහා රාජතාන්ත්‍රික මලු යැවීම, විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/තනතුරු විසින් එවූ රාජතාන්ත්‍රික මලු එක්රැස් කිරීම හා අමාත්‍යාංශයේ අදාළ අංශ වෙත එක්රැස් කළ රාජතාන්ත්‍රික මලුවල ඇති අයිතම

බෙදාහැරීම, තවද අමාත්‍යාංශය විසින් කාලෝචිත පදනමින් පිරිවැය කපාහැරීමට හා වේගවත්ව තැපැල් මලු බෙදාහැරීම තහවුරු කිරීම පිණිස තෝරාගත් දූත මණ්ඩලවල රාජතාන්ත්‍රික මලු යැවීමට බාර ගැනීම සඳහා කුරියර් සමාගම්වල සහයෝගයෙන් ආරම්භ කර ඇත.

5. තොරතුරු තාක්ෂණ අංශය

තොරතුරු තාක්ෂණ අංශය මඟින් දෛනිකව විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/තනතුරු හා ශ්‍රී ලංකාවේ විදේශයන්හි පිහිටි අනෙකුත් සංවිධාන හා ආයතන විසින් ලැබෙන ෆැක්ස් හා විද්‍යුත් තැපැල් ලිපි 600-700 ක් අතර ප්‍රමාණයක් සම්බන්ධයෙන් කටයුතු සිදුකරයි. විදේශ කටයුතු ලේකම්තුමාගේ උපදෙස් පරිදි මෙම අංශයේ රාජකාරී වේලාව වෙනස් කොට තිබේ. (සතියේ දිනවල පෙ.ව.5.30 සිට ප.ව.10.00 දක්වාත් සෙනසුරාදා දින පෙ.ව.5.30 සිට ප.ව.9.00 දක්වාත් ඉරිදා දිනවල පෙ.ව.6.00 සිට ප.ව.7.00 දක්වා සහ රජයේ නිවාඩු දිනවල ප.ව.5.30 සිට ප.ව.8.00 දක්වාත් වේ.) මෙහි කාර්යය මණ්ඩලය සේවා වැඩමුර ක්‍රමය යටතේ සේවයෙහි යොදවා ඇත.

6. ප්‍රගති වාර්තාව හා වාර්ෂික කාර්යය සාධන වාර්තාව පිළියෙල කිරීම

විදේශ දූත මණ්ඩල අංශය අනෙක් අංශ සමඟ සම්බන්ධීකරණ කරමින් තුන්වන කාර්තුවේ කාර්යසාධන වාර්තාව හා වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කරයි.

7. ගමන් මලු ඇසිරීම හා ප්‍රවාහනය සහ රක්ෂණය කිරීම (පෞද්ගලික බඩුබාහිරාදිය)

විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාලවල සියරට පේරු පදනමින් බඳවා ගන්නා කාර්යය මණ්ඩලයේ බර ගමන් මලු (Heavy baggage) සඳහා සලසනු ලබන පහසුකම් ක්‍රමවත් කිරීම සඳහා අමාත්‍යාංශය අංක 216 දරන 2018.10.19 දිනැති අමාත්‍යාංශයීය උපදෙස් මාලා චක්‍රලේඛය නිකුත් කර තිබේ. අදාල වියදම් අඩු කිරීම සඳහා රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් හැර සිය රට පදනමින් බඳවාගන්නා අනෙකුත් කාර්යය මණ්ඩලයට 2018.10.19 දින සිට බර ගමන් මලු වෙනුවට එකවිට ගෙවන මුදලක් ලබා දීමට පියවර ගෙන තිබේ.

8. සියරට පේරු පදනමින් බඳවා ගන්නා සියලුම නිලධාරීන් සඳහා බද්ධ නිවාස භාර ගැනීම සහ භාරදීම පිළිබඳ උපදෙස් සහ බඩු වට්ටෝරුව.

විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාලවලට අනුයුක්තව සේවය කරන සියරට පේරු පදනමින් බඳවා ගන්නා සියලුම නිලධාරීන් සඳහා බද්ධ නිවාස භාර ගැනීම සහ භාරදීම පිළිබඳ උපදෙස් සහ බඩු වට්ටෝරුව දක්වාලමින් අමාත්‍යාංශය අංක 216 දරන 2018.10.19 දිනැති අමාත්‍යාංශයීය උපදෙස් මාලා චක්‍රලේඛය නිකුත් කර තිබේ. මේ අනුව, කුලී තැන්පතු ලබා ගැනීමට අපොහොසත් වන නිලධාරීන්ගේ අතිරේක ගාස්තුවක් අයකර ගනු ලබන අතර එමඟින් රජයට විශාල අරමුදල් ප්‍රමාණයක් ලබා දීමට අමාත්‍යාංශයට හැකි වෙයි.

9. මානව සම්පත් කළමනාකරණය

මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය

විදේශ කටයුතු ලේකම්තුමාගේ උපදෙස්වලට අනුව විදේශ දූත මණ්ඩල පාලන අංශය ප්‍රතිසංවිධානය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2018 නොවැම්බර් 19 වැනි දින සිට මානව සම්පත් හා දූත මණ්ඩල කළමනාකරණ අංශය පිහිටුවන ලදී. විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල /දූත කාර්යාල සියල්ලේම කාර්ය කටයුතු මනා ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සැලසීම මෙම අංශයේ මූලික කාර්යය වෙයි. මීට අමතරව විදේශ කටයුතු අමාත්‍යාංශයේ ඒදිනෙදා කටයුතු ඉටු කිරීම සඳහා අවශ්‍ය මානව සම්පත් හා මාර්ගෝපදේශ ලබාදීම ද මෙම අංශය මඟින් සිදුකරනු ලබයි. මෙම කාල සීමාව තුළ දී සිදු කරනු ලැබූ කැපී පෙනෙන කාර්ය කටයුතුවලින් සමහරක් මෙසේය:

I. ඩිජිටල්කරණය කළ මානව සම්පත් තොරතුරු පද්ධතිය

කාර්ය මණ්ඩල සම්බන්ධීකරණය හා පරිපාලන කටයුතුවලට පහසුකම් සැලසීම සඳහා අමාත්‍යාංශය තුළ හා විදේශයන්හි දූත මණ්ඩල/තනතුරු ඩිජිටල්කරණය කළ මානව සම්පත් කළමනාකරණ පද්ධතියක් ඇරඹීමේ ක්‍රියාවලිය විදේශ දූත මණ්ඩල පාලන අංශය විසින් නිමාකරන ලදී.

ii. බඳවා ගැනීම

විභාග දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව දූත මණ්ඩලවල ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් බඳවා ගැනීම සඳහාත්, අපගේ විදේශ දූත මණ්ඩලවල සේවය කිරීම සඳහා රජයේ කළමනාකරණ සහකරුවන් හා පුද්ගලික සහකරුවන් තෝරාගැනීම සඳහාත්, විදේශ දූත මණ්ඩල පාලන අංශය මඟින් විවෘත තරඟ විභාග පවත්වනු ලබයි.

විදේශ දූත මණ්ඩල පාලන අංශය මඟින් ශ්‍රී ලංකා විදේශ සේවයේ **III** ශ්‍රේණිය සඳහා නව නිලධාරීන් 19ක් බඳවාගත් අතර ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග **(I)** හා **(II)** පැවැත්වීමේ කටයුතු සම්බන්ධීකරණය කළේය.

iii. නව දූත මණ්ඩල ප්‍රධානීන් පත්කිරීම.

මෙම කාලසීමාව තුළදී දූත මණ්ඩල ප්‍රධානීන් /දූත කාර්යාල ප්‍රධානීන් දාහත් (17) දෙනෙකු පත් කිරීමට කටයුතු යොදා ඇත.

iv. විදේශ දූත මණ්ඩල සඳහා සහායක කාර්ය මණ්ඩල පත්කිරීම.

ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩල සේවය කිරීම සඳහා රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් 29 ක්, පුද්ගලික සහායකයන් 21 ක්, සහ සන්ධාන සහායකයන් 01 ක් පත්කරන ලදී.

v. මාරුවීම් මණ්ඩලය පත් කිරීම

ආයතන සංග්‍රහයේ 3 වැනි කොටසේ III පරිච්ඡේදයේ දක්වා ඇති පරිදි විදේශ කටයුතු ලේකම්වරයා විසින් මාරුවීම් මණ්ඩලය පත් කරනු ලැබේ. විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල පුරප්පාඩු පිරවීමේ දී අමාත්‍යාංශයේ සේවය කරන ශ්‍රී.ලං.වි.සේ. නිලධාරීන් තෝරා ගැනීම පිළිබඳව විදේශ කටයුතු ලේකම්වරයාට නිර්දේශ ලබා දීම මෙම මාරුවීම් මණ්ඩලයේ වගකීම වෙයි.

vi. විභාග ව්‍යුහය ප්‍රතිව්‍යුහගත කිරීම

විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සඳහා රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන් හා පෞද්ගලික සහකාරවරුන් තෝරා ගැනීම සඳහා වන තරඟ විභාගවල ව්‍යුහය ප්‍රතිව්‍යුහගත කිරීමට පියවර ගෙන තිබේ.

මානව සම්පත් සංවර්ධන ඒකකය

1. ශ්‍රී ලංකා විදේශ සේවයේ (SLFS) නිලධාරීන්ට අදාළව මානව සම්පත් ක්ෂේත්‍රයේ දිගු කාලයක් මුළුල්ලේ පවතින අවශ්‍යතාවලට විසඳුමක් ලබා දීම සඳහා 2016 ජනවාරි 25 වැනි දිනැති ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ වාර්තාවේ දක්වා ඇති නිර්දේශ පදනම් කර ගනිමින් මෙම මානව සම්පත් සංවර්ධන ඒකකය (HRDD) 2016 පෙබරවාරි 15 වැනි දින ස්ථාපනය කරන ලදි. 2016 මාර්තු මසදී, මෙම ඒකකය විදේශ දූත මණ්ඩල පාලන අංශයේ (OAD) අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතට ගන්නා ලදී.

2. අමාත්‍යාංශයේ, විශේෂයෙන්, ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන්ගේ මානව සම්පතෙහි පුහුණු කටයුතු අමාත්‍යාංශයේ එක් අංශයක් මගින් සිදු කරනු ලබන බව තහවුරු කිරීම මෙම ඒකකය ස්ථාපනය කිරීමේ අරමුණු වෙයි.

3. විදේශ දූත මණ්ඩල පාලන අංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා යටත් තව දුරටත් ක්‍රියාත්මක වන මෙම ඒකක මගින් පොදුවේ පුහුණු කිරීමේ සම්බන්ධයෙන් පහත සඳහන් කාර්ය කටයුතු සිදු කරන ලදී.

අ. ශ්‍රී.ලං.වි.සේ. නිලධාරීන් සඳහා පුහුණු

1. විදේශ කටයුතු අමාත්‍යාංශයට අදාළ සියලුම ක්ෂේත්‍ර පිළිබඳ ජාත්‍යන්තර පුහුණු හා වැඩමුළු සඳහා ශ්‍රී. ලං. වි. සේ. නිලධාරීන් නම් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය මෙම නිලධාරීන් සඳහා දකුණු ආසියාව, යුරෝපය, නැගෙනහිර ආසියා සහ ඇමරිකානු රටවලින් ලද පුහුණු ඉඩ ප්‍රස්ථා තිස් හතක් (37) ප්‍රදානය කරන ලදී.

2. බණ්ඩාරණායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය (BIDTI) සමඟ එක්ව, විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සේවය කරන නිලධාරීන් සඳහා මිනිස් ජාවාරම මැඩපැවැත්වීම පිළිබඳව මාර්ගගත පුහුණු පාඨමාලාවක් 2018 ඔක්තෝම්බර් 9 වැනි දින නිල වශයෙන් දියත් කිරීමට අවශ්‍ය පහසුකම් සලසන ලදී.

3. විදේශ කටයුතු අමාත්‍යාංශයේ හා බාහිර සම්පත්දායකයින් යොදා ගනිමින් නම් කළ තානාපතිවරුන් සහ මහ කොමසාරිස්වරුන් සඳහා 2018 අගෝස්තු 23 හා 24 දෙදින තුළ දී ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයේදී දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

4. නම් කළ මහ කොමසාරිස්වරුන් හා ආරක්ෂක පරිවාරක නිලධාරීන් සඳහා සැප්තැම්බර් 12 වැනි දින හිල්ටන් හෝටලයේදී ආචාර සමාචාර විධි පිළිබඳ එක් දින පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

5. නම් කළ ආරක්ෂක පරිවාරක නිලධාරීන් සඳහා දෙදින නම්නීකරණ වැඩසටහන 2018 සැප්තාම්බර් 13-14 දිනවලදී සංවිධානය කරන ලදී.

6. මිලෝදා ආයතනය සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, 2018 ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරී කාණ්ඩය සඳහා වැඩි දියුණු මට්ටමේ සන්නිවේදන කුසලතා පිළිබඳව පුහුණුවක් 2018 මැයි 14 සිට ජූනි 29 දක්වා කාලය තුළ දී පවත්වන ලදී.

7. 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය පිළිබඳ පනතේ ක්‍රියාත්මක කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2018 අගෝස්තු 18 වැනි දින බණ්ඩාරණායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනයේදී සංවිධානය කරන ලදී.

8. ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය සමඟ එක්ව 2018 දෙසැම්බර් මස දී පොදු රාජ්‍යතාන්ත්‍රික කටයුතු පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

ආ.'බ්‍රවුන් බෑග්' සැසිවාර

1. ලෝක කාන්තා දිනය සනිටුහන් කරමින් 2018 මාර්තු 8 වැනි දින විදේශ කටයුතු අමාත්‍යාංශයේ උපදේශිකා නීතීඥ ශර්මිලා පෙරේරා මහත්මිය 'සේවා ස්ථානයේදී ලිංගිකත්වය පදනම් කර ගනිමින් සිදු කරනු ලබන වෙනස් කොට සැලකීම කෙරෙහි මානව අයිතිවාසිකම් සහය' මැයෙන් ඉදිරිපත් කරන ලද දේශනය.

2. ප්‍රධාන පෙළේ සමාජ මාධ්‍ය විද්වතෙකු වන නාලක ගුණවර්ධන මහතා විසින් 2018 අප්‍රේල් 25 වැනි දින අමාත්‍යාංශයීය කුඩා සමුළු ශාලාවේදී පවත්වන ලද නූතන රාජ්‍යතාන්ත්‍රික කටයුතුවලදී සමාජ මාධ්‍යයේ කාර්ය භාරය පිළිබඳ සැසිවාරය.

3. 'රාජ්‍යතාන්ත්‍රික කටයුතු සහ සාගරය:සාගරය සහ එහි සම්පත් ආරක්ෂා කිරීම සහ යෝග්‍ය සංවර්ධනය' මැයෙන් ආචාර්ය පී.බී. ටර්නි ප්‍රදීප් කුමාර මහතා විසින් 2018 මැයි 23 වැනි දින පවත්වන ලද සැසිවාරය.

4. ආයෝජන මණ්ඩල නිලධාරීන් විසින් 2018 ජූනි 20 පවත්වන ලද ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු පිළිබඳ සැසිවාරය.

5. විගණකාධිපතිවරයාගේ නීති කෙටුම්පත් පිළිබඳව 2018 අගෝසතු 14 වැනි දින පවත්වන ලද සැසිවාරය.

6. මෙම අමාත්‍යාංශයට අදාළ වන සියලුම ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ලොව විවිධ රටවලදී ලබා දෙනු ලබන පුහුණු හා වැඩමුළු සඳහා ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් නම් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

ඈ. ශ්‍රී ලංකා විදේශ සේවයට බඳවා ගැනීම

ශ්‍රී.ලං.වි. සේවයට නිලධාරීන් විසි (20) දෙනෙකු බඳවා ගත් අතර ඔවුන් බණ්ඩාරණායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනයේ දී දෙමස පුහුණු වැඩසටහනක් සඳහා යොමු කිරීම.

ඈ. ශ්‍රී.ලං.වි. සේවයට අයත් නොවන නිලධාරීන් සඳහා පුහුණු ලබා දීම

විදේශ රටවල පිහිටි දූත මණ්ඩලවලට / දූත කාර්යාලවලට අනුයුක්ත කරනු ලබන රාජ්‍ය කළමනාකරණ සේවයේ නිලධාරීන් සඳහා එම දූත මණ්ඩල / දූත කාර්යාලවල සේවය කිරීමේදී වැදගත් වන විවිධ පැතිකඩවල් පිළිබඳව 2018 අගෝස්තු 25-30 දිනවලදී පුහුණු වැඩසටහනක් සංවිධානය කිරීම.

ඉ. දූත මණ්ඩල / දූත කාර්යාලවල කාර්ය සාධන ඇගයීම

i. දූත මණ්ඩල / දූත කාර්යාල හා අමාත්‍යාංශයේ වෙනත් අංශ සමඟ කටයුතු සම්බන්ධීකරණය කරමින් 2018 වාර්ෂික කාර්ය සාධන වාර්තාවේ කටයුතු නිම කිරීම.

ii. දූත මණ්ඩල / දූත කාර්යාලවල කාර්ය සාධනය ඇගයීමට හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ කාර්ය සැලැස්මට අදාළ මූලික කාර්ය කටයුතු 2018 දෙසැම්බර් මස ආරම්භ කරන ලදී.

iii. 2018 ඔක්තෝබර් මස පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට නියමිතව තිබූ වාර්ෂික කාර්ය සාධන වාර්තාවේ කටයුතු නිම කිරීම.

ඊ. ප්‍රතිපත්ති සංවර්ධනය

i. විදේශ සේවා දීමනාව (OSA); දූත මණ්ඩල/දූත කාර්යාලවල සේවය කරන නිලධාරීන්ට ගෘහ සේවය/සේවා සහාය/නිවාස රැක බලා ගැනීමේ සේවය ලබා ගැනීම; පිළිබඳ අමාත්‍යාංශීය උපදෙස් මාලාව (MIS) සංශෝධනය කරන ලදී.

ii. ගමන්මළු (පෞද්ගලික) ඇසිරීම හා ප්‍රවර්ධනය හා රක්ෂණය කිරීම පිළිබඳ අමාත්‍යාංශීය උපදෙස් මාලාව (MIS) සංශෝධනය කරන ලදී.

iii. සිය රට පේරු පදනමින් බඳවා ගන්නා එක් එක් තනතුරු ප්‍රවර්ගයට අනුමත කර ඇති උපරිම මුදල් ප්‍රමාණය ;ගෘහ භාණ්ඩ හා ගෘහ උපකරණ ලබා ගැනීම පිළිබඳ වියදම් ප්‍රතිපූර්ණය කිරීම පිළිබඳ අමාත්‍යාංශීය උපදෙස් මාලාව (MIS) සංශෝධනය කරන ලදී.

iv. බද්ධ නිවාස ලබා ගැනීම හා ආපසු භාර දීම සම්බන්ධයෙන් (සියරට පේරු පදනමින් බඳවා ගන්නා සියලුම නිලධාරීන්) සඳහා මාර්ගෝපදේශ හා බඩු බාහිරාදිය ඇතුළත් ලැයිස්තුව අමාත්‍යාංශීය උපදේශ මාලාව (MIS) සඳහා සැකසීම.

v. විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සේවය සඳහා පෞද්ගලික සහකාරවරුන් හා රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන් බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කරන ලද අතර කුසලතා පුර්ණ සහාය කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම සඳහා නව ව්‍යුහයක් සකසන ලදී.

vi. ශ්‍රී ලංකා විදේශ සේවයේ කාර්යක්ෂම හා කඩඉම් විභාගය සඳහා ගැසට් නිවේදනයේ කටයුතු නිම කිරීම.

ආ.'බ්‍රවුන් බෑග්' සැසිවාර

I. ලෝක කාන්තා දිනය සනිටුහන් කරමින් 2018 මාර්තු 8 වැනි දින විදේශ කටයුතු අමාත්‍යාංශයේ උපදේශිකා නීතීඥ ශර්මිලා පෙරේරා මහත්මිය 'සේවා ස්ථානයේදී ලිංගිකත්වය පදනම් කර ගනිමින් සිදු කරනු ලබන වෙනස් කොට සැලකීම කෙරෙහි මානව අයිතිවාසිකම් සහය' මැයෙන් ඉදිරිපත් කරන ලද දේශනය.

II. ප්‍රධාන පෙළේ සමාජ මාධ්‍ය විද්වතෙකු වන නාලක ගුණවර්ධන මහතා විසින් 2018 අප්‍රේල් 25 වැනි දින අමාත්‍යාංශයීය කුඩා සමුළු ශාලාවේදී පවත්වන ලද නුතන රාජ්‍යතාන්ත්‍රික කටයුතුවලදී සමාජ මාධ්‍යයේ කාර්ය භාරය පිළිබඳ සැසිවාරය.

III. 'රාජ්‍යතාන්ත්‍රික කටයුතු සහ සාගරය:සාගරය සහ එහි සම්පත් ආරක්ෂා කිරීම සහ යෝග්‍ය සංවර්ධනය' මැයෙන් ආචාර්ය පී.බී. ටර්නි ප්‍රදීප් කුමාර මහතා විසින් 2018 මැයි 23 වැනි දින පවත්වන ලද සැසිවාරය.

IV. ආයෝජන මණ්ඩල නිලධාරීන් විසින් 2018 ජුනි 20 පවත්වන ලද ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු පිළිබඳ සැසිවාරය.

V. විගණකාධිපතිවරයාගේ නීති කෙටුම්පත් පිළිබඳව 2018 අගෝසතු 14 වැනි දින පවත්වන ලද සැසිවාරය.

සන්ධාන අංශය

සන්ධාන අංශය

1. සන්ධාන අංශයේ කාර්ය කටයුතු පහත දැක්වෙන ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපය යටතේ වර්ග කළ හැකිය.:-

අ) සැමරුම් උත්සව සම්බන්ධීකරණය

ආ) විදේශීය රාජ්‍යතාන්ත්‍රික නියෝජන එක්සත් ජාතීන්ගේ සංවිධාන හා එහි විශේෂිත නියෝජිතායතන හා ශ්‍රී ලංකාවට අක්තගන්වා ඇති ජාත්‍යන්තර සංවිධානවලට පිරිනමා ඇති රාජ්‍යතාන්ත්‍රික වරප්‍රසාද හා විනිර්මුක්තීන්වලට අවශ්‍ය පහසුකම් සැලසීම හා නිරීක්ෂණය කිරීම.

ඇ) ශ්‍රී ලංකාවට අක්තගන්වා ඇති (කොළඹ පිහිටි දූත මණ්ඩලවල ප්‍රධානීන් හා වෙනත් දූත මණ්ඩලවලින් සමගාමීව අක්තගන්වන ලද) දූත මණ්ඩලවල ප්‍රධානීන් සඳහා පහසුකම් සැලසීම.

ඈ) ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ජාත්‍යන්තර සමුළු සඳහා සැපයුම් සේවා සහ සන්ධාන කටයුතු ඉටුකිරීම.

2. උත්සව අවස්ථා

සමාලෝචනයට බඳුන්වන කාලසීමාව තුළදී මෙම අංශය මගින් සම්බන්ධීකරණය කරන ලද අවස්ථා.

2.1 ශ්‍රී ලංකාවේ සංචාරවල නියැලෙන අතිශයින් වැදගත් පුද්ගලයන්ගේ/ඉතා වැදගත් පුද්ගලයන්ගේ සංචාර

2.1.1 රාජ්‍ය නායකයින්/අග්‍රාමාත්‍යවරුන්

2.1.2 විදේශ අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය විදේශ අමාත්‍යවරුන්

2.1.3 එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හා වෙනත් ජාත්‍යන්තර සංවිධානවල සම්භාවනීය පුද්ගලයන්

2.1.4 මාර්ගස්ථ සංචාර

2.1.5 වෙනත් විදේශීය සම්භාවනීය පුද්ගලයන්

ඇමුණුම I/I,I/II,I/III බලන්න

2.1.6 රැස්වීම්/සමුළු සඳහා නියෝජිත කණ්ඩායම්

2.2 ශ්‍රී ලාංකික අතිශයින් වැදගත් පුද්ගලයන්ගේ/ ඉතා වැදගත් පුද්ගලයන්ගේ සංචාර

2.2.1 අතිගරු ජනාධිපතිතුමාගේ රාජ්‍ය සංචාර (ඇමුණුම II)

2.2.2 ගරු අග්‍රාමාත්‍යතුමාගේ සංචාර (ඇමුණුම III)

2.2.3 ගරු විදේශ කටයුතු අමාත්‍යතුමාගේ සංචාර (ඇමුණුම IV)

2.2.4 නියෝජ්‍ය/විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමාගේ සංචාර (ඇමුණුම V)

3. විනිර්මුක්ති හා වරප්‍රසාද

සමාලෝචනයට බඳුන්වල කාලය තුළදී සන්ධාන අංශයේ වරප්‍රසාද හා විනිර්මුක්ති පිළිබඳ ඒකකය විසින් ඉටුකරන ලද කාර්ය කටයුතු මෙසේය:-

3.1 නිෂ්කාශන සහතිකපත් නිකුත් කිරීම

3.1.1 විදේශීය දූත මණ්ඩල සඳහා

(සහතිකපත් 50ක් ඇතුළත් පොත් 134ක්) 6700

3.1.2 ජාත්‍යන්තර සංවිධාන සඳහා

(සහතිකපත් 50ක් ඇතුළත් පොත් 30ක්) 1500

3.2 රේගු පහසුකම් - ආනයනය

3.2.1 විදේශීය දූත මණ්ඩල සඳහා 1450

3.2.2 ජාත්‍යන්තර සංවිධාන සඳහා 250

3.3 රේගු පහසුකම් - අපනයනය

3.3.1 විදේශීය දූත මණ්ඩල සඳහා 167

3.3.2 ජාත්‍යන්තර සංවිධාන සඳහා 20

3.3 වාහන (රාජ්‍යතාන්ත්‍රික / එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ අනෙකුත් සංවිධාන)

3.3.1 වාහන විකිණීම 212

3.3.2 වාහන ලියාපදිංචිය 198

3.3.3 ආදායම් බලපත්‍ර නිකුත්කිරීම 700

3.3.4 රියදුරු බලපත්‍ර නිකුත් කිරීම 172

3.3.5 පැට්‍රෝල් කූපන් පොත් නිකුත් කිරීම 489

3.4 වීසා බලපත්

3.4.1 විදේශීය දූත මණ්ඩල සඳහා වීසා බලපත් - ප්‍රවේශ වීසා (ඇමුණුම VI) 759

3.4.2 විදේශීය ¥ත මණ්ඩල සඳහා වීසා බලපත්- වාස වීසා (ඇමුණුම VII) 1274

3.4.3 ජාත්‍යන්තර සංවිධාන සඳහා වීසා බලපත්- ප්‍රවේශ වීසා

(ඇමුණුම VIII)207

3.4.4 ජාත්‍යන්තර සංවිධාන සඳහා වීසා බලපත්- වාස වීසා

(ඇමුණුම IX) 421 3.5 ගුවන්තොටුපළ අවසරපත්

3.5.1 ස්ථිර - නව නිකුතුව 62

3.5.2 තාවකාලික (මාස 6ක් සඳහා) - නව නිකුතුව 10

3.5.3 ස්ථිර - අලුත් කිරීම් 94

3.5.4 තාවකාලික (මාස 6ක් සඳහා) - අලුත් කිරීම් 35

3.6 ඉතා වැදගත් පුද්ගලයන්ගේ පිවිසුම සඳහා අවසරපත්

3.6.1 විදේශීය මගීන් 6316

3.6.2 දේශීය මගීන් 4894

3.7 රාජ්‍ය තාන්ත්‍රික නිෂ්කාශන (ඇමුණුම X)

3.7.1 විදේශීය ගුවන් යානා සඳහා අනුමැතිය 172

(යුධ ගුවන් යානා/රජයට අයත්)

3.7.2 විදේශීය නැව් සඳහා අනුමැතිය 40

(යුධ නැව්/රජයට අයත්)

3.8 අනන්‍යතා පත්‍ර (රාජ්‍යතාන්ත්‍රික / එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ අනෙකුත් සංවිධාන) 715

4. දූත මණ්ඩල ප්‍රධානීන්/නිර්වේතනික කොන්සල්වරු පත්කිරීම

ශ්‍රී ලංකාවට අක්තගන්වා ඇති විදේශීය තානාපතිවරුන් / මහකොමසාරිස්වරුන් වෙත අක්තපත්‍ර පිළිගැන්වීම සඳහා වන උත්සව සංවිධානය කිරීමේ සහ ශ්‍රී ලංකාව නේවාසික දූත මණ්ඩල පිහිටුවා ඇති රටවලට පත්කරනු ලබන ශ්‍රී ලංකා තානාපතිවරුන් මහකොමසාරිස්වරුන් සඳහා අදාළ රටවලින් පිරිනමන පිළිගැනීමේ ලිපිය ලබාගැනීමේ වගකීම පැවරෙන්නේ සන්ධාන අංශයටය. ශ්‍රී ලංකාවේ නිර්වේතනික කොන්සල්වරුන් පත්කිරීම හා ශ්‍රී ලංකාවේ සිටින වෙනත් රටවල නිර්වේතනික කොන්සල්වරුන් පත්කිරීම පිළිබඳ වගකීම මෙම අංශය වෙත පැවරේ. සමාලෝචනයට බදුන්වන කාලය තුළදී මෙම අංශය විසින් පවත්වන ලද උත්සව අවස්ථා මෙසේය,

4.1 ශ්‍රී ලංකාව සඳහා විදේශීය දූත මණ්ඩල ප්‍රධානීන්ගේ පත් කිරීම

(ඇමුණුම XI) 27

විදේශයන් සඳහා ශ්‍රී ලාංකික දූත මණ්ඩල ප්‍රධානීන්ගේ පත් කිරීම 21

4.2 විදේශීය රටවල සිටින ශ්‍රී ලංකා නිර්වේතනික හා කොන්සල්වරුන්ගේ පත්කිරීම් (ඇමුණුම XII)

4.2.1 පත් කිරීම් 16

4.2.2 සේවා කාලය දීර්ඝ කිරීම 24

4.3 ශ්‍රී ලංකාවේ සිටින නිර්වේතනික කොන්සල්වරුන්ගේ පත් කිරීම් 05

5. මෙම අංශය විසින් සම්බන්ධීකරණ කටයුතු සඳහා පවත්වන ජාත්‍යන්තර සමුළු

ජාත්‍යන්තර සමුළු පැවැත්වීම සඳහා සිත්ගන්නාසුළු ස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමෙහිලා සන්ධාන අංශය මූලික කාර්යභාරයක් ඉටු කරයි. මේ සම්බන්ධයෙන් මෙම අංශය අදාළ රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සමඟ සමීපව කටයුතු සම්බන්ධීකරණය කරයි.

එවැනි ජාත්‍යන්තර සමුළුවලට අදාළ වන සන්ධාන සහ සැපයුම් කටයුතු ඉටුකිරීම සඳහා අදාළ රේඛීය නියෝජිතායතනවල කාර්ය මණ්ඩල සාමාජිකයන්ට අවශ්‍ය සහාය හා මාර්ගෝපදේශ ලබා දෙනුයේද මෙම අංශය විසිනි.

රාජ්‍ය නායකයන්/පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්

1.	ලැට්වියා ජනරජයේ අතිගරු ජනාධිපති රේමන්ඩ්ස් වෙපෝයින්ස් මැතිතුමා 2018 ජනවාරි මස 06 සිට 16 දක්වා ශ්‍රී ලංකාවේ නිරත වූ පෞද්ගලික සංචාරය
2.	සිංගප්පූරු අගමැති ගරු ලී හසෙන් ලූන්ග් මැතිතුමා 2018 ජනවාරි මස 22 සිට 24 දක්වා ශ්‍රී ලංකාවේ නිරත වූ නිල සංචාරය
3.	ඉන්දුනීසියා අතිගරු ජනාධිපති ජොකෝ විඩෝඩෝ මැතිතුමා 2018 ජනවාරි මස 12 සිට 13 දක්වා ශ්‍රී ලංකාවේ නිරත වූ නිල සංචාරය
4.	තායිලන්ත රාජධානියේ අගමැති ගරු ජනරාල් ප්‍රයෝට් චැන්-ඕ-චා මැතිතුමා 2018 ජනවාරි මස 24 සිට 25 දක්වා ශ්‍රී ලංකාවේ නිරත වූ සංචාරය
5.	ජපාන හිටපු අගමැති ගරු යුකිතෝ මටොයමා මැතිතුමා 2018 ජනවාරි මස 11 සිට 12 දක්වා ශ්‍රී ලංකාවේ නිරත වූ සංචාරය
6.	කටාර් රාජ්‍යයේ එමීර්වරයා 2018 ජනවාරි මස 25 සිට 28 දක්වා ශ්‍රී ලංකාවේ නිරත වූ පෞද්ගලික සංචාරය

විදේශ අමාත්‍යවරු සහ නියෝජ්‍ය විදේශ අමාත්‍යවරු

1.	ජපාන විදේශ කටයුතු අමාත්‍ය ගරු ටාර් කොනෝ මැතිතුමා 2018 ජනවාරි මස 04 සිට 06 දක්වා නිරත වූ සංචාරය
2.	ඉරාන විදේශ කටයුතු අමාත්‍යතුමා 2018 ජූලි මස 31 වැනි දා සිට අගෝස්තු මස 01 වැනි දා දක්වා නිරත වූ නිල සංචාරය
3.	තායිලන්ත විදේශ කටයුතු අමාත්‍ය ගරු දොන් ප්‍රමුද්විනායි මැතිතුමා 2018 නොවැම්බර් මස 08 සිට 09 දක්වා නිරත වූ සංචාරය
4.	ස්පාඤ්ඤ ජනරජයේ නියෝජ්‍ය අගමැති සහ මුදල් අමාත්‍ය ගරු පීටර් කෂිමර් මැතිතුමා 2018 මාර්තු මස 27 සිට 29 දක්වා නිරත වූ සංචාරය
5.	සර්බියාවේ ප්‍රථම නියෝජ්‍ය අගමැති සහ විදේශ කටයුතු අමාත්‍ය ගරු ඉවිකා ඩෙසිඩ් මැතිතුමා 2018 මැයි මස 07 සිට 08 දක්වා නිරත වූ සංචාරය

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හා වෙනත් ජාත්‍යන්තර සංවිධානවල සම්භාවනීය පුද්ගලයන්

1.	මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ ගෝලීය විශේෂඥ කණ්ඩායම් හමුව - 2018 ජූලි මස 25 සිට 27 දක්වා
2.	හරිත දේශගුණ අරමුදලේ විධායක අධ්‍යක්ෂතුමා 2018 අප්‍රේල් මස 05 සිට 10 දක්වා නිරත වූ නිල සංචාරය
3.	පොදු රාජ්‍ය මණ්ඩලීය මහ ලේකම් ගරු පැට්රිකා ස්කොට්ලන්ඩ් මැතිනිය 2018 අගෝස්තු මස 01 සිට 04 දක්වා ශ්‍රී ලංකාවේ නිරත වූ සංචාරය

වෙනත් සම්භාවනීය පුද්ගලයන්

1.	ඉන්දියාවේ නීතිය හා සාමය සහ විද්‍යුත් හා තොරතුරු තාක්ෂණ අමාත්‍ය ගරු රවි ශංකර් ප්‍රසාද් මැතිතුමා 2018 ජනවාරි මස 14 සිට 17 දක්වා නිරත වූ සංචාරය
2.	ජපාන වාණිජ හා කර්මාන්ත මණ්ඩලය (JCCI) සහ ටෝකියෝ වාණිජ හා කර්මාන්ත මණ්ඩලය (TCCI) නියෝජිතයන් 2018 ජනවාරි මස 24 සිට 26 දක්වා නිරත වූ සංචාරය
3.	70 වැනි නිදහස් දිනයට සහභාගිවීම සඳහා ජපාන-ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මිත්‍රත්ව ලීගයේ සභාපති ගරු වටෝරු ටකේෂිටා මැතිතුමා නිරත වූ සංචාරය
4.	කොන්ග්‍රස් සභික පේමිස් සෙන්සෙන්බ්‍රනර් මහතා 2018 පෙබරවාරි මස 19 සිට 23 දක්වා නිරත වූ සංචාරය
5.	චීන ජාතිකයන්ගේ දේශපාලන උපදේශන සමුළුවේ උප සභාපති ගරු හන් ක්‍යඩි මැතිතුමා 2018 පෙබරවාරි මස 04 සිට 07 දක්වා නිරත වූ නිල සංචාරය
6.	මහජන චීන සමූහාණ්ඩුවේ චීන ජාතිකයන්ගේ දේශපාලන උපදේශන සමුළු ජාතික කමිටුවේ උප සභාපති ගරු වැන් ක්යින්මින් මැතිතුමා සහ නියෝජිතයන් 2018 පෙබරවාරි මස 01 සිට 04 දක්වා ශ්‍රී ලංකාවේ නිරත වූ සංචාරය
7.	නෝර්වීජියානු රාජ්‍ය ලේකම්තුමා 2018 ජූනි මස 20 සිට 22 දක්වා නිරත වූ සංචාරය
8.	ෆින්ලන්ත ආර්ථික කටයුතු හා රැකියා රාජ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමාගේ උප ලේකම් ගරු පෙට්රි පෙල්ටනන් මැතිතුමාගේ නායකත්වයෙන් ෆින්ලන්ත ව්‍යාපාර නියෝජිතයන් 2018 ජූනි මස 10 සිට 13 දක්වා ශ්‍රී ලංකාවේ නිරත වූ සංචාරය
9.	ජාතික වී පර්යේෂණ ආයතනයේ (IRRI) අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය මැතිව් මොරෙල් මහතා නිරත වූ සංචාරය

10.	ෆින්ලන්ත ආර්ථික කටයුතු හා රැකියා රාජ්‍ය අමාත්‍යාංශයේ උප ලේකම් පෙට්‍රි පෙල්ටනන් මහතා 2018 ජූනි මස 10 සිට 13 දක්වා නිරත වූ සංචාරය
11.	කුවේට්හි ගරු විදේශ අමාත්‍යතුමාගේ සහ ආසියානු කටයුතු දෙපාර්තමේන්තුවේ සහායක ගරු අලි සුලෙයිමන් අල් සයීඩ් මැතිතුමා 2018 ජූලි මස 23 සිට 25 දක්වා ශ්‍රී ලංකාවේ නිරත වූ නිල සංචාරය
12.	ජපාන ආරක්ෂක අමාත්‍ය ගරු ඉටිසුනෝරි ඔන්ඩෙරා මැතිතුමා 2018 අගෝසතු මස 20 සිට 22 දක්වා නිරත වූ සංචාරය
13.	විදේශ ණය හා අනෙකුත් ජාත්‍යන්තර මූල්‍ය බැඳීම්වල ස්වාධීන විශේෂඥ ජුවාන් පබ්ලෝ මහතා 2018 සැප්තැම්බර් මස 03 සිට 11 දක්වා නිරත වූ නිල සංචාරය

ශ්‍රී ලංකාවේ පැවති ජාත්‍යන්තර සමුළු

1.	2018 අප්‍රේල් 07 වැනි දින ලෝක සෞඛ්‍ය දිනය
2.	දකුණු ආසියා සහයෝගිතා පරිසර වැඩසටහනේ පාලක මණ්ඩලයේ 14 වැනි සමුළුව
3.	2018 බුද්ධ රශ්මි ජාතික වෙසක් උත්සවය
4.	2018 ජූලි 10 වැනි දින කොළඹ පැවැති 8 වැනි BIMSTEC ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමේ සමුළුව
5.	2018 අගෝස්තු 2 වැනි දින පැවති ථේරවාද බෞද්ධ විශ්වවිද්‍යාල ජාත්‍යන්තර සංගමයේ (IATBU) 5 වැනි සමුළුව
6.	2018 සැප්තැම්බර් 19-21 දිනවල දී පැවති ''Eval Colombo 2018" නම් වූ පාර්ලිමේන්තු සභිකයන්ගේ ගෝලීය අංගය

ද්විපාර්ශ්වීය සමුළු

1.	2018 ජනවාරි 18 වැනි දින පැවති යුරෝපා- ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිෂමේ 25 වැනි සැසි වාරය
2.	2018 පෙබරාරි 20 වැනි දින, ශ්‍රී ලංකාව සහ තුර්කිය අතර ඇති කරගත් වෙළෙඳ ප්‍රවර්ධනය සහ ආරක්ෂාව පිළිබඳ ගිවිසුම් යෝජනාව පිළිබඳ කටයුතු අවසන් කිරීම
3.	ශ්‍රී ලංකා තායිලන්ත ද්විපාර්ශ්වීය උපදේශනය පිළිබඳ 4 වැනි සැසි වාරය(තායිලන්ත දේශපාලන උපදේශනය)
4.	2018 අප්‍රේල් 07 වැනි දින පැවති ලෝක සෞඛ්‍ය දිනය
5.	2018 අගෝස්තු 15 වැනි දින පැවති 2 වැනි ශ්‍රී ලංකා-ඕමාන් දේශපාලන උපදේශනය

ඇමුණුම II

අතිගරු ජනාධිපතිවරයා විදේශ රටවල නිරත වූ සංචාර

අංකය	රට	කාලසීමාව	අරමුණ
1.	**ඉන්දියාව**	2018 මාර්තු 10-11	ජාත්‍යන්තර සූර්ය සමුළුව සඳහා නිරත වූ නිල සංචාරය
2.	**ජපානය**	2018 මාර්තු 12-16	රාජ්‍ය සංචාරය
3.	**පකිස්ථානය**	2018 මාර්තු 22-24	ජාතික දින සැමරුම සඳහා සහභාගී වීමට නිරත වූ සංචාරය
4.	**එක්සත් රාජධානිය**	2018 අප්‍රේල් 16-21	CHOGM 2018 සඳහා නිරත වූ නිල සංචාරය
5.	**ඉරානය**	2018 මැයි 12-15	රාජ්‍ය සංචාරය
6.	**ඉතාලිය**	2018 ජූලි 14-16	වන වගාව පිළිබඳ 24 වැනි FAO සැසිය සඳහා නිරත වූ නිල සංචාරය
7.	**ජෝර්ජියාව**	2018 ජූලි 16-18	විවෘත රාජ්‍ය හවුල්කාරිත්වය සඳහා නිරත වූ නිල සංචාරය
8.	**නේපාලය**	2018 අගෝස්තු 29-සැප්තැම්බර් 02	නිල සංචාරය සහ BIMTEC සමුළුව
9.	**ඇමරිකා එක්සත් ජනපදය**	සැප්තැම්බර් 22-27	එක්සත් ජාතීන්ගේ මහා සමුළුව සඳහා

ඇමුණුම III

ගරු අග්‍රාමාත්‍යවරයාගේ විදේශ සංචාර

අංකය	රට	කාලසීමාව	අරමුණ
1.	**සිංගප්පූරුව**	2018 මාර්තු 01-02	නිල සංචාරය
2.	**සිංගප්පූරුව**	2018 ජූලි 08-10	නිල සංචාරය(ලෝක නගර සමුළුව)
3.	**වියට්නාමය**	2018 අගෝස්තු 25-28	නිල සංචාරය (ඉන්දියානු සාගර සමුළුව)
4.	**වියට්නාමය**	2018 සැප්තැම්බර් 10-13	නිල සංචාරය (ASEAN පිළිබඳ ආර්ථික සංසදය)

ඇමුණුම IV

අතිගරු විදේශ අමාත්‍යවරයාගේ විදේශ සංචාරය

අංක	රට	කාලසීමාව	අරමුණ
1.	**ඉන්දියාව**	2018 ජනවාරි 10-14	නාලන්දා විශ්වවිද්‍යාලයේ නිරත වූ සංචාරය
2.	**ජපානය**	2018 මාර්තු 10-17	අතිගරු ජනාධිපති ජපානයේ නිරත වූ නිල සංචාරය
3.	**ජිනීවා**	2018 මාර්තු 19-24	මානව හිමිකම් මණ්ඩල සැසිය
4.	**ජර්මනිය**	2018 අප්‍රේල් 15-17	බර්ලින් බලශක්ති සංවාදය
5.	**එක්සත් රාජධානිය**	2018 අප්‍රේල් 18-24	CHOGM
6.	**ඉරානය**	2018 මැයි 10-14	අතිගරු ජනාධිපතිවරයා ඉරානයේ නිරත වූ සංචාරය
7.	**චෙක් ජනරජය**	2018 මැයි 15-20	ද්විපාර්ශ්වීය සංචාරය
8.	**භූතානය**	2018 ජුනි 06-10	ද්විපාර්ශ්වීය සංචාරය
9.	**උගන්ඩාව**	2018 ජුනි 20-13	ද්විපාර්ශ්වීය සංචාරය
10.	**කෙන්යාව**	2018 ජුනි 24-28	ද්විපාර්ශ්වීය සංචාරය
11.	**සිංගප්පූරුව**	2018 අගෝස්තු 03-05	ආසියානු කලාපීය සංසදය
12.	**ඉන්දුනීසියාව**	2018 අගෝස්තු 06-08	බාලි ක්‍රියාමය පිළිබඳ අමාත්‍ය මට්ටමේ සමුළුව
13.	**සිංගප්පූරුව**	2018 අගෝස්තු 19-24	ද්විපාර්ශ්වීය සංචාරය
14.	**මැලේසියාව**	2018 අගෝස්තු 27	ද්විපාර්ශ්වීය සංචාරය

15.	**නිව්යෝර්ක්**	2018 සැප්තැම්බර් 22-30	UNGA සැසිය
16.	**බාලි ,ඉන්දුනීසියාව**	2018 ඔක්තෝබර් 24-30	අපේ සාගර සමුළුව, බාලි ඉන්දුනීසියාවේ

ඇමුණුම V

අතිගරු රාජ්‍ය අමාත්‍යවරයාගේ විදේශ සංචාර

අංක	රට	කාලසීමාව	අරමුණ
1.	**ඉන්දියාව**	2018 ජනවාරි 17-19	නිල සංචාරය රොසිනා සංවාදය
2.	**පෝලන්තය**	2018 පෙබරවාරි 14-19	පොලිස් රජයේ ආරාධනය
3.	**ඕස්ට්‍රේලියාව**	2018 මාර්තු 23-30	ඕස්ට්‍රේලියානු රජයේ ආරාධනය (වෙළෙඳ ප්‍රවර්ධන කටයුතු)
4.	**කටාර් සහ ජෝර්දානය**	2018 මැයි 08-13	නීති විරෝධී සංක්‍රමණ, ආහාර ද්‍රව්‍ය තහනම ඉවත් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා මාණ්ඩලික විද්‍යාල සාකච්ඡාව
5.	**චීනය**	2018 ජූනි 24- ජූලි 01	චීන රජයේ ඉල්ලීම පරිදි පාර්ලිමේන්තු සභික නියෝජනයක්
6.	**සැල්වදෝරය**	2018 ජූලි 3-11	නිල සංචාරය (ශ්‍රී ලංකාව සහ සැල්වදෝරය අතර දේශපාලන හා සහයෝගීතාව පිළිබඳ 1 වැනි සාකච්ඡා වටය)
7.	**නේපාලය- කත්මණ්ඩු**	2018 අගෝස්තු 27-සැප්තැම්බර් 02	16 වැනි BIMSTEC සමුළුව
8.	**ස්ලොවේනියාව, ඉතියෝපියාව, පෘතුගාලය**	2018 සැප්තැම්බර් 08-20	8-12 ස්ලොවේනියා-රුධිර සංසදය 13-16 ඉතියෝපියාව-තොරතුරු සෙවීමේ දූත කණ්ඩායම සහ ආර්ථිකය වැඩි දියුණු කිරීම 17-20 පෘතුගාලය- වැඩි දියුණු කළ ආර්ථික වෙළෙඳ ප්‍රවර්ධන කටයුතු
9.	**ජැමෙයිකාව,කියුබාව සහ ඩොමිනිකන් ජනරජය**	2018 ඔක්තෝබර් 3-12	නිල සංචාරය
10.	**රුවන්ඩාව**	ඔක්තෝබර් 21-25	නිල සංචාරය

ඇමුණුම IX

	ADB	Colombo Plan	FAO	ICRC	IFRC	ILO	IMF	IOM	IWMI	JICA	SACEP	UNHCR	UNDP	UNFPA	UNOPS	UNICEF	AMNESTY	IFC	UNHABITAT	WFP	WHO	World Bank	එකතුව
ජන		4		2					8	3	3	3	4							1	1		29
පෙබ		1			2					1			1					3				2	10
මාර්තු				1		3	2	2	2	2						1		2			1		16
අප්‍රේ	1	4			1	1			7	1						5		1			3	1	25
මැයි	1	3	1	1	1	1		1	6	6			9				3	4		1		15	53
ජුනි			1	6		3		4	5	7			7		4					1	1	5	44
ජූලි		1		4	5			2	11	3	1		10					1	4	1	1	4	48
අගෝ	1			10		1			4	2	5	1	4	1		9	3	4		2		4	51
සැප්			1	5				4	5	5			7	1	3	1				2		2	36
ඔක්	1			2		1		5	1	3	3		8	1	1	2			1	1		4	34
නොවැ		2	1	1	3		2	4	9				6		3	8	5						44
දෙසැ		3	2	10				2	7	2									1	2	2		31
එකතුව	4	18	6	42	12	10	4	24	65	35	12	4	56	3	11	26	11	15	6	11	9	37	421

ඇමුණුම VIII

ජාත්‍යන්තර සංවිධාන සඳහා ප්‍රවේශ වීසා

	ADB	COLOMBO PLAN	FAO	ICRC	IFRC	ILO	IMF	IOM	IWMI	JICA	SACEP	UNFPA	UNHCR	UNDP	UNFPA	UNOPS	UNICEF	AMNESTY	UNHABITAT	WFP	WHO	WOLD BAnK	IFC	එකතුව
ජන										2			1				1							4
පෙබර										3												1		4
මාර්තු		1		2		1			4	3							7					8		26
අප්‍රේ		2		6					5								5	1						19
මැයි			1	4				2	4			3		3							2	1	1	21
ජුනි		1		8		4		2	3	2		1		3								2		26
ජුලි			1	5					4	2	2	1	2	3				3		2		4	4	33
අගෝ		1		2		1				3	1			7						1		1		17
සැප්				1				5	2	3	3			2		3	1			2				22
ඔක්							2	1	2	1						2	1	5		1				15
නොවැ			2	4						1								1			1			9
දෙසැ									8	2				1										11
එකතුව		5	4	32		6	2	10	32	22	6	5	3	19		5	15	10		6	3	17	5	207

	ජන	පෙබ	මාර්තු	අප්‍රේ	මැයි	ජූනි	ජූලි	අගෝස්	සැප්	ඔක්	නොවැ	දෙසැ	එකතුව
ඇෆ්ගනිස්ථානය		3						1		1		2	
ඕස්ට්‍රේලියාව	5							9	9	3		7	
බංගලාදේශය	9	1	3	5	1	4	7			3			
බ්‍රිතාන්‍යය මණ්ඩලය			9	2	10	7	10	4		18			
බ්‍රසීලය	2								4				
බැනඩාව		1		13				4	9				
චීනය		1	1	3	2	4	2	11	5		1	3	
බියුබාව	2								1				
ඊජිප්තුව	4	1			1		1	1	2				
යුරෝපා සංගමය		6	2	6		6	2	15	1	3	1	1	
ප්‍රංශය	2	5	5	1	8	12	4	10	16	7	2		
ජර්මනිය	2	2	8	3	7		5	9	3	3	1	1	
වතිකානුව			1										
ඉන්දියාව	36	10	57	18	8	17	18	15	15	4	17	12	
ඉන්දුනීසියාව	4	7		1	5					4	2	3	
ඊරානය	1	1	1		6				11	2		4	
ඊරාකය						11	3			4	1		
ඉතාලිය	4	3	5			1		1	9	3	3		
ජපානය	2	5	11	1	10	1	1	4	1	4		2	
ජකාර්යාව	2	9	10	8	2	3	6	14	3	4		6	
කුවේට්		1				5	1	2	3				
ලිබියාව		1	5	2		1		4	10		1		
මැලේසියාව	1	3						4		1			
මාලදිවයින	11	5	12	4	9	7	21	2	5	2	1	4	
මෙක්සිකෝව									1				
වියන්මාරය								1		3			
නේපාලය				4		3							
නෙදර්ලන්තය	6		1	1				1	2				
නයිජීරියාව	4			2			8	8		1			
නෝර්වේ	1	1	2					4	1	2			
ඕමානය	5				1		1						
පකිස්ථානය	11		1	3	1	7		12	13	4			
පලස්තීනය		7	7							4			
කටාර්			1					8	3	1			
රුසියාව		5	1	1	6		6	4	3	2	2	2	
රොමේනියාව												2	

සවුදිය		3			1					2			
සීෂෙල්ස්							3	3					
අකුණු අප්‍රිකාව													
ස්විස්ටර්ලන්තය			9	1	1		4	4			1		
ටජිකිස්ථාන්													
තායිලන්තය	1					4		5		4	6	1	
තුර්කිය	3		1				2						
එක්සත් අරාබි එමීර් රාජ්‍ය				10	7		3	8		1			
ඇමරිකා එක්සත් ජනපදය	3	10	14	4	13	9	28	25	16	38	5	3	
එක්සත් රාජධානිය	4	12	15	3			7	8	14		2	6	
වියට්නාමය	1				1	2	2	2					
ස්වීඩනය													
ඊශ්‍රායලය													
එක්සත් ජනපදයේ ආධාර								4					
එකතුව	**126**	**103**	**182**	**96**	**100**	**104**	**145**	**207**	**160**	**128**	46	59	1456

ඇමුණුම III

විදේශ ලේකම්වරයාගේ විදේශ සංචාර

අංකය	රට	කාලසීමාව	අරමුණ
1.	**ඉන්දියාව**	2018 මාර්තු 10-11	ජම්බුද්වීප-ශ්‍රී ලංකා බෞද්ධ සාරානාත් විහාරයේ වන්දනාකරුන්වන්ගේ විශ්‍රාම ශාලාව විවෘත කිරීමේ උත්සවය
2.	**ජිනීවා**	2018 අප්‍රේල් 8-21	සංක්‍රමණික සේවකයන්ගේ ආරක්ෂාව සඳහා වන එක්සත් ජාතීන්ගේ කමිටුව
3.	**ඊශ්‍රායල**	2018 ජූනි 09-13	AJC ගෝලීය සංසදය
4.	**වොෂිංටන්**	2018 ජූලි 21-30	සබඳතාවන්හි නිදහස වැඩි දියුණු කිරීමට සිදු කළ අමාත්‍ය හමුව
5.	**නිව්යෝර්ක්**	2018 සැප්තැම්බර් සිට ඔක්තෝබර් 01	73 වැනි එක්සත් ජාතීන්ගේ මහා සමුළුව

පොදු සන්නිවේදන අංශය හා පාරසමුද්‍රීය ශ්‍රී ලාංකිකයන් සහ සංස්කෘතික රාජ්‍ය තාන්ත්‍රික භාවය පිළිබඳ අංශය

පොදු සංනිවේදන අංශය

මෙහෙයුම් අංශයක් වන පොදු සංනිවේදන අංශය, තොරතුරු ප්‍රචාරණය සහ ශ්‍රී ලංකා ප්‍රතිමූර්තිය එතෙර ප්‍රක්ෂේපණයෙහිලා රජය සහ බාහිර ක්‍රියාකාරීන් අතර සම්බන්ධයක් ලෙස ක්‍රියකරයි. ශ්‍රී ලංකා විදේශ ප්‍රතිපත්තිය සහ ජාත්‍යන්තර සබඳතා ආශ්‍රිතව, අමාත්‍යාංශයෙහි සාහ පොදුවේ රට තුළ සිදුවන සිද්ධීන් සහ අවස්ථා ආවරණය කිරීම මෙම අංශයෙන් සිදු වෙයි.

1.1. ප්‍රධාන ක්‍රියාකාරකම්

I ශ්‍රී ලංකා දූත මණ්ඩල සම්බන්ධීකරණයෙන් එතෙර ශ්‍රී ලංකා ප්‍රතිමූර්ති ප්‍රවර්ධනය.

II තොරතුරු සහ ප්‍රචාරණ ද්‍රව්‍ය එතෙර ශ්‍රී ලංකා දූත මණ්ඩල වෙත බෙදා හැරීම සහ මාධ්‍ය නිවේදන / රාජ්‍ය ප්‍රකාශණ හරහා දූත මණ්ඩල හා මහජනතාව දැනුවත් කිරීම.

III අමාත්‍යාංශයට අදාළ කරුණු සහ ශ්‍රී ලංකා විදේශ ප්‍රතිපත්තිය / ජාත්‍යන්තර සබඳතාවලට අදාළ කරුණු සම්බන්ධයෙන් මතුවන මාධ්‍ය විමසුම්වලට ප්‍රතිචාර දැක්වීම.

IV සංචාරක කටයුතු, වෙළඳ සහ ආයෝජනයට අදාළ ප්‍රවර්ධනාත්මක තොරතුරු දූත මණ්ඩල සහ අදාළ පාර්ශ්වකරුවන් වෙත ලබාදීම.

V දේශීය හා විදේශීය මාධ්‍ය සමග සම්බන්ධීකරණය.

VI දේශපාලන අංශ සමඟ සාකච්ඡා පවත්වමින් මාධ්‍ය ප්‍රකාශ සම්පාදනය හා මුද්‍රා හැරීම.

VII මෙරටට සම්ප්‍රාප්තවන විදේශීය මාධ්‍ය සඳහා මාධ්‍ය කටයුතු සිදු කිරීමට අනුමතය ලබා දීම.

VIII ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විදේශීය මාධ්‍ය සහ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සිදු කරනු ලබන වාර්තාකරණය ට අදාළ වාර්තා සටහන් තබාගැනීම

IX සියළුම දූත මණ්ඩල සහ නිලධාරීන් අතර බෙදා හැරිය යුතු දේශීය ප්‍රවෘත්ති දේශීය මුද්‍රිත මාධ්‍ය ඔස්සේ ඒකරාශී කරගැනීම සහ අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධ කිරීම පිණිස ශ්‍රී ලංකාවට වැදගත්වන ප්‍රවෘත්ති වාර්තා විදේශීය හා දේශීය මාධ්‍යවලින් තෝරා බේරා ගැනීම

X සමාජ මාධ්‍ය ජාල (ෆේස්බුක්, ට්විටර්, යූටියුබ්, ඉන්ස්ටග්‍රෑම් හා සවුන්ඩ් ක්ලවුඩ්) ඇතුළත්වන පරිදි භාෂාත්‍රයෙන්ම අමාත්‍යාංශ වෙබ් අඩවිය පවත්වා ගෙනයාම

XI ශ්‍රී ලංකාවේ පවත්වනු ලබන චිත්‍රපට උළෙල, මාධ්‍ය වැඩමුළු සහ සම්මන්ත්‍රණ ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.

1.2. විදේශීය මාධ්‍ය පිරිස් සහ චිත්‍රපට නිෂ්පාදන කණ්ඩායම්වල සංචාර

ප්‍රවෘත්ති ආවරණය සහ සංචාරක කටයුතු, චාරිකා සහ සංස්කෘතියට අදාළ චිත්‍රපට/වාර්තාමය වැඩ සටහන් සහ රූපවාහිනී ව්‍යාපෘති නිෂ්පාදනය සඳහා විදේශීය මාධ්‍යවල පැමිණීමට අවශ්‍ය පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය.

❖ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවද විමසා බලමින්, 2018 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුළ චිත්‍රපට/වාර්තාමය වැඩ සටහන් ව්‍යපෘති 35ක් ද ඇතළත්වන පරිදි, මාධ්‍ය කටයුතු සිදු කිරීම සඳහා තාවකාලික අවසරපත් 309 ක කටයුතු සංවිධානය කෙරිණ.

1.3. මාධ්‍ය නිවේදන නිකුත් කිරීම

අදාළ කාල වකවානුව තුළ මෙම අංශය විසින් මාධ්‍ය නිවේදන 452 ක් ප්‍රචාරණය කර ඇත. එතෙර ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද මාධ්‍ය නිවේදන මීට ඇතුළත්ය. මෙයින්, 126 ක් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද නිවේදන වේ. මෙයට අමතරව, හැකි පමණ දෛනික පදනමින් අමාත්‍යාංශයීය සමාජ මාධ්‍ය අඩවිවල (ෆෙස්බුක් සහ ට්විටර්) ප්‍රවෘත්ති පළකිරීම ද මෙම අංශය විසින් සිදු කෙරේ.

1.4. ශ්‍රී ලංකාවට සම්ප්‍රාප්තවන විදේශීය සම්භාවණීය පුද්ගලයන්ගේ සංචාර සහ මාධ්‍ය සිද්ධි/ක්‍රියාකාරකම් ආවරණය කිරීම

අදාළ කාලවකවානුව තුළ, පහත දැක්වෙන සංචාර සහ අංගවල මාධ්‍ය ආවරණය මෙම අංශය විසින් සිදු කෙරිණ. රාජ්‍ය හා ආණ්ඩු නායකයින්ගේ සංචාර සඳහා මාධ්‍ය ආවරණය ලබා දෙන ලදදේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව හා සම්බන්ධීකරණයෙනි. අනෙකුත් සංචාර හා අංගද මෙම අංශය විසින්ම ආවරණය කෙරිණ.

I 2018 ජනවාරි මස 31 සිට පෙබරවාරි 03 දක්වා, එක්සත් රාජධානියේ රාජෝත්තම එඩ්වඩ් කුමරුගේ සම්ප්‍රාප්තිය.

II 2018 ජනවාරි 04-06 දක්වා, ජපානයේ විදේශ කටයුතු අමාත්‍ය, ගරු ටාරෝ කෝනෝ මැතිතුමාගේ නිල සංචාරය.

III 2018 ජනවාරි 22-24 දක්වා, සිංගප්පූරු අග්‍රාමාත්‍ය, ගරු ලී සීන් ලුං මහතාගේ නිල සංචාරය.

IV 2018 ජනවාරි 24-25 දක්වා, ඉන්දුනීසියානු ජනරජයේ ජනාධිපති අතිගරු ජෝකෝ විඩෝඩෝ මහතාගේ නිල සංචාරය.

V 2018 පෙබරවාරි 27-28 දක්වා, ශ්‍රී ලංකා-තායිලන්ත ද්විපාර්ශ්වික උපදේශණ මාලාවේ සිවුවන රැස්වීම.

VI 2018 මාර්තු මස 5-7දක්වා, පුද්ගල නාශක බිම් බෝම්බ තහනම් කිරීමේ ගිවිසුමේ විශේෂ නියෝජිත, රාජෝත්තම මියාඩ් රාඩ් සීඩ් අල්-හුසේන් කුමරුගේ සම්ප්‍රාප්තිය.

VII 2018 මාර්තු 27-29 දක්වා, ස්ලෝවැක් ජනරජයේ නියෝජ්‍ය අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, අතිගරු පීටර් කසමීර් මහතාගේ නිල සංචාරය.

VIII 2018 අප්‍රියෙල් මස 11 වන දින, වියට්නාම විදේශ කටයුතු අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍ය, ඩැං ඩිං කී මහතාගේ නිල සංචාරය.

IX 2018 මැයි 06-08 දින දක්වා, සර්බියාවේ පළමුවන නියෝජ්‍ය අග්‍රාමාත්‍ය සහ විදේශ කටයුතු අමාත්‍ය, ගරු ඉවිකා ඩැසික්ගේ නිල සංචාරය.

X 2018 ජූනිමස 07 වන දින, ශ්‍රී ලංකාව සහ කොරියා ජනරජය අතර ද්විපාර්ශ්වික උපදේශන රැස්වීම් මාලාවේ දෙවන වටය.

XI 2018 ජූනි 23-25 දක්වා, නෝර්වේ සංවර්ධන සහයෝගිතා රාජ්‍ය ලේකම්,පෙන්ස් ෆ්ලෝලව් හෝල්ටේ මහතාගේ නිල සංචාරය.

XII 2018 ජූලි 12-13 තුළ, තායිලන්ත රාජධානියේ, අග්‍රාමාත්‍ය, අතිගරු පෙනරාල් ප්‍රයුත් චාං ඕ චා මහතාගේ නිල සංචරය.

XIII 2018 ජූලි මස 20 වන දින,නාවික ආරක්ෂාව, සුරක්ෂිතභාවය සහ සමුද්‍රීය ගැටලු පිළිබඳ ශ්‍රී ලංකා-ජපන් සංවාද මාලාවේ 3 වන රැස්වීම.

XIV 2018 අගෝස්තු මස 01-04, පොදු රාජ්‍ය මණ්ඩලීය මහ ලේකම්, රාජ නීතිඥ, අතිගරු පැට්‍රීෂියා ස්කොට්ලන්ඩ් මැතිතුමියගේ නිල සංචාරය.

XV 2018 අගෝස්තු 07, ෙඩරල් කවුන්සිලයේ සමූහාණ්ඩුවේ, සභික අතිගරු සිමොනෙටා සොමාරුගා මැතිතුමියගේ නිල සංචාරය.

XVI 2018 අගෝස්තු 15, ශ්‍රී ලංකා-ඕමාන ද්විපාර්ශ්වික උපදේශණ මාලාවේ 2 වන වටය.

XVII 2018 අගෝස්තු 28-30, ජපානයේ විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය, කසුයුකි නකානේ මහතාගේ නිල සංචාරය.

XVIII 2018 සැප්තැම්බර් 04-05, සමුදිය ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය පිළිබඳ ඉන්දීය සාගර වටදේදර සංගමයේ ක්‍රියාකාරී මණ්ඩලය ස්ථාපිත කිරීම පිළිබඳ මූලික වැඩමුළුව.

XIX 2018 ඔක්තෝබර් 01, ශ්‍රී ලංකා-ෆින්ලන්ත ද්විපාර්ශ්වික උපදේශණ මාලාව.

XX 2018 ඔක්තෝබර් 16, ශ්‍රී ලංකා- දකුණු අප්‍රිකා පාර්ශ්වකාර සංසදයේ 7 වන සැසිය

XXI 2018 ඔක්තෝබර් 26, ශ්‍රී ලංකා විදේශ ප්‍රතිපත්තිය සහ ආර්ථික රාජ්‍යතාන්ත්‍රික සංවාදය-2018-සමුගැනීමේ සැසිය.

1.5. විදේශ කටයුතු අමාත්‍යාංශයේ, වෙබ් අඩවියේ නව අතුරු මුහුණත

විදේශ කටයුතු අමාත්‍යාංශයේ, වෙබ් අඩවියේ නව අතුරු මුහුණත 2018 අප්‍රියෙල් මාසයේදී දියත් කෙරිණ. එහි සිංහල හා දමිළ මුහුනත් 2018 මැයි මාසයේදී එළිදක්වන

ලදී. පොදු ජනතාව වෙත වඩාත් භාවිත-මිත්‍රශීලී වෙබ් අඩවි අතුරු මුහුණතක් සැපයීමේ අරමුණින්, නව ඒකකය නිර්මාණය කර ඇති අතර, එයට විස්තරාත්මක, යාවත්කාලීන කළ තොරතුරු අඩංගු කර ඇත.

1.6. එතෙර දූත මණ්ඩලවල වෙබ අඩවි ක්‍රමවත් කිරීමේ යෝජනාව

එතෙර ශ්‍රී ලංකා දූත මණ්ඩල සඳහා භාවිත-මිත්‍රශීලී, ආරක්ෂා සහිත සහ ප්‍රමිතියෙන් යුතු වෙබ් අඩවි නිර්මාණය කිරීම පිණිස යෝජනාවක් කෙටුම්පත් කෙරිණ.

විදේශගත ශ්‍රී ලාංකික් සහ සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රික කටයුතු අංශය

විදේශගත ශ්‍රී ලාංකිකයින් සහ අමාත්‍යාංශයේ සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රික කටයුතුවලට අදාළ කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම විදේශගත ශ්‍රී ලාංකිකයින් සහ සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රික කටයුතු අංශය මඟින් සිදු කෙරේ.

වෙනත් කරුණු අතර, අංශයේ ප්‍රධානතම කාර්යයන් වන්නේ : විදේශගත ශ්‍රී ලාංකිකයින් (විදේශවල ජීවත් වන ශ්‍රී ලාංකිකයින් සහ ශ්‍රී ලාංකික සම්භවයක්/ඇති පුද්ගලයන්) සමඟ අන්තර් ක්‍රියා/ඇති කර ගැනීමට හා පහසුකම් සැලසීම; විදේශගතව සිටි ඔවුන්ට යළිත් දේශීය සම්බන්ධතා ඇතිකරගැනීමට හැකිවන පරිදි ශ්‍රී ලංකාවට පැමිණීමට පහසුකම් සැලසීම හා ශ්‍රී ලංකාවේ සමාජීය-ආර්ථික සංවර්ධනය සහ සංහිඳියා පරිශ්‍රමයන් සඳහා ඔවුන්ගේ දායකත්වය ඒකරාශී කර ගැනීම; ශ්‍රී ලාංකික ඩයස්පෝරාව ආශ්‍රිත අධ්‍යයන/පර්යේෂණ/වැඩ සටහන් හා සම්බන්ධ රාජ්‍ය නොවන සංවිධාන සහ පර්යේෂණ සංවිධාන හා සමග ඒකාබද්ධව කටයුතු කිරීම; සහ ශ්‍රී ලංකාවේ සංවිධාන/වැඩ සටහන්වලට අනුගත විදේශගතව සිටින ශ්‍රී ලංකිකයින්ට වීසා ලබා දීම සඳහා පහසුකම් සැලසීම.

සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රික කටයුතු යටතේ, ප්‍රවර්ධනාත්මක හා සංස්කෘතික ක්‍රියාකාරකම්, අධ්‍යාපනික හුවමාරු, මාධ්‍ය හා චිත්‍රපට ව්‍යාපෘති, ශිෂ්‍යත්ව සහ පර්යේෂණ ප්‍රවර්ධනය සඳහා වූ පෞද්ගලික හා රාජ්‍ය ස්ථිති අතර සහයෝගිතාව සහාය සහ සම්මන්ත්‍රණ සහ වැඩමුළු වැනි බාහිර ක්‍රියාකාරකම් උදෙසා වන පොදු රාජ්‍යත්‍රාන්ත්‍රික ක්‍රියාදාමයන් සඳහා සහාය වීමද මෙම අංශයෙහි අපේක්ෂාවයි.

එතෙර ශ්‍රී ලාංකික දූත මණ්ඩල හා සමග කටයුතු කිරීම

- විදේශගත ශ්‍රී ලාංකිකයින් සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස කේන්ද්‍රීය ක්‍රියාකාරීන් ලෙස කටයුතු කිරීම සඳහා නිලධාරියෙකු/නිලධාරීන් නම් කරන ලෙස එතෙර දූත මණ්ඩලවලින් ඉල්ලා ඇත.

- ශ්‍රී ලාංකීය සාමාජීය සහ ආර්ථික සංවර්ධනය, සංහිඳියාව සහ ඒකාග්‍රතා පරිශ්‍රම සඳහා දායක වන විදේශගත ශ්‍රී ලාංකික කණ්ඩායම්/සංගම්වලට සම්බන්ධීකරණයෙන් සහායවීමට දූත මණ්ඩල විසින් ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

- දූත මණ්ඩල විසින් විදේශගත ශ්‍රී ලාංකික ප්‍රජාව තුළ සිද්ධි පිළිබඳ දැනුම රෝපණය කළ යුතු වන අතර, ඔවුන් පෞද්ගලික අංශයේ විවිධ කණ්ඩායම්/සංවිධාන සමග යම් යම් අංශ-අධ්‍යාපනය, සෞඛ්‍යය-හදුනා ගනිමින් සිටිති.

- යම් යම් අංශවල/ක්ෂේත්‍රවල යෙදී සිටින්නාවූ විදේශගත ශ්‍රී ලාංකිකයින්ගේ ලැයිස්තු සකසා, ක්‍රමිකව යාවත්කාලීන කරන ලෙසත්, අමාත්‍යාංශය දැනුවත් කරන ලෙසත් දූත මණ්ඩල වලින් ඉල්ලා ඇත.

රාජ්‍ය ආයතන සහ නියෝජිතායතන සමග කටයුතු කිරීම

- ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක විදේශගත ශ්‍රී ලාංකිකයින්ගේ සංවිධානවලට සහාය වීම සඳහා විදේශගත ශ්‍රී ලාංකික අංශය සංහිඳුයාව උදෙසා වූ ජාතික සමග කාර්යාලය හා සමග සමීප සම්බන්ධතාවයකින් යුක්තව කටයුතු කරන අතර, ශ්‍රී ලංකාවේ සංචාර යෙදෙන විදේශගත ශ්‍රී ලාංකිකයින් හා සමග එකමුතුව කටයුතු කිරීමට සහ සංවිධාන ගැලපීමට අප භාවිතාකරනු ලබන ප්‍රධානතම පාර්ශ්වය වන්නේ මෙම අංශයයි.

- ශ්‍රී ලංකාවේ සාමාජීය-ආර්ථික වැඩ සටහන්වලට අනුගතව ක්‍රියාකිරීම පිණිස ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශගත ශ්‍රී ලාංකිකයින් සහ ස්වේච්ඡා සේවකයින්ට වීසා ලබාදීමේ ක්‍රියාදාමයන් විධිමත් කිරීම පිණිස, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සමග සමීපතම සහයෝගිතාවයකින් කටයුතු කිරීම අංශය විසින් සිදු කෙරේ.

- විදේශගත ශ්‍රී ලාංකිකයින්ට වීසා නිකුත් කිරීමට අදාල ගැටලුවලදී සහාය වීමට සහ ක්‍රියාදාමය කඩිනම් කිරීම පිණිස කේන්ද්‍රීය ක්‍රියාකාරකයෙකු ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නම් කර ඇත.

2018 ජනවාරි මස 01 වන දින සිට දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදයේ ක්‍රියා කාරකම්

විදේශගත ශ්‍රී ලාංකික ප්‍රජා සාමාජිකයින්, විශේෂඥයන් සහ ස්වේච්ඡා සේවකයින් කිහිප දෙනෙකුට වීසා නිර්දේශ කිරීම මගින්, බ්‍රිජිං ලංකා, නෙක්ටා ලංකා, කොමිඩු. අයිටී, සහීරා ලංකා සහ වාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය වැනි ශ්‍රී ලංකාවේ ස්ථාපිත විදේශගත ශ්‍රී ලාංකික සංවිධාන කිහිපයක කාර්ය කටයුතු සඳහා පහසුකම් මෙම අංශය පහසුකම් සැලසීය.

බ්‍රිජිං ලංකා-මහනුවර පර්යේෂණාත්මක අධ්‍යයනයකට සහාය: 2018 අගෝස්තු

- ශ්‍රී ලංකාවේ සාමාජීය-ආර්ථික සංවර්ධනයට උර දෙන විදේශගත ශ්‍රී ලාංකිකයින්ට/ශ්‍රී ලාංකික සම්භවයකන් යුත් පද්ගලයනින්ගෙන් සමන්විත සංවිධාන හා සමග බැඳී,එකමුතුව කටයුතු කිරීම පිණිස ක්‍රියා කරන්නා වූ බ්‍රිජිං ශ්‍රී ලංකා ආයතනයේ කටයුතුවලට පහසුකම් සැලසීමට මෙම අංශය විසින් පියවර ගන්නා ලදී. ජීවනෝපාය සහාය, ව්‍යාපාර

සංවර්ධනය, ප්‍රජා උපදේශණය, නාගරික සැලසුම් හා සමාජීය සංගත ව්‍යාපෘති ගණනවක්සඳහා විශේෂඥ සහාය සහ සම්පත් බිපිං ලංකා විසින් සංවිධානය කෙරේ.

- විවිධ ප්‍රජාවන් අතර අන්තර්-ප්‍රජා විශ්වාසය සහ අන්‍යෙන්‍ය ගෞරවය සවිමත් කිරීම පිණිස මහනුවර දිස්ත්‍රික්කයේ, දිගන සහ තෙල්දෙණිය ප්‍රදේශවල ප්‍රජා සහජීවනය සම්බන්ධයෙන් බ්‍රිපිං ලංකා විසින් දියත් කරන ලද පර්යේෂණාත්මක අධ්‍යයනයට අවශ්‍ය පහසුකම් මෙම අංශය විසින් සලසන ලදී.

- මෙයට අමතරව, කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ශ්‍රී ලංකාවේ රැඳී ක්‍රියා කිරීමට හැකිවන පරිදි, වීසා නිකුත් කිරීම සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධව කටයුතු කිරීමටද විදේශගත ශ්‍රී ලාංකික අංශය විසින් පියවර ගන්නා ලදී.

- **කොම්ඩු අයිටී**.

  කොම්ඩු.අයිටී යනු ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනයට තාක්ෂණික සහාය සහ ආධාර පිරිනැමීම සඳහා විදේශගත ශ්‍රී ලාංකික ස්වේච්ඡා වැඩ සටහන් සංවිධානය කරනු ලබන කැනේඩියානු සංවිධානයකි. මෙම අංශය ඔවුන්ගේ 2018-2019 වැඩ සටහනට සහාය දැක්වූ අතර, ශ්‍රී ලංකාවේ උතුර සහ නැගෙණහිර පළාත්වල කෙරී ගෙන යන වැඩ සටහන් සහ ව්‍යාපෘතිවල විවිධ සංවිධාන සමග ස්වේච්ඡාවෙන් කටයුතු කිරීම පිණිස තරුණ ශිෂ්‍යයින්/වෘත්තිකයින් 12 දෙනෙකුට පහසුකම් සලසා දෙන ලදී.

- **ආසියා පදනම් වැඩසටහන-ලංකා කෝප්ස් සම්මාන සාමාජිකයෝ**

  2018-ලංකා කෝප්ස් සම්මාන සාමාජිකත්ව වැඩ සටහනේ ක්‍රියා කාරිත්වය අංශය විසින් නිර්දේශ කෙරිණ. සය මස් සම්මාන සාමාජිකත්ව වැඩ සටහනක් යටතේ ශ්‍රී ලංකාවේ සාමාජයීය, සංස්කෘතික හා ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම්වල යෙදීම පිණිස නිපුන් වෘත්තිකයින් සිය දෙනෙකු ශ්‍රී ලංකාවට පැමිණි අතර, ඔවුන් රාජ්‍ය සහ පෞද්ගලික අංශවලට අනුයුක්ත කෙරිණ.

සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රිකත්වය

- අදාළ කාල පරාසය තුළ, ඉතාලියෙහි, එක්සත් රාජධානියෙහි සහ කොරියා සමූහාණ්ඩුවේ, ශ්‍රී ලංකා රූපවාහිණියේ ණී එතෙර මෙතෙර, වැඩ සටහන පැවැත්වීමට මෙම අංශය විසින් පහසුකම් සලසන ලදී.

- ශ්‍රව්‍ය-දෘෂ්‍ය ද්‍රව්‍ය, ලිපි ලේඛන සැපයීම මගින්, විදේශගත ශ්‍රී ලාංකික දූත මණ්ඩලවල සංස්කෘතික රාජතාන්ත්‍රික කටයුතු වැඩ පිළිවෙළවල ගණනාවකට මෙම අංශයේ සහාය ලබා දෙන ලදී.

දකුණු ආසියා හා සාර්ක් අංශය

දකුණු ආසියානු සහ සාර්ක් අංශය

ඇෆ්ගනිස්ථානය

I. ඇෆ්ගනිස්තාන් ගුවන්විදුලි සහ රූපවාහිනී සේවය සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව අතර අවබෝධතා ගිවිසුමක් ඇතිකර ගැනීමේ යෝජනාව ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට යොමුකර ඇත.

II. ඇෆ්ගනිස්ථාන් පොලිස් සේවා සාමාජිකයින් 05 දෙනෙකුට අධ්‍යයන චාරිකාවක් සලසා දෙන ලෙස ඇෆ්ගනිස්තානයෙන් ලැබී ඇති ඉල්ලීම සඳහා දූත මණ්ඩලය විසින් පහසුකම් සැලසීමට පොලිස් දෙපාර්තමේන්තුව එකඟ වී ඇත.

III. අන්‍යොන්‍ය වැදගත්කමකින් යුත් කරුණු සහ ද්වීපාර්ශ්වික ගිවිසුම් මෙහෙයවීමේ කාර්ය භාරය සාකච්ඡා කිරීම පිණිස දූත මණ්ඩල ප්‍රධානීන්, ඇෆ්ගනිස්තානයේ දේශපාලන කටයුතු පිළිබඳ නියෝජන විදේශ කටයුතු අමාත්‍යවරයා හමු වන ලදී.

IV. ද්වි/බහු පාර්ශ්වික සංසදවලදී ඇෆ්ගනිස්තානයට සහ වෙනත් රටවලට අදාල ගැටලු සම්බන්ධයෙන් පැවැත්වෙන එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් සහ UNAM රැස්වීම්වලට ක්‍රමිකව සහභාගී වීම.

ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන

I. ඇෆ්ගනිස්තානයට ශ්‍රී ලංකා තේ ආනයනය සම්බන්ධයෙන් දූත මණ්ඩලය විසින් සාකච්ඡා පවත්වා ඇත. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ සංචාරයක යෙදීමට ආයෝජකයින් බලවත් උනන්දුව පළ කර ඇත.

II. ශ්‍රී ලාංකීය පුහුණු හා වෘත්තීය මිනිස් බලය පරිභෝජනය සම්බන්ධයෙන් දෙරට අතර අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.

III. ශ්‍රී ලංකා ගුවන් සේවයේ ප්‍රවර්ධන හා ප්‍රචාරන ද්‍රව්‍ය දූතමණ්ඩල කාර්යාලයෙහි ප්‍රදර්ශනය කිරීමට පියවර ගෙන ඇති අතර, ශ්‍රී ලංකා ගුවන් සේවය සහ නිවාඩු දිශාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා එකී ද්‍රව්‍ය කාබුල්හි චාරිකා සංවිධායකයින් අතර බෙදා හරින ලදී.

සංස්කෘතික සබඳතා

I. කාබුල්හි පැවැති යුනෙස්කෝ සාකච්ඡාවලින් අනතුරුව, ඉටු කෙරෙමින් පවතින පුනරුත්ථාපන/ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ශ්‍රී ලාංකීය විශේෂඥ දැනුම පිරි නමන ලද අතර, අපගේ පුරාවිද්‍යා විශේෂඥයින්ට බාමියන් සංචාරයක් සඳහා සහාය වීමට යුනෙස්කෝව එකඟත්වය පළකර ඇත. කෙසේ වුවද, මෙවන් සංචාර දෙකක් අවස්ථා

දෙකකදී දූත මණ්ඩලය විසින් සංවිධානය කරන ලද නමුදු, ශ්‍රී ලංකා පාර්ශ්වයෙන් අවශ්‍ය කටයුතු සිදු නොකෙරිණි.

සේවක සුභසාධනය

I. වලංගු වීසා කාලය ඉක්මවා ඇෆ්ගනිස්තානයේ රැඳී සිටීම සම්බන්ධයෙන්, දඩ මුදලක් ලෙස ඇ.ඩො.4,920 ක් ඇෆ්ගනිස්තාන් රජයට ගෙවා, ශ්‍රී ලාංකිකයෙකු මෙරටට ගෙන්වා ගැනීමට දූත මණ්ඩලය සහාය වන ලදී.

<u>බංග්ලාදේශය</u>

එතෙර සංචාර

I. 2018 මැයි මස 1-4 දක්වා, ඩකා නුවර පැවැති ළමයින් සඳහා වූ දකුණු ආසියානු පාර්ලිමේන්තු සභික රැස්වීම් මාලාවට හිටපු නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍ය, ගරු (වෛද්‍ය) සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය ප්‍රධාන නියෝජිත පිරිසක් සහභාගී වූහ.

II. 2018 මැයි මස 15-17 දක්වා, ඩකා නුවර පැවැති අඛාධිතත්ත්ව සහ ආපදා අවදානම් කළමණාකරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ 2 වන සැසියට වාරිමාර්ග, ජලසම්පත් සහ ආපදා කළමණාකරණ රාජ්‍ය අමාත්‍ය, ගරු පාලිත රංගේ බණ්ඩාර මහතා සහභාගී විය.

III. 2018 සැප්තැම්බර් මස 04-08 දක්වා, ඩකා නුවර පැවැති දකුණු ආසියාවේ මැතිවරණ කළමණාකරණ ආයතන සංසදයේ 9 වන රැස්වීමට, ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති, මහින්ද දේශප්‍රිය මහතාගේ ප්‍රධානත්වයෙන් නියෝජිත පිරිසක් සහභාගී වූහ.

IV. 2018 ඔක්තෝබර් මස 09-10 දින තුළ, ඩකා නුවර පැවැති, දකුණු ආසියානු සමුද්‍රීය සහ ආනුෂාංගික සේවා සංසදයේ දෙවන රැස්වීමට, ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍ය, ගරු හර්ෂ ද සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් නියෝජිත පිරිසක් සහභාගී වූහ.

V. 2018 ඔක්තෝබර් මස 11-12 දින තුළ, සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය ,ගරු මලික් සමරවික්‍රම මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් ඇඟලුම් අංශයේ ඉහළ මට්ටමේ වාණිජ නියෝජිත පිරිසක් ඩකා නුවර සංචාරයක නිරත විය.

මෙතෙර චාරිකා

I. 2018 ඔක්තෝබර් මස 11-12 දින තුළ, කොළඹ පැවැති 'ඉන්දියන් සාගරය-අනාගත විග්‍රහය' සම්මන්ත්‍රණයට, බංග්ලාදේශයේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ, දකුණු ආසියානු කලාප අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ප්‍රධානත්වයෙන් යුත් නියෝජිත පිරිසක් සහභාගී වූහ.

ද්විපාර්ශ්වීය සබඳතා

ශ්‍රී ලංකා මහ කොමසාරිස්තුමා පහත දැක්වෙන බංග්ලාදේශ ප්‍රභූවරුන් හමුවිය;

I. 2018 මාර්තු මස 25 වන දින, බංග්ලාදේශයේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ, ලේකම්වරයා.

II. 2018 අප්‍රේල් මස 02 වන දින, බංග්ලාදේශයේ විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා.

III. 2018 ජූනි මස 26 වන දින, බංග්ලාදේශ පාර්ලිමේන්තුවේදී, බංග්ලාදේශ අග්‍රාමාත්‍ය ගරු ෂීක් හසීනා මහත්මිය.

IV. 2018 ජූලි මස 29 වන දින, ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව සහ බංග්ලාදේශයේ කෘෂිකර්ම පර්යේෂණ සභාව අතර ගිවිසගෙන ඇති අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම පිණිස බංග්ලාදේශයේ කෘෂිකර්ම පර්යේෂණ සභාවේ සභාපති සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්.

බහුපාර්ශ්වීය සබඳතා

ශ්‍රී ලංකා මහ කොමසාරිස්තුමා පහත දැක්වෙන රැස්වීම් වලට සහභාගී විය.

I. 2018 මාර්තු මස 20 වන දින, බිම්ස්ටෙක් මහ ලේකම් කාර්යාලයේ පැවැති, 'බෙන්ගාල් ප්‍රජාව උදෙසා-බිම්ස්ටෙක්-20' සම්මන්ත්‍රණය.

II. 2018 මැයි මස 05 වන දින ඩකා නුවර පැවැති, ඉස්ලාමීය සහයෝගිතා සංවිධානයේ විදේශ අමාත්‍ය සභාවේ 45 වන සැසිය.

III. 2018 අගෝස්තු මස 13-14 දින තුළ, ඩකා නුවර පැවැති, ත්‍රස්ත විරෝධී සහ සංක්‍රමණික අපරාධ පිළිබඳ බිම්ස්ටෙක් ඒකාබද්ධ ක්‍රියාකාරී මණ්ඩලයේ රැස්වීම.

ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන

I. 2018 ජූලි මස 06 වන දින ඩකා නුවරදී, බංග්ලාදේශයේ ශ්‍රී ලාංකික ආයෝජනයන්ට අදාල ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම පිණිස, මහ කොමසාරිස්තුමා ශ්‍රී ලංකා බංග්ලාදේශ වාණිජ සහ කර්මාන්ත මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය සමග, බංග්ලාදේශ ආයෝජන සංවර්ධන අධිකාරියේ සභාපති සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හමුවිය.

II. 2018 මාර්තු මස 22-24 දින තුළ සහ 2018 ඔක්තෝබර් මස 11 වන දින, ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය, ශ්‍රී ලංකා ගුවන් සේවය සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමග එක්ව, ශ්‍රී ලංකාව (රැස්වීම්, දිරිගැන්වීම්, සම්මන්ත්‍රණ සහ සිද්ධි) සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධන කරලීම පිණිස ඉසව් දෙකක් (ශ්‍රී ලංකාවේදී හමුවෙමු සහ ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය) මහ කොමසරිස්තුමා විසින් සංවිධානය කරන ලදී.

සංස්කෘතික සබඳතා

I. මහ කොමසාරිස්තුමා, බංග්ලාදේශයේ ශ්‍රී ලංකා සංගමයේ සහාය ඇතිව, බංග්ලාදේශයේ ශ්‍රී ලාංකික ළමයින්ගේ ශ්‍රී ලාංකික සංස්කෘතික අධ්‍යාපනය අධ්‍යාපනය කෙරෙහි පහසුකම් සැලසීය.

සේවක සුභසාධනය

එතෙර ශ්‍රී ලාංකික සේවක අදාල ප්‍රදූත කාරණා ගණනාවක් සම්බන්ධයෙන් මහ කොමසාරිස් කාර්යාලය විසින් මැදිහත්ව ක්‍රිය කරන ලදී.

භූතානය

ද්විපාර්ශ්වීය සබඳතා

I. 2018 අප්‍රේල් මස 29 - මැයි 02 දක්වා, අරලියගහ මන්දිරයේ පැවැති වෙසක් උත්සවයේදී භූතාන් රජය විසින් ගෞතම බුද්ධ ප්‍රතිමා දෙකක් පූජා කරන ලදී. මෙම කාර්යයට ඩකා නුවර සහ නව දිල්ලියේ ශ්‍රී ලංකා දූත මණ්ඩල සහායද ලැබිණි.

එතෙර චාරිකා

ෂග 2018 ජූනි මස 06-09 දින තුළ, විදේශ කටයුතු අමාත්‍ය ගරු තිලක් මාරපන මහතා වෙළඳ නියෝජිත පිරිසක් සමග භූතානයේ සංචාරයක නිරත විය.

මෙම සංචාරයේදී, බංග්ලාදේශ ශිෂ්‍යයන් සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශ ආයතනවල උසස් අධ්‍යාපන සඳහා වැඩිමනත් ශිෂ්‍යත්ව අවස්ථා හඳුන්වාදීමට ශ්‍රී ලංකා රජය විසින් පියවර ගන්නා ලදී. ගරු අමාත්‍යතුමා, ස්වකීය සංචාරයේදී, භූතානයේ පස්වන රජතුමන්, ගරු අග්‍රාමාත්‍යතුමන්, විදේශ කටයුතු අමාත්‍යතුමන් සහ ආර්ථික කටයුතු අමාත්‍යතුමන් ද සමුවිය.

නේපාලය

එතෙර චාරිකා

I. අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, සැප්තැම්බර් මස 01-02 දෙදින, කත්මණ්ඩු නුවර පැවැති 4 වන බිම්ස්ටෙක් සමුළුවට සහභාගීවීම. එතුමා, අගෝස්තු මස 30-31 දෙදින, සිද්ධාර්ථ ගෞතම කුමරුන්ගේ ජන්ම ස්ථානය වන ලුම්බිණියේ මායා දේවී විහාරස්ථානයද, දුටුගැමුණු විශ්‍රාම ශාලාවද, සාර්ක් මහ ලේකම් කාර්යාලයද, ආනන්කුටි විහාරය සහ පසුපතිනාත් පුදබිමද නරඹන ලද අතර, නේපාලයේ අග්‍රාමාත්‍ය, කේ.පී. ෂර්මා ශලි මහතා සමුවී, ISSR විසින් සංවිධානය කරන ලද, 'වෙළඳ, සංචාරක සහ ආයෝජන සංවාදය' සමාරම්භක උත්සවයට සහභාගී විය.

II. නේපාලයේ විදේශ කටයුතු ආයතනය සහ ශ්‍රී ලංකාවේ බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික අභ්‍යාස ආයතනය අතර තාරුණ්‍ය සංවර්ධනයට අදාල අවබෝධතා ගිවිසුම් හුවමාරු කෙරිණ.

III. සාර්ක් අංශයෙහි ජ්‍යෂ්ඨ අධ්‍යක්ෂ ජනරාල් යසෝජා ගුණසේකර මිය, සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ අභයජීව මිය, 2018 ජූලි මස 07 වන කත්මණ්ඩු නුවර පැවැති වැඩ සටහන් සම්පාදන කමිටුවේ 55 වන සැසියට සහභාගී වූහ.

IV. සාර්ක් අංශයෙහි ජ්‍යෂ්ඨ අධ්‍යක්ෂ ජනරාල් යසෝජා ගුණසේකර මිය, සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ අභයජීව මිය, 2018 දෙසැම්බර් මස 11-12, සටහන් සම්පාදන කමිටුවේ 56 වන සැසියට සහභාගී වූහ.

ද්විපාර්ශ්වික සබඳතා

I. තානාපතිතුමා, පහත දැක්වෙන ප්‍රභූන් හමුවිය.

- ජනවාරි මස 08 වන දින, නේපාලයේ, යුධ හමුදා කාර්ය මණ්ඩල ප්‍රධානී, ජනරල් රාජේන්දු චෙට්‍රි මහතා
- නේපාලයේ, විදේශ කටයුතු අමාත්‍ය, ගරු ප්‍රදීප් කුමාර් ග්‍යාවලි මහතා

II. ශ්‍රී ලංකා යුධ හමුදාවේ හිටපු ආඥාපති, ලුතිනන් ජනරාල් ක්‍රිෂාන්ත ද සිල්වා මහතාගේ ඇරයුමින්, නේපාලයේ, යුධ හමුදා කාර්ය මණ්ඩල ප්‍රධානී, ජනරල් රාජේන්දු චෙට්‍රි මහතා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන

I. ශ්‍රී ලංකාව සහ නේපාලය අතර ආර්ථික සබඳතා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, තානාපතිතුමා පහත දැක්වෙන රැස්වීම්වලට සහභාගී විය.

- 2018 ජනවරි 05, මාර්තු 23 සහ මැයි 07 වන දින පිලිවෙලින් නේපාලයේ ඩෑන්ග්, ජනක්පූර් සහ පොකාරා වෙළඳ සහ කර්මාන්ත වාණිජ මණ්ඩලවල සභාපතිවරුන් සහ සාමාජිකයින් සමග.
- ජනවාරි මස 27 වන දින, නේපාල විදුලබල ආයෝජන සමුළුව
- අප්‍රේල් මස 25 වන දින, භෞතික යටිතල සහ ප්‍රවාහන අමාත්‍ය, ගරු රඝුබීර් මහසෙත් මහතා සමග
- අප්‍රේල් මස 25 වන දින, නේපාලයේ ආයෝජන මණ්ඩලයේ ප්‍රවර්ධන විධායක නිලධාරි සමග
- ජූලි මස 19 වන දින, නේපාලයේ අධ්‍යාපන උපදේශණ සභාවේ, අධ්‍යාපන ප්‍රදර්ශනය

<u>සංචාරක කටයුතු</u>

I. තානපතිතුමා, නේපාලයේ පොක්රා, භක්තපූර්, ලලිට්පූර් සහ ට්‍රෙකිං නියෝතායතන සංගම් රැස්වීම් ඇතුළු ඉසව් සහ රැස්වීම් ගණනාවකට සහභාගී වී ඇත.

II. පහත දැක්වෙන රැස්වීම්වලට සහභාගීවීම.

- මාර්තු 28 වන දින, නේපාලයේ චාරිකා මෙහෙයවන්නන් සහ සංචාර නියෝජිතයින් සමග
- ජූලි මස 11 වන දින, නේපාල සංචාරක මණ්ඩලයේ සහ NATTA ප්‍රධාන විධායක නිලධාරි සමග
- 2018 සැප්තැම්බර් මස 20 වන දින,නේපාල ගෝලීය කටයුතු සභා රැස්වීමේදී, නේපාල ගෝලීය කටයුතු සභාව සහ ශ්‍රී ලංකාවේ ලක්ෂ්මන් කදිරගාමර් ජාත්‍යන්තර සබඳතා සහ උපායමාර්ගික අධ්‍යයන ආයතනය අතර අවබෝධතා ගිවිසුමට අත්සන් තැබිණ.

සංස්කෘතික සබඳතා

I. ආනන්දකුටි විහාරයේ සහ රාටෝ මච්න්ද්‍රනාත් පුදබිමේ ප්‍රතිසංස්කරණ කටයුතු දූත මණ්ඩලය විසින් අධීක්ෂණය කෙරේ.

II. තානපතිතුමා, 2018 පෙබරවාරි මස 21-24 දක්වා, යුනෙස්කෝ විසින් කත්මණ්ඩු නුවර සංවිධානය කරන ලද, ලුම්බිණි ජාත්‍යන්තර විද්‍යාත්මක කමිටු රැස්වීමට සහභාගී විය.

III. මාර්තු මස 28-අප්‍රේල් 1 දක්වා, ශ්‍රී ලංකාවේ පවත්වන ලද තාරුණ්‍ය උත්සවයට සහභාගි වීම සඳහා නේපාලයේ තරුණ නියෝජිත පිරිසක් එවීමට සහාය වන ලදී.

IV. 2018 මැයි මස 25-ජූනි 02 දක්වා, කත්මණ්ඩු යැක් ඇන්ඩ් යෙටි හෝටලයේදී, ' ශ්‍රී ලාංකික ආහාර ප්‍රදර්ශනයක් ' සංවිධානය කෙරිණ.

V. 2018 අගෝස්තු මස 07 වන දින, නේපාලයේ, සංස්කෘතික, සංචාරක සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ ලුම්බිණි සංවර්ධන භාරයේ උප සභාපති, පූජ්‍ය මෙත්තෙයා සාක්‍යපුත්ත හිමියන් සමුවන ලදී.

VI. අගෝස්තු මස 30 වනදින, හයාට් රීජන්සි හෝටලයේදී, සංස්කෘතික ප්‍රදර්ශනයක් සංවිධානය කෙරිණ.

VII. නේපාල ඇකඩමියේ කුලපති සමග රැස්වීම.

ප්‍රදූත සහාය

I. තානාපතිතුමා, මනිපාල් වෛද්‍ය විද්‍යාලයෙහි ඉගෙනුම ලබන ශ්‍රී ලාංකික ශිෂ්‍යයින් සම්බන්ධයෙන්, වෛද්‍ය විද්‍යාලය සමග සාකච්ඡාවක් පැවැත්වීය.

II. ශ්‍රී ලංකාවේ, ඉදිකිරීම් වාණිජ මණ්ඩලය විසින් කරන ලද ඉල්ලීමක් පරිදි, නේපාලයෙන් ශ්‍රමිකයින් බඳවා ගැනීමට දූත මණ්ඩල සහාය ලබා දෙන ලදී.

මාලදිවයින

ද්විපාර්ශ්වික සබඳතා

I. අතරමං වූ ශ්‍රී ලාංකික ධීවරයින් ආපසු එවීම සම්බන්ධයන්, වඩාත් සහයෝගී සහ සුමට මෙහෙයුමක් ඉටු කර ගැනීමේ අරමුණින්, මාලදිවයිනේ විදේශ කටයුතු අමාත්‍යාංශය, මාලදිවයින ජාතික ආරක්ෂා හමුදා, වෙරළ ආරක්ෂක ආයතන, ආගමන සහ රේගු බලධාරීන් සමග අඛණ්ඩව සංවාදයේ නියැලුණි.

II. දූත මණ්ඩල ප්‍රධානී, පහත දැක්වෙන රැස්වීම් සහ සාකච්ඡාවලට සහභාගී විය.

- මාලදවයිනේ පීවත් වන ශ්‍රී ලාංකිකකයින්ගේ වීසා කරුණු සම්බන්ධයෙන් ආගමන හා විගමන පාලක සමග.
- අත්අඩංගුවට පත් ශ්‍රී ලාංකිකයින් සම්බන්ධයෙන් පොලිස් කොමසාරිස් සමග
- අත්අඩංගුවට පත ශ්‍රී ලාංකිකයින් සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියමාර්ග ගැනීමේ ප්‍රමාදය සම්බන්ධයෙන් පැමිණිලි මෙහෙයුම් ජනරාල් සමග
- වෙලාන ජාත්‍යන්තර ගුවන් තොටුපළ හරහා ගමන් ගන්නා ශ්‍රී ලාංකිකයන් මුහුණ පාන්නාවූ ගැටලු සම්බන්ධයෙන්, සිවල් ගුවන් සේවා සභාපති සහ රේගු කොමසාරිස් ජෙනරාල් සමග.
- මාලදිවයින් වෛද්‍ය ශිෂ්‍යයින් ශ්‍රී ලංකාවේදී සීමාවාසික පුහුණුව ලබාදීම සහ ඔවුන්ට කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යාලයට ඇතුළත්වීමේ අමතර අවස්ථා ලබාදීම සම්බන්ධයෙන්, සෞඛ්‍ය අමාත්‍යතුමා සමග.
- මාලදිවයිනේ ක්‍රිකට් ක්‍රීඩා වැඩිදියුණු කිරීම පිණිස ක්‍රිකට් අමාත්‍යවරයා සමග.

III. SGD 14 සැසියට සහභාගිවීම පිණිස මාලදිවයින ධීවර සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ නියෝජිත පිරිසක් ශ්‍රී ලංකාවට එවන ලදී.

IV. මාලදිවයිනට තෝරා පත් වූ ජනාධිපතිවරයාගේ පදවි ප්‍රාමප්ති උළෙලට සහභාගී වීම පිණිස, විදේශ කටයුතු අමාත්‍යාංශ, ගරු සරත් අමුණුගම, පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍ය, ගරු ෆයිසර් මුස්තාපා, නාමල් රාජපක්ෂ සහ කනක හේරත් යන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මාලදිවයින් චාරිකාවකට එක්වූහ.

බහුපාර්ශ්වීය සබඳතා

- මාලදිවයිනේ වසංගත ගැටලු සම්බන්ධයෙන්, දූත මණ්ඩල ප්‍රධානී විසින් මාලදිවයිනේ ලෝක සෞඛ්‍ය සංවිධාන නියෝජිත වෛද්‍ය අරවින්ද් මතූර් සමග සාකච්ඡාවක් පවත්වන ලදී.
- ජාත්‍යන්තර තරුණ කමිටු නියෝජිතයින් පිරිසක්, ඔවුන්ගේ සභාපති සමග තානාපති කාර්යලයට පැමිණියහ.

ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන

I. අධ්‍යාපන ප්‍රදර්ණයේ (මාලදිවයිනේ ජාත්‍යන්තර අධ්‍යාපන හා රැකියා එක්ස්පෝ) සංවිධාකයින්ට ශ්‍රී ලංකාවේ අධ්‍යාපනික ආයතනයේ සහාය ලබා දෙන ලදී.

II. දූත මණ්ඩලය විසින්, ප්‍රධානතම ලෝහ භාණ්ඩ නිෂ්පාදන සමාගමක් වන කේඑම්සීසී ව්‍යාධපාර සමූහය වෙනුවෙන්, ප්‍රධානතම ඉදිකිරීම් සමාගම් සමග රැස්වීමක් සංවිධානය කර පැවැත්විණ.

III. තානාපති කාර්යලය විසින්, මාලදිවයිනෙන් ඖෂධ ප්‍රසම්පාදනය කර ගැනීම පිණිස,ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ඖෂධ සංස්ථාව සහ මාලදිවයිනේ වෙළඳ සංවිධානය අතර ප්‍රමන්ත්‍රණයන් ප්‍රති-ස්ථාපනය කරන ලදී.

IV. ලංකා ප්‍රදර්ශන සහ සම්මන්ත්‍රණ සේවා (පෞද්ගලික) සමාගමට, මාලදිවයිනේ පැවැති '2018-14 වන එඩිසන් හෝටල ආසියානු ප්‍රදර්ශන සහ ජාත්‍යන්තර ආහාර සැකසුම් අභියෝග' ප්‍රදර්ශනයට සහභාගී වීමේ අවස්ථාව ලබා දෙන ලදී.

සංස්කෘතික සබඳතා

I. අදාල චිත්‍රපට අධ්‍යක්ෂවරුන්ගේ සහභාගිත්වයද ඇතිව, ශ්‍රී ලාංකීය ප්‍රසිද්ධ චිත්‍රපට තුනක් ප්‍රදර්ශනය කරමින් ශ්‍රී ලාංකික චිත්‍රපට උළෙල සාර්ථකව පවත්වනලදී.

සේවක සුබසාධනය

I. ශ්‍රී ලංකා සේවකයින් සඳහා, ස්වකීය අයිතිවාසිකම්, හිමිකම්, රටෙහි කළ නොකළයුතු දේ පිළිබඳ නීතිරීති, හැසිරීම සහ විනය සම්බන්ධයෙන් වැඩමුළු සහ දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීමට දූත මණ්ඩලය විසින් ක්‍රියාකරන ලදී.

II. පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා මාලදවයිනට පැමිණ ශ්‍රී ලංකා සේවකයින් හමුවිය.

ඉන්දියාව

එතෙර චාරිකා

I. අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා, 2018 මාර්තු මස 11 වන දින, ජාත්‍යන්තර සූර්ය තාප සමුළුවේ සමාරම්භක සම්මන්ත්‍රණයට සහභාගී වීම පිණිස නව දිල්ලියට පැමිණියේය. මෙම සංචාරයේදී, ඉන්දියානු ජනාධිපති සහ අග්‍රාමාත්‍යවරයා සමගද රැස්වීම් පවත්වන ලදී.

II. විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය, ගරු වසන්ත සේනානායක මහතා, 2018 ජනවාරි 18 වන දින නව දිල්ලියේ පැවැති, 'රේසිනා සංවාද-2018' සමුළුවට සහභාගී විය.

III. රාජ්‍ය ව්‍යාපාර සහ මහනුවර නගර සංවර්ධන අමාත්‍ය ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා ශ්‍රී ලංකා රජයේ විශේෂ නියෝජිතයා ලෙස, ඉන්දියාවේ හිටපු අග්‍රාමාත්‍යවරයා, ගරු අතාල් බිහාරි වජ්පායී මහතාගේ අවමංගල්‍ය උත්සවයට සහභාගී විය.

IV. 2018 ජූනි මස 23-27 දින තුළ පැවැති ආසියානු යටිතල ආයෝජන බැංකුවේ 3 වන වාර්ෂික රැස්වීමට සහභාගී වීම පිණිස ගරු මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යතුමා මුම්බායිහි චාරිකාවක යෙදුණි.

V. ඉන්දියාවේ ලෝක සභා කථානායකවරයාගෙන් ලත් ඇරයුමක් පරිදි, ගරු කථානායක කරු ජයසූරිය මහතා සහ නියෝජිත පිරිසක් 2018 සැප්තැම්බර් 9-14 දක්වා ඉන්දියාවේ දැනුවත්වීමේ සංචාරයක නියැලුණාහ.

VI. ගරු අග්‍රාමාත්‍ය 2018 ඔක්තෝබර් 18-20 දින තුළ, ඉන්දියාවේ සංචාරයක නිරත විය.

මහ කොමසාරිස් කාර්යාලය පහත දැක්වෙන රැස්වීම් සම්බන්ධීකරණයෙහි සහ පහසුකම් සැලසීමෙහි නිරතවිය;

VII. ගරු සෞඛ්‍ය අමාත්‍ය රාජිත සේනාරත්න මහතා 2018 මාර්තු මස 13-14 දෙදින, නව දිල්ලියේ පැවැති, අග්නිදිග කලාපයේ ක්ෂය රෝගය පිටුදැකීමේ රැස්වීමට සහභාගී විය.

VIII. ශ්‍රී ලංකා අග විනිසුරු, පියසාත් ඩෙප් මහතා 2018 අප්‍රේල් මස 28-29 දෙදින තුළ, ඉන්දියාවේ, දාගාපූර්, ඩාර්පීලිංහි, ඉන්දියානු නීති විද්‍යාත්මක පරීක්ෂණ ආයතනයේ පැවැති, සාර්ක් නීති පර්ෂද රැස්වීමට සහභාගී විය.

IX. විදුලබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය, ගරු අජිත් පී පෙරේරා මහතා 2018 අප්‍රේල් 10-12 තුළ පැවැති 16 වන ජාත්‍යන්තර බලශක්ති සංසද රැස්වීමට සහභාගී විය.

X. වාරිමාර්ග සහ ජල සම්පත් කළමණාකරණ අමාත්‍ය ගරු විජිත් විජයමුණි සොයිසා මහතා, 2018 අප්‍රේල් මස 9-12 දින තුළ, '3R සහ සම්පත් කාර්යක්ෂභාවය හරහා පිරිසිදු ජලය,

පිරිසිදු ඉඩම් පිරිසිදු සහ වාතය' යන තේමාව යටතේ ඉන්දියාවේ පැවැති 8 වන කලාපීය සංසදයට සහභාගී විය.

මෙතෙර චාරිකා

I. ඉන්දියාවේ නීතිය හා සාධාරණත්වය සහ විද්‍යුත් හා තොරතුරු තාක්ෂණ අමාත්‍ය, ගරු රවි ෂන්කර් ප්‍රසාද් මහතා 2018 ජනවාරි මස 14-17 දින තුළ ශ්‍රී ලංකාවේ සංචාරයක නිරතවිය. මෙම සංචාරයේදී, තොරතුරු තාක්ෂණ සහ විද්‍යුත් ක්ෂේත්‍රයෙහි සහයෝගිතවය ප්‍රවර්ධනය කිරීම පිණිස ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබිණ.

II. ඉන්දියාවේ පාර්ලිමේන්තු කථානායක ගරු සුමිත්‍රා මහත්මිය, ජූලි මස 11-12 දින තුළ කොළඹ පැවැති දකුණු ආසියානු කතානායකවරුන්ගේ සමුළුවට සහභාගී වූවාය.

III. කාලිංග පදනමෙහි සාමාජිකයෙකු ශ්‍රී ලංකාවට පැමිණ, 2018 ඔක්තෝබර් 30 වන දින විදෙශ කටයුතු අමාත්‍යවරයා හමුවිය.

IV. බටහිර බෙන්ගාලයේ, කොල්කටාහි. වාණිජ සහ කර්මාන්ත වෙළඳ මණ්ඩලයේ සාමාජකයින් 18 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත පිරිසක් සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවට පැමිණි අතර, ලංකා වාණිජ මණ්ඩලය සමග අවබෝධතා ගිවිසුමකට එළඹුණාහ.

ප්‍රදුත සේවා

I. චෙන්නායිහි, නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලයේ පහසුකම් සැලසීමක් ඉන්දියානු බලධාරීන් හා සම්බන්ධීකරණයෙන් අත්අඩංගුවේ සිටි ශ්‍රී ලාංකික ධීවරයින් මුදා ගන්නා ලද අතර, තමිල්නාඩු ප්‍රාගන්තයේ සිටි ශ්‍රී ලංකා දෙමළ සරණාගතයින් පිරිසකට ස්වේච්ඡාවෙන් සියරට බලා පැමිණීමට කටයුතු සම්පාදනය කෙරිණ.

II. ශ්‍රී ලංකා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණයෙන් ශ්‍රී ලංකා විශ්‍රාමිකයන්ට සහ වෛද්‍ය ප්‍රතිකාර ලබන ශ්‍රී ලාංකික රෝගීන්ට අවශ්‍ය සහාය ලබා දෙන ලදී.

III. දකුණු ඉන්දියාවේ සංචාරයේ නිරතවන ශ්‍රී ලාංකික ප්‍රභූන් වෙනුවෙන්, ආරක්ෂාව, චාරිත්‍ර විධි සහ තිරුමාලා තිරුපති දේවස්ථානයේ දර්ශන පහසුකම් වැනි කටයුතු සංවිධානය කෙරිණ.

ද්විපාර්ශ්වීය සබඳතා

2018 ජනවරි මස 22-23 දෙදින තුළ, නව දිල්ලියේ පැවැතන නීති විරෝධී භාණ්ඩ ජාවාරම්කරුවන් මැඩලීමේ අධ්‍යක්ෂ ජනරාල් මට්ටමේ සාකච්ඡා සඳහා ශ්‍රී ලංකාවේ සහ

ඉන්දියාවේ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරුන් සහභාගිවීම, මහ කොමසාරිස් කාර්යාලය විසින් සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීම.

වෙළඳ/ගුවන් සේවා

I. ශ්‍රී ලංකා ගුවන් සේවය, කොයිම්බතූර්, මදුරෙයි සහ මංගලෝර්හි ඉන්දියානු ගමනාන්ත 14 කට ගුවන් ගමන් මෙහෙයවයි.

ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන

I. ගරු සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා, චාරික මෙහෙයවන්නන් සහ මාධ්‍යවේදීන් සමග සාකච්ඡාවක් සඳහා බැංගලෝරයට පැමිණීම සඳහා අවශ්‍ය පහසුකම් සලසන ලදී. බැංගලෝරයේ මාධ්‍ය, චාරිකා මෙහෙයුම් හා සංචාරක කර්මාන්තකරුවන් ඉදිරියේ, රාමායන වෙබ් අඩවිය දියත් කිරීම අමාත්‍යතුමා අතින් සිදු කෙරණ.

II. ඉන්දියාවේ ඇඟලුම් කර්මාන්තකරුවන් හමුවීම පිණිස, ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ ඇඟලුම් කර්මාන්ත සංගමයේ නියෝජිත පිරිසක් 2018 සැප්තැම්බර් මස 26-27 තුල, නව දිල්ලිය කරා ගියාහ.

III. ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර සහ කඳුරට දීප ව්‍යාප්ත හදිසි නිවාස සේවාවන් පැවැත්වීමට සහාය දෙන ලදී.

IV. ඉන්දියාව වාර්ෂිකව ලබා දෙන ශිෂ්‍යත්ව, නේරු සමරුව (100)ක්, රජීව් ගාන්ධි සැමරුම (25)ක්, අසාද් මවුලානා යෝජන ක්‍රමය (50)ක්, පොදු රාජ්‍ය මණ්ඩලීය වැඩ සටහන (05)ක් වේ. වැඩිමලත් ශිෂ්‍යත්ව 5-10 ක් ආයුෂ් ශිෂ්‍යත්ව වැඩ සටහන යටතේ ලබා දේ.

සංස්කෘතික සබඳතා

I. විදේශ කටයුතු අමාත්‍ය, ගරු තිලක් මාරපන මහතා, 2018 ජනවාරි 11-13 අතර ඉන්දියාවේ, බිහාර්, රාජ්ගිර්හි පැවැති, 4 වන ජාත්‍යන්තර ධර්ම-ධම්ම සම්මන්ත්‍රණයට සහභාගී විය.

II. ඉන්දියාවේ සාරානාත්හි මූලගන්ධකුටි විහාරයේ තැන්පත්කර ඇති සර්වඥ ධාතු 2018 අප්‍රේල් මස 27-මැයි 02 දක්වා, මහජන පුදපූජා සඳහා ශ්‍රී ලංකාවට වැඩමකරවීමේ ක්‍රියදාමය සඳහා අවශ්‍ය ක්‍රියදාමය සැලසිණි.

අධ්‍යාපනය ආශ්‍රිත කරුණු

I. ශ්‍රී ලංකාවේ රුහුණු විශ්ව විද්‍යාලය විසින්, චට්ටිස්ගාර්, කයිරාගාත්හි, ඉන්දිරා කලා සංගීත් විශ්වවිද්‍යාලය සහ කල්කටා විශ්වවිද්‍යාලය සමග සහයෝගිතාව මත අවබෝධතා ගිවිසුමකට එළඹෙන ලදී.

ආරක්ෂක කටයුතු

I. පහත දැක්වෙන සංවාද සහ සමුළුවලට ශ්‍රී ලංකාව සහභාගී විය.

- ජනවාරි මස 9 වන දින, නව දිල්ලියේදී, 5 වන ඉන්දු ශ්‍රී ලංකා වාර්ෂික ආරක්ෂක සංවාදය
- පෙබරවාරි 07-09 දක්වා, නාවික හමුදා-කාර්ය මණ්ඩල මන්ත්‍රණ
- ජනවාරි 16-18 දක්වා, ගුවන් හමුදා*කාර්ය මණ්ඩල මන්ත්‍රණ
- මාර්තු 20-22 දක්වා යුධ හමුදා-කාර්ය මණ්ඩල මන්ත්‍රණ
- 2018 මාර්තු වෙරළ ආරක්ෂක සේවා කාර්ය මණ්ඩල මන්ත්‍රණ

II. සීමාසහිත ගෝවා නැව් තටාංගන සමාගම විසින් නිෂ්පාදිත, 2 වන අධිශ්රේණියේ අක්වෙරළ පරීක්ෂණ යාත්රාෂං2018 මාර්තු මස 22 වන දින භාර ගැනීම සම්බන්ධීකරණය කෙරිණ.

<u>පකිස්තානය</u>

එතෙර සංචාර

I. අතිගරු ශ්‍රී ලංකා ජනාධිපතිතුමා 2018 මාර්තු මස 22-24 දක්වා පකිස්තානයේ සංචාරයක නියැලුණි. මෙම චාරිකාවේදී, පකිස්තානු ජනාධිපති සහ අග්‍රාමාත්‍යතුමන් සමග සාකච්ඡා පැවැතිණ. පකිස්තානය සහ ශ්‍රී ලංකාව අතර තාරුණ්‍ය සංවර්ධනය, රාජ්‍යතාන්ත්‍රික පුහුණුව, ශ්‍රී.ලං.ප.සේ. නිලධාරීන් සඳහා පුහුණුව සහ සංචාරක සංවර්ධනයේ සහයෝගිතාව යන ක්ෂේත්‍රයන්හි ගිවිසුම්වලට එළඹෙන ලදී.

II. නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, ගරු රාවුෆ් හකීම් මහතා 2018 අප්‍රේල් 11-15 අතර, පකිස්තාන් සංචාරයක නිරත විය.

III. හමුදාපති, ලුතිනන් ජනරල්, එන්.යූ.එම්.එම්.ඩබ්. සේනානායක මහතා, ආර්ඩබ්පී.ආර්එස්පී.යූඑස්පී,යූඑස්ඒ සීපීඑස්සී, 2018 අප්‍රේල් මස 22-28 දක්වා, පකිස්තානු සංචාරයක නියැලුණි.

IV. ශ්‍රී ලංකාවේ ස්ලිඩා ආයතනය සහ පකිස්තානයේ පකිස්තානයේ ජාතික රාජ්‍ය ප්‍රතිපත්ති පාසල අතර ගිවිස ගත් අවබෝධතා ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම පිණිස, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්, එච්.ටී.කමල් පද්මසිරි සහ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ, පාලක ජනරාල් පී.ඩී.එස්.සී.නෝනිස් යන මහත්වරු පකිස්තානයේ ජාතික රාජ්‍ය ප්‍රතිපත්ති පාසල වෙත ගියාහ.

V. ශ්‍රී ලංකාවේ අග්‍ර විනිශ්චයකාර පියසාත් ඩෙප් මහතා, 2018 පෙබරවාරි මස 26-27 දෙදින ලාහෝර්හි පැවැති දේශගුණික විපර්යාස පිළිබඳ ආසියා ශාන්තිකර අධිකරණ ව්‍යවහාර රැස්වීමට සහභාගී විය.

මෙතෙර චාරිකා

I. පකිස්තානු යුධ හමුදා කාර්ය මණ්ඩල ප්‍රධානී, ජනරල් කොමාර් ජවේඩ් බජ්වා මහතා 2018 ජනවාරි මස 15-17 දින ශ්‍රී ලංකාවේ චාරිකාවක නියැලුණි.

ද්විපාර්ශ්වික සබඳතා

I. ශ්‍රී ලංකාවේ පශු සම්පත් සංවර්ධන අංශයේ උදෙසා, විශේෂයෙන්ම පොළොන්නරුවේ කිරි ගොවිපළ කේන්ද්‍රය කර ගනිමින්, තාක්ෂණ සහාය සහ ධාරිතා වර්ධන සහයෝගිතාවය පකිස්තානය විසින් සපයා ඇත.

අධ්‍යාපන සහ ආරක්ෂක කටයුතු

I. ශ්‍රී ලාංකික රාජ්‍ය නිලධාරීන්ට සැපයෙන විශේෂ තාක්ෂණික සහාය වැඩ සටහන යටතේ, රාජ්‍යතාන්ත්‍රික පාඨමාලාවක්, 2018 මාර්තු මාසයේදී, ප්‍රදානය කෙරිණ.

II. පකිස්තානු තක්ෂණ සහාය වැඩ සටහන යටතේ, වෛද්‍ය, දන්ත වෛද්‍ය, ඖෂධවේදී, ඉංජිනේරු විද්‍යා උපාධි යන ක්ෂේත්‍රයන්හි ස්ථාන 18ක් ශ්‍රී ලංකා ශිෂ්‍යයින්ට වෙන් කර ඇත.

III. පකිස්තානු ආයුධ සන්නද්ධ හමුදා විසින්, ශ්‍රී ලංකා යුද හමුදාවලට, නිලධාරීන්ට සහ පොලිස් දෙපාර්තමේන්තුවට පුහුණු පාඨමාලා සපයා ඇත.

බහුපාර්ශ්වීය සබඳතා

I. දකුණු ආසියාවේ සෞඛ්‍යාරක්ෂාව සඳහා වූ දකුණු අසියානු 7වන සම්මන්ත්‍රණය - 2030 සැලසුම - 2018 අප්‍රේල් මස 11-15 දක්වා ඉස්ලාමාබාද්හි පැවැත්විණ.

ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන

I. 2018 මාර්තු මාසයේ, ජනාධිපතිතුමාගේ පකිස්තානු සංචාරයේදී, මහ කොමසාරිස් කාර්යාලය විසින් සම්භාව්‍යම පකිස්තානු ආයෝජකයින් හා සමග සාකච්ඡාවන් සංවිධානය කරන ලදී.

II. ශ්‍රී ලංකාවෙහි ආයෝජනය කිරීමට උනන්දුවක් දක්වන ඉහළ වටිනාකම් සහිත ආයෝජකයින් සිවු දෙනෙකුට, අදාල බලධාරීන් හමුවීම පිණිස ශ්‍රී ලංකාවට පැමිණීමට කටයුතු සලසා දෙන ලදී.

III. මහ කොමසාරිස් කාර්යාලය විසින්, තෝරාගත් සංචාරක නියෝජිතායතන සහ චාරිකා මාධ්‍යවේදීන්ට දැනුවත්වීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණීමට කටයුතු සම්පාදනය කර දෙන ලද අතර, ඔවුන් විසින් පකිස්තානයේ ප්‍රධානතම චාරිකා සඟරාවල ශ්‍රී ලංකාවේ සංචාරක කටයුතු ගැන ලිපි පළකරනු ඇත.

IV. ශ්‍රී ලංකා නිෂ්පාදන සහ අත්කම් පකිස්තානු ව්‍යාපාර ප්‍රජාව අතර ප ප්‍රවර්ධනය කිරීම පිණිස, රාවල්පින්ඩි වාණිජ හා කර්මාන්ත මණ්ඩලය විසින් සංවිධානය කරන ලද 2018-ජාත්‍යන්තර රාවල් එක්ස්පෝ ප්‍රදර්ශණයට සහභාගිවීමට මහ කොමසාරිස් කාර්යාලය විසින් කටයුතු කරන ලදී.

V. දූත මණ්ඩලයේ මෙහෙයවීමෙන්, මෙට්රියක් ටොන් 76000 ක යූරියා පොහොර පකිස්තානයෙන් අපනයනය කරණ ලදී.

VI. පකිස්තානයේ, පැල සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා නිෂ්පාදන ආනයනය කරණ පකිස්තානු ආනයනකරුවන්ට ආනයන බලපත්‍ර නිකුත් කිරීම අත්හිටුවන ලදී. කොන්සල් ජනරාල්තුමා විසින් ජාත්‍යන්තර වෙළඳ නීති යටතේ ඇති බැඳීම් විග්‍රහ කර, මෙම ගැටලුව නිරාකරණය කර ගන්නා ලදී.

VII. 2018-2019 වසර සඳහා පකිස්තානයේ මුදල් පණත අනුව, තීරු බදු විෂමතාවයක උද්ගත වූ අතර, ශ්‍රී ලංකාවෙන් පකිස්තානයට අපනයනය කරනු ලබන එම්ඩීඑෆ් බෝඩ් මත නියාමන බද්දක් පනවන ලැබිණ. කොන්සල් ජනරාල්තුමා, පකිස්තානයේ දැව වෙළඳ සංගමයේ සාමාජිකයින් හමුවී, මෙම ද්‍රව්‍ය සම්බන්ධයෙන් පකිස්තානු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමෙහි බැඳීම් ගැන ඔවුන් දැනුවත් කරන ලදී. ඒ අනුව, මෙම නිදහස් වෙළඳ ගිවිසුම යටතේ දිරිදීමනා සම්බන්ධයෙන් මන්ත්‍රණයෙහි යෙදීමට දැනටමත් ඉඩකඩ සලසා ඇත.

VIII. පකිස්තානයේ නිෂ්පාදිත තුනපහ කුඩු ශ්‍රී ලංකාවේ බෙදා හැරීම සඳහා සහ ශ්‍රී ලංකාවේ අළුත් කුළුබඩු වර්ග පකිස්තානයට අපනයනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සල්වා ඩිසට්‍රියබියුටර්ස් සහ පකිස්තානයේ නෝරාස් පෞද්ගලික සමාගම අතර ගිවිසුම් කොන්ත්‍රාතුවක් අත්සන් තැබීම කොන්සල් ජනරාල්තුමා ඉදිරියේ සිදුවිය.

IX. 2018 අප්‍රේල් මස 26-28 දක්වා, සාමාජිකයින් 22 දෙනෙකුගෙන් සමන්විත පකිස්තානු වෙළඳ නියෝජිත පිරිසකට ශ්‍රී ලංකාවේ චාරිකාවක් සංවිධානය කර දෙන ලදී.

සංචාරක කටයුතු

I. කොන්සල් කාර්යාලය විසින් ශ්‍රී ලංකා ගුවන් සේවය හා එක්ව, පෙබරවාරි මස 7-9 දින වලදී පකිස්තානයේ, කරච්චි නුවර, ශ්‍රී ලාංකික ආහාර සහ සංස්කෘතික උත්සවයක් සංවිධානය කරන ලදී.

II. කොන්සල් කාර්යාලය විසින් , ශ්‍රී ලංකාවේ සංචාරක සමාගම් 10 ක නියෝජිතයින්ට 2018 පකිස්තානු ට්‍රැවල් මාට් ප්‍රදර්ශනයට සහභාගී වීමට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය හා එක්ව කටයුතු සංවිධානය කර දෙන ලදී.

සංස්කෘතික සබඳතා

I. ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින්, ඉස්ලාමාබාද් නුවර මැරියට් හෝටලය හා එක්ව, 2018 පෙබරවාරි මස 03 වන දින, ශ්‍රී ලාංකික ආහාර උත්සවය සංවිධානය කරන ලදී.

II. ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් 2018 අප්‍රේල් මස 28-මැයි 02 දක්වා සංවිධානය කරන ලද වෙසක් උත්සවය සඳහා ගෞතම බුද්ධ දන්ත ධාතු වැඩමවීමට කටයුතු සම්පාදනය කෙරිණ.

III. ලාහෝරයේ, ඉංජිනේරු සහ තාක්ෂණ විද්‍යා විශ්ව විද්‍යාලයේ, ජාත්‍යන්තර ශිෂ්‍ය සංගමය විසින් මහ කොමසාරිස් කාර්යාලයේ අනුග්‍රහය ඇතිව, 2018 ජාත්‍යන්තර සංස්කෘතික හා ආහාර සැණකෙළිය සංවිධානය කරන ලදී.

සේවක සුබසාධනය

I. මහ කොමසාරිස් කාර්යාලය සහ කොන්සල් කාර්යාලය ක්‍රමික ශ්‍රී ලාංකික ප්‍රජාව මුණ ගැසෙමින් ඔවුන්ගේ ගැටලු සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ලබා දෙති.

එක්සත් ජාතීන් හා මානව හිමිකම් අංශය

එක්සත් ජාතීන් හා මානව හිමිකම් අංශය

බහුපාර්ශ්වික කටයුතු යන සන්දර්භය යටතේ, නිව්යෝක්, ජිනීවා, වියෙනා, පැරිසිය, රෝමය, නයිරෝබි, බැංකොක් හා හේග් හි පිහිටි ශ්‍රී ලංකා නිත්‍ය දූතමණ්ඩල/මහකොමසාරිස් කාර්යාල/තානාපති කාර්යාල මෙම අංශය යටතෙහි පවතී. අදාල රේඛීය අමාත්‍යාංශ, ශ්‍රී ලංකාවේ පිහිටි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිතායතන, ජාත්‍යන්තර හා දේශීය මානව අයිතිවාසිකම් සංවිධාන, සිවිල් සමාජය හා මාධ්‍ය ආයතන සමඟ ද සම්බන්ධීකරණය කරයි. 2018 වර්ෂයේ දී මෙම අංශයෙහි ප්‍රධාන කාර්ය ක්ෂේත්‍රයන්ට පහත කරුණු ඇතුළත් විය:

1. එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනයේ (UNGA) 73 වැනි සැසිය - 2018 සැප්තැම්බර් 25 සිට ඔක්තෝබර් 01 දක්වා නිව්යෝක් හි දී

- 2018 සැප්තැම්බර් මස පැවති UNGA 73 වැනි සැසියෙහි ඉහළ පෙළේ සාකච්ඡාවලට සහ ඒ සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් යුත් ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමෙහි සහභාගිත්වය වෙනුවෙන් අංශය විශේෂ කාර්ය භාරයක් ඉටු කළේය. අතිගරු ජනාධිපතිතුමා 2018 සැප්තැම්බර් 25 වැනි දා එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනය ඇමතීය. ඉහළ පෙළේ සාකච්ඡා අතරතුර දී, අතිගරු ජනාධිපතිතුමා සහ අනෙකුත් රාජ්‍ය නායකයන්, ආණ්ඩු ප්‍රධානීන්, නියෝජිත කණ්ඩායම් ප්‍රධානීන් හා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ උසස් නිලධාරීන් අතර පැවති රැස්වීම් සඳහා ද අමාත්‍යාංශය විසින් පහසුකම් සපයන ලදී.

- නිව්යෝක්හි පිහිටි නිත්‍ය දූතමණ්ඩලය, අයර්ලන්තයේ නියෝජ්‍ය අග්‍රාමාත්‍යතුමා හා විදේශ කටයුතු අමාත්‍යතුමා, රොමේනියාවේ විදේශ කටයුතු අමාත්‍යතුමා, අසර්බයිජානයේ විදේශ කටයුතු අමාත්‍යතුමා, ඉන්දුනීසියාවේ සමුද්‍ර කටයුතු හා ධීවර අමාත්‍යතුමා, ලක්සෙම්බර්ග් හි විදේශ හා යුරෝපා කටයුතු අමාත්‍යතුමා හා කැනඩාවේ ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ අමාත්‍යතුමා සමඟ පැවති ද්විපාර්ශ්වික හමු සඳහා පහසුකම් සැපයීය. ත්‍රස්තවාදය පිටුදැකීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලයෙහි දෙවැනි ලේකම් ජනරාල්තුමා සහ ඇමරිකා එක්සත් ජනපදයේ සෞඛ්‍ය හා මානව සේවා දෙපාර්තමේන්තුවේ දකුණු හා මධ්‍යම ආසියානු කටයුතු කාර්යාංශයෙහි ප්‍රධාන නියෝජ්‍ය සහකාර ලේකම්තුමා සමඟ ද ද්විපාර්ශ්වික හමු සූදානම් කරන ලදී.

- UNGA අතරතුර දී පැවති පොදුරාජ්‍ය මණ්ඩලයේ, සාක් හා ආසියා සහයෝගිතා කතිකාවත (ACD) විදේශ කටයුතු අමාත්‍යවරුන්ගේ රැස්වීම්වලට ද ශ්‍රී ලංකාව සහභාගී විය. විදේශ අමාත්‍යවරුන්ගේ CICA (ආසියාවේ විශ්වාසය දිනාගැනීමේ ක්‍රියාමාර්ග) පිළිබඳ විශේෂ රැස්වීමෙහි නවතම සාමාජිකයා ලෙස ද ශ්‍රී ලංකාව පිළිගැනීමට ලක්විය.

2. සංහිඳියාව හා මානව අයිතිවාසිකම්

එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කවුන්සිලය

- අංශය, අනෙකුත් පාර්ශ්වකරුවන් ද සමඟ එක්ව, "ශ්‍රී ලංකාවේ ප්‍රතිසංධානය, වගවීම හා යහපාලනය ප්‍රවර්ධනය" නම් වූ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ (2015) 30/1 හා (2017) 34/1 දරන යෝජනා සම්මුති ක්‍රියාවට නැංවීම පිළිබඳ ප්‍රගතිය තහවුරු කිරීම සඳහා රජය විසින් ආරම්භ කොට ඇති ක්‍රියාමාර්ගය සම්බන්ධීකරණය හා සහය වීම අබණ්ඩව සිදුකරයි.

  'ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් වැඩිදියුණු කිරීම, සංහිඳියාව හා යහපාලනය' සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ලබා ඇති ප්‍රගතිය, නිතිපතා යාවත්කාලීන කොට, විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූතමණ්ඩල ඇතුළු අදාළ පාර්ශ්වකරුවන් අතර බෙදාහරින ලදී.

- 2018 වර්ෂයේ දී ජිනීවා හි පැවති එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ සැසිː 37 වැනි සැසිය (2018 පෙබරවාරි 26 - මාර්තු 23), 38 වැනි සැසිය (2018 ජූනි 18 - ජූලි 06) හා 39 වැනි සැසිය (2018 සැප්. 10 - සැප්. 28) සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වයට විශේෂිත හා සැපයුම් සේවා සූදානම් කරන ලදී.

  - ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස්වරයාගේ කාර්යාලයේ වාර්තාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා 2018 මාර්තු 19-23 දිනවල ජිනීවා හි සංචාරයක යෙදුණි. ගරු ආචාර්ය සරත් අමුණුගම (පා.ම.) මැතිතුමා, ගරු ෆයිසර් මුස්තාෆා (ජ.නී., පා.ම.) මැතිතුමා, ශ්‍රී ලංකාවේ සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණය කිරීමේ ලේකම් කාර්යාලයේ ලේකම් ජනරාල් මනෝ තිත්තවැල්ල මහතා හා ශ්‍රී ලංකා රජයේ අනෙකුත් ජ්‍යේෂ්ඨ නිලධාරීන්ගෙන් නියෝජිත කණ්ඩායමේ ඉතිරි කොටස සමන්විත විය.

  - 2018 මාර්තු මස පැවති 37 වැනි සැසියේ දී මානව හිමිකම් පිළිබඳ නියෝජ්‍ය මහකොමසාරිස්වරයා විසින් ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස්වරයාගේ කාර්යාලයේ වාර්තාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, අදාළ රට ලෙස ශ්‍රී ලංකාව ඊට මැදිහත් විය.

- 2018 ජනවාරි - සැප්තැම්බර් කාලසීමාව තුළ දී මැදිහත්වීම් 17 ක් සිදුකිරීමෙන්, තේමාගත යෝජනා සම්මුති 16 ක් සම්බන්ධයෙන් සවිස්තරාත්මක නිරීක්ෂණ/නිර්දේශ ඉදිරිපත් කිරීමෙන් හා කළාපය හරහා පැමිණි ප්‍රකාශ 4 කට සහය දැක්වීමෙන් ශ්‍රී ලංකාව කවුන්සිලය සමඟ මැදිහත් විය. සැසිවාර 3 අතරතුර දී සාමාජික රාජ්‍ය/නිරීක්ෂක රාජ්‍ය මඟින් ශ්‍රී ලංකාව පිළිබඳ සඳහන් කෙරුණු වාර ගණනෙහි සැළකිය යුතු තරමේ අඩු වීමක් දක්නට ලැබුණු අතර, රටෙහි වැඩිදියුණු වී ඇති මානව හිමිකම් තත්වය හා ජාත්‍යන්තර වශයෙන් ඊට ලැබී ඇති පිළිගැනීම ඒ සඳහා බලපාන්නට ඇතැයි සැළකිය හැකිය.

- මීට අමතරව, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ පහත සඳහන් සංසදවල දී ශ්‍රී ලංකාව වෙනුවෙන් පහත සඳහන් ප්‍රකාශයන්/මැදිහත්වීම් ද සිදුකරන ලදී:

  – 2018 අප්‍රේල් 23-27 දිනවල පැවති සංවර්ධණය සඳහා ඇති අයිතිය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ 19 වැනි සැසියේ දී සිදුකළ ප්‍රකාශය,

  – මානව හිමිකම් කොමිසමේ 37 වැනි සැසියේ දී (2018 මාර්තු) අත්තනෝමතික රඳවා තැබීම් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම සමඟ අන්තර්ක්‍රියාකාරී සංවාදයේ දී සිදුකළ ප්‍රකාශය හා ක්‍රියාකාරී කණ්ඩායම 2017 දෙසැම්බර් 5-17 දිනවල ශ්‍රී ලංකාවේ සංචාරය කොට ලබාදුන් වාර්තාව පිළිබඳව අදාළ රට ලෙස 2018 දෙසැම්බර් 12 දින මානව හිමිකම් කොමිසමේ 39 වැනි සැසියේ දී සිදුකළ ප්‍රකාශය

- ශ්‍රී ලංකාව, මානව හිමිකම් කවුන්සිලයේ සමාජ සංසදය 2018 හි සභාපතිත්වය දැරූ අතර, පිනීවාහි ශ්‍රී ලංකා තානාපති හා එක්සත් ජාතීන්ගේ සංගමයේ නිත්‍ය නියෝජිතවරයා සංසදයෙහි 2018 ඔක්තෝබර් 01 දින පැවති සැසියේ දී ආරම්භක ප්‍රකාශය ඉදිරිපත් කළේය.

<u>විශ්වීය වාර සමාලෝචනය (UPR)</u>

- ශ්‍රී ලංකාවේ විශ්වීය වාර සමාලෝචනය (UPR) පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ ප්‍රතිඵලය 2018 මාර්තු 19 වැනි දින පැවති මානව හිමිකම් කොමිසමේ 37 වැනි සැසියේ දී කවුන්සිලය විසින් අනුගත කර ගන්නා ලදී. විශ්වීය වාර සමාලෝචනයෙහි දී ශ්‍රී ලංකාව විසින් අනුමත කරන ලද නිර්දේශ සමාලෝචනය කිරීමට හා ඒවා දැනට රජය විසින් සිදුකරගෙන යනු ලබන මූලාරම්භයන්ට අන්තර්ගත කරගත හැකි ආකාර පිළිබඳව ගවේෂණය කිරීමට සිවිල් සමාජයේ සාමාජිකයන් හා පාර්ශ්වකාර අමාත්‍යාංශවල නියෝජිතයන් සමඟ සංවාදයක් 2018 අගෝස්තු 23 වැනි දින අංශය විසින් ආරම්භ කරන ලදී.

<u>එක්සත් ජාතීන්ගේ විශේෂ ක්‍රියා පටිපාටි බලධාරීහු:</u>

- රජය විසින් 2015 දෙසැම්බර් මස සිට විශේෂ ක්‍රියා පටිපාටි බලධාරීන් වෙත සිදුකළ විවෘත ආරාධනයෙන් අනතුරුව, සියලු මානව හිමිකම් විශේෂයෙන්ම, ආර්ථික, සමාජමය හා සංස්කෘතික අයිතිවාසිකම් පූර්ණ වශයෙන් භුක්තිවිඳීම සඳහා විදේශ ණය හා වෙනත් අදාළ ජාත්‍යන්තර මූල්‍ය වගවීම්වල බලපෑම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ස්වාධීන විශේෂඥ ජුවාන් පැබ්ලෝ බොහොස්ලවුස්කි මහතා 2018 සැප්තැම්බර් 3-11 දිනවල ශ්‍රී ලංකාවේ සංචාරයක යෙදුණි. මෙම සංචාරයට පහසුකම් සැළසීම සඳහා ස්වාධීන විශේෂඥවරයාගේ ලේකම් කාර්යාලය, පිනීවා හි එක්සත් ජාතීන්ගේ නිත්‍ය නියෝජිත හා අදාළ පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධීකරණය අංශය විසින් සිදුකරන ලදී. 2015 සිට සම්පූර්ණ වශයෙන් විශේෂ ක්‍රියා පටිපාටි සංචාර 8 ක් සිදුකර ඇත.

ජාතික මානව හිමිකම් කාර්ය සැළැස්ම (NHRAP):

- මෙම කාර්ය සැළැස්ම ක්‍රියාවට නැංවීම නිරීක්ෂණය කිරීම සඳහා රජය විසින් පිහිටුවන ලද අන්තර්-අමාත්‍යාංශ යාන්ත්‍රණය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට හා එහි වූ සමහර ක්‍රියාකාරී ස්ථාන ක්‍රියාත්මක කිරීමට සහයවීම තුළින් 2017-2021 ජාතික මානව හිමිකම් කාර්ය සැළැස්ම ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීමට අමාත්‍යාංශය පහසුකම් සැළසීය. විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් සම්බන්ධීකරණය කරන ලද පුළුල් පදනමකින් යුත් උපදේශන ක්‍රියාවලියක් හරහා ජාතික මානව හිමිකම් කාර්ය සැළැස්ම සකස් කෙරුණු අතර, එය 2017 දී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. රාජ්‍ය හා රාජ්‍ය නොවන නියෝජිතායතනවල සහය ඇතිව, ගරු අග්‍රාමාත්‍යතුමාගේ සභාපතිත්වයෙන් යුත් ස්ථිර තුනකින් සමන්විත අන්තර් අමාත්‍යාංශ කමිටුවක් හරහා ජාතික මානව හිමිකම් කාර්ය සැළැස්ම ක්‍රියාවට නැංවෙයි.

3. යෞවන කටයුතු:

- නිව්යෝක් හි හා පෘතුගාලයෙහි පිහිටි එක්සත් ජාතීන්ගේ නිත්‍ය දූතමණ්ඩල හා මහලේකම්වරයාගේ යෞවන කටයුතු පිළිබඳ විශේෂ නියෝජිත කාර්යාලයේ හවුල්කාරිත්වයෙන් යුක්තව, ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් '2018 ලෝක යෞවන නිපුණතා දිනය' සැමරීම සඳහා සමගා අංගයක් වාර්ෂිකව සිව්වැනි වරට පවත්වන ලදී.

4. එක්සත් ජාතීන්ගේ සාමසාධක අරමුදල:

- ශ්‍රී ලංකාව, එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයාගේ සාම සාධක අරමුදලෙහි (PBF) ප්‍රතිලාභියෙකු වන අතර, එවැනි ජාතික සාමසාධක ප්‍රමුඛතා සැළැස්මක් අදාළ පාර්ශ්වකරුවන්ගේ උපදේශනයෙන් යුක්තව සකස් කරන ලදී. සාමසාධක අරමුදල මඟින් අරමුදල් සැපයෙන ව්‍යාපෘතිවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා සාමසාධක මණ්ඩලයක් පිහිටුවන ලද අතර 2017 සිට නිතිපතා එහි රැස්වීම් පවත්වන ලදී. විදේශ කටයුතු ලේකම්තුමා, එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරක සමඟ සාමසාධක මණ්ඩලයෙහි සම සභාපතිත්වය දරයි. 2018 සැප්තැම්බර් මස වන විට සාමසාධක මණ්ඩලයෙහි රැස්වීම් 09 ක් සඳහා මෙම අංශය මඟින් පහසුකම් සපයා ඇත. මෙම අංශය, සාමසාධක අරමුදල යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති අධීක්ෂණය කරන අධීක්ෂණ කමිටුවෙහි දී විදේශ කටයුතු අමාත්‍යාංශය නියෝජනය කරන අතර, ඒවා සාර්ථක ලෙස ක්‍රියාවට නැංවීම සඳහා දායක වෙයි.

5. මිනිස් ජාවාරම:

- 2018 මාර්තු මස එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද මිනිස් ජාවාරම පිළිබඳ ශ්‍රී ලංකාවේ වාර්තාව මෙම අංශය මඟින් සම්බන්ධීකරණය කරන ලදී. මෙම ගැටලුව විසඳීම සඳහා දරන ලද ප්‍රයත්නවල ප්‍රතිඵලයක් ලෙස, දෙවැනි අනුගාමී

වර්ෂයේ දී ද 2018 වසරේ එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ වාර්තාවෙහි දෙවැනි ස්ථානයෙහි රැඳී සිටීමට ශ්‍රී ලංකාව සමත් විය.

- මිනිස් ජාවාරමෙහි වින්දිතයන් ක්‍රියාශීලීව හඳුණා ගැනීම, ආරක්ෂක සේවා වැඩිදියුණු කිරීම හා මිනිස් ජාවාරම් වරදවල් වැළැක්වීම සඳහා නිලධාරීන් පුහුණු කිරීමේ කටයුතුවලට ද මෙම අංශය පහසුකම් හා සහය සැපයීය. මේ සම්බන්ධයෙන්, මිනිස් ජාවාරමෙහි වින්දිතයන් පිළිබඳව කටයුතු කිරීමේ දී ඵලදායී හා සංවේදී අන්දමින් ප්‍රතිචාර දැක්වීම සඳහා විදේශවල පිහිටි ශ්‍රී ලංකා දූතමණ්ඩලවල නිලධාරීන්ගේ දැනුම හා නිපුණතාව වැඩිදියුණු කිරීම සඳහා මාර්ගගත පුහුණු මොඩියුලයක් සකස් කරන ලදී. මෙම වැඩසටහන 2018 ඔක්තෝබර් 9 වැනි දින දියත් කරන ලදී. මිනිස් ජාවාරමෙහි වින්දිතයන් හඳුණාගැනීම හා ඔවුන්ට සහය වීම සඳහා ගුවන් යානා කාර්ය මණ්ඩලයේ ධාරිතාව වැඩිදියුණු කිරීමට ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ගුවන්යානා කාර්ය මණ්ඩලයට ද මෙවැනිම පුහුණු වැඩසටහනක් 2018 සැප්තැම්බර් මාසයේ දී දියත් කරන ලදී.

6. මානව හිතවාදී කටයුතු:

<u>ජාත්‍යන්තර රතුකුරුස කමිටුව:</u>

- 1989 සිට, ශ්‍රී ලංකාවේ සිරගෙවල හා තාවකාලික ස්ථානවල රඳවා තබන ලද පුද්ගලයන් බැලීමට පැමිණෙන ජාත්‍යන්තර රතුකුරුස කමිටුව (ICRC) සමඟ ශ්‍රී ලංකාව මනා සහයෝගිතාවක් පවත්වා ගනී. 2018 මැයි 22 වැනි දින ලබාදුන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව, ශ්‍රී ලංකා රජය සහ ජාත්‍යන්තර රතුකුරුස කමිටුව, "තම නිදහස අහිමි වූ පුද්ගලයන්ගේ ප්‍රතිලාභය සඳහා වූ සහයෝගිතාවය හා මානවහිතවාදී කටයුතු" පිළිබඳ ගිවිසුමකට අත්සන් තබන ලදී. එකී ගිවිසුමට එළඹීම සඳහා වූ සාකච්ඡාවල දී මෙම අංශයේ සහභාගිත්වය හා විශේෂ දායකත්වය ද ලබාදෙන ලදී.

- මෙම ගිවිසුම යටතේ, ශ්‍රී ලංකා හමුදා ආයතන තුළ හමුදා නීතිය යටතේ රඳවා සිටින හමුදා නිලධාරීන් හැරෙන්නට, ශ්‍රී ලංකා රජය යටතේ පවතින සියලු රැඳවියන් හා රැඳවුම් මධ්‍යස්ථාන කරා යාමට ජාත්‍යන්තර රතුකුරුස කමිටුවට අවසරය හිමි වේ. මෙම ගිවිසුම මඟින්, ශ්‍රී ලංකාවේ රැඳවුම් තත්ත්වයන් හා රටේ රැඳවියන්ට සළකනු ලබන ආකාරය වැඩිදියුණු කිරීමේ හා ශ්‍රී ලංකාවේ බන්ධනාගාර පද්ධතිය ජාත්‍යන්තර ලෙස පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව සැකසීමේ රජයේ ව්‍යායාමයන් සඳහා ජාත්‍යන්තර රතුකුරුස කමිටුවේ ජාත්‍යන්තර අත්දැකීම්වලින් හා විශේෂඥතාවයෙන් ප්‍රයෝජන ගැනීමට ශ්‍රී ලංකාවට හැකි වනු ඇත.

7. නිරායුධකරණය:

- ශ්‍රී ලංකාව, එහි දීර්ඝකාලීන මානව හිතවාදී නිරායුධකරණයට ඇති කැපවීම විදහා දක්වමින්, 2017 දෙසැම්බර් 13 දින පුද්ගලනාශක බෝම්බ භාවිතය, ගබඩා කිරීම, නිෂ්පාදනය හා එහාමෙහා ගෙනයාම තහනම් කිරීම සහ ඒවා විනාශ කිරීම පිළිබඳ

සම්මුතිය හා සම්බන්ධ වීමේ සාධන පත්‍රයට ද, 2018 මාර්තු 1 වැනි දින එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේ දී, නිව්යෝක් හි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත හරහා පොකුරු යුද්ද අවි පිළිබඳ සම්මුතිය හා සම්බන්ධ වීමේ සාධන පත්‍රයට ද, එකඟ විය.

- 2018 වර්ෂයේ දී නිරායුධකරණය පිළිබඳ ක්ෂේත්‍රයෙහි කැපී පෙනෙන සිදුවීම් පහත සඳහන් වේ:
    - ශ්‍රී ලංකාව නිරායුධකරණය පිළිබඳ සම්මන්ත්‍රණයෙහි මූලසුන දැරීම මෙන්ම, පොකුරු යුද්ද අවි පිළිබඳ සම්මුතියෙහි 9 වැනි රාජ්‍ය පාර්ශ්වකරුවන්ගේ රැස්වීමේ දී මූලාසන වාර්තාකරු තත්වය ශ්‍රී ලංකාවට හිමිවීම.
    - පුද්ගලනාශක බෝම්බ භාවිතය, ගබඩා කිරීම, නිෂ්පාදනය හා එහාමෙහා ගෙනයාම තහනම් කිරීම සහ ඒවා විනාශ කිරීම සඳහා වූ සම්මුතිය පිළිබඳ විශේෂ නියෝජිත මිරෙඩ් බින් රාඩ් අල්-හුසෙයින් රජකුමරු 2018 මාර්තු 4-5 දිනවල ශ්‍රී ලංකාවේ සිදුකළ සංචාරය.
    - පුද්ගලනාශක බෝම්බ භාවිතය තහනම් කිරීමේ සම්මුතියට (ඔටාවා ප්‍රඥප්තිය) ශ්‍රී ලංකාව එකඟ වීමෙන් අනතුරුව, ජිනීවාහි එක්සත් ජාතීන්ගේ නිත්‍ය නියෝජිත විසින් ජිනීවා හි දී ඉහත කී ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ සහය ඒකකය සමඟ සම්බන්ධ වීමට පහසුකම් සැළසූ අතර, 2018 ජූනි මස පැවති තනි තනි රටවල ඉදිරිපත් කිරීම සඳහා සම සත්කාරකත්වය දැරිය.
- 2018 නොවැම්බර් මස දී ඉදිරිපත් කිරීමට නියමිත බිම්බෝම්බ තහනම් කිරීමේ ප්‍රඥප්තියට අදාළව, ජාතික ප්‍රතිපත්තියක් කෙටුම්පත් කොට අවසන් කිරීම මෙම අංශය විසින් සම්බන්ධීකරණය කරනු ලැබේ.
- ජාතික බිම්බෝම්බ පිළිබඳ ක්‍රියාකාරී මූලෝපායයෙහි මධ්‍ය කාලීන සමාලෝචනයෙහි දී මෙම අංශය විදේශ කටයුතු අමාත්‍යාංශය නියෝජනය කළ අතර, ඒවා ක්‍රියාවට නැංවීම තක්සේරු කිරීමෙහි දී හා අනාගත ඉලක්ක සැකසීමේ දී සහය විය.

8. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා:

- එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රාජ්‍යයන් විසින් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා ක්‍රියාවට නැංවිය යුතු වීමේ වගකීමට අනුව, ඉරානය පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ යෝජනා අංක 2231 පැනවීම සඳහා, 1968 අංක 45 දරණ එක්සත් ජාතීන්ගේ පනත යටතේ අදාළ දේශීය රෙගුලාසි කෙටුම්පත් කොට ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදී. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා අංක 2231 ට අදාළ සම්බාධක ක්‍රියාත්මක කිරීමට අංක 2080/34 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ශ්‍රී ලංකාවට බලය ලැබී ඇත. අදාළ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සඳහා නිසි බලධාරී වශයෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමා පත් කරන ලදී.

- අදාළ රේඛීය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල ප්‍රයෝජනය සඳහා, මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ සහය ඇතිව, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා අංක 1540 ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් වැඩමුළු 3 ක් 2018 අගෝස්තු මස කොළඹ දී සංවිධානය කරන ලදී.

9. සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස්වරයා:

- රැකවරණය පතන්නන් හා සරණාගතයන් ලේඛනගත කිරීම සහ සරණාගතයන් නැවත පදිංචි කරවීම හා ඊට අදාළ ගැටලු යනාදිය සම්බන්ධයෙන් මෙම අංශය, එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස්වරයා හා අදාළ රාජ්‍ය ආයතන සමඟ සහයෝගීතාව දිගටම පවත්වා ගනී. මෙම අංශය, යුනිසෙෆ් ආයතනයේ හා එක්සත් ජාතීන්ගේ සරණාගතයින්ගේ නියෝජිතායතනයේ සහයෝගීතාව ඇතිව, මානවවාදී කරුණු සහ සරණාගතයන්ගේ හා රැකවරණය පතන්නන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය සඳහා වූ ප්‍රවේශය පිළිබඳ ගැටලුව සම්බන්ධයෙන් ද විසඳුම් ලබාදෙයි.

- ප්‍රධාන වශයෙන් ඉන්දියාවේ සිට ආපසු පැමිණෙන ශ්‍රී ලාංකික සරණාගතයන් නැවත පදිංචි කරවීමේ ගැටලුවට ද මෙම අංශය විසඳුම් ලබා දෙයි. 2018 අගෝස්තු මස වන විට ශ්‍රී ලංකාවට ආපසු පැමිණි සරණාගතයන් සංඛ්‍යාව 948 ක් ලෙස සඳහන් වන අතර, 2009 වසරේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ආපසු පැමිණි මුළු සරණාගතයන් සංඛ්‍යාව 10,675 කි.

- 2018 සැප්තැම්බර් වන විට එක්සත් ජාතීන්ගේ සරණාගතයින්ගේ නියෝජිතායතනය මඟින් සරණාගතයන් හා රැකවරණය පතන්නන් සඳහා ජාත්‍යන්තර වශයෙන් ආරක්ෂාව සැපයීම සම්බන්ධයෙන් රජයේ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා වැඩමුලු 05 ක් (සහභාගී වූවන් 107) පවත්වා ඇත.

10. අපේක්ෂකත්වයන්:

- අනෙකුත් එක්සත් ජාතීන්ගේ සංගමයේ සාමාජික රටවලවල අපේක්ෂකත්වයන් සඳහා ඡන්ද විමසීමේ දී සහය දැක්වීමෙන්/ශ්‍රී ලංකාවේ ඡන්ද හුවමාරුකර ගැනීමෙන් සහ එක්සත් ජාතීන්ගේ සංගමයේ ආයතන සඳහා ඡන්ද විමසීම්වල දී ශ්‍රී ලංකාව ඡන්දය පාවිච්චි කළ රටාව පිළිබඳ දත්ත පාදකයක් බවත්වා ගැනීමෙන් එක්සත් ජාතීන්ගේ සංගමයේ අනෙකුත් සාමාජික රටවල් සමඟ සබඳතා පවත්වා ගැනීමට මෙම අංශය දායක විය.

- ද්විපාර්ශ්වික සහයෝගීතාව වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංගමයේ අනෙකුත් සාමාජික රටවල්වලට සිය සහය දැක්වීය.

- යුනෙස්කෝ සංවිධානයේ, අස්පර්ෂ්‍ය සංස්කෘතික උරුමයන් සුරැකීම පිළිබඳ අන්තර්-ආණ්ඩු කමිටුවේ 2018-2022 කාලසීමාව සඳහා ශ්‍රී ලංකාවේ අපේක්ෂකත්වයට වෙනුවෙන් සහය ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා දූතමණ්ඩල සමඟ සම්බන්ධීකරණය මෙම අංශය විසින්

සිදුකරන ලදී. සිය අපේක්ෂකත්වය වෙනුවෙන් සහය පළකරන ජන්ද 122 ක් ලබාගනිමින් ශ්‍රී ලංකාව එම අසුන දිනාගත්තේය.

11. තිරසර සංවර්ධන ඉලක්ක:

- මෙම අංශය, ප්‍රතිපත්තිමය කරුණු හා අන්තර්කාලීන වාර්තාකරණය සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ ලේකම් කාර්යාලය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ කොළඹ කාර්යාලය හා තිරසර සංවර්ධන අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය කළේය.

- තිරසර සංවර්ධන, වනජීවී හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ අධීක්ෂණ අමාත්‍යතුමා හා ජ්‍යේෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත ඉහළ පෙළේ නියෝජිත කණ්ඩායමේ සහභාගිත්වයට, නිව්යෝක්හි නිත්‍ය දූතමණ්ඩලය සහභාගී වූ අතර, ඊට අවශ්‍ය පහසුකම් ද සැපයීය.

<u>**පරිසරය හා දේශගුණ විපර්යාස:**</u>

- වඳවීමේ තර්ජනයට ලක්ව ඇති සත්ව හා ශාක විශේෂවල ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ සම්මුතියෙහි (CITES) රාජ්‍ය පාර්ශ්වකරුවන්ගේ 18 වැනි රැස්වීම සඳහා ශ්‍රී ලංකාව සත්කාරකත්වය දරයි. මේ සඳහා සූදානම් වීමේ කටයුතු සම්බන්ධයෙන්, පිනීවාහි එක්සත් ජාතීන්ගේ නිත්‍ය නියෝජිත, තිරසර සංවර්ධන අමාත්‍යාංශය හා CITES ලේකම් කාර්යාලය සමඟ මෙම අංශය දිගටම සම්බන්ධීකරණ කටයුතු සිදුකරයි.
- බේසල්, රොටර්ඩෑම් හා ස්ටොක්හෝම් සම්මුති සමඟ ශ්‍රී ලංකාවේ අනුකූල වීම සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශ, පිනීවාහි එක්සත් ජාතීන්ගේ නිත්‍ය නියෝජිත හා බහුපාර්ශ්වික නියෝජිතායතන සමඟ මෙම අංශය දිගටම සම්බන්ධීකරණ කටයුතු සිදුකරයි.

12. බහුපාර්ශ්වික සංසදවල ශ්‍රී ලංකාවේ නියෝජනය:

- ජාත්‍යන්තර සම්මන්ත්‍රණවල ශ්‍රී ලංකාවේ නියෝජනය/සහභාගිත්වය සඳහා මෙම අංශය පහසුකම් සැපයීය. පරිසරය, සමාජ-ආර්ථික ගැටලු, සෞඛ්‍යය, නිරායුධකරණය වැනි ගැටලු ගණනාවක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට වැදගත් වන කරුණු සම්බන්ධීකරණය හා ඒ පිළිබඳ ස්ථාවරයන් සකස් කිරීමට සහය වීම, ශ්‍රී ලංකාව සහභාගී වන රැස්වීම් සඳහා අභිප්‍රාය ලිපි 34 ක් සැකසීම. (2018 සැප්තැම්බර් 30 දිනට)

13. වීසා සැකසීම හා රාජ්‍ය නොවන සංවිධාන ලේඛනගත කිරීම:

- වසර පුරාම ශ්‍රී ලංකාවේ දී පැවති සමුළු, වැඩමුලු, රැස්වීම්, සම්මන්ත්‍රණ සඳහා වීසා බලපත් නිකුත් කිරීමට පහසුකම් සැළසීම, රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලය මඟින් මෙම අමාත්‍යාංශයෙහි සහය අපේක්ෂා කළ අවස්ථාවල දී රාජ්‍ය නොවන සංවිධාන

ලේඛනගත කිරීම සඳහා පහසුකම් සැළසීම. 2018 ජනවාරි 01 දින සිට සැප්තැම්බර් 30 දින දක්වා මෙම අංශය මඟින් වීසා 2,253 ක් නිකුත් කොට ඇත.

14. එක්සත් ජාතීන්ගේ සංවිධානයට හා අදාළ නියෝජිතායතනවලට ශ්‍රී ලංකාවේ දායත්වය:

- එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිතායතනවල ශ්‍රී ලංකාවේ සාමාජිකත්වය සඳහා එම ආයතන වෙත සිදුකළ යුතු ගෙවීම් සම්බන්ධයෙන් මෙම අංශය අදාළ රජයේ අමාත්‍යාංශ හා ආයතන සමඟ සම්බන්ධීකරණය සිදුකරයි.

- 2018 සැප්තැම්බර් මාසය සඳහා රටවල් 56 කින් සමන්විත වූ ආසියා-පැසිෆික් කණ්ඩායමේ එක්සත් ජාතීන්ගේ සංවිධානයට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා ශ්‍රී ලංකාව එහි මුලසුන දැරීය. කණ්ඩායමේ සභාපති ලෙස, එක්සත් ජාතීන්ගේ සංවර්ධන ක්‍රමයේ සංක්‍රාන්ති කණ්ඩායම සමඟ 2018 සැප්තැම්බර් 12 වැනි දින පැවති කළාපීය කණ්ඩායම්වල සභාපතිවරුන් සඳහා වූ ඒකාබද්ධ කාර්ය මණ්ඩල සංවර්ධන සංසදය පිළිබඳ හමුවකට ශ්‍රී ලංකාව ද සහභාගී වූ අතර, එහි දී උපායමාර්ගික උපදේශක කණ්ඩායම හා එහි සංයුතිය ඇතුළුව, යෝජිත පාලන ව්‍යුහය පිළිබඳව කණ්ඩායමේ සාමාජිකයන් දැනුවත් කරන ලදී. නෙල්සන් මැන්ඩෙලා සාම සමුළුව ආරම්භ කිරීමට ප්‍රථම, 2018 සැප්තැම්බර් මස 24 වැනි දින එක්සත් ජාතීන්ගේ සංගමයේ මහලේකම්වරයාගේ ද සහභාගිත්වය ඇතිව, දකුණු අප්‍රිකාවේ ජනාධිපතිවරයා විසින් හිටපු ජනාධිපති නෙල්සන් මැන්ඩෙලා මැතිතුමාගේ පිළිරුව විවෘත කිරීමේ අවස්ථාවට ද ආසියා පැසිෆික් කණ්ඩායම නියෝජනය කරමින් ශ්‍රී ලංකාව සහභාගී විය.

ඇමරිකා එක්සත් ජනපද සහ කැනඩා අංශය

ඇමරිකා එක්සත් ජනපදය සහ කැනඩා අංශය

1.1. ඇමරිකා එක්සත් ජනපදය

වර්තමාන අක්තගැන්වීම් : වොෂින්ටන් ඩී. සී. මෙක්සිකෝව, ට්‍රිනිඩෑඩ් හා ටොබැගෝ

අ. ද්විපාර්ශ්වික සබඳතා

i. ශ්‍රී ලංකාවේ සංවර්ධන කටයුතු පිළිබඳව දැනුවත් කිරීම සඳහා තානාපති කාර්යාල නියෝජිතයින්, **රාජ්‍ය ආරක්ෂක දෙපාර්තමේන්තුව, ජාතික ආරක්ෂක කවුන්සිලය** සහ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වූ මන්ත්‍රී මණ්ඩලයේ දේශපාලන බල මණ්ඩලය ඇතුළු **කොන්ග්‍රස් සාමාජිකයින්/කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්** හමුවූහ. වාර්තා කරන ලද කාලය තුළ තානාපති කාර්යාලය සෘජු සම්බන්ධකම් (රැස්වීම් / අන්තර් ක්‍රියාකාරීත්වයන්) 220 ක් පමණ පවත්වා ඇත. ඉහළ මට්ටමේ එක්සත් ජනපද කොංග්‍රස් මණ්ඩල ශ්‍රී ලංකා සංචාරයන්හි වැදගත්කම පිළිබඳව පරිපාලනය සහ කොන්ග්‍රස් නියෝජිතයින් දෙපාර්ශවයම පිළිගනු ලබති.

ii. දේශපාලන කටයුතු පිළිබඳ රාජ්‍ය උප ලේකම් ටොම් ෂැනන් මහතා ඉහළම රාජ්‍ය දෙපාර්තමේන්තු නිලධාරි තෙවන මට්ටම ශ්‍රී ලංකාවට පිරිනමා ඇති අතර, 70 වන ජාතික දින උත්සවයට ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගි වීම සඳහා සහ එහිදී ඇමෙරිකානු රජය වෙනුවෙන් අදහස් දැක්වීමේ අවස්ථාව ශ්‍රී ලංකාවට හිමිවිය.

iii. **සන්නද්ධ සේවා පිළිබඳ එක්සත් ජනපද කමිටුවේ** සභාපති මැක් තෝන්බෙරි මහතාගේ ප්‍රධානත්වයෙන් යුතු නියෝජිත පිරිසක් මැයි මාසයේදී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. අගෝස්තු මාසයේදී විදේශ හමුදා මූල්‍යකරණය සඳහා එක්සත් ජනපදය විසින් ශ්‍රී ලංකාවට ඇමෙරිකානු ඩොලර් මිලියන 39 ක් ආධාර වෙන් කරන බව නිවේදනය කරන ලදී. විදේශ කටයුතු පිළිබඳ කමිටු සාමාජික සෙන්සෙන්බ්‍රෙනර් සහ ඔහුගේ මාණ්ඩලික ප්‍රධානී මැට් බිසෙනියස් පෙබරවාරි මාසයේදී පොදු අධ්‍යාපන සහ සංස්කෘතික හුවමාරු පනත (MECEA) යටතේ ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූහ.

iv. ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ඉල්ලීම මත නියෝජිත රාජා ක්‍රිෂ්ණමූර්ති කොන්ග්‍රස් මණ්ඩලයේ ශ්‍රී ලංකා දේශපාලන බල මණ්ඩලයට එක් විය.

v. දකුණු ආසියා කළාපයේ රටවල් තුළ කාන්තා සහභාගිත්වය ඉහළ නැංවීම සඳහා උපාය මාර්ගයන් සාකච්ඡා කිරීම සඳහා සහ වෘත්තීය අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා පැවැත්වූ වැඩසටහනක දී ලොස් ඇන්ජලීස්හි විදේශ දූත මණ්ඩල කාර්යාලය, එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව සමඟ කොන්සල් ජනරාල්වරයා සහයෝගිත්වයෙන් කටයුතු කරනු ලැබීය.

vi. තානාපති කාර්යාලයේ ඉල්ලීම මත, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වූ මන්ත්‍රී මණ්ඩලයේ දේශපාලන බල මණ්ඩලයේ සම-සාමාජික නියෝජිත ඩීනා ටයිටස් විසින් 70 වසරක එක්සත් ජනපද - ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික සබඳතා පිළිබඳ කොංග්‍රස් මණ්ඩල වාර්තාවක් ප්‍රකාශයට පත් කරනු ලැබීය.

vii. තානාපති කාර්යාලය අබණ්ඩව බුද්ධි මණ්ඩල (Think tanks) සමඟ සම්බන්ධ වී කටයුතු කරනු ලැබීය. ශ්‍රී ලංකා ගරු අග්‍රාමාතුතුමා ඇතුළු ශ්‍රී ලංකා රාජ්‍ය නියෝජිතයන් සමඟ සාකච්ඡාවන් පැවැත්වීම සඳහා හෙරිටේජ් පදනමෙහි ආසියානු අධ්‍යයන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් යුතු නියෝජිත පිරිසක් ඔක්තෝබර් මස ශ්‍රී ලංකාවේ සංචාරයක නියුතු වූ අතර, ලක්ෂ්මන් කදිරගාමර් ජාත්‍යන්තර සබඳතා හා ක්‍රමෝපායික අධ්‍යයනය ආයතනය (LKIIRSS) සමඟද එහිදී වට මේස සාකච්ඡාවක් පවත්වනු ලැබීය.

viii. එක්සත් ජනපද - ශ්‍රී ලංකා සහයෝගිතාව පිළිබඳ සාකච්ඡා කිරීම සහ සහයෝගීතාවය වැඩි දියුණු කිරීමේ වැඩිදුර අවස්ථාවන් සාකච්ඡා කිරීම සඳහා එක්සත් ජනපද රාජ්‍ය නිලධාරීන් (රජය, ආරක්ෂක, ජාතික ආරක්ෂක කවුන්සිලය, USAID, මිලේනියම් අභියෝග සංස්ථාව) සහ එක්සක් ජනපද කොන්ග්‍රස් මණ්ඩල සාමාජිකයින් (එක්සත් ජනපද කමිටුවේ සභාපති මැක් ටෝන්බෙරි මහතා, විදේශ කටයුතු පිළිබඳ කමිටුවෙහි සභාපති ටෙඩ් යොහෝ මහතා) සමඟ සම්බන්ධ වී කටයුතු කිරීමට සහ ගරු. සාගර රත්නායක මහතා සැප්තැම්බර් මස වොෂින්ටයේ සංචාරයක නියුතු විය.

ix. විදේශ කටයුතු ලේකම් ප්‍රසාද් කාරියවසම් මහතා ජූලි මාසයේ දී වොෂින්ටන් නගරයේ සංචාරයක නියුතු වූ අතර, එහිදී එක්සත් ජනපද රාජ්‍ය නිලධාරීන් (රජය, ආරක්ෂක, ජාතික ආරක්ෂක කවුන්සිලය, සහ කොන්ග්‍රස් මණ්ඩලයේ සාමාජිකයින් සහ නිලධාරීන් (ශ්‍රී ලංකාව දේශපාලන බල මණ්ඩලයේ සම සභාපති නියෝජිත රොබර්ට් ඇඩර්හෝල්ට් සහ නියෝජිත ඩීනා ටයිටස්, ශ්‍රී ලංකාවේ ජනවාර්ගික හා ආගමික නිදහස පිළිබඳ මණ්ඩලයේ නියෝජිත බිල් ජොන්සන්) හමු විය. එක්සත් ජනපද රාජ්‍ය ලේකම් විසින් පවත්වන ලද පළමු වාර්ෂික අන්තර්ජාතික ආගමික නිදහස් අමාත්‍යාංශ වැඩසටහන සඳහා සහභාගි වූ ශ්‍රී ලංකා නියෝජිත පිරිසගේ ප්‍රධානත්වයද ඔහු විසින් දැරූ අතර, ඒ සඳහා ආසන්න වශයෙන් රටවල් 80 ක් පමණ ආරාධනා ලැබූ අතර, ඒ අතරට ශ්‍රී ලංකාවද ඇතුලත් විය.

x. මාර්තු මාසයේ ශ්‍රී ලංකාවේ සංචාරය කළ ආගමික සුළු ජාතීන්ගේ විශේෂ උපදේශක නොක්ස් තේම්ස් මහතා සමඟින් එම සංචාරයේ පසු විපරමක් ලෙස, පැවතිය හැකි සහයෝගිතාවයන් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා තානාපති කාර්යාලය තේම්ස් මහතාව මුණ ගැසුණි. එක්සත් ජනපදයේ අධිකරණ දෙපාර්තමේන්තුව සහ දේශීය ආරක්ෂාව පිළිබඳ දෙපාර්තමේන්තුව 2018

දෙසැම්බර් මස ශ්‍රී ලංකාවට පැමිණීමට නියමිත අතර, අන්තර් රාජ්‍ය පාලනය පිළිබඳ වැඩමුළුව ඇතුළුව ශ්‍රී ලංකාවේ නීති ක්‍රියාත්මක කිරීම සඳහා පුහුණුවීම් සිදුකිරීමට නියමිතය.

xi. ශ්‍රී ලංකාව පුද්ගල ජාවාරම පිළිබඳ වාර්තාව තුළ තෙවන මට්ටම පවත්වා ගෙන ඇත. ශ්‍රී ලංකා රජය පුද්ගල ජාවාරම තුරන් කිරීම සඳහා සැළකිය යුතු උත්සාහයක් දරනු ලැබුවද, අවශ්‍ය අවම ප්‍රමිතීන් සම්පූර්ණයෙන් අත්පත් කර ගෙන නොමැති බව එම වාර්තාව සඳහන් කරයි. පූර්ව වාර්තාව සිදු කරන ලද කාලයේදී දෙවන මට්ටමේ සිටි ශ්‍රී ලංකා රජය සාපේක්ෂව වර්ධනය වන උත්සාහයක් දරා ඇති බව එම වාර්තාව සඳහන් කරයි.

1. ආරක්ෂක කටයුතු

i. තානාපති කාර්යාලය විසින් ආරක්ෂක කටයුතු සම්බන්ධයෙන් එක්සත් ජනපදයේ සම තත්ව දරන්නන් 120 ක් සමඟ පමණ සෘජු සබඳතාවයන් පැවතිණි. මෙයට ශ්‍රී ලංකා රාජ්‍ය නියෝජිත කණ්ඩායම් සහභාගී වූ රැස්වීම් / සාකච්ඡා ද ඇතුළත් වේ.

ii. ආරක්ෂක සහයෝගිතාව තවදුරටත් වැඩි දියුණු කිරීම සහ පුළුල් කිරීම සඳහා සහ සේවාවන් තුන සහ වෙරළ ආරක්ෂකයින් සමඟ සම්බන්ධීකරණය වීම සඳහා අවකාශ පවතින බව තානාපති නියෝජිතයින් යෝජනා කළහ. මේ සම්බන්ධයෙන් දෙරට අතර හමුදා ගිවිසුම (SOFA) සකස් කර අවසන් කිරීම සඳහා එක්සත් ජනපදය උනන්දු වනු ඇත. තවද, එක්සත් ජනපදය විසින් ගුවන් මධ්‍යස්ථානයක්, ගුවන් යානා තාවකාලික නවාතැන්පොළක්, ගුවන් යානා කොටස් ගබඩාවක්, HADR උපකරණ පූර්ව ස්ථානගත කිරීම් සහ යුධමය තොරතුරු පොදු ආරක්ෂාව පිළිබඳ ගිවිසුම (GSOMIA) සඳහා වන යෝජනා සළකා බැලීම සඳහා ඉදිරිපත් කරන ලදී.

iii. දකුණු සහ මධ්‍යම ආසියා කළාපය වෙනුවෙන් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වන ආරක්ෂක උප ලේකම්වරයාගේ කාර්යාලය සමඟ තානාපති කාර්යාලය සිය අඛණ්ඩ සංවාදය පවත්වා ගෙන යන ලදී. විදේශ කටයුතු ලේකම් සහ නාවුක හමුදාපති වර්ෂය තුළ විවිධ අවස්ථාවල DASD රැන්ඩල් ශ්‍රිවර් සහ DASD ආචාර්ය ජෝෂප් ෆෙල්ටර් හමු වීමට කටයුතු කළ අතර, එම හමුවීම් වලදී ආරක්ෂක සහයෝගිතාවය සම්බන්ධ කරුණු සහ ආරක්ෂක ගිවිසුමෙහි තත්ත්වය (SOFA) සහ අනෙකුත් යෝජනා පිළිබඳ සාකච්ඡා කරන ලදී.

iv. වත්මන් ඉන්දු - ශාන්තිකර උපායමාර්ගය පිළිබඳ වත්මන් එක්සත් ජනපද පරිපාලනය, අග්නිදිග හා දකුණු ආසියාවේ රටවල් සමඟ පවත්නා ආරක්ෂක සබඳතා කෙරෙහි සැලකිය යුතු අවධානයක් යොමු කරයි. මෙම සන්දර්භය තුළ,

2018 අගෝස්තු මාසයේ දී එක්සත් ජනපද රාජ්‍ය ලේකම් විසින් විදේශ යුධමය මූල්‍යකරණය (FMF) වැඩසටහන හරහා කළාපයට ඩොලර් මිලියන 300 ක ආධාරයක් ලබා දීම ප්‍රකාශයට පත් කරන ලදී. මේ සම්බන්ධ වැඩසටහන් සඳහා ශ්‍රී ලංකාව වෙත වෙන් කරනු ලැබූ ඇමෙරිකානු ඩොලර් මිලියන 39 ට අමතරව, ආරක්ෂක සහයෝගිතාව තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා එක්සත් ජනපදයේ අභිප්‍රාය පිළිබඳ සංඥා කරමින්, සමුද්‍රීය ආරක්ෂාව, මානුෂීය ආධාර සහ ආපදා ප්‍රතිචාර (HADR) සඳහා මෙම ආධාර වෙන් කරනු ලැබ ඇත.

v. වර්ෂ 2015 සිට පවත්නා ද්විපාර්ශ්වික සහයෝගිතාව වැඩි දියුණු කිරීම සම්බන්ධව කැපී පෙනෙන සන්ධිස්ථානයක් සලකුණු කරමින්, එක්සත් ජනපදයේ හිටපු ඇමරිකානු වෙරළ ආරක්ෂක ගටර්, ෂර්මන්, අගෝස්තු 28 දා හවායිහිදී ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත මාරු කරන ලදී. ශ්‍රී ලාංකේය කාර්ය මණ්ඩලය වර්තමානයේ නෞකාවේ පුහුණුව ලබමින් සිටින අතර, 2019 පෙබරවාරි මස අවසන් වන විට නෞකාව ශ්‍රී ලංකාව බලා යාත්‍රා කිරීමට නියමිතය. එම නෞකාව ලංකාව වෙත ලැබීමෙන් පසු, ශ්‍රී ලංකා නාවික හමුදාවට අයත් විශාලතම යාත්‍රාව වනු ඇත.

vi. මීට අමතරව, තානාපති කාර්යාලය විසින් පුහුණු කණ්ඩායම් හුවමාරු කිරීම, විෂය කරුණු විශේෂඥයින් (සුළු හා මධ්‍ය පරිමාණ) / ජංගම පුහුණු කණ්ඩායම් (MTI) යුධමය අභ්‍යාසවල සහභාගීත්වය සහ INDOPACOM සහ කොළඹ ස්ථාපිත එක්සත් ජනපද තානාපති කාර්යාලයේ සමීප සම්බන්ධතාවයෙන් පුහුණුව ලබා දීම සඳහා තානාපති කාර්යාලය සිය සහාය දැක්විය. ඇමෙරිකා එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව ඒකාබද්ධ යුද අභ්‍යාස, නාවුක චාරිකා සහ අදාළ හවුල්කාර වැඩසටහන් අඛණ්ඩව සිදු කරන ලදී. මානුෂීය ආධාර සහ ආපදා ප්‍රතිචාර දැක්වීම, ශාන්තිකර හවුල්කාරිත්වය, මෙම වසරේ අප්‍රේල් මාසයේදී දෙවන වරට ත්‍රිකුණාමලයේදී පවත්වන ලදී.

vii. ශ්‍රී ලංකා රටවල් 25 කින් සමන්විතව ජූලි හා අගෝස්තු මාසවල පැසිෆික් කළාපයේදී පවත්වන ලද අන්තර්ජාතික සමුද්‍රීය නාවික අභ්‍යාසය "RIMPACK" සඳහා නාවික හමුදා සමුද්‍රීය භටයින් සහභාගි වූහ.

viii. තානාපති කාර්යාලය MLI සමඟ එක්ව මානුෂීය බිම් බෝම්බ ඉවත් කිරීමේ වැඩපිළිවෙල තවදුරටත් සම්බන්ධීකරණය කළේය. වර්ෂ 2020 වන විට බිම් බෝම්බවලින් තොර ශ්‍රී ලංකාවක් බිහිකිරීමේ අරමුණින් ශ්‍රී ලංකා යුධ හමුදා ඉංජිනේරුවන් සමඟ එක්ව කටයුතු කිරීම සඳහා අතිරේක බිම් බෝම්බ හඳුනාගැනීමේ බල්ලන් (MDDs) ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත යැවීමට MLI සැලසුම් කරයි.

ix. ශ්‍රී ලංකා නාවුක හමුදාපතිවරයා 2018 සැප්තැම්බර් 18 – 21 දක්වා නිව් පෝට් රෝඩ් දිවයිනෙහි එක්සත් ජනපද නාවුක විද්‍යාලයේ දී පැවති 23 වැනි අන්තර්ජාතික සාගර බලශක්ති සමුළුව (NEWS) ට සහභාගී වූ අතර, නාවුක හමුදාපතිවරයා විසින් සමුළුවේදී ''ඉන්දියන් සාගර නාවුක සම්මේලනය'' මැයෙන් වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. එහිදී එක්සත් ජනපද නාවුක මෙහෙයුම් ප්‍රධානී, ඔස්ට්‍රේලියානු නාවුක ප්‍රධානි, එක්සත් ජනපද ශාන්තිකර නාවික හමුදා අණදෙන නිලධාරි, ඇමෙරිකානු නාවික හමුදාවේ මධ්‍ය අණ දෙන නිලධාරි සහ එක්සත් ජනපද වෙරළ ආරක්ෂක බල මණ්ඩලයේ ආඥාපති සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වූ අතර, අන්‍යෝන්‍ය ලැදියාව සහිත කරුණු සහ හවුල්කාර සබඳතාවයන් පිළිබඳ සාකච්ඡා කරන ලදී. මැදිහත්වීම්. වොෂිංටන් ඩීසී හිදී නාවික හමුදාපතිවරයා, දකුණු සහ මධ්‍යම ආසියාව සඳහා වැඩබලන නියෝජ්‍ය සහකාර රාජ්‍ය ලේකම් සහ දකුණු සහ මධ්‍යම ආසියානු ප්‍රතිපත්ති පිළිබඳ ආරක්ෂක නියෝජ්‍ය ලේකම් හමුවිය.

x. 2018 ඔක්තෝබර් 12 වන දින පවත්වන ලද බටහිර ශාන්තිකර නාවික හමුදා සමුළුවේ දී නිරීක්ෂක තත්ත්වය සඳහා ශ්‍රී ලංකාව ඉදිරිපත් වී ඇත. තානාපති කාර්යාලය එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව මගින් එක්සත් ජනපද සභාය ඉල්ලා ඇත. ශ්‍රී ලංකාවට නිරීක්ෂක තත්ත්ව ප්‍රදානය කරනු ලැබූ අතර, එක්සත් ජනපදය සහ INDOPACIFIC පාර්ශවකරුවන් සමඟ එක්ව අපගේ ඉල්ලීම සඳහා ප්‍රබල ලෙස සහයෝගය ලබා දුන් බව රාජ්‍ය දෙපාර්තමේන්තුව සඳහන් කළේය.

xi. ආරක්ෂක / සමුද්‍රික සම්මන්ත්‍රණ සඳහා එක්සත් ජනපදයේ සිවිල් සහ හමුදා වෘත්තිකයින් සහභාගී කරවීම සඳහා තානාපති කාර්යාලය අඛණ්ඩව පහසුකම් සපයනු ලැබීය. නාවුක පශ්චාත් උපාධි අධ්‍යයනායතනය, වොෂිංටන්හි ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය සහ එක්සත් ජනපද INDOPACIFIC හි කථිකයින් / කණ්ඩායම් සාමාජිකයින් වර්ෂ 2018 දී ඉහත සමුළු සඳහා සහභාගි වූහ.

2. අධ්‍යාපනය සහ පර්යේෂණ

(i) ලංකාව කළාපයේ නූතන අධ්‍යාපනය සඳහා අවශ්‍යතාවය සනිටුහන් කරමින් අධ්‍යාපනය සඳහා කේන්ද්‍රස්ථානයක් ලෙස සහ දකුණු ආසියානු කළාපය ගෝලීය ආර්ථික ධාවකයකු යන සන්දර්භය තුළ, ශ්‍රී ලාංකික සිසුන්ගේ දැරිය හැකි උසස් අධ්‍යාපන අවස්ථා පිළිබඳව අධ්‍යයනය කිරීම, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සමඟ ඒකාබද්ධ අධ්‍යාපන වැඩසටහන් ස්ථාපනය කිරීම, කොළඹ පිහිටි කාර්යාල නියෝජනය කිරීම, අධ්‍යයන නුවමාරු සහ ශ්‍රී ලංකාව තුළ එක්සත් ජනපද විශ්වවිද්‍යාල පැවතීම සඳහා ව්‍යාප්ත කිරීමේ පවතින අවස්ථාවන් සොයා බැලීමට

එක්සත් ජනපද විශ්වවිද්‍යාල දිරිමත් කිරීම සඳහා ජාත්‍යාන්තර සහයෝගිතා දෙපාර්තමේන්තුවේ නියෝජිතයන් වෙත තානාපති කාර්යාලය ප්‍රවේශ වී තිබේ.

(ii) තානාපති කාර්යාලය බුද්ධි මණ්ඩල සහ පර්යේෂණ ආයතන නියෝජිතයින් සමඟ නිතිපතා සබඳතා පවත්වා ගනු ලැබ ඇත. එක්සත් ජනපදයේ ප්‍රතිපත්ති සැකසීමේ ක්‍රියාවලිය තුළ මෙම සංවිධානයන්හි භූමිකාවක් පවතී:

3. රාජ්‍ය තාන්ත්‍රික සහ සංස්කෘතික සබඳතා

(i) 2018 පෙබරවාරි මාසයේදී, ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ශ්‍රී ලංකාවේ 70 වන නිදහස් දින සංවත්සරය සනිටුහන් කරමින් එක්සත් ජනපද රාජ්‍ය නිලධාරීන්, රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන්, ශ්‍රී ලාංකික - ඇමරිකානු ප්‍රජාව, සිවිල් සමාජය සහ අනෙකුත් සබඳතාවයන් සඳහා එක්සත් ජනපද සාමසාධක ආයතනයේදී (USIP) ප්‍රිය සම්භාෂණයක් පවත්වනු ලැබීය.

(ii) රාජ්‍ය දෙපාර්තමේන්තුව ඇතුළුව එක්සත් ජනපද රාජ්‍ය ආයතනයන්හි ආසියානු - ඇමරිකානු සංගම් විසින් සංවිධානය කරන ලද උත්සවයන්හි සංස්කෘතික කටයුතු වලදී ශ්‍රී ලාංකීය නාට්‍ය සහ නර්තන වෘන්දයේ සහභාගිත්වය තානාපති කාර්යාලය විසින් සම්බන්ධීකරණය කරනු ලැබීය.

(iii) වෙසක් උත්සවය සමරමින් 2018 මැයි මස 10 වන දින තානාපති කාර්යාලයේ දී බෞද්ධ භික්ෂූන්වහන්සේලා වෙනුවෙන් වාර්ෂික දානමය පුණ්‍යකර්මයක් සංවිධානය කරන ලදී.

(iv) තානාපති කාර්යාලය විසින් 2018 ජූලි 19 වන දින වොෂිංටන් බෞද්ධ විහාරස්ථානයේදී වාර්ෂික ආහාර ප්‍රදර්ශනයක් සංවිධානය කරන ලදී.

(v) 2018 සැප්තැම්බර් 22 වන දින, ශ්‍රී ලාංකික - ඇමරිකන් ප්‍රජාවේ සාමාජිකයින්ගේ සහභාගිත්වයෙන් වොෂිංටනයේ ශ්‍රී ලංකා - ඇමරිකානු සංගම් එක්ව සංවිධානය කරන ලද, එක්සත් ජනපදයේ 6125 මොන්ට්‍රොස් පාර, රොක්විල්, MD 20820 හි ග්‍රේට්ර් වොෂිංටන්හි බෙන්ඩර් JCC හිදී පැවති ශ්‍රී ලංකා දිනය සඳහා තානාපති කාර්යාලය සහභාගි විය.

(vi) කීර්ති පැස්කුවෙල් සහ අනිල් භාරතී සමඟ එක්ව කලා ලංකා පදනම විසින් සංවිධානය කරන ලද, 7611 පිනේ ශාඛා පාර සිල්වර් ස්ප්‍රින්ග්, MD 20910 හි තකාමා පාක් පාසල් ශ්‍රවණාගාරයේදී හිදී 2018 ඔක්තෝබර් 20 වන දින පවත්වන ලද ප්‍රජා සත්කාරක වැඩසටහනකට තානාපති කාර්යාලය සහභාගි විය.

(vii) "The Jeweled Isle" නම් මාස හතක් දිගු විස්තීර්ණ සහ වෘත්තිමය ලෙස සංවිධානය කරන ලද මෙගා ශ්‍රී ලංකා චිත්‍ර ප්‍රදර්ශනයෙහි නිල එලිදැක්වීම 2018 දෙසැම්බර් මස 5 වන දින ලොස් ඇන්ජලීස් ප්‍රාන්ත කලා කෞතුකාගාරයේ

(LACMA) රෙස්නික් මණ්ඩපයේදී 300 කට අධික විශේෂ ආරාධිතයින්ගේ සහභාගිත්වයෙන් පැවැත්විණි. ඒ සඳහා එක්සත් ජනපද රාජ්‍ය ආයතන, බටහිර රාජ්‍යයන්, විදේශ රාජ්‍ය තාන්ත්‍රිකයන්, ව්‍යාපාරික ව්‍යවසායකයින් සහ ශ්‍රී ලාංකික ප්‍රජාව ඇතුළු අමුත්තන් ඇතුලත් විය. උත්සවය අවසන් වීමෙන් පසුව කොන්සියුලර් ජනරාල් විසින් කොන්සියුලර් ජනරාල් කාර්යාල පරිශ්‍රයේදී දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වූ අතර, එයට අමුත්තන් 150 කට අධික පිරිසක් සහභාගී විය.

II. බහුපාර්ශ්වික සබඳතා

1. ලෝක බැංකුව / ජාත්‍යන්තර මූල්‍ය අරමුදල

(i) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව සමග සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම.

(ii) එක්සත් ජනපදයේ ආර්ථික හා ආර්ථික ප්‍රතිපත්ති සංවර්ධනය සහ ශ්‍රී ලංකාව වෙත බලපෑම නියාමනය කිරීම.

(iii) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල / ලෝක බැංකු වසන්ත සම්මේලනය සහ වාර්ෂික රැස්වීම් සම්බන්ධීකරණය කිරීම සහ ශ්‍රී ලංකා දූත මණ්ඩල සහභාගීත්වය සඳහා පහසුකම් සැපයීම.

2. ඇමරිකානු රාජ්‍යයන්ගේ සංවිධානය (OAS)

OAS ආකෘතිය තුළ OAS සහ එහි සාමාජික රටවල්වල නිරීක්ෂකයෙකු ලෙස තානාපති කාර්යාලය සම්බන්ධ වේ. ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ නියෝජිතයා ස්ථාවර නිරීක්ෂකයෙකු වශයෙන් රැස්වීම් වලට සහභාගි වේ. තානාපති කාර්යාලය අදාළ OAS කරුණු පිළිබඳ අමාත්‍යාංශයට වාර්තා කරනු ලබයි.

3. ජාත්‍යන්තර විදුලි සංදේශ චන්ද්‍රිකා සංවිධානය (ITSO)

ඇමරිකා එක්සත් ජනපදයේ වොෂිංටන් ඩීසී හි දී 2018 ජුනි 13 සිට 15 දක්වා පැවැත්වූ ITSO පාර්ශ්වයන්ගේ 38 වන සම්මේලනයේ රැස්වීමට සහභාගි විය. අදාළ කරුණු පිළිබඳව තානාපති කාර්යාලය කොළඹට වාර්තා කරනු ඇත.

III. වෙළඳ ආයෝජන, ආර්ථික සහ සංචාරක සහයෝගිතාව

එක්සත් ජනපද දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද විශාල සහ ඉහළ මට්ටමේ ව්‍යාපාරික නියෝජිත පිරිසක් 2019 මැයි මාසයේදී ශ්‍රී ලංකාවට පැමිණීමට නියමිතය. දශක තුනකට පසු ශ්‍රී ලංකාවට පැමිණෙන විශාල සහ ඉහළ පෙළේ දූත කණ්ඩායම මෙයයි.

1. වෙළඳාම

(i) ප්‍රවර්ධන වැඩසටහන් -

- අගය එකතු කළ කුරුඳු ප්‍රවර්ධනය කිරීම සඳහා 2018 ජූලි 01 වන දින කර්මාන්ත සහ අධ්‍යයන ඒකාබද්ධ කිරීම සඳහා ව්‍යාපාරික කට්ටලයක් ආරම්භ කිරීම අරමුණු කර රැස්වීමක් සංවිධානය කරන ලදී.
- 2018 ජූලි මස 20 වන දින අන්තර්ජාතික සමාජ ශාලා සාමාජිකයන් සඳහා සංචාරක සහ තේ ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කරන ලදී.
- කොන්සල් ජනරාල්වරයා ප්‍රධාන කුරුඳු වෙළඳපොළකරුවන් සමඟ නිතිපතා සබඳතා පවත්වා ඇති අතර, ඉදිරි මාස කිහිපය තුළ වර්ධනය වෙමින් පවතින වර්ධන වේගයන් තහවුරු කර ගැනීම සඳහා ප්‍රවර්ධන පියවරයන් මේ වන විට සිදු කෙරෙමින් පවතී.
- ස්වාභාවික කුළුබඩු සහ ලංකා කුරුඳු; කොන්සියුලර් ජනරාල් විසින් සුදුසු විභව වෙළඳපොළවල් අතර ක්ෂේත්‍රය තවදුරටත් ප්‍රචලිත කිරීම අරමුණු කරගත් ප්‍රවර්ධන වැඩසටහන්වලට විශේෂ අවධානයක් යොමු කර ඇත.

(ii) වෙළඳපොළ සහභාගීත්වය

- 'ගිම්හාන විසිතුරු ආහාර ප්‍රදර්ශනය' 2018 2018 ජූනි 30 – ජූලි 02.
- World EXPO 2018 හි ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය - ශ්‍රී ලංකා කොන්සල් ජනරාල්වරයා විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමඟ සහයෝගීත්වයෙන් ලාස් වේගාස් සම්මේලන මධ්‍යස්ථානයේ දී ජූනි 12 – 14 දක්වා පැවති World Tea Expo - 2018 සංස්කරණයේ ශ්‍රී ලංකා මණ්ඩපය සංවිධානය කරනු ලැබීය. World Tea Expo – 2018 සංස්කරණයේ ශ්‍රී ලංකා මණ්ඩපයට සමාන්තරව, කොන්සල් ජනරාල් / තේ මණ්ඩල සාමාජිකයින් විසින් තේ ප්‍රවර්ධන මාධ්‍යකරුවන්ගේ ජාලගත කොක්ටේල් සම්භාෂණයක් පවත්වන ලද අතර, එහිදී, සිලෝන් ටී, කළාපීය කාණ්ඩ නිෂ්පාදනයන්ගේ විශේෂිතභාවය සහ ලැදියාව මෙන්ම ගෝලීය තේ කර්මාන්තය සඳහා වන අභිවෘද්ධිය පිළිබඳ සංක්ෂිප්ත කරනු ලැබීය.

(iii) ප්‍රවර්ධන රැස්වීම් / විමසීම්

- කාලපරිච්ඡේදය තුළ සමස්ථ රැස්වීම් විසිහතරක් පවත්වන ලදී.
- සංචාරක භාණ්ඩ, කුරුඳු සහ වටිනාකම් එකතු කරන ලද කුරුඳු නිෂ්පාදන, කොහු සහ ආශ්‍රිත නිෂ්පාදන, කාර්මික ටයර්, ආහාර නිෂ්පාදන, පොල් නිෂ්පාදන, සෙරමික් / පෝසිලේන් පිඟන් භාණ්ඩ, හස්ත කර්මාන්ත, පිරිසිදු කිරීමේ බුරුසු, සජීවී ශාක, කොකෝ පීට්, ගාර්සීනියා,

ඇඟලුම්, තේ, කුළු බඩු, විසිතුරු ආයිත්තම්, පොලිප්‍රොපිලීන් බෑග්, නිස්සාරක තෙල්, අත්වැසුම්, විදුලි බයිසිකල්, ටින් මාළු, අඹ හා අඹ කල්කය, පරිගණක මෘදුකාංග සහ සංචාරක ආකර්ෂණීය ස්ථාන පිළිබඳ අභ්‍යන්තර සහ බාහිර විමසීම් 49 කට ප්‍රතිචාර දක්වන ලදී .

(iv) ව්‍යාපාරික සංචාර සංවිධානය කිරීම / සම්බන්ධීකරණය කිරීම

- විවිධ ව්‍යාපාරික අරමුණු සඳහා පුද්ගලයින් 32 ක් සමඟ සම්බන්ධීකරණය කිරීම.

(v) ඇමරිකා එක්සත් ජනපදය සහ සමගාමීව අක්ත ගැන් වූ රටවල වෙළඳ ප්‍රදර්ශන / උත්සව

- ඇමරිකා එක්සත් ජනපදය සහ සමගාමීව අක්ත ගැන් වූ රටවල පහත වෙළඳ ප්‍රදර්ශන / උත්සව පවත්වන ලදී.

1) කොළඹ මංගල සතිය 2018
2) "ආයුර්වේද එක්ස්පෝ" 2018
3) ශ්‍රී ලංකා ආයෝජන සහ ව්‍යාපාර සාකච්ඡා සභාව 2018
4) FACETS ශ්‍රී ලංකා
5) ශ්‍රී ලංකා බෝට්ටු සංදර්ශනය
6) ශ්‍රී ලංකා කෘෂිකාර්මික ප්‍රදර්ශනය

(vi) වෙළඳපල සමීක්ෂණ / විශේෂ වාර්තා -

- පහත සඳහන් වාර්තා / වාණිජ තොරතුරු සකස් කර ශ්‍රී ලංකාවේ අදාළ බලධාරීන්වයන්ට ඉදිරිපත් කරන ලදී.

1. තේ වෙළඳපල වාර්තාව 2017
2. එක්සත් ජනපද GSP යෝජනා ක්‍රමය යටතේ ඇතැම් ඇඟලුම් නිෂ්පාදන සඳහා අදාළ තීරු බදු සහන
3. අගය එකතු කළ කුරුඳු ප්‍රවර්ධනය කිරීම සඳහා අලෙවිකරණ සහ සන්නාම උපාය මාර්ග සකස් කිරීම සඳහා වූ යෙදවුම්
4. එක්සත් ජනපද කර්මාන්ත ප්‍රතිපත්තිය පිළිබඳ තොරතුරු
5. කහ බඩ ඉරිඟු වෙළෙඳපොළ තත්ත්වයන් සහ අපනයන මිල
6. ආසියානු ශාන්තිකර කළාපයේ එතනෝල් සමුලුවේ සහභාගිත්වය පිළිබඳ වාර්තාව
7. ඉන්දු ශාන්තිකර ව්‍යාපාර සංසදය 2018 සහභාගිත්වය පිළිබඳ වාර්තාව

8. ඇමෙරිකානු එල්එන්ජී සමුලුව 2018 සහභාගිත්වය පිළිබඳ වාර්තාව
9. වාණිජ දෙපාර්තමේන්තුව වෙත කුළු බඩු පිළිබඳ එක්සත් ජනපද වෙළඳාම් විශ්ලේෂණය

(vii) මෙක්සිකෝව හා ට්‍රිනිඩෑඩ් සහ ටොබැගෝ සමඟ වොෂින්ටන් ඩීසී හි ඔවුන්ගේ දූත මෙහෙවර හරහා ඔවුන් සමඟ සබඳතා ශක්තිමත් කිරීම

- මෙක්සිකෝවේ උනන්දුව දක්වන පාර්ශවයන් අතර ශ්‍රී ලංකාවේ වෙළඳ සල්පිල් සහ උත්සව ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා මෙක්සිකෝ තානාපති කාර්යාලයේ වෙළඳ සහ NAFTA කාර්යාලයෙන් ආධාර ලබාගෙන ඇත. එම සහායට අමතරව, මෙක්සිකෝවේ ආනයනකරුවන් දෙදෙනෙකුට එරෙහිව ශ්‍රී ලංකා සමාගම් දෙකක් විසින් වෙළඳ පැමිණිලි විසඳීම සඳහා ආධාරය ඉල්ලා සිටියහ.
- ට්‍රිනිඩෑඩ් සහ ටොබැගෝහි උනන්දුවන පාර්ශවයන් අතර වෙළඳ සල්පිල් සහ ප්‍රචාරක කටයුතු ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා ට්‍රිනිඩෑඩ් සහ ටොබැගෝ තානාපති කාර්යාලයෙන් ආධාර ලබා ගන්නා ලදී.

2. ආයෝජන

(i) ප්‍රවර්ධන රැස්වීම්

ඉඩම් සංවර්ධන, විදුලිබල උත්පාදනය, බලශක්ති, විදුලි සංදේශ, පාන වර්ග, ප්‍රවාහන, කෘෂිකර්ම, යටිතල පහසුකම් සංවර්ධනය, නිෂ්පාදන සහ බලශක්තිය පිළිබඳ ආයෝජන සම්බන්ධයෙන් සමාගම් 17 ක් සමඟ රැස්වීම් හා සන්නිවේදනය පැවතුනි.

- ශ්‍රී ලංකාවේ මහානගර සහ බස්නාහිර පළාත් සංවර්ධන අමාත්‍යාංශයේ සහාය ඇතිව කොන්සල් ජනරාල්වරයා විසින් 2018 අප්‍රේල් මාසයේදී කැලිෆෝනියාවේ හා නෙවාඩාහි දින 04 සෘජු ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කරන ලදී.
- නියෝජ්‍ය නගරාධිපති හා නගර කාර්යාලයේ අන්තර්ජාතික වෙළඳ සහ ආයෝජන අධ්‍යක්ෂ සහ ලොස් ඇන්ජලීස් හි ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් සමඟ පවත්වන ලද වට මේස සාකච්ඡාව) නියෝජිත ආයතනවලින් FDI වෙත විශේෂ අවධානය යොමු කර ඇති එක්සත් ජනපද ආයෝජකයින් ආකර්ශනය කර ගැනීමට ඔවුන්ගේ සහයෝගය ලබා ගන්නා ලදී.

3. සංචාරක

(i) සංචාරක ප්‍රර්ශනය සඳහා සහභාගි වීම

- නිව්යෝර්ක් ටයිම්ස් සංචාරක සංදර්ශනය, 2018 ජනවාරි 26) 28

(ii) විශේෂ ප්‍රවර්ධන වැඩසටහන් -

- 2018 නොවැම්බර් 12 වන දින වොෂිංටන් ඩීසී හි ඇමරිකානු විශ්වවිද්‍යාලයේ සංචාරක ප්‍රවර්ධන වැඩසටහන.

(iii) ප්‍රවර්ධන රැස්වීම් -

- ඩීසී ජාත්‍යන්තර සමාජය
- සේද මාවත, මේරිලන්ඩ්
- තානාපති කාර්යාල අත්දැකීම්
- වොෂිංටන් ඩී.සී. හි හාවඩ් සමාජය

4. ආර්ථික සහයෝගිතාව

(i) වෙළඳ පහසුකම් සැලසීමේ අරමුණ ඇතිව වෙළඳ ප්‍රතිපත්ති කටයුතු මෙහෙයවීම -

- ඇමරිකා එක්සත් ජනපදය වෙත සූර්ය කෝෂ ආනයනය කිරීමට එරෙහිව ආරක්ෂණ ක්‍රියාමාර්ග පිළිබඳව එක්සත් ජනපදයේ අන්තර්ජාතික වෙළඳ කොමිසම සහ එක්සත් ජනපද වෙළඳ වාණිජ දෙපාර්තමේන්තුවේ ජාත්‍යන්තර වෙළඳ පරිපාලනය සඳහා නියෝජනයක් සිදු කරන ලදී. ශ්‍රී ලංකාව ක්‍රියාකාරීත්වයෙන් ඉවත් වූ අතර ආරක්ෂක බද්ද ගෙවීමෙන් තොරව ආනයනකරුට ආනයනය කළ හැකි විය.
- ශ්‍රී ලංකාවෙන් රබර් පටි ආනයනය කිරීම පිළිබඳ එක්සත් ජනපදයේ අන්තර්ජාතික වෙළඳ කොමිසම සහ එක්සත් ජනපද වෙළඳ වාණිජ දෙපාර්තමේන්තුවේ ජාත්‍යන්තර වෙළඳ පරිපාලනය සඳහා අබණ්ඩ නියෝජනයන් සිදු කරන ලදී. ශ්‍රී ලංකාවේ වාණිජ දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් උපදේශයන් අනුව තානාපති කාර්යාලය විසින් සිදු කළ ඉදිරිපත් කිරීම්හි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාව මෙම පරීක්ෂණයෙන් ඉවත් විය.
- ශ්‍රී ලංකාවේ සිට ඇමරිකා ඒක්සත් ජනපදය වෙත නිශ්චිත වර්ගවලට පිටින් ආනයනය කිරීම සඳහා ප්‍රතිව්‍යුහගත බදු පැනවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය විසින් එක්සත් ජනපද රජය වෙත ගොනු කරන ලද ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ නඩුව සම්බන්ධයෙන් කොළඹ වාණිජ දෙපාර්තමේන්තුව සමග අබණ්ඩ සම්බන්ධීකරණය හා පසු විපරම් සිදු කරන ලදී. මෙම නඩුව සම්බන්ධයෙන් කොළඹ වාණිජ

දෙපාර්තමේන්තුවෙන් ලැබුණු අවශ්‍ය උපදෙස් තානාපති කාර්යාලය ලබා දුනි. මෙම නඩුව ශ්‍රී ලංකාව ජයග්‍රහණය කළ අතර එක්සත් ජනපද රජය මෙම තීරණයට එරෙහිව අභියාචනය කළේය. කොළඹ පිහිටි වාණිජ දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව දූත මණ්ඩලය තවදුරටත් ඉදිරි කටයුතු සිදු කරන ආකාරය පිළිබඳ නීතිඥ ආයතනයට උපදෙස් ලබා දුනි.

- USGSP ක්‍රමවේදය අලුත් කිරීම, සූර්ය පැනල සඳහා ආරක්ෂණ බදු පැනවීම, ශ්‍රී ලංකාවෙන් රබර් පටි ආනයනය කිරීම පිළිබඳ විමර්ශනය සහ ඊළඟ TIFA රැස්වීමේ න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් USTR කාර්යාලය සමඟ අබණ්ඩව සාකච්ඡා පැවැත්වීම.
- තානාපති කාර්යාලය ආරම්භ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, ජාතික සෞඛ්‍යය ආයතනයේ ඉහළ පෙළේ දූත පිරිසක් අප්‍රේල් මස 18 සිට 24 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නියුතු වූ අතර, එහි අරමුණ වූයේ ලංකාවට අලුතින් සොයාගත් ඩෙංගු එන්නත හඳුන්වා දීමයි.
- ශ්‍රී ලංකාවට එතනෝල් මිශ්‍රණය හඳුන්වාදීම සඳහා ප්‍රතිපත්ති සහ නාක්ෂණය පිළිබඳ සහාය ඉල්ලා සිටීම සඳහා එක්සත් ජනපදයේ ධාන්‍ය කවුන්සිලය සහ එක්සත් ජනපද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කර ඇත. ප්‍රතිඵලයක් වශයෙන්, 2018 ඔක්තෝබර් 12 වන දින ශ්‍රී ලංකාවේ බනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය සහ ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව සමඟ මූලික සාකච්ඡා පැවැත්වීම සඳහා නියෝජිතයෙකු ශ්‍රී ලංකාවේ සංචාරය කරන ලදී.
- LNG මිත්‍ර පාර්ශවයන් සහ එක්සත් ජනපදයේ බලශක්ති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වූ අතර LNG නාක්ෂණය ලබා ගැනීම සඳහා සහ ශ්‍රී ලංකාවේ බහඩ අංශයේ ආයෝජනය සඳහා එක්සත ජනපද ආයෝජකයින් සමඟ මූලික සාකච්ඡා ආරම්භ කරන ලදී.
- ඇමෙරිකා එක්සත් ජනපදයේ විදේශීය ආයෝජන ආයෝජකයන් (OPIC) සමඟ අබණ්ඩව සාකච්ඡා පැවැත්වූ අතර, ශ්‍රී ලංකාව වෙත එක්සත් ජනපද ආයෝජන දිරිගැන්වීම සහ සහතික කිරීම සඳහා ඔවුන්ගේ සහයෝගය සහ සම්බන්ධීකරණය ඉල්ලා සිටියහ. 2018 ඔක්තෝබර් 26 සිට 30 දක්වා කාලය තුළ OPIC නියෝජිතයන් දෙදෙනෙක් සහ 2018 ඔක්තෝබර් 02 සිට ඔක්තෝබර් 04 දක්වා කාලය තුළ තවත් නියෝජිතයන් දෙදෙනෙක් ශ්‍රී ලංකාවේ සංචාරය කරන ලදී.
- මූල්‍ය වත්කම් කාර්යසාධක බලකායේ අළුත් ලැයිස්තුවේ ශ්‍රී ලංකාව ලැයිස්තුගත කර ඇත. මූල්‍ය ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගය එක්සත් ජනපද භාණ්ඩාගාර

දෙපාර්තමේන්තුවට දැනුම් දී, ශ්‍රී ලංකාව අළු පැහැති ලැයිස්තුවෙන් ඉවත් කිරීමට එක්සත් ජනපදයේ සහාය ඉල්ලා සිටින ලදී.

(ii) අභ්‍යන්තර / බාහිර නියෝජිතයින් සමඟ සංවිධානය / සම්බන්ධීකරණය කිරීම -

- අලුතින් නිපදවන ලද ඩෙංගු එන්නත හඳුන්වාදීම සඳහා 2018 අප්‍රේල් මස 18 - 24 දින දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නියුතු වූ ජාතික සෞඛ්‍ය ආයතනයෙහි නියෝජිත කණ්ඩායමට අවශ්‍ය සංවිධාන කටයුතු සහ සම්බන්ධීකරණය සිදු කරන ලදී.
- ආහාර නිෂ්පාදන සමාගම් අහඹු නිරීක්ෂණ චාරිකාවක් සඳහා 2018 මැයි මස 24 - 30 දක්වා ශ්‍රී ලංකාව වෙත පැමිණි එක්සත් ජනපද ආහාර හා ඖෂධ අධිකාරියේ නිලධාරීන්ගේ නිල සංචාරය සම්බන්ධීකරණය කිරීම.
- අගය එකතු කළ කුරුඳු ප්‍රවර්ධනය සඳහා කර්මාන්ත සහ අධ්‍යයන ඒකාබද්ධ කිරීම සඳහා ව්‍යාපාරික කට්ටලයක් ආරම්භ කිරීම උදෙසා, 2018 ජූලි මස 01 වන දින වොෂින්ටන් බලා සංචාරය කළ ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දූත පිරිසගේ නිල සංචාරය සම්බන්ධීකරණය කිරීම.
- 2018 සැප්තැම්බර් 26 - 30 දක්වා ශ්‍රී ලංකාව සඳහා විදේශීය පෞද්ගලික ආයෝජන සංස්ථාවේ නිලධාරීන් දෙදෙනෙකුගේ සංචාරය සම්බන්ධීකරණය කිරීම.
- 2018 ඔක්තෝබර් 04 - 05 දක්වා ශ්‍රී ලංකාව සඳහා විදේශීය පෞද්ගලික ආයෝජන සංස්ථාවේ නිලධාරීන් දෙදෙනෙකුගේ සංචාරය සම්බන්ධීකරණය කිරීම.
- 2018 ඔක්තෝබර් 11 - 12 දිනයන්හි එක්සත් ජනපදයේ ධාන්‍ය සම්මේලනයේ නියෝජිතයෙකුගේ සංචාරය සම්බන්ධීකරණය කිරීම.

1.2. කැනඩාව

1. ද්විපාර්ශ්වික සබඳතා

1.2018 පෙබරවාරි 24 සිට 27 දක්වා මහ කොමසාරිස්වරයා විසින් සිදු කළ ශ්‍රී ලංකා සංචාරය, කැනේඩියානු ගෝලීය කටයුතු පිළිබඳ සහකාර නියෝජ්‍ය අමාත්‍ය ගරු ආචාර්ය ඩොනල්ඩ් බෝඛියාස් මහතා විසින් දිරිගන්වමින් සම්බන්ධීකරණය කරනු ලැබීය. මේ සංචාරය අතරතුර දී, ඔහු විසින් විදේශ කටයුතු අමාත්‍යවරයා සහ ලේකම් / විදේශ කටයුතු සහ තවත් අමාත්‍යවරුන් සහ ශ්‍රී ලංකාවේ උසස් නිලධාරීන් සමඟ සාකච්ඡා කරන ලදී.

2. පහත සඳහන් සම්භාවනීය අමුත්තන්ගේ කැනඩා සංචාරය සඳහා මහ කොමසාරිස්වරයා සහභාගී වූයේය.

අ) ගරු. මයන්ත දිසානායක, පාර්ලිමේන්තු මන්ත්‍රී - 2018 අප්‍රේල් මාසයේදී.

ආ) ආචාර්ය සුසන්ත සේනාරත්න, ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ අධ්‍යක්ෂ - 2018 ජූලි මාසයේදී.

ඇ) අගෝස්තු 26 සිට 2018 සැප්තැම්බර් මස 08 වැනිදා දක්වා හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය. (පෞද්ගලික සංචාරයකි)

3. ශ්‍රී ලංකාව හා කැනඩාව අතර ද්විපාර්ශවික උපදේශන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය අවබෝධතා ගිවිසුමකට නියමිත කාලයේ දී අවතීර්ණ වීමට නියමිත ය.
4. කැනඩාවේ රාජ්‍ය ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් මෙහෙයුමක් සම්බන්ධීකරණය කොට ඇති අතර, ශ්‍රී ලංකාවේ ආරක්ෂක අමාත්‍යංශය සාම සාධක සංචාරයක් සංවිධානය කිරීම සඳහා 2018 ඔක්තෝම්බර් / නොවැම්බර් මස ශ්‍රී ලංකාවෙන් කණ්ඩායමක් කැනඩාව වෙත සංචාරය කිරීමට කටයුතු සූදානම් කර ඇත.
5. බණ්ඩාරනායක අන්තර්ජාතික රාජ්‍ය තාන්ත්‍රික පුහුණු මධ්‍යස්ථානය (BIDTI) සහ කැනේඩියානු විදේශ සේවා මධ්‍යස්ථානය (CFSI) අතර අවබෝධතා ගිවිසුම අවසන් කිරීම මෙම මෙහෙවර ක්‍රියාවලිය තුළ දී සිදු කෙරේ.
6. ශ්‍රී ලංකාවේ නීතිය බලාත්මක කිරීමේ බලධාරීන් සඳහා පුහුනු අවස්ථා සම්බන්ධයෙන් ටොරොන්ටෝ පොලිස් විද්‍යාලයේ අධිකාරී ස්ටීවන් මොලිනෝක්ස් මහතා සහ කොන්සල් ජනරාල්වරයා අතර හමුවීමක් පැවතිණි.

2. බහුපාර්ශවික සබඳතා

1. 2017-2020 කාල පරිච්ඡේදය සඳහා රාජ්‍ය පාර්ශ්විකත්ව නියාමන කමිටුවක් ආරම්භ කිරීමට ශ්‍රී ලංකා අපේක්ෂකත්වය වෙනුවෙන් කැනඩාවේ සහය ලබාගැනීමට මහ කොමසාරිස්වරයා උත්සාහ කළේ ය.
2. 2018 ඔක්තෝබර් මස 12 වැනි දින කොරියානු ජනරජයේ දී පැවැත්වීමට නියමිත බටහිර පැසිෆික් නාවික සම්මන්ත්‍රණයේ දී ශ්‍රී ලංකාවේ නිරීක්ෂක තත්ත්වය සඳහා කැනඩාවේ සහය ලබාගැනීමට මහ කොමසාරිස්වරයා උත්සාහ කළේ ය.
3. ජාත්‍යන්තර සංවිධානවල ශ්‍රී ලංකාවේ අපේක්ෂකත්වය ලබාගැනීම සඳහා සහය ලබාගැනීමට DFATD සහ ඔටාවාහි අනෙකුත් දූත මෙහෙයුම් සමඟ මහ කොමසාරිස්වරයා සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලබයි.

3. ආර්ථික සබඳතා හා විදේශ ආයෝජන

2018 වර්ෂයේ දී, ශ්‍රී ලංකාවෙන් කැනඩාව වෙත ඩොලර් මිලියන 220.96 ක අපනයන සිදුකිරීමට සඳහා වන ඉලක්කය සපුරාගැනීම සඳහා මහ කොමසාරිස්වරයා සහ

කොන්සියුලර් ජනරාල්වරයා ප්‍රවර්ධන ක්‍රියාමාර්ග තවදුරටත් ක්‍රියාත්මක කරන ලද අතර ශ්‍රී ලංකාවේ වෙළඳාම සහ ආයෝජන විභව්‍යතා හඹායෑම සඳහා කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සහ පෞද්ගලික ව්‍යවසායකයන් ශ්‍රී ලංකා ඩයස්පෝරාවේ ව්‍යාපාරික ප්‍රජාව හා සම්බන්ධ වීමෙන් ලද ප්‍රතිඵල අනුව සහ කැනේඩියානු ව්‍යාපාරික අංශයෙන් ලද පිළිතුරු අනුව ධනාත්මක සංවර්ධනයක් ඇති වී තිබුණි.

1. වෙළඳාම

I. 2017 වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂ ව 2018 වර්ෂයේ ජනවාරි සහ ජූලි කාලය තුළ දී ශ්‍රී ලංකාව ඩොලර් මිලියන 165.88 ක මුදලකට ලඟා වූ අතර අපනයන සඳහා 2.8%ක නිර්යාත ධනාත්මක පෙන්නුම් කළේ ය.

II. ශ්‍රී ලංකාවෙන් කැනඩාවට සිදු කළ ආනයන ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කළේ ය. (2017 ජනවාරි සිට ජූලි මාසයන්හි ඩොලර් මිලියන 84 ක ආනයනවලට සාපේක්ෂ ව 2018 ජනවාරි සිට ජූලි සඳහා ඩොලර් මිලියන 113.49 ක ආනයන සිදු විය.)

III. ටොරොන්ටෝ කොන්ග්‍රස් මධ්‍යස්ථානයේ දී 2018 ඔක්තෝම්බර් මස 23-24 යන දිනවල පැවැත්වීමට සැලසුම් කර ඇති "Grocery innovations Canada" නැමැති ප්‍රධාන ප්‍රදර්ශනයට සමගාමී ව මහකොමසාරිස්වරයා සහ කොන්සල් ජනරාල්වරයා විසින් ශ්‍රී ලංකා වානිජ මණ්ඩලයෙන් කැනඩාව වෙත සංචාරයක් යෝජනා කර සිටියේ ය.

IV. කැනඩාවේ ටී. ගිල්ඩ් විසින් සංවිධානය කරන ලද ටොරොන්ටෝ අනුග්‍රාහක පුස්තකාලයේදී පෙබරවාරි 3 - 4 දිනයන්හි පවත්වන ලද 6 වන වාර්ෂික තේ සම්මාන උළෙල කොන්සල් ජනරාල්ගේ සහභාගිත්වයෙන් සිදු කරන ලදී. තේ වෙළෙන්දන් සහ අනෙකුත් අය අතර පුළුල් අවබෝධයක් ඇති කිරීමට මෙය මහඟු අවස්ථාවක් විය.

V. 2018 මැයි මාසයේ මොන්ට්‍රියල් හි පැවති SIAL කැනඩා අන්තර්ජාතික ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාවෙන් සහභාගි වූ නියෝජනය සඳහා පහසුකම් සපයන ලදී. එය ආහාර සහ පාන වර්ග අංශයේ නිෂ්පාදන සඳහා අමතර වටිනාකමක් සහිත ප්‍රවර්ධනය කිරීමටද දායක විය. ශ්‍රී ලංකා දූත පිරිස වෙළඳපොල දිශානුගත කිරීමේ දෙදින වැඩසටහනකට, වෙළඳපොල දැනුවත් කිරීමේ චාරිකාව සහ කැනේඩියානු වෙළඳපොළ පිළිබඳ තොරතුරු සැසියකටද සහභාගී විය. ප්‍රදර්ශනයේ දී පැවති (B2B) රැස්වීම් ප්‍රදර්ශකයින්ට ප්‍රයෝජනවත් වෙළඳ සම්බන්ධතා ඇති කර ගැනීමට අවස්ථාවක් ලබා දුනි.

VI. ආහාර පාලන රෙගුලාසි මත ලියාපදිංචි වන අපනයනකරුවන් සඳහා කැනේඩියානු වෙළඳපලට ඇතුළත් වීම සඳහා 2018 දී දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා උපදේශකවරුන් හඳුනා ගැනීමට කොන්සල් ජනරාල් සහාය ලබා දෙන ලදී. මෙම වැඩසටහන සාර්ථක වී ඇති බව අපනයන සංවර්ධන

මණ්ඩලය දැනුම් දී ඇති අතර තෝරාගත් අපනයනකරුවන් 2019 දී කැනඩාවේ සංචාරය කිරීමට නියමිත බව සඳහන් කර ඇත.

2. විදේශ සෘජු ආයෝජන

i. කැනේඩියානු ඩොලර් මිලියන 20 ක වියදමින් යාපනයේ හෝටල් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කළ ආයෝජකයෙක්, ආයෝජන මණ්ඩලයේ සභාපති, මහකොමසාරිස්වරයා හා කොන්සල් ජනරාල්වරයා අතර පහත සඳහන් සාකච්ඡා හමුවීම් පවත්වන ලදී.

ii. කොළඹ කොටස් වෙළෙඳපොළ හා මහකොමසාරිස් කාර්යාලය එක්ව, ශ්‍රී ලාංකික සම්භවයක් ඇති පදිංචිකරුවන් විසින් ශ්‍රී ලංකා කොටස් වෙළඳපොල තුළ ආයෝජනය කිරීම ප්‍රවර්ධන කිරීමේ අරමුණින් "Invest in Sri Lanka" නමින් කැනඩාවේ ආයෝජන සමුළුවක් සංවිධානය කිරීම සඳහා කොන්සල් ජනරාල්වරයා විසින් තොරතුරු ලබා දෙන ලදී. කොළඹ කොටස් වෙළෙඳපොළ තවමත් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් සිටින බැවින් කැනඩාව තුළ මෙම අයෝජන සමුළුව පැවැත්වීම සඳහා තෝරාගෙන නොමැත. කොන්සල් ජනරාල්වරයා හා මහ කොමසාරිස්වරයා විසින් කොළඹ කොටස් වෙළඳපොළ හා ටොරොන්ටෝහි කොටස් වෙළඳපොළ අතර සහයෝගය සඳහා කටයුතු කරන ලදී.

iii. මහ කොමසාරිස්වරයා හා කොන්සල් ජනරාල්වරයා විසින් විවිධ ආයෝජකයන්, ව්‍යාපාරිකයන්, නියෝජිතයන්, සංවිධායකයන්, වාණිජ මණ්ඩලවල නිළධාරීන්, කැනඩා වෙළඳ පහසුකරණ කාර්යාලයේ නිළධාරීන් හා වෙළඳ නාගරික සභාවල නිළධාරීන් සමඟ විශේෂ සාකච්ඡා හමුවීම් පවත්වන ලදී.

iv. අදාළ අවස්ථාවන් වළදී මෙම ආයෝජකයන්ගේ ව්‍යාපෘති යෝජනා ආයෝජන මණ්ඩලය වෙත යවන ලදී. මෙහිදී හඳුනාගත් යෝජනා පරිසර හිතකාමී අපද්‍රව්‍ය කළමනාකරණය හා අපද්‍රව්‍ය වලින් බලශක්තිය නිෂ්පාදනය, සූර්ය බලශක්තිය, නේවාසික හා වාණිජ දේපළ සංවර්ධනය යන ක්ෂේත්‍රවලට අදාළ වේ.

v. කොන්සල් ජනරාල්වරයා විසින් ඩයස්පෝරා ව්‍යාපාරික ප්‍රජාව සමඟ සමීපව සම්බන්ධ වෙමින් ආයෝජන දිරිගැන්වීම හා 2018 ජූලි 26 වන දින අයෝජකයින් කණ්ඩායමක්සමඟ හමුවක් පැවැත් වීම.

vi. කොළඹ කොටස් වෙළෙඳපොළ හා එක්ව, ශ්‍රී ලාංකික සම්භවයක් ඇති පදිංචිකරුවන් විසින් ශ්‍රී ලංකා කොටස් වෙළඳපොල තුළ ආයෝජනය කිරීම ප්‍රවර්ධන කිරීමේ අරමුණින් "Invest in Sri Lanka" නමින් කැනඩාවේ ආයෝජන සමුළුවක් සංවිධානය කිරීම සඳහා කොන්සල් ජනරාල්වරයා විසින් තොරතුරු ලබා දෙන ලදී. කොන්සල් ජනරාල්වරයා හා මහ කොමසාරිස්වරයා විසින් කොළඹ

කොටස් වෙළඳපොළ හා ටොරොන්ටෝහි කොටස් වෙළඳපොළ අතර සහයෝගය සඳහා කටයුතු කරන ලදී.

vii. Ni-Met Metals Inc සමාගමේ සභාපති අනිල් ශා මහතා විසින් නායකත්වය දරන ලද දූත මණ්ඩලයේ සංචාරය සඳහා කොන්සල් ජනරාල්වරයා විසින් 2018 වසරේ අගෝස්තු 30 සිට සැප්තැම්බර් 03 තෙක් පහසුකම් සැලසීම සිදු කරන ලදී. CAD හි මිලියන 35 ක අයෝජනය සහිත සුන්බුන් ලෝහ ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියක් ස්ථාපනය කිරීමේ කටයුතු Ni -Met Metals Inc විසින් කෙරෙමින් පවතී.

viii. මෙගා වොට් 100 ක සූර්ය බල ශක්ති ව්‍යාපෘතියක අයෝජන යෝජනාව පිළිබඳව Global PC Trade Finance සමාගමේ නිළධාරීන් සමග කොන්සියුලර් ජනරාල් සාකච්ඡා කිරීම.

2. සංචාරක ක්ෂේත්‍රය

i. 2018 වසර තුළදී ශ්‍රී ලංකාවට පැමිණෙනැයි අපේක්ෂිත කැනේඩියානු සංචාරකයින් සංඛ්‍යාව 50,235 ක් වූ අතර ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ දත්ත අනුව 2018 අගෝස්තු මස දක්වා පැමිණා ඇත්තේ සංචාරකයන් 39,196ක් පමණි.

ii. ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට කැමැත්තක් දක්වන අයට, කැනේඩියානු සංචාරකයන්ට හා සංචාරක යාත්‍රා නියෝජිතයන්ට අවැසි තොරතුරු, මාර්ගෝපදේශනය හා සහයෝගය ලබා දීම. ශ්‍රී ලංකාව සිය ගමනාන්ත ප්‍රවර්ධන වැඩසටහන් මගින් ප්‍රවර්ධනය කිරීමටත් ඔවුන්ගේ සංචාරක පැකේජයන් තුළ ශ්‍රී ලකාව අන්තර්ගත කිරීමටත් ප්‍රධාන පෙළේ සංචාරක යාත්‍රා මෙහෙයවන්නන් හා ගුවන් ගමන් සේවාවන් කෙරෙන් ඉල්ලා සිටීම.

iii. 2018 අගෝස්තු 16 සිට 18 දක්වා Saskatoon හි Folkfest වැඩසටහන සඳහා සංචාරක පත්‍රිකා, ශ්‍රී ලංකා හා ශ්‍රී ලංකා ප්‍රදර්ශන මණ්ඩපය සැරසීම සඳහා මුද්‍රණය කළ හැකි ඡායාරූප ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය හා එක්ව මහ කොමසාරිස් කාර්යාලය විසින් ලබා දීම

IV. සංස්කෘතික සබඳතා

i. මහ කොමසාරිවරයා හා කොන්සියුලර් ජනරාල් විසින් පහත සඳහන් වැඩසටහන් සංවිධානය/ සහය වීම/සම්බන්ධීකරණය/ සහභාගිවීම සිදු කරන ලදී.

අ. ජනවාරි මස ඔටාවා බෞද්ධ විහාරයේදී හා හිල්ඩා ජයවර්ධන බෞද්ධ ආරාමය සහ භාවනා මධ්‍යස්ථානයේ අලුත් අවුරුද්ද සඳහා සෙත් පතා වැඩසටහන් පැවත්වීම.

ආ. 2018 පෙබරවාරි 04 වන දින, කැනඩාහි ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයාගේ නිල නිවාසයේදී 70 වන නිදහස් සැමරුම පැවැත්වීම.

අ. ඔටාවා හි ශ්‍රී ලංකා ප්‍රජාව විසින් සංවිධානය කරනු ලදුව 2018 මාර්තු මස කාල්ටන් සරසවියේදී සංගීත සන්ධ්‍යාවක් පැවැත්වීම

ඈ. 2018 අප්‍රියෙල් මස හිල්ඩා ජයවර්ධන හා ඔටාවා බෞද්ධ විහාරයේ සිංහල හා හින්දු අලුත් අවුරුද්ද සැමරීම

ඉ ටොරොන්ටෝහි ශ්‍රී ලංකා-කැනඩා සගමය විසින් 2018 අප්‍රියෙල් 21 දින 50 වෙනි වතාවටත් වාර්ෂික සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය සැමරීම

ඊ. ‘‘ඔටාවාහි වෙසක් හා ආසියානු උරුමය’’ විසින් සංවිධානය කරනු ලැබූ වෙසක් දින සැමරුම් 2018 මැයි 19 දින නගර ශාලාවේ දී පැවැත්වීම.

උ. 2018 සැප්තැම්බර් 06 දින ඔටාවා මහජන පුස්තකාලයේ ශ්‍රවණාගාරයේදී ‘‘ශ්‍රී සිද්ධාර්ථ ගෞතම’’ නම් සම්මාන දිනූ ශ්‍රී ලංකා සිනමාපටය ඔටාවා මහජන පුස්තකාලයේ හා ආසියාවේ ආලෝකය පදනමේ සහයෝගයෙන් මහ කොමසාරිස් කාර්යාලය විසින් ප්‍රදර්ශනය කරන ලදී.

ඌ. 2018 ජනවාරි මස Cambridge, Guelph, Kitchener සහ Waterloo ශ්‍රී ලංකා සංගමය විසින් වාර්ෂික Gala උත්සවය පැවැත්වීම

එ. 2018 ජනවාරි මස වරසිද්ධි විනායගර් හින්දු කෝවිලහි තෙපොන්ගල් සැමරීම

ඒ. සිංහල සංගමය හා කැනඩා-ශ්‍රී ලංකා සංගමය විසින් 2018 අප්‍රියෙල් මස සිංහල හා හින්දු අලුත් අවුරුදු සැමරුම් පැවැත්වීම

ඓ. 2018 අප්‍රියෙල් මස කැනඩා ශ්‍රී ලංකා මැලේ ලලිත කලා හා සංස්කෘතික මධ්‍යස්ථානය විසින් මැලේ ආහාර සහ සංස්කෘතික උත්සවයක් පැවැත්වීම

ඔ. 2018 අප්‍රියෙල් මස SLUNA විසින් ශ්‍රී ලංකාවේ 70 වෙනි නිදහස් උත්සවය සමරමින් වැඩසටහනක් සංවිධානය කිරීම

ඕ. අප්‍රියෙල් 20 වැනි දින Women In Management Canada Chapter හි සමාරම්භක උළෙල සංකේතවත් කරමින් රාත්‍රී සාදයක් පැවත්වීම

ඖ. වික්ටර් රත්නායක, සුනිල් එදිරිසිංහ, ටී. එම් ජයරත්න හා රෝහණ වීරසිංහ යන ශිල්පීන් විසින් 2018 මැයි මස සංගීත වැඩසටහනක් පැවැත්වීම.

II. කම්කරු සුභසාධනය

I. රැකියා අවස්ථා ලබා දීමේ තොරතුරුවල සත්‍යතාව සොයා බලමින් මහ කොමසාරිස්වරයා හා කොන්සියුලර් ජනරාල්වරයා විසින් කැනඩාවේ රැකියා අවස්ථා වලට අවතීර්ණ වීමට අපේක්ෂා කරන ශ්‍රී ලාංකිකයන්ට සහය විය.

II. මහ කොමසාරිස්වරයා විසින් මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදේශ නියුක්ති කාර්යාංශයටද සහය විය

III. කැනේඩියානු සමාගම් විසින් සේවයට බඳවා ගෙන ඇති ශ්‍රී ලාංකිකයන්යන්ගේ සුභ සාධන කටයුතු සඳහා කොමසාරිස් ජනරාල්වරයා සහයෝගය ලබා දුන් අතර අනාගත සේවා යෝජකයන්ට හා රැකියා අවස්ථා සඳහා පහසුකම් සලසන්නන්ට දැනුවත්භාවය ලබා දීමට කටයුතු කරන ලදී.

රට	ඇමරිකා එක්සත් ජනපදය		කැනඩාව	
දූත මෙහෙවර	ශ්‍රී ලංකා තානාපති කාර්යාලය /වොෂිංටන්	ලොස් ඇන්ජලීස් හි කොන්සල් ජනරාල්වරයා	ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය- ඔටාවා	ටොරොන්ටෝ හි කොන්සල් ජනරාල්
කාල සීමාව (දූත මෙහෙවර වෙතින් ලද තොරතුරු)	01.01.2018 සිට 31.12.2018 දක්වා		01.01.2018 සිට	31.12.2018 දක්වා
නිකුත් කරන ලද වීසා සංඛ්‍යාව	1160	400	599	2245
නිකුත් කරන ලද විදේශ ගමන් බලපත්‍ර සංඛ්‍යාව	596	319	432	956
යන්ත්‍රය මගින් කියවිය හැකි විදේශ ගමන් බලපත්‍ර	69	59	47	107
නිකුත් කරන ලද අනන්‍යතා සහතික (TTD)	13	04	04	23
විදේශ ගමන් බලපත්‍ර පිටසන් කිරීම	26	05	05	24
විදේශ ගමන් බලපත්‍ර අලුත් කිරීම	-	-	03	-
පෙරළා යැවීම (මෘත දේහ)	14	-	02	05
උපත් ලියාපදිංචිය	213	81	64	89
මරණ ලියාපදිංචිය	08	01	-	04

ලේඛන සත්‍යාපනය කිරීම	511	84	186	1211
පොලිස් නිෂ්කාශන සහතික	10	-	06	66
ද්විත්ව පුරවැසි අයදුම්පත	302	238		331
දරුවන් කුලවද්දා ගැනීම්				01
දිවුරුම් ප්‍රකාශ/ ඇටෝර්නි බලපත්‍ර				89
විශ්‍රාම යාම්				450
පරිවර්තන	10			

ආදායම් එකතුව 2018 ජනවාරි1 දින සිට 2018 දෙසැම්බර්31 දින දක්වා - ඔටාවා

විෂය	කැනේඩියානු ඩොලර්	ශ්‍රී ලංකා රුපියල්
ආගමන පනත (2003*02*07)	191,294.00	24,107,274.25
කොන්සල් පනත (2003*02*99)	29,195.00	3,690,248.09
වෙනත් (2003*99*00)	9,854.62	1,233,327.94
එකතුව	230,343.62	29,030,850.28


ආදායම් එකතුව 2018 ජනවාරි1 දින සිට 2018 සැප්තැම්බර් 30 දින දක්වා - ටොරොන්ටෝ

විෂය	ලංකා රුපියල්	කැනේඩියානු ඩොලර්
ආගමන පනත	76,673,105.69	616,950.00
කොන්සල් පනත	6,716,521.05	53,993.00
පොලිස් නිශ්කාෂන	220,132.07	1,764.00
එකතුව	83,609,758.81	672,707.00

ආදායම් එකතු කිරීමේ විස්තර 2018 ජනවාරි 01 දින සිට 2018 දෙසැම්බර් 30 දින දක්වා

	ඇ. ඩොලර්	ලංකා රුපියල්
ආගමන පනත	155205.50	25,075,261.75
කොන්සල් පනත	39501.67	6327404.59
වෙනත්	764.19	185682.22
රැකියා ගිවිසුම් ලියාපදිංචිය	0.00	0.00

විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල / දූත කාර්යාල



2018.12.31 දිනට දූතමණ්ඩල/දූත කාර්යාලවල ආදායම් වාර්තාව

දූත මණ්ඩල අංකය	දූත මණ්ඩලය	රජයේ ගොඩනැගිලි කුලිය 2002-01-01	වෙනත් පොලී 2002-02-99	විදේශ ගමන් බලපත්‍ර හා වීසා 2003-02-07	විභාග හා වෙනත් 2003-02-13	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව 2/14/2003	කොන්සියුලර් ගාස්තු 2003-02-99	වෙනත් ලැබීම් 2003-99-00	මධ්‍යම රජයේ වැ. හා අනත් දරු 2004-01-00	පළාත් වැ. හා අනත් දරු 2004-02-00	ප්‍රාග්ධන වත්කම් විකිණීම 2006-02-01 (වාහන)	ප්‍රාග්ධන වත්කම් විකිණීම 2006-02-02 (වෙනත්)	මුළු එකතුව
01A	කැන්බරා		47,149.64	18,865,305.06		19,355.88	6,695,534.73	1,184,229.70	223,687.68	18,405.75		855,581.30	27,909,249.76
02A	සිඩ්නි		17,696.48	29,163,538.91	638.95	177,474.78	12,213,467.68	969,538.76	157,630.98	14,299.74			42,714,286.29
03A	කයිරෝ		180,904.44	2,454,308.43			372,139.87	82,508.55	103,545.20				3,193,406.50
04A	පැරිස්		35,750.68	165,016,757.55	683.40		21,481,458.68	2,890,211.07	291,488.63	65,706.05			189,782,056.06
05A	හේග්		27,769.17	16,023,028.72			2,449,308.58	1,043,843.09	132,883.97				19,676,833.53
06A	ටෝකියෝ		32,450.22	26,279,075.92	600.19	540,835.31	13,663,387.10	6,159,883.40	190,951.62	17,827.39			46,885,011.15
07A	අම්මාන්		13,062.23	5,906,578.17			709,334.73	83,239.12	57,870.73				6,770,084.98
08A	කත්මන්ඩු	4,843.84	252,509.03	4,979,842.24	605.48		498,212.43	7,555,035.60	106,458.47				13,397,507.09
09A	බර්ලින්		8,212.60	37,817,263.64			3,298,301.74	1,755,332.96	123,568.86	49,719.73			43,052,399.53
10A	වියානා		17,451.52	3,759,003.25			1,103,788.05	6,667,526.09	137,957.84		154,454.64		11,840,181.38
11A	බීජිං		29,306.54	17,933,055.04	618.50		5,299,626.96	5,897,972.27	343,000.36	20,928.11			29,524,507.78
12A	හවානා		11,225.46	179,877.85			249,425.92	192,869.66	84,808.98	2,445.03			720,652.90
13A	ක්වාලාලම්පූර්		17,717.27	14,419,487.18			4,056,483.55	8,517,923.64	235,749.39				27,247,361.02
14A	සිංගප්පූරුව		41,964.28	5,993,525.77			4,463,454.45	2,905,345.99	256,674.95				13,660,965.44
15A	නිව්යෝක්		22,887.77	14,533,009.30			2,823,892.40	1,450,924.07	369,386.75				19,200,100.29
16A	වොෂිංටන්		83,360.10	25,034,722.68			6,424,145.42	1,258,486.19	451,993.79	49,180.57		34,408.50	33,336,297.25
17A	ලොස් ඇන්ජලීස්		19,897.68	15,326,871.89			1,311,749.50	128,675.89	137,928.09				16,925,123.05
18A	ඩකා		6,203.02	9,882,454.61	3,005.33		553,863.27	138,770.43	86,819.63		25,630.23		10,696,746.51
19A	මුම්බායි		14,269.67	1,563,953.34			1,495,105.84	2,826,318.59	139,146.67				6,038,794.11
20A	ෆයිරෝබි		30,304.42	1,275,770.11			208,278.24	75,709.81	123,730.90				1,713,793.48
21A	යැන්ගොන්	39,046.00	8,104.73	2,183,633.25			118,141.55	75,709.81	124,203.94	17,642.93			2,566,482.21
22A	ස්ටොක්හෝම්		21,463.05	13,905,644.92			1,944,396.41	1,544,455.72	165,463.07				17,581,423.18
23A	බැංකොක්		20,043.46	3,476,890.38			1,826,237.39	4,354,946.13	149,619.67	38,889.82			9,866,626.84
24A	බ්‍රසල්ස්		26,550.14	4,677,568.10			1,304,628.18	216,157.81	205,905.86		589,343.70		7,020,153.78
25A	චෙන්නායි		39,476.91	8,738,122.36			28,562,461.94	2,059,829.76	481,726.73			77,135.13	39,958,752.83
26A	ජකාර්තා		31,757.51	1,420,790.00	604.20		515,758.66	583,241.46	187,957.92				2,740,109.74
27A	මාලේ		29,664.12	2,357,477.01	601.20		2,529,195.30	116,610.60	92,238.02	27,913.21			5,153,699.47
28A	පිනිවා		31,121.93	47,003,676.30	649.03		13,442,565.52	202,569.45	419,829.89	25,438.76			61,125,850.89
29A	අබුඩාබි		50,276.69	19,715,193.13	99.89		3,482,380.78	2,370,013.29	150,682.69	92,903.22			25,861,549.68
30A	ඩුබායි		39,075.40	77,523,527.40			15,043,313.80	4,047,220.62	257,070.56	21,041.00		394,827.30	97,326,076.09
31A	ලන්ඩන්		61,471.20	72,343,255.70			86,867,753.29	3,244,470.98	400,335.51	34,076.61			162,951,363.29
32A	නවදිල්ලිය	14,675.38	39,877.48	3,172,734.61			5,438,802.69	11,835,909.96	411,432.53	22,769.02			20,936,201.68
33A	සෝල්	396.79	32,496.50	35,264,587.30	1,799.76		12,297,362.10	1,323,148.45	401,437.60				49,321,228.49
34A	කුවේට්		49,283.43	90,029,120.39			25,340,468.95	458,204.29	572,887.61				116,449,964.67
35A	රියාද්		117,327.41	43,556,177.46			2,274,153.56	2,614,998.20	368,869.56		660,483.20		49,592,009.39
36A	මොස්කව්		28,207.06	1,280,360.28	624.20		621,666.56	7,573,648.65	177,331.87				9,681,838.63
37A	ඔටාවා		40,232.54	24,248,687.62			3,648,471.00	1,655,010.46	212,967.83	5,931.02			29,811,300.46
38A	බැන්ඩඩ්		12,393.21	895,854.00			153,489.50	211,529.65	42,988.58	866.17			1,317,121.11
39A	රෝමය	514,511.03	23,277.07	95,606,047.86			31,123,973.26	2,312,974.08	289,207.42				129,869,990.73
40A	හිමානය		33,166.51	10,588,167.43	612.98		4,380,670.91	456,392.71	289,363.40	22,149.25	505,087.20		16,275,610.39
41A	ඉස්ලාමාබාද්		9,146.99	1,426,017.13			819,116.06	229,986.57	174,286.96	30,503.14			2,689,056.85
42A	කරච්චි		15,614.29	1,615,518.77			750,624.89	87,035.83	99,580.20	22,132.99			2,590,506.95
43A	ජෙඩා		16,673.43	15,887,323.36			2,951,402.04	9,522,153.06	99,881.82				28,477,433.72
44A	කටාර්		19,964.88	55,165,190.85			12,177,589.76	7,980,706.49	972,987.48			728,169.50	77,044,608.95
45A	ප්‍රිටෝරියා		22,268.24	3,386,544.58			473,944.51	1,805,112.41	172,230.66				5,860,100.40
46A	බීරූට්		34,049.48	5,089,498.01			464,049.49	404,436.45	199,486.53	19,328.71		1,062,300.00	7,273,148.67

දූත මණ්ඩල අංකය	දූත මණ්ඩලය	රජයේ ගොඩනැගිලි තැලිය 2002-01-01	වෙනත් පොළී 2002-02-99	විදේශ ගමන් බලපත්‍ර හා වීසා 2003-02-07	විභාග හා වෙනත් 2003-02-13	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව 2/14/2003	කොන්සියුලර් ගාස්තු 2003-02-99	වෙනත් ලැබීම් 2003-99-00	මධ්‍යම රජයේ වැ. හා අනත් දරු 2004-01-00	පළාත් වැ. හා අනත් දරු 2004-02-00	ප්‍රාග්ධන වත්කම් විකිණීම 2006-02-01 (වාහන)	ප්‍රාග්ධන වත්කම් විකිණීම 2006-02-02 (වෙනත්)	මුළු එකතුව
47A	ටෙහෙරාන්		25,578.57	1,193,925.50			116,244.80	279,473.58	56,719.32			2,137.26	1,674,079.03
48A	මැනිලා		29,877.46	3,100,528.53			673,318.24	133,192.88	145,632.27				4,082,549.38
49A	වෝර්සෝ		13,852.98	865,635.19			419,028.20	1,043,536.62	47,133.26	22,011.96			2,411,198.21
50A	ඔස්ලෝ		12,046.18	9,711,914.03	1,199.92		462,236.69	1,726,248.92	96,710.36	1,242.34			12,011,598.44
51A	ෆ්‍රැන්ක්ෆර්ට්		10,968.73	40,515,588.36			1,096,323.82	1,829,344.88	233,194.81				43,685,420.61
52A	නෙල් අවිව්		2,928.21	10,195,054.81			2,402,404.08	1,729,421.69	97,739.19				14,427,547.97
53A	ටොරොන්ටෝ		32,792.42	93,918,065.42			8,446,376.43	8,634,675.79	256,500.12				111,288,410.18
54A	බ්‍රසිලියා		40,739.90	189,610.09			169,940.98	376,057.43	216,673.44				993,021.84
55A	හැනෝයි		3,738.94	1,831,478.25	600.00		936,686.47	2,295,315.29	165,146.68	11,659.84			5,244,625.47
56A	රමල්ලා		1,666.50					1,101,301.77	17,855.26				1,120,823.53
57A	ෂැංහයි	7,868.92	5,166.30	6,422,352.51			508,238.66	2,642,134.46	91,526.62				9,677,287.48
60A	ඇන්කාරා		16,949.61	865,905.66			533,054.75	595,982.12	177,219.27				2,189,111.40
61A	ගුවංජෝ		6,847.11	3,489,657.82			432,783.52	838,029.56	129,435.50				4,896,753.52
62A	මෙල්බර්න්		261,129.04	53,605,200.94			19,835,250.97	1,642,512.56	137,313.25				75,481,406.75
63A	මනමා		17,715.82	10,735,530.94	2,485.60		2,398,893.92	435,632.54	122,392.23	33,289.80			13,745,940.86
65A	අබුජා		7,245.92	2,641,633.83				75,709.81	120,931.82	23,203.05			2,868,724.43
66A	වික්ටෝරියා		7,126.65	993,514.48			231,629.99	5,638,159.88	19,735.01				6,890,166.01
67A	කාබුල්			1,735,937.00				76,518.32	20,394.36				1,832,849.68
68A	මිලාන්		17,965.92	70,231,544.77			44,400,201.50	946,444.25	98,522.23				115,694,678.66
69A	අඩිස් අබාබා		15,419.99	477,614.35			303,485.55	2,985,901.22	131,884.26				3,914,305.36
70A	සයිප්‍රස්							-	9,225.52				9,225.52
මුළු එකතුව		**581,341.96**	**2,292,832.09**	**1,369,685,730.34**	**15,428.62**	**737,665.97**	**431,289,675.82**	**154,096,411.35**	**13,267,142.18**	**711,505.21**	**1,934,998.97**	**3,154,558.98**	**1,977,767,291.51**

විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල මගින් සිදු කළ කොන්සියුලර් කාර්යයන්
2018 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා

* 2018 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා දූත මණ්ඩල වාර්තා කළ

රට	දූත මණ්ඩලය	රාජ්‍ය නොවන ක්‍රියාවන්	නිකුත් කළ වීසා	නිකුත් කළ ගමන් බලපත්‍ර	යන්ත්‍ර මගින් කියවිය හැකි ගමන් බලපත්‍ර නිකුත් කළ ආකාරය	නිකුත් කළ සහතික	විදේශ ගමන් බලපත්‍ර සිටුවා දීම	විදේශ ගමන් බලපත්‍ර අලුත් කිරීම	ආපසු සියරට පැමිණවීම	උපත් ලියාපදිංචි කිරීම	විවාහ ලියාපදිංචි කිරීම	මරණ ලියාපදිංචි කිරීම	මේලග සහතිය කිරීම	පොලිස් නිදහසායන සහතිය	වෙනත්
ඇෆ්ගනිස්ථානය	කාබුල්	-	483	-	-	-	-	-	1	-	-	-	-	2	-
ඔස්ට්‍රේලියාව	කැන්බරා*	-	82	599	109	-	5	-	-	177	-	5	343	53	-
ඔස්ට්‍රේලියාව	මෙල්බර්න්*	-	616	1442	126	60	34	-	-	365	-	7	1921	105	20
ඔස්ට්‍රේලියාව	සිඩ්නි*	-	520	627	58	80	18	-	-	142	-	6	1136	85	3
ඔස්ට්‍රියාව	වියනාව	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
බහරේන්	මැනමා	555	310	675	48	0	66	0	15	64	0	8	525	17	462
බංග්ලාදේශය	ඩකා	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
බෙල්ජියම	බ්‍රසල්ස්	0	465	33	0	12	0	0	0	15	0	0	203	0	-
බ්‍රසීලය	බ්‍රසීලියා	-	8	5	1	-	3	-	-	1	-	-	27	4	2
කැනඩාව	ටොරොන්ටෝ	-	2905	1184	132	-	29	-	27	107	-	6	-	88	-
කැනඩාව	ඔටාවා	-	599	432	47	04	05	03	02	64	0	0	186	06	-

විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල මගින් සිදු කළ කොන්සියුලර් කාර්යයන්
2018 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා

* 2018 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා දූත මණ්ඩල වාර්තා කළ

රට	දූත මණ්ඩලය	රැකියා කොන්ත්‍රාත්තු	විසා නිකුත් කළ	ගමන් බලපත්‍ර නිකුත් කළ	ගෙවීම් ඔබිනි සිසවිය යන්ත්‍ර මගින් ගමන් බලපත්‍ර	විසා අභ්‍යාචනා නිකුත් කළ සහතික පත්‍ර	විදේශ ගමන් බලපත්‍ර පිටපත් විදේශ ගමන් බලපත්‍ර අලුත් කිරීම	විදේශ ගමන් බලපත්‍ර අලුත් කිරීම	ඇපකර සියරට පැමිණවීම	උපත් ලියාපදිංචි කිරීම	විවාහ ලියාපදිංචි කිරීම	මරණ ලියාපදිංචි කිරීම	මේඛන සහතික කිරීම	නිදහස් පොලිස් නිදහස් කිරීම	වෙනත්
චීනය	බීජිං*	-	2285	52	4	-	3	3	-	21	-	-	1126	2	17
චීනය	ගුවැන්ෂු	-	561	-	5	-	-	2	-	1	-	1	95	-	-
චීනය	ෂැංහයි	-	597	14	45	-	4	-	19	11	9	2	293	5	6
කියුබාව	ශවානා	-	7	4	-	-	-	-	-	1	-	-	57	23	-
ඊජිප්තුව	කයිරෝ	31	205	32	13	-	2	-	-	10	-	-	97	-	-
ප්‍රංශය	පැරිසිය	0	1202	4191	130	58	435	0	112	1167	286	0	849	31	2928
ජර්මනිය	බර්ලින්*	-	1876	311	9	-	11	-	-	36	-	-	258	3	10
ජර්මනිය	ෆ්රැන්ක්ෆර්ට්*	-	973	878	21	0	25	0	0	70	2	3	68	1	0
ඉන්දියාව	නවදිල්ලිය	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
ඉන්දියාව	චෙන්නායි														
ඉන්දියාව	මුම්බායි	0	884	19	3	-	2	6	2	1	-	1	308	2	2

විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල මගින් සිදු කළ කොන්සියුලර් කාර්යයන්
2018 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා

* 2018 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා දූත මණ්ඩල වාර්තා කළ

රට	දූත මණ්ඩලය	රැකියා කොන්ත්‍රාත්තු	සිහුන් සෙළු සිහුන්	සිහුන් සෙළු ඔබලපත	යන්තු මලින් සිසවිය හොයැයි ඔබලපත	සිහුන් සෙළු අභ්‍යාසය සිහුන් පත සහතික	විදේශ ගමන් බලපත පිටපත් සිරීම	විදේශ ගමන් බලපත අලුත් සිරීම	සියරට පැමිණවීම අපසු	උපත් ලියාපදිංචි සිරීම	විවාහ ලියාපදිංචි සිරීම	මරණ ලියාපදිංචි සිරීම	ලේඛන සහතික සිරීම	පොලිස් නිදහස් සහතිය	වෙනත්
ඉන්දුනීසියාව	ජකර්තා	-	231	12	79	-	-	-	10	-	-	-	44	-	04
ඉරානය	ටෙහෙරාන්	-	239	1	6	-	-	1	4	1	-	2	9	-	-
ඉරාකය	බැග්ඩෑඩ්	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
ඊශ්‍රායලය	ටෙල් අවිව්*	-	5	275	26	-	6	-	3	20	2	1	191	6	-
ඉතාලිය	රෝමය	-	29	847	69	0	62	0	05	269	04	11	439	43	2323
ඉතාලිය	මිලාන්*	-	5	1954	690	-	275	-	-	672	17	10	1081	201	2643
ජපානය	ටෝකියෝව	-	670	637	139	21	16	-	23	204	41	8	974	01	66
ජෝර්දානය	උම්මාන්	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
කෙන්යාව	ණයිරෝබි	-	67	20	8	-	-	-	1	10	-	1	8	-	8
කොරියාව	සියෝල්	-	286	941	91	-	9	11	-	30	8	5	1489	9	40
කුවේට්	කුවේට්	-	1375	5523	1704	-	-	-	-	-	-	-	-	-	-
ලෙබනනය	බීරූට්*	-	11	416	30	-	12	-	207	41	-	1	70	4	-

විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල මගින් සිදු කළ කොන්සියුලර් කාර්යයන්
2018 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා

* 2018 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා දූත මණ්ඩල වාර්තා කළ

රට	දූත මණ්ඩලය	රැකියා කොන්ත්‍රාත්තු	නිකුත් කළ විසා	නිකුත් කළ ගමන් බලපත්‍ර	යළිත් ඒමට හිමිසහිත ගමන් බලපත්‍ර	නිකුත් කළ හදිසි ගමන් පත්‍ර	විදේශ ගමන් බලපත්‍ර පිටපත් සහතික කිරීම	විදේශ ගමන් බලපත්‍ර අමුණා සහතික කිරීම්	ඇපකර සියරට පැමිණවීම	උපත් ලියාපදිංචි කිරීම්	විවාහ ලියාපදිංචි කිරීම්	මරණ ලියාපදිංචි කිරීම්	ලේඛන සහතික කිරීම්	නිදහස් පොලිස් සහතික	වෙනත්
මැලේසියාව	ක්වාලාලම්පුර්*	114	272	288	444	-	23	-	87	37	20	9	280	-	-
මාලදිවයින	මාලේ	0	148	103	18	0	7	0	0	7	0	0	477	0	0
මියැන්මාරය	යැන්ගොන්*	-	333	9	6	-	-	-	6	1	-	1	-	-	-
නේපාලය	කත්මණ්ඩු	0	1418	01	06	0	0	0	0	01	01	0	13	142	01
නෙදර්ලන්තය	හේග්*	-	674	65	1	3	-	-	9	20	-	-	211	-	-
නයිජීරියාව	උබුජා*	-	333	9	6	-	-	-	6	1	-	1	-	-	-
නෝර්වේ	ඔස්ලෝ	-	544	141	8	-	7	0	4	38	-	1	48	1	-
ඕමාන්	මස්කට්	4635	94	624	151	-	52	624	148	78	0	16	875	4	0
පාකිස්තානය	ඉස්ලාමාබාද්	-	595	1	3	-	-	4	-	8	-	-	168	-	66
පාකිස්තානය	කරච්චි	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
පිලිපීනය	මැනිලා*	-	303	21	1	-	5	-	-	11	-	-	91	3	31
පෝලන්තය	වෝර්සෝ	7	47	11	2	-	2	-	8	1	-	-	211	-	-

විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල මගින් සිදු කළ කොන්සියුලර් කාර්යයන්
2018 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා

* 2018 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා දූත මණ්ඩල වාර්තා කළ

රට	දූත මණ්ඩලය	රැකියා කොන්ත්‍රාත්තු	නිකුත් කළ විසා	නිකුත් කළ ගමන් බලපත්‍ර	යන්ත්‍ර මගින් සිසුවිය හැකි ගමන් බලපත්‍ර	නිකුත් කළ හදිසි ගමන් පත්‍ර	විදේශ ගමන් බලපත්‍ර පිටපත් සහතික කිරීම	විදේශ ගමන් බලපත්‍ර අලුත් කිරීම	ඇපකර සියර්ට පැමිණවීම	උපත් ලියාපදිංචි කිරීම	විවාහ ලියාපදිංචි කිරීම	මරණ ලියාපදිංචි කිරීම	ලේඛන සහතික කිරීම	නිදහස් පොලිස් නිදහසක් සහතික	වෙනත්
පලස්තීන රාජ්‍යය	රමල්ලා නගරය	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
කටාර්	දෝහා	-	185	3897	1541	-	305	14	-	345	15	53	2255	6	576
රුසියානු සමූහාණ්ඩුව	මොස්කව්	0	166	10	6	8	1	0	1	9	0	0	352	5	0
සවුදි අරාබිය	රියාද්	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
සවුදි අරාබිය	ජෙද්ධා	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
සීෂෙල්ස්	වික්ටෝරියා	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
සිංගප්පූරුව	සිංගප්පූරුව	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
දකුණු අප්‍රිකාව	ප්‍රිටෝරියා	-	107	12	17	-	5	66	-	20	-	2	69	21	-
ස්වීඩනය	ස්ටොක්හෝම්	0	1033	168	20	0	0	03	0	53	0	02	76	0	40
තායිලන්තය	බැංකොක්	-	466	10	37	-	4	-	16	11	7	1	219	4	-
තුර්කිය	උන්කාරා	-	113	-	4	-	-	3	56	7	-	1	110	1	-

විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල මගින් සිදු කළ කොන්සියුලර් කාර්යයන්
2018 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා

* 2018 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා දූත මණ්ඩල වාර්තා කළ

රට	දූත මණ්ඩලය	රැකියා කොන්ත්‍රාත්තු	නිකුත් කළ විසා	නිකුත් කළ ගමන් බලපත්‍ර	යන්ත්‍ර මගින් සිසුවිය හැකි ගමන් බලපත්‍ර	නිකුත් කළ අභ්‍යාසා සහතික පත්‍ර	විදේශ ගමන් බලපත්‍ර පිටපත් සහතික කිරීම	විදේශ ගමන් බලපත්‍ර අලුත් කිරීම්	ඇපකර සියර්ට පැමිණවීම	උපත් ලියාපදිංචි කිරීම්	විවාහ ලියාපදිංචි කිරීම්	මරණ ලියාපදිංචි කිරීම්	මේඛන සහතික කිරීම්	නිදහස් පොලිස් සහතික	වෙනත්
එක්සත් අරාබි එමීර් රාජ්‍යය	අබු ඩාබි	11	174	1114	29	232	109	993	9	144	23	9	506	5	1085
එක්සත් අරාබි එමීර් රාජ්‍යය	ඩුබායි	293	734	4102	830	-	425	4332	145	455	-	20	491	25	1438
එක්සත් රාජධානිය	ලන්ඩන්*	-	2710	2356	-	-	198	638	51	333	16	10	-	-	-
එක්සත් ජාතීන්	ජිනීවා	0	855	1315	103	0	49	3	188	326	0	4	1039	2	-
එක්සත් ජාතීන්	ණිව්යෝක්	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
ඇමරිකා එක්සත් ජනපදය	වොෂින්ටන්	-	1160	596	69	13	26	-	14	213	-	08	511	10	312
ඇමෙරිකා එක්සත් ජනපදය	ලොස් ඇන්ජලීස්	-	400	319	59	4	5	0	0	81	0	1	84	0	238
වියට්නාමය	හැනෝයි	-	195	6	4	-	1	3	-	8	-	-	255	5	23

විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

EHA/A/MFA/01/FS/2018 **2019** මැයි 31 දින

ලේකම්,
විදේශ කටයුතු අමාත්‍යාංශය

විදේශ කටයුතු අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

විදේශ කටයුතු අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වැනුවිධිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2018දෙසැම්බර් 31 දිනට විදේශ කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹුකරන බව මා දරන්නාවූ මතයවේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍යප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය කිරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේවගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරවඅමාත්‍යාංශයවිසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේමූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ

සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

ඩෘස්තිය විනිශ්චය සහ වෘත්තීය යැකකියුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, වෙතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇති්වීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

- දෙපාර්තමේන්තුව විසින්ඉකුත්වර්ෂයටඅදාළවමුල්‍යප්‍රකාශනපිළියෙලකිරීමේඅවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ප්‍රමාණාත්මක ගිණුම්කරණ අඩුපාඩු අනාවරණය විය.

(අ) ආදායම් නොවන ලැබීම්

සමාලෝචිත වර්ෂයේදී විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ආදායම් නොවන ලැබීම් සම්බන්ධයෙන් සිදු කළ විගණනයේදී පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

අත්තිකාරම් ලැබීම්

මූල්‍යකාර්යසාධන ප්‍රකාශනයේ ඇතුලත් අත්තිකාරම්ලැබීම් අමාත්‍යාංශයේ මාසික ගිණුම් සාරාංශ සමඟ සැසඳීමේදී රු.9,934,037 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර අමාත්‍යාංශයට අනුව එම වෙනස රු.9,896,124 ක් විය. ඒ අනුව වෙනස රු.37,913 ක් විය.

1.6.2 අග්‍රිම ගිණුම

අග්‍රිම ගැලපුම් ගිණුමේ විදේශ කටයුතු අමාත්‍යාංශය අනෙකුත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් රු.778,863,553 ක් වශයෙන් ගළපා තිබුණ ද, මාසික ගිණුම් සාරාංශ අනුව මෙය රු.786,835,575 ක් වූයෙන් රු.7,972,022 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.6.3 දේපල පිරියත හා උපකරණ

(අ) සමාලෝචිත වර්ෂයේදී විකුණන ලද අමාත්‍යාංශයේ වාහනවල පිරිවැය වටිනාකම අපහරණ අගය ලෙස දක්වනවා වෙනුවට රක්ෂණ අවශ්‍යතාවය සඳහා තක්සේරුකරන ලද අගය වූ රු.13,900,000 ක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර තිබුණි. තවද, විකුණා ඇත්තේ වාහන 05 ක් වුවද, වාහන 06 ක අගය මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ දැක්වීමට කටයුතු කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී දූත මණ්ඩල 03 ක අපහරණය කරන ලද පිරිවැය වටිනාකම රු.13,875,228 ක් වූ වාහන 03 ක විකුණුම් වටිනාකම රු.2,156,731 ක් අපහරණ අගය ලෙසත්, තවත් අපහරණය කරන ලද වාහන 02 ක පිරිවැය වටිනාකම රු.7,648,500ක්ඇතුළත් නොකර මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ අපහරණවටිනාකම දක්වා තිබුණි.

(ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම් යටතේ රු.5,089,558 ක විදේශ දූත මණ්ඩලවල වාහන විකුණුම්වල ලැබීම් පමණක් ඇතුළත් කර තිබූ අතර, අමාත්‍යාංශයේ වාහන විකුණුම්වලින් ලැබූ රු.10,020,720 ක මුදල ඇතුළත් කර නොතිබුණි.

1.6.4 අත්තිකාරම් ගිණුම් ශේෂ

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම් ප්‍රකාරව2018 දෙසැම්බර් 31 දිනට මාරු වී ගිය,විශ්‍රාම ගිය,මියගිය, වැඩහහනම් වූ,සේවය අවසන් කළ හා සේවය හැරගිය නිලධාරීන්ගේ හිඟහිටි ණය ශේෂවල එකතුව රු.2,326,566 ක් වූ අතර ඉන් වර්ෂ 05ට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂවල එකතුව රු.1,259,997 ක් බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ සඳහන් වර්ෂ 05 කට වැඩි හඳුනා නොගත් ණය ශේෂ එකතුව රු.1,515,668 ක් සම්බන්ධව හඳුනාගැනීම ක්‍රමවට හෝ නිරවුල් කිරීමටකටයුතු කර නොතිබුණි.

1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

මුදල් රෙගුලාසි 110 ප්‍රකාරවවිදේශ දූත මණ්ඩල සම්බන්ධයෙන් හානි ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

2- මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයේ මාසික අග්‍රිම සැලැසුම් කිරීම,ඉල්ලුම් කිරීම සහ ලැබුණු අග්‍රිම පිළිබඳ විශ්ලේෂණයේදී ඉල්ලුම් කළ අග්‍රිමයට වඩා රු.මිලියන 4,380.4 ක් අඩුවෙන් අග්‍රිම ලැබී තිබුණි.

2.2 වියදම් කළමනාකරණය

ඇස්තමේන්තුහැකිතාක්දූරටසම්පූර්ණවත්නිවැරදිවන්පිළියෙලකිරීමගණන්දීමේ නිලධාරියාගේ වගකීම වුවද, වැය විෂයන් 04 ක් සඳහා වෙන් කරන ලද රු.3,669,300 ක ප්‍රතිපාදනවලින් සියයට සියයක් ඉතිරිවීම් නිරීක්ෂණය වූ අතර,ප්‍රතිපාදනය රු.566,000,000ක් වූවැය විෂයන් 07 ක රු.324,915,822 ක ඉතිරිවීම් ප්‍රතිපාදිත මුදලින් සියයට 54 කසිට සියයට 78 ක් දක්වා පරාසයක් ගෙන තිබුණි.

2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ වැය විෂයන් 31 ක් සඳහා සලසා තිබූ රු.9,925,496,365 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනය ඉක්මවා රු.244,155,260 ක බැරකම් ඇති කර ගෙන තිබුණි.

(ආ) 2018 නොවැම්බර් 11 දිනැති අංක 267/2018 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයෙහි 3.4 වගන්තිය අනුව වාර්තා නොකළ කිසිදු බැඳීමක් හෝ බැරකමක් පෙර වර්ෂයේ වියදමක් ලෙස 2019 වර්ෂයේදී නිරවුල් නොකළ යුතුයි. එසේ වුවද විදේශ හා දූතමණ්ඩල කිහිපයක නියැදි පරීක්ෂාවේදී වාර්තා නොකළ රු.10,884,464ක්වූ බැරකම්,සමාලෝචිත වර්ෂයේ නිරවුල්කර තිබුණි.

2.4 අත්තිකාරම්නිකුත් කිරීම හා පියවීම

විදේශ දූත මණ්ඩලයන්හි 2018 දෙසැම්බර් 31 දිනට නොපියවූ අත්තිකාරම් ශේෂය රු.392,373,638 ක් විය. මෙය නිවාස ආරක්ෂිකූ ඇප තැන්පතු රු.342,391,044 ක් හා අනිත් තැන්පත් රු.49,982,594 ක් විය. නිවාස ආරක්ෂිත ඇප තැන්පතුවල දැනට පදිංචිව සිටින නිවාස වෙනුවෙන් තැන්පත් කර ඇති හා දැනට පදිංචිව නොමැති එහෙත් නැවත භිලවී කරගත නොහැකි වූ තැන්පතු ඇතුළත් වේ. මෙම ශේෂය තුළ වර්ෂ 1 ක සිට වර්ෂ 27 ක් දක්වා වූ කාල පරාසයක නොපියවූ අත්තිකාරම් හා තැන්පතු ශේෂ පැවතුණි.

2.4 තැන්පතු

මුදල් රෙගුලාසි 565(5) ප්‍රකාරව එක් එක් මාසය සඳහා පිළියෙල කළ මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් ඊළඟ මාසය අවසන් වීමට පෙර විගණකාධිපති වෙත යැවිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

3 -මෙහෙයුම් සමාලෝචනය

3.1 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විදේශ දූත මණ්ඩල සම්බන්ධයෙන් සිද්ධීන් 46 ක පාඩු හා අත්හැරීම් වටිනාකම රු.27,162,885 ක් විය. එම ශේෂයෙන් වර්ෂ 10ක් ඉක්මවූ හා වර්ෂ 05ත් වර්ෂ 10ත් අතර ශේෂයන් පිළිවෙලින් රු.21,626,285ක් හා රු.1,334,664 ක් විය.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අයථා පරිහරණ මුදල් සොරකම් හා වැටුප් රහිත නිවාඩුවලින් අයවිය යුතු රු.1,091,828 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව අවශ්‍ය පරීක්ෂණ කර නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගෙන දිගින් දිගටම ගිණුමේ ඉදිරියට එමින් පැවතුණි.

(ඇ) අයනොවූ නිවාස ආරක්ෂිත ඇප තැන්පතු රු.2,166,467 ක්, වාහන අනතුරු රු.3,752,431 ක් අයකර ගත නොහැකි අත්තිකාරම් රු.1,750,081 ක් ජංගම දුරකථන නැතිවීම් රු.16,000 ක් හා අනෙකුත් හානි සම්බන්ධයෙන් රු.2,235,495 ක මුදලක් පාඩු හා අත්හැරීම් යටතේ නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග නොගෙන දිගින් දිගටම පෙන්වා තිබුණි.

4 - මානව සම්පත් කළමනාකරණය

4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය , තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

2018 දෙසැම්බර් 31දිනට අනුමත, තථ්‍ය ,පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍ය කාර්යාලය හැර අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි කාණ්ඩය යටතේ වැටුප් හා වේතන වැය විෂයය වෙනුවෙන් රු .1,735,721,849ක් වැය කර තිබුණි.

(අ) අමාත්‍යාංශ කාර්යය මණ්ඩලය

	සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්ත සංඛ්‍යාව
i.	ජ්‍යෙෂ්ඨ මට්ටම	99	92	07	-
ii.	තෘතියික මට්ටම	08	04	04	-
iii.	ද්විතියික මට්ටම	367	342	28	03
iv.	ප්‍රාථමික මට්ටම	138	130	10	02
v.	වෙනත් (අනියම් / කාවකාලික/කොන්ත්‍රාත් පදනම්)	51	13	38	0
	එකතුව	663	581	87	05

(අ) දූත මණ්ඩල කාර්යය මණ්ඩලය

සියරට පේරුව (Home Based)	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්ත සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ / තෘතියික *	246	208	38	-
ද්විතියික **	260	258	02	-
ප්‍රාථමික ***	07	07	-	-
එකතුව	513	473	40	
ස්ථානීය නොවන (Locally recruited)				
ද්විතියික **	306	276	30	-
ප්‍රාථමික ***	270	255	15	-
එකතුව	576	531	45	

i. ජ්‍යෙෂ්ඨ/ තෘතියික - දූත මණ්ඩල ප්‍රධානී, අමාත්‍ය උපදේශක,උපදේශක , පළමු ලේකම්, දෙවන ලේකම් ,තෙවන ලේකම්

ii. ද්විතීයික - සංධාන සහකාර , තොරතුරු තාක්ෂණ නිලධාරීන් ඇතුළු රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්

iii. ස්ථානීය නොවන ද්විතීයික - ලිපිකරු , පිළිගැනීමේ නිලධාරීන්, ලඝු ලේඛක, භාෂා පරිවර්තක, තොරතුරු තාක්ෂණ නිලධාරීන් ඇතුළු නිලධාරීන්

iv. ප්‍රාථමික - රියදුරු, කාර්යාල සහයක, පිරිසිදු කරන්නන් ඇතුළු නිලධාරීන්

ඩබ්ලිව්.ජී.එන්. මැණිකේ
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත : අධ්‍යක්ෂ ජනරාල් , රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව